308 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 308 - இல. 16
Volume 308 - No. 16

2023 දෙසැම්බර් 09 වන සෙනසුරාදා
2023 டிசம்பர் 09, சனிக்கிழமை
Saturday, 09th December, 2023

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 3215]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 3216-3241]

**සබරගමුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඒකකය:**
සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 3246]

**ගරු ගාමිණී වලේබොඩ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 3249]

**වරප්‍රසාද:**
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත මුද්‍රණය කිරීමේ ප්‍රමාදය [තීරුව 3251]

**විසර්ජන පනත් කෙටුම්පත, 2024 - [විසිතුන්වන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 118, 281, 285, 292 (කෘෂිකර්ම); ශීර්ෂ 135, 289, 293, 337 (වැවිලි කර්මාන්ත); ශීර්ෂය 501 (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 3269-3446]

**ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත:**
නියමය [තීරුව 3447]

**පළිබෝධනාශක පාලනය කිරීමේ පනත:**
නියෝග [තීරුව 3447]

**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය:**
වාර්ෂික වාර්තාව (2021) [තීරුව 3447]

**පොල් වගාකිරීමේ මණ්ඩලය:**
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 3448]

**පොල් පර්යේෂණ ආයතනය:**
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 3448]

**තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය:**
වාර්ෂික වාර්තාව (2019) [තීරුව 3449]

**පොල් සංවර්ධන අධිකාරිය:**
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 3449]

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය:**
වාර්ෂික වාර්තාව (2021) [තීරුව 3450]


# பிரதான உள்ளடக்கம்


**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 3215]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 3216-3241]

**சப்ரகமுவ பல்கலைக்கழகத்தின் பேராசிரியர் அலகு:**
சுகாதார அமைச்சரினது கூற்று [ப: 3246]

**மாண்புமிகு காமினி வலேபொடவினது சொந்த விளக்கம்** [ப: 3249]

**சிறப்புரிமை:**
இலங்கை மின்சாரம் சட்டமூலத்தை அச்சிடுவதிலுள்ள தாமதம் [ப: 3251]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2024- [ஒதுக்கப்பட்ட இருபத்திமூன்றாம் நாள்]:**
[தலைப்புகள் 118, 281, 285, 292 (கமத்தொழில்); தலைப்புகள் 135, 289, 293, 337 (பெருந்தோட்டக் கைத்தொழில்); தலைப்பு 501 (அரச பெருந்தோட்ட தொழிற்றுறை மறுசீரமைப்பு)] – குழுவில் ஆராயப்பட்டது [ப: 3269-3446]

**இலங்கை தேயிலைச் சபைச் சட்டம்:**
கட்டளை [ப: 3447]

**பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தற் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 3447]

**இலங்கை இறப்பர் ஆராய்ச்சி நிறுவனம்:**
வருடாந்த அறிக்கை (2021) [ப: 3447]

**தென்னைப் பயிர்ச்செய்கைச் சபை:**
வருடாந்த அறிக்கை (2020) [ப: 3448]

**தென்னை ஆராய்ச்சி நிறுவனம்:**
வருடாந்த அறிக்கை (2020) [ப: 3448]

**தலவாக்கலை இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்:**
வருடாந்த அறிக்கை (2019) [ப: 3449]

**தெங்கு அபிவிருத்தி அதிகாரசபை:**
வருடாந்த அறிக்கை (2020) [ப: 3449]

**சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை:**
வருடாந்த அறிக்கை (2021) [ப: 3450]


# PRINCIPAL CONTENTS


MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 3215]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 3216-3241]

PROFESSORIAL UNIT OF SABARAGAMUWA UNIVERSITY:
Statement by Minister of Health [Col. 3246]

PERSONAL EXPLANATION BY HON. GAMINI WALEBODA [Col. 3249]

PRIVILEGE:
Delay in Printing Sri Lanka Electricity Bill [Col. 3251]

APPROPRIATION BILL, 2024 - [Twenty Third Allotted Day]:
Considered in Committee - [Heads 118, 281, 285, 292 (Agriculture); Heads 135, 289, 293, 337 (Plantation Industries); Head 501 (State Plantation Enterprises Reforms)] [Cols. 3269-3446]

SRI LANKA TEA BOARD LAW:
Order [Col. 3447]

CONTROL OF PESTICIDES ACT:
Regulations [Col. 3447]

RUBBER RESEARCH INSTITUTE OF SRI LANKA:
Annual Report (2021) [Col. 3447]

COCONUT CULTIVATION BOARD:
Annual Report (2020) [Col. 3448]

COCONUT RESEARCH INSTITUTE:
Annual Report (2020) [Col. 3448]

TEA RESEARCH INSTITUTE OF SRI LANKA - TALAWAKELE:
Annual Report (2019) [Col. 3449]

COCONUT DEVELOPMENT AUTHORITY:
Annual Report (2020) [Col. 3449]

TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY:
Annual Report (2021) [Col. 3450]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2023 දෙසැම්බර් 09 වන සෙනසුරාදා***
*2023 டிசம்பர் 09, சனிக்கிழமை*
*Saturday, 09th December, 2023*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූනි 01 දිනැති අංක 2334/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Plantation Industries)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියමය සහ නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13(1)(අ) සහ 13(1)(ආ) වගන්ති යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 04 දිනැති අංක 2339/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
(ii) 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 20 වගන්තිය සමඟ කියවිය යුතු 26 වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 18 දිනැති අංක 2345/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෙත්සම් පිළිගැන්වීම.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති මහවැලි අධිකාරිය සතු ඉඩම්: විස්තර
### முதலீட்டுக் கருத்திட்டங்களுக்கு வழங்கப்பட்டுள்ள மகாவலி அதிகாரசபைக்குரிய காணிகள்: விபரம்
### LANDS BELONGING TO MAHAWELI AUTHORITY GIVEN FOR INVESTMENT PROJECTS: DETAILS

3357/2023

**1. ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ආයෝජන ව්‍යාපෘතිවලට ලබා දී ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය එක් එක් මහවැලි කලාපය, දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටෙයාර කොපමණද;

(ii) එම එක් එක් ඉඩම ලබා දී ඇති ආයෝජකයාගේ නම, ලිපිනය, ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ මේ වන විට ඉඩම භාවිත කරනු ලබන කාර්යය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ඉඩම් අතරින් ලබා දුන් කාර්යය සඳහා භාවිත කරනු නොලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් ලබාගෙන ඇති ආයෝජකයන් කවුරුන්ද;

(v) ඔවුන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු ජයන්ත සමරවීර මහතා]

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් බෙදා දීමේ බලය ඇති නිලධාරියා කවුරුන්ද;

(ii) මේ වන විට බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் முதலீட்டுக் கருத்திட்டங்களுக்காக வழங்கப்பட்டுள்ள இலங்கை மகாவலி அதிகாரசபைக்குரிய காணிகளின் அளவு ஒவ்வொரு மகாவலி வலயம், மாவட்டம் மற்றும் பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக எத்தனை 'ஹெக்டேர்'கள் என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு காணியும் வழங்கப்பட்டுள்ள முதலீட்டாளரின் பெயர், முகவரி, வழங்கப் பட்டுள்ள காணியின் அளவு மற்றும் தற்போது காணி பயன்படுத்தப்படும் நடவடிக்கை வெவ் வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி காணிகளுள் வழங்கப்பட்ட நடவடிக் கைக்காக பயன்படுத்தப்படாத காணிகளின் அளவு யாதென்பதையும்;

(iv) மேற்குறித்த காணிகளைப் பெற்றுக்கொண்டுள்ள முதலீட்டாளர்கள் யாவர் என்பதையும்;

(v) அவர்களுக்கெதிராக எடுக்கப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை மகாவலி அதிகாரசபைக்குரிய காணிகளைக் கைமாற்றம் செய்வதற்கான அதிகாரமுடைய உத்தியோகத்தர் யார் என்பதையும்;

(ii) இன்றளவில் கைமாற்றம் செய்யப்பட்டுள்ள காணிகளின் அளவு எத்தனை 'ஹெக்டேர்'கள் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land belonging to the Mahaweli Authority of Sri Lanka that has been given for investment projects at present, in relation to each Mahaweli System, district and Divisional Secretary's Division in hectares, separately;

(ii) the name and address of the investor to whom each such land has been given, the extent of land so given and the purposes for which the land that has been given is used, separately;

(iii) of the above lands, the extent of land that is not used for the purpose for which they were given;

(iv) the investors who have obtained those lands; and

(v) the steps that would be taken against them?

(b) Will he also inform this House -

(i) the officer who is authorized to disburse the lands that belong to the Mahaweli Authority of Sri Lanka; and

(ii) the extent of lands that has been disbursed at present in hectares?

(c) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග ඇමතිතුමිය මේ ප්‍රශ්නයට අදාළ පිළිතුර මට එවා තිබෙනවා. ඒ පිළිතුර මට ඉදිරිපත් කරන්න පුළුවන්. අතුරු ප්‍රශ්න අහනවා නම් අපට වෙන වෙලාවක් ලබා ගන්න වෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)

ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර ඉදිරිපත් කරන්න. මම අතුරු ප්‍රශ්නත් අහන්නම්. අතුරු ප්‍රශ්නවලට පසුව පිළිතුරු ලබා දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග ඇමතිතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඉඩම්වල විස්තර පහත පරිදි වේ.

| අංකය | දිස්ත්‍රික්කය | කලාපය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඇති සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) | දිස්ත්‍රික්කය තුළ ඇති සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) |
|---|---|---|---|---|---|
| 1 | පොළොන්නරුව | බී,සී,ඩී,ජී | දිඹුලාගල,<br>ඇලහැර,<br>වැලිකන්ද,<br>මැදිරිගිරිය | 1610.3<br>1.29<br>1757.01<br>14.41 | 3383.01 |
| 2 | මඩකලපුව | බී | කෝරළේපත්තුව උතුර,<br>කෝරළේපත්තුව දකුණ | 71.2<br>20.9 | 92.1 |
| 3 | බදුල්ල | සී | මහියංගනය | 625.88 | 625.88 |
| 4 | අම්පාර | සී,<br>රඹකැන්ඔය | දෙහිඅත්තකණ්ඩිය<br>මහඔය | 16.29<br>398.95 | 415.24 |

| අංකය | දිස්ත්‍රික්කය | කලාපය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඇති සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) | දිස්ත්‍රික්කය තුළ ඇති සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) |
|---|---|---|---|---|---|
| 5 | ත්‍රිකුණාමලය | ඩී | කන්තලේ | 700.61 | 700.61 |
| 6 | මාතලේ | ජී,ඊ,<br>වික්ටෝරියා | ලග්ගල,<br>දඹුල්ල,<br>උකුවෙල,<br>නාඋල | 30.81<br>8<br>0.81<br>5.95 | 45.57 |
| 7 | නුවර | ඊ,<br>වික්ටෝරියා | කුණ්ඩසාලේ<br>හාරිස්පත්තුව<br>තිස්පනේ | 18.51<br>2.52<br>2.81 | 23.84 |
| 8 | නුවරඑළිය | ඊ,<br>වික්ටෝරියා | කොත්මලේ,<br>හැටන් | 15.78<br>20.35 | 36.13 |
| 9 | අනුරාධපුරය | එච්,<br>හුරුළුවැව | කැකිරාව,<br>පලාගල,<br>තඹුත්තේගම,<br>ගල්නෑව,<br>නොච්චියාගම,<br>තලාව | 59<br>7<br>104.48<br>38.42<br>56.61<br>2.73 | 268.24 |
| 10 | කුරුණෑගල | එච් | ගල්ගමුව | 1.13 | 1.13 |
| 11 | මුලතිව් | එල් | වැලිඔය | 380.93 | 380.93 |
| 12 | මොනරාගල | වලව | සෙවණගල | 28.93 | 28.93 |
| 13 | රත්නපුර | වලව | ඇඹිලිපිටිය | 255.51 | 255.51 |
| 14 | හම්බන්තොට | වලව | හම්බන්තොට<br>අඟුණුකොළපැලැස්ස<br>සූරියවැව | 238.76<br>34.48<br>4.36 | 277.60 |
| | මුළු ප්‍රදේශය (හෙක්ටෙයාර) | | | 6534.7232 | 6534.7232 |

(ii) ඇමුණුම 1හි දක්වා ඇත.

(iii) හෙක්ටෙයාර 1373.6 විධිමත්ව ලබා දුන් කාරණයට භාවිත නොකරනු ලබන අතර, එම ඉඩම් අවලංගු කර නැවත ආයෝජකයන් වෙත බැහැර කර ඇත.

(iv) ඇමුණුම 2හි දක්වා ඇත.

(v) අදාළ ආයෝජකයන්ගේ බදු අයිතිය අවලංගු කිරීමට කටයුතු කර ඇත.

(ආ) (i) රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් බැහැර කිරීමට බලය ඇත්තේ විෂය භාර ගරු අමාත්‍යවරයාට වන අතර ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් බැහැර කිරීමට බලය ඇත්තේ ගරු විෂය භාර අමාත්‍යවරයාට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වේ.

(ii) මේ වන විට බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 176,609කි.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)

ගරු අමාත්‍යතුමනි, මම අතුරු ප්‍රශ්න දෙක යොමු කරන්නම්. ඔබතුමා විෂය භාර ගරු අමාත්‍යතුමියට අතුරු ප්‍රශ්න යොමු කරලා පිළිතුරු ලබා දෙන්න කටයුතු කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඒ පිළිතුරු ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, දිවුල්පතාන කියන ගම්මානය ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවසේ සිට හත්වැනි සියවස දක්වා දිව ගිය ගම්මානයක්. ඒ කාලයේ බිම්තැන්නපත්තුවේ, දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයට අයත්ව තිබුණු මේ ගම අද තිබෙන්නේ වෙන්කලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ දකුණු ඉවුරට අයත් මහවැලි "බී" කලාපයට අයත් මේ ගම්මානයේ ඉතිහාසයේ ගොවි පවුල් 513ක් පදිංචිව ඉඳලා තිබෙනවා. මේක ගොවි පවුල් සඳහා පදිංචියට සහ වගාව සඳහා හෙක්ටෙයාර 14,000ක් වෙන් කර තිබෙන බිමක්. 2017දී කළ පුරාවිද්‍යා ගවේෂණයේදී මේ ප්‍රදේශයෙන් ක්‍රිස්තු පූර්ව දෙවැනි

[ගරු ජයන්ත සමරවීර මහතා]

සහ හත්වැනි සියවස්වලට අදාළ ආරාම පද්ධතියක්, ශිලා ලේඛන සහ වැව් සොයාගෙන තිබෙනවා. ඒකෙන් ඉතා පැහැදිලියි, ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවසට දිව යන, අනුරාධපුර මුල් යුගයට දිව යන සිංහල බෞද්ධ ජනාවාසයක් මේ ප්‍රදේශයේ තිබුණා කියලා.

පසුගිය කාලයේ තිබුණු සිවිල් යුද තත්ත්වය නිසා මේ හෙක්ටෙයාර 14,000 තුළ වගා කරගන්න බැරි වුණා; ඉඩම් කච්චේරි තියලා ගොවි ජනතාව අතර ඒවා බෙදා දෙන්න බැරි වුණා. ඒ නිසා සිංහල ජනතාවට ඒ ප්‍රදේශය අත්හැරලා සමහර වෙලාවට වෙනත් ගම්බිම් කරා යන්නත් සිද්ධ වුණා. හැබැයි, ඒ දුෂ්කර තත්ත්වය -යුද තත්ත්වය- තුළත් ඒ ගම්බිම් අත්හැර නොගිය පවුල් ප්‍රමාණයකුත් ඒ ගම්වල ජීවත් වෙනවා. කොහොම වුණත්, ගරු රොෂාන් රණසිංහ මැතිතුමා වාරිමාර්ග අමාත්‍යවරයා හැටියට ඉකුත් දා -2022 දී- සිටියදී, මේ ගම්වලට, මේ ගොවි ජනතාවට වෙන් වෙච්ච හෙක්ටෙයාර 14,000, හෙක්ටෙයාර 9,000 දක්වා අඩු කරලා තිබෙනවා. හෙක්ටෙයාර 14,000න්, හෙක්ටෙයාර 3,000ක් ඒ ප්‍රදේශයේ ජීවත් වෙන දෙමළ ජනතාවගේ ගවයන් සඳහා තණ බිම් හැටියට වෙන් කර තිබෙනවා. ඒ වාගේම හෙක්ටෙයාර 9,000ක් ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දීමට වෙන් කරලා තිබෙනවා. එතකොට හෙක්ටෙයාර දෙදහස් ගණනයි ගොවීන් සඳහා වෙන් කර තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මේක සිංහල, දෙමළ, මුස්ලිම් කියන තුන්ගොල්ලන්ටම සිද්ධ වෙච්ච බලවත් අසාධාරණයක්. ඒ නිසා ඓතිහාසිකව ඒ ගම්වරයන්ට පැවරුණු, මහවැලි "බී" කලාපයෙන් වෙන් කරන ලද ඒ ඉඩම් ප්‍රමාණය ඒ ගොවි ජනතාවට ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. මේ වෙලාවෙත් ඒ ප්‍රදේශයේ අක්කර 5,000කට වඩා වගා කර තිබෙනවා. ඒ ප්‍රදේශයේ වගා කටයුතු කරන පවුල් 513ක් දැනටත් ඉන්නවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය හැටියට ඒ ඉඩම් ටික කරුණාකර ඒගොල්ලන්ට ලබා දීමට අවශ්‍ය පියවර වහාම ගන්න කියන යෝජනාව මම කරනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා -ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා- මහිනුයි වාරිමාර්ග අමාත්‍යතුමිය වෙත මම මේ දෙවන අතුරු ප්‍රශ්නයත් යොමු කරන්නේ. මම දන්නා තරමින් මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තකුත් තිබෙනවා.

මෙහිදී බාධාවක් තිබෙනවා නම්, ඒ බාධාව මොකක්ද කියන එක සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවක් පවත්වා මේ සඳහා කඩිනම් පියවර ගන්න කියන යෝජනාව මහදිවුල්පතාන ගම්මානයේ අහිංසක ජනතාව වෙනුවෙන් මම කරනවා. අපි පසුගිය කාලයේ දැක්කා, හමුදාව දාලා, තමන්ගේ අම්මාට කෑම එකක්වත් ගෙනියන්න ගමේ ජනතාවට ඉඩ දුන්නේ නැති බව. ඒ නිසා ජනතාව අත් විඳින මේ පීඩාකාරී තත්ත්වය නැති කිරීම සඳහා කඩිනමින් විශේෂ මැදිහත්වීමක් කරලා මේ පුරාතන -ඉපැරණි- ගම්මාන රකින්න අවශ්‍ය පියවර වහාම ගන්න කියන යෝජනාවත් ඔබතුමා මඟින් වාරිමාර්ග අමාත්‍යතුමිය වෙත මම යොමු කරනවා. මේ අතුරු ප්‍රශ්න දෙකටම පිළිතුරු ලිඛිතව ලබා දෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -3367/2023- (1), ගරු මයන්ත දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය: විස්තර
### பெருந்தோட்டப் பிராந்தியத்திற்கான புதிய கிராமங்கள் அதிகாரசபை: விபரம்
### NEW VILLAGE AUTHORITY FOR PLANTATION REGION: DETAILS

3485/2023

**3. ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වතුකරයේ වැවිලි කලාපවල සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම වෙනුවෙන් වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම අධිකාරියේ පරිපාලන ව්‍යුහය කවරේද;

(iii) එම අධිකාරිය සඳහා මේ වනවිට පත් කර ඇති නිලධාරින්ගේ නම් කවරේද,

(iv) එම පත්වීම් සිදු කිරීමේදී සලකා බලන ලද සුදුසුකම් එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත අධිකාරියේ අරමුණු කවරේද;

(ii) එම අධිකාරිය විසින් ඉටු කරනු ලබන කාර්යයන් කවරේද;

(iii) එම අධිකාරියේ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් සැලසුම් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மலையக பெருந்தோட்டப் பிரதேசங்களில் அபிவிருத்தித் திட்டங்களை முன்னெடுப்பதற்காக "பெருந்தோட்டப் பிராந்தியத்திற்கான புதிய கிராமங்கள் அதிகாரசபை" நிறுவப்பட்டுள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அதிகாரசபையின் நிர்வாகக் கட்டமைப்பு யாதென்பதையும்;

(iii) மேற்படி அதிகாரசபைக்கு தற்போது நியமிக்கப் பட்டுள்ள அலுவலர்களின் பெயர் விபரங்கள் யாவை என்பதையும்;

(iv) இந்நியமனங்கள் வழங்கப்படுகையில், கவனத் திற்கொள்ளப்பட்ட தகைமைகள் ஒவ்வொரு பதவியின் அடிப்படையில் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) மேற்படி அதிகாரசபையின் நோக்கங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி அதிகாரசபையால் நிறைவேற்றப்படும் கருமங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அதிகாரசபையின் எதிர்காலப் பணிகளைச் செயற்படுத்தத் திட்டங்கள் வகுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) அவ்வாறாயின், அது தொடர்பான விபரங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Estate Infrastructure Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the New Village Authority for Plantation Region has been established for carrying out development projects in the estates of the plantation region;

(ii) the administrative structure of that Authority;

(iii) the names of the officers who have been appointed to that Authority so far; and

(iv) separately for each post, the qualifications considered in making the aforesaid appointments?

(b) Will he also inform this House -

(i) the objectives of the aforesaid Authority;

(ii) the functions performed by the aforesaid Authority; and

(iii) whether the aforesaid Authority plans to conduct new programmes in future; and

(iv) if so, details of the aforesaid programmes?

(c) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த வாரம் பெருந்தோட்டத்துறை தொடர்பாக கேட்கப்பட்ட வினாவுக்கும் விடையளிக்கப்படவில்லை. இந்த வாரம் கேட்கப்பட்ட வினாவுக்கும் விடையளிக்கப்படவில்லை. ஆகவே, இந்தச் சபையிலே இருக்கின்றவர்கள் பெருந்தோட்டத்துறையிலே இருக்கின்ற மலையக மக்களினது பிரச்சினைகளை ஓரங்கட்டுவதற்காக இவ்வாறு செய்கின்றார்களா? அல்லது அமைச்சர்கள் தங்களது பொறுப்புக்கூறலை நிறைவேற்றாமல் இருக்கின்றார்களா என்பது தொடர்பாக நீங்கள் கூற வேண்டும். நாங்கள் காலையில் இருந்து இந்தக் கேள்விகளுக்கான விடைகளைப் பெறுவதற்காக இங்கே காத்துக்கொண்டு இருக்கின்றோம். ஆனால், அமைச்சர் அவர்கள் பொறுப்பற்ற வகையிலே, தொடர்ச்சியாக கால அவகாசம் கேட்டுக்கொண்டு இருக்கிறார்கள்.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මේ ප්‍රශ්නයට පිළිතුරු ගරු ඇමතිතුමා මට එවා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවොත්, ඒකට පිළිතුරු දෙන්න බැරි නිසා තමයි මම ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා නොදුන්නේ.

ගරු කථානායකතුමනි, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා පළමුවන වතාවට තමයි මෙම ප්‍රශ්නය ගරු සභාවේදී අහන්නේ. ස්ථාවර නියෝග අනුව, ප්‍රශ්නයක් අහන්න ගරු මන්ත්‍රීවරයෙකුට අවස්ථා තුනක් ලබා දෙනවා. හැබැයි, තුන්වන අවස්ථාවේදීවත් ඊට පිළිතුරු දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලීමක් කරනවා නම් මට ඒ ප්‍රශ්නයට පිළිතුර සභාගත කරන්න පුළුවන්. මම මේ කාරණයත් වගකීමෙන් කියනවා. ගරු ජීවන් තොණ්ඩමන් ඇමතිතුමා වතුකරයේ ජනතාව වෙනුවෙන් විශාල කැපවීමකින් කටයුතු කරනවා. එතුමා මේ වෙනකොට වතුකරයේ ජනතාවට ඉඩම් පවා ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම එතුමා අධ්‍යාපන හා යටිතල පහසුකම් වෙනුවෙනුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඔබතුමා එතුමා එක්ක එකතු වුණොත් වතුකරයේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්නත් පුළුවන්.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයට පිළිතුරක් තිබෙනවා නම් එය ලබා දෙන්න කියන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මම සභාගත කරන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු කථානායකතුමනි, මම යොමු කර තිබෙන්නේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් නේ. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, එම නිසා ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුර ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු කථානායකතුමනි, ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්. වැවිලි කලාපයේ නව ගම්මාන සංවර්ධනය උදෙසා වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇත.

(ii) ආයතනයේ පරිපාලන ව්‍යුහය:

අධිකාරියේ කළමනාකරණ සහ පරිපාලන ව්‍යුහය සඳහා කළමනාකරණ මණ්ඩලයක් ඇති කළ යුතු අතර, එය නිල බලයෙන් පත්වන සාමාජිකයන් 07 දෙනෙකුගෙන්ද, අධිකාරිය

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

අයත් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 06දෙනෙකුගෙන්ද සමන්විත වේ.

මේ අතරින් එක් සාමාජිකයෙකු කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබයි. එසේම, ගරු අමාත්‍යතුමා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත පත් කරනු ලබයි. මෙම අධිකාරියේ පරිපාලන කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක: DMS/1849 හා 2019.08.15 දිනැති ලිපිය මඟින් තනතුරු 28ක් අනුමත කර ඇත.

| | තනතුර | නිලධාරි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 02 | අධ්‍යක්ෂ | 02 |
| 03 | ප්‍රාදේශීය අධ්‍යක්ෂ | 01 |
| 04 | සහකාර අධ්‍යක්ෂ | 02 |
| 05 | ගණකාධිකාරි | 01 |
| 06 | නීති නිලධාරි | 01 |
| 07 | පරිපාලන නිලධාරි | 01 |
| 08 | තාක්ෂණ නිලධාරි | 02 |
| 09 | භාෂා පරිවර්තක | 02 |
| 10 | ගිණුම් සහකාර | 01 |
| 11 | සංවර්ධන නිලධාරි | 02 |
| 12 | කළමනාකරණ සහකාර | 03 |
| 13 | රියදුරු | 04 |
| 14 | කාර්යාල කාර්ය සහායක | 05 |
| | එකතුව | 28 |

(iii) අධිකාරිය සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමට 2022 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන්වී ඇති නමුත්, ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, අංක 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛය මඟින් කල් තබා ඇත. ඒ අනුව ස්ථිරව බඳවා ගන්නා තෙක් අධිකාරිය වෙත කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2023.02.20 දින අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ සමාලෝචන කමිටුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර, එම අනුමැතිය ලැබෙන තෙක් වැඩබලන පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් කාර්ය මණ්ඩලය පත් කර ඇත.

01. අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) - ටී.ඩී. බංගමුව මහත්මිය
02. ගණකාධිකාරි (වැ.බ) - එම්.එම්. මිල්ලත් මහීර් මහතා
03. ප්‍රාදේශීය අධ්‍යක්ෂ (කොන්ත්‍රාත්) - එස්. රූබදර්ශන් මහතා
04. සංවර්ධන නිලධාරි (වැ.බ) - ආර්.බී. දිවාරත්න මහතා
05. සංවර්ධන නිලධාරි (වැ.බ) - ඩබ්ලිව්.වී.එන්. කුමුදුනී මෙනෙවිය
06. කළමනාකරණ සහකාර (වැ.බ) - ඩබ්ලිව්.ඒ.සී. පෙරේරා මහතා
07. රියදුරු (කොන්ත්‍රාත්) - පී. රමේෂ් මහතා
08. රියදුරු (කොන්ත්‍රාත්) - ටී.පී. පුෂ්පකුමාර මහතා
09. රියදුරු (කොන්ත්‍රාත්) - අයි.සී.කේ. කහටපිටිය මහතා
10. කාර්යාල කාර්ය සහයක (කොන්ත්‍රාත්) - එස්. මුනියප්පන් මහතා

(iv) ඔව්. පත්වීම් සිදු කිරීමේදී සලකා බලන ලද සුදුසුකම් එක් එක් තනතුරු අනුව පහත පරිදි වේ.

| | තනතුර | බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවම සුදුසුකම් | පත්කර ඇති නිලධාරියාගේ නම | පත්වීම | පත්කිරීමේ ස්වභාවය / බලය ලබාදීම | පත්කල නිලධාරියාගේ සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය සමඟ තනතුරට අදාල අවම අවුරුදු 18ක පළපුරුද්ද. | ටී.ඩී. බංගමුව මහත්මිය | වැඩ බලන පදනම මත (අමාත්‍යාංශ නිලධාරි) | පනතේ විධිවිධාන අනුව, (අධ්‍යක්ෂ ජනරාල් කෙනෙකු නොමැති විට අමාත්‍යතුමාගේ අභිමතය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු අතුරින් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් පත්කිරීම සිදුකල යුතුවේ. ඒ අනුව අමාත්‍යතුමා විසින් හා 2021.10.14 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ පත්කර ඇත. | 01. විද්‍යාවේදී ප්‍රථම උපාධිය (ජීව විද්‍යා) - රුහුණු විශ්ව විද්‍යාලය<br>02. විද්‍යාපති උපාධිය (MSC) - බැංකොක් විශ්ව විද්‍යාලය<br>03. වසර 24ක රාජ්‍ය සේවා පළපුරුද්ද |
| 02 | ගණකාධිකාරි | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධිය සහ තනතුරට අදාල අවම අවුරුදු 01ක පළපුරුද්ද | එම්.එම්. මිල්ලත් මහීර් මහතා | වැඩ බලන පදනම මත (අමාත්‍යාංශ නිලධාරි) | අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇත. | 01. පශ්චාත් උපාධි ඩිප්ලෝමා (බැංකු කරණය හා මූල්‍ය කරණය) - කොළඹ විශ්ව විද්‍යාලය<br>02. පශ්චාත් උපාධිය (MBA) (ව්‍යාපාර පරිපාලනය - මූල්‍ය කරණය) - කොළඹ විශ්ව විද්‍යාලය<br>03. වසර 34ක රාජ්‍ය සේවා පළපුරුද්ද |
| 03 | ප්‍රාදේශීය අධ්‍යක්ෂ | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධිය සහ තනතුරට අදාල අවම අවුරුදු 03ක පළපුරුද්ද. | එස්. රූබදර්ශන් මහතා | කොන්ත්‍රාත් පදනම මත | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | 01. මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධි - යාපනය විශ්ව විද්‍යාලය<br>02. අවුරුදු 03ක පළපුරුද්ද |

| | තනතුර | බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවම සුදුසුකම් | පත්කර ඇති නිලධාරියාගේ නම | පත්වීම | පත්කිරීමේ ස්වභාවය / බලය ලබාදීම | පත්කල නිලධාරියාගේ සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| 04 | සංවර්ධන නිලධාරි | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම උපාධිය | ආර්.බී. දිවාරත්න මහතා | වැඩ බලන පදනම මත (අමාත්‍යාංශ නිලධාරි) | අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇත. | 01. රාජ්‍ය කළමනාකරණ උපාධිය (විශේෂ)<br>02. අවුරුදු 05ක රාජ්‍ය සේවා පළපුරුද්ද |
| | | | ඩබ්.වී.එන්. කුමුදුනී මෙනවිය | වැඩ බලන පදනම මත (අමාත්‍යාංශ නිලධාරි) | අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇත. | 01. ශාස්ත්‍රවේදී කලා උපාධිය (සාමාන්‍ය) - කැළණිය විශ්ව විද්‍යාලය<br>02. අවුරුදු 03ක රාජ්‍ය සේවා පළපුරුද්ද |
| 05 | කළමනාකරණ සහකාර | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයන් හතරකට සම්මාන සහිතව එක් වරකදී විෂය හයක් සමත් වීම (සිංහල / දෙමළ හා ගණිතය සම්මාන) සමඟ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත් වීම | ඩබ්.ඒ.සී. පෙරේරා මහතා | වැඩ බලන පදනම මත (අමාත්‍යාංශ නිලධාරි) | අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇත. | 01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන 05ක් සමඟ විෂයන් 08ක් සමත්වීම<br>02. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් විෂයන් 03ක් සමත්වීම<br>03. අවුරුදු 10ක රාජ්‍ය සේවා පළපුරුද්ද. |
| 06 | රියදුරු | දෙවරකට නොවැඩි වාර ගනනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අවම සම්මාන 02ක් සහිතව විෂයන් 06 ක් සමත්වීම සහ බර වාහන රියදුරු බලපත්‍රය සහ බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම අවුරුදු 03ක පළපුරුද්ද. | පී. රමේෂ් මහතා | කොන්ත්‍රාත් පදනම මත | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | 01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන 03ක් සමඟ විෂයන් 07ක් සමත්වීම<br>02. සැහැල්ලු රියදුරු බලපත්‍රය සමඟ අවුරුදු 06ක පළපුරුද්ද. |
| | | | ටී.පී. පුෂ්පකුමාර මහතා | කොන්ත්‍රාත් පදනම මත | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | 01. බර වාහන පුහුණුව (NVQ Level 03) ලබාගෙන ඇත. බරවාහන රියදුරු බලපත්‍රය<br>02. අවුරුදු 15ක පළපුරුද්ද. |
| | | | අයි.සී.කේ. කහටපිටිය මහතා | කොන්ත්‍රාත් පදනම මත | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | 01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන 03ක් සමඟ විෂයන් 07ක් සමත්වීම<br>02. බරවාහන රියදුරු බලපත්‍රය සමඟ අවුරුදු 05ක පළපුරුද්ද. |
| 07 | කාර්යාල කාර්ය සහයක | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අවම විෂයන් 06කින් සමත් වීම. | එස්. මුනියප්පන් මහතා | කොන්ත්‍රාත් පදනම මත | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | 01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන 03ක් සමඟ විෂයන් 06ක් සමත්වීම. |

(ආ) (i) අධිකාරියේ අරමුණු:

- වැවිලි කලාපයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් නම් කළ ප්‍රදේශවල වැවිලි ප්‍රජාව ප්‍රධාන සමාජ ධාරාවට ඇතුළත් කිරීම සහතික කිරීම.
- හඳුනාගත් ප්‍රදේශවල වැවිලි ප්‍රජාව, ඔවුනට ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි වන පරිදි සමාජමය හා ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම.

(ii) අධිකාරිය විසින් ඉටුකරනු ලබන කාර්යයන්:

01. අමාත්‍යවරයා විමසා, නම් කළ ප්‍රදේශවල නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සැලසුම් වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
02. අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා ක්‍රියා කිරීමේදී වැවිලි කලාපයේ අනෙකුත් ජාතික, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
03. නව ගම්මාන සංවර්ධනය සඳහා වූ ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැදීමේදී සහ නම් කළ ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේදී වැවිලි කලාපයේ ප්‍රජාමූල සංවිධානවල සහභාගීත්වය සහතික කිරීම.
04. නම් කළ ප්‍රදේශවල වතුවල ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා එම පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු නිකුත් කිරීම පහසු කරලීම.
05. නම් කළ ප්‍රදේශවල වතු අංශයේ සිටින තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතීයික හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීම සඳහා සහාය සැලසීම.
06. නම් කළ ප්‍රදේශවල ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවා සැපයීම පහසු කරලීම සඳහා පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවල ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල සමඟ කටයුතු කිරීම.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

07. නම් කළ ප්‍රදේශවල වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මඟ පෙන්වීම හා යෙදවුම් සැපයීම.

08. තම ජීවනෝපාය මාර්ග නඟා සිටුවීම සඳහා කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ද ඇතුළු වතු අංශයේ විවිධ ප්‍රජා කණ්ඩායම් සවිබල ගැන්වීම.

09. නම් කළ ප්‍රදේශවල වතුවල පිහිටි නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ගෙන් පැවැතෙන්නන්ටද එම නීත්‍යානුකූල පදිංචි කරුවන් විසින් භුක්ති විඳිනු ලබන සියලු පහසුකම් සලසන බවට තහවුරු කිරීම.

10. නම් කළ ප්‍රදේශවල භූමි සහ ජල මූලාශ්‍රවල භෞතික පහත වැටීම් අවම කිරීමේ සහ පරිසර දූෂණය තුරන් කිරීමේ අරමුණින් නිවාරක සහ ප්‍රතිකර්මය යන දෙයාකාරයෙන්ම වූ සංරක්ෂණ පියවර සියලු මට්ටම්වලදී ශක්තිමත් කිරීම.

11. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය විමසා නම් කළ ප්‍රදේශවල උවදුරු සහිත ප්‍රදේශ හඳුනා ගැනීම සහ නේවාසික කාර්ය සඳහා නීති විරෝධී ලෙස පදිංචිවීම්වලින් ආරක්ෂා කර ගනිමින් ඒවා විකල්ප ඵලදායී භාවිතයට හැරවීම සහ

12. නම් කළ ප්‍රදේශවල ප්‍රමාණවත් සමාජ සේවා සහ ප්‍රමාණවත් තිරසර යටිතල පහසුකම් සැලසීම ප්‍රවර්ධනය කිරීම.

(iii) ඔව්.

(iv) අධිකාරියේ ඉදිරි සැලසුම්:

අධිකාරිය ආයතනික කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම සහ වර්තමාන කාර්ය මණ්ඩලය මත පදනම්ව අධිකාරිය වෙත පවරා ඇති සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා 2023-2025 වර්ෂයන්ට අදාළව මධ්‍ය කාලීන වශයෙන් සැලසුම් මේ වන විට සකස් කර ඇත. ඒ අනුව අධිකාරිය වෙත පවරා ඇති,

- නම් කළ ප්‍රදේශවල වතුවල ඉදි කර ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා හිමිකම් ඔප්පු නිකුත් කිරීම පහසු කරලීම.
- නම් කළ ප්‍රදේශවල වතු අංශයේ සිටින තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය උදෙසා තෘතීයික හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම.
- නම් කළ ප්‍රදේශවල වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මඟ පෙන්වීම හා යෙදවුම් සැපයීම.
- නම් කළ ප්‍රදේශවල වතුවල පිහිටි නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ගෙන් පැවැතෙන්නන්ටද එම නීත්‍යානුකූල පදිංචිකරුවන් විසින් භුක්ති විඳිනු ලබන සියලු පහසුකම් සලසන බවට තහවුරු කිරීම.

ඉහත සඳහන් කාර්යයන් ආවරණය වන පරිදි සකස් කරන ලද එම මධ්‍ය කාලීන සංයුක්ත සැලසුම යටතේ පහතින් දක්වා ඇති ක්‍රියාමාර්ග ගෙන ඇත.

නීත්‍යානුකූල වතු නිවාස ප්‍රතිලාභීන් පිළිබඳ දත්ත හා තොරතුරු රැස්කොට දත්ත පද්ධතියක් සකස් කර පවත්වා ගැනීම හා ඉදිරි වසර 03 ඇතුළත අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද මෙතෙක් ඉඩම් හිමිකම් නොලැබූ වතු නිවාස ප්‍රතිලාභීන් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු ලබා දීම හා සමස්ත වතු ප්‍රජාවගේ නිවාස ගැටලු විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම.

වතු අංශයේ අවිධිමත් රැකියාවල නිරත තරුණ තරුණියන් සඳහා විධිමත් රැකියා අවස්ථා හිමිකර දීමට සැලසුම් සකස් කිරීම. ඒ වෙනුවෙන්,

i. නිසි පුහුණුවක් නොමැතිව විවිධ විෂය පථයන්හි අවම දෛනික දීමනා මත සේවයේ නියුතු තරුණ තරුණියන් සඳහා සිය සේවා පළපුරුද්ද අනුව වෘත්තීය පුහුණු සහතික ලබාදීමට (NVQ 03 හා NVQ 04) වැඩ පිළිවෙළ සකස් කිරීම.

ii. වතු ප්‍රදේශයන්හි සංචාරක හා කර්මාන්ත අංශයන්හි රැකියා අවස්ථා ඇති කරදීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය හා අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව කටයුතු කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න දෙක මම ඉදිරිපත් කරන්නම්, උත්තර පසුව ලබා ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනින් ඉදිරිපත් කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මේක මට තිබෙන වරප්‍රසාදයක් නේ, ගරු කථානායකතුමනි. මම අතුරු ප්‍රශ්න දෙක ඉදිරිපත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන ප්‍රශ්න කළේ නැහැ නේ. ඔබතුමා අතුරු ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ சபாநாயகர் அவர்களே, நீங்கள் கோபமடையத் தேவையில்லை. நாங்கள் தேவையான நேரத்தில் மாத்திரமே எங்களுடைய சிறப்புரிமையைப் பயன்படுத்திக் கொள்கிறோம்.

பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை நிறுவப்பட்டிருப்பது, மலையகப் பெருந்தோட்டப் பகுதிகளிலே புதிய கிராமங்களை நிர்ணயிப்பதற்கும் அவற்றை அபிவிருத்தி செய்வதற்கும் ஆகும். மலையக மக்களின் அபிவிருத்திக்குரிய ஒரேயோர் அதிகாரசபையாக இது விளங்குகின்றது. ஆனால், 2023ஆம் வருட வரவு செலவுத்திட்டத்திலே இதற்கு எவ்வித நிதி ஒதுக்கீடும் செய்யப்படவில்லை. அடுத்த வருடத்திற்கும் மிகச் சொற்பமான தொகையாக 5 மில்லியன் ரூபாய் மூலதனச் செலவினமாக மட்டும்தான் ஒதுக்கப் பட்டிருக்கின்றது. எனவே, இந்த அதிகாரசபை ஓரம் கட்டப்படுவது ஏன் என்பது எனது முதலாவது மேலதிக் கேள்வியாக இருக்கின்றது.

இரண்டாவது கேள்வி: இந்த அதிகாரசபையின் எதிர்கால நிகழ்ச்சித் திட்டங்களிலே மக்களினது சமூக அபிவிருத்தி தொடர்பாகவும் வேலைவாய்ப்புத் தொடர் பாகவும் புள்ளிவிபரங்களைச் சேகரிப்பது தொடர்பாகவும் சமூக அபிவிருத்தி நலன்கள் தொடர்பாகவும் குறிப்பிடப் பட்டிருக்கின்றதே ஒழிய, இந்த அதிகாரகாரசபை உருவாக் கப்பட்ட அடிப்படை நோக்கமான புதிய கிராமங்களை அமைப்பது, வீட்டுத் திட்டத்தை முன்னெடுப்பது பற்றிய விடயங்களையெல்லாம் பெருந் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச் சின்கீழ் வரும் PHDTஇன் ஊடாக வெவ்வேறு தாபனங் களுக்கு ஒதுக்கி, அரசினால் அதிகாரமளிக்கப்பட்ட, அரசின் மேற்பார்வையின்கீழ் அரச அமைப்புக்குள் வருகின்ற இந்த அதிகாரசபை ஓரம் கட்டப்பட்டு, இவ்வாறு தங்களுக்கு வசதியான, தங்களுக்கு ஏற்ற வகையிலான துறைகளுக்கு நிதியை ஒதுக்குவது ஏன் என்பது தொடர்பாக இந்தச் சபைக்குத் தெளிவுபடுத்துமாறு கேட்டுக்கொள்கின்றேன்.

## මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය : වැය කළ මුදල
## மாகம் றுஹுணுபுர சர்வதேச மாநாட்டு நிலையம்: செலவிடப்பட்ட தொகை
## MAGAM RUHUNUPURA INTERNATIONAL CONVENTION CENTRE: AMOUNT SPENT

3665/2023

**4. ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ ඉදිකිරීම් ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදි කිරීම් විදේශ ආයතනයක් විසින් සිදු කරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කර ඇති රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(iii) එම සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாகம் றுஹுணுபுர சர்வதேச மாநாட்டு நிலையத்தை நிர்மாணிப்பதற்காக செலவிடப் பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி மாநாட்டு நிலையத்தை நிர்மாணிப் பதற்காக வெளிநாட்டு நன்கொடைகள் கிடைக்கப்பெற்றனவா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி ஒவ்வொரு வெளிநாட்டு நன்கொடையின் பெறுமதி தனித்தனியாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மாநாட்டு நிலையத்தை நிர்மாணிப் பதற்காக கேள்வி மனுக்கள் கோரப்பட்டனவா என்பதையும்;

(ii) இல்லையெனில், குறித்த கட்டுமான நிறுவனம் தேர்ந்தெடுக்கப்பட்ட முறையியல் யாதென் பதையும்;

(iii) மாநாட்டு நிலையத்தின் நிர்மாணப் பணிகள் வெளிநாட்டு நிறுவனமொன்றினால் மேற்கொள் ளப்பட்டிருப்பின், அதன் இலங்கை முகவர் யார் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மாநாட்டு நிலையத்தை நிர்மாணிப்பதற்காக செலவிடப்பட்டுள்ள அரசாங்க நிதியின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நிதி பெறப்பட்ட நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி மாநாட்டு நிலையம் திறக்கப்பட்ட திகதி தொடக்கம் இதுவரையில் அதன் வருமானம் மற்றும் செலவினம் ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු ලලිත් එල්ලාවල මහතා]

asked the Minister of Urban Development and Housing:

(a) Will he inform this House -

(i) the amount spent to construct Magam Ruhunupura International Convention Centre;

(ii) whether foreign donations were received for the construction of the aforesaid centre; and

(iii) if so, separately, the value of each foreign donation?

(b) Will he also inform this House -

(i) whether tenders had been called to construct the aforesaid convention centre;

(ii) if not, the procedure followed to select the relevant construction company; and

(iii) if the construction of the convention centre had been carried out by a foreign company or its Sri Lankan agent?

(c) Will he further inform this House -

(i) the amount of government funds spent for the construction of the convention centre;

(ii) the institutions the funds were obtained from; and

(iii) separately, the income and the expenditure of the convention centre from the date it was declared open, according to each year?

(d) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රු. 4,682,074,596කි.

(ii) ඔව්. කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය - Korea International Co-operation Agency - KOICA.

(iii) ඇමෙරිකානු ඩොලර් මිලියන 6.4කි.

(ආ) (i) නැත.

(ii) අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අදාළ ඉදිකිරීම් ආයතනය තෝරාගෙන ඇත. ඇමුණුම් 01 සහ 02හි විස්තර දක්වා ඇත.

(iii) DAEBO Engineering & Construction Company Limited විසින් සිදු කරන ලදී.

(ඇ) (i) රු. 3,830,874,596කි.

(ii) මහා භාණ්ඩාගාරයෙන් රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දෙන ලදී.

(iii) ඇමුණුම 03හි දක්වා ඇත.

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විතයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ පරිදි ටෙන්ඩර් කැඳවීමකින් තොරව, නියමානුකූල නොවූ ක්‍රමවේදයක් ඔස්සේ එම ඉදිකිරීම් ආයතනය තෝරා ගත්තේ නම් ඒ සඳහා සලකා බැලූ අනෙක් ආයතන කවරේද, එලෙස තෝරාගත් ආයතනයේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් සහ ලිපින කවරේද කියන කාරණා මම පළමු අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්නද?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ඔව්, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න. එතකොට මට පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

මෙය ඉතා වැදගත්, පහසුකම් සියල්ල සහිත ශාලාවක්. මා දන්නා තරමින් එම සම්මන්ත්‍රණ ශාලාව BMICH එකටත් - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවටත්- වඩා පහසුකම් තිබෙන ශාලාවක්. නමුත්, මා දන්නා තරමින් එහි ජාතික මට්ටමේ හෝ ජාත්‍යන්තර මට්ටමේ සමුළු 4ක් පමණ සංඛ්‍යාවක් තමයි පවත්වා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලයීය සමුළුව පැවති කාලයේ -ඒ කියන්නේ, වර්ෂ 2012 විතර වන කොට- මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ එම සමුළුව නොපවත්වන්නේ ඇයි කියලා ප්‍රශ්නයක් ඇහුවා මට මතකයි. මම පළාත් සභාවේ හිටපු කාලයේ ඒ ප්‍රශ්නය මතු වුණාම ඒ වෙලාවේ කිව්වේ, එවැනි සමුළු පැවැත්වීම සඳහා අවශ්‍ය හෝටල් පහසුකම් ඒ අවට නොමැති නිසා ඒ සමුළුව හම්බන්තොට ශ්‍රවණාගාරයේ පවත්වන්න බැහැ කියලායි. ගරු ඇමතිතුමනි, දැන් ඒ අවට හෝටල් පහසුකම් තිබෙනවා; තරු පහේ හෝටල් දෙකකට වඩා තිබෙනවා. ඒ වාගේම, අධිවේගී මාර්ග තිබෙනවා; ගුවන් තොටුපළ තිබෙනවා. මා දන්නා තරමින් ඒ සියලු දේවල් තිබුණත් මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව පාඩුවට තමයි දැනුත් පවත්වාගෙන යන්නේ. එහි සම්මන්ත්‍රණ පවත්වන්නේ නැහැ. බිලියන ගණනක් වියදම් කරලා, නාස්ති කරලා හැදුවාට මා දන්නා තරමින් මේ වන කොට එහි සම්මන්ත්‍රණ හතරයි පවත්වා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මහජන මුදල් එක්ක ඒ වාගේ සෙල්ලම් කරලා එදා වංචනික පසුබිමක් යටතේ හදපු ඒ සම්මන්ත්‍රණ ශාලාව ලාභ ලබන තත්ත්වයකට ගන්නේ කවදාද කියලා. ඒක දැන් මී ගව ගාලක් බවට පරිවර්තනය වෙලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඒ තීන්දු අරගෙන ඒ විධියට මුදල් නාස්ති කරපු අයට නීතිමය දඬුවම් දිය යුතු නැද්ද කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, තොරතුරු ලබාගෙන, එතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට ඉදිරියේදී පිළිතුර ලබා දෙන්න මා කටයුතු කරන්නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මන්ත්‍රීතුමනි, දෙවන කාරණාව ඔබතුමා කියපු ආකාරයටම ඉතා වැදගත්. දකුණු හම්බන්තොට සංවර්ධන සැලැස්ම, ගුවන් තොටුපොළ, වරාය, සම්මන්ත්‍රණ ශාලාව ද ඇතුළත්ව දියුණු කරන්න ආරම්භ කරපු වැඩ පිළිවෙළක්. ඒක ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන කරපු කටයුත්තක්, ගරු කථානායකතුමනි. ගුවන් තොටුපොළත්, වරායත් සංවර්ධනය කිරීම ඉතිහාසයේ ඉඳන් -අවුරුදු ගණනාවක් තිස්සේ- යෝජනා වෙමින් ආපු කාරණාවක්. හදිස්සියේ උලුප්පා කියන්න හදනවා ඒවා රාජපක්ෂලා නිසා හැදුවා කියලා. ජාතික සැලසුම් ආයතනයේ තිබෙන ලේඛන දිහා බැලුවොත් ඔබතුමන්ලාට පෙනේවි, එය ඈත කාලයේ ඉඳන් යෝජනා කරපු දෙයක් බව.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේ මම පිළිගන්නවා. රටේ පැවති ආර්ථික අර්බුදය, ඊට පෙර තිබුණු යුද්ධය වාගේම වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය නිසාත්, සංචාරකයන් ආවේ නැතිව ආදායම් අහිමි වීම නිසාත් ලොකු ලොකු වියදම් දරන්න බැරි මට්ටමක්, ලොකු ලොකු ව්‍යාපෘති කරන්න බැරි මට්ටමක් ඇති වුණා. හැබැයි ගරු කථානායකතුමනි, මම පෞද්ගලිකව විශ්වාස කරනවා රජයේ දායකත්වය කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ දායකත්වයෙන් හෝ එකී සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයත් සංවර්ධනය කරන්න ඕනෑ කියලා. දැනට BMICH එක ලබා දී තිබෙන ආකාරයට එයත් market කරලා, වැඩක් කරන්න පුළුවන් කණ්ඩායමකට ලබා දීලා දියුණු කරන්න පුළුවන් නම් හොඳයි කියා මම හිතනවා. ඒ පිළිබඳව සාකච්ඡා වෙමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -3681/2023- (1), ගරු වඩිවේල් සුරේෂ් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## කුරුඳු නිෂ්පාදනය සහ අපනයනය: විස්තර
### கறுவா உற்பத்தி மற்றும் ஏற்றுமதி: விபரம்
### PRODUCTION AND EXPORT OF CINNAMON: DETAILS

3367/2023

**2. ගරු හර්ෂණ රාජකරුණා මහතා (ගරු මයන්ත දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா - மாண்புமிகு மயந்த திசாநாயக்க சார்பாக)
(The Hon. Harshana Rajakaruna on behalf of the Hon. Mayantha Dissanayake)
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) රජය සහ පෞද්ගලික අංශය සතු කුරුඳු ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කුරුඳු නිෂ්පාදනයෙන් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාව කුරුඳු අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) වාර්ෂිකව අපනයනය කරනු ලබන කුරුඳු ප්‍රමාණය කොපමණද;

(iv) කුරුඳු අපනයනය කිරීමෙන් උපයනු ලබන වාර්ෂික අපනයන ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கறுவா செய்கை மேற்கொள்ளப் படுகின்ற பிரதேசங்கள் யாவை என்பதையும்;

(ii) அரசிற்கும் தனியார் துறையினருக்கும் சொந்தமான காணிகளின் அளவு தனித்தனியே யாதென்பதையும்;

(iii) கறுவா உற்பத்தியின்மூலம் ஈட்டப்படும் வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையின் கறுவா ஏற்றுமதி செய்யப் படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அந்நாடுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) வருடாந்தம் ஏற்றுமதி செய்யப்படும் கறுவாவின் அளவு யாதென்பதையும்;

(iv) கறுவா ஏற்றுமதியின்மூலம் ஈட்டப்படும் வருடாந்த ஏற்றுமதி வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform the House -

(i) in which areas cinnamon is cultivated in Sri Lanka;

(ii) what are extents of government-owned and privately-owned cinnamon lands, separately; and

(iii) what income is derived annually from cinnamon production?

(b) Will he also inform the House -

(i) whether Sri Lanka's cinnamon is exported;

(ii) if so, to what countries cinnamon is exported;

(iii) the volume of cinnamon exported annually; and

(iv) the income derived annually from exporting cinnamon?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගාල්ල, මාතර, කළුතර, හම්බන්තොට, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන වශයෙන්ද බදුල්ල, කොළඹ, අනුරාධපුරය, කුරුණෑගල, මහනුවර, පොළොන්නරුව, මාතලේ, මොනරාගල, අම්පාර, ගම්පහ, කෑගල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි සුළු වශයෙන්ද කුරුඳු වගා කරයි.

(ii)

| දිස්ත්‍රික්කය | රජය සතු කුරුඳු ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) | පෞද්ගලික අංශය සතු ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර) | |
|---|---|---|---|
| | | ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු ඉඩම් ප්‍රමාණය | පුද්ගලික වගාකරුවන් සතු කුරුඳු ඉඩම් ප්‍රමාණය |
| මාතලේ | 81 | 5 | 331 |
| කෑගල්ල | 39 | 29 | 431 |
| ගාල්ල | | 258 | 12016 |
| නුවරඑළිය | | 33 | 27 |
| රත්නපුරය | | 690 | 4472 |
| කළුතර | | 404 | 2326 |
| මාතර | | 189 | 9453 |
| කුරුණෑගල | 316 | | 87 |
| හම්බන්තොට | | | 3531 |
| බදුල්ල | | | 550 |
| ගම්පහ | | | 359 |
| කොළඹ | | | 232 |
| මහනුවර | | | 226 |
| මොනරාගල | | | 278 |
| අනුරාධපුරය | | | 58 |
| පොළොන්නරුව | | | 29 |
| අම්පාර | | | 33 |
| පුත්තලම | | | 17 |
| ත්‍රිකුණාමලය | | | 6 |
| | 436 | 1608 | 34462 |

(iii)

| | වාර්ෂික නිෂ්පාදනය (මෙ.ටොන්) | වාර්ෂික ආදායම (රු.මිලියන) |
|---|---|---|
| 2022 වර්ෂය | 24,094 | 80,753.40 |

දේශීය කුරුඳු නිෂ්පාදනය හා නිෂ්පාදකයන් විසින් තම නිෂ්පාදන අළෙවි කරනු ලබන මිල ගණන් (ගොවිපොළ මිල ගණන්) මත පදනම්ව 2022 වර්ෂය තුළදී කුරුඳු නිෂ්පාදකයන් උපයනු ලබන ආදායම පිළිබඳ දළ ඇස්තමේන්තුව ඉහත වගුව මඟින් දක්වා ඇත.

(ආ) (i) ඔව්.

(ii) මෙක්සිකෝව, ඇමෙරිකා එක්සත් ජනපදය, පේරු රාජ්‍යය, ඉක්වදෝරය, ඉන්දියාව

(iii)

| නිෂ්පාදනය | වාර්ෂික අපනයන ප්‍රමාණය (මෙ.ටොන්) | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 (සැප්තැම්බර් දක්වා) |
| කුරුඳු | 17176.2 | 18721.8 | 18813.5 | 18298.2 | 13390.7 |
| කුරුඳු කොළ තෙල් | 261.9 | 300.5 | 307.3 | 194.4 | 138.0 |
| කුරුඳු පොතු තෙල් | 42.3 | 67.2 | 74.0 | 26.0 | 5.3 |
| කුරුඳු කොළ (වියළි) | | | | 302.1 | 219.0 |
| **සමස්ත අපනයන ප්‍රමාණය** | 17480.4 | 19089.5 | 19194.8 | 18820.6 | 13753.1 |

(iv)

| නිෂ්පාදනය | වාර්ෂික අපනයන ආදායම (රුපියල් මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 (සැප්තැම්බර් දක්වා) |
| කුරුඳු | 31463.0 | 38218.8 | 45879.2 | 71716.2 | 47869.7 |
| කුරුඳු කොළ තෙල් | 666.6 | 1156.6 | 1384.5 | 1348.8 | 726.2 |
| කුරුඳු පොතු තෙල් | 1453.7 | 2755.9 | 2629.1 | 1753.5 | 380.3 |
| කුරුඳු කොළ (වියළි) | | | | 66.5 | 56.9 |
| සමස්ත ආදායම | 33583.4 | 42131.2 | 49892.8 | 74885.0 | 49033.1 |

(ඇ) අදාළ නොවේ.

## කොළඹ-බදුල්ල මඟී දුම්රිය සේවාව: තදබදය
## பதுளை - கொழும்பு பயணிகள் புகையிரத சேவை: நெரிசல்
## COLOMBO-BADULLA PASSENGER TRAIN SERVICE: CONGESTION

3681/2023

**5. ගරු හර්ෂණ රාජකරුණා මහතා (ගරු වඩිවේල් සුරේෂ් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா - மாண்புமிகு வடிவேல் சுரேஷ் சார்பாக)
(The Hon. Harshana Rajakaruna on behalf of the Hon.Vadivel Suresh )

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උඩරට දුම්රිය මාර්ගය, සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ විශේෂ දුම්රිය මාර්ගයක් බවත්;

(ii) සතියේ දිනවල කොළඹ සිට බදුල්ල දක්වා මඟී දුම්රිය හතරක්, බදුල්ල සිට කොළඹ දක්වා මඟී දුම්රිය හතරක් සහ සති අන්තයේ දිනවල අමතර සංචාරක දුම්රියක් එම දුම්රිය මාර්ගයේ ධාවනය කරවනු ලබන බවත්;

(iii) වතුකරය ආශ්‍රිතව හා ඒ අවට ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ගමන් පහසුව එම දුම්රියවලින් සලසා ගන්නා බැවින් එම දුම්රියවල අධික තදබදයක් පවතින බවත්;

(iv) එම තදබදය හේතුවෙන් මහනුවර, ඇල්ල, දෙමෝදර, බණ්ඩාරවෙල සහ නුවරඑළිය සංචාරක කලාප කරා ගමන් කරන දේශීය විදේශීය සංචාරකයන් මෙන්ම අනෙක් මඟීන් දැඩි අපහසුතාවකට පත්වන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) මඟී තදබදය වැළැක්වීම සඳහා එම මාර්ගයේ දුම්රිය ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීමට හෝ මේ වනවිට ක්‍රියාත්මක ගමන් වාර සඳහා භාවිත කරනු ලබන මැදිරි සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නේද;

(ii) බදුල්ල-කොළඹ රාත්‍රී තැපැල් දුම්රියේ පහසුකම් වැඩි කිරීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மலைநாட்டு புகையிரத வீதியானது சுற்றுலாப் பயணிகளின் கவனத்தை ஈர்த்த தனித்துவமானதொரு புகையிரத வீதி என்பதையும்;

(ii) வார நாட்களில் கொழும்பிலிருந்து பதுளை வரை நான்கு பயணிகள் புகையிரதங்களும், பதுளையிலிருந்து கொழும்பு வரை நான்கு பயணிகள் புகையிரதங்களும் வார இறுதி நாட்களில் மேலதிக சுற்றுலா புகையிரதம் ஒன்றும் மேற்படி புகையிரத வீதியில் இயக்கப் படுகின்றதென்பதையும்;

(iii) தோட்டத்துறை சார்ந்த மற்றும் அதை அண்டிய பிரதேசங்களில் வசிக்கும் மக்களின் பயண வசதிகளை மேற்படி புகையிரதங்கள்மூலம் பூர்த்திசெய்து கொள்வதால் மேற்படி புகையிரதங்களில் கடும் நெரிசல் காணப் படுகின்றது என்பதையும்;

(iv) மேற்படி நெரிசல் காரணமாக கண்டி, எல்ல, தெமோதர, பண்டாரவளை மற்றும் நுவரெலியா சுற்றுலா வலயங்களுக்குச் செல்லும் உள்நாட்டு மற்றும் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளும் இதர பயணிகளும் கடும் சிரமங்களை எதிர்கொண்டுள்ளார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) பயணிகளின் நெரிசலைத் தடுப்பதற்காக மேற்படி வீதியில் புகையிரதப் பயணங்களின் எண்ணிக்கையை அதிகரிப்பதற்கோ அல்லது இன்றளவில் இயக்கப்படுகின்ற புகையிரதப் பயணங்களுக்கென பயன்படுத்தப்படுகின்ற புகையிரதப் பெட்டிகளின் எண்ணிக்கையை அதிகரிப்பதற்கோ நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) பதுளை - கொழும்பு இரவு நேர தபால் புகையிரதத்தின் வசதிகளை அதிகரிப்பதற்கு துரித நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he admit that -

(i) the upcountry railway is a special railway track that has grabbed tourist attraction;

(ii) four-passenger trains from Colombo to Badulla and Badulla to Colombo on weekdays and one additional tourist train during the weekend are operating on the said railway track;

(iii) those trains are highly congested as people residing in the upcountry and other surrounding areas use the aforesaid trains as their mode of transport; and

(iv) both locals and foreigners who travel to tourism zones such as Kandy, Ella, Demodara, Bandarawela and Nuwara Eliya have been inconvenienced due to the aforementioned congestion?

(b) Will he inform this House -

(i) whether necessary steps will be taken to increase the number of train journeys or the carriages used in currently running trains to prevent the said congestion; and

(ii) whether expeditious steps will be taken to increase the facilities of the Badulla-Colombo night mail train?

(c) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උඩරට දුම්රිය මාර්ගය, සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ විශේෂ දුම්රිය මාර්ගයකි.

(ii) දිනපතා කොළඹ සිට බදුල්ල දක්වා දුම්රිය හතරක්ද, බදුල්ල සිට කොළඹ කොටුව දක්වා දුම්රිය හතරක්ද ධාවනය වන අතර "ඇල්ල ඔඩිසි" සංචාරක දුම්රිය බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා කොළඹ කොටුව සිට බදුල්ල දක්වාද, සිකුරාදා සහ ඉරිදා බදුල්ල සිට කොළඹ කොටුව දක්වාද ධාවනය කරනු ලබයි.

මීට අමතරව උඩරට දුම්රිය මාර්ගයේ දිනපතා මහනුවර සිට බදුල්ල දක්වා දුම්රියක් හා බදුල්ල සිට මහනුවර දක්වා දුම්රියක්ද, කොළඹ කොටුව සිට නානුඔය දක්වා දුම්රියක් හා නානුඔය සිට කොළඹ කොටුව දක්වා දුම්රියක්ද ධාවනය කරනු ලබයි.

(iii) වතුකරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ජනතාව එම දුම්රියවලින් ගමන් පහසුව සලසා ගන්නා අතර, සති අන්තයේ සහ නිවාඩු දිනයන්හිදී දේශීය සංචාරකයින් වැඩිවීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල එම දුම්රියවල අධික තදබදයක් ඇති වේ.

(iv) සති අන්තයේ සහ නිවාඩු දිනයන්වල ධාවනය වන දුම්රියන්හි ඇති වන අධික මගී තදබදය හේතුවෙන් ඇතැම් අවස්ථාවන්හිදී විදේශීය සංචාරකයින් සහ අනෙකුත් මගීන් යම් යම් අපහසුතාවලට ලක්විය හැක.

(ආ) (i) උඩරට මාර්ගයේ ධාවනය සඳහා ගෙන්වා ඇති බලවේග කට්ටල සියල්ලම මේ වනවිට ධාවනය සඳහා යොදවා ඇති බැවින්, එම මාර්ගයේ දුම්රිය ගමන්වාර සංඛ්‍යාව වැඩි කිරීමට හැකියාවක් නොමැත. එමෙන්ම උඩරට මාර්ගය දැඩි ආනතියක් සහිත මාර්ගයක් වන බැවින් දැනට ධාවනය කරනු ලබන ගමන් වාර සඳහා භාවිත කරනු ලබන මැදිරි සංඛ්‍යාව වැඩි කිරීමට ද හැකියාවක් නොමැත.

එසේ වුවද, දීර්ඝ සති අන්ත නිවාඩු, පාසල් නිවාඩු සහ උත්සව සමය වැනි අවස්ථාවලදී ඇති වන මගී අවශ්‍යතාවන්ට අනුව අමතර දුම්රිය ධාවනය සිදු කරනු ලබන අතර, පවතින රෙගුලාසිවලට අනුකූලව සහ අමතර මැදිරි සපයා ගැනීමේ හැකියාව මත හැකි සෑම අවස්ථාවකම අමතර මැදිරි එක් කෙරේ. දුම්රිය දෙපාර්තමේන්තුව සතු එන්ජින්, බලවේග කට්ටල සහ කාර්ය මණ්ඩලය වැනි සීමිත සම්පත් යොදා ගනිමින් මගී අවශ්‍යතාවන් උපරිම ලෙස සැපිරීමට කටයුතු කෙරේ.

(ii) කොළඹ කොටුව - බදුල්ල රාත්‍රී තැපැල් දුම්රිය උඩරට මාර්ගයේ ධාවනය කළ හැකි උපරිම මැදිරි සංඛ්‍යාව සහිතව ධාවනය කරන බැවින්, තවදුරටත් මැදිරි සංඛ්‍යාව වැඩි කිරීමේ හැකියාවක් නොමැත. නමුත් මේ වනවිටත් එම දුම්රිය සඳහා යොදවා ඇති මැදිරිවලින් වැඩි සංඛ්‍යාවක් තන්ත්‍රි ආයතනය මඟින් අලුත්වැඩියා කරමින් පවතින අතර, ඉදිරියේදී ඉතිරි මැදිරිද අලුත්වැඩියා කර මැදිරි තුළ පවතින පහසුකම් නැංවීමට පියවර ගැනේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අද දින වැදගත් විවාදයක් තිබෙන නිසා ඔබතුමාගේ අවසරය පරිදි මම බොහොම කෙටියෙන් වැදගත් කරුණු තුනක් මතු කරන්න කැමැතියි. මේ කාරණා කෙරෙහි ගරු සභානායකතුමාගේත්, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේත් අවධානය මා යොමු කරවනවා.

මිහින්තලය රජමහා විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වන වලවාහැංගුණවැවේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඊයේ දිනයේ බොහොම බරපතළ චෝදනාවක් කළා. පොලීසිය, යුද හමුදාව සහ සිවිල් ආරක්ෂක අංශයේ බොහෝ දෙනා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හිත දිනා ගෙන ඉතාම හොඳින් මිහින්තලා පුද බිමේ වැඩ කටයුතු කරනවා. එහි කිසිම ගැටලුවක් නැහැ. ගරු කථානායකතුමනි, හැබැයි සති තුනක පමණ කාලයක සිට නාඳුනන -හඳුනා නොගත්- දෙදෙනෙක් හමුදාවේ යැයි කියා ගෙන එතැනට ඇවිල්ලා ඉඳලා තිබෙනවා. ඇත්තටම ඒගොල්ලන් හසු වෙලා තිබෙන්නේ, සිවිල් ආරක්ෂක අංශයේ සහ පොලීසියේ අයටයි. මේ පුද්ගලයින් අල්ලාගෙන තිබෙන්නේ ආරක්ෂක අංශ. ගරු නායක ස්වාමීන් වහන්සේගේ හිතේ බරපතළ සැකයක් තිබෙනවා, විශේෂයෙන්ම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට හානි කිරීමට හෝ උන්වහන්සේව ඝාතනය කිරීමට හෝ වෙනත් හානියක් සිදු කිරීමට මේ පුද්ගලයින් දෙදෙනා පැමිණ සිටියාද කියන කාරණාව ගැන. එම ස්ථානයේ යුද හමුදාව, සිවිල් ආරක්ෂක අංශය සහ පොලීසිය කියන සියලු අංශවලට අයත් නිලධාරින් ඉන්නවා.

ඒ කිසිම කෙනෙක් දන්නේ නැහැ, මේ නාඳුනන පුද්ගලයින් දෙපළ කවුද කියලා. නමුත්, ඒ දෙන්නා ඇවිල්ලා තිබෙන්නේ නොච්චියාගම කඳවුරක සිටින ප්‍රධාන අණදෙන නිලධාරියාගේ උපදෙස් මත කියලා දැන් හොයාගෙන තිබෙනවා. මම මේ කාරණය විශේෂයෙන්ම මේ සභාව තුළ මතු කරන්න කැමැතියි. නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජීවිතයේ ආරක්ෂාව පිළිබඳ වගකීම රජයටත්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලු දෙනාටත් තිබෙනවා. මම මේ කාටවත් ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. හැබැයි, ඉතින් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මේ රටේ දුක්විඳින පොදු ජනතාව වෙනුවෙන් එළිපිට ප්‍රකාශ ඉදිරිපත් කරනවා. ඒ එළිපිට සිදු කරන ප්‍රකාශවලින් පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව සමහර අයට චෝදනා එල්ල වෙනවා. ඒ හැම දෙයක්ම අපි දරා ගන්නට ඕනෑ. හැබැයි, මම මේ කාරණාව සභාවට කියන්න කැමැතියි. ආරක්ෂක අංශ ගණනාවක් ඒ පුදබිමේ ඉන්නවා. නමුත්, ඒ කිසිම කෙනෙක් දන්නේ නැහැ, ඒ දෙන්නා ඇවිල්ලා තිබෙන්නේ මොකටද කියලා. ඒ දෙන්නා සති තුනක කාලයක් ඉඳලා තිබෙනවා. කෑමට මොනවා හරි දමලා, එහෙම නැත්නම් වස පොවලා, එහෙමත් නැත්නම් මොනවා හෝ හානියක් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට කරන්න උත්සාහ කළාද කියන සැකය අපට තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ පිළිබඳව විභාග කරලා, පරීක්ෂණයක් සිදු කරන්න ක්‍රියාත්මක වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු සභානායකතුමනි, දෙවැනි කාරණාව මෙයයි. ගරු කථානායකතුමනි, පසුගිය දිනක අධිකරණයේ නඩු නිමිත්තක දී නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරින් උසාවියට කරුණු ඉදිරිපත් කර තිබෙනවා, -වෙන කවුරුවත් නොවෙයි, නීතිපති දෙපාර්තමේන්තුව- ශානි අබේසේකර

මැතිතුමාව ඝාතනය කරන්න -හප්පලා මරන්න- හදනවා කියලා තොරතුරු ලැබී තිබෙනවා කියලා.

ඒක නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් උසාවියට - අධිකරණයට- ඉදිරිපත් කළ කාරණාවක්; බරපතළ කාරණාවක්. එතකොට ඔබතුමා දන්නවා, එතුමාට ලොකු තර්ජනයක් තිබෙන බව. ඒ තර්ජනයට සරිලන විධිමත් ආරක්ෂාවක් ලබා දීම අපේ වගකීමක්; යුතුකමක්. ඔබ අපි සියලුදෙනාම දන්නවා, අපේ රටේ හප්පලා මරපු, පුච්චලා මරපු අවස්ථා සඳහා නිදසුන් තිබෙන බව. ඒ නිසා විශේෂයෙන්ම ශානි අබේසේකර මැතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව මම ඉල්ලීමක් කරනවා, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ම අධිකරණයට ඉදිරිපත් කළ කරුණු මත විධිමත් ආරක්ෂාවක් ලබා දෙන්න කියලා.

අවසාන කාරණාව මේකයි, ගරු කථානායකතුමනි. මම හිතන විධියට ලබන 13වැනිදා යින් පස්සේ ආපහු පාර්ලිමේන්තු සැසි වාරය ආරම්භ වෙන්නේ ජනවාරි මාසයේ. එහෙම නැත්නම් ඔබතුමන්ලාට හැකියාවක් තිබෙනවා නම් පාර්ලිමේන්තුව විසුරුවන්න, ඒකත් බොහොම හොඳයි. මොකද, ඒක අපට බොහොම සුබවාදී ආරංචියක්. ඒ කෙසේ වෙතත්, මම ඔබතුමාට අද ලිඛිතව ඉදිරිපත් කරන්නම්, මම අහපු ප්‍රශ්න කීයකට උත්තර දීලා තිබෙනවාද කියලා. දැන් මට ප්‍රශ්න ඇසීමේ සීමාවකුත් දාලා තිබෙනවා, සතියකට දෙකයි කියලා. ඇත්ත වශයෙන්ම මම බරපතළ ප්‍රශ්නයක් ඇහුවා, ගරු කථානායකතුමනි. ලංකා බැංකුවෙනුත් -Bank of Ceylon එකෙනුත්, මහජන බැංකුවෙනුත් - People's Bank එකෙනුත් - වැඩියෙන්ම ණය අරගෙන ණය ගෙවීම පැහැර හැරපු පුද්ගලයන් සහ ආයතනවල නාම ලේඛන දෙන්න කිව්වා. ඒවා දෙන්න පුළුවන්. දෙන්න බැහැ කියන්න බැහැ. ගරු කථානායකතුමනි, මොකද බොහොම බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම කොවිඩ්-19 අර්බුදය, Easter Sunday ප්‍රහාරය සහ ඉන් පසුව ඇති වූ බංකොලොත්භාවය නිසා අද කුඩා, ක්ෂුද්‍ර, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් තම කර්මාන්ත බොහොම අමාරුවෙන් කරගෙන යන මොහොතක පරාටේ නීතිය හරහා ඒ අයගේ දේපළ නැති කරනවා, වෙන්දේසි - auction - කරනවා.

ගරු කථානායකතුමනි, හැබැයි People's Bank, Bank of Ceylon ඇතුළු රාජ්‍ය බැංකුවලින් රුපියල් කෝටි, ප්‍රකෝටි ගණන් ණය අරගෙන ඒ ණය නොගෙවා ඉන්න තෝරු, මෝරු ටිකට ප්‍රශ්නයක් නැහැ. රුපියල් කෝටි, ප්‍රකෝටි ගණන් ණය ගත්තාට ප්‍රශ්නයක් නැහැ, ආපසු ඒවා ගෙවනවා නම්. ඔවුන් ණය ගෙවීමක් කරන්නේත් නැහැ. නමුත්, ණය ගත්ත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ පෞද්ගලික දේපළ පරාටේ නීතිය හරහා වෙන්දේසි කරනවා.

ගරු කථානායකතුමනි, බැංකු පද්ධතියේ ස්ථායීකරණයට අපි ශක්තිය දෙන්න ඕනෑ. Banking system එකේ stability එක අපි ආරක්ෂා කරන්න ඕනෑ. නමුත්, පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව -යම්කිසි කාල වකවානුවකට- හෝ අහෝසි කරන්න, එහෙම නැත්නම් අත්හිටුවන්න. අර අහිංසක මිනිසුන්ට තමන්ගේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ටික ගොඩනහා ගන්නා තෙක් පරාටේ නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා මම බොහොම වගකීමෙන් කියනවා. කරුණාකර මහජන බැංකුවෙන්, ලංකා බැංකුවෙන් රුපියල් බිලියන ගණන්, ට්‍රිලියන ගණන් ණය ගත්ත ආයතන සහ පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව මෙම මස 13වැනි දාට ඉස්සෙල්ලා මම ප්‍රශ්න කරපු ආකාරයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලාත් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ කෙටි කරුණු දැක්වීමට අදාළව මමත් පොඩි කාරණයක් මතු කරන්න කැමැතියි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු ශානි අබේසේකර කියන නිලධාරියා සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ මහතෙක් හෝ මහත්මියක් ඉතා බරපතළ ප්‍රකාශයක් කරලා තිබෙනවා. මොකද, ඒ විධියට පොලිස් නිලධාරින්ව මරන්න සැලසුම් කරන්න පුළුවන් නම් මෙතැන ඉන්න ඕනෑම කෙනෙකුවත් ඒ විධියට මරන්න සැලසුම් කරන්න පුළුවන්. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉදිරි දිනකදී මේ පාර්ලිමේන්තුවට නීතිපතිවරයා කැඳවා ඒ කරපු ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව පිළිබඳව මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට කරුණු විමසා දැනගැනීම සඳහා අවස්ථාවක් සලසා දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමනි, ඔබතුමා පිළිතුරක් දෙනවාද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
**(අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මීට ස්වල්ප වේලාවකට පෙර මේ ගරු සභාවට කරුණු තුනක් පැහැදිලි කළා. එක කාරණයක් තමයි, මිහින්තලය රජමහා විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ ආරක්ෂාව පිළිබඳ කාරණය. ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ අවධානය යොමු කර, මේ සභා වාරය අවසන් වීමට පෙර පිළිතුරක් ලබා දීමට කටයුතු කරනවා.

ඊළඟට, නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ මහතෙකු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු වූ ශානි අබේසේකර මහතා සම්බන්ධයෙන් අධිකරණයට කරන ලද හෙළිදරව්වක් පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාත්, ගරු විමල් වීරවංශ මැතිතුමාත් ප්‍රශ්න කළා. ඒ පිළිබඳ කරුණුත් ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කරලා පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරනවා.

තුන්වෙනි කාරණයෙන් ඇහුවේ, ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් ණය අරගෙන, එම ණය පැහැර හැරපු පුද්ගලයන් සහ ආයතන සම්බන්ධයෙන්. ඒ පිළිබඳව මීට පෙරත් ගරු විපක්ෂ නායකතුමා කරුණු ඉදිරිපත් කළා. 13වැනි දා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරනවා. එදිනට මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්, Sri Lanka Customs එකේ සහ ඒ අදාළ සියලු නිලධාරින් පාර්ලිමේන්තුවට පැමිණෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, එදින එම ප්‍රශ්නයටත් උත්තරයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, මමත් ලංකා බැංකුවේ අවුරුදු 8ක් වැඩ කළා. මම banking exam එකත් complete කරලා තමයි නීති ක්ෂේත්‍රයට ආවේ. මම නීති ක්ෂේත්‍රයේ වැඩ කරන නිසා දන්නවා, *parate* execution නීතිය ගෙනාවේ කවුරු හරි පිරිසක් ඉලක්ක කරගෙන නොවෙයි කියන එක. එහිදී ලොකු, කුඩා කියලා භේදයක් නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා කියන කාරණයේ

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සාධාරණත්වයක් තිබෙනවා. මට පෙන්වලා දෙන්න ඕනෑ වුණේ මේකයි. *Parate* execution law එක රජයකට නවත්වන්න බැහැ; එහෙම අත්හිටුවන්න බැහැ. රටක නීතියක් ක්‍රියාත්මක වන එක කොහොමද නවත්වන්නේ?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

මම මේ කාරණය ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාටත් කිව්වා. පොළොන්නරුවේ වී ගොවීන්ට විරුද්ධව පරාටේ නීතිය ක්‍රියාත්මක කරන්න යනකොට මුදල් අමාත්‍යාංශය ඒක නැවැත්වූවා. මම වගකීමක් ඇතුවයි ඒක කියන්නේ. ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් මම කිහිප සැරයක්ම ඇහුවා, වී ගොවීන් සම්බන්ධයෙන් එම නීතිය ක්‍රියාත්මක වීම නතර කරන්න පුළුවන් නම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඒ සහනය දෙන්න බැරි ඇයි කියලා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. මෙතුමා කියන එකට පිළිතුරක් දෙන්න,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, පරාටේ නීතිය තිබිය යුතුයි. පරාටේ නීතිය තිබෙන්නේ බැංකු ස්ථායීකරණය - banking stability - සඳහායි. මම කථා කරන්නේ ඒක ගැන නොවෙයි. මම කථා කරන්නේ, පිට පිටම ඇති වූ සිද්ධීන් වන පාස්කු ඉරුදින ප්‍රහාරය - Easter Sunday Attack එක, කොරෝනා ප්‍රශ්නය සහ රට බංකොලොත් වීම නිසා ඇති වූ තත්ත්වය ගැනයි. ඒ කියන්නේ, පිට පිට සුනාමි තුනක් ආවා. අපි ඉල්ලන්නේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට යම් කිසි නිදහස් කාල වකවානුවක් ලබා දෙන ලෙසයි. ඒක කරන්න පුළුවන්. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියැළෙන මිනිස්සු දෙපයින් නැඟී සිටිනකල් *parate* execution එක ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන්න. ඒ වාගේම ඔබතුමා දන්නවාද, කොරෝනා ව්‍යසනය සහ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය එල්ල වූ සමය තුළ මේ රටේ බැංකු පද්ධතිය කොපමණ මුදලක් උපයා තිබෙනවාද කියලා? අධික ලාභ උපයා තිබෙනවා; සුපිරි ලාභ උපයා තිබෙනවා. මම කියන්නේ මේ පරාටේ නීතිය අයින් කරන්න කියලා නොවෙයි. ඒක වැරැදියි. මේක තාවකාලිකව, සීමාසහිත කාල වකවානුවකට නතර කරලා, අර අහිංසක මිනිසුන්ගේ දේපළ ටික වෙන්දේසි නොකර ඒ අයට නැඟී සිටින්න පුංචි විරාමයක්, - පොඩි interval එකක් - පොඩි සහනයක් ලබා දෙන්න. පසුවේ තෙතමනය තිබෙනවා නේ. තෙතමනය තිබෙනවා නම් ඒක ක්‍රියාත්මක කරන්න. ඒ මිනිසුන්ගේ ආයතන වැහිලා යනවා, කර්මාන්ත වැහිලා යනවා. ඒකයි මම මේ ඉල්ලීම කරන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම *parate* execution එකෙන් වෙන්නේ මේකයි. යම් ගනුදෙනුකරුවෙකුට වාණිජ බැංකුවකින් ණය නිකුත් කරනකොට යම් යම් කොන්දේසි දමනවා. Guaranteed loan එකක් වෙන්න පුළුවන්, personal loan එකක් වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් property එකක් තියලා ණය ගන්නවා වෙන්න පුළුවන්, ඒ ණය නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු යම් ක්‍රියාදාමයක් තිබෙනවා.

*Parate* execution law එක ආපසු ඒකෙන් බලය පැවරුවා, ණය නිකුත් කිරීමෙන් පසු, non-performing loans category එකට ගිහිල්ලා perform නොකරන අවස්ථාවකදී නිවේදන නිකුත් කිරීම, පුවත්පත් දැන්වීම් පළ කිරීම වැනි කටයුතු කරලා මේ දේපළ වෙන්දේසි කරන්න ඒ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට තීන්දුවක් ගන්න පුළුවන් කියලා. ඔන්න ඕක තමයි කරන්න තිබෙන්නේ. අපි නීතිඥයෝ හැටියට දන්නවා, එවැනි අදියරකට යන අවස්ථාව වෙනකොට දිස්ත්‍රික් අධිකරණයට ගිහිල්ලා තහනම් නියෝග ගැනීම වැනි කටයුතුත් කරන්න තිබෙන බව. ඔබතුමන්ලා කියන නීතිමය තත්ත්වය ඒක නොවෙයි. ඊට පෙරාතුව මුදල් අමාත්‍යාංශය හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න පුළුවන් circular එකකින්, නැත්නම් Central Bank එක හරහා. Central Bank එකේ Bank Supervision Department එක හරහා සාකච්ඡා කරලා යම් ආකාරයක උපදෙසක් දෙන්න පුළුවන්, අපි දැන් ගොවි ණය කපා හරිනවා වාගේ යම් කාල සීමාවකට moratorium එකක් දෙන්න, එහෙම නැත්නම් ඒ loans reschedule කරන්න, ආපස්සට ගන්න කාලයක් දෙන්න කියලා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියන කාරණය මුදල් අමාත්‍යාංශයේ අවධානයට මා යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදනය, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා.

## සබරගමුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඒකකය : සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சப்ரகமுவ பல்கலைக்கழகத்தின் பேராசிரியர் அலகு : சுகாதார அமைச்சரினது கூற்று
## PROFESSORIAL UNIT OF SABARAGAMUWA UNIVERSITY: STATEMENT BY MINISTER OF HEALTH

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)
ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය දිනවල කථාබහට ලක් වෙච්ච සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකය පිළිබඳවත්, පසුගිය 05වැනි දින අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේදී ඒ සම්බන්ධයෙන් තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය කළ ප්‍රකාශයක් පිළිබඳවත් පැහැදිලි කරන්න මම බලාපොරොත්තු වෙනවා.

සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි අවසන් වසරේ සායනික පුහුණුව පිළිබඳව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් යම් යම් කරුණු, නිගමන ඉදිරිපත් කර තිබුණා. එම නිගමන ක්‍රියාත්මක කිරීමේදී අපට සෞඛ්‍ය අමාත්‍යාංශයත්, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයත්, රත්නපුර රෝහලත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත්, සබරගමුව විශ්වවිද්‍යාලය ඇතුළු ආයතන රැසක් සමඟ කටයුතු කරන්න වුණා. එහිදී රත්නපුර මහ රෝහලේ

විශේෂඥ වෛද්‍යවරු දැනට භාවිත කරන, රෝගීන් ඉන්න රෝහල් වාට්ටු සංකීර්ණ මහාචාර්ය ඒකක ලෙස හඳුනාගෙන ඒ හා සම්බන්ධ නිගමන ක්‍රියාත්මක කරන්න කියලා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අපට දැනුම් දී තිබුණා. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ එම නිගමනවලට අනුකූලව මෙම නිර්දේශ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම පිණිස ඊයේ සෞඛ්‍ය අමාත්‍යාංශයත්, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයත් යම් ගිවිසුමකට එළඹුණා. දෙපාර්ශ්වය අතර ඊයේ Memorandum of Understanding අත්සන් කරලා එම නිර්දේශ පවත්වාගෙන යන්න, යහපත් විධියට කටයුතු කරන්න අවශ්‍ය එකඟතාවකට එළඹුණා. මට සඳහන් කරන්න අවශ්‍ය කාරණය මෙයයි,

ගරු කථානායකතුමනි. මේ ඉඩකඩ ගැටලුව විසඳන්න තමන් භාවිත කරන වාට්ටු සංකීර්ණ ලබා දී රත්නපුර මහ රෝහලේ අධ්‍යක්ෂතුමා ඇතුළු වෛද්‍යවරු, විශේෂඥ වෛද්‍යරු ඇතුළු සැම කෙනෙකුම විශාල කැප කිරීමක් කළා. මේ පාර්ලිමේන්තුවේ නම සඳහන් කරපු, මෙතැනට ඇවිල්ලා උත්තර දෙන්න බැරි, විශේෂඥ වෛද්‍ය සමන් අබේවර්ධන මැතිතුමා, විශේෂඥ වෛද්‍ය කේ. ජෙගනාදන් මැතිතුමා, විශේෂඥ වෛද්‍ය මෛත්‍රී චන්ද්‍රරත්න මැතිතුමා වාගේම රෝහල් අධ්‍යක්ෂ අනෝජ් රොද්‍රිගෝ මැතිතුමා මේ ගැටලුව විසඳන්න අපට විශාල ලෙස උදවු කළා.

එතුමන්ලාට අසාධාරණ චෝදනාවක් මේ සභාවේදී එල්ල වුණා, ඔවුන් ඒ කටයුත්තට විරුද්ධයි කියලා. එතුමන්ලා තමයි මේ වෙනුවෙන් උදවු කළේ. එතුමන්ලා මේ පිළිතුරේ කොටස්කරුවන් මිසක් ප්‍රශ්නයේ කොටස්කරුවන් නොවෙයි. ඒ අනුව අපි මේ සැම කෙනෙකු සමඟම කථා කරලා ඉතාම හොඳ, සාධනීය විසඳුමක් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේක අලුත් ගැටලුවකුත් නොවෙයි. සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ලංකාවේ 8වන වෛද්‍ය පීඨය; 9වන වෛද්‍ය පීඨය තමයි මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය; 10වන වෛද්‍ය පීඨය තමයි නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමන්ලා ආරම්භ කරන ඌව-වෙල්ලස්ස වෛද්‍ය පීඨය. මේ පීඨ දහයම ආරම්භ කරනකොට - මුල දෙක තුන හැරෙන්නට - මහාචාර්ය ඒකක ආරම්භ කිරීම සම්බන්ධයෙන් මෙවැනි ගැටලු මතු වෙලා තිබුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, කරාපිටිය වෛද්‍ය පීඨය ආරම්භ කරලා තිබෙන්නේ 1978දී. නමුත්, එහි ප්‍රධාන මහාචාර්ය ඒකකයට ගොඩනැඟිල්ල ඉදිවෙන්නේ දැන්. ඒ කියන්නේ, අවුරුදු හතළිස් පහකට පස්සේ. හැබැයි, තිබුණු ඉඩකඩ කළමනාකරණය කරගෙන ඒවා පවත්වාගෙන ඇවිල්ලා තිබෙනවා.

උදාහරණයක් හැටියට ගත්තොත්, අදටත් කරාපිටිය මහ රෝහලේ මානසික වෛද්‍ය ඒකකයට විශේෂ වාට්ටුවක් නැහැ. වෛද්‍යවරු හවුලේ තමයි එය භාවිත කරන්නේ. ඒ නිසා මෙවැනි තත්ත්වයකදී අපි සැම කෙනෙකුගේම යුතුකම තමයි ඒ වෙනුවෙන් මැදිහත් වෙලා විසඳුම් සොයන එක. ඒ වෙනුවෙන් අපි සැම කෙනෙකුම මැදිහත් වුණා. ඒ වෙනුවෙන් ඒ රෝහලේ වෛද්‍යවරු විශේෂ දායකත්වයක් ලබා දුන්නා කියන කාරණයත් මම විශේෂයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු කථානායකතුමනි, මෙහිදී මම විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. ඒක තමයි, වෛද්‍ය සභාවේ ප්‍රතීතනය - accreditation of SLMC - ලබා දෙන්නේ අවසන් වසරේ කටයුතු අවසන් වුණාට පසුවයි කියන එක. එතෙක් ඔවුන් නියාමනය කරගෙන යනවා. එක නියාමනයකට ඔවුන් සම්බන්ධ වුණා. එහිදී ඒ නිගමන අපට ලබා දුන්නා. ඒවා ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා. ඉදිරි කාලය තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත්, වෛද්‍ය සභාවත් අඛණ්ඩව අධ්‍යාපනය පිළිබඳව ඔවුන්ගේ නියම, නිගමන ලබා දෙනවා. රත්නපුර රෝහලේ මේ වෛද්‍යවරුන් ඉතාම හොඳ සායනික පුහුණුවක් තුන්වන වසරේදීත්, හතරවන වසරේදීත් ඒ සිසු දරුවන්ට ලබා දීලා තිබුණා. දැන් අවසන් වසරේදීත් ඔවුන් ලෑස්ති වෙලා ඉන්නවා, වෛද්‍ය පීඨයේ මහාචාර්යවරුන්, ආචාර්යවරුන් එක්ක දරුවන්ගේ අධ්‍යාපන කටයුතු යහපත්ව පවත්වාගෙන යන්න. ඒ සියලුදෙනාම අපට ඒ කටයුත්තට උදවු කළා. අපි දැන් MoU එකක් අත්සන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්නට අවශ්‍යයි, මේ කාරණයේදී අධ්‍යාපන ඇමතිතුමා වාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපට උදවු කළ බව. ඒ එක්කම සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්ය, මහාචාර්යවරු අපිත් සමඟ සම්බන්ධ වුණා. විශේෂයෙන්ම මම නැවත සිහිපත් කරනවා, රත්නපුර රෝහලේ සියලු වෛද්‍යවරු අපට මේ වෙනුවෙන් උදවු කළ බව. ගරු කථානායකතුමනි, අප කරන්න අවශ්‍ය වෙන්නේ එකතු වෙලා මේ කටයුත්ත යහපත්ව පවත්වාගෙන යෑම මිසක් මේවාට සම්බන්ධ වෙලා උදවු කරපු අයට බාධා කිරීම නොවෙයි.

මම අවසාන වශයෙන් මේ කාරණයත් සඳහන් කරන්න කැමතියි. රත්නපුර මහ රෝහලේත් විශේෂඥ වෛද්‍ය ඒකකය ඉදිකරන්න දැන් ටෙන්ඩර් කැඳවලා, ඒ ටෙන්ඩර් එක අනුමත කරලා තිබෙන්නේ. දැන් අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඉතාම නුදුරු දිනයකදී මේ මහාචාර්ය ඒකකය ආරම්භ කරයි. ඒ ගොඩනැඟිල්ල හදන්න අවුරුදු තුනක් විතර ගත වෙයි. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන ලැබිලා තිබෙන්නේ සවුදි අරමුදල යටතේයි. අනිවාර්යයෙන්ම ඒ ගොඩනැඟිල්ල හදනවා. මේ අවුරුදු තුන ඇතුළත අපට අන්තර් කාලීන විධිවිධාන පවත්වාගෙන යන්න වෙනවා. එතකොට තමයි අපිට SLMC එකේ අනුමැතිය ලබා ගන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය සියලු සහයෝගය සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා අපි ලබා දෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර බොහොම සුබවාදියි; ප්‍රගතිශීලියි. බොහොම ස්තුතියි, එම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට. ඒ ශිෂ්‍ය දූ දරුවන් මා හමුවෙන්නත් ආවා. ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට ඒකට කියන්නේ, clinical teaching කියලා. ඒ කියන්නේ, රෝහල් භූමිය තුළ සායනික පුහුණුව ලබා දෙනකොට ඒ දරුවන්ට වෙනම hall එකක් නැහැ, studies කරන්න. ඔබතුමා ඔය සඳහන් කරන සැලැස්මේ ඒවා ඔක්කොම තිබෙනවා. හැබැයි, ඔබතුමා කිව්ව ආකාරයට ඒ සඳහා යම් කාල වකවානුවක් ගත වෙනවා. අපිත් සූදානම්, ඔබතුමාත් එක්ක අත්වැල් බැඳගන්න. අඩුම ගණනේ රෝහල් අධ්‍යක්ෂතුමා අවසර දෙනවා නම්, ඔබතුමාත් කැමැතියි නම්, අපටත් ඒ සඳහා උදවු කරන්න පුළුවන්. ඒ දූ දරුවන්ට theoretical දේවල් ඉගෙන ගැනීම සඳහා පන්ති කාමර තුන, හතරක වාගේ දිග ශාලාවක් හදා දෙන්න කියලා ඒගොල්ලන්ගේ ඉල්ලීමක් තිබෙනවා. ඒ වාගේ දෙයක් කිරීම සුදුසු නම් අපිත් සූදානම්, ඔබතුමාත්, රජයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එක්කහු වෙලා ඒ වෙනුවෙන් යම් සහයෝගයක් ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, මම විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කටයුත්ත වෙනුවෙන් උදවු කරන්න ඉදිරිපත් වීම ගැන. සැම කෙනෙකුටම මේ සඳහා උදවු කරන්න පුළුවන්. අපි කියන්නේත් බාධා කරන්න එපා, උදවු කරන්න කියායි. ඒ එක්කම මම පෞද්ගලිකව රත්නපුර රෝහලට ගිහිල්ලා මේ වෛද්‍යවරුන් හමු වුණා. අපි කොළඹදී රැස්වීම් කිහිපයක්ම පැවැත්වූවා. ඒ දරුවන් උද්ඝෝෂණයකුත් කළා. මම අනාරාධිතවම එතැනට ගිහිල්ලා ඒගොල්ලන් එක්ක කථා කළා. අපි උපරිමව උත්සාහ

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කරනවා, මේ ගැටලු විසඳන්න. විපක්ෂ නායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ සඳහා උදවු කරන්න ඉදිරිපත් වීම පිළිබඳව.

බොහොම ස්තුතියි.

**ගරු උදයන කිරිදිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදයන කිරිදිගොඩ මන්ත්‍රීතුමා.

**ගරු උදයන කිරිදිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි. මීට පූර්වයෙන් කථා වෙච්ච *parate* execution එක සම්බන්ධයෙන් මට පොඩි කරුණු දැක්වීමක් කරන්න අවශ්‍යයි. මේ අවුරුද්දේ නොවැම්බර් මාසයේ 30වැනි දා වෙනකොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 1,183ක් පරාටේ නීතිය යටතේ පවරා ගන්න ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ ප්‍රමාණය මාසයකට සියයකට අධික සංඛ්‍යාවක්. මේ නිසා අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් විනාශ වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන්න කියලා නැවත නැවතත් අපි ඉල්ලා සිටිනවා. යම්කිසි සාධාරණ කාල සීමාවකට මේ පරාටේ නීතිය අත්හිටුවා එම ව්‍යවසායකයන්ට සහනයක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු ගාමිණී වලේබොඩ මැතිතුමා.

## ගරු ගාමිණී වලේබොඩ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு காமினி வலேபொடவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. GAMINI WALEBODA

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මගේ කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. ඊයේ මම මේ සභාවේ නොමැති අවස්ථාවක, මගේ සභාපතිත්වයෙන් තිබෙන ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පිළිබඳව වැරැදි මතයක් සමාජගත වන ආකාරයට ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් යම් ප්‍රකාශයක් කර තිබුණා. මම එය නිවැරැදි කරන්න අවශ්‍යයි. ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට අපි වෘත්තීයභාවයකින් යුතුව කටයුතු කරමින් ඉන්නවා.

පසුගිය කාල පරිච්ඡේදය තුළදී අපේ කාරක සභාව රැස්වීම් වාර 15කට වැඩි ප්‍රමාණයක් පවත්වා මේ අය වැය පිළියෙළ කිරීමේදීත්, විවිධ අමාත්‍යාංශවලට නිර්දේශ ගණනාවක් ලබා දීලා රටේ ආර්ථිකය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය කරන යෝජනා ගණනාවකුත් ලබා දීලා තිබෙනවා. උදාහරණයක් විධියට මට ඒ ගැන කියන්න පුළුවන්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් යෝජනා කර තිබුණා, ලබන අවුරුද්දේ ජනවාරි 01වැනි දා ඉඳලා SVAT ක්‍රමය අහෝසි කරන්න කියලා. අපේ කාරක සභාව අධ්‍යයනයක් කළා, එයින් කර්මාන්තවලට වන බලපෑම පිළිබඳව, ගරු කථානායකතුමනි. ඒ අනුව මුදල් අමාත්‍යාංශයට වාර්තාවක් ලබා දුන්නා, මේක කරන්න එපා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට VAT එක ආපසු ගෙවීමේ යන්ත්‍රණය නියම තත්ත්වයට ගෙන එනතුරු, එහෙම නොවුණොත්, අපේ අපනයන ආදායම කඩාගෙන වැටෙන්න එය බලපානවා කියලා. රජය එය පිළිගෙන ලබන අවුරුද්ද වෙනතුරු එය කල් දැමීමට කටයුතු කළා.

ගරු කථානායකතුමනි, ලංකාවේ ආබාධිතයන් ඉන්නවා, ලක්ෂ 22කට ආසන්න ප්‍රමාණයක්. මේ අයට ඕනෑ කරන භාණ්ඩවලටත් දැනුවත්ව හෝ නොදැනුවත්ව HS codes හරහා විශාල බදු ප්‍රමාණයක් පනවා තිබුණා. අපි ඒ ගැන වෙනම අධ්‍යයනය කරලා හඳුනාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා යෝජනාවක් ඉදිරිපත් කළා, මේ අයට ඕනෑ කරන භාණ්ඩ සඳහා අය කරන බදු සංශෝධනය කරලා එය බින්දුව බවට පත් කරන්න කියලා. රජය එයත් පිළිගෙන ක්‍රියාත්මක කළා. මෙවර Budget එකටත් අපි ඉදිරිපත් කරපු කරුණු ගණනාවක් ඇතුළත් වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ අනුව ඔබතුමා අදහස් කරපු ආකාරයේ දේශපාලන අරමුණකට අපේ කමිටුව කටයුතු නොකරන බව මම මේ ගරු සභාවට සහ රටට වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන්න අවශ්‍යයි. අපි ප්‍රබල විධියට වෘත්තීයභාවයකින් යුතුව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්ද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්ද කියන කාරණාවවත් නොසලකා මහජනතාව අපිව පත් කරලා එවපු කාර්යය ඉටු කර ගැනීම වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් උපරිම දායකත්වයෙන් යුතුව කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මම හිතන විධියට මේ ගැටලුව පැන නැඟෙන්න හේතුව මේකයි. අපි පෙරේදා කමිටුවේ සාකච්ඡාවට කැඳවා තිබුණා, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිලධාරීන්. එම කොමිෂන් සභාවේ නිලධාරීන් එක්ක අපට කරුණු කිහිපයක් කථා කරන්න තිබුණා. විදුලිබලය මිලකරණය සිද්ධ වෙච්ච ආකාරය පිළිබඳව පසුගිය කාලයේ රටේ මතයක් පැන නැඟිලා තිබෙනවා, මහජන උපයෝගිතා කොමිසම සාධාරණ, යුක්තිසහගත ආකාරයේ මිල වැඩි කිරීමකට නොවෙයි, අවසර දුන්නේ කියලා. හැබැයි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට අවස්ථාවක් හම්බ වුණේ නැහැ, එය සාධාරණීකරණය කරන්න. ඉතින්, නියාමන අධිකාරිය විධියට ඒ ආයතනවලට තිබෙන ප්‍රතිරූපය විනාශ වෙන විධියට කටයුතු කරන්න දෙන්න අපට බැහැ. මොකද, අපි හිටියත්, නොහිටියත් ඒ ආයතන පවත්වා ගෙන යන්න ඒගොල්ලන්ට අවස්ථාව දෙන්න අවශ්‍යයි. ඒ වාගේම මහජනතාවගෙන් පැන නැඟිලා තිබෙන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නත් අවශ්‍යයි. ඒ නිසා අපි ඒ ආයතනය සහ එයට සම්බන්ධ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය කියන ආයතන සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරීන් හා ඒ ක්ෂේත්‍රයේ ඉන්න වෘත්තිකයන්, ඉංජිනේරුවරුන් කැඳවා ගැඹුරු සාකච්ඡාවක් කළා.

එතැනදී අපි ඒ ඒ ආයතනවලට විධාන නිකුත් කළා, තම තමන්ගේ නිර්දේශ හා ඒ ගත්ත තීරණ පිළිබඳව සාධාරණීකරණය කරපු වාර්තාවක් අපට ලබා දෙන්න, අපි එය පාර්ලිමේන්තුවට

ඉදිරිපත් කරලා ඒ ආයතනවලට සාධාරණය ඉෂ්ට කරනවා කියලා. ගරු කථානායකතුමනි, මේක තමයි සිද්ධ වෙච්ච දේ. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් මා වෙත කරපු චෝදනාව මම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. අපි එහෙම අඳ බාල ආකාරයට, අපට ලැබෙන වගකීමක් හෝ තනතුරක් අපගේ පෞද්ගලික අභිමතාර්ථ හෝ අභිලාෂ වෙනුවෙන් හෝ දේශපාලන අවශ්‍යතා ඉටු කර ගැනීම වෙනුවෙන් පාවිච්චි කරන්නේ නැහැ කියන එක මේ ගරු සභාවට මම ප්‍රකාශ කරන්න අවශ්‍යයි. ගරු කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්න.

## වරප්‍රසාද: ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත මුද්‍රණය කිරීමේ ප්‍රමාදය
## சிறப்புரிமை: இலங்கை மின்சாரம் சட்டமூலத்தை அச்சிடுவதிலுள்ள தாமதம்
## PRIVILEGE: DELAY IN PRINTING SRI LANKA ELECTRICITY BILL

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1)වන ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන්ව තිබෙනවා:

> "සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය."

ඒ වාගේම, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 13හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පවත්වාගෙන යා යුත්තේ ය."

මේ පාර්ලිමේන්තුවේ අපි කටයුතු කරන්නේ රටේ උත්තරීතර ව්‍යවස්ථාවට ගරු කරමිනුයි. එය උල්ලංඝනය කරමින් කිසියම් කාරණයක් සිද්ධ වෙනවා නම්, අපි බොහොම පැහැදිලිව දකින්නේ ඒක අපේ පාර්ලිමේන්තු වරප්‍රසාද ඉවත් කිරීමක් විධියටයි.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය, 2023 දෙසැම්බර් මස 01වන දින, II කොටස, අතිරේකය (2023.12.05 දින නිකුත් කරන ලදී)" යනුවෙන් ඉදිරිපත් කර තිබෙන, "ශ්‍රී ලංකා විදුලිබල" යනුවෙන්, "විදුලිබල හා බලශක්ති ඇමතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී" යනුවෙන් නිකුත් කර ඇති පනත් කෙටුම්පත, 2023.12.05 දින වන විට ඇත්ත වශයෙන්ම රජයේ මුද්‍රණාලය මුද්‍රණය කොට තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. එදිනට හිස් තැන් තබා නිකුත් කිරීමට තමයි වෙන් කරලා තිබුණේ. ඒක බොහොම පැහැදිලිව එහි කාලසටහනේ දාලා තිබෙනවා.

ඉන්පසුව තොරතුරු දැනගැනීම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව අපි මේ පිළිබඳව රජයේ මුද්‍රණාලයාධිපතිනියගෙන් විමසීමක් කළා. එතුමිය විසින් 2023.12.07වැනි දා, ඒ කියන්නේ පෙරේදා එතුමියගේ අත්අකුරින් නිකුත් කරන ලද ලිපිය මඟින් කියා සිටියේ, "මෙය තවමත් සැකසෙමින් පවතින බැවින්, මෙම මොහොතේ මුද්‍රිත පිටපත් ලබාදිය නොහැක. මෙතෙක් වෙබ් අඩවියේ ද පළ නොකරන ලදී" කියලායි. ගරු කථානායකතුමනි, එතුමියගේ එම ප්‍රකාශය ඇතුළත් ලිපියේ පිටපතක් මම **සභාගත*** කරනවා.

මොකද, එතුමිය අත්සන් කරලා තමයි ඒක දීලා තිබෙන්නේ. ඒ අනුව අද දින -ඒ කියන්නේ 9වැනි දා- උදේ 9.00 වන විටත් එහි දෙමළ භාෂා මුද්‍රණය තවම වෙබ් අඩවියේ පළ කරලා නැහැ. ඒ කියන්නේ, අද වන විටත් ඒක පළ කරලා නැහැ. එසේම මෙම පනතේ ඉංග්‍රීසි පිටපතේ "Sri Lanka Electricity, A Bill" යනුවෙන් සඳහන් වෙලා තිබෙනවා. සිංහල ගැසට් පත්‍රයේ සඳහන් වන්නේ, "ශ්‍රී ලංකා විදුලිබල" කියන එක විතරයි. පනත ද, මොකක්ද කියන එකත් සඳහන් නොකර අත් හැරලා තිබෙන්නේ.

එසේම මෙහි සිංහල පිටපතේ 6වැනි පිටුවේ (3) (අ) හි තිබෙන අකුරු සිංහල අකුරු විධියට නොවෙයි තිබෙන්නේ. මට හිතා ගන්න බැහැ, ඒ අකුරු මොනවාද කියලා. සංස්කෘත ද, ලන්දේසි ද, අරාබි ද, මාගධි ද, මොනවාද කියලා සොයා ගන්න බැරි භාෂාවක් එහි තිබෙන්නේ. මෙවැනි දෝෂ රාශියක් සිංහල පිටපතේත් තිබෙනවා.

එසේම 2023.12.08 දින වනවිටත් මෙම පනත් කෙටුම්පත නීත්‍යානුකූල ලෙස භාෂා තුනෙන්ම ඉදිරිපත් වෙලා නැහැ. එය නීත්‍යානුකූලව භාෂා තුනෙන්ම පළ කළ දින සිට දින 07ක් ඉක්ම වූ පසු පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ කියන එක තමයි අපේ මතය වෙලා තිබෙන්නේ. අපට ආරංචි තිබෙන්නේ ගරු අමාත්‍යතුමා විසින් එය අය වැය විවාදයේ අවසන් දිනයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න යනවා කියායි. මම දන්නේ නැහැ, එතුමා ඇත්තටම කරන්න හදන්නේ මොකක්ද කියලා. කෙසේ වුවත්, ඒ වාගේ ආරංචියක් අපට ආවා. මේ දින පහු වෙලා තිබෙන තත්ත්වයක් තුළ එහෙම කරනවා නම්, පැහැදිලිව ඒක වැරැදියි කියන එකයි මගේ අදහස වෙන්නේ.

මේ විදුලිබල පනත සම්බන්ධයෙන් කුමන්ත්‍රණකාරී ස්වරූපයකින් ක්‍රියාත්මක වෙන බවක් තමයි අපිට පෙනෙන්නේ. මේක රටට ඉතාම වැදගත් පනතක්. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු දින සිට සති දෙකක් ඇතුළත අපට උසාවියට යන්න පුළුවන්. හරියටම මේක ඉදිරිපත් කරන්න තිබුණේ 12වැනි දා වුණත් ගැටලුවක් තිබෙනවා. ඒකයි මේ 05වැනි දා ගැසට් එක ගහගත්තේ. 05වැනි දා ඉඳලා දවස් හතක් ගියාම එන්නේ 12වැනි දා. 12වැනි දා ඉඳලා සති දෙකක් කියන්නේ, 27වැනි දා වෙනතුරු ඉඩ තිබෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, 15වැනි දා සිට උසාවි නිවාඩුයි. එතකොට උසාවි නැවත විවෘත කළාම තමයි ඒ කටයුත්ත කරන්න වෙන්නේ. පැහැදිලිවම රටේ සාමාන්‍ය ජනතාවට අධිකරණයකට යන්න බැරි වෙන තැනකට තමයි, මේ ක්‍රියාදාමය සිද්ධ කරන්න හැදුවේ. ඒ නිසා මේක විශාල අර්බුදයක් විධියට අපි දකිනවා.

පැහැදිලිව මම කියන්න කැමැතියි, කඩිමුඩියේ මෙය මුද්‍රණය කිරීම තුළ සහ මේ පනත් කෙටුම්පත ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා දින 14ක් ඇතුළත අධිකරණයට යන්න තිබෙන කාරණා ආදිය එක්ක බලනකොට ඇති වෙලා තිබෙන තත්ත්වය. මම විදුලිබලය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කමිටුවේ සාමාජිකයෙක්. නමුත් ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන්න අපේ කමිටුවටවත් ඉදිරිපත් කර තිබුණේ නැහැ.

ඒ වාගේම, විශේෂයෙන් වෘත්තීය සමිති හා විදුලි පාරිභෝගික සංගම් සමඟ මේ පිළිබඳ සාකච්ඡා කර නැහැ. ලංකා විදුලිබල

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මණ්ඩලයේ නිලධාරින් එක්ක දෙවරක් කථා කරලා තිබුණා. ඒකෙදි පනත ගැන නොවෙයි කථා කර තිබුණේ, වෙන වෙන කාරණාත් එක්ක. ඒ වාගේම, පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු සමහවත් අඩුම තරමින් යම් සාකච්ඡාවක් කළා නම් හොඳයි කියන එකයි මගේ අදහස. ඒ නිසා මේ ගෙනෙන්න යන විදුලිබල පනත ඉතාම ප්‍රශ්නකාරී පනතක්. මේක මාස හයක් ඇතුළත සම්මත වුණේ නැත්නම්, ඒ කියන්නේ ඇමතිතුමා අත්සන් කළේ නැත්නම්, ඉබේම සමාගම් 12ක් හැදෙනවා. ගරු කථානායකතුමනි, මේ පනතේ තිබෙන ඒවාත් එක්ක කියවලා බැලුවාම එහෙමයි.

අද මේ රටේ විදුලි බිල සියයට 400කින් වැඩි කරලා තිබෙන්නේ. ලක්ෂ හයකට අධික විදුලි පාරිභෝගිකයින්ගේ විදුලිය විසන්ධි කර තිබෙනවා. නැවත විදුලිය සන්ධි කරන්න යන්නේ රුපියල් 1,100යි. නමුත්, දැන් රුපියල් 3,000ක් ගන්නවා.

ඒ වාගේම පසුගිය කාල වකවානුව තුළ බලශක්ති ක්ෂේත්‍රයේ විශාල අර්බුදයක් තිබෙනවා අපි දැක්කා. සාලිය වික්‍රමසූරිය මැතිතුමාත්, තිලාන් විජේසිංහ මැතිතුමාත් තමයි මේ පනත් කෙටුම්පත හදන්න මූලික වෙලා තිබුණේ. එතැනත් තිබෙනවා, බැඳියාවන් පිළිබඳ ගැටීමක්. ඒ කියන්නේ, a conflict of interest. මොකද, සාලිය වික්‍රමසූරිය මහත්තයා තෙල් සංස්ථාවේ සභාපති; ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේත් සභාපති; වරාය නගර සංවර්ධනය සම්බන්ධයෙන් වන අධිකාරියෙත් සභාපති. ඒ වාගේම වෙළෙඳ හා වාණිජ මණ්ඩලයේ බලශක්තිය සම්බන්ධයෙන් වන කමිටුවේත් සභාපති. ඊළඟට, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ලංකාවට හරිත හයිඩ්‍රජන් - green hydrogen - හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතුවලටත් ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ සභාපති තමයි සම්බන්ධ වෙන්නේ. ඒ වාගේම ඔහුගේ පුත්‍රයා තමයි ග්‍රීන්ස්ටැට් ලංකා පෞද්ගලික සමාගමේ උප සභාපති. ඔහුගේ බෑණා තමයි Chemonics Internationalහි, ඒ කියන්නේ USAID එකේ ප්‍රතිව්‍යුහගතකරණය සඳහා උපදෙස් දෙන ආයතනයේ ඉන්නේ. ඒ, වානක වික්‍රමසූරිය මහත්තයා. ඒ, ඔහුගේ ඥාතියෙක්. මේ විධියට ගත්තාට පස්සේ පැහැදිලිව කියන්න තිබෙන්නේ මෙයයි. ඇයි, මේ පනත් කෙටුම්පත හදිස්සියේ ගෙනෙන්නේ? ඇයි, මේ ගැන අපිත් එක්ක කථා කරන්නේ නැත්තේ? මේ රටේ විදුලි පාරිභෝගිකයන් එක්ක, නිලධාරින් එක්ක කථා කරන්නේ නැතිව ඇයි මේ වැඩේ කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉක්මන් කරන්නම්, ගරු කථානායකතුමනි. ඔය ඉක්මනට වඩා වටිනා කාරණයක් ගැන මම මේ කියන්නේ. මොකද හේතුව, මෙහෙම පනත් කෙටුම්පත් ගෙනැල්ලා ඉතිහාසයේ කවදාවත් මේ වාගේ වැඩක් කෙරුණේ නැහැ, ගරු කථානායකතුමනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපේ වරප්‍රසාද මේ උල්ලංඝනය වෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ක්‍රියාවලිය සිද්ධ කරපු මේ අමාත්‍යාංශයේ ලේකම්, මාපා පතිරණ මහත්තයා සම්පූර්ණයෙන්ම මේකට වග කියන්න ඕනෑ බව. ඇමතිතුමාටත් වැඩිය නිලධාරියෙක් විධියට ඔහු පාර්ලිමේන්තුවට, අපිට වගකියන්න ඕනෑ. ඒ වාගේම මේක හදන්න මුල් වුණු අය ඒ වාගේම විදුලි බල මණ්ඩලයේ සභාපති, විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා - GM - යන මේ සියලු දෙනා ආචාර ධර්ම සහ වරප්‍රසාද කමිටුව ඉස්සරහට ගෙනෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. හේතුව, මේ විදුලිබල පනත හරහා ලංකාවේ විදුලිබල මණ්ඩලය කොටස් 12කට කැඩෙනවා. ඒ විතරක් නොවෙයි, මේවා පෞද්ගලීකරණය කරන තැනකට තල්ලු වෙනවා. මේකත් එක්ක විශාල අර්බුදයක් එනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණා විවාදයේ දී ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රටේ මිනිස්සු වෙනුවෙන් මම මේ කාරණය කිව්වේ. ඒ නිසා කරුණාකරලා මෙය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ගරු චරිත හේරත් මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නය?

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 50 යටතේ තිබෙන, පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය යටතේ මම කථා කරන්නේ. විශේෂයෙන්ම, ගරු ඇමතිතුමා උත්තර දෙන්න හදන නිසා මම මේ ගැන ඉස්සෙල්ලා කියන එක වැදගත්.

මේ පනත් කෙටුම්පතේ සිංහල පරිවර්තනය දැන් වෙබ් එකේ තිබෙනවා. නමුත් ඒක ඉතාම දෝෂ සහගතයි. මම උදාහරණ දෙකක් කියන්නම්. Clause 4 (3) (g)වල තිබෙන "value chain" කියන එක සිංහලට පරිවර්තනය කර තිබෙන්නේ "මිල ජාලය" කියලායි. මේක නොවෙයි එහි තේරුම. Clause 12 (2) (a)වල "national tariff policy" කියලා තිබෙන්නේ. නමුත් මේක "ජාතික බදු ප්‍රතිපත්තිය" කියලා තමයි සිංහලට පරිවර්තනය කර තිබෙන්නේ. මේක "ජාතික ගාස්තු ප්‍රතිපත්තිය" කියලා තමයි සිංහල භාෂාවෙන් එන්න ඕනෑ. සිංහල පරිවර්තනය ගත්තාම මෙවැනි දෝෂ විශාල ප්‍රමාණයක් තිබෙනවා. සමහර ඒවා Google Translate එකට දාලා ඒකෙන් එන විකාර වචන තමයි දාලා තිබෙන්නේ. එවැනි දේවල් නොකළ යුතු නිසා - ඒක translate කරන එක ඇමතිතුමාගේ වගකීමක් නොවෙන්න පුළුවන් - මේ සම්බන්ධව ටිකක් විධිමත්ව කල්පනා කරලා බලලා නිශ්චිතව ඉදිරිපත් කළොත් සුදුසුයි කියලා මට හිතෙනවා. මේ පනත් කෙටුම්පත ගැන අපට විවාද කරන්න තිබෙනවා; සාකච්ඡා කරන්න තිබෙනවා; උසාවි යන්න තිබෙනවා. ඒ ඔක්කොම හරි. නමුත් මූලික කෙටුම්පතක් විධියට, text එකක් විධියට මේක ඉදිරිපත් කරනකොට පිළිගත්ත භාෂා තුනෙන් හරියට ඉදිරිපත් කිරීම වගකීමක් විධියට ගන්න කියා මම ඉල්ලා සිටින්න කැමතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

විදුලිබල ක්ෂේත්‍රය ඇත්තටම ජාතික ආරක්ෂාවට බලපාන ක්ෂේත්‍රයක්, ගරු කථානායකතුමනි. අපි හැමෝම දන්නවා, මේ රටේ ලාභ ලබන ආයතන වාගේම පාඩු ලබන ආයතනත් තිබෙන බව. පාඩු ලබන ආයතනවල යම් වෙනසක් සිදුවිය යුතුයි. හැබැයි, මේ විදුලිබල ක්ෂේත්‍රයේ ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, ක්‍රියාත්මක කරන ක්‍රියාදාමය සහ කරන්නට යන වාසිදායක වෙනස්කම් රටේ ජාතික ආරක්ෂාවට පක්ෂපාතී වෙන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලය සහ අමාත්‍යාංශය මේ සියලු සංශෝධන කරන්නට යන්නේ කිසිදු පාර්ශ්වකරුවකු එක්ක සාර්ථක සාකච්ඡාවක් අවසන් වෙලා නොවෙයි. Stakeholder discussions නැතිව තම තමන්ට ඕනෑ විධියට, තම තමන්ට හිතෛෂී පුද්ගලයන් පත් කරගෙන තම තමන්ට ළබැඳියාවේ සට්ටන - conflicts of interest - තිබෙන පුද්ගලයන්ව සම්බන්ධ කරගෙන මේ රටේ ජාතික සම්පත පාඩු ලබනවා කියලා- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය කරුණු සියල්ල විවාදයේදී ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසාන වශයෙන් ඔබතුමාට එක දෙයක් කියන්න කැමතියි. 1994ට පෙර විදුලිබල මණ්ඩලය ලාභ ලැබුවාද, නැද්ද? ඒක ගැන සොයලා බලන්න. 1994න් පසුව තමයි මේ විනාශය සිද්ධ වුණේ. ඒ නිසා විදුලිබල මණ්ඩලයට මේ විධියට එක එක අතපෙවීම් කරලා තම තමන්ගේ න්‍යාය පත්‍ර සකස් කරගෙන, තම තමන්ට ඕනෑ විධියට unbundle කරන්නට ඉඩ දෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේ කියනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමනි, ඔබතුමා මේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73වැනි පරිච්ඡේදයට අනුවද, 78වැනි පරිච්ඡේදයට අනුවද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
78වැනි පරිච්ඡේදයට අනුව.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එහෙම නම් හරි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78වැනි ව්‍යවස්ථාව තමයි පනත් කෙටුම්පත් පළ කිරීම පිළිබඳව සඳහන් වන්නේ. මම ඊයේ ඔබතුමාට දැනුම් දුන්නා. ගරු විදුලිබල සහ බලශක්ති ඇමතිතුමා ඒ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සිදු කරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කංචන විජේසේකර ඇමතිතුමා.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මම ඊයේ දවසේ පාර්ලිමේන්තුවේ රැඳී සිටියේ නැහැ. ඊයේ දවසේත්, අද දවසේත් ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳව මේ ගරු සභාවට වැරදි අවබෝධයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම කිව යුතුයි, මේ විදුලිබල පනත් කෙටුම්පත කඩිනමින් ගෙනෙන කුමන්ත්‍රණයක් නැති බව. මෙය මාස 14ක් තිස්සේ සිදු කළ කටයුත්තක්. පසුගිය වසරේ -2022 වසරේ- ජූලි මාසයේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය පරිදි කමිටුවක් පත් කළා මේ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කරන්න. ඒ කමිටුවේ පළමු කාර්යභාරය වුණේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගැනීමයි. ගරු කථානායකතුමනි, ඒ අනුව පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා මේ පාර්ලිමේන්තුවේදීම එම කමිටුවත් සමඟ සාකච්ඡා කරන්න එන්න කියලා. ඒ සාකච්ඡාවට සහභාගි වුණේ මන්ත්‍රීවරුන් 12දෙනෙකු පමණයි. එයට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සහභාගි වුණා, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා සහභාගි වුණා, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා සහභාගි වුණා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ආවේ නැහැ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විවිධ පක්ෂවල මන්ත්‍රීවරු එයට සහභාගි වුණා. ගරු කථානායකතුමනි, ඒ වාගේම එළියේ ඉන්න, පාර්ලිමේන්තුව නියෝජනය කරපු හිටපු විදුලිබල අමාත්‍යවරුන්ටත් මේ සඳහා ආරාධනා කළා. හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් අජිත් පී. පෙරේරා මැතිතුමා මේකට සහභාගි වුණා විපක්ෂය නියෝජනය කරමින්. ගරු රවි කරුණානායක මැතිතුමා එතුමාගේ යෝජනාව ඉදිරිපත් කළා. ගරු කරු ජයසූරිය මැතිතුමා එතුමාගේ ලිඛිත යෝජනාව ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලයේත්, ආණ්ඩුවේත් ඉන්න මන්ත්‍රීවරු -ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා ඇතුළු කණ්ඩායම- මේ සම්බන්ධයෙන් තමන්ගේ අදහස්, යෝජනා ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙහි පාර්ශ්වකරුවන් වශයෙන් මුලින්ම මේ පිළිබඳව සාකච්ඡා කළේ වෘත්තීය සමිති සමඟයි. වෘත්තීය සමිති 34ක් තිබෙනවා. ඒ වෘත්තීය සමිති 34ත් එක්ක අවස්ථා 4කදී සාකච්ඡා කර තිබෙනවා. අවශ්‍ය නම් ඒවායේ වීඩියෝ පට පවා ලබා දෙන්න පුළුවන්. මොකද, ඒ සාකච්ඡාවලට අදාළ සම්පූර්ණ රැස්වීම් ටික වීඩියෝගත කරලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ සාකච්ඡාවත් වීඩියෝගත කරලා තිබෙනවා. වෘත්තීය සමිති එක්ක කළ සාකච්ඡාත් වීඩියෝගත කරලා තිබෙනවා. පාර්ශ්වකරුවන් එක්ක කළ සාකච්ඡාත් වීඩියෝගත කරලා තිබෙනවා. ඔබතුමන්ලාගෙන් බොහෝ දෙනෙකු සහභාගි නොවීම තමයි කනගාටුව. ගරු කථානායකතුමනි, ඒ වෘත්තීය සමිති එක්ක අප සාකච්ඡා කළේ අවස්ථා හතරක් පමණක් නොවෙයි. විදුලිබල මණ්ඩලය නියෝජනය කරන සාමාන්‍යාධිකාරිවරයා, සභාපතිවරයා ඇතුළු කළමනාකාරිත්වයේ Corporate Management Team - CMT - එක තිබෙනවා. එහි

[ගරු කංචන විජේසේකර මහතා]

තමයි අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් සහ ඉහළ නිලධාරින් ඉන්නේ. ඔවුන් එක්ක අවස්ථා තුනක් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු, අතිරේක සාමාන්‍යාධිකාරිවරු, අධ්‍යක්ෂවරු 114දෙනෙක් ඉන්නවා විදුලිබල මණ්ඩලයේ. ඒ 114දෙනාත් එක්ක අවස්ථා දෙකකදී කණ්ඩායම් දෙකකට කඩලා සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම CEBTESU එක, අනෙකුත් ප්‍රධාන unions ටික - Ceylon Electricity Board Engineers' Union එක, Ceylon Electricity Board Independent Engineers' Association එක, Senior Engineers' Union of the Ceylon Electricity Board එක - වාගේම පහළම නිලය දක්වා, HR එක දක්වා සියලු දෙනා සමඟත් සාකච්ඡා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යභාරය තමයි මෙය 05වන දා ගැසට් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ Government Printerට ලිඛිතව දැනුවත් කරන එක.

ඒක upload කිරීම සහ ඒකට අවශ්‍ය කාරණා ටික ඇතුළත් කිරීම ඔවුන්ගේ වගකීමක්. එහි වැරැද්දක් තිබෙනවා කියලා මමත් දැක්කා. 05වන දා දිනය දාලා තිබුණත්, ඒක upload වෙලා තිබුණේ දින දෙකකට පසුවයි. එහි දෝෂයක් තිබෙනවා කියලා Legal Draftsman's Department එකෙන් අපට කියලා තිබුණා. මොකද, Tamil translation එකේ වගන්ති දෙකක් අත් හැරලා තමයි upload කරලා තිබෙන්නේ. ඔවුන් තමයි ඒක හදලා දෙන්න ඕනෑ. ඒ නිසා අපි ඔවුන්ට කිව්වා, ඒක හදලා දෙන්න කියලා. අපට කිසි කලබලයක් නැහැ, ගරු කථානායකතුමනි. මාස 14ක් කටයුතු කරපු එකේ තව මාසයක් ප්‍රමාද කරන එක අපට එච්චර ප්‍රශ්නයක් නොවෙයි. මාස 14ක් නොවෙයි මෙය අවුරුදු 20ක් තිස්සේ මේ රටේ කථා කරන දෙයක්. අවුරුදු 20ක් තිස්සේ කථා කරන දෙයක් තමයි අපි මාස 14ක් තුළ ඉතාම පරිස්සමෙන් කටයුතු කරලා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ගරු සභානායකතුමාටත්, ඒ වාගේම විශේෂයෙන් ගරු නීතිපතිතුමාටත් කිව්වා, මේ පනත් කෙටුම්පත අපි දෙසැම්බර් 12වන දා හෝ 13වන දා පළමුවැනි වර කියවීමට ඉදිරිපත් කරන්නේ නැහැ, ඊළඟ සභා වාරයේදී, ඒ කියන්නේ ජනවාරි සභා වාරයේදී පාර්ලිමේන්තුව රැස් වුණාම ඒක ඉදිරිපත් කරන්නම් කියලා.

ගරු කථානායකතුමනි, මම නම් කැමැතියි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාම ගිහිල්ලා මේ පනත් කෙටුම්පතට challenge කරනවා නම්; අභියෝගයට ලක් කරනවා නම්. ඒ වාගේම වෘත්තීය සමිති හැම එකක්ම ගිහිල්ලා මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරනවා නම්. මොකද, මේ පනත හදන්නේ තාවකාලිකව අවුරුදු දෙකකට, තුනකට නොවෙයි. මෙය දීර්ඝ කාලයක් වෙනුවෙන් හදන පනතක්. ඒ නිසා තමයි අපි කැමැති ඒක අභියෝගයට ලක් වෙනවා නම්.

ගරු කථානායකතුමනි, අපිත් එහි දෝෂ දැක්කා. දැන් ගරු චරිත හේරත් මැතිතුමා කිව්වා, එහි ඇති වචනවල දෝෂ ගැන. Legal Draftsman's Department එකට දෝෂ 42ක් අපිත් දන්වා යවා තිබෙනවා. එහි සමහර තැන්වල වචනවල, වගන්තිවල දෝෂ තිබෙනවා. එයට ඇතුළත් වෙන්න ඕනෑ දේවල් ද තිබෙනවා. එහි "Consumer Protection Law" කියන එකේ ඡේද දෙකක් තිබෙනවා. ඒවා අත් හැරිලා තිබෙනවා. අපි කිව්වා, ඒක අලුත් ඡේදයක් හැටියට ඇතුළත් කරන්න කියලා. හැබැයි, ඔවුන් අපට ඒ වෙලාවේ උපදෙස් දුන්නේ එය කාරක සභා අවස්ථාවේදී ගෙනෙන්න පුළුවන්, සමහර දෝෂ හදන්න පුළුවන් කියලායි. ඕනෑ නම් ඔබතුමන්ලාට ඒක බලාගන්න දෙන්නත් පුළුවන්. ඒ වාගේම, Regulatorගේ levy එකේ ප්‍රශ්නයක් තිබුණා. ස්වාධීන කොමිසමක් හින්දා සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවෙන් තමයි Regulatorට මුදල් වෙන් කරන්නේ. හැබැයි, අපි එතැනින් එහාට තවත් පියවරක් ගිහින් කිව්වා, Regulatorට levy එකක් නිර්මාණය කිරීම පිළිබඳ කාරණයක් ගැනත්. ඒකත් සංශෝධනයක් වශයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, චෝදනා ගණනාවක් එල්ල වුණා කමිටුව පිළිබඳවත්. ඒ කමිටුවේ ප්‍රධානියා වන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන මාපා පතිරණ මැතිතුමායි. ඒ කමිටුව නියෝජනය කරන තවත් නිලධාරින් ගණනාවක් ඉන්නවා. අප ඉල්ලීමක් කරපු හින්දා, -විශේෂයෙන් අමාත්‍යවරයා හැටියට මා ඉල්ලීමක් කරපු හින්දා- තමයි ඒ නිලධාරින් සියලුදෙනා කිසිම ගාස්තුවක් ගන්නේ නැතිව තමන්ගේ කාලය වැය කරලා මේ සඳහා ඉදිරිපත් වුණේ. එහි ඉන්නවා, මාපා පතිරණ ලේකම්තුමා. ඒ වාගේම නීතිඥවරුත් ඉන්නවා. හර්ෂ ප්‍රනාන්දු, නිහාල් ජයවර්ධන කියන නීතිඥවරු, සුසන්ත පෙරේරා හිටපු AGM, ෆර්ඩිනැන්ඩු අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමා, තිලාන් විජේසිංහ, සාලිය වික්‍රමසූරිය, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ චන්දන විජේසිංහ කියන මහත්වරුත් එහි සිටිනවා. තෙරේස් පෙරේරා තමයි Legal Draftsman.

ඉතින් මේ කණ්ඩායමත් එක්ක තමයි අපි කටයුතු කළේ. හැබැයි, ඒ කට්ටියගේ තනි මතයට නොවෙයි, ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. ඒ සඳහා අපි සහාය ලබා ගත්තා සංවර්ධන නියෝජිත ආයතනවලින්. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, USAID හා JICA කියන ආයතන හතරෙන්ම අපි සහාය ඉල්ලුවා. ඔවුන් තාක්ෂණික සහාය සැපයීමක් වශයෙන් ඔවුන්ගේ නියෝජිතවරුන් අපට දුන්නා. හැබැයි, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මේක එක නියෝජිත ආයතනයක සහායෙන් සකස් කළ පනත් කෙටුම්පතක් කියලා. ඔවුන්ගෙනුත් අදහස් ගත්තා. තාක්ෂණික කාරණා ගැන අපි ඇහුවා. ඒ කටයුත්ත මාස ගණනාවක් තිස්සේ කරගෙන ආවා.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කවුරුන් හෝ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැඳවනවා නම්, මාව කැඳවන්න. මොකද, මම තමයි එම කමිටුව පත් කළේ. එහි සම්පූර්ණ වගකීම මම භාර ගන්නවා. මාපා පතිරණ මහත්මයා වෙනුවෙනුත්, සාලිය වික්‍රමසූරිය මහත්මයා, තිලාන් විජේසිංහ මහත්මයා ඇතුළුව එම කමිටුවේ ඉන්න සියලුදෙනා වෙනුවෙනුත් මෙම පනත් කෙටුම්පතට අදාළ සියලු කාරණාවල වගකීම මම භාර ගන්නවා; අමාත්‍යවරයා හැටියට එහි වගකීම මම භාර ගන්නවා. ඒ වගකීම භාර ගන්නවා වාගේම, මම මේ ගරු සභාව පැහැදිලිව දැනුවත් කරනවා, මෙම කටයුත්ත කිරීම අත්‍යවශ්‍ය බව. අපි මෙම පනත් කෙටුම්පත සංශෝධන සහිතව අනිවාර්යයෙන් ඉදිරිපත් කරනවා. යම් වැරැද්දක් වෙලා තිබෙනවා upload කිරීමේදී. මම දන්නේ නැහැ ඒක කොහොමද වුණේ කියන එක. මෙතැන ඉන්න ගරු මන්ත්‍රීවරු දන්නවා, ඒක අමාත්‍යවරුන් හෝ ලේකම්වරුන් හෝ ගිහිල්ලා කරන වැඩක් නොවෙයි කියලා. සාමාන්‍යයෙන් සෑම පනත් කෙටුම්පතකම දෝෂ තිබෙනවා. එහෙම දෝෂ තිබෙන බව ඔබතුමන්ලා නොදන්නවා නොවෙයි. නමුත්, මේ පනත් කෙටුම්පත සම්බන්ධව අනිසි බිල්ලෙක් මවන්නයි හදන්නේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රශ්නයේදී විපක්ෂයේ කණ්ඩායම එකතු වුණා. හැබැයි, ලංකා විදුලිබල මණ්ඩලයේ තිබෙන දූෂණ, අක්‍රමිකතා නවත්වන්න, එහි ව්‍යුහය වෙනස් කරන්න කවුරුවත් එකතු වෙන්නේ නැත්තේ ඇයි?

ගරු කථානායකතුමනි, එහි වෘත්තීය සමිති කණ්ඩායම් හැටියට ශරීර හොරු ටිකක් ඉන්නවා, අවුරුදු 20ක්, 30ක් රාජකාරියෙන් නිදහස් වෙලා ඉඳලා පඩි ගත්තු; අවුරුදු 20ක්, 30ක් රාජකාරියෙන් නිදහස් වෙලා ඉඳලා දේශපාලනය කරපු. මේ යෝජිත පනත් කෙටුම්පත සම්මත වෙලා ආයතනික ව්‍යුහය සකස් වුණාට පසුව ඔවුන්ට ඒ කටයුතු තවදුරටත් කරගෙන යන්න බැහැ. ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ 26,000ක සේවක මණ්ඩලයක් ඉන්නවා. දැන් කියනවා නේ, අපි ලංකා විදුලිබල මණ්ඩලයේ කවුරුවත් මේ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුත්තට දායක කර ගත්තේ නැහැ කියලා. මම ලංකා විදුලිබල මණ්ඩලයට කිව්වා, 26,000ක් වන සේවක සංඛ්‍යාව ඔබතුමන්ලා අඩු කරන්නේ කොහොමද කියලා ගණන් හදලා පෙන්වන්න කියලා. විදුලිබල මණ්ඩලය මට ගෙනැල්ලා දුන්නා යෝජනාවක්. ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ 26,000ක් ඉන්නවා. දැන් ඉන්නේ 21,000යි. හැබැයි, ඒ කට්ටිය යෝජනා කරනවා, එම සංඛ්‍යාව 28,000ක් කරන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, ඒක තමයි ලංකා විදුලිබල මණ්ඩලය ලබා දීපු යෝජනාව. එහි ආයතනික ප්‍රතිව්‍යුහගතකරණයක් සිදු වෙනවා නම්, එය ජාත්‍යන්තර වශයෙන් ගැළපෙන ආකාරයට වෙන්න ඕනෑ.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා, මෙහි බෙදීමේ කටයුත්තේදී කුමන්ත්‍රණයක් වෙනවා, unbundle කිරීමක් වෙනවා වාගේ කථාවක්. ගරු විපක්ෂ නායකතුමාත් 2002දී මේ වාගේම unbundle කරන යෝජනාවකට පාර්ලිමේන්තුවේදී ඡන්දය දුන්නා. ඡන්දය දීලා, එය සම්මත වුණා. එදා ගරු විපක්ෂ නායකතුමාත් හිටියා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් හිටියා. මට මතක හැටියට ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාත් හිටියා, ගරු කබීර් හෂීම් මැතිතුමා සහ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් හිටියා. මේ සියලුදෙනා 2002දී ඒ යෝජනාවට ඡන්දය දුන්නා. එහෙම ඡන්දය දුන්නාට, එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරපු නිසා ගරු කරු ජයසූරිය හිටපු අමාත්‍යතුමාට ඒකට අත්සන් කරන්න බැරි වුණා.

ගරු දයාසිරි ජයසේකර මැතිතුමා වැරදි අදහසක් කිව්වා. ඒ තමයි, මෙය පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ නැතුව නිකම්ම - ඉබේම- සම්මත වෙනවා කියන එක.

මම දන්නේ නැහැ, ඒක කොහෙන් ඉගෙන ගත්ත දෙයක්ද කියලා. පාර්ලිමේන්තුවට එන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවෙන් සම්මත වෙන්නේ නැතුව ඉබේම සම්මත වෙන්නේ නැහැ. සම්මත වුණාට පසුව මාස හයක් යනකල් අමාත්‍යවරයා අත්සන් නොකළත්, ඒ මාස හයෙන් පසුව ඒක ක්‍රියාත්මක වීම සඳහා තමයි ප්‍රතිපාදන හදලා තිබෙන්නේ. ඒ ප්‍රතිපාදන හැදුවේම පරණ පූර්වාදර්ශයත් එක්ක. පනත් කෙටුම්පතක් හදලා, සම්මත කරලා තිබුණත් පාර්ලිමේන්තුව විසුරුවා හැරපු නිසා එදා ඒ පනත ක්‍රියාත්මක වුණේ නැහැ. ගරු කථානායකතුමනි, මේ ක්‍රියාවලිය සිදුවිය යුතුයි. පාර්ලිමේන්තුව ඇතුළේ සියලුදෙනා කථා කරන්නේ, ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩි කරන්න; දූෂණය නැති කරන්න; විදුලිබිල අඩු කරන්න. ගරු කථානායකතුමනි, මේ ව්‍යුහය තිබෙන තාක් කල් විදුලිබල මණ්ඩලයට විදුලිය මිලදී ගැනීම නම් කරන්න බැහැ. විදුලිය මිලදී ගන්නේ නැතුව අනෙක් ඔක්කෝම කරනවා. විදුලිය මිලදී ගන්නේ නැතුව විදුලිබල මණ්ඩලයෙන් වැඩක් තිබෙනවාද? විදුලිබල මණ්ඩලයට එන යෝජනාවලට ප්‍රතිචාර නැත්නම්, මේ තිබෙන ව්‍යුහය ඇතුළේ පුනර්ජනනීය බලය ගන්න උදවු කරන්නේ නැත්නම්, ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, ඒ සඳහා අමාත්‍යවරු කොච්චර මහන්සි වුණත්, රජය මොන ප්‍රතිපත්තිය හැදුවත් වැඩක් නැහැ. හිටපු සෑම ඇමතිවරයෙකුම ප්‍රතිපත්ති හදලා තිබෙනවා; ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ පනත ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ නැති ව්‍යුහයක් නම් තිබෙන්නේ ඒ ව්‍යුහය වෙනස් කළ යුතුයි.

ඒ ව්‍යුහය වෙනස් කළොත් විතරයි අපට අලුතින් බලාගාර ඉදිකරලා විදුලිය බිල අඩු කරන තැනට යන්න පුළුවන් වන්නේ. ගරු කථානායකතුමනි, ඒ වාගේම අපේ රාජ්‍ය ඇමතිතුමා ඉලක්ක කරලා වලේබොඩ මන්ත්‍රීතුමා උත්තරයක් දුන්නා. ගරු කථානායකතුමනි, පෙරේදා සවස ආංශික අධීක්ෂණ කාරක සභාව කැඳවලා එතුමා මාධ්‍යයට ප්‍රකාශයක් කර තිබෙනවා, "විදුලිබල මණ්ඩලයේ නිලධාරින් ඇවිල්ලා කිව්වා, අනිවාර්යයෙන්ම ජනවාරි මාසයේ විදුලි බිල වැඩි කරන්න වෙනවා" යනුවෙන්. ගරු කථානායකතුමනි, එම ආංශික අධීක්ෂණ කාරක සභාවේ හඬපට - recordings - ගෙන්වා ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එම කාරක සභාවේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ කවුරු හරි නිලධාරියෙකු එහෙම කිව්වාද කියන එක පිළිබඳව පරීක්ෂණ කරන්න. ඒ පරීක්ෂණ කරලා මෙතුමා කරපු ප්‍රකාශය හරිද, වැරදිද කියන එක පිළිබඳව ඔබතුමා තීන්දුවක් ගන්න.

ගරු කථානායකතුමනි, එවැනි ආංශික අධීක්ෂණ කාරක සභාවකට නිලධාරින් කැඳවලා ඊට පස්සේ නිවේදනයක් නිකුත් කරනවා නම්; ප්‍රකාශයක් කරනවා නම් ඒ පිළිබඳව සැලකිලිමත් වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, එතුමාට තරහක් තිබෙනවාද කියලා. එතුමා මීට ඉස්සෙල්ලා විදුලිබල මණ්ඩලය කාරක සභාවට ගෙන්වලා නියෝගයක් දුන්නා, සමනල වැව මැණික් ගරන්න ඉඩ දෙන්න කියලා. එතුමා නියෝගයක් දුන්නා. එහෙම නියෝග දෙන්න පුළුවන්කමක් නැහැ, ආංශික අධීක්ෂණ කාරක සභාවට. එතුමා මැණික් ගරන ප්‍රදේශවල ලැයිස්තුවක් හදලා, ඒ ලැයිස්තුවට අනුව මැණික් ගරන්න ඉඩ දෙන්න කියලා තිබුණා. එහෙම මැණික් ගරන්න අපි ඉඩ නොදීපු නිසා විදුලිබල මණ්ඩලයත් එක්ක වෙනම "ඇරියස්" එකක් ඇති. හැබැයි, ඒ "ඇරියස්" එක දේශපාලනයට පාවිච්චි කරන්න එපා.

විදුලිබල මණ්ඩලයේ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් අපි අද දවසේත් යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමාට පෙරේදා අපි ලියුමක් එව්වා. මම දැන් ඒක ප්‍රසිද්ධියේ කියන්නම්. විදුලි බිල අඩු කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කරන්න, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් පස්දෙනෙකුට 12වැනි දා එන්න කියලා කැඳවලා තිබෙනවා. ජනවාරි මාසයේ විදුලි බිලෙහි සංශෝධනයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි හිතුවාට වඩා හොඳ තත්ත්වයකට ජලයෙන් විදුලිය උත්පාදනය කරලා තිබෙනවා. මම ජනාධිපතිතුමාව පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේ දී දැනුවත් කළා. ඒ සම්බන්ධව කැබිනට් මණ්ඩලය සාක්ෂි දරයි. ඒ වාගේම පසුගිය අඟහරුවාදා කැබිනට් මණ්ඩලය රැස්වෙලා තීන්දුවක් ගත්තා, දෙසැම්බර් 31වන දා වෙනකොට තත්ත්වය බලලා නැවත වතාවක් ජනවාරි මාසයේ හරි සංශෝධනයක් සිදු කරන්න. එහෙම නැත්නම් සංශෝධනය කරන්න තිබුණේ අප්‍රේල් මාසයේ දී. මම දැනුත් කියනවා, විපක්ෂ නායකතුමාට ලියුමක් යවලා තිබෙනවා. ඕනෑනම් ඔබතුමන්ලාත් එදිනට එන්න. 12 වැනිදා සවස 2.00ට තමයි සාකච්ඡාව තිබෙන්නේ. විදුලි බිල අඩු කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික යෝජනා තිබෙනවා නම්, අපට ඒවා ලබා දෙන්න. අපි වෙනත් කණ්ඩායම්වලටත්, පාර්ශ්වවලටත් ඒ සඳහා ආරාධනා කරනවා. ගරු කථානායකතුමනි, මේ පාර්ශ්වවලට අමතරව අපි හැම පාර්ශ්වයකටම ආරාධනා කරලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වලා තිබෙනවා. මම අඛණ්ඩව සාකච්ඡා 70ක්, 80ක් පවත්වා තිබෙනවා. ඒ හැම එකක්ම වීඩියෝගත කර තිබෙනවා. ඔබතුමන්ලාට ඕනෑ නම් ඒ තොරතුරු ලබා දීමට කටයුතු කරන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ගැන දැන් කථා කරන්න ගියොත් ඔබතුමන්ලාට විවාදයේ දී කථා කරන්න දෙයක් නැති වෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, අද දින විවාදයට වෙන් වූ කාලයෙන් විනාඩි 40ක් පමණ දැනටමත් අවසන් වෙලා තිබෙනවා. අද මන්ත්‍රීවරයෙකුට කථා කරන්න ලැබෙන්නේ විනාඩි 6යි. ඒ නිසා ඒ ගැන සැලකිලිමත් වෙන්න. මන්ත්‍රීවරුන් 38දෙනෙක් කථා කරන්න ඉල්ලා තිබෙනවා. සමහර අයට වෙලාව දෙන්නත් බැරි වුණා. මෙහෙම කාලය ගත වුණොත් මන්ත්‍රීවරුන්ට ඒ දීපු විනාඩි 6ත් නැති වෙනවා. මේ කාරණය ගැන විවාද කරන්න වෙනම දිනයක් යොදා ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඔබතුමන්ලා මේ කාලය නාස්ති කරන්නේ නැතිව විවාදයේ දී කථා කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, අදත් දිවා ආහාරය සඳහා වෙන් කරපු කාලය අපි විවාදයට ලබා ගනිමු. නැත්නම් කථිකයින්ට කථා කරන්න වෙලාව මදි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට එකඟයි. - *[බාධා කිරීමක්]* ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට පිළිතුරක් දෙන්න ඕනෑ නම්, දැන් කියන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)
ගරු කථානායකතුමනි, පරාටේ බලතල ගැන කථා කරද්දී කිරිඇල්ල මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. ඒ නිසා ඒ ගැන පැහැදිලි කළ යුතුයි. පරාටේ බලතල බැංකුවල ආරක්ෂාවට තමයි ගෙනැල්ලා තිබෙන්නේ. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ දී තමයි ඒක ගෙනාවේ. ඒක තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ. ඒක නරක දෙයක් නොවෙයි. ඒක මේ බැංකු ටික ආරක්ෂා කර ගන්න ගෙනාපු නීතියක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා අහගෙන හිටියේ නැහැ නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මම අහගෙන හිටියා. මම මහ එන ගමන් ඔබතුමාගේ කථාව අහගෙනයි ආවේ. ගරු විපක්ෂ නායකතුමනි, ඒ නිසා තමයි මම මේකට උත්තරයක් දෙන්න ඕනෑ කියලා හිතුවේ. මේක වැදගත්. ඔබතුමා කථා කරපු දේ නොවැදගත් නිසා නොවෙයි, මම දුවගෙන ඇවිල්ලා මෙහෙම කියන්නේ.

ගරු කථානායකතුමනි, මේ නීතිය බලපාන්නේ රුපියල් මිලියන 5ට. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 50ට වඩා ණය ගත් අයට. අපේ රටේ සිටින ණයගැතියන් දිහා බැලුවාම රුපියල් ලක්ෂ 50ක ණයක් ගන්නවා කියන්නේ යම් මට්ටමක ඉන්න පිරිසක්. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පැහැදිලි කළා වාගේ, ණය ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට යම් තීරණයක් ගන්න මේකෙන් හැකියාව ලැබෙනවා. ඒකත් වහාම නොවෙයි, විවිධාකාර පියවරවලින් පස්සේ.

ඒ වාගේම අපි පිළිගන්නවා, මේ වාගේ කාලයක ණය ගෙවන්නන්ට වැඩි වැඩියෙන් සහන දෙන්න ඕනෑ කියලා. ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. පොලිය ඉහළ ගිහින් තිබෙනවා. ඒ නිසා තමයි මහ බැංකුව වරින් වර විවිධාකාර වූ චක්‍රලේඛ මඟින් සහන ලබා දුන්නේ. ගරු කථානායකතුමනි, මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව අදටත් ක්‍රියාත්මක වෙනවා.

දෙපාර්තමේන්තුවක අධ්‍යක්ෂවරයකු පත් කරලා අපි ඒ කටයුත්ත කරගෙන යනවා, ගරු කථානායකතුමනි. හැබැයි අපට බැංකුවල ආරක්ෂාවත් ඉතා වැදගත්. 2019 වෙද්දී බැංකුවල තිබුණු සියයට 4ක් වූ අය නොවන ණය අනුපාතය දැන් සියයට 15ත් පැනලා. ඒක ඉතා බරපතළ තත්ත්වයක්. ගරු කථානායකතුමනි, රාජ්‍ය බැංකු දෙක ප්‍රාග්ධනීකරණයට මේ අය වැය ලේඛනය තුළ අපි රුපියල් බිලියන 450ක් වෙන් කරලා තිබෙනවා. එම රාජ්‍ය බැංකු දෙක ආරක්ෂා කරන්න අපි රුපියල් බිලියන 450ක් දෙනවා. ඒ නිසා අපට ගනුදෙනුකරුවන්, ණය හිමියන් කියන පාර්ශ්ව දෙකම ආරක්ෂා කිරීමේ වගකීම තිබෙනවා. අපේ රටේ කෝටි 5ක් වන ගනුදෙනුකරුවන් මේ බැංකුවල මුදල් තැන්පත් කරනවා. ඒ කෝටි 5න් රුපියල් 5,000ට අඩු තැන්පතු තිබෙන අය සියයට 60ක් ඉන්නවා. බැංකුවල දේපළවලින් සියයට 80ක් ඒ මිනිසුන් සතුයි. රජයට නොවෙයි. ඉතින් ඒ නිසාම රජයට විශාල වගකීමක්

පැවරෙනවා, ගරු කථානායකතුමනි. අර පැත්තෙන් ණය හිමියන් ආරක්ෂා කරන අතරම බැංකු ටික ආරක්ෂා කර ගන්නත් ඕනෑ. යම් හෙයකින් බැංකුවක් අකර්මණ්‍ය වුණා; බැංකුවක් වැටුණා; බැංකුව පිළිබඳව විශ්වාසය පලුදු වුණා කියන්නේ සමස්ත ආර්ථිකයම බිඳ වැටීමක්. අන්න ඒ නිසා තමයි රජයට මේ වාගේ ආරක්ෂිත පියවර ගන්න සිදු වෙලා තිබෙන්නේ. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, අපි කිසිසේත්ම මේ කරුණු දිහා හදවතක් නැතුව බලනවාය කියලා. ඒ නිසා තමයි අපි වෙනම අංශයක් පිහිටුවාගෙන එක ණය මුදලෙන් ණය මුදලට සොයා බලන්නේ. දැන් අපි සම්පූර්ණයෙන් පරාටේ බලතල නැවැත්වුවොත් හැබැවටම මේ ප්‍රශ්නය තිබෙන අයටත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්, නැති අයටත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඒ නිසා තමයි එකින් එකට ඒ ගැන සොයා බලා කටයුතු කරන්න වෙනම අංශයක් පිහිටුවා තිබෙන්නේ. සිද්ධියෙන් සිද්ධියට මේ පිළිබඳව හොයා බලන්න කියලා තමයි මහ බැංකුව උපදෙස් දීලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කළා. එතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ සභාවට ඇවිල්ලා කරුණු ඉදිරිපත් කිරීම ගැන. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, මේ රටේ දළ දේශීය නිෂ්පාදිතය නිර්මාණය කරන්නට සියයට 50කට වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කුඩා, ක්ෂුද්‍ර, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් බව. මට තිබෙන ප්‍රශ්නය මෙන්න මේකයි. පැහැදිලිවම පරාටේ නීතිය තිබෙන්න ඕනෑ. අපි ඉල්ලා සිටින්නේ කුඩා, ක්ෂුද්‍ර සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නැඟී සිටින්නට පරාටේ නීතියට යම් කිසි නිවාඩු කාලයක් දෙන්න කියලායි. ගරු කථානායකතුමනි, මම මෙතුමාට කිව්වා මහජන බැංකුවෙනුත්, ලංකා බැංකුවෙනුත් වැඩියෙන්ම ණය ගත්ත තනි පුද්ගලයන්ගේ හෝ කොම්පැනිවල, ණය පැහැර හරින්නන්ගේ නාම ලේඛනය දෙන්න කියලා. ඒකට උත්තර දෙන්නේ නැහැ. ණය පැහැර හරින තෝරුන්ට, මෝරුන්ට එක විධියකටත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තවත් විධියකටත් සලකලා, පරාටේ නීතිය දාලා ඒ මිනිසුන්ගේ දේපළ ටික වෙන්දේසි කිරීමටයි අපි විරුද්ධ. අන්න ඒකට උත්තරයක් දෙන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කාරණා දෙකක් කිව්වා. එකක්, පරාටේ නීතිය තාවකාලිකව ඉවත් කරන්න කියන එක. ගරු කථානායකතුමනි, පරාටේ නීතිය තාවකාලිකව ඉවත් කළොත් සැබැවින්ම ණය ගෙවන්න නොහැකි වුණු පිරිසටයි, අයථා විධියට ණය නොගෙවන පිරිසටයි කියන දෙගොල්ලන්ටම එක වාගේ සහනයක් ලැබෙනවා. ඒ නිසා තමයි මහ බැංකුව නියෝග කරලා තිබෙන්නේ, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අංශයක් පිහිටුවා, සිද්ධියෙන් සිද්ධියට බලා අවශ්‍ය පහසුකම් දෙන්න කියලා.

දෙවෙනි කාරණය වන ණය නොගෙවීමක් පිළිබඳව මෙතුමා අහන ප්‍රශ්නයට මම වගකීමෙන් කියනවා, අපි කිසිදු විශේෂයක් කාටවත් දක්වන්නේ නැහැ කියලා. හැබැයි, මෙතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා භාර ගත්තා. කාර්ය බහුලත්වයත් එක්ක අපි සමහර විෂයයන් බෙදාගෙන තිබෙන්නේ. ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නය පිළිබඳව, නීතිමය පැත්තෙන් සහ බැංකුවෙන් කරුණු සියල්ලම සොයා බලා 13වැනි දාට ඉස්සෙල්ලා පැහැදිලි පිළිතුරක් අපි ලබා දෙනවා. අපට සඟවන්න කිසිම දෙයක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමා, ඉක්මනට කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගරු කංචන විජේසේකර ඇමතිතුමා කාරණා කිහිපයක් කිව්වා. මම කෙටියෙන් මගේ අදහස් කියන්නම්. ශ්‍රී ලංකා විදුලිබල කියන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා සාකච්ඡා පවත්වා තිබෙනවා. මම ඒක පිළිගන්නවා. හැබැයි, මේ පනත් කෙටුම්පත හදපු අය මේකට අදාළ වන පිරිසත් එක්ක කථා නොකිරීමේ ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. ඔබතුමා කොච්චර කිව්වත් ඒක තමයි දැන් වෙලා තිබෙන්නේ. උදාහරණයකට, පෙරේදා මම පාරිභෝගික අයිතිය පිළිබඳව කථා කළාට පස්සේ දැන් ඇමතිතුමා කියනවා, පාරිභෝගික අයිතිය පිළිබඳව තිබෙන කොටසක් අමතක වෙලා කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඇමතිවරයෙකු විධියට හිටියා. ඔබතුමාත් දන්නවා, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා. ඉස්සෙල්ලාම draft එක හදලා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යවනවා, ආපහු ඒක නීතිපති දෙපාර්තමේන්තුවට එවනවා, ආයෙත් ඒක නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යවනවා. ඊට පස්සේ ඒ දෙපාර්තමේන්තුවෙන් දෙන පනත් කෙටුම්පත අරගෙන ගිහිල්ලා තමයි අපි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාර දෙන්නේ. එහෙමයි අපි මේ කටයුත්ත කරන්නේ. එම කොටස ඇතුළත් කළා නම් එතුමාට tweet එකක් දමන්න තිබුණා, මේක දැන් දාලා තිබෙන්නේ කියලා. සාමාන්‍යයෙන් tweet එකෙන් ඉක්මනට අපට පණිවුඩය එනවා නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් පැහැදිලිව දන්නවා, අපි හොරකමට විරුද්ධයි කියලා. විදුලිබල මණ්ඩලයේ හොරකම් සිද්ධ වෙනවා. අපි ඒකට විරුද්ධයි. ඒකට විරුද්ධව පනතක් ගෙනෙන්න ඕනෑ. අපි ඒකට සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, ගරු කථානායකතුමනි, මිලදී ගැනීමේදී තමයි හොරකම සිද්ධ වෙන්නේ. මෙච්චර කාලයක් මිලදී ගැනීම්වලදී යම් කිසි විධියක හොරකමක් සිද්ධ වුණා නම්, මේ පනත යටතේ මිලදී ගැනීම් සම්බන්ධ සම්පූර්ණ බලය ඇමතිතුමාට යනවා. ඉතින්, මම අහන්නේ ඒකෙන් හොරකම නතර වෙනවාද කියලායි. ඒ විතරක් නොවෙයි. මෙතුමා වැරදියට ඒක තේරුම් අරගෙන තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය විවාදයේදී ගන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, සම්මත වුණාට පස්සේ මේ පනත අත්සන් කළේ නැතත්, මාස හයකින් ඉබේම ක්‍රියාත්මක වෙනවා. එහෙම තමයි මෙහි ප්‍රතිපාදන හදලා තිබෙන්නේ. එතකොට මොකද වෙන්නේ? ගරු කථානායකතුමනි, මෙහි තිබෙන වගකීම් ප්‍රමාණය රුපියල් බිලියන 900ක්. මේ assets ගැන කිසිම හොයා බැලීමක් කරලා නැහැ. මේකේ තිබෙන වගකීම් ගැන හොයා බැලීමක් කරලා නැහැ. මේ ටික ඔක්කෝම -රුපියල් බිලියන 900ම- අර කොම්පැනි 12ට තමයි කැඩෙන්නේ. මේකෙන් ඇතිවන ප්‍රශ්න ගැනයි අපි කථා කරන්නේ. වෙන දෙයක් ගැන නොවෙයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණය ගැන විවාදය වෙලාවෙදි කථා කරන්න. විවාදයක් පවත්වනවා නේ. ඒ විවාදයේදී කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපි උනන්දු වෙලා මේක කරමු. අපි ඔක්කෝම මේකට සහයෝගය දෙනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කංචන විජේසේකර ඇමතිතුමා, ඒකට උත්තරයක් දෙනවාද?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ නොදැනුවත්කම පිළිබඳව මම කනගාටු වෙනවා. Asset management, HR management, financial analysis ආදී සියලු දේවල් සිද්ධ වෙනවා. ආසියානු සංවර්ධන බැංකුවෙන්, ලෝක බැංකුවෙන්, JICA එකෙන් සහ USAID එකෙන් මීට මාස 6කට ඉස්සෙල්ලා මේ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. ToR එක නිකුත් කරලා ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා. එම නිසා මෙතුමා ඒ පිළිබඳව නොදැනුවත් වීම පිළිබඳව මම කනගාටු වෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙතුමා ඊයේ-පෙරේදා ඇවිල්ලා විදුලිබල පනත ගැන කථා කරපු නිසා consumer rights දැම්මේ නැහැ.

නොවැම්බර් මාසයේ 23වැනි දා අපි අලුත් වගන්තියක, new Clause 40 on Dispute Resolutionහි ඇතුළත් කරලා තිබෙනවා, "Regulator shall establish a dispute resolution process for the settlement of disputes arising between in relation to -" යනුවෙන්.

මේ පනත් කෙටුම්පත හැදුවාට පස්සේ අපි නැවත සංවර්ධන නියෝජිතායතන හතරටම යැව්වා, පනත් කෙටුම්පතේ යම් අඩු පාඩුවක් තිබෙනවා නම් හෝ තාක්ෂණික වශයෙන් යම් අඩු පාඩුවක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා. ඒ නියෝජිතායතන හතරම අපට කරුණු 6ක් ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, වෙනදාට මේක ඇවිල්ලා තිබුණේ regulationsවලින්. Regulationsවලින් නැතුව පනත් කෙටුම්පත ඇතුළෙන්ම මේ කටයුත්ත කරන්න කියලා තමයි ඔවුන් යෝජනා කළේ. එම නිසා මේක මෙහෙම තිබෙන එක හොඳයි කියලා අපිත් එකඟ වුණා. හැබැයි මම නැවත වතාවක් කියනවා, මේ පනත් කෙටුම්පතේ අපිට හංගන්න කිසිම දෙයක් නැහැ කියලා. මෙම පනත් කෙටුම්පත ජනවාරි මාසයේදී අපි පළමුවැනි වරට ඉදිරිපත් කරන්නම්. ඊට පස්සේ ඔබතුමන්ලා අධිකරණයට යන්න. හැබැයි මම දන්නවා, මෙතුමා කොච්චර කෑ ගැහුවත්, පෙනී සිටින්නේ වෘත්තීය සමිති වෙනුවෙන් කියන එක. ගරු කථානායකතුමනි, ඒ වාගේම procurements කිරීම සඳහා මේකෙන් ඇමතිවරයාට කිසිම බලයක් දීලා නැහැ. Procurements කිරීමේ සම්පූර්ණ බලය ඇමතිවරයාගෙන් හෝ වෙනත් තනි කණ්ඩායමකින් ඉවත් කරලා තිබෙනවා. Procurements සම්බන්ධයෙන් වන නීති රීති අපි ගෙනැවිත් තිබෙනවා, competitive biddingsවලට. G2G කියන ඒවා ඉවත් කරලා තිබෙනවා. එම සාධනීය කරුණු අපි මේකට ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම මේක Regulator සහ NSO - National System Operator - කියන කණ්ඩායම් දෙකට තමයි භාර දීලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා කැමැති ඇති, මේක ගේන එක කල් දමාගෙන ඇමතිවරයෙක් යටතේ, නැත්නම් යම් කණ්ඩායමක් යටතේ procurements කරන එකට. සමහර විට මෙතුමාට ඒ වාගේ දේකට කැමැත්තක් ඇති, ගරු කථානායකතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතේ අන්තර්ගත කරුණු පිළිබඳව මම ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. ගරු ඇමතිතුමා පැහැදිලිව කිව්වා, ජනවාරි මාසයේදී පළමු වරට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා, අවශ්‍ය නම් ඊට පස්සේ උසාවි යන්න පුළුවන්, ඊට පස්සේ පනත් කෙටුම්පතේ අන්තර්ගතය තුළ තිබෙන ගැටලු ගැන කථා කරන්නත් පුළුවන් කියලා. මම එක කාරණයක් පිළිබඳව විතරයි මෙතැනදී සඳහන් කරන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, හොරකම් කරන වෘත්තීය සමිති ගැන. එවැනි වෘත්තීය සමිති තිබෙන්න පුළුවන්. මම ඒක බැහැර කරන්නේ නැහැ. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, සමස්ත වෘත්තීය සමිති ව්‍යාපාරයම හොරකම් කරනවා කියලා. හැබැයි, ඔබතුමා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හදලා තිබෙන කමිටුව තිබෙනවා නේ, තිලාන් විජේසිංහලා, අර පුද්ගලයා, මේ පුද්ගලයා ඉන්න කමිටුව. ඒ කමිටුවේ මම හොඳින්ම දන්නා කම්බ හොරෙකුත් ඉන්නවා. එතුමා මහින්ද රාජපක්ෂ මහත්මයා 2015දී ජනාධිපතිවරණය පැරදුණාම ඕස්ට්‍රේලියාවට පැන්නා. ඔහුට ඕස්ට්‍රේලියාවේ ගෙවල් කිහිපයක්ම තිබෙනවා. ඒ මුළු කාලයම ඔහු ඕස්ට්‍රේලියාවේ ලැගලා සිටියා. නැවත අපේ ආණ්ඩුව ආවාම විදුලිබල මණ්ඩලයේ සභාපති වුණා. මම ඔහුගේ නම කියන්නේ නැහැ. මේ කාරණය ඔබතුමා නැවත මතු කළොත් මට නම කියන්න බැරිකමකුත් නැහැ. ඒ වාගේ, රාජ්‍ය සේවයම දන්නා, ගඳ ගහන, කම්බ හොරුත් ඔය කමිටුවේ ඉන්නවා. ඉතින්, ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. අඩු ගණනේ චරිතවත් මිනිස්සු ටිකක් ඕකේ ඉන්නවා නම් අපට ඔය දිහා සාධනීයව බලාගෙන ඉන්න තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණා ටිකත් ඔබතුමාට විවාදයේදී කියන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඔබතුමා දැන් කී සැරයක් කථා කළාද, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මීට පසුව යම් කමිටුවකට පත් කිරීමේදී කම්බ හොරෙක් නොවන විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් පත් කරන්න මම කටයුතු කරන්නම්.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමා මට බරපතළ චෝදනාවක් කළා, ගරු කථානායකතුමනි. විදුලිබල හා බලශක්ති ඇමතිතුමා මගේ නම කියමින් සාවද්‍ය ප්‍රකාශයක් කළා. මට ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ඒකට හේතුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

මේ ආර්ථික අර්බුදය පැනනැඟුණාට පස්සේ විවිධ සාකච්ඡා මණ්ඩප තුළ කැබිනට් මණ්ඩලයෙනුත්, ගරු ජනාධිපතිතුමාගෙනුත්, ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභා පත් කරපු අවස්ථාවේත් අපට ලැබුණු උපදේශය තමයි, ආර්ථිකයට යම් කිසි උත්පාදන කර්තව්‍යයක් කරන්න පුළුවන් නම් ඒ පිළිබඳව සොයා බලා වාර්තා කරන්න කියන එක. ඒ අනුව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හරහා කර්මාන්ත අමාත්‍යාංශයෙන් අපේ කමිටුවට ඉල්ලීමක් ලැබෙනවා, ලංකාවේ මැණික් ගරලා ආදායම් උත්පාදනය කරන්න පුළුවන් ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු වාර්තා කරලා ඒ සඳහා ඔවුන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා. ඒ අනුව, අපි එවැනි රැස්වීමක් කැඳවනවා. මැණික් කර්මාන්තය සම්බන්ධව කටයුතු කරන ලංකාවේ තිබෙන සියලුම ආයතනවල නියෝජිතයන් අපි එතැනට කැඳවනවා. විදුලිබල මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, කර්මාන්ත අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, GSMB එක ආදී ඒ සියලු ආයතනවල නියෝජිතයන් කැඳවා ඔවුන් සමඟ කථා කරලා, අපි ඔවුන්ට උපදෙස් දුන්නා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනින් කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මට බරපතළ චෝදනාවක් කළා, මම මැණික් ගරන්න විදුලිබල මණ්ඩලයෙන් අවසර ඉල්ලලා මට ඒකට අවසර දුන්නේ නැති හින්දා විදුලිබල මණ්ඩලයත් එක්ක මට "ඇරියස්" එකක් තිබෙනවා කියලා. මට ඔය කා එක්කවත් "ඇරියස්" එකක් නැහැ. අපට "ඇරියස්" එක තිබෙන්නේ මේ රට මෙතැනට ගෙනාපු මිනිස්සු එක්කයි. ගරු කථානායකතුමනි, අපි මේ උත්සාහ කරමින් ඉන්නේ, අපේ දැනුම අනුව, අපේ ආකල්ප අනුව අපට ලබා දෙන්න පුළුවන් අබමල් රේණුවක හරි දායකත්වයක් තිබෙනවා නම් ඒ දායකත්වය ලබා දීලා එක ඩොලරයක් හරි රටට ගේන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්, එක රැකියාවක් හරි ගොඩනඟන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම් ඒකට දායකත්වය සපයන්නයි. තමන්ට සාපේක්ෂව අනුන් දිහා බලන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.

මට තව කාරණාවක් කියන්න තිබෙනවා. විදුලිබල ඇමතිතුමා මට තව චෝදනාවක් කළා, විදුලි බිල වැඩි කරනවා කියා මම ප්‍රකාශයක් කළා කියලා. ගරු කථානායකතුමනි, විදුලි බිල වැඩි කරනවා කියලා මම ප්‍රකාශයක් කළේ නැහැ. ඛනිජ තෙල් ආනයනයේදී, ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳලා එකතු කළ අගය මත බද්දත් එයට එකතු වෙනවා. එතකොට විදුලිබල මණ්ඩලය විදුලිය නිෂ්පාදනය කරන ප්‍රමාණයෙන් සියයට 66ක් විතර නිෂ්පාදනය කරන්නේ ඛනිජ තෙල් පාවිච්චි කරලා. අමුද්‍රව්‍යයක් විධියට පාවිච්චි කරන ඛනිජ තෙල්වල මිල වැඩි වෙනකොට අනිවාර්යයෙන්ම විදුලිබල මණ්ඩලයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යන එක අපට වළක්වන්න බැහැ. මේක සාමාන්‍ය තත්ත්වයක්, බබෙකුට වුණත් තේරෙන දෙයක්. මේක rocket science එකක් නොවෙයි. අපි විදුලිබල මණ්ඩලයෙන් ඇහුවා, ඛනිජ තෙල්වලට ඒ බද්ද පැනවෙනවා නම්, ඔබතුමන්ලා දැන් කරපු මිල සංශෝධනයත් එක්ක ලාභත් නැති අලාභත් නැති පිරිවැය ආවරණය කරන මට්ටමකට ඇවිල්ලා ඉන්නේ මේ අවස්ථාවේදී නම්, දැන් මේ බද්ද පැනෙව්වොත් මොකක්ද කරන්නේ කියලා. එතකොට එතුමන්ලා පැහැදිලිව ප්‍රකාශයක් කළා, බදු පැනවෙනවා නම් ඒ ගණනට අනුව ඛනිජ තෙල් මිල වැඩි කරන්න සිද්ධ වෙනවා කියලා. අපි ඒ මුළු සාකච්ඡාවම පාර්ලිමේන්තු website එකේ පළ කර තිබෙනවා. එහි, ඒ කථා කරපු දේවල් ඔක්කෝම ටික තිබෙනවා. මේ ඇමතිතුමා එක්කවත්, රාජ්‍ය ඇමතිතුමා එක්කවත්, ලංකා විදුලිබල මණ්ඩලය එක්කවත්, ආණ්ඩුව එක්කවත්, කා එක්කවත් "ඇරියස්" තියාගෙන අපි මෙතැනට ඇවිල්ලාත් නැහැ, අපි එහෙම කටයුතු කරන්නේත් නැහැ, ගරු කථානායකතුමනි. අපට මැණික් ගරන්න ඕනෑත් නැහැ, අපි ඒවාට යන්නේත් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මට එක විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමා මේ කරන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 4ක් ගත්තා නේ. *[බාධා කිරීමක්]*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඉල්ලන්නේ මෙයයි. අපි ගියවරත් පොහොර සම්බන්ධව කථා කරනකොට, පොහොර භාවිතය ගැන කථා කරනකොට මඩක් ගැහුවා, අපි පොහොර කොම්පැනිවලට support කරනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒවා කියලා වැඩක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ ප්‍රශ්නය කියලා ඊට අදාළව කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විනාඩියක් ඉන්න, ගරු කථානායකතුමනි.

අද මොකක්ද කියන්නේ? අපි විදුලි බිල ගැන කථා කරනකොට, විදුලිබල මණ්ඩලයේ දූෂණ ගැන කථා කරනකොට අද කියන්නේ මොකක්ද? කරුණාකරලා ඔය චෝදනාව කරන්න එපා, ගරු ඇමතිතුමනි. අපි මේ කරන්නේ විදුලිබල මණ්ඩලය හා සම්බන්ධ වෘත්තීය සමිති වෙනුවෙන් පෙනී සිටීම නොවෙයි. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් පේනවා, මේ යෝජිත පනතේ ප්‍රශ්නයක් තිබෙන බව. ඔබතුමා කියනවා, මේ ගැන තව කථා කරමු කියලා. අපි කියන්නේත් ඕන්න ඔය කාරණය. ඒක හින්දා අපි ඒක ගැන පොඩි අවධානයක් යොමු කරලා වැඩ කරමු. ගරු ඇමතිතුමනි, ඒක තමයි මට ඉල්ලන්න තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත වැඩ කටයුතු.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2023 දෙසැම්බර් 10 ඉරිදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පත - 2024, විසිතුන්වන වෙන් කළ දිනය, කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2024
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2024
## APPROPRIATION BILL, 2024

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-*
*[ප්‍රගතිය: දෙසැම්බර් 08 ]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 08]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. - [Progress: 08th December]*
*[THE HON. SPEAKER in the Chair.]*

**118වන ශීර්ෂය.- කෘෂිකර්ම අමාත්‍යවරයා**
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,499,400,000

**தலைப்பு 118.- கமத்தொழில் அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,499,400,000

HEAD 118.- MINISTER OF AGRICULTURE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,499,400,000

135 වන ශීර්ෂය.- වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,043,000,000

**தலைப்பு 135.- பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,043,000,000

HEAD 135.- MINISTER OF PLANTATION INDUSTRIES
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,043,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවැනි උපලේඛනය, කෘෂිකර්ම අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 118, 281, 285 සහ 292; වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 135, 289, 293 සහ 337; අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 501. සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා.

[පූ.භා. 11.02]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු සභාපතිතුමනි, "2024 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2023.12.09වන සෙනසුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 118, 281, 285, 292, 135, 289, 293, 337 සහ 501 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනෙහි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේ රටේ වැඩි කොටසක් නියෝජනය වන කෘෂිකර්ම ක්ෂේත්‍රය සහ වැවිලි ක්ෂේත්‍රය ගැනයි අද අපි කථා කරන්නේ. අපි දන්නවා, අද මේ රටේ ගොවියා අන්තිම දුක්ඛිත තත්ත්වයකට පත් කරන්න මේ රජය කටයුතු කරලා තිබෙන බව. ලෝකයේම කෘෂිකර්මය නවීකරණය වෙද්දී පසුගිය කාලයේ පැවති පොදු ජන පෙරමුණු ආණ්ඩුවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත්, හිටපු ඇමති මණ්ඩලයත් තීරණයක් ගත්තා, කාබනික පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. ඒකට මේ ගරු සභාවේ සිටින සියලුදෙනාම වග කියන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා විතරක් නොවෙයි, කැබිනට් මණ්ඩලයේ සිටින සියලුදෙනාම ඒවාට අත දුන්නා. අන්තිමට මොකක්ද වුණේ? මේ රටේ කෘෂිකර්මය කඩාගෙන වැටුණා. 1994 වෙනකොට දළ දේශීය නිෂ්පාදනයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පංගුව සියයට 20යි. අද වෙනකොට -2023 වෙනකොට- ඒ ප්‍රමාණය සියයට 7.5ට අඩු වෙලා තිබෙනවා, සියයට 24ක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිරත වෙලා සිටියත්. පසුගිය අවුරුදු 29දී තේ මේක වෙලා තිබෙන්නේ. හැබැයි, එයින් අවුරුදු 23ක් රට පාලනය

කරලා තිබෙන්නේ මේ උදවිය. 2021.04.27වෙනි දා ගත්ත ඒ අමනෝඥ තීන්දුව නිසා -වත්මන් කෘෂිකර්ම ඇමතිතුමාත් එදා ඒකට ඡන්දය දුන්නා, කැබිනට් මණ්ඩලයේදී- මේ රටේ ගොවියාගේ 2021/2022 මහ කන්නයේ අස්වැන්න සියයට 37කින් අඩු වෙලා තිබෙනවා. 2022 යල කන්නයේ අස්වැන්න සියයට 30කින් අඩු වෙලා තිබෙනවා. 2022/2023 මහ කන්නයේ අස්වැන්න අඩුවීමේ සංඛ්‍යාලේඛන තවම දීලා නැහැ. අම්පාර, මොනරාගල, පොළොන්නරුව, අනුරාධපුරය කියන දිස්ත්‍රික්කවල සංඛ්‍යාලේඛන ලැබිලා තිබෙනවා. ඒ සංඛ්‍යාලේඛනවලට අනුව ඒ දිස්ත්‍රික්කවල අස්වැන්න අඩු වෙලා තිබෙනවා. 2022දී සහල් විතරක් ගෙන්වලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 384,000ක්. ඒ, ඩොලර් මිලියන 292කට. පොහොර නවත්වලා දැන් හාල් ගේනවා. මම අහන්නේ, මේකද ආර්ථික ප්‍රතිපත්තිය? *[බාධා කිරීමක්]* ඔව්, මට ආරංචියි දැනුත් හාල් ගේන්න කටයුතු කරනවා කියලා. මම දන්නේ නැහැ, ඒකේ ඇත්ත නැත්ත. ලබන අවුරුද්දේ ජනවාරි මාසය වෙනකොට -තව මාසයකින්- වී නිෂ්පාදන එළියට එනවා.

අනෙක් කාරණය මේකයි. එක පැත්තකින් අස්වැන්න අඩු වෙලා, ඒවාට නියමිත මිලක් ලැබුණේ නැහැ. අතීතයේ ඉඳලාම සාමාන්‍යයෙන් මේ රටේ ආණ්ඩු ගොවියා ආරක්ෂා කරන්නේ, මිල ආරක්ෂා කරන්නේ වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගෙන. පසුගිය අවුරුදු දෙකේම වී අලෙවි මණ්ඩලය මේ කටයුතු සඳහා මැදිහත් වුණේ නැහැ. ඒ නිසා ගොවියාට හරි මිලක් ලැබුණේ නැහැ. ගොවීන් වී මෝල් හිමියන්ගේ ග්‍රහණයට අහු වෙලා හිටියා. ඒ නිසා වී කිලෝවක මිල රුපියල් 80ටත් එනවා, රුපියල් 85ටත් එනවා, රුපියල් 70ටත් එනවා. දැන් ඩීසල්, පොහොර, බෙහෙත් -සියල්ලේම- මිල වැඩි වෙලා. අද වෙනකොට කුඹුරු අක්කරයක් වැඩ කරන්න රුපියල් 140,000ක්, රුපියල් 150,000ක් විතර වැය වෙනවා. නමුත් ඒ තුළින් හොඳ ආදායමක් ලැබෙනවාද? නැහැ. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 85ක් වැය වෙනවා. වී කිලෝවක රජයේ සහතික මිල රුපියල් 90යි. නමුත්, රජය වී කිලෝවක් රුපියල් 90ට ගන්නේත් නැහැ. ඒ නිසා ගොවියා අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. එහෙම නම් අපි කෘෂිකර්ම ඇමතිතුමාට කියනවා, ගොවියා දුප්පත්වීමේ, ගොවියා වැටීමේ වගකීම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ කියලා. ඒ විතරක් නොවෙයි. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 85ක් වැය වෙනවා. නමුත්, අද වී කිලෝවක් මිලදී ගන්නේ රුපියල් 95ට. පසුගිය දවස්වල වී කිලෝවක් රුපියල් 80ටත් තිබුණා. මමත් කෘෂි කාර්මික කටයුතු කරන දිස්ත්‍රික්කයක තමයි ඉන්නේ.

අනෙක් කාරණය මේකයි. මේ වෙනකොට කන්න තුනක් බඩ ඉරිඟු වගාව විනාශ වෙලා තිබෙනවා. අපේ රටට ඕනෑ බඩ ඉරිඟු අවශ්‍යතාවෙන් සියයට 70ක් විතර අපි නිෂ්පාදනය කරනවා. මොනරාගල, අනුරාධපුරය සහ අම්පාර වාගේ දිස්ත්‍රික්ක ඒ අතුරින් ප්‍රධානයි. 2020දී නිෂ්පාදනය සියයට 50කින් අඩු වෙලා තිබෙනවා. ඇයි ඒ? තමුන්නාන්සේලා බීජ ගෙනාවේ නැහැ; පොහොර ගෙනාවේ නැහැ. රට බංකොලොත් කරලා තිබෙන නිසා මිනිස්සු දුක් විඳිනවා. මේ වෙනකොට -2023දී- අක්කර 100,000ක් විතර බඩ ඉරිඟු වගා කරලා තිබෙනවා. නමුත්, දැන් තමුන්නාන්සේලා අවසර දීලා තිබෙනවා, බඩ ඉරිඟු ටොන් 200,000ක් ගේන්න. බඩ ඉරිඟු අස්වැන්න ලබන මාසයේ ලැබෙනවා. නමුත්, දැනටමත් ටොන් 120,000ක් අපේ රටට ගෙනැල්ලා තිබෙනවා. අපි කියනවා, කරුණාකර බඩ ඉරිඟු ගෙනෙන එක නවත්වන්න කියලා. බඩ ඉරිඟු කිලෝවක් ආනයනයට රුපියල් 120ක්, රුපියල් 130ක් විතර වැය වෙනවා. ඒ අනුව ඒ සඳහා රුපියල් බිලියන 26ක් වැය වෙනවා. මේ සඳහා වැය වන මුදල් ටික අපේ ගොවියාට දෙන්න. තමුන්නාන්සේලා හැම ගොවියෙක්ම විනාශ කරලා තිබෙනවා. වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා.

ලංකාවේ සීනි කර්මාන්තශාලා 4ක් තිබෙනවා. ඒවා තමයි, පැල්වත්ත, සෙවනගල, ගල්ඔය සහ ඇතිමලේ කියන සීනි කර්මාන්තශාලා. එයින් සීනි කර්මාන්තශාලා 3ක්ම තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් උක් ගස් තමයි වැඩියෙන් වගා කරන්නේ. හැබැයි, සීනි මිල වැඩි වෙනවා, උක් මිල වැඩි වෙන්නේ නැහැ. උක් ටොන් එකක් රුපියල් 10,000යි. උක් ගොවියාට අද වියදම පියවා ගන්නවත් විධියක් නැහැ. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා මහ ලොකුවට පොහොර සහනාධාරයක් ගැන කථා කරනවා. මේ රටේ ගොවීන්ගෙන් තුනෙන් එකකට තමයි ඒ පොහොර සහනාධාරය දෙන්නේ. පොහොර සහනාධාරය වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 19,500යි. රටේ කුඹුරු හෙක්ටෙයාර 1,300,000ක් තිබෙනවා. නමුත්, රුපියල් 15,000යි පොහොර සහනාධාරය වශයෙන් දෙන්නේ. මේ පොහොර සහනාධාරය දෙන්නේ වී වගාවට විතරයි. එළවලු වගාවට, බඩ ඉරිඟු වගාවට, උක් වගාවට, අපනයන භෝගවලට මේ පොහොර සහනාධාරය දෙන්නේ නැහැ. අපේ ආණ්ඩුව පැවති කාලයේ නම් හැම ගොවියාටම ඒ පොහොර සහනාධාර ක්‍රමය යටතේ ගන්න පුළුවන් වුණා. අද වෙලා තිබෙන්නේ පොහොර සහනාධාරය දෙනවා කියලා ගොවීන්ගෙන් කොටසකට -වී වගා කරන අයට- විතරක් ඒ සහනාධාරය දෙන එකයි. ඊයේත් ගොවීන් පිරිසක් මට කථා කළා. ඒ අය මේ අවුරුද්දේ අස්වැන්න ලබා ගන්නත් ලැස්තියි. තමුන්නාන්සේලා කිව්වා, මේ පොහොර සහනාධාරයට අදාළ මුදල බැංකුගත කරනවා කියලා. නමුත්, තවමත් ඒ මුදල බැංකුගත කරලා නැහැ. එතකොට කොහොමද ගොවියා පොහොර මිලදී ගන්නේ? ගොවියා දුප්පත් වෙලා තිබෙනවා. ඒ ජීවිත කඩාගෙන වැටිලා තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා තවමත් මේ පොහොර සහනාධාරයට අදාළ මුදල් දීලා නැහැ. මොකක්ද මේ කරන බොරුව? අස්වැන්න ලැබුණාට පස්සේ ඒ මුදල් ලබා දීලා වැඩක් නැහැ. මේ රටේ වගා කරන ඉඩම්වලින් තුනෙන් එකයි වී වගා කරන්නේ. ඒ තුනෙන් එකට විතරයි තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දීලා තිබෙන්නේ.

මම මේ කාරණයත් අහන්න කැමැතියි, කෘෂිකර්ම ඇමතිතුමාගෙන් සහ ආණ්ඩුවෙන්. ඔබතුමන්ලා අර චීන කුණු පොහොර නැවට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක් ගෙවා තිබෙනවා. හැබැයි, පොහොරත් නැහැ; සල්ලිත් නැහැ. විගණකාධිපතිතුමාගේ වාර්තාව මා ළඟ තිබෙනවා. මේ වාර්තාවේ තිබෙනවා, ඒකට ඇමතිවරුත් වග කියන්න ඕනෑ කියලා. විගණකාධිපතිතුමාගේ මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අවුරුද්දක් වෙනවා. මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, 2022 අගෝස්තු මාසයේ 26වැනි දා. හැබැයි, තවමත් සාකච්ඡාවට අරගෙන නැහැ. මේ රටේ මිනිස්සු දුප්පත් වෙද්දී, කන්න නැති වෙද්දී තමුන්නාන්සේලා ඒ ගැන කිසිම සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමාට මම කියනවා, කරුණාකරලා මේ පිළිබඳව COPE එකේ සාකච්ඡා කරලා, මේ ගැන පරීක්ෂණ කරන්න කියලා. මේ හොරු කවුද කියලා රටට හෙළි කරන්න. මේකට සම්බන්ධ අය අපි දන්නවා. ගොවියාට පොහොර නැහැ. රට බංකොලොත් වෙලා තිබියදී හොරකම් කරනවා. අපි ඉල්ලා සිටිනවා, කරුණාකර මේවාට පියවර ගන්න කියලා.

ඒ විතරක් නොවෙයි. මෙවර අය වැයේ සඳහන්ව තිබෙනවා, රාජ්‍ය ආයතන සතු ඉඩම්වලින් අක්කර ලක්ෂ 3ක් කෘෂි කාර්මික කටයුතු සඳහා යොදා ගන්න කියලා. ඒ ඉඩම් මැනුම් කටයුතු වෙනුවෙනුත් මුදල් වෙන් කර තිබෙනවා. මේ ඉඩම් කාටද දෙන්නේ? මහවැලි කලාපයේ ඉඩම්, LRC එකට අදාළ ඉඩම්, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ තිබෙන ගොවි පොළවල් 31ක් පෞද්ගලික අංශයට දෙන්න යනවා. කාටද මේවා දෙන්නේ? තමන්ගේ දේශපාලන හිතවතුන්ටද එහෙම නැත්නම්

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

විදේශීය සමාගම්වලටද? අපට ආරංචියි, විදේශීය සමාගම්වලට දෙන්න යනවා කියලා. මොකක්ද මේ කරන්න හදන්නේ? ඒ කිරි නිෂ්පාදනය වැඩි කරන්නයි කියනවා. තමුන්නාන්සේලා ඔය වාගේම වැඩක් මීට පෙරත් කළා. 2014දී විශාල මුදල් ප්‍රමාණයක් - බිලියන ගණනක්- ගෙවලා, ඕස්ට්‍රේලියාවෙන් කිරි හරක් ගෙනාවා. මොනවාද වුණේ? ඒ හරක් ටික ඔක්කොම මැරුණා. ඒ නිසා ඒ ව්‍යාපාරයේ නිරත වුණු නුවරඑළිය, නුවර පැත්තේ සමහර ව්‍යාපාරිකයන්ට ගෙවල් දොරවල් පවා විකුණන්න සිද්ධ වුණා. කොමිස් ගහලා මේ රටට නුසුදුසු කිරි එළදෙනුන් ගෙනාවා. මම දන්නේ නැහැ, මේ වතාවේත් ඒ වාගේ වැඩක්ද කරන්න යන්නේ කියලා. කරුණාකර මේ දේවල් නවත්වන්න. අපේ රටේ ගොවීන් ඉන්නවා. ඔවුන් දුප්පත්. ඔවුන්ට ඕනෑ ආධාර ටික දෙන්න; උදවු කරන්න. කිරි නිෂ්පාදනය කරන ගොවියෙකුට සත පහක සහනාධාරයක් දෙනවාද? හැබැයි, මේ ඉඩම් දෙන්න හදන්නේ විදේශීය සමාගම්වලට. විදේශීය ආයෝජන අපට අවශ්‍යයි. නමුත්, මේ රටේ ගොවියා අද බොහොම අමාරු තත්ත්වයක ඉන්නේ.

ඒ ගොවියාට ඉන්දියාවෙන්, පාකිස්තානයෙන් ගවයන් ගෙනැත් දුන්නාට කමක් නැහැ. ඒ සතුන්ට අවශ්‍ය කෑම ටික දුන්නාට කමක් නැහැ. අපට ආරංචි විධියට නම්, සමාගමකට මේ ඉඩම් අක්කර ලක්ෂ තුනෙන් වැඩි කොටසක් දෙන්න යනවා. කරුණාකරලා කියන්න, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ට මොකක්ද වෙන්නේ කියලා? මේ සේවකයන්ට ගෙදර යන්න වෙනවා, මේ ඉඩම් සමාගම්වලට දුන්නාට පසු.

දැන් බලන්න, අඹේවෙල සමාගම වැනි දේශීය සමාගම් ලාභ ලබමින් හොඳට පවත්වාගෙන යනවා. මට මතකයි, එක් පෞද්ගලික සමාගම් හිමියෙක් කිව්වා, "මෙහි දූෂණ තිබෙනවා, නමුත් මම මේ ව්‍යාපාරය ගත්තා. අරගෙන මම වෙන මොකුත් කළේ නැහැ, සතුන්ට දෙන්න ඕනෑ කෑම ටික විතරක් දුන්නා. එතකොට කිරි වැඩි වුණා" කියලා. ඒ කියන්නේ ඊට ඉස්සෙල්ලා දීලා නැහැ. කරුණාකරලා අපි ඉල්ලා සිටින්නේ මේකයි. මේ රටේ ගොවීන් අනාථ කරන්න එපා.

පැල්වත්ත කිරි කම්හලේ විතරක් දවසකට කිරි ලීටර් ලක්ෂ දෙකහමාරකින් කිරිපිටි නිෂ්පාදනය කරනවා. අපි කරන්න ඕනෑ ඒකට තව උදව් කරන එක. කාගිල්ස් එක දියර කිරි ලීටර් ලක්ෂ එකහමාරක් ගන්නවා. මිල්කෝ එක ඉස්සර කිරි ලීටර් ලක්ෂ හතරක්, හතරහමාරක් ගත්තා. දැන් ගන්නේ ලීටර් ලක්ෂ එකහමාරක්, දෙකක් පමණ. අපි ඉල්ලන්නේ මේ කර්මාන්ත දියුණු කරන්න කියලා. මේ ගණන් වැරදි නම් තමුන්නාන්සේ මට කියන්න. මමත් මේ විෂයය භාරව මාස ගානක් හිටියා. ඒ නිසායි මම කිව්වේ.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මොනරාගල, හම්බන්තොට, රත්නපුර දිස්ත්‍රික්කවල නියඟය නිසා වගා හානි වුණා. ගං වතුරෙන් මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල වගා හානි වුණා. අක්කර 75,000ක් පමණ වගා හානි වුණා. තමුන්නාන්සේලා කිව්වා, ගොවීන්ට අක්කරයකට රුපියල් 40,000ක් වන්දි ගෙවනවා කියලා. මේ වන්දි ප්‍රමාණය ගෙවන්න නම් රුපියල් මිලියන 3,000ක් ඕනෑ. තමුන්නාන්සේලා රක්ෂණයට සහ ඒ වැඩ පිළිවෙළට මිලියන 100ක් තමයි වෙන් කරලා තිබෙන්නේ. ඉතින් අපි අහනවා, තමුන්නාන්සේලා කොහොමද මේ වන්දි ගෙවන්නේ කියලා. ගිය අවුරුදුවල අපේ පැත්තේ බඩඉරිඟු සහ අනික් හානි වූ වගාවලට වන්දි ගෙවනවා කිව්වා. නමුත් ගෙව්වේ නැහැ. ගොවීන් රවට්ටන්න එපා. මේ වගා හානියට පත් වූ අක්කර 75,000ට අක්කරයකට රුපියල් 40,000 ගානේ ගෙවන්න රුපියල් මිලියන 3,000ක් ඕනෑ. තමුන්නාන්සේලා ගොවීන් රවට්ට රවට්ට ඉන්නවා. මම ඇමතිතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා, කොහොමද මේ වන්දි ගෙවන්නේ කියලා.

ඒ වාගේම, මම මේ කෘෂිකර්ම නවීකරණය කියන කාරණය විවේචනය කරනවා. අපේ රටේ කෘෂිකර්මය නවීකරණය කරන්න අවශ්‍යයි. එහි කිසිම තර්කයක් නැහැ. එය වැඩි වැඩියෙන් කරන්න ඕනෑ. අපේ අරමුණ තිබුණේ අපනයන වෙළඳපොළ. නමුත් අන්තිමට මොකක්ද වුණේ? දැන් නව තාක්ෂණයෙන් මිරිස් වගා කරනවා. නමුත් සංඛ්‍යාලේඛන බැලුවාම, 2010දීත් මිරිස් ටොන් 50,000ක් ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරලා ගිය අවුරුද්දේත් ටොන් 50,000ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ කියන්නේ මේ වැඩ පිළිවෙළ සාර්ථක නැද්ද? ඒ ගැන සොයා බලන්න. අපේ පැත්තේ අන්නාසි වවනවා; අඹ වවනවා. ඒවාට වෙළඳපොළ හොයන්න. මා දන්නා විධියට මේ වැඩ පිළිවෙළින් පිටරට යවන්නේ ඇඹුල් කෙසෙල් විතරයි. ඒ නිසා කරුණාකරලා මේ වැඩ පිළිවෙළේ සාර්ථකත්වය, අසාර්ථකත්වය බලන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ලෝකයම අද දේශගුණික විපර්යාස පිළිබඳව බොහොම උනන්දුවෙන් ඉන්නවා. දේශගුණික විපර්යාස එන්න එන්නම වැඩියි. දේශගුණික විපර්යාස පිළිබඳ යාවත්කාලීන කළ ප්‍රතිපත්තිය පසුගිය දා එළිදැක්වුවා. මම අහනවා, තමුන්නාන්සේලා මේ සඳහා කොච්චර මුදලක් වෙන් කරලා තිබෙනවාද? ලෝකයේ රටවල් අද මේ සඳහා විශේෂ මුදලක් වෙන් කරනවා. ඒ වාගේම විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. අද මේ කටයුතු කරන්න තමුන්නාන්සේලා කොච්චර මුදලක් වෙන් කරලා තිබෙනවාද? ඒ වාගේම සාර්ව කෘෂිකර්ම ප්‍රතිපත්තිය සහ ආහාර හා සත්ව භෝග සඳහා වන කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තවමත් ක්‍රියාත්මක වෙලා නැහැ. මේවා අවුරුදු ගණනක් ක්‍රියාත්මක නොවුණු නිසා තමයි අද අපේ ගොවීන් වැටිලා තිබෙන්නේ. ලෝකය දියුණු වෙද්දී, අලුත් තාක්ෂණය එද්දී, අපේ ගොවියා තවම පරණ විධියට තමයි ගොවිතැන් කටයුතු කරන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

මම පසුගිය දවසක මහවැලි කලාපයට ගියා. මහවැලිය පටන් ගත්ත දවස්වල ඉඩම් අක්කර දෙකහමාරෙන් වී කිලෝ 7,000ක් අරගෙන තිබෙනවා. දැන් ගන්නේ වී කිලෝ 4,500යි, 5,000යි. අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේවාට නිසි වැඩ පිළිවෙළක් හදලා මේ ගොවීන් බේරා ගන්න කියලා.

අනෙක් කාරණය මේකයි ගරු ඇමතිතුමනි. වනසතුන් නිසා අද වන විට ගොවි නිෂ්පාදනවලින් තුනෙන් එකක් විතර අපතේ යනවා. ගොවීන් මේ ගැන මැසිවිලි නඟනවා. මේ අය වැයෙන් සත පහක්වත් ඒ ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් වෙන් කරලා නැහැ. අපි කියන්නේ සතුන් මරන්න කියන එක නොවෙයි. අපි ඉල්ලා සිටින්නේ ඒකට වැඩ පිළිවෙළක් හදන්න කියලායි. මේ නිසා අද ගොවියා බොහොම අසරණ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. වනසතුන්ගෙන් වගාවට වන හානිය එන්න එන්න වැඩි වෙනවා. මම ඉල්ලා සිටින්නේ කරුණාකරලා තමුන්නාන්සේලා මේකට වැඩ පිළිවෙළක් හදන්න කියලායි. මේ ප්‍රශ්නය දැන් මොනරාගල දිස්ත්‍රික්කයටත් බලපානවා; හම්බන්තොටටත් බලපානවා. මත්තල ගුවන් තොටුපොළට විතරක් වනසතුන් හිටපු කැලෑවෙන් අක්කර 5,500ක් වෙන් කර තිබෙනවා. හම්බන්තොට වරායට අක්කර

4,000ක් වෙන් කර තිබෙනවා. ඒ ව්‍යාපෘති දෙකෙන්ම අපේ රටට ලාභයක් ලැබෙන්නේ නැහැ. රිදියගම සෆාරි උද්‍යානයට අක්කර 500ක් වෙන් කර තිබෙනවා. මේවා වනසතුන් හිටපු කැලෑ. අද ඒ වනසතුන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මොනරාගල දිස්ත්‍රික්කයේ මිනිසුන්ගේ වගා භූමිවල තිබෙන දේවල් ආහාරයට ගන්න එනවා. මේ ආකාරයට සැලැස්මක් නැතිව, තමන්ගේ නම හදා ගන්න කරපු මෝඩ සංවර්ධන වැඩ නිසා අද රටත් බංකොලොත් වෙලා තිබෙනවා; ගොවියාත් අමාරුවේ වැටිලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ ගොවියා නංවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ගරු ඇමතිතුමාට යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 11.19]

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)
ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළා. එම ප්‍රශ්නවලට මම අවසානයේ පිළිතුරු ලබා දෙන්න කැමැතියි.

ප්‍රථමයෙන්ම මේ වෙලාවේ මම පැහැදිලිව සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට මම 2018 වර්ෂයේ මාස කිහිපයක් කටයුතු කළා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගේ ප්‍රදේශයටත් ගිහිල්ලා යම් යම් වැඩ කොටස් කළා. ඒ වාගේම රට පුරා ගිහිල්ලා ඒ අවස්ථාවේ වැඩ කොටස් කිහිපයක් සංවිධානය කළා. ඒ වෙනකොටත් අපට මේ වාගේම අභියෝගයක් තමයි තිබුණේ. මම මේ වතාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය බාර ගන්නකොට තිබුණු අභියෝගය ඒ වතාවේත් තිබුණා. පොහොර ප්‍රශ්නය නිසා වී අස්වැන්න විශාල වශයෙන් අඩුවෙලා තිබුණා. පොහොර නැව් එන්නේ නැතිව, පොහොර ගැටලුවකට අපි මුහුණ දුන්නු අවස්ථාවේ තමයි මම මේ අමාත්‍යාංශය බාර අරගෙන සාර්ථකව කටයුතු සිද්ධ කළේ. එහි ප්‍රතිඵලය විධියට අවුරුදු ගණනාවකට පස්සේ මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා, අවුරුදු 40කට පසුව ලැබුණු වැඩිම වී අස්වැන්න ඒ අවස්ථාවේ අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා කියලා. එතැන ඉඳලා තමයි අපේ රටේ වී අස්වැන්නේ වැඩිවීම වාර්තා වෙන්නේ. නමුත්, නැවත මට මේ අමාත්‍යාංශය, මේ වගකීම බාර ගන්න සිද්ධ වුණේ, අවාසනාවකට වාගේ වී අස්වැන්න අඩු වෙච්ච අවස්ථාවක. ඒ වෙලාව වෙනකොට ඔබතුමාට සිහිපත් වෙනවා ඇති රටේ අරගළයක් නිර්මාණය වුණා කියලා. අරගළයේ ආරම්භය විධියට මම විශ්වාස කරන්නේ ගොවි ජනතාවට ඇති වුණු ප්‍රශ්නය කියලායි. එදා ගොවීන්ට ඒ පොහොර වැඩ පිළිවෙළ -ඒක හොඳ වැඩ පිළිවෙළක්- එක සැරේ ක්‍රියාත්මක කරන්න යෑම තුළ ඇති වෙච්ච ගැටලුව නිසා තමයි ඒ අරගළය නිර්මාණය වුණේ කියලා මම විශ්වාස කරනවා. ගොවි ජනතාව හිටියේ ගොවි බිමේ නොවෙයි, මහ පාරේ උද්ඝෝෂණවල; විරෝධතාවල. එවන් අවස්ථාවක තමයි මේ අමාත්‍යාංශය මට බාර වුණේ.

ඒ වෙනකොට ඔබතුමා ඇතුළු මේ සියලුදෙනාට මතක ඇති, සහල් කිලෝ එකක මිල රුපියල් 500ට යනවා කිව්වා. මාධ්‍යවලත් එහෙම කිව්වා. සමහර අය කිව්වා, රුපියල් 1,000ට යයි කියලා. ඒ වෙලාවේ සමහර උදවිය Benzවලින්, BMWවලින්, V8වලින් තිස්සමහාරාම පැත්තට ගිහිල්ලා - කතරගම ගිහිල්ලා එනකොට - වී අරගෙන ආවා. කිලෝ එක රුපියල් 200ටත් වඩා වැඩි මිලටත් අරගෙන ආවා. වී කිලෝ එක රුපියල් 220ට ගෙනාපු අය හිටියා. එවැනි තත්ත්වයක් තුළ තමයි මට මේ අමාත්‍යාංශය බාර වුණේ. ඒ වෙලාවේ අපි දන්නවා, මේ කටයුත්ත අභියෝගාත්මක බව. ඒ වෙලාවේ ඔබතුමන්ලාත් ඒ බව හොඳටම දන්නවා. මම හිතන විධියට ඒ වෙලාවේ පඹයෝ විතරක් දහස් ගණනක් පුච්චලා තිබුණා. මහ පාරවල්වල උද්ඝෝෂණ තිබුණු වේලාවක තමයි මට මේ වගකීම බාර වුණේ. හිටපු අමාත්‍යවරයා -මම ඒ අමාත්‍යවරයාගේ වරදක් කියනවා නොවෙයි- ඒ ප්‍රතිපත්ති තීන්දු ක්‍රියාත්මක කරන්න යෑම නිසා එතුමාට එවැනි විරෝධයක් තිබුණා. නමුත්, මම දන්නවා මේ කටයුතු අමාරු බව. අමාරු වුණත්, මට ඒ වගකීම බාර දුන්නාම, මම ඒ වගකීම බාර ගත්තා. ඊට පස්සේ අපි පළමුවෙන්ම කළේ ජනාධිපතිතුමා මැදිහත් කරගෙන, කැබිනට් මණ්ඩලය සමඟත් සාකච්ඡා කරලා පොහොර පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමයි. ඒ වන විට යල කන්නයක් තිබුණේ. ඒ යල කන්නයේ හෙක්ටෙයාර 212,000ක් තමයි වගා කරලා තිබුණේ. එතකොට ඒ කන්නයේ වැඩ පටන් අරගෙන තිබුණේ.

මම නිලධාරීන්ගෙන් ඇහුවාම කිව්වේ, ඒ ප්‍රමාණය හෙක්ටෙයාර 275,000 දක්වා වැඩි කර ගන්න මහන්සි වෙනවා කියලායි. මොකද, ඒ වන විට ගොවි ජනතාව කුඹුරු වගා කිරීම වර්ජනය කරලායි තිබුණේ. මම ගොවි ජනතාවගෙන් ඉල්ලීමක් කළා, මේ ප්‍රමාණය වැඩි කර ගන්න මහන්සි වෙන්න, අපි කොහොම හරි පොහොර ටිකක් -යූරියා ටිකක් හෝ- ගෙනැල්ලා දෙනවා කියලා. මම මේ රටේ ගොවි ජනතාවට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඇත්තටම ඒ වෙලාවේ ගොවීන් ලොකු විශ්වාසයකින් නොවුණත්, ඒ කටයුත්තට ප්‍රවේශ වුණා. තව කොටසක් ඒ හෙක්ටෙයාර 212,000 වුණත් වගා කළේ අස්වැන්නක් බලාපොරොත්තුවෙන් නොවෙයි, ළමයින්ට කැඳ ටිකක් හරි දෙන්න වී ටිකක් හදා ගන්න ඕනෑ කියලායි. පොහොර නැව පටවන්නත් ඉස්සෙල්ලා, එන්නත් ඉස්සෙල්ලා අපි කිව්වා, "පොහොර එනවා" කියලා. තමුන්නාන්සේලාත් ඒ ගැන ප්‍රශ්න කළා. කෙසේ වෙතත්, ඒ පොහොර නැව එනවාත් එක්කම අපේක්ෂිත ප්‍රමාණයෙන් දෙගුණයකට වඩා -හෙක්ටෙයාර 512,000ක්- යල කන්නයේ වගා කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. හැබැයි, සාර්ථක අස්වැන්නක් ලබා ගන්න බැරි වුණත්, අපි යම් ප්‍රමාණයකට යූරියා දීපු නිසා වියදම යම් මට්ටමකට ආවරණය කර ගන්න ඒ වෙලාවේ ගොවීන්ට පුළුවන්කම ලැබුණා.

ඊළඟට තිබුණේ, මාස් කන්නය. ඒ මාස් කන්නයේදී අපි කිව්වා, අපි තවත් උත්සාහයක් දරනවා කියලා. ඒ සම්බන්ධයෙන් අපි ඇත්තටම ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමාගේ මැදිහත්වීම මත විදේශ ආධාර දෙන කණ්ඩායම් ගණනාවක් එක්ක අපි සාකච්ඡා කළා. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය - FAO, USAID, ලෝක බැංකුව ආදී වශයෙන් සංවිධාන ගණනාවක් එක්ක සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් විධියට, ඒ අය අප සමඟ එකඟ වුණා, පොහොර ලබා දීමේ යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අපි බලාපොරොත්තු වුණා, පොහොර වර්ග තුනම ලබා දෙන්න. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලබා දෙන්න එකඟ වුණු ඒ මඩ පොහොර ටික ලබාගෙන අපට දෙන්න එතුමන්ලා උත්සාහ දැරුවත්, ඒ වෙලාවේ යුක්රේනය හා රුසියාව අතර යුද්ධයක් ඇති වෙලා තිබුණු නිසා, මහ කන්නයට අවශ්‍ය පොහොර නියමිත වෙලාවට දෙන්න බැරි වුණා. මඩ පොහොර

[ගරු මහින්ද අමරවීර මහතා]

නැතුව වගා කරන්නේ කොහොමද කියලා පාර්ලිමේන්තුවේදීම ගොඩක් අය චෝදනා කළා. ගොවියා අධෛර්යවත් වන විධියේ බොහෝ දේවල් ඒ වෙලාවේ මාධ්‍යවලින් පවා ප්‍රකාශ වුණා. මම ඒ කාරණයත් කියන්න ඕනෑ. අපි පළමුවෙන්ම යූරියා ගෙනාපු වෙලාවේ සමහරු කිව්වා, ඒ ගෙනා යූරියා බාල පොහොර කියලා. විරුද්ධ පාර්ශ්වයේම පක්ෂයක් නියෝජනය කරන නායකයෙක් කිව්වා, ඒ ගෙනාවේ බාල පොහොර කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මමද, කිව්වේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා නොවෙයි, වෙනත් පක්ෂයක නායකයෙක් කිව්වේ. *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි කියලා මම කිව්වා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නම කියන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නම කියන්න පුළුවන්. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඒ වෙලාවේ එහෙම කිව්වා. මම හිතන්නේ, ඒක එතුමාට ලබා දුන්නු වැරදි තොරතුරක්. එතුමන්ලාට සම්බන්ධ වෙච්ච ගොවි සංවිධාන ලබා දුන්නු තොරතුරක් අනුව එතුමා කිව්වා, "බාල පොහොර තමයි මේ ගේන්නේ" කියලා. ඒ අය තවත් ඒ වාගේම දේශපාලන කණ්ඩායම්, ගොවි සංවිධාන සමඟ දැඩි ලෙස සම්බන්ධ වෙලා තිබුණා. මොකද, ඒ වෙලාවේ ඒ ගොල්ලන් දේශපාලනය කළේ ගොවි සංවිධාන එක්ක. ඒ නිසා ඒ අය අපේ ගොවිතැන අඩාළ කරන්න ගන්න තිබෙන සියලු ක්‍රියා මාර්ග ගත්තා. බාල පොහොර ගේනවා කියලා ටික දවසයි ගත වුණේ. ඊළඟ කන්නයේ මඩ පොහොර ටික ගේන්න අපට බැරි වෙන කොටම කියන්න ගත්තා, "කුඹුරු වගා කරලා වැඩක් නැහැ. මඩ පොහොර නැත්නම් ප්‍රතිඵලයක් නැහැ" කියලා. එසේ කියමින් වගා කරන එක නවත්වන්න බැලුවා. නමුත්, අපි කරපු ඉල්ලීම අනුව ගොවි ජනතාව කුඹුරු වගා කළා. ඊළඟට, අපි යූරියා ටික ගෙනාවා. එය දෙන්න යන කොට කිව්වා, "මේ පොහොරවල බර අඩුයි" කියලා. මේ පොහොරවල බර අඩුයි, කිලෝ තුන ගණනේ ගසා කාලා, එක හොණ්ඩරයකින් කිලෝ තුන ගණනේ හොරකම් කරලා කියලා යම් පක්ෂයක් නියෝජනය කරන ගොවි සංවිධාන බල මණ්ඩලයක හිටපු නායකයෙක් කිව්වා ඔබතුමන්ලාටත් මතක ඇති. ඒ ගණන හදලා රුපියල් කෝටි ගණනක් ගසා කාලා කිව්වා. ඒකට සමහර රාජ්‍ය නිලධාරිනුත් උදවු කළා. ඒ ගොල්ලන් ඒ දේශපාලන පක්ෂවලට සම්බන්ධ අය නිසා වැරදි තොරතුරු දීලා තිබුණා. අවසානයේ අපට සිද්ධ වුණා, තරාදි දාලා පොහොර කිරලා දෙන්න. බලන්න, කවදාවත් නොකරපු දෙයක් ඒ වෙලාවේ කරන්න සිද්ධ වුණා. තරාදියෙන් කිරලා තමයි අපි ඒ පොහොර ටික දුන්නේ. හැබැයි, ඒවායේ නියමිත බර තිබුණා. සමහර ඒවායේ නියමිත බරට වැඩියෙනුත් තිබුණා. ගොවීන් අධෛර්යවත් කරන මේ වාගේ සිද්ධි බොහොමයක් වුණා.

ඊළඟට ඔබතුමන්ලාට මතක ඇති, පොහොරවල පණුවෝ ඉන්නවා කිව්වා; යූරියාවල පණුවෝ ඉන්නවා කිව්වා. ඒ වාගේම, සමහර කට්ටිය යූරියා කාලා පෙන්නුවා. ඒ අය ආයෙත් කිව්වේ මොකක්ද? "ඇමති කිව්වාට පොහොර දෙනවා කියලා, පොහොර නැහැ" කිව්වා. යූරියා නැව අපේ රටට එනවා. ඒ ගොල්ලන් ඒක දන්නවා. නමුත්, මිනිසුන්ට කිව්වා පොහොර එන්නේ නැහැ කියලා. ගරු සභාපතිතුමනි, ඒ ඔක්කොම කියලා කරන්න හැදුවේ මොකක්ද? ඒ කිව්වේ මොකක්ද? ඒ කිව්වේ, වගා කරන්න එපා, වගා කළාට වැඩක් නැහැ, බාල පොහොර තමයි දෙන්නේ, ඒකත් නියමිත බරට වඩා අඩුවෙන් දෙන්නේ කියලායි. ඒ වාගේම කිව්වා, වගා කළාට වැඩක් නැහැ, පොහොර නැහැ කියලා. ඉතින්, ගොවීන් අධෛර්යවත් වන මේ වාගේ ප්‍රකාශ රාශියක් කරන තත්ත්වයක් මැද්දේ තමයි, ඒ අභියෝගය භාර ගෙන කටයුතු කරන්න අපට සිද්ධ වුණේ. අප ඒ කරපු කාර්යයේ ප්‍රතිඵල අපි මේ වන විට අත් කරගෙන තිබෙනවා. ගිය යල කන්නය වන කොට, අපි පොහොර වර්ග තුනම ලබා දුන්නා. එතැනදීත් මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, ඒවා වෙලාවට ලැබෙන්නේ නැහැ කියලා.

නමුත්, දේශපාලනය ඇඳා ගත්තු සමහර නිලධාරින් සිටින තැන්වල සුළු ප්‍රමාදයක් ඇති වුණත්, නියම වෙලාවට අපි මඩ පොහොර සියලුදෙනාට නොමිලේ දුන්නු බව මම පැහැදිලිව කියනවා. අපි සියලු ගොවීන්ට TSP පොහොර නොමිලේ දීලා තමයි යල කන්නය පටන් ගත්තේ. ඒ කන්නය පටන් ගන්න කලින් පොහොර ටික බෙදලා අවසන් කළා. යූරියා පොහොර තිබුණේ රුපියල් 40,000ට. ගරු සභාපතිතුමනි, අපි මේ වගකීම භාර ගත්තු වෙලාවේ මිනිස්සු යූරියා පොහොර සිල්ලරට ගත්තේ රුපියල් 45,000ට. මිනිස්සු බලාගෙන ඉන්න බැරිකමට යූරියා කිලෝ 5 ගෙනැල්ලා දිය කරලා තෙල් ගහන වැංකිවල දාලා spray කළා. එහෙමයි එදා පොහොර පාවිච්චි කළේ. හැබැයි, අපි මිල රුපියල් 9,000 දක්වා අඩු කරලා පොහොර ලබා දුන්නා. ඒ වාගේම බණ්ඩි පොහොර ටිකත් අපි වෙලාවට ලබා දුන්නා. ඒකේ ප්‍රතිඵලයක් විධියට ඒ වගා කළ ගොවීන්ට ඉහළම අස්වැන්නක් ලබා ගන්න පුළුවන් වුණා. නමුත්, අවාසනාවන්ත විධියට වලව කලාපයේ නියඟය නිසා විශාල විනාශයක් වුණා. අනෙක් පැත්තෙන්, මාතර, ගාල්ල ඇතුළු ප්‍රදේශවල ගං වතුර නිසා විශාල විනාශයක් වුණා. මේ විනාශය මැද්දේ වුණත් අපේක්ෂිත අස්වැන්න ප්‍රමාණය අනෙක් ප්‍රදේශවල ගොවීන්ගෙන් ලබා ගන්න අපට පුළුවන් වුණා. ඒ ගොවි සංවිධානවල නායකයෝ මට ඒ සාර්ථකත්වය ගැන කිව්වා. සාමාන්‍යයෙන් ගොඩක් අය කියන්නේ නැහැ, අස්වැන්න සාර්ථකයි කියලා. හැමදාම ඇහුවාම කියන්නේ, අස්වැන්න අසාර්ථකයි කියලායි. නමුත්, අස්වැන්න සාර්ථකයි කියනවා මට අවුරුදු ගාණකට පස්සේ මේ වතාවේ අහන්න ලැබුණා. තිස්සමහාරාමයේ ගියාම ගොවි නායකයෝ කිව්වා, ඉතිහාසයේ වැඩිම වී අස්වැන්න ලැබුණා කියලා. අනුරාධපුරයේදීත් ඒක කිව්වා. පොළොන්නරුවේදීත් ඒක කිව්වා. හැම තැනකදීම වාගේ ගොවි සංවිධාන දේශපාලනයෙන් තොරව ඒ වෙලාවේ කියන්න ගත්තා, අපට හොඳ වෙලාවට පොහොර ටික ඇතුළු යෙදවුම් ලැබුණු නිසා, අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ වුණු නිසා, ඉන්ධන ටික ලැබුණු නිසා මෙවර හොඳ අස්වැන්නක් ලැබුණා කියලා.

පළමුවෙන්ම කියන්න ඕනෑ, මුල් අවස්ථාවේ ගොවීන්ට අවශ්‍ය ඉන්ධන ටිකවත් තිබුණේ නැති බව. ඒ නිසා විදුලිබල සහ බලශක්ති ඇමතිතුමාත් එක්ක වෙනම කථා කරලා QR Code එකට දෙන තෙල් ටික වෙනස් විධියකට ගොවීන්ට ලබා දෙන්න අපට සිදු වුණා. මේ සියලු තත්ත්ව මැද තමයි අපි කටයුතු කළේ. නියඟයෙන් සහ ගං වතුරෙන් ඇතැම් ප්‍රදේශවල ගොවීන් පීඩාවට පත් වුණත්, අවසානයේ අපට පුළුවන්කම ලැබුණා පසුගිය යල කන්නය සාර්ථක යල කන්නයක් බවට පත් කර ගන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමා කථා කරන්නේ අපි වැරදිකාරයන් හැටියට සලකලායි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමන්ලා වැරදිකාරයෝ කියලා මම කිව්වේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කාටවත් වැරැද්දක් කිව්වා නොවෙයි. ඉන්ධන නැතිව මිනිස්සු පෝලිම්වල මැරුණු වෙලාවේ- *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මොකක්ද කියන්න තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු සභාපතිතුමනි, එතුමා කියන්නේ අපි ඒ තත්ත්වය ඇති කළා වාගේ කථාවක්. ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ හිටපු ආණ්ඩුවෙන්, තමුන්නාන්සේ හිටපු කැබිනට් මණ්ඩලයෙන් තමයි ඒ තීන්දු අරගෙන මේ රට බංකොලොත් කළේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු සභාපතිතුමනි, මේ වාගේ ප්‍රකාශවලට වෙලාව දීලා තේරුමක් නැහැ.

ඉන්ධන නැති වුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ නොවෙයි, අපේ ආණ්ඩුව කාලයේ, ගරු මන්ත්‍රීතුමා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, අපි මේ වගකීම භාර ගන්න වෙලාව වන කොට ඉන්ධන ගන්න ගිහින් සමහර මිනිස්සු පෝලිම්වල මැරුණා; ගෑස් ගන්න ගිහින් සමහර මිනිස්සු පෝලිම්වල මැරුණා. කරන්ට් එක පැය 13ක් තිස්සේ තිබුණේ නැහැ. එහෙම වෙලාවක තමයි මේ වගකීම් භාරගෙන අපි ඉදිරියට ක්‍රියාත්මක වුණේ.

මීළඟට අපි ගිය අවුරුද්දේ යල කන්නයේ නිෂ්පාදන ප්‍රමාණය ගෙන බලමු. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා 2022 වසරට අදාළව කියපු ගණන් නිවැරදියි. සමහර ඒවා ඩොලර්වලින් කිව්වේ. 2022 වසරේ සහල් මෙට්‍රික්ටොන් ලක්ෂ තුනක් ගෙන්නුවා කිව්වාට සහල් මෙට්‍රික්ටොන් ලක්ෂ තුනක් නොවෙයි, අපට ලැබුණු ආධාර එක්ක ගත්තාම මෙට්‍රික්ටොන් ලක්ෂ 8ක් විතර අපේ රටට ගෙනෙන්න සිදු වුණා. ඒ බව අපට පිළිගන්න වෙනවා. අපේ රටේ සහල් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් ලක්ෂ 25ක් විතර වෙනවා. 2022 අවුරුද්දේ ඒකෙන් තුනෙන් එකක් සපුරා ගන්න අපි රට හාල් ගෙනැල්ලායි කෑවේ. අපට එහෙම කන්න සිද්ධ වුණා. මොකද, මිනිසුන් බඩගින්නේ තියන්න බැරි නිසා අපි ඒ වෙලාවේ පිට රටින් සහල් ගෙනැල්ලා දුන්නා. හැබැයි, මේ වගකීම අපි භාර ගත්තා වුණත් ගරු ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත්, අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත්, මගේ රාජ්‍ය ඇමතිවරුත් නිරන්තරයෙන් ඒ සඳහා යෝජනා ලබා දුන්නා. අපි ගත්තු ක්‍රියා මාර්ගවල සාර්ථක ප්‍රතිඵල අපට ලැබුණා. ඒ වාගේම, අපේ ගොවි ජනතාව අපේ වචනය විශ්වාස කරලා වගා කටයුතු කළා. අර කියපු දේශපාලන කණ්ඩායම්, "වගා කරන්න එපා" කියලා අධෛර්යවත් වන දේවල් කියද්දී වුණත් අපේ ගොවි ජනතාව මේ අභියෝගය භාර ගෙන කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් විධියට 2023 අවුරුද්දේ සහල් අවශ්‍යතාවට වඩා වැඩි අස්වැන්නක් අපට ලැබුණා. අපට පරිභෝජනයට අවශ්‍ය වන්නේ සහල් මෙට්‍රික්ටොන් 2,540,000ක්. නමුත්, මෙට්‍රික්ටොන් 2,750,000ක සහල් නිෂ්පාදනයක් සිදු වෙලා තිබෙනවා. එක අතකින් බැලුවාම, මෙක වාර්තාවක්. ගරු කථානායකතුමාගේ දිස්ත්‍රික්කය වන මාතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශවල මිනිසුන්ට ගංවතුර නිසා කැඳ ටිකක් බොන්නවත් වී ටිකක් ගන්න, හාල් ටිකක් ගන්න බැරි වෙච්ච වෙලාවක, හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශ කීපයකම මිනිසුන්ට නියඟය නිසා කැඳ ටිකක් බොන්නවත් වී ටිකක් ගන්න, හාල් ටිකක් ගන්න බැරි වෙච්ච වෙලාවක, අපේ රටේ අනෙක් ප්‍රදේශවල ජනතාව ලබා දුන්නු අස්වැන්න නිසා තමයි මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකකට වැඩි අතිරික්තයක් එක්ක අපේ නිෂ්පාදනය වැඩි කර ගන්න අපට පුළුවන් වුණේ. මේක කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති වෙච්ච විශාල පරිවර්තනයක් කියන එක මට බය නැතිව කියන්න පුළුවන්.

ඒ වාගේම මේකටම අදාළව මේ කාරණයත් මම කියන්න ඕනෑ. "එහෙම නම් තියෙද්දී ගේන්නේ ඇයි?" කියලා අහයි. මම පිළිගන්නවා, අපට -වී අලෙවි මණ්ඩලයට- වී සංචිතයක් තියාගන්න බැරි වුණු බව. මම ඒ සඳහා ලොකු උත්සාහයක් දැරුවා. මේ පාර්ලිමේන්තුවේත් ඒ ගැන කිව්වා; එළියේත් කිව්වා; කැබිනට් එකේත් කිව්වා. මම ලොකු උත්සාහයක් දැරුවා, වී අලෙවි මණ්ඩලය සතුව වී සංචිතයක් තියාගන්න. නමුත් මට ඒකට මුදල් ලබාගන්න බැරි වුණා. මුදල් ලබා ගන්න බැරි වුණු එක ගැන මට චෝදනා කරන්න බැහැ. මොකද, මහ භාණ්ඩාගාරයට මුදල් තිබුණේ නැති නිසා. මම ඒක දන්නවා. මම පෞද්ගලිකවම ගිහිල්ලා බැලුවා. ජනාධිපතිතුමාත් නියෝගයක් දුන්නා, මුදල් තිබෙනවා නම් දෙන්න කියලා. මුදල් අමාත්‍යාංශයට ඒ මුදල් දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ වාගේම බැංකුවලට වුණත් අපට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න බැරි වුණා. එහෙම නොවුණා නම්, අද අපට හාල් ඇටයක්වත් ගෙනෙන්න ඕනෑ වෙන්නේ නැහැ. දැන් අවශ්‍යතාවට -මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකකට - වැඩිය නිෂ්පාදනය වෙලා තිබියදී, අපට කිරි සම්බාවල හිඟයක් තිබෙනවා. ඔබතුමන්ලා ඒක දන්නවා. කොහේ ගිහින් ඇහුවත්, supermarketsවලවත් -කිසි තැනක- කිරි සම්බා ටිකක් ගන්න නැහැ. මටත් කථා කරලා කියනවා, දානයකටවත් කිරි සම්බා ටිකක් ගන්න නැහැ කියලා. මොකද, වී තිබුණාට ඒවා තිබෙන්නේ මෝල්වල. ලොකු වී මෝල්වල තිබෙනවා. අනෙක් වී මෝල්වලත් මේ සැරේ හංගාගෙන ඉන්නවා, වැඩි මිලට විකුණන්න. ඒ නිසා තමයි අපට මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. එතකොට අහයි, ඒවා ගන්න බැරි මොකද කියලා. අපට තිබෙන ප්‍රශ්නය මේවා වටලන්න බලයක් නැතිකම. වී මෝල්වල තිබෙන ඒවා ගන්න පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බලයක් නැහැ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ගැන මම ඇහුවා. දැන් ඒ පනත සංශෝධනය කරනවා. නුදුරේදී ඒ පනත සංශෝධනය කළාම එහෙම කරන්න බැරි වෙයි. ඒ නිසා දැනට ඒවා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සිල්ලර වෙළෙන්දාට දඩ ගහන එක විතරයි කරන්න වෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය එහෙම විසඳාගන්න බැහැ. මෙට්‍රික්ටොන් ලක්ෂ තුනක් ගෙන්වන්න තමයි මුල් අදියරට විමසීමක් කළේ. නමුත් අවසානයේ අපි කිරි සම්බාවලට සමාන වර්ගයකින් මෙට්‍රික්ටොන් 50,000ක් ගෙන්වන්න අවසර දුන්නා. ඒකත් හිතුමතේට වෙළෙඳ පොළට දමන්න බැහැ. රාජ්‍ය ආයතනයක් මඟින් ගෙන්වලා සතොස, සමුපකාර සහ supermarkets හරහා බෙදා හරින්න ඕනෑ. ජනාධිපතිතුමා යටතේ තිබෙන STC ආයතනය මඟින් විතරක් ගෙන්වන්න පුළුවන්. ඒ වාගේම මේ හාල් පාලනයක් යටතේ දෙන්න ඕනෑ. ගොවි ජනතාවට ප්‍රශ්නයක් ඇති නොවෙන්නයි මේ

[ගරු මහින්ද අමරවීර මහතා]

වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. මෙය, වී මෝල්කරුවන් අසීමිත ලාභයක් ලැබීම සඳහා පාරිභෝගිකයා තළා පෙළා දමන එකෙන් මුදවන වැඩ පිළිවෙළක් මිස වෙන කටයුත්තක් නොවෙයි. මේ අය පාලනය කරන්න වෙන මොකවත් කරලා හරියන්නේ නැහැ. මේ සඳහා රජය සතුව වී සංචිතයක් තිබෙන්න ඕනෑ කියලා මම අදත් යෝජනා කරනවා. වී අලෙවි මණ්ඩලයේ හෝ, සතොසේ හෝ වෙන කොහේ හෝ ආයතනයක සංචිතයක් රඳවාගන්නා තෙක් අපට වී හංගාගෙන ඉන්න එක, වී මෝල්කරුවන් වැඩි මිලට විකුණන එක පාලනය කර ගන්න බැහැ. අපට පාරිභෝගිකයන් ආරක්ෂා කර ගන්න බැරි වෙනවා. ඉදිරියේ දී රටේ මූල්‍ය තත්ත්වය සුබ අතට පත් වුණොත්, අපට ඒ අවස්ථාව ලබා ගන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. එහෙම වුණොත් අපට මේක පාලනයකට නතු කර ගන්න පුළුවන් වෙයි.

ගරු සභාපතිතුමනි, මේ මාස් කන්නය. මේ මාස් කන්නයේ අපට දැඩි ලෙස වර්ෂාව ඇවිත් තිබෙනවා. ඒ නිසා තමයි විදුලිබල ඇමතිතුමාත් මේ ගැන කිව්වේ. විදුලිබල මණ්ඩලයට මේ තත්ත්වය වාසිදායකයි. එතුමා කැබිනට් එකේත් මේ ගැන සාකච්ඡා කළා. වැව් පිරිලා ඉතිරිලා යන එකේ වැඩිම වාසිය ලැබෙන්නේ විදුලිබල මණ්ඩලයට. ඇමතිතුමා ඉදිරියේ දී බිදුලි බිල අඩු කිරීම පිළිබඳ සාකච්ඡා පවත්වා ගෙන යනවා. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි මම කිව්වේ. හමුදාව යොදවලාවත් අපට ඒ තත්ත්වය පාලනය කර ගන්න බැරි වුණා. ඒ නිසා නීතියෙන්ම තමයි මේක වෙනස් කර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.*

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

වී මෝල්වල හෝ ගබඩාවල හංගාගෙන ඉන්න ඒවා පාලනය කර ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්න පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය දැන් නීතිය වෙනස් කරනවා කියලා අපට දැනුම් දීලා තිබෙනවා. මම නැවතත් කියන්නේ රටට හාල් ගෙන ඒමේ අවශ්‍යතාවක් නැහැ කියලායි. නමුත් වී මෝල් හිමියන් හංගාගෙන ඉන්න නිසා කීරි සම්බාවලට සමාන දෙයක් ගෙන ඒම පිළිබඳව මන්ත්‍රීවරුත් ගොඩක් කථා කළා. ඉදිරියට එන්නේ නත්තල් කාලය. උත්සව කාලය එන්නේ. අඩු ගණනේ ගෙදරක ළමයෙකුට fried rice එකක් හදා දෙන්නවත් විධියක් නැහැ. සංචාරක ව්‍යාපාරයට ඇති අවශ්‍යතාවත් කියනවා. මම වගකීමෙන් කියනවා, අපේ පරිභෝජනයට අවශ්‍ය සහල් ප්‍රමාණය රට තුළ තිබෙනවා කියලා. මෝල් හිමියන් සහ ගබඩාකරුවන් කරන කාර්යය නිසා තමයි අපට මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒකත් අපි ඉදිරියේ දී පාලනය කරන්න විධි දෙකක් ක්‍රියාත්මක කරනවා. එකක් තමයි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කරලා හංගාගෙන ඉන්න වී එළියට ගන්න බලයක් ඇති කර ගැනීම. දෙවනුව, රජය සතුව සංචිතයක් තියාගෙන අවශ්‍ය වෙලාවට එළියට දමන වැඩ පිළිවෙළක් දියත් කරන්නත් අපි කටයුතු කරන්න සූදානමින් සිටින බව මම සඳහන් කරන්න කැමතියි.

අඛණ්ඩ වර්ෂාපතනය විදුලිබල මණ්ඩලයට වාසිදායක තත්ත්වයක් ඇති කර තිබෙනවා. ඒ වාගේම අඛණ්ඩ වර්ෂාපතනය තිබුණත් අපි මේ මහ කන්නයේ වගා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ මහ කන්නයේ සියලු කුඹුරු අස්වද්දන්න මේ වනවිට අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. මේ වෙලාවේ පොහොර ලබා දෙමින් තිබෙනවා. අපි ළඟ රුපියල් 19,500ට වාගේ විකුණන්න ගෙනාපු බණ්ඩි පොහොර තිබුණත්, මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා රුපියල් 9,000 බැගින් බණ්ඩි පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම පෞද්ගලික අංශය අනෙකුත් පොහොර වර්ග විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙනවා. ගොවීන් නියමිත වෙලාවට පොහොර පාවිච්චි කරලා මහ කන්නයේ සාර්ථක වී අස්වැන්නක් ලබා දෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. 2023 - 2024 මහ කන්නයෙන් පස්සේ මේ රටේ අනිවාර්යයෙන්ම සහල් අතිරික්තයක් ඇති වෙනවා.

මම නිලධාරින්ට උපදෙස් ලබා දුන්නා, ප්‍රශ්න ඇති වුණාම උත්තර හොයන්නේ නැතිව අතිරික්ත සහල් කුමන කාර්යයන්වලටද යොදා ගන්නේ කියා දැන්මම වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. ඒවා අපනයනයට යොදා ගන්නවාද, එහෙම නැත්නම් පිටි කරලා විකල්ප ආහාර නිෂ්පාදනය සඳහා යොදා ගන්නවාද කියන එක පිළිබඳව කටයුතු කරන්න කියලා දැනටමත් අපි උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මෙවර හොඳ වී අස්වැන්නක් ලැබෙයි කියලාත් මම විශ්වාස කරනවා.

අපේ ඊළඟ ඉලක්කය මෙයයි. අපි තව භෝග කිහිපයක් වෙන් කරගෙන තිබෙනවා. අපි හිතුවා, මේ ඔක්කෝම එකට වැඩිදියුණු කරනවාට වඩා ගොවීන් කැමැති දේවල් වගා කරන්න ඉඩ දෙන්න. අපි වී වගාවත් අත්හරින්නේ නැහැ. නමුත්, වී හැරුණාම තවත් භෝග වර්ග කිහිපයකට අපි ප්‍රමුඛතාව ලබා දීලා තිබෙනවා. ඒ තමයි, බඩඉරිඟු, මිරිස්, අර්තාපල් කියන භෝග. ඒ භෝග තුනට ප්‍රමුඛතාව ලබා දෙන්න කියලා මම අපේ නිලධාරින්ට උපදෙස් ලබා දුන්නා. මේවා මේ රටේ නිෂ්පාදනය කරගන්න පුළුවන් දේවල්.

ගරු රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා හරි. මිරිස් වගාව ගත්තාම, අපි මිරිස් මෙට්‍රික් ටොන් 48,500ක් විතර පිට රටින් ගෙනැල්ලා තමයි කන්නේ. අපි කොච්චර කිව්වත් ඒක තමයි ඇත්ත කථාව. හැබැයි, දැන් මිරිස් වගාව ප්‍රචලිත කරන්න නවීන තාක්ෂණය තිබෙනවා. අපේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය - ASMP - හරහා ඒ තාක්ෂණය ගෙනැල්ලා තිබෙනවා. ඔබතුමන්ලාත් ඒ වගාවන් දකින්න ඇති, මමත් එතැනට ගිහිල්ලා බැලුවා. ඒ ගොවීන් එක්ක අපි කථා කළා. මම ඒ හැම තැනකටම වාගේ ගිහිල්ලා බැලුවා. අනුරාධපුරයේ එක ගොවියෙක් අක්කර භාගයක මිරිස් වගා කරලා රුපියල් ලක්ෂ 50ක ආදායමක් ලබා ගත්තා. ඊට පස්සේ මම ඔහු ගැන සොයා බැලුවා. ඔහු බුද්ධික කියලා තරුණ සේවා නිලධාරියෙක්. ඔහු නවීන තාක්ෂණය යටතේ හඳුන්වා දීපු විධියට මිරිස් වගා කරන්න පටන් ගත්තා. ඔහු අක්කර භාගයකින් රුපියල් ලක්ෂ 50ක ආදායමක් ලබා ගත්තා. ඊට පසු මම ගිහින් යාපනයේ ගොවියෙකුගේ මිරිස් වගාව බැලුවා. ඔහු මිරිස් වගාවෙන් රුපියල් ලක්ෂ 60ක් ලබාගෙන වාර්තාවක් තබා තිබෙනවා. තිරප්පනේ බන්දුල කියන ගොවියා ගිය මාසය වෙනකොට රුපියල් ලක්ෂ 84ක් ගත්තා. ඔහු කිව්වා, අවසානය වෙනකොට ඔහුගේ වගාවෙන් රුපියල් ලක්ෂ 100ක් ගන්න පුළුවන් කියලා. මිරිස් අක්කර භාගයක් වගා කරලා රුපියල් ලක්ෂ

100ක ආදායමක් ලබා ගන්න පුළුවන් නම් ඒක මේ රටට මොන තරම් වැදගත්ද? ඒ වාගේම, අපට මේ වගාවන්ට තව කොපමණ තරුණයන් ආකර්ෂණය කරගන්න පුළුවන්ද? අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදීත් මේ වාගේ තරුණ කණ්ඩායම් එකතු කරගෙන මේ වගාව ප්‍රචලිත කරන්න. නමුත්, ඒකට අපට මූල්‍යමය ප්‍රශ්න තිබෙනවා. ආධාර ලබා දෙන විදේශ කණ්ඩායම් එක්ක අපි කථා කරගෙන යනවා, මේවාට අපට උදවු කරන්න කියලා. එක් කෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියනයක් පමණ වියදම් කරන්න පුළුවන් නම්, ඒ තරුණයන් ආයෙත් කවදාවත් ආණ්ඩුවේ රස්සා ඉල්ලාගෙන යන්නේ නැති තත්ත්වයට පත් කරගන්න අපට පුළුවන්කම තිබෙනවා. අද කෘෂිකර්මයට නවීන තාක්ෂණය උපයෝගී කර ගන්නවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, කෘෂි නවීකරණ ව්‍යාපෘතිය තුළ යම් යම් ගැටලු තිබෙන බව. නමුත්, ඒක සාර්ථක වුණු තැනුත් තිබෙනවා. ඔබතුමා කිව්වා, ඇඹුල් කෙසෙල් අපනයනය සිද්ධ වෙනවා කියලා. මම දෙතුන් වතාවක් ගිහින් බැලුවා, රජාංගනයේ ඒක ඉතාම හොඳින් සිද්ධ වෙනවා. ඩුබායි වෙළෙඳ පොළට "Baby Banana" නමින් යාපනයේ ඇඹුල් කෙසෙල් අපනයනය සිද්ධ වෙනවා. ඒ වාගේම, ඇඹිලිපිටිය සහ හම්බන්තොට අතරමැද බරවකුඹුක ආසන්නයේ කච්චිගල්ආර ප්‍රදේශයේ වසා තිබෙන වී ගොවිපොළේ මේ වන විට තවත් ඇඹුල් කෙසෙල් අපනයන සැකසුම් මධ්‍යස්ථානයක් සකස් කරගෙන යනවා. ඒ ප්‍රදේශයේ ගොවීන් 400ක් මුල් වටයේ එකතු කරගෙන අපි විදේශ වෙළෙඳ පොළට ඒ නිෂ්පාදන යවන්න කටයුතු කරනවා.

ඒ එක්කම මම කියන්න කැමැතියි, 2018දී මම ගිහිල්ලා වාකරේ ප්‍රදේශයේ green cucumber වගාව ආරම්භ කළ බව. ඒ කියන්නේ, ගර්කින් වාගේ කොළ පිපිඤ්ඤා වර්ගයක්. ඒ වගාව ආරම්භ කළේ 2018 වර්ෂයේදී. අපි ඒ ව්‍යාපෘතියට වියදම් කළ මුළු ඩොලර් ප්‍රමාණයට වඩා ආදායමක් දැනටමත් ඒ වගාවෙන් ලංකාවට ලැබී තිබෙනවා. ඒ අනුව, ඒ මඟින් රටට ඩොලර් ඇවිල්ලා තිබෙනවා. ඒ ව්‍යාපෘතියට අපට වැය වුණු මුළු මුදලම ඒ ගර්කින් වගාවෙන් විතරක් ලැබී තිබෙනවා. දැන් අපට මේ වගාව බොහොම හොඳට කරගෙන යන්න පුළුවන්. දැන් නවීන තාක්ෂණය උපයෝගී කරගෙන අපි අඹ වගාවත් කරනවා. ඔබතුමා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයටත් මම ගියා. මමම සිට වූ ගස් තිබෙනවා. 2018දී මම මොනරාගල, දඹුල්ල, යාපනය ප්‍රදේශවල අඹ කලාප හැදුවා. මම එම ප්‍රදේශ තුනටම ගිහිල්ලා ඒ ගස්වල ගෙඩිත් කැඩුවා. සමහර ඒවාට බෑග් දැමුවා. ඒ අවස්ථාවේ අපි අක්කරයකට ගස් 80ක්, 85ක් පමණ ප්‍රමාණයක් තමයි සිටවූයේ. අද වෙනකොට අපි ඒ වගාවටත් නවීන තාක්ෂණය ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම, තිබෙන තාක්ෂණයත් තව වැඩිදියුණු කරලා තිබෙනවා. ඒ අනුව, ඒ ප්‍රදේශයේම අක්කරයකට ගස් 560ක් සිටුවන්න පුළුවන්කම ලැබී තිබෙනවා. අක්කරයකට පේර පැළ 1,500ක් පමණ සිටුවන්න පුළුවන් තත්ත්වයට අද ගොවීන් පත් වෙලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් නිර්මාණය කරගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

පශු සම්පත් ක්ෂේත්‍රය ගත්තොත්, මම මේ අමාත්‍ය ධුරයට පත් වනකොට තිබුණු අභියෝගය තමයි, බිත්තර පිට රටින් ගෙන ඒම, මස් පිට රටින් ගෙන ඒම. ඒ ගැන ඔබතුමන්ලාත් දන්නවා. පිට රටින් ගෙනැල්ලා මස් කන්න දෙන්න, පිට රටින් ගෙනැල්ලා බිත්තර කන්න දෙන්න යෝජනා ඉදිරිපත් වුණා. බිත්තරයක මිල රුපියල් 70ට ගියා, කුකුළු මස් කිලෝවක මිල රුපියල් 1,700ට ගියා. අපි බැණුම් අහමින් ඒ සඳහා වැඩ පිළිවෙළක් හැදුවා. බණින්න බණින්න අපි ඒක බාධාවක් කර ගත්තේ නැහැ. ඒක ශක්තියක් කරගෙන ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් හැදුවා. එහි ප්‍රතිඵලයක් විධියට අපි හඳබිම අධිකාරිය හරහා ගම්කුකුළු පැටව් 20,000කට වැඩිය ගම්වලට දුන්නා. ඒ වාගේම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා අපි පළමුවැනි වතාවට පැටව් ප්‍රමාණය වැඩි කිරීම සඳහා රැකීමට ලක් කළ හැකි බිත්තර - hatching eggs - ගෙනාවා. එම බිත්තර ගෙනැල්ලා වේගයෙන් පැටව් ප්‍රමාණය වැඩි කළා. මට බය නැතිව කියන්න පුළුවන් එක කාරණයක් තිබෙනවා. උත්සව සමය නිසා මේ මාසයේ තව දවස් කිහිපයක් බිත්තරවල ප්‍රශ්නයක් තියේවි. නමුත්, අපි කරන සියලු කටයුතුවල ප්‍රතිඵලය විධියට ජනවාරි මාසයේ සිට බිත්තර මිලෙහි අඩුවීමක් මිසක් වැඩිවීමක් සිදු වෙන්නේ නැහැ, කුකුළු මස්වල මිලෙහිත් අඩුවීමක් මිසක් වැඩිවීමක් සිදු වෙන්නේ නැහැ. 2024 වසරේ අපේ ඉලක්කය තමයි, නිෂ්පාදනය වැඩි කිරීම. අපි දැනටමත් -මේ තත්ත්වය තුළත්- කුකුළු මස් සහ බිත්තර අපනයනය කරනවා. මොකද, අපේ රට කුරුලු උණෙන් තොර කලාපයක් නිසා අපට බිත්තර යවන්න පුළුවන්. මාලදිවයින කියන්නේ අපෙන් ඒ දේවල් ලබා ගන්නා ප්‍රමුඛ රටක්. අපේ රට ලබන අවුරුද්දේ සිට අනිවාර්යයෙන්ම බිත්තර සහ කුකුළු මස් අපනයනය කරන රටක් බවට පත්කරන්න අවශ්‍ය පියවර ගන්නවා කියන එකත් මම සඳහන් කරන්න කැමැතියි.

වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ගැන ගොඩක් දේවල් කියන්න තිබුණත්, ඊට වෙලාවක් නැහැ. මම මේ අමාත්‍යාංශය අලුතින් භාර ගත්තේ. මේ ක්ෂේත්‍රය නඟා සිටුවන්න අපේ රමේෂ් පතිරණ මැතිතුමා ලොකු උත්සාහයක් දැරුවා. ඒ තත්ත්වය ඉස්සරහට ගෙන යන්න අපි කටයුතු කරනවා. තේවලින් ලැබෙන ආදායමේ අඩුවීමක් තිබෙනවා. ඒ ගැන එතුමා කථා කරාවි. අද වෙලාවක් නැහැ. අපේ මන්ත්‍රීවරුන්ටත් තිබෙන්නේ විනාඩි පහයි, හයයි. තේ වගාව වැඩිදියුණු කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම කුරුඳු වගාව සංවර්ධනය කිරීමට දෙපාර්තමේන්තුවක් අලුතින් පිහිටුවා තිබෙනවා. මොකද, ඒ හරහා ඒ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න. අපි නවීන තාක්ෂණය වගාවන්ට හඳුන්වා දෙනවා. අපට පොල් කර්මාන්තයෙන් විශාල ආදායමක් ලබාගන්න පුළුවන් මාර්ග තිබෙනවා. ඒ කටයුතුවලටත් අපි දායක වන බව මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් ඔබතුමා අහපු කාරණයකට මම පිළිතුරක් දෙන්න කැමැතියි. ඒ තමයි, ගොවීන්ට වන්දි දෙන්නේ කොහොමද කියන එක. අපි ගොවීන්ට වන්දි දෙනවා. අපි දැනටමත් වන්දි දෙන්න පටන් අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් අවුරුද්දක් එකහමාරක් ගිහිල්ලා තමයි මෙතෙක් අපි වගා හානියකට වන්දි දුන්නේ. නමුත්, අපි මේ අවුරුද්දේ වන්දිය විධියට මේ වනකොටත් -මාස ගණනක් ඇතුළත- ගිණුම්වලට මුදල් දමා තිබෙනවා. මම ගිහිල්ලා ඇඹිලිපිටියේ ගොවීන්ට වන්දි බෙදලා දුන්නා. මාසයක් ඇතුළතදී ගංවතුරෙන්, නියඟයෙන් පීඩාවට පත්ව වගා හානි සිද්ධ වෙච්ච සියලුදෙනාට වන්දි ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ සඳහා අපට මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබෙනවා.

ඒ වාගේම පොහොර සඳහා මුදල් ලැබීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි පිළිගන්නවා. මොකද, අපේ ගොවි ජන සේවාවලට අදාළ සමහර නිලධාරින් මේ වැඩ පිළිවෙළට කැමැති නැහැ. බෙදා දීම සඳහා පොහොර එනවා නම් ඔවුන් කැමැතියි. ගිණුමට සල්ලි දමන එකට ඒ අයගේ කැමැත්තක් නැහැ. ඒක මම පැහැදිලිව කියනවා. මේ ආයතනය මා යටතේ තිබුණා වුණත්, ගොවීන්ගේ මුදල් ගිණුමට යවන්න ඒ අය කැමැති නැහැ. ඒ නිසා අදාළ ලේඛන එවීමේ ප්‍රමාදයක් තිබෙනවා. හැබැයි, ඒ ප්‍රමාදය මඟ හරවා ගෙන කටයුතු කරන්න අපි ලොකු උත්සාහයක් දරනවා. මේ අවුරුද්දේදී යම් ප්‍රමාදයක් ඇති වෙයි. නමුත්, අපි හැම කෙනෙකුටම මේ මුදල ගිණුමට යවනවා. ලබන කන්නය වෙනකොට අපි මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳනවා. සම්පූර්ණ database එක හදා ගත්තාම අපට කෙළින්ම ඒ මුදල ගිණුමට

[ගරු මහින්ද අමරවීර මහතා]

යවන්න පුළුවන්. එතකොට අපේ නිලධාරින්ටත් බොහොම පහසුවක් ඇති වෙනවා. එතකොට ඔවුන්ට මේ සම්බන්ධයෙන් කරන්න වැඩක් නැහැ. ඒ මුදල ගොවියාට ලැබුණාම ගොවියා කැමැති විධියට මේ කටයුත්ත කරගෙන යනවා කියන එකත් මම සඳහන් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, කිරි නිෂ්පාදනය ගැනත් ඔබතුමා කිව්වා. අපි ඉඩම් අක්කර ලක්ෂ 3ක් දෙන්නේ නැහැ. NLDB එක යටතේ තිබෙන්නේ අක්කර 28,000ක් විතර. ඉන්දියාවේ අමුල් සමාගම එක්ක ඒ සඳහා සාකච්ඡාවක් පවත්වනවා. නමුත්, තවම අවසාන නිගමනවලට ඇවිල්ලා නැහැ. ඒ පිළිබඳවත් මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕනෑ. එය කිරි කර්මාන්තය වැඩිදියුණු කර ගැනීම සඳහා වන යෝජනාවක් මිසක්, කිසිම එකක් විකිණීමක් කරලා පැත්තකට වෙන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. අපේ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යතුමන්ලා හතරදෙනෙක් ඉන්නවා. එතුමන්ලා ඉතාම සහයෝගයෙන් කටයුතු කරනවා. එතුමන්ලා මට ලබා දෙන සහයෝගය පිළිබඳව මම ඒ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ නිලධාරින් අතර බොහොම මහන්සි වෙලා වැඩ කරන කණ්ඩායමක් ඉන්නවා, වැඩ නොකරන කණ්ඩායමකුත් ඉන්නවා. වැඩ කරන, මහන්සි වෙන නිලධාරින් කණ්ඩායමටත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ආයතන ප්‍රධානීන්ටත්, දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ඇතුළු ඒ කණ්ඩායමටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. ඉදිරියේදී අපේ රාජ්‍ය අමාත්‍යතුමන්ලාගේ කථාවලදී එතුමන්ලා ඉතිරි කාරණා ඉදිරිපත් කරාවි.

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු තවරාජා කලෛයි අරසන් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.48]

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ தவிசாளர் அவர்களே, எமது நாட்டின் மிக முக்கிய துறைகளான கமத்தொழில் மற்றும் பெருந்தோட்டத் துறைகள் சம்பந்தமான அமைச்சுகள் பற்றி இடம்பெறும் இன்றைய குழுநிலை விவாதத்திலே எமது மாகாணம், மாவட்டம் சார்ந்த விடயங்களைப் பற்றிப் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. மிக்க நன்றி! உண்மையில் இலங் கையைப் பொறுத்தமட்டில் இதுவொரு விவசாய நாடு. ஆகையால், நாங்கள் விவசாயத்தை மேம்படுத்த வேண்டும்; அதனூடாகப் பொருளாதாரத்தை மேம்படுத்த வேண்டும் என்ற எண்ணம் ஜனாதிபதியிடமும் அமைச்சர்களிடமும் அதேபோன்று எங்களைப் போன்ற அரசியல்வாதிகளிடமும் இருக்கின்றது; இல்லையென்று நாங்கள் சொல்லவில்லை. எமது நாட்டின் மொத்தத் தேசிய உற்பத்தியில் 25 சதவீதமான உற்பத்தியைக் கிழக்கு மாகாணம் பெற்றுத் தருகின்றது. அதிலும் அம்பாறை மாவட்டம் மொத்தத் தேசிய உற்பத்தியில் கிட்டத்தட்ட 22 சதவீதமான உற்பத்தியை வழங்கிக்கொண்டு இருக்கின்றது.

குறிப்பாக, கடந்த பெரும் போகத்திலே எங்களுடைய விவசாயிகள் தமது விவசாய உற்பத்திப் பொருட்களை விற்பனை செய்வதிலே மிகவும் கஷ்டத்தை எதிர்கொண்டார்கள்; அவர்களுக்குப் பாரிய நட்டம் ஏற்பட்டது. ஏனென்றால், அரசாங்கத்தினால் நிர்ணயிக்கப்பட்ட விலைக்கு நெல் கொள்வனவு செய்யப்படவில்லை. அந்த வேலைத் திட்டத்தைக்கூட அரசாங்கம் அங்கு இறுதி நேரத்தில்தான் முன்னெடுத்திருந்தது. இது தொடர்பில் நான் கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு கோரிக்கையை முன்வைக்கலாம் என்று நினைக்கின்றேன். ஏனென்றால், பொலன்னறுவை, அநுராதபுரம், குருநாகல் போன்ற மாவட்டங்களிலே அறுவடை ஆரம்பித்ததும் நெல் சந்தைப்படுத்தும் சபையினால் நெல் கொள்வனவு செய்யப்படுகின்றது. ஆனால், கடந்த காலங்களில் எங்களுடைய மாவட்டத்தில் அவ்வாறு செய்யப்படவில்லை. ஆகவே, எதிர்காலத்தில் அங்கும் அவ்வாறான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

குறிப்பாக, எங்களுடைய விவசாயிகள் அந்த மாவட்டத்திலே நெல் உற்பத்தியை விரிவுபடுத்தியிருந்தாலும், அவர்களுக்கு அது தொடர்பான போதிய, தெளிவான விளக்கங்கள் வழங்கப்படுவதில்லை. அம்பாறை மாவட்டத்திலே கூடுதலான விளைச்சலைப் பெறுகின்ற விளைநிலங்கள் இருப்பது உங்களுக்குத் தெரியும். அந்த அடிப்படையில், நாங்கள் சம்பந்தப்பட்ட அதிகாரிகளை அழைத்துச் சில இடங்களிலுள்ள மண்ணை ஆய்வுசெய் கின்றபொழுது, அதன் முடிவுகள் காலதாமதமாகியே எங்களுக்குக் கிடைக்கப்பெறுகின்றது. இது எங்களுடைய விவசாயத் திணைக்களத்தின் பிரச்சினையா அல்லது எங்களுடைய பிரதேசங்களில் அதற்குரிய கருவிகள் இல்லையா? என்ற பல வினாக்களை எழுப்புகின்றது. எனவே, இந்த விடயங்களையும் நீங்கள் கருத்திற்கொண்டு செயற்படவேண்டும்.

அடுத்து, அதிகமான எங்களுடைய விவசாயிகள் தமது உற்பத்தியிலிருந்து தாங்கள் பெறுகின்ற இலாபத்தைவிட மேலதிகமாகச் செலவழிக்கவேண்டிய ஒரு சூழல் இருக்கின்றது. இந்த நிலைமைகளையெல்லாம் நீங்கள் மாற்ற வேண்டும். குறிப்பாக, அம்பாறை மாவட்டத்திலே பல இடங்களில் நெல் சந்தைப்படுத்தல் சபையின் செயற்பாடுகளை விரிவுபடுத்தி, நிர்ணயிக்கப்பட்ட விலைக்கு எங்களுடைய விவசாயிகளின் நெல்லைக் கொள்வனவு செய்வதற்குரிய ஏற்பாடுகளை நீங்கள் செய்துதர வேண்டும்.

அதுமாத்திரமல்ல, அம்பாறை மாவட்டத்திலே ஆசியக் கண்டத்திலேயே பெயர் பெற்ற பெரியதோர் அரிசி ஆலை இருந்தது; அது இன்று இல்லை. உண்மையிலே, நீங்கள் ஒன்றை விளங்கிக்கொள்ளவேண்டும். யுத்த சூழலால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்குப் பிரதேசங்களில் இருந்த பல கைத்தொழிற் பேட்டைகள் இன்று இருந்த இடமே தெரியாதளவுக்கு ஆக்கப்பட்டிருக்கின்றது. இவ்வாறிருக் கின்றபோது அந்தப் பிரதேசங்களை எதிர்காலத்தில் எவ்வாறு அபிவிருத்தி செய்ய முடியும்? உண்மையிலே, விவசாயத்தை மேம்படுத்த வேண்டுமானால், விவசாயிகளைக் கவரக்கூடிய பணிகளை இந்தக் கமத்தொழில் அமைச்சினூடாக முன்னெடுக்க வேண்டும். இப்பொழுது எங்களுடைய விவசாயிகள் கூடுதலாக விவசாயத் துறையைக் கைவிட்டு, வெளிநாடுகளுக்குச் செல்லக்கூடிய நிலைமைதான் இருக்கின்றது. ஏனென்றால், அவர்களுடைய உற்பத்தியின் மூலமான வருமானத்தைவிடச் செலவு கூடுதலாக இருக்கின்றதென்ற அடிப்படையில், அவர்கள் அவ்வாறு வெளியேறுகின்ற நிலைமை காணப்படுகின்றது. கடந்த காலங்களில் எங்களுடைய பிரதேசங்களிலே சில

அரிசியாலைகளிலிருந்து நெல் கொள்வனவு செய்யப் பட்டிருந்தது. அதுபோல், எதிர்காலத்தில் இந்த விவசாயத் துறையை மேம்படுத்தக்கூடிய வேலைகளை மேற்கொள் வதுடன், குறிப்பாகச் சிறந்த நெல் கொள்வனவு முறையூடாக அந்த விவசாயிகள் தங்களுடைய நெல்லை இலகுவாக விற்பனை செய்யக்கூடிய ஒரு சூழலை நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

இன்னும் சில விடயங்களை இங்கு நான் பேசவேண்டியிருக் கின்றது. கல்முனை கரைவாகுவட்டை என்று சொல்லப் படுகின்ற கல்முனை கரைவாகு, நற்பிட்டிமுனை வடக்கு, நற்பிட்டிமுனை மேற்கு ஆகிய பிரதேசங்களிலே 2005 - 2010 வரை 'நியாப்' திட்டத் தினூடாகப் பத்து வேலைத்திட்டங்கள் முன்மொழியப்பட்டு, அதற்கான பணிகள் ஆரம்பிக்கப் பட்டிருந்தன. அங்கு கிட்டத்தட்ட 950 ஏக்கர் மிகவும் வளங்கொழிக்கின்ற விளைநிலங்கள் இருக்கின்றன. அவர்கள் வருடத்தில் ஒரு போகச் செய்கையாகச் சிறுபோகத்தை மாத்திரந்தான் செய்கின்றார்கள். மழைக் காலங்களில் ஏற்படும் வெள்ளப் பெருக்கின் காரணமாக விவசாயிகளின் விளைநிலங்கள் பாதிக்கப்படுகின்றதென்ற அடிப்படையில், வழுக்கமடு ஆறு அகற்றுதல் மற்றும் வடிச்சல் வாய்க்கால்கள் புனரமைக்கின்ற வேலைத்திட்டங்கள் உட்படப் 10 வேலைத் திட்டங்களை முன்னெடுத்திருந்தார்கள். ஆனால், அந்த வேலைகள் பூர்த்தியாகும் முன்னரே 'நியாப்' திட்டத்தை முடிவுறுத்தி அங்கிருந்து அவர்கள் வெளியேறியிருக் கின்றார்கள்.

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**

(மாண்புமிகு தவராஜா கலை அரசன்)

(The Hon. Thavaraja Kalai Arasan)

கௌரவ தவிசாளர் அவர்களே, கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களின் நேரத்திலிருந்து 5 நிமிடத்தை எனக்கு வழங்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

கடந்த வருடமும்கூட, சிறுபோகத்தின்போது வெள்ளம் பெருக்கெடுத்ததனால், விவசாயிகளின் விளைநிலங்கள் நாசமாகிய வரலாறும் இருக்கின்றது. இந்த 'நியாப்' திட்டத் தின்கீழ் இனங்கண்ட அந்தப் 10 வேலைத்திட்டங்களையும் நடைமுறைப்படுத்துவதனூடாக, அந்த விவசாயிகள் எதிர்காலத்திலே இரு போக வேளாண்மையினைச் செய்யக்கூடியதாக இருக்கும் என்பதுடன், அவர்களுடைய பொருளாதாரத்தையும் இந்த நாட்டின் பொருளாதாரத்தையும் மேம்படுத்தக்கூடிய வகையிலும் அது அமையும். எனவே, அந்தத் திட்டத்தை நீங்கள் கட்டாயமாக நடைமுறைப் படுத்தவேண்டும்.

அதுமாத்திரமல்ல, கவுடாதீவு என்று சொல்லப்படுகின்ற இடத்திலுங்கூட, ஆற்றங்கரையை அண்டிய சவலக்கடை, நாவிதன்வெளி, அன்னமலை, காரைக்குடா, குடியிருப்புமுனை போன்ற பிரதேசங்களை அண்டியதாக 1,000 ஏக்கருக்கும் மேற்பட்ட நிலம் இருக்கின்றது. உவர்நீர் இந்த வயல்வெளிக்குள் வெள்ளமாகச் செல்கின்றபொழுது அந்த விளைநிலங்கள் பாதிக்கப்படுகின்றன. நீரிலே மிதக்கக்கூடிய கனரக வாகனங்களைப் பயன்படுத்தி, அந்த அணைக் கட்டுகளைச் செப்பனிடுவதனூடாக அந்தப் பிரதேசங்களிலும் விளைச்சலை அதிகரிக்கக்கூடிய ஒரு சூழல் இருக்கின்றது. எனவே, அந்த விடயத்தினையும் நீங்கள் விரைவுபடுத்திச் செய்துதர வேண்டும்.

அதேபோல், 1952 - 1956ஆம் ஆண்டு காலப்பகுதியில் 'கல்ஓயா திட்டம்' என்று சொல்லப்படுகின்ற கருத்திட்டத் தின்கீழ் இந்த நாட்டில் பல பணிகளைச் செவ்வனே செய்து முடித்த முன்னாள் பிரதம மந்திரி டி.எஸ். சேனாநாயக்க அவர்கள், திருக்கோவில் வலதுகரை வாய்க்காலைப் புனரமைப்புச் செய்வதற்கான திட்டத்தையும் முன்னெடுத் திருந்தார். இருந்தும் அத்திட்டம் இடைநடுவில் கைவிடப் பட்டது. திருக்கோவில், ஆலையடிவேம்புப் பிரதேசங்களில் கிட்டத்தட்ட 20,000க்கும் மேற்பட்ட ஏக்கர் நிலம் வானம் பார்க்கின்ற பூமியாக இருந்துகொண்டிருக்கின்றது. இத்திட் டத்தை முழுமையாக நடைமுறைப்படுத்துகிறபொழுது, அங்கு விவசாயத்தை மாத்திரமல்ல, கால்நடை வளர்ப்பு மற்றும் ஏனைய மேட்டுநிலப் பயிர்ச் செய்கையையும் சிறப்பாக முன்னெடுக்கமுடியும். கடந்த மாதத்திற்கு முந்திய மாதம் கௌரவ பிரதமர் அவர்கள் அம்பாறை மாவட்டத்திற்கு வருகை தந்தபோது அந்தப் பிரதேசத்திலுள்ள மக்களால் அத்திட்டம் சம்பந்தமான முன்மொழிவுகள் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றன. அத்திட்டத்தினை நடைமுறைப்படுத்துகின்றபொழுது, அந்தப் பிரதேசத்திலே விவசாயம் மேம்படுவது மாத்திரமல்ல, அங்குள்ள மக்களும் பொருளாதாரத்தில் உயர்ந்தவர்களாக, இந்த நாட்டுக்குப் பொருளாதாரத்தை ஈட்டித் தருபவர்களாக விளங்குவார்கள். இன்று அங்கு கால்நடைகளை வளர்ப்போர்கூட அவற்றுக்குத் தண்ணீர் இல்லாது பாரிய பிரச்சினைகளை எதிர்கொண்டிருக்கிறார்கள் என்பது உங்களுக்குத் தெரிந்திருக்கும்.

அதேபோல், திருக்கோவில் பிரதேசத்திலே சில இடங்களில் மேட்டுநிலப் பயிர்ச் செய்கைகளை மேற்கொள்கின்ற மக்கள்கூட அந்த இடங்களிலிருந்து குடிபெயர்கின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. இந்த நிலைமைகள் மாற்றம் பெறவேண்டுமானால், அந்தப் பிரதேசத்திலே விவசாயத்தை மேம்படுத்தக்கூடிய திட்டங்களை நாங்கள் முன்னெடுக்க வேண்டும். நாங்கள் வடக்கு, கிழக்கு என்று அடிக்கடி பேசுவது எங்களுடைய மக்களின் நலன்சார்ந்த விடயங்களுக்காகவே தவிர, அரசியலுக்காகவல்ல. வடக்கு மாகாணத்திலும், கிழக்கு மாகாணத்திலும் இருந்த பல கைத்தொழிற் பேட்டைகள் இன்று இயங்க முடியாமல் இருப்பதைப் பற்றி நீங்கள் சிந்திக்க வேண்டும். அவ்வாறு இருக்கிறபொழுது, எங்களுடைய மக்களின் வாழ்க்கைத் தரத்தை எவ்வாறு உயர்த்த முடியும்? நான் இங்கு முதலில் குறிப்பிட்ட சவளக்கடை அரிசியாலை போன்ற கட்டிடங்களை இந்த நாட்டிலே காணவில்லை. அவ்வாறிருந்த அந்தக் கட்டிடம் இருந்த இடமே இன்று தெரியவில்லை. அதேபோல், அன்று இறக்காமத்தில் ஓட்டுத் தொழிற்சாலையை அவர்கள் இயக்கிக்கொண்டிருந்தார்கள். ஆனால், இன்று அதை இராணுவத்தினர் இயக்குகின்றார்கள். அப்பிரதேச மக்கள் ஓர் ஏக்கர் காணிகூட இல்லாதவர் களாகத்தான் அங்கு இருந்துகொண்டு இருக்கின்றார்கள். அவ்வாறே மண்டூரிலும் கைத்தொழிற்சாலைகள் இயங்கின. இவ்வாறு வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே இயங்கிய கைத்தொழிற் பேட்டைகளை மீளவும் உருவாக்குவதனூடாக எதிர்காலத்தில் அந்த மக்களின் நாளாந்த வருமானத்தை அதிகரிப்பது மாத்திரமல்ல, இந்த நாட்டுக்குப் பொருளாதாரத்தை ஈட்டித் தருபவர்களாக அவர்களை முன்னேற்ற முடியும் என்பதில் எந்தவிதமான சந்தேகமுமில்லை.

இங்கு நான் இன்னுமொரு விடயத்தையும் சொல் லவேண்டும். நாவிதன்வெளிப் பிரதேசத்திலே மணல்மேடு என்று சொல்லப்படுகின்ற 200 ஏக்கருக்கும் மேற்பட்ட காணி

[ගරු තවරාජා කලෛයි අරසන් මහතා]

இருக்கின்றது. 1990ஆம் ஆண்டு இந்த நாட்டில் யுத்தம் நடைபெற்றபோது, அங்கு தொடர்ச்சியாக வேளாண்மை செய்துவந்த விவசாயிகளை இராணுவத்தினர் தடை செய்தார்கள். அவர்கள் வேளாண்மை செய்கின்ற இடத்திற்குச் செல்வதற்குக் கிட்டத்தட்ட 100 மீற்றர் தூரம் ஆற்றைக் கடந்து செல்லவேண்டியதொரு நிலைமை இருக்கின்றது. அவ்வாறு சென்றுதான் மணல்மேட்டில் வேளாண்மை செய்து வந்தார்கள். கிட்டத்தட்ட 13 வருடங்களாக மக்கள் நடமாட்டம் இல்லாத காரணத்தினால் இப்போது அந்த இடம் வனாந்தரமாகக் காட்சியளிக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, அந்த விவசாயிகள் எதிர்காலத்தில் தங்களுடைய நிலங்களுக்குச் சென்று விவசாய நடவடிக்கைகளை மேற்கொள்வதற்கு வசதியாக அந்த 100 மீற்றர் தூரத்துக்குத் தற்காலிக பாதையொன்றையாவது அமைத்துக் கொடுத்தால், அவர்கள் விவசாயத்தை மேற்கொண்டு இந்த நாட்டுக்குப் பொருளாதாரத்தை ஈட்டித் தருவார்கள் என்பதில் எந்தவிதமான சந்தேகமுமில்லை. அம்பாறை மாவட்டத்திலே உள்ள கவுடாதீவு, கல்முனை, கரவாகுவட்டை ஆகிய இடங்கள் மிகவும் செழிப்புமிக்க பிரதேசங்களாகக் காணப்படுகின்றன. நான் குறிப்பிட்ட இந்த இடங்களில் எதிர்காலத்தில் விவசாய அமைச்சினூடாகப் பல திட்டங்களை நடைமுறைப் படுத்துவதற்கும் அந்த மக்களின் விவசாய நடவடிக்கைகளை மேம்படுத்துவதற்கும் நீங்கள் உதவி செய்யவேண்டுமென்று கேட்டுக்கொண்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.01]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය තමයි, අලුතින් මට ලැබුණු අමාත්‍යාංශය. ඒ ගැන කථා කරන්න ඉස්සෙල්ලා මම පොඩි ඌන පූරණයක් කරන්න කැමැතියි. අපි මුලින් සංවාදයක යෙදුණා, පරාටේ බලතල සහ විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට ඇති වී තිබෙන පීඩාව පිළිබඳව. අපි පිළිගන්නවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට සහන දිය යුතු බව. ඒ නිසා තමයි අපි වරින් වර, වරින් වර විවිධාකාර සහන ලබා දෙන්නේ. බැංකුත් ආරක්ෂා වෙන්නත් ඕනෑ, ඔවුනුත් ආරක්ෂා වෙන්නත් ඕනෑ.

ගරු සභාපතිතුමනි, රුපියල් බිලියන 50ක සහනාදායී ණය ක්‍රමයක් සඳහා මේ අය වැය ලේඛනයෙන් රුපියල් බිලියන 20ක මුදලක් වෙන් කර තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුවේ ණයක් හැටියට බිලියන 30ක් වෙන් කරලා තිබෙනවා. කාටද මේ? සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට. අපි බලාපොරොත්තු වෙනවා, ඒ රුපියල් බිලියන 50 චක්‍රීය ආකාරයෙන් ක්‍රියාත්මක වෙන කොට රුපියල් බිලියන 250ක වාගේ පුළුල් පරාසයක් තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට පහසු ක්‍රමයකට මූල්‍ය පහසුකම් සලසන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිතුමා විසින් රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ වගකීම මා වෙත පවරා තිබෙනවා, අංක 2355/9 හා 2023.10.23 දිනැති ගැසට් පත්‍රය මඟින්. මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඒවායේ ඵලදායීතාව සහ ආදායම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමයි. අපේ වගකීම වෙලා තිබෙන්නේ ඒ කාරණාව, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපි වැවිලි කර්මාන්තයේ ඉතිහාසයට ගියොත්, අපේ පැරණිම, විශේෂයෙන් අපනයනය කරන වැවිල්ලක් හැටියට අපට හඳුන්වා දෙන්න පුළුවන්, කුරුඳු වගාව. අපේ රට හොයාගෙන ආපු බොහෝ ආක්‍රමණිකයන් පවා -පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයන් වෙන්න පුළුවන්- සම්පත් කිහිපයක් ගැන කල්පනා කළා. ඒ තමයි, කුරුඳු, ඇත් දළ, මිණිමුතු. අපේ රටේ වැවිලි කර්මාන්තයක් හැටියට ලෝකයට ප්‍රථමයෙන්ම ප්‍රචලිත වුණේ කුරුඳු වගාවයි. ඉන්පසුව ඉංග්‍රීසින්ගේ කාලයෙන් පස්සේ කෝපි වගාව ප්‍රචලිත වුණා. ඉන්පසු කෝපි වගාවට වැලඳුණු විවිධාකාර රෝගාබාධත් සමඟ තේ වගාව වෙත යොමු වුණා.

මීට වසර 155කට පමණ පෙර, එනම් 1867 වර්ෂයේ ජේම්ස් ටේලර් විසින් තමයි මුලින්ම හෙක්ටෙයාර අටක තේ වගාව ලූල්කඳුර වතු යායේ ආරම්භ කළේ. මේ තේ කර්මාන්තය එක්ක ඇති වුණු කම්කරු හිඟය නිසා තමයි ඉන්දියානු දමිළ ප්‍රජාව අපේ රටට පැමිණීම ආරම්භ වුණේ. විශේෂයෙන් 1929 දෙසැම්බර් වන විට පිරිමින් 243,335ක්ද, කාන්තාවන් 234,390ක්ද, ළමයින් 264,575ක්ද වශයෙන් මුළු ගණන 742,335ක් සංක්‍රමණිකයෝ ලෙස ලංකාව තුළ හිටියා. තේ වගාවේ ආරම්භයත් එක්ක තමයි අපේ දමිළ සහෝදරයන්ගේ පැමිණීම ආරම්භ වුණේ. ඉන්පසුව රබර් වගාව අපේ රටට ප්‍රධාන වැවිල්ලක් හැටියට ආවා. 1876දී සර් හෙන්රි වික්හැම් විසින් තමයි රබර් වගාව ලංකාවට හඳුන්වා දුන්නේ. පොල් වගාව අපේ රටේ තිබුණු බොහොම පැරණි වගාවක්. පොල් ගෙඩිය මුහුදෙන් පාවෙලා එන්න ඇති කියන එක තමයි පිළිගැනීම. නමුත් අපේ පොල් වගාව ඉතාම අතීතයේ සිට තිබෙන වගාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙවතු වගාවක් ලෙස තිබුණු පොල් වගාව 1860න් පසුව තමයි වැවිලි වගාවක් බවට පරිවර්තනය වුණේ. අපේ රටේ භූමියත් එක්ක බැලුවාම වැවිලි වගාව ඉතා වැදගත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපේ රටේ භූමි ප්‍රමාණය ගත්තොත්, වර්ග කිලෝමීටර 65,610ක් තිබෙනවා. වර්ග කිලෝමීටර 65,610ක් වන අපේ භූමි ප්‍රමාණය හෙක්ටෙයාරවලට පරිවර්තනනය කළොත් හෙක්ටෙයාර 6,561,000ක්. එයින් වාණිජ වැවිලි වගාවට විශාල භූමි ප්‍රමාණයක් යට වෙලා තිබෙනවා. තේ වගාව සඳහා හෙක්ටෙයාර 267,000ක්, රබර් වගාව සඳහා හෙක්ටෙයාර 139,000ක්, පොල් වගාව සඳහා හෙක්ටෙයාර 505,000ක්, වාණිජ වශයෙන් කරන වී වගාව සඳහා හෙක්ටෙයාර 1,258,000ක්, අනෙකුත් වාණිජ භෝග සඳහා - ගම්මිරිස් වෙන්න පුළුවන්, කොකෝවා වෙන්න පුළුවන්, කරාබුනැටි වෙන්න පුළුවන්- හෙක්ටෙයාර 185,876ක් වශයෙන් වූ භූමි ප්‍රමාණයක් යට වෙලා තිබෙනවා.

ඒ අනුව මුළු වාණිජ වැවිලි වගාවට අපේ රටේ භූමියෙන් වෙන් වෙලා තිබෙනවා, හෙක්ටෙයාර 2,354,876ක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කියන්නේ අපේ රටේ මුළු භූමි ප්‍රමාණය වන හෙක්ටෙයාර 6,561,000න් සියයට 35.8ක් අපි වෙන් කරගෙන තිබෙන්නේ වාණිජමය වැවිලි වගාවලට. එයින් හෙක්ටෙයාර 252,000ක් මගේ අමාත්‍යාංශය වන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතිනවා. ප්‍රාදේශීය වැවිලි සමාගම් 21ක්, රජය සතු වැවිලි සමාගම් 03ක්, ජනවසම හා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් තිබෙනවා.

මම මුලින් කිව්වා වාගේ වාණිජ වැවිලිවලට අපේ මුළු භූමියෙන් සියයට 35.8ක් වෙන් වෙලා තිබෙනවා. එයින් සියයට 10.7ක් රාජ්‍ය ව්‍යවසායන්වලට වෙන් වෙලා පවතිනවා. ඒ අනුව ඉතාම පුළුල් විෂයයක් මේ අමාත්‍යාංශය යටතේ පවතිනවා. මෙය ප්‍රතිව්‍යුහගත කිරීම සහ මේ භූමිය වඩාත් ඵලදායී තත්ත්වයකට ගෙන ඒම අප සතු වගකීමක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මේ වතු සමාගම් ප්‍රථමයෙන්ම රන්පවුම් වතු -ස්ටර්ලින්පවුම් වතු- සහ රුපියල් වතු ලෙස පැවතුණා. 1972 ගෙනා ඉඩම් ප්‍රතිසංස්කරණ පනතත් එක්ක ඒවා රජයට පවරා ගත්තා. ඒ කාලයේ විශේෂයෙන්ම තිබුණේ ස්වෛරීභාවය පිළිබඳ ප්‍රශ්නය. මොකද, අපිට 1948 වසරේ නිදහස ලැබුණත් ඉඩම්වල ප්‍රබල අයිතියක්, ඒ කියන්නේ භූමියෙන් සියයට අටක් ඒ වෙනකොටත් විශේෂයෙන්ම රන්පවුම් වතුවලට අයත් වෙලා තිබුණා. ඒ නිසා ස්වෛරීභාවය පිළිබඳව වූ හැඟීම්, සමාජවාදී අදහස් කියන ඒවා එක්ක මේ ඉඩම් පවරා ගැනීම සිද්ධ වුණා. ඒ අනුව තේ හෙක්ටෙයාර 134,000ක්, රබර් හෙක්ටෙයාර 64,000ක්, පොල් හෙක්ටෙයාර 22,000ක් වශයෙන් වතු 502ක් එකවර පවරා ගැනීම සිද්ධ වුණා, ඒ කියන්නේ භූමියෙන් සියයට අටක්. හැබැයි, එතැනදී ලොකු ප්‍රශ්නයක් ඇති වුණා, ඒ පවරා ගැනීමත් එක්ක. දේශපාලනය එම පරිපාලනයට දැවැන්ත විධියට ඇතුළු වෙලා තිබුණා. ඒ හේතුව නිසා බොහොම හොඳ හැඟීමකින්, ප්‍රගතිශීලී හැඟීමකින් කරපු ඒ පවරා ගැනීම ප්‍රායෝගිකව ගත් කළ ලොකු ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතා වතු සංවර්ධන මණ්ඩලය - JEDB - සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් ඒවායේ පාලනය සිද්ධ වුණේ. නමුත් යම් කිසි කාලයක් යනකොට, ඉතාම අපහසු තත්ත්වයකට, පහළ තත්ත්වයකට මේ පරිපාලනය වැටුණා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා තමයි 1992-1995 කාලයේ ඒවා ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට පවරන්න සිද්ධ වුණේ. JEDB සහ SLSPC යන ආයතන විශාල පාඩුවක් ලබන්න පටන් ගත්තා; ඒ කාලයේ හැටියට මාසයකට මිලියන 400ක පමණ පාඩුවක් ලබා තිබුණා. අද දවසේ ඒ ආකාරයේ පාඩුවක් පැවතුණා නම්, වර්ෂයකට රුපියල් බිලියන 15ක විතර පාඩුවක් අපට දරන්න සිද්ධ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

විශේෂයෙන්ම ඒ කාලයේ සුබසාධනය සහ සංවර්ධනයත් ඉතාම අඩු තැනකට පත් වී තිබුණා. ඒවා පවත්වා ගෙන යන්න බැරි මට්ටමට ආවාට පසුව විශේෂයෙන්ම ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට මේ වතු පැවරීම, අළෙවි කිරීම නැත්නම් කොටස් පැවරීම සිද්ධ වුණා. අතීතයට ගිහින් බැලුවාම එහි යම් යම් ධනාත්මක කරුණු අපට දකින්න පුළුවන්. දේශපාලන බලපෑම් අඩු වුණා, කාර්ය මණ්ඩල වැටුප් ආදිය වැඩි වුණා, තේ නිෂ්පාදනය ඉතාම හොඳ තැනකට ආවා. 2016 වෙනකොට චීනයට පමණයි අපි දෙවැනි වුණේ. 2016 වෙනකොට චීනය ඩොලර් බිලියන 1.5ක තේ නිෂ්පාදනයක් කර තිබුණා. ඒ කියන්නේ ලෝකයේ මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 22.8ක්. ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 1.3ක, ඒ කියන්නේ මුළු නිෂ්පාදනයෙන් සියයට 19.2ක් සිදු කර තිබුණා. ඒක හොඳ තත්ත්වයක්. මේ වැවිලි සමාගම් හරහා තමයි එය සිදු කෙරුණේ. ඒ වාගේම ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කිරීම වාගේ ධනාත්මක ලක්ෂණත් දකින්න තිබුණා. එම සමාගම් මුලින් හොඳ ප්‍රාග්ධනයක් ඒ සඳහා යොදවා තිබුණා.

රජය මේ වතුවල golden shareholder වුණා; මහා භාණ්ඩාගාරය රන් කොටස්කරුවා වුණා. ඒ රන් කොටස්වල අයිතිය පාලනය කරන්න, අපි බලාපොරොත්තු වුණු ආකාරයටම එම කටයුතු කෙරෙනවාද කියලා සොයා බලන්න, මේ වතු අධීක්ෂණය සඳහා තමයි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පත් කරනු ලැබුවේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එතැනදී එක් අධ්‍යක්ෂවරයෙක් යටතේ කුඩා කණ්ඩායමක් පැවතියත් අධීක්ෂණයක් වුණාද කියන ගැටලුව අපට එක පැත්තකින් මතු වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඊට අමතරව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ සෘජුව වතු යම් ප්‍රමාණයක් පාලනය වුණා. ඊට අමතරව රජයේ සමාගම් ලෙස පවතින වයඹ වතු සමාගම, හලාවත වැවිලි සමාගම, ඇල්කඩුව වැවිලි සමාගම සහ විශේෂයෙන්ම තේ කර්මාන්තශාලා මුල් කරගත් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ක්‍රියාත්මක වුණා. අද අපේ අමාත්‍යාංශය යටතේ සෘජුව තිබෙන්නේ මේ ආයතන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සඳහන් කළ ආයතනවලට අදාළව 2021 වර්ෂයේ සංඛ්‍යාලේඛන බැලුවොත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2021 වසරේ අලාභය මිලියන 490ක්. එය විශාල වතු ප්‍රමාණයක් තිබෙන ආයතනයක්. ඒ වාගේම රාජ්‍ය වැවිලි සංස්ථාවේ අලාභය මිලියන 231ක්. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අලාභය මිලියන 14ක්. මම මේ සඳහන් කළේ මෙම ආයතන සම්බන්ධයෙන් 2021 වසරට අදාළව මට ලැබී තිබෙන දත්ත. හලාවත වැවිලි සමාගමේ මිලියන 510ක ලාභයක් තිබෙනවා. කුරුණෑගල වැවිලි සමාගමේ මිලියන 468ක ලාභයක් තිබෙනවා. ඇල්කඩුව වැවිලි සමාගම මිලියන 322ක ලාභයක් ලබා තිබෙනවා. මෙසේ ලාභ ලැබුවත් අපි බලන්න අවශ්‍යයි, ඵලදායීතාව එහෙම නැත්නම් ලෝකයත් එක්ක තරග කරන්න පුළුවන් ලාභදායීත්වයක අපි ඉන්නවාද කියන එක, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපි අවසාන වශයෙන් යම්කිසි විශ්ලේෂණයකට ආවොත්, මේ ප්‍රාදේශීය වැවිලි සමාගම්, ඒ වාගේම රජය සතු වැවිලි සමාගම් වර්තමානයේ වගාවකින්, එහෙම නැත්නම් වාණිජ වැවිලි භෝගයකින් බලාපොරොත්තු වන දේවල් සාර්ථකව ඉෂ්ට වෙලා තිබෙනවාද කියලා අපට ආපස්සට හැරිලා බලන්න සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි ඵලදායීතාව මැන බලන්න ඕනෑ ලෝකයත් සමඟ සසඳමින්. අප සිදු කළ යම් යම් ප්‍රතිසංස්කරණවලින් විශේෂයෙන් අපේ අපනයන භෝගවල ඵලදායීතාව, එහෙම නැත්නම් අපේ අපනයන භෝග ව්‍යාප්තිය මේ සුවිශාල භූමි ප්‍රදේශය තුළ සාර්ථකව කෙරුණා ද කියන එක ගැන අපට සිතා බලන්න වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ඒ වාගේම තමයි එහි ඵලදායීතාව කියන එකත්. අපි කියනවා, ලංකාවේ මේ මේ සමාගම් ලාභ ලබා තිබෙනවා කියලා. හැබැයි, ඒ සමාගම් පොල් ගසකින් වර්ෂයකට ලබන ඵලදාව වාගේ දෙගුණයක් මැලේසියාව, ඉන්දියාව ආදි රටවල් ලබනවා නම් අපි නියම ඵලදායීතාව භුක්ති විඳිනවාද, මේ රටේ ජනතාවට ඒ අයිතිය ලැබෙනවාද කියන කාරණය පිළිබඳව අපට ආපසු හැරී බලන්න සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම රජයට ලැබෙන ප්‍රතිලාභ -බදු වෙන්න පුළුවන්, බිම් කුලිය වෙන්න පුළුවන්- ප්‍රමාණවත්ද? ඒවාට යම්කිසි අගය එකතු කිරීමක් කළ යුතු නැද්ද? අපි හැම දාම පොල් ගෙඩිය හදලා, තේ දල්ල හදලා, ක්‍රේප් රබර් ටික හදලා අපනයනය කළා විතර ද, එහෙම නැත්නම්, ඒවාට යම්කිසි අගය එකතු කිරීමක් කරලා එතැනින් එහාට යන්න ඒ සමාගම්වලට, ඒ ආයතනවලට පුළුවන් වුණා ද කියන එක ගැන අපට සොයා බලන්න සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම තමයි භෝග විවිධාංගීකරණය. ලෝකයට ගැළපෙන විධියට යම් යම් අලුත් දේවල් සොයා ගන්න අප කටයුතු කර තිබෙනවාද කියන එක ගැනත් ආපසු හැරිලා බලන්න අපට සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ වාගේම, නව තාක්ෂණය භාවිතයත් වැදගත්. අපි මේ භෝග වගාවන්ගෙන් කොපමණ ප්‍රමාණයකට නව තාක්ෂණය යොදාගෙන තිබෙනවාද? ඒක ජල බිංදු තාක්ෂණය වෙන්න පුළුවන්, වාරි තාක්ෂණය වෙන්න පුළුවන්, වෙනත් තාක්ෂණ ක්‍රමවේදයක් වෙන්නත් පුළුවන්. අපි දන්නවා, එවැනි තාක්ෂණයක් යොදාගත හැකි වගාවන් වියළි කලාපය තුළ තිබෙන බව. නමුත්, මේ කාල සීමාව තුළ ඒවායෙන් කොපමණ ප්‍රමාණයකට එම තාක්ෂණය යොදාගෙන තිබෙනවාද කියන එක ගැන ආපස්සට හැරිලා බැලුවොත්, අපට සතුටු වෙන්න පුළුවන්ද කියා හිතා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟ විශේෂ කාරණය යටිතල පහසුකම් සංවර්ධනයයි. වැවිලි භෝග වගාවන් හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කොපමණ ප්‍රමාණයකට සිදු වෙලා තිබෙනවාද -පාර හැදිලා තිබෙනවාද, අනෙකුත් පහසුකම් සංවර්ධනය වෙලා තිබෙනවාද- කියා සොයා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම, අප සමඟ ඇති කරගත් ගිවිසුම් අනුව කටයුතු කිරීම පිළිබඳවත්, ඒවා කොතෙක් දුරට අනුගමනය කර තිබෙනවාද කියන එක ගැනත් ආපස්සට හැරිලා බලන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම, සමහර සමාගම්, ද්විතීයික කළමනාකරණ සමාගම් පිහිටුවා ගෙන කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය ඒවාට භාර දීලා ගෙවීම් ද සිදු කරනවා. ඒ තුළ ඇති වන සැබෑ තත්ත්වය, එනම් ලාභදායීත්වය අඩු වීම පිළිබඳව, රජයට ලැබෙන බදු මුදල අඩු වීම පිළිබඳ සැබෑ තත්ත්වය මොකක්ද කියන එක ගැනත් අපට සොයා බලන්න සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මේ හැම දෙයකදීම වැදගත්ම දේ තමයි, සේවක සුබසාධනය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වතුවල -ඒ වතු යායවල- වැඩ කරන සාමාන්‍ය පවුල් 107,784ක් ඉන්නවා. ඒක ඉතා විශාල ප්‍රමාණයක්. ඒ වාගේම වතුවල වැඩ නොකරන, එනම් නගරයේ වැඩට යන, කොළඹ වැඩට එන, garment factoriesවල වැඩට යන, වතුවල පදිංචි වෙලා ඉන්න පවුල් 147,192ක් ඉන්නවා. ඒ වතුවල සමස්ත පදිංචිකරුවන් ඉන්නවා දළ වශයෙන් පවුල් 254,976ක්. ඒවායේ වැඩි ප්‍රමාණයක් ඉන්නේ විශේෂයෙන් දමිළ සහෝදරවරු. ඔවුන්ගේ සුබසාධන කටයුතු මේ කාල සීමාව තුළ සාර්ථකව ඉෂ්ට වුණා ද කියන කාරණය ගැන අපට නැවත සිතා බලන්න සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සුබසාධන කාරණා කිව්වාම ඔවුන්ගේ වැටුප වෙන්න පුළුවන්, නිවාස වෙන්න පුළුවන්, අධ්‍යාපනය වෙන්න පුළුවන්, සෞඛ්‍යය වෙන්න පුළුවන්, වෙනත් අයිතිවාසිකම් වෙන්නත් පුළුවන්. හැබැයි, ඒ සම්බන්ධයෙන් අපට සතුටු වෙන්න පුළුවන්ද? ඒ ජනතාව එක්ක ජීවත් වන ජනතා නියෝජිතයකු හැටියට මම දකිනවා, මේ රටේ අඩුම පහසුකම් භුක්ති විඳින ජනතාව බවට ඒ වතු ප්‍රජාව පත් වෙලා තිබෙන ආකාරය. කනගාටුවෙන් තමයි අපට එය කියන්න වෙන්නේ. ඉතින් මේ කාරණා පිළිබඳව ආපස්සට හැරී බලා අපට තීරණය කරන්න සිදු වෙලා තිබෙනවා, අපි අපේ අරමුණු කරා ගිහින් තිබෙනවාද කියලා. මේ සියල්ලට මැදිහත් වීමට රජයට සිදු වෙලා තිබෙනවා, ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගතකරණ වැඩ පිළිවෙළ තුළ.

ඊයේ දවසේ ගරු ජනාධිපතිතුමා වතු සමාගම් පාලකවරුන් කැඳවා විමසීමක් කළා, වතු සේවකයින් ඉල්ලන දෛනික වැටුප වන රුපියල් 1,700 ගෙවන්න පුළුවන්ද බැරිද කියලා. කම්කරු විෂය භාර ගරු අමාත්‍යතුමාට ඒ සාකච්ඡාව භාර දුන්නා. ඒ රුපියල් 1,700 ගෙවන්න පුළුවන්ද, එහෙම නැත්නම් ඔබතුමන්ලාට ගෙවන්න පුළුවන් ගණන කීයද කියලා, මේ දෙසැම්බර් 31 දිනට පෙර කරුණාකර කියන්න කිව්වා.

ඒ වාගේම, එම ජනතාව වෙනුවෙන් නිවාස වහා සකස් කිරීම පිළිබඳව ඉන්දියාව සමඟත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා භූමිය වෙන් කර ගැනීම පිළිබඳ සාකච්ඡා වාරයක් ආරම්භ කරනවා. ලබන 14වන දා අපි ඒ සාකච්ඡා වාරය ආරම්භ කරනවා. ඒ වාගේම වතුවල ඵලදායිතාව, අපනයන භෝගවල ඵලදායිතාව වර්ධනය කිරීම සම්බන්ධවත් විශේෂ වැඩ පිළිවෙළක් ලබන 14වන දා අපි ආරම්භ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සේවක සහෝදරයන් වැඩි පිරිසකට තැපැල් ලිපිනයක් තිබුණේ නැහැ. ඊට අදාළව නඩු තීන්දුවක් තිබුණා. එක් වත්තක තැපැල් ලිපිනය වහාම ලබා දෙන්න ශ්‍රේෂ්ඨාධිකරණයට එකඟ වෙලා තිබුණා, නීතිපතිවරයා. ඉතින් අපි ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අරගෙන රජය සෘජුව පාලනය කරන හැම වත්තකටම චක්‍රලේඛයක් මඟින් වහා දැනුම් දීමක් කළා, තැපැල් ලිපිනය ඉතා ඉක්මනින් ලබා දෙන්න කියලා. ඒ වාගේම අපි බැලුවා, වතු සමාගම් අධීක්ෂණය ප්‍රමාණවත්ව සිදු වෙලා තිබෙනවාද කියලා. අපි විශ්වාස කරනවා, වඩාත් ශක්තිමත් ස්වාධීන අධීක්ෂණ ආයතනයක් වතු වෙනුවෙන් පත් කරන්න අවශ්‍යයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වතු සමාගම් මුහුණ දෙන ගැටලුත් අපි අවබෝධ කර ගන්න ඕනෑ. පොහොර භාවිතය, කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය ආදිය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම, රබර් වගාවට බලපාන රෝගයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් අපි මැදිහත් වෙනවා, ලබන සතියේ. මේ අනුව අලුත් ප්‍රතිසංස්කරණ යටතේ අපි බලාපොරොත්තු වෙනවා, දැනට රජය පාලනය කරන වතු නව ව්‍යවසායකයන් යටතට අරගෙන ඒවා වඩා විනිවිදභාවයෙන්, සේවක අයිතීන් උපරිම ලෙස සුරකෙන පරිදි, අපනයන භෝගවලට මුල් තැන දීලා, නව තාක්ෂණය යොදාගෙන ලොවට ගැළපෙන විවිධාංගිකරණයකුත් එක්ක ඉදිරියට ගෙන යන්න. ඒක තමයි අපේ බලාපොරොත්තුව. මේ රටෙන් තුනෙන් එකක් වෙච්ච වැවිලි භෝග වගාවන් රටට ඵලදායී, රට ගොඩ ගන්න පුළුවන් ව්‍යාපෘති බවට පත් කිරීමයි අපි බලාපොරොත්තු වන්නේ. බොහොම ස්තුතියි.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, what is the point of Order?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් රාජ්‍ය ඇමතිතුමාගේ ද අවසරය ඇතිව මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, it is not a point of Order.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවසරය ඇතුවයි මම මෙය අහන්නේ. මට ලබා දී තිබෙන වෙලාවෙන් මේ කාලය අඩු කර ගන්න.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඊයේ ප්‍රාදේශීය වැවිලි ආයතන එක්ක පැවැති සාකච්ඡාවේදී ගරු ජනාධිපතිතුමා කියලා තිබෙනවා, නැවත Collective Agreement එකකට යන්න කියලා; ඒ වාගේම රුපියල් 1,700ක දෛනික පඩියක් ලබා දෙන්න කියලා. මේ සභාවේ පසුගිය 7වන දා පැවැති Labour Ministry එකේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී Minister of Labour and Foreign Employment කියා තිබුණා, නැවත පඩිපාලක සභාවට යනවා කියලා. Collective Agreement එක අත්සන් කරන වෘත්තීය සමිති දෙකම රජය එක්ක ඉන්නේ. ඒ වෘත්තීය සමිති දෙකම කියා තිබුණේ Collective Agreement එකකට යන්න ඕනෑ කියලායි. එතකොට අපට සැකයක් තිබෙනවා, මේ කියන රුපියල් 1,700 සම්බන්ධයෙන්. ඒක කම්කරුවන්ගේ ඉල්ලීමක් නොවෙයි. කම්කරුවන් කොතැනකදීවත් එවැනි ඉල්ලීමක් කරලා නැහැ. නමුත්, ජනාධිපතිතුමා කියලා තිබෙනවා, කම්කරුවන්ගේ ඉල්ලීම අනුව දෛනික වැටුප රුපියල් 1,700ක් කරන්න කියන කාරණය සම්බන්ධයෙන් නැවත Collective Agreement එකකට යන්න කියන එක. එහෙම නම්, ඒ ඉල්ලීම් දෙකම ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ, ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ඉල්ලීම අනුව ද, එහෙම නැත්නම් Collective Agreement එකට සහභාගී වන trade unionsවල ඉල්ලීම අනුව ද කියන එක පැහැදිලි කර ගන්න ඕනෑ. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කියා තිබෙනවා, දැනට තිබෙන inflation එක අනුව සාමාන්‍යයෙන් පවුලකට ජීවත් වීමට දවසකට අවම වශයෙන් රුපියල් 3,250ක්වත් අවශ්‍යයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please be brief about your clarification.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ඒ ගැන පැහැදිලි කර දෙන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතා පැහැදිලිව ගරු ජනාධිපතිතුමාට අවශ්‍ය වෙලා තිබෙන්නේ වතු සහෝදරවරුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ඒ අය මේ සමාජයේ දෙවන පෙළ පුරවැසියන් නොවන තැනට ගෙනෙන්නයි. 'நாம் 200' සැමරුම් වැඩසටහනේදී එතුමා ඒ බව කියනවා අපි දැක්කා. අන්න ඒ සඳහා වූ පියවර රාශියක් තමයි අපි මේ ගන්නේ. මේ සාකච්ඡාවලින් පස්සේ ඔබතුමන්ලා එක්ක කථා කරන්න පුළුවන්. මේවා කවුරුවත් එක්ක වෙනම කථා කරපු කාරණා නොවෙයි. මේ රටේ වැවිලි ව්‍යාපාරය පවතින අතරේ වතු කම්කරුවාගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න අවංකව ගත හැකි පියවර හැටියට සලකා තමයි ගරු ජනාධිපතිතුමා ඇතුළු අපි ඒ කාර්යය වෙනුවෙන් මැදිහත් වෙලා ඉන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Leader of the Opposition Sajith Premadasa. You have 18 minutes.

[අ.භා. 12.21]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව ආරම්භයේදීම මම කැමැතියි, බංකොලොත් වෙච්ච මේ රටේ කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙන යන අලුත්ම ක්‍රමවේද සඳහා යෝජනා කිහිපයක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්න. අපි යන්න ඕනෑ, නව නිර්මාණවලට -innovationsවලට- සහ modern agricultureවලට. ඒක, පළමුවැනි කාරණය. මොකද, කෘෂිකර්මය පිළිබඳ නවීන වැඩ පිළිවෙළ තුළින් අපට පුළුවන්, පිරිවැය අඩු කර ගන්න; ශ්‍රම ඌනතාවට විසඳුම් ලබා ගන්න; ඒ වාගේම, පාරිභෝගිකයාගේ වෙනස් වන ඉල්ලුමට සරිලන ආකාරයට කටයුතු කරන්න.

රටක් විධියට ඉදිරියට යන්න නම්, agriculture technology - agtech - පැත්තට අපි යන්නට ඕනෑ. බංකොලොත්භාවයෙන් රට ගොඩ එනකොට, precision agriculture, smart irrigation, biotechnology, automation, indoor vertical farming, livestock technology, modern greenhouse practices, artificial intelligence, blockchain කියන කෘෂි කාර්මික ක්‍රමවේද හරහා නැවුම් ආකාරයට ගොඩ එමින් සාර්ථක ඉලක්ක කරා යන්නට අපට පුළුවන්. මම ඔබතුමාට උදාහරණ දෙකක් දෙන්නම්. විශ්වාස කරන්න, modern greenhouse technology එකේ ලෝකයේ සම්පූර්ණ කෘෂිකර්ම ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 350යි. ඒ, greenhouse agricultureවලින්. අපි රටක් හැටියට greenhouse agriculture ක්ෂේත්‍රයට මුල පුරන්නට ඕනෑ. ඒ වාගේම තවත් අලුත් තාක්ෂණයක් තිබෙනවා, precision agriculture කියලා. එම precision agriculture technology එකේ ලෝකයේ market එක ඇමෙරිකානු ඩොලර් බිලියන 43.4යි. ඇත්ත වශයෙන්ම අපි කෘෂි කර්මාන්තයේ තාක්ෂණික දියුණුවක් ඉතාම ඉක්මනින් ලබාගත යුතුයි කියන එක තරයේ විශ්වාස කරනවා. එපමණක් නොවෙයි. අපි බංකොලොත්භාවයෙන් ගොඩ එන ගමනේ දී ඒ ඉලක්ක කරා යාම ඉතාම වැදගත් කියන කාරණය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමැතියි.

ඊළඟට, මේ කාරණය කෙරෙහිත් ඇමතිවරයාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ඇත්ත වශයෙන්ම පසුගිය කාල සීමාව තුළ ගත් අමනෝඥ තීන්දුවලින් රටත්, ජනතාවත් මුහුණ දුන් ඵල විපාකවලට තිරසර විසඳුම් මේ අය වැය යෝජනාවල නැහැයි කියන එකයි අපේ අදහස. දැන් බලන්න. එක්කෝ නියඟය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නිසා, එහෙම නැත්නම් ගංවතුර නිසා සිදු වන හානිවලට වන්දි ලබා දීම සඳහා ඇත්ත වශයෙන්ම ප්‍රමාණවත් මුදල් වෙන් කිරීමක් සිදු වෙලා නැහැ. වී මිලදී ගැනීමට මුදල් වෙන් වෙලා නැහැ. ඒ සඳහා රුපියලක්, තඹ සතයක් වෙන් වෙලා නැහැ. එතකොට වී ගොවියා නිෂ්පාදනය කරන වී කොහොමද සාධාරණ සහ ස්ථාවර මිලකට අළෙවි කර ගන්නේ කියන කාරණය බරපතළ ප්‍රශ්නයක්. ඒ වාගේම සතා සිවුපාවා සහ ගොවි ජනතාව අතර ඇති වන ඒ සංට්ටනකාරී තත්ත්වයන් තුළින් අස්වැන්නට සිදු වන හානිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට තඹ දොයිතුවක් වෙන් කරලා නැහැ. ආහාර සුරක්ෂිතතාවට 2024 වසර වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 250ක්. බොහෝ විශේෂඥයින් කියනවා, ලබන වසරේ නියඟයක් එන්නට ඉඩ තිබෙනවා කියලා. නියඟයක් එන්නට ඉඩ තිබෙනවාය කියන කාල වකවානුවක් වෙනුවෙන් රුපියල් මිලියන 250ක් වැනි සොච්චමක් වෙන් කිරීම ප්‍රතිඵලදායකද, නැද්ද කියලා සොයා බලන්නට ඕනෑ.

ගරු ඇමතිතුමනි, වාර්ෂිකව අපේ රටට වර්ෂාවෙන් ලැබෙන ජලය 50 billion cubic metres අපි නාස්ති කරනවා. ඇත්ත වශයෙන්ම එපමණ ප්‍රමාණයක් අපතේ යනවා. මොකක්ද ඒකට හේතුව? ඒකට හේතුව, අපේ වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය නොකිරීම. කුඩා පරිමාණයේ වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම අපි අගය කරනවා. හැබැයි, කුඩා පරිමාණයේ වාරි මාර්ග විතරක් නොවෙයි, මධ්‍ය වාරි සහ මහා වාරි අංග සම්පූර්ණව පුනරුත්ථාපනය කිරීමකට - irrigation rehabilitation එකකට - අපි අනිවාර්යයෙන් යා යුතුයි. වාරි කර්මාන්තයේ storage capacity එක වැඩි වනකොට මුහුදට ගලා යන, ඒ අපතේ යන ජලය රඳවාගෙන රටේත්, ජනතාවගේත් ප්‍රයෝජනයට ඒවා උපයෝගී කර ගන්න අපට පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ මම තවත් වැදගත් මාතෘකාවකට ප්‍රවේශ වෙන්න කැමැතියි. මේ සියලු කරුණු-කාරණා, දත්ත මම ඉදිරිපත් කරන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ website එකේ සඳහන් වී තිබෙන දත්ත ලේඛන සහ විගණන වාර්තාවල දත්ත පරිශීලනය කිරීමෙන් පසුවයි. බතලෙගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය අවුරුදු 11ක් කන්න 22ක පරීක්ෂණයක් කරලා තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවාද? ඒ පරීක්ෂණයෙන් හෙළිදරව් වුණු කාරණා මොනවාද? ඒ පරීක්ෂණයෙන් කියනවා, සම්පූර්ණයෙන්ම කාබනික පොහොර යෙදවීම තුළින් අස්වැන්න සියයට 21ත්, 31ත් අතර ප්‍රමාණයක් අනිවාර්යයෙන්ම අඩු වෙනවා කියලා. මේ අද ඊයේ කරපු පර්යේෂණයක් නොවෙයි. අවුරුදු 11ක කන්න 22ක පර්යේෂණයක්. ඒ වාගේම එම වාර්තාවේ කියනවා, වැඩිම අස්වැන්නක් ලබා ගන්න පුළුවන් ක්‍රමවේදය තමයි රසායනික පොහොරයි, කාබනික පොහොරයි දෙකේම මිශ්‍රණයකින් කියලා. රසායනික පොහොර භාවිතය විතරක් නොවෙයි. දැන් මේ දත්ත ඔබතුමන්ලා දැක්කා; ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. නමුත්, මේ දත්ත ඉදිරියේ තිබෙද්දීම ඔබතුමන්ලා එක පාරටම කාබනික පොහොර වගාවට ගියා. කාබනික පොහොර වගා ක්‍රමයට යොමු වුණාම සිදු වුණු හානිය මොකක්ද? වී අස්වැන්න සියයට 53කින් අඩු වුණා. සාමාන්‍යයෙන් ගත්තොත්, අර්තාපල් සහ අනෙකුත් භෝග වර්ගවල අස්වැන්න සියයට 52කින් අඩු වුණා. බඩ ඉරිඟු සියයට 68කින්, ලොකු ලූනු සියයට 53කින්, අර්තාපල් සියයට 52කින්, මිරිස් සියයට 43කින්, වැටකොළු වගාව සියයට 64කින්, තක්කාලි වගාව සියයට 62කින්, ගෝවා වගාව සියයට 61කින්, බෝංචි වගාව සියයට 54කින්, බණ්ඩක්කා වගාව සියයට 49කින්, වම්බටු වගාව සියයට 42කින් අස්වැන්න අඩු වුණා. මේ සියල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයේ දත්ත. මේක තමයි සිදු වුණු හානිය. මේ හානිය තුළ තවත් දෙයක් සිද්ධ වුණා, ගරු අමාත්‍යතුමනි. ඒ තමයි මේ රටට අසූචි පොහොර ගෙන්වීමේ දී සිදු වුණු බරපතළ හොර ගනුදෙනුව තුළින් සිද්ධ වුණු මූල්‍ය පාඩුව.

මම පැහැදිලිව කියන්නට ඕනෑ, විගණකාධිපති මේ වාර්තාව ගැන. විගණකාධිපතිවරයා, ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න. එතුමා 41වෙනි විගණකාධිපතිවරයා. එතුමාට Commerceවලින් Honours Degree එකක් තිබෙනවා, Kelaniya University එකේ. එතුමා, professional accountancy examinations from the Institute of Chartered Accountants of Sri Lanka complete කරලා තිබෙනවා; එතුමා, a Fellow Member of the Institute of Chartered Accountants of Sri Lanka; එතුමා, a qualified Accountant Member of the Chartered Institute of Public Finance and Accountancy of the United Kingdom. එතකොට මෙය qualified විගණකාධිපතිවරයෙක් ලබා දුන් වාර්තාවක්. මේක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෘත්තීය සමිතිය යෝජනා කරලා, එහි බල කිරීමට දේශපාලන පළි ගැනීමක් සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවක් සකස් කරන්නට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වෘත්තීය සමිතියෙන් පත් කරපු, AAT සුදුසුකමවත් නැති **හොර** විගණකයාගේ හොර විගණන වාර්තා වාගේ නොවෙයි. මේක Auditor-Generalගේ වාර්තාව. Auditor-Generalතුමාගේ සුදුසුකම් සඳහන් වන ලේඛනය මේ අවස්ථාවේ දී මම **සභාගත*** කරනවා.

මොකද, Auditor-Generalගේ වාර්තාවෙන් තමයි, මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ. එහෙම නැතිව, පොහොට්ටු වෘත්තීය සමිතිය යෝජනා කර, තාවකාලිකව විගණකාධිපති තනතුරේ වැඩ ආවරණය කළ හොරෙකුගේ වාර්තාවක් නොවෙයි කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, දැන් මම මේ කාරණය අහන්න කැමැතියි. මේ පොහොර ගනුදෙනුව නිසා ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 69ක් - මිලියන 1,382ක් - අපේ රටට අහිමි වෙලා තිබෙනවා. පැහැදිලිවම මේ සඳහා ඔබතුමාගේ ප්‍රතිචාරය මොකක්ද? මම මේ කරුණු කාරණා ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. මේ Special Audit Report එක මගේ කථාව අතරතුර මම සභාගත කරන්නම්.

පොහොර ටික රටට ආවේත් නැහැ. හැබැයි ඒ අසූචි පොහොරවලට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 69ක් -මිලියන 6.9ක්- ගෙවලාත් තිබෙනවා. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 13,827ක් ගෙවලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. Auditor-Generalගේ මේ විශේෂ විගණන වාර්තාවේ ගණනය කරලා නැහැ, මහ කන්නයේදී වගාවට යෙදීම සඳහා සැලසුම් කළ කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000ක් නොයෙදීම නිසා අහිමි වුණු අස්වැන්නේ හානිය. ඒක ගණනය කරලාවත් නැහැ. ඒ විතරක් නොවෙයි, ලංකාවේ ආර්ථික වටිනාකමක් ඇති බෝගවලට මෘදු කුණුවීම නමැති විනාශකාරී රෝගය සහ අංගමාරය වැනි රෝග ඇති කරන අර්විනියා සහ බැසිලස් නමැති විනාශකාරී බැක්ටීරියා සහිත පොහොර තොගයක් රට තුළට ඇතුළු කිරීමට උත්සාහ කිරීම වෙනුවෙන් අපේක්ෂිත වන්දිය ගණනය කරලාත් නැහැ. ඒ විතරක් නොවෙයි, උක්ත කාබනික පොහොර සැපයීම වෙනුවෙන් ඇති කර ගත් ගිවිසුම මත ශ්‍රී ලංකා ජනරජයට අනාගතයේදී යම් වන්දියක්, වියදමක්, ගාස්තුවක් ගෙවීමට සිදු වුවහොත් එම පාඩුව පිළිබඳවත් ගණනය කරලාත් නැහැ. ඒවා නැතුව තමයි පාඩුව විධියට ඩොලර් ලක්ෂ 69ක් - මිලියන 6.9ක්- කියලා සඳහන් වෙන්නේ. එතකොට මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි,

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

Auditor-Generalගේ මේ විශේෂ විගණන වාර්තාවේ,- *[බාධා කිරීමක්]* ඔබතුමාට වෙන් වූ කාලය තුළ ඔබතුමා උත්තර දෙන්න. මේ ටික පොඩ්ඩක් සටහන් කර ගන්නකෝ, ගරු ඇමතිතුමනි. මේ වාර්තාවේ 4වැනි පිටුව, 31වැනි පිටුව, 37වැනි පිටුව, 38වැනි පිටුව, 39වැනි පිටුව සටහන් කරගන්න. මේකේ ඒ ඔක්කෝම කරුණු සඳහන් කරලා තිබෙනවා. ඇයි, මේවාට විරුද්ධව පියවර නොගත්තේ? ඇයි, මේවා හංගත්තේ? මම පිළිගන්නවා, ඔබතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ නොවෙයි මේක වුණේ කියලා. ඒක මම පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා නිර්දෝෂයි. හැබැයි, Auditor-Generalගේ විශේෂ විගණන වාර්තාව පදනම් කරගෙන පියවර නොගැනීම ගැන ඔබතුමා නිර්දෝෂයි කියලා කියන්නට බැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තරහා නැතුව ඔබතුමාගේ කාල වේලාව තුළ උත්තර දෙන්න. මම ඔබතුමාට පෞද්ගලිකව මඩ ගහන කථාවක් කිව්වේ නැහැ නේ. මේවා ඔක්කෝම ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න විගණකාධිපතිතුමා,-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Minister?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම කථා කරලා ඉවර වුණාට පස්සේ නේ දැන් ඔබතුමා කථා කරන්නේ. එතකොට, මට නියමිත කාලය තුළ උත්තර දෙන්න කියන එකේ ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මම ඔබතුමාගේ කාලය ගන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
During the Committee Stage, the Minister can get up and answer any time. But, do not do so during my time.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, නැහැ, ඔබතුමාට වෙන් වූ කාලයෙන් වේලාව ගන්න අවශ්‍ය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The time will be deducted from the Government side.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Please, do not disturb my speech.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමාගේ කාලය අඩු කර ගන්න අවශ්‍ය නැහැ. මේ ගැන ඊයේත් මම කථා කළා. ඔබතුමාම ඊයේ අපට ක්‍රමවේදයක් යෝජනා කළා. මම ඊයේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුන්නා, මේ සම්බන්ධයෙන් වාර්තා කරන්න කියලා. මොකද, මෙතැන කාගේවත් නම් සඳහන් වෙලා නැහැ. යම් සිද්ධියක් ගැන කිව්වාට, අඩු ගණනේ මේකට වග කියන්න ඕනෑ කවුද කියලා අපට නිර්දේශයක් දීලා නැහැ. COPE එකෙන් හෝ මේ කියන විගණකාධිපති වාර්තාවෙන් ඒක තහවුරු කරලා නැහැ. ඒ නිසා තමයි කමිටුවක් පත් කරලා මේ ගැන සොයන්න කටයුතු කරන්නේ. ඔබතුමා කිව්ව ආකාරයටම අපි ඊයේ ඒ කටයුත්ත ආරම්භ කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණාකරලා මගේ කථාවට බාධා කරන්න දෙන්න එපා.

මම දත්ත සහිතවයි මේවා ඉදිරිපත් කරන්නේ. මේක, qualified වික්‍රමරත්න විගණකාධිපතිතුමාගේ වාර්තාව. එහෙම නැතුව පොහොට්ටුව පත් කරපු, අධ්‍යාපන සුදුසුකම් නැති, VRS වැඩසටහන යටතේ retirement එක ගත්තාට පස්සේ ආපහු පත්වීම් දෙකක් ලබා දුන් හොර විගණකාධිපතිවරයෙක් නොවෙයි මෙතුමා, අර ඉංජිනේරු සංස්ථාවේ කෙනා වාගේ. පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මෙම අසූචි පොහොර පිළිබඳ වාර්තාවට. අසූචි පොහොර පිළිබඳ ඒ මහා හොරකමට අදාළ විගණන වාර්තාවේ පිටු අංක 4, 31, 37, 38 සහ 39 කෙරෙහි අවධානය යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, මම නැවත වරක් කියනවා, ඔබතුමාගේ කාලයේ නොවෙයි මේක වුණේ, ඔබතුමා නොවෙයි ඒ Cabinet Paper එක දැම්මේ. හැබැයි, විගණකාධිපතිවරයාගේ වාර්තාව තුළ තිබෙනවා ගතයුතු පියවර මොකක්ද කියලා. මම ඒ ටිකත් කියන්නම්. ඔබතුමා ඒ සඳහා පියවර නොගැනීම ගැන අපි ඇත්ත වශයෙන්ම බරපතළ ලෙස කනගාටු වෙනවා.

දැන් මම කියන්නම්, විගණකාධිපතිවරයා මොනවාද කියන්නේ කියලා. "මේ සිද්ධියට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ආදියෙහි වගකිව යුත්තන් සිය වගකීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය" යනුවෙන් එතුමා මෙම විගණන වාර්තාවේ සඳහන් කර තිබෙනවා. වගකීම - responsibility; වගකීම පැහැර හැරීම - violating responsibility. එය සිදු කර තිබෙන්නේ කවුද? කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය. එතකොට එහි වගකිවයුත්තන් කවුද? සජිත් ප්‍රේමදාසද, සමඟි ජන බලවේගයද? අපිද? අපිද වගකිවයුත්තන්? ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නේ නැද්ද වගකිවයුත්තන් කවුද කියලා? මේක අහගන්න. "අදාළ සුරක්ෂණයන් කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීම හෝ සුරක්ෂණයන්ගේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීම හා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අත්තිකාරම් ගෙවීමේදී කිසිදු සුරක්ෂණයකින් තොරව අරමුදල් නිදහස් කිරීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව මෙම ගනුදෙනුවට සම්බන්ධ වගකිවයුත්තන්ට එරෙහිව නඩු පවරා අය කර ගැනීම..." යනුවෙනුත් මේ Audit Report එකේ සඳහන් වෙනවා. කවුද මෙහෙම කියන්නේ? Qualified විගණකාධිපති, ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මැතිතුමා. එතුමාගේ qualifications පවා මම කිව්වා. තමුන්නාන්සේලා කරන්නේ මොනවාද? හොර පත්වීම් දීලා; විගණකාධිපති නිලධාරින් කියලා හොරට කට්ටිය පත් කරලා අධ්‍යාපන සුදුසුකම් පවා නැතුව, තිබෙන එකම සුදුසුකම වන පොදු පෙරමුණේ වෘත්තීය සමිතියේ ලියුම දාලා මොනවාද කරන්නේ? මටත්, මගේ බිරිඳටත් මඩ ගහන එක නේ කරන්නේ. මොන ලජ්ජා නැති වැඩක්ද? මෙන්න තිබෙනවා, මේ පිළිබඳ විගණකාධිපති වාර්තාව. කරුණාකරලා මේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න. නීති-රීති ප්‍රකාරව හා ගිවිසුම්වලට අනුකූලව ක්‍රියා නොකළ උක්ත සැපයුම්කාර සමාගම ශ්‍රී ලංකාව තුළ අසාදුලේඛනගත කිරීමට කටයුතු කිරීම සහ රුපියල් ලක්ෂ 13,827ක මුදලක් ලබා ගැනීම සඳහා ඒ සැපයුම්කාරයාට එරෙහිව නෛතික කටයුතු කිරීම යනුවෙන් නිර්දේශ දෙකක් තිබෙනවා. මෙන්න තිබෙනවා, ඔක්කෝම නිර්දේශ. මේවා ක්‍රියාත්මක වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, මෙහෙම කිව්වාට අමනාප වෙන්න එපා. ඒක ගැන ඔබතුමාට වග කියන්න සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් මට කියනවා එහෙම කරන්න, මෙහෙම කරන්න කියලා ඊයේ මම කිව්වාය කියලා. දෙයියනේ! කෘෂිකර්ම ඇමතිවරයා ඉන්නේ විපක්ෂ නායකයාගේ උපදෙස් මත Audit Report එකේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Leader of the Opposition, you have one more minute.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I have time, do not worry; මට වෙලාව තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා බයවෙන්න එපා. මම ඒ වෙලාව ගන්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අමාත්‍ය ධුරය නොදරපු කාල වකවානුවේ කරපු හොරකම්වලට මගෙන් උපදෙස් අරගෙන නඩු දාන්නද ඔබතුමා හිතාගෙන ඉන්නේ? මගෙන් උපදෙස් අරගෙන කටයුතු කරන්නද ඔබතුමා හිතාගෙන ඉන්නේ? මොකක්ද මේ විහිළුව? මේ හොරකම් වසර ගණනාවක් පරණයි.

ඒ විතරක් නොවෙයි, තව කාරණා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතකද, ඉන්දියාවේ නැනෝ පොහොර ගනුදෙනුව? මොකක්ද මේ නැනෝ පොහොර ගනුදෙනුව? ඉන්දියාවේ ඩොලර් 3.23කට මිලදී ගන්න පුළුවන් මිලිලීටර් 500ක ප්‍රමාණයේ නැනෝ පොහොර බෝතලයක් අපේ රට ඇමෙරිකානු ඩොලර් 12.45කට අරගෙන තිබෙනවා. මේකෙන් අපේ රටට කරපු පාඩුව රුපියල් ලක්ෂ 78,000යි. ඒ කියන්නේ ඩොලර් 3.23ට ගන්න පුළුවන් මිලිලීටර් 500ක නැනෝ පොහොර ඩොලර් 12.45ට අරගෙන තිබෙනවා. එතකොට මිලිලීටර් 500ක ප්‍රමාණයේ එක නැනෝ පොහොර බෝතලයකට රුපියල් 1,867ක් වැඩිපුර ගෙවලා තිබෙනවා. මේ නිසා රටට වුණු සම්පූර්ණ පාඩුව රුපියල් ලක්ෂ 78,400යි; මිලියන 7,841යි, නැත්නම් බිලියන 7.8යි. කවුද මෙහෙම කියන්නේ? මෙහෙම කියන්නේ මම නොවෙයි, හොරාට පත් කරගත්ත විගණකාධිපතිවරයෙක් නොවෙයි. අපේ රටේ 41වැනි විගණකාධිපති, ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහත්මයා. අපිට මඩ ගහන්න, අපේ චරිත ඝාතනය කරන්න පොහොට්ටුවේ යෝජනා සම්මත කරපු, වෘත්තීය සමිතිය සම්මත කරපු සුදුසුකම් නැති හොර විගණකාධිතිවරයෙක් නොවෙයි මේක කියන්නේ.

මොකක්ද, ඔබතුමා මේවාට ගන්න පියවර? කරුණාකරලා අපට කියන්න. ඒ විතරක් නොවෙයි, ඔබතුමා දන්නවාද තවත් විහිළු සහගත දෙයක් වෙලා තිබෙනවා කියලා? ඇත්ත වශයෙන්ම ඒක විහිළුවක් නොවෙයි, රටේ ජනතාව නොමග යැවීමක්. මොකක්ද වෙලා තිබෙන්නේ? ඔබතුමා දන්නවාද, පොටෑසියම් ක්ලෝරයිඩ් කාබනික පොහොර වශයෙන් රටේ බෙදා හරිනවා කියලා. පොටෑසියම් ක්ලෝරයිඩ් කාබනික පොහොරක් නොවෙයි. කෘෂිකර්ම ඇමතිවරයා ප්‍රසිද්ධියේ රටම අන්දවන්න, ගොවි ජනතාව අන්දවන්න කටයුතු කරලා තිබෙනවා. මොකක්ද ඔබතුමා ඒකට ගන්න පියවර? පොටෑසියම් ක්ලෝරයිඩ් කියන්නේ කාබනික පොහොරක්ද? මම ඒ ඔක්කෝම දේවල්, ඒ කරපු බොරුව, ඒ කරපු හොරකම, කරපු වංචා ගැන සියලු ලේඛන සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

නැනෝ පොහොර වංචාව ගැන audit report එකක් තිබෙනවාද, audit report එක හදලාද, audit report එක අතුරුදහන් වෙලාද කියලා මම දන්නේ නැහැ. දැන් ඔය reportsවලට මොනවාද වෙන්නේ පාර්ලිමේන්තුව වාරාවසාන - prorogue - කරනවා කියන තත්ත්වය තුළ? මොනවාද ඒවාට වෙන්නේ? මේ ඔක්කෝම රට, ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම අන්දවන්න කරන මහා මිථ්‍යා ක්‍රියා. ඒ නිසා මම ඒ සියලු කරුණු කාරණාවලට අදාළ ලේඛන සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට එක කාරණයක් කියන්නට ඕනෑ. මන්ත්‍රීවරු සභාවට ඇවිල්ලා, එක එක චෝදනා කරලා ලේඛන හැන්සාඩගත කරනවා කියනවා, සභාගත කරනවා කියනවා. හැබැයි, අපි හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් ඇහුවාම එහෙම මොනවත් හැන්සාඩගත කරලාත් නැහැ, සභාගත කරලාත් නැහැ. ඒවාට මහ ලේකම් කාර්යාලය ගන්නා පියවර මොනවාද? හැන්සාඩගත කරනවා කියලා කියනවා. හැබැයි, හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් ඇහුවාම ඒ මොනවත් නැහැ.

ඇත්ත වශයෙන්ම මම ඔබතුමාට එක කාරණයක් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මම මෙහෙම කිව්වාට ඔබතුමා අමනාප වෙන්න එපා. යාළු මිත්‍රකම් පැත්තකට දාන්න, හිතවත්කම් පැත්තකට දාන්න. කරුණාකරලා audit report එකේ තිබෙන නිර්දේශ ටික ක්‍රියාත්මක කරන්න. විපක්ෂ නායකගේ නිර්දේශ ඕනෑ නැහැ නේ, නිර්දේශ දෙන්න විපක්ෂ නායකයාට අයිතියකුත් නැහැ. මම ඒ විගණන වාර්තාවල නිර්දේශ සභාගත කරන්නම්. ඔබතුමා දැනගෙන හිටියේ නැත්නම්, ඒ නිර්දේශ ටික දැන්වත් ක්‍රියාත්මක කරන්න.

ඇත්ත වශයෙන්ම මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, පොටෑසියම් ක්ලෝරයිඩ් කියලා කාබනික පොහොරක් තිබෙනවාද කියලා. පොටෑසියම් ක්ලෝරයිඩ් කියලා කාබනික පොහොරක් ගෙනැල්ලා අපේ රටේ ජනතාවට බෙදුවා කියලා කවුද රට ඇන්දුවේ? උත්තර දෙන්න. මම දන්නවා ඔබතුමා නොවෙයි කියලා. කවුද ඒක කළේ? ඒවාට උත්තර දෙන්න.

මහින්ද අමරවීර ඇමතිතුමනි, මම දැක්කා ඔබතුමා පශු සම්පත් ක්ෂේත්‍රය ගැන කථා කරනවා. ඔබතුමන්ලා මේ රටේ වටිනාම පශු සම්පත් දේපොළවලට මොකක්ද කර තිබෙන්නේ? ගොවිපොළ 31ක් තිබෙනවා, මේ රටේ. ඔබතුමන්ලා ඒ ගොවිපොළ 31ම වෙන්දේසියට දාලා තිබෙන්නේ. මිල්කෝ එක වෙන්දේසියට

දාලා තිබෙන්නේ. මිල්කෝ එකට දැන් කියනවා, මිල්කෝ එකේ භූමිය ඔබට අයිති නැහැ. ඒක UDA එකට අයිතියි කියලා. ඒක හරිද? ගරු ඇමතිතුමනි, ඒ ගොවිපොළ වෙන්දේසි කරලා මේ රටේ කිරි නිෂ්පාදනය ඉහළ නංවන්න පුළුවන්ද? දැන් ඔබතුමා කච්චිගල්ආරේ කරන ව්‍යාපෘතියක් ගැන කිව්වා. ඒක හොඳයි. හැබැයි, රිදියගම farm එක ඔබතුමා විකුණන්න යනවා, වීරවිල farm එක විකුණන්න යනවා. තවත් පශු සම්පත් ගොවිපොළ 31ක් විකුණන්න යනවා. ඉතින් කොහොමද රට ගොඩ නඟන්නේ?

මම තව වැඩි වේලාවක් ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ රටේ උඩ රට ප්‍රජාව ගැන. අපි "වතු කම්කරු" කියන වචන පාවිච්චි කරන්නේ නැහැ. මේ රටට විදේශ විනිමය උපයන උඩ රට ඒ ජන ප්‍රජාව අපි රැක ගන්න ඕනෑ. තවදුරටත් ඒ අයව කම්කරු තැනේ තියන්නට එපා. මේ රටේ තේ නිෂ්පාදනයෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක් ලබා දෙන්නේ කුඩා තේ වතු හිමියන්. හැබැයි, කුඩා තේ වතුවලට අයිති භූමිභාගය ඉතාම සුළු ප්‍රමාණයක්; සියයට 30ක්, 40ක් වාගේ ප්‍රමාණයක්. ඉතිරි ටික ඔක්කෝම අයිති ලොකු කොම්පැනිවලට, රාජ්‍ය වතු ක්ෂේත්‍රයට. එතකොට වැඩිම ඉඩම් ප්‍රමාණයක් තිබෙන අය තේ නිෂ්පාදනයට අඩුවෙන්ම දායකත්වය දෙනවා. අඩු ඉඩම් අයිතියක් තිබෙන කුඩා තේ වතු හිමියන් සියයට 60කට, 70කට ආසන්න ප්‍රමාණයක වැඩි නිෂ්පාදන දායකත්වයක් ලබා දෙනවා.

එතකොට අපි මොකක්ද කරන්න ඕනෑ? රුපියල් 1,000ක් දෙන්නම්, 1,500ක් දෙන්නම්, 2,000ක් දෙන්නම්, 2,500ක් දෙන්නම්, 3,000ක් දෙන්නම් කිය කියා වතු ප්‍රජාව හැමදාම ඒ කම්කරු තනතුරේ තියා නොගෙන, විවිධ රජයන්වල විවිධ ඇමතිවරුන්ගේ ස්ථිර වහලුන් බවට පත් නොකර ඔවුන් සවිබලගැන්විය යුතුයි; without enslaving them, empower them. මේ රටේ විරැකියාවෙන් පෙළෙන, ජාති භේදයෙන් තොරව කටයුතු කරන තරුණ ප්‍රජාවට, වතු ප්‍රජාවට වගා නොකරන මුඩු ඉඩම් ටික ලබා දීලා ස්ව ශක්තියෙන්, ස්වෝත්සාහයෙන් ඒ කුඩා තේ වතුවල නිෂ්පාදනය වැඩි කරලා, ඒ භූමිය තුළ තමන්ගේම නිවසක් ඉදි කරගෙන කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න. ඒ, ලයින් කාමරය තමන්ගේ සදාකාලික නිවස බවට පත් කර ගන්නේ නැතුව කටයුතු කිරීම සඳහායි. වතු ප්‍රජාව, කම්කරු ප්‍රජාව යැයි කියන ඒ කොටසට අපි ඒ වචන පාවිච්චි කරන්නෙත් නැහැ. උඩරට ඒ ශ්‍රමික ප්‍රජාව කුඩා තේ වතු හිමියන් බවට පත් කරන්න ඔබතුමන්ලාට බැරි නම්, අපි ඒ දේ කරනවා කියන එක මම මේ අවස්ථාවේ නොබියව ප්‍රකාශ කරනවා. මම මේක ජනාධිපතිවරණයේදී කිව්වාම ජාතිවාදය, ආගම්වාදය මුල් කරගෙන ගහපු පහර ගැහිල්ල මට මතකයි. මම කිව්වේ, මේ රටේ විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාවට, වතු ප්‍රජාවට ජාති, ආගම්, කුල මල, පන්ති, පක්ෂ භේදයෙන් තොරව මුඩු ඉඩම් ලබා දීලා කුඩා තේ වතු හිමියන් බවට පත් කිරීමේ අයිතිය ලබා දෙන්න කියලා. හැබැයි, ඒක හේතු කරගෙන මට පහර ගැහුවා. ඒකේ ඵල විපාකය අද පේන්න තිබෙනවා. අද රටම නන්නත්තාර වෙලා; බංකොලොත් වෙලා; ලක්ෂ 220ම අනාථ වෙලා. මම මීට වඩා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මම වගකීමෙන් යුක්තව කටයුතු කරන පුද්ගලයෙක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

එතුමාට Kelaniya University එකේ Commerce Degree එකක් තිබෙනවා. Institute of Chartered Accountantsහි සේවය කර තිබෙනවා. එතුමා, Fellow Member of CIPFA, ACMA, FFA, FCA. ඒ විගණකාධිපතිතුමා තමයි මේ වාර්තාව ලබා දුන්නේ. එහෙම නැතිව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යෝජනා කරලා, ඉල්ලීම් ලිපි ලබා දීලා පත් කරගත් පුද්ගලයෙක් නොවෙයි, මේ වාර්තාව ලබා දුන්නේ. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සුදුසුකම් නැති පුද්ගලයෙක් තියාගෙන ඉන්නවා. එතුමාට AATවත් නැහැ. VRS එකෙන් පස්සේ, රටේ නීතියට විරුද්ධව, මුදල් අමාත්‍යාංශයේ නීතියට විරුද්ධව, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපතිගේ නිර්දේශවලට විරුද්ධව දෙවතාවක් පත්වීම් දීලා එතුමා අදටත් තියාගෙන ඉන්නවා. දෙසැම්බර් 31 වැනිදා වෙනකල් ඔහුගේ කොන්ත්‍රාත් කාලය තිබෙනවා. ඒ මොකද? ඔක්කොම promotions. එතුමාගේ support එක ලැබුණේ, සජිත් ප්‍රේමදාසටයි, පවුලේ සාමාජිකයන්ටයි බොරු කියලා මඩ ගස්සවන්න. හැබැයි, මේක මඩ ගහන වාර්තාවක් නොවෙයි. මේක, හොර අසූචි පොහොර පිළිබඳ විගණන වාර්තාව. ගරු ඇමතිතුමනි, සියලුදෙනාම දන්නවා ඔබ නොවෙයි මේ හොරකම කළේ කියලා. නමුත්, හොරකම් කරපු අයට විරුද්ධව විගණකාධිපතිවරයා ලබා දී තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියා ඔබතුමාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Yes, Hon. Lakshman Kiriella?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අසූචි පොහොර වංචාවට සම්බන්ධ අය අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ ඒවාට උත්තර දෙන්න ඒ අය පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Hon. Member, that is not a point of Order.

The next speaker is the Hon. M. Rameshwaran. You have five minutes.

[பி.ப. 12.50]

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**
(மாண்புமிகு எம். ராமேஷ்வரன்)
(The Hon. M. Rameshwaran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கமத்தொழில் அமைச்சு மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு பற்றிய குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி. இந்த நாடானது ஒரு விவசாய நாடு. அதிலும் பெருந்தோட்ட மக்கள் இந்த நாட்டுக்குப் பெருவாரியான வருமானத்தை ஈட்டிக்கொடுப்பவர்கள். கௌரவ அமைச்சர் அவர்களே, பெருந்தோட்டங்களைக் கம்பனிகளுக்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්. රාමේෂ්වරන් මහතා]

குக் குத்தகைக்குக் கொடுத்தபோது, சகல வளங்களும் கொண்டதாகவே அவை காணப்பட்டன. ஆனால், இன்று அதில் பல தோட்டங்கள் மூடப்பட்டிருக்கின்றன. 'மக்கள் வேலைக்கு வருவது குறைவு' என்று பெருந்தோட்டக் கம்பனிகள் அதற்குக் காரணம் சொல்கின்றன. இன்று பெருந்தோட்ட மக்களுக்கு வெறும் 1,000 ரூபாய் நாட் சம்பளமே வழங்கப்படுகின்றது. இந்தப் பணத்தைக்கொண்டு அவர்கள் எவ்வாறு வாழ்க்கையை நடத்துவார்கள்? அதேவேளை, சிறு தோட்டங்களிலிருந்து வாங்குகின்ற ஒரு கிலோ கிராம் தேயிலைக் கொழுந்துக்கு 150 - 200 ரூபாய் கொடுக்கிறார்கள். ஆனால், பெருந்தோட்டங்களில் மேலதிக மாகப் பறிக்கப்படுகின்ற ஒரு கிலோ கிராம் தேயிலைக் கொழுந்துக்கு 50 ரூபாய் வழங்கப்படுகின்றது. இந்த நிலைமைகளை நாங்கள் மாற்றியமைக்க வேண்டும்.

அண்மையில் கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்களும் கௌரவ தொழில் அமைச்சர் மனுஷ நாணாயக்கார அவர்களும் சேர்ந்து பெருந்தோட்டக் கம்பனிகளை அழைத்துச் சம்பளப் பேச்சுவார்த்தைகளை நடாத்தினார்கள். கூட்டு ஒப்பந்தத்திற்கூடாக அவர்களுடைய சம்பளத்தைக் கூட்ட வேண்டும் அல்லது சம்பள நிர்ணய சபையினூடாக அவர் களுடைய சம்பளத்தைக் கூட்ட வேண்டும் என்ற கோரிக் கையை அப்போது நாங்கள் அவர்களிடம் முன்வைத்தோம். அதற்குப் பதிலளிக்க அவர்கள் இரண்டு வார கால அவகாசம் கேட்டிருந்தார்கள்.

நேற்றைய தினம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டக் கம்பனிகளை அழைத்து பெருந்தோட்ட மக்களுக்கு 1,700 ரூபாய் சம்பளம் கொடுக்கவேண்டுமென்றும் ஏதாவது மாற்றுக் கருத்துக்கள் இருக்குமாயின் டிசம்பர் 31ஆம் திகதிக்கு முன்னர் அது தொடர்பில் அறிவிக்க வேண்டு மென்றும் கூறியிருக்கின்றார். அதற்காக நாங்கள் மலையக மக்கள் சார்பாகவும் இலங்கை தொழிலாளர் காங்கிரஸ் சார்பாகவும் அவருக்கு நன்றி கூறுகின்றோம். இந்த நாட்டில் பல ஜனாதிபதிகள் பதவிக்கு வந்திருக்கிறார்கள். ஆனால், தற்போதைய ஜனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் பெருந்தோட்ட மக்களுடைய எதிர்காலத் திட்டங்கள் தொடர்பில் மிகவும் கரிசனையோடு செயற்படுகின்றார். அவர்களுக்குக் காணி உறுதிப்பத்திரத்துடன் 10 பேர்ச்சஸ் காணி வழங்க வேண்டும், அவர்கள் கல்வியில் வளர்ச்சியடைய வேண்டும், அவர்களுக்கு ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட வேண்டும் என்பதற்காகச் செயற்படுவது மட்டுமல்ல, பெருந் தோட்டப் பகுதிகளில் உட்கட்டமைப்பு வசதிகளை வழங்குவ தற்குத் தேவையான நிதிகளையும் அவர் ஒதுக்கியிருக்கின்றார்.

இன்று பெருந்தோட்டக் கம்பனிகள் outgrower systemஇல் போவதற்கே முயற்சி செய்கின்றன. Outgrower system என்பது, 1,000 தேயிலைக் கன்றுகளைக் கொடுத்து விட்டு, அவர்களிடமிருந்து 50 ரூபாய்க்குத் தேயிலைக் கொழுந்துகளைப் பெறுவதல்ல. அங்கிருக்கின்ற காணிகளில் பெருந்தோட்ட மக்கள் காலங்காலமாக வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அவர்களுக்கு முழுமையாகக் காணியைக் குத்தகை அடிப்படையில் வழங்கி, அவர்களை 10 நாட்கள் தோட்டத்தில் வேலை செய்ய அனுமதிக்க வேண்டும்; அவர்களுக்குரிய EPF, ETFஇனை வழங்க வேண்டும். மிகுதியாக இருப்பதை outgrower systemஇல் கொடுத்து, சிறுதோட்டங்களிலிருந்தும் கொழுந்துகளைப் பெற்றுக்கொள்ள வேண்டும். அப்போதுதான் இந்த நிலைமைகள் மாறும். அப்படியில்லாமல், முழுமையாக outgrower systemஇல் போகின்றபோது, பெருந்தோட்ட மக்களுக்கு EPF, ETF கிடைக்காது. அதனால், அன்றிலிருந்து நாங்கள் பெருந் தோட்டக் கம்பனிகளிடமும் சம்பந்தப்பட்ட அமைச்சர்களிடமும் இந்த நிலைமைகளை மாற்றியமைக்க வேண்டும் என்று கூறிவருகின்றோம்.

கூட்டு ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற இரண்டு தொழிற் சங்கங்கள் இருக்கின்றன. சம்பளப் பேச்சுவார்த்தையின்போது நாங்களே ஒரு முடிவெடுத்து கம்பனிகளுடன் பேச்சுவார்த்தை நடாத்துவது முறையல்ல. பெருந்தோட்ட மக்களின் கருத்து களையும் கேட்டு, வாழ்க்கைச் செலவுக்கேற்ற வகையில் எவ்வளவு தேவைப்படும் என்பதையும் கருத்திற்கொண்டுதான் அந்தப் பேச்சுவார்த்தைகளை நடத்தி வந்திருக்கிறோம். அந்த வகையில்தான் இந்த முறையும் நாங்கள் மக்களிடம் கருத்துகளைக் கேட்டிருக்கிறோம்; அவர்கள் சொல்லியிருக் கிறார்கள். அதை நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கும் சொல்லியிருக்கிறோம். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டக் கம்பனிகளுடன் பேச்சுவார்த்தை நடத்துகின்றார்.

பெருந்தோட்ட மக்களைப் பொறுத்தளவில், அவர்கள் பச்சைக் கொழுந்து பறிப்பதில் மட்டும்தான் இன்று முன்னுதாரணமாக இருக்கிறார்கள். அங்கே தேவையாகவுள்ள ஏனைய எல்லா வசதிகளையும் - அது வீடமைப்பாக இருந்தாலும்சரி, போக்குவரத்தாக இருந்தாலும்சரி, சுகாதார வசதிகள் என்றாலும்சரி, சிறுவர் பராமரிப்பு என்றாலும் சரி - அரசாங்கம்தான் செய்து கொடுக்க வேண்டும். ஆனால், பெருந்தோட்டக் கம்பனிகள் அவர்களுக்கு ஆதாயம் இருந்தால் மட்டும் எதை வேண்டுமென்றாலும் செய்கிறார்கள். இந்த நிலைமையை மாற்றியமைக்க வேண்டும் என்றுதான் மாண்புமிகு அமைச்சருடனும் மாண்புமிகு ஜனாதிபதியுடனும் பேசுகின்றபோது சொல்லியிருக்கின்றோம். ஜனாதிபதி அவர்கள் நல்ல தீர்மானங்களைக் கொண்டுவந்திருக்கிறார். பெருந்தோட்ட மக்களுக்கு அவர்மீது நம்பிக்கை இருக்கின்றது. அவர் பல திட்டங்களை உருவாக்கியிருக்கின்றார். எதிர்காலத் தில் அவர் இதற்கான திட்டங்களையும் உருவாக்குவார் என்று நான் நினைக்கிறேன்.

விவசாயத் துறையைப் பொறுத்தளவில் நுவரெலியா மாவட்டத்தில்தான் கூடுதலான மரக்கறி வகைகளைச் செய்கைபண்ணும் விவசாயிகள் இருக்கிறார்கள். ஆனால், வெள்ளம் போன்ற அழிவுகளின்போது ஏனைய பகுதிகளுக்கு வழங்கப்படுகின்ற சலுகைகள் நுவரெலியா மாவட்டத்திற்குக் கிடைப்பதில்லை. கௌரவ அமைச்சர் அவர்களே, கூடுதலான மரக்கறி அங்கே பயிரிடப்படுவதனால் அவர்களையும் நீங்கள் கருத்திற்கொள்ள வேண்டும். மானிய விலையில் உரங்கள் கொடுக்கின்றபொழுது அந்த மக்களைப் பற்றியும் சிந்தித்துப் பார்க்க வேண்டும்.

அதேபோல், நுவரெலியா மாவட்டத்தில்தான் கூடுதலான பால் உற்பத்தி மேற்கொள்ளப்படுகின்றது. ஆனால், அங்கு கால்நடை வைத்தியர் பற்றாக்குறை இருக்கின்றது. குறிப்பாக மஸ்கெலியா, பொகவந்தலாவை பகுதிகளில் கால்நடை வைத்தியர் பற்றாக்குறை கூடுதலாக இருக்கின்றது. இந்த நிலைமையை நிவர்த்திசெய்ய வேண்டும். இது ஒரு விவசாய நாடு. எனவே, எல்லா மக்களுக்கும் விவசாயம் செய்வதற்குத் தேவையான சகல வசதிகளையும் செய்து கொடுக்க வேண்டும். கௌரவ மஹிந்த அமரவீர அவர்கள் சிறந்த முறையில் சேவையாற்றக்கூடிய ஓர் அமைச்சர். அவர் எதிர்காலத்திலே இந்தத் திட்டங்களுக்கு முக்கியத்துவம் கொடுப்பார் என்று நம்பிக்கை தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Vijitha Herath. You have 10 minutes.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
No, Sir, I have 15 minutes.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
I am sorry, your time has been reduced because of the earlier delays. The time alloted to you was12 minutes, but it has been reduced to 10 minutes now.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා තමන්ට කාලය තිබෙනවා කියලා ගත්තාට, ඒ කාලය අපෙන් අඩු කරන්න එපා. ඒක එතුමන්ලාගේ පක්ෂයෙන් අඩු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, that is how it has been done.

[අ.භා. 12.56]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කාලය තිබෙනවා කියලා එතුමා සීමාව ඉක්මවා කථා කළාට ඒ කාලය අපෙන් අඩු කරන්න එපා. අපට නියමිත කාලය දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්මය සහ වැවිලි කර්මාන්තය කියන්නේ ඉතා පළල් විෂයයක්. ඒ සම්බන්ධයෙන් කථා කරන්න කරුණු විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් මම කැමැතියි, කරුණු කිහිපයක් විතරක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න.

විශේෂයෙන්ම මෑත භාගය වන විට අපේ රටේ තේ කර්මාන්තය විශාල කඩා වැටීමකට ලක්වෙලා තිබෙනවා. ඔබතුමාත් ඒක පිළිගනීවි. යම් යම් පුරෝකථන කොච්චර දුන්නත් පසුගිය කාලය තුළ විශේෂයෙන්ම පොහොර සහනාධාරය කප්පාදු කිරීමත්, අවසාන වශයෙන් රසායනික පොහොර සම්පූර්ණයෙන්ම නතර කිරීමත් එක්ක අපේ රටේ තේ දලුවල ධාරිතාව අඩු වුණා. ඒ වාගේම, තේවල ගුණාත්මකභාවයත් අඩු වුණා. මොකද, පොහොර නැති වුණාම ඒ දල්ලේ තිබෙන ගුණාත්මකභාවයත් අඩු වෙනවා. ඒ විතරක් නොවෙයි, අද විදුලි බිල වැඩිවීමත්, අනෙකුත් වියදම් වැඩිවීමත් එක්ක මේ වෙනකොට පිරිවැය සියයට 200ක්, 300ක් වැඩිවෙලා තිබෙන්නේ. ඒ නිසා තේ නිෂ්පාදන ආයතන, විශේෂයෙන්ම කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් පසුගිය කාලයේ වැහුණා. අද වන විට තවත් වේගයෙන් වැහෙමින් යනවා. මොකද, ඒ අයට මේ කර්මාන්තය පවත්වාගෙන යන්න බැහැ. ඒ අයට තමන් ගත්ත ණය ටික ගෙවා ගන්න බැහැ. බැංකු ණය ගෙවා ගන්න බැරිව ගොඩක් කර්මාන්තශාලා බැංකු සන්තක වෙනවා. ඒ වාගේම, බ්‍රෝකර් සමාගම්වලින් ගත්ත ණය ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. අද වන විට අපේ රටේ තේ කර්මාන්තශාලා වැහෙන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ තේ, -"Ceylon Tea"- ලෝකය පුරා ප්‍රසිද්ධයි කියලා අපි කොච්චර කථා කළත්, මෑතකදී තේ කර්මාන්තය පටන් ගත්ත චීනය, වියට්නාමය වැනි රටවල් දැන් අපිව අබිබවා; අපිව පසු කරගෙන ඉස්සරහට යනවා. අද වන විට ලෝක වෙළෙඳ පොළට වැඩිම තේ පංගුව එවන්නේ චීනයෙන්. ඒ වාගේම, කෙන්යාව, ඉන්දියාව, වියට්නාමය වැනි රටවල් අපිව පසු කරගෙන ගිහිල්ලා තිබෙනවා. අපි ඉතිහාසයේ තේවලින් විශාල ආදායමක් ලැබුවත්, අද අපේ තේවල ගුණාත්මකභාවයත් බැහැලා, තේ කර්මාන්තයම කඩාගෙන වැටෙන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම ආදායම් ලැබෙන්නේ නැති වුණාම විවිධ රසායනික ද්‍රව්‍ය තේවලට එකතු කරන්න පටන් අරගෙන තිබෙනවා. තේවලට පැණි දානවා, කෝස්ටික් සෝඩා දානවා, ආප්ප සෝඩා දානවා. ඒවා දාලා තේවල සංයුතිය වෙනස් කරනවා. එවැනි දේවල් නිසා ලෝක වෙළෙඳ පොළ තුළ අපේ තේවල quality එක තවත් අඩු වෙනවා. ඒ නිසා අපට තිබෙන ඉල්ලුම තවත් අඩුවෙලා යනවා. ඒ අයට කරන්න දේකුත් නැහැ. මොකද, ඒ අයත් කර්මාන්තය පවත්වාගෙන යන්න ඕනෑ; බැංකු ණයත් ගෙවන්න ඕනෑ. එහෙම නැත්නම් තමන්ගේ ෆැක්ට්‍රි එක බැංකුව සතු වෙනවා. ඒක නිසා විවිධ ආකාරයේ වැරදි ක්‍රමවලින් හරි ලාභය පවත්වාගෙන යන්න ඒ අය උත්සාහ කරනවා. ඒකෙන් අපේ තේ කර්මාන්තය තවත් අනතුරට ලක් වෙනවා.

ඇත්තටම රජය සතුව තිබ්බ අපේ තේ ඉඩම් විශාල ප්‍රමාණයක් පෞද්ගලික සමාගම්වලට දුන්නා; ගිවිසුම් අත්සන් කළා. 2047 අවුරුද්ද වෙනකම් ඒ ගිවිසුම් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ වතු සමාගම්වලට අයිති ඉඩම්වල තේ නිෂ්පාදනය වර්ධනය සඳහා ක්‍රියා මාර්ග ගන්නේ නැහැ. ඒ වතුවල සියයට 25ක වාගේ ඵලදායීතාවක් තමයි දැන් තිබෙන්නේ. ඒවා දැන් මුඩු බිම් බවට පත් වෙලා තිබෙනවා. අලුතින් තේ පැළ සිටුවන්නෙත් නැහැ. තේ වගාවේ වර්ධනය සඳහා ක්‍රියා මාර්ග ගන්නේත් නැහැ. ලාභ ලැබීම විතරක් පදනම් කරගෙන කටයුතු කරනවා. ඒකෙන් අපට විශාල පාඩුවක් සිද්ධ වෙනවා. ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වැනි ආයතන 4ක් යටතේ තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ. නමුත් මම හිතනවා, මේ ආයතන හතර ඒකාබද්ධ කරලා එක තැනකින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා නම් තමයි මේ කටයුතු වඩාත් ඵලදායී වෙන්නේ කියලා.

මොකද, ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිකමත් අද ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මා ඒ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒවා අපේ රටට විශාල විදේශ විනිමයක් සොයා දෙන ආයතනයි. හරියට ගත්තොත්, පසුගිය අවුරුදු දෙකතුනේ තේවලින් උපයාගන්න තිබුණු ආදායමෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන තුන්සිය ගණනක් අපට අහිමි වුණා. IMF එකෙන් ගත්තු ණය වාරිකය ඇමෙරිකානු ඩොලර් මිලියන 330යි. ඒ හා සමාන මුදලක් 2021, 2022 කාලයේ හා මේ අවුරුද්දේ මුල් කාර්තුව ඇතුළත අපට අහිමි වෙලා තිබෙනවා.

තේ කර්මාන්තය අනාගතයේ නඟාසිටුවන්න නම්, අලුත් නිෂ්පාදන එක්ක අපි ඉදිරියට යන්න ඕනෑ. කෙන්යාව ආදි රටවල් දැන් orthodox තේ නිෂ්පාදනය පටන්ගෙන තිබෙනවා. අද ඒ ගොල්ලෝ අපට වඩා ඉස්සරහට ගිහින් තිබෙනවා. තවත් අවුරුදු දෙකක් තුනක් යන කොට, කෙන්යාවේ orthodox තේ නිෂ්පාදනයත් එක්ක ලෝක තේ වෙළෙඳ පොළේ තරග කරන්න අපට බැරි වන තත්ත්වයක් ඇති වෙනවා. ඒක ඉතාම අනතුරුදායක තත්ත්වයක්.

[ගරු විජිත හේරත් මහතා]

අප පුංචි කාලයේ කිව්වේ තේ, පොල්, රබර් අපේ රටේ ප්‍රධාන අපනයන භෝග කියලායි. ගරු ඇමතිතුමනි, මේ අවුරුද්ද තුළ පොහොර ලබා දීමත් එක්ක තේ සහ රබර් වගාව යම් ප්‍රමාණයකට ඉස්සරහට ගියත්, වැවිලි වගාවක් විධියට අපේ පොල් කර්මාන්තය ගත්තාම පොල් වගාව සැලකිය යුතු ප්‍රමාණයකින් කඩා වැටිලායි තිබෙන්නේ. 2023 වසරේ මුල් මාස හත ගත්තොත්, පොල් ගෙඩි මිලියන 151කින් එලදාව අඩු වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, පොල් පොහොරවල මිල වැඩි වීම සහ පිරිවැය වැඩි වීම. ඒ නිසා පොල් වගාවෙන් අපේ ගොවියෝ ඈත් වෙනවා. මේ දවස්වල සාමාන්‍යයෙන් වැසි කාලය. වැසි කාලවල පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් පොල් පැළ මිල දී ගැනීම් වැඩි වෙනවා. නමුත්, අද එහෙම නැහැ. අද කොයි තරම් වැස්සත් පොල් පැළ ගෙන යන්නේ නැහැ, මිල දී ගන්නේ නැහැ. ඒකට ප්‍රධාන හේතුව තමයි, පොල් වගාකරුවන් දැන් පොල් වගාවෙන් ඉවත් වෙමින් සිටීම. ඒ, පොල් වගාව දැන් ලාභ ලබන තත්ත්වයේ නැති නිසායි. පොල් පොහොර මිල වැඩියි. පසුගිය කාලයේ පොල් පොහොර සොයා ගන්න තිබුණේත් නැහැ. දැන් තිබෙන පොහොරවල මිල වැඩියි. ඒ නිසා පොල් වගාව එපා වෙලා තිබෙනවා. ඒ එපා වීමත් එක්ක ඇත්තටම ගත්තොත් අද පොල් කර්මාන්තය පසු බෑමකට ලක් වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්ද සමඟ මේ අවුරුද්දේ මුල් කාර්තුව සංසන්දනය කළොත් පෙනෙනවා, සියයට 7.6කින් පොල් නිෂ්පාදනය කඩා වැටිලා තිබෙන බව.

අපේ රටේ පොල් වගාවේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න ඔබතුමන්ලා දැනටමත් දන්නවා. සාමාන්‍යයෙන් වර්ෂයකට අපට පොල් ගෙඩි මිලියන 3,200ක් විතර අවශ්‍ය කර තිබෙනවා. කෑමට විතරක් පොල් ගෙඩි මිලියන 2,000ක් විතර යනවා. පොල් හා සම්බන්ධ අතුරු නිෂ්පාදන 35ක් විතර තිබෙනවා. හැබැයි, අද ඒවාට අදාළ පිරිවැය වැඩි වී තිබෙන නිසා ඒ නිෂ්පාදන කටයුතු කරගෙන ගෙන යන්න බැහැ.

අපි ඊළඟට පොල්තෙල් නිෂ්පාදනය ගෙන බලමු. රටේ පොල් තෙල් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 275,000ක් විතර වනවා. නමුත්, ඒ මෙට්‍රික්ටොන් 275,000න් අප නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික්ටොන් 40,000ක් පමණයි. ඒ නිසාම පොල් තෙල් ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ආනයනය කරද්දී විවිධ palm oil වර්ග ගෙන්වනවා. Palm oil ගෙන්වන එක තහනම් කළා. හැබැයි, Pyramid Wilmar (Pvt.) Limited එක වාගේ ආයතන තුනහතරකට, අර කුප්‍රකට මාෆියාවට අයිති සමාගම් කිහිපයකට පමණක් palm oil ගෙන්වන්න දැන් ඉඩ දීලා තිබෙනවා. ඒ ගොල්ලන්ට ලයිසන් දීලා තිබෙනවා. ඒ ගොල්ලන් තමයි දැන් ආපහු palm oil ගෙන්වන්නේ. එහිදී සිදු වන අක්‍රමිකතා ගොඩක් තිබෙනවා. RBD පොල්තෙල් ගෙන්වීම ගැනත් කිව යුතුයි. ඇත්තටම ගත්තොත්, ඒවා refine කරන්නේ නැතුව පාවිච්චි කරන්න බැහැ. එතැනත් ලොකු මාෆියාවක් ක්‍රියාත්මක වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, palm oil, palm kernels, ඒ වාගේම පොල්තෙල් ගෙන්වීමේදී ඒවාට අදාළව පවතින බදු අනුපාත වෙනස් බව. සාමාන්‍යයෙන් පොල්තෙල් කිලෝග්‍රෑම් එකකට බද්ද රුපියල් 150යි, palm kernelsවල බද්ද රුපියල් 250යි. හැබැයි, palm kernels ගෙන්වා ඒවා ප්‍රති අපනයනය - re-export - කරන ව්‍යාපාරයක් පවතිනවා. ඒක ඇතුළේ අපට සිදු වන විශාල හානිදායක තත්ත්වයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමා සොයා බලන්න.

ඒ වාගේම අපේ පොල් කෙඳි සහ කොහුබත් නිෂ්පාදන සඳහා ලෝක වෙළෙඳ පොළේ ලොකු ඉල්ලුමක් තිබෙනවා. ලබන අවුරුද්දේත් එයට ලොකු ඉල්ලුමක් ඇති වෙනවා. හැබැයි, දැනට අපේ රටේ කොහුබත් සහ කොහු කෙඳි අපනයනය කිරීම කඩා වැටිලා තිබෙනවා. ඇත්තටම ගත්තොත් එය පොල් සංවර්ධන මණ්ඩලය හරහා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පොල් සංවර්ධන මණ්ඩලයේ Processing Director, Marketing Director කියන තනතුරු පසුගිය කාලයේ සිට පුරප්පාඩු වෙලා තිබෙනවා. එම පුරප්පාඩු තවම පුරවා නැහැ. එහි සභාපතිතුමා මේ වෙලාවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්නවා. අපට ලබන අවුරුද්දේ ඇති වන ඉල්ලුමට සරිලන විධියට සැපයීම කරන්න අපි දැන් තියා ලෑහැස්ති වෙලා ඉන්න ඕනෑ. හැබැයි, එහෙම සැලැස්මක් නැහැ. පසුගිය කාලයේ සවුදි අරාබියෙන් අවුරුද්දකට කන්ටේනර් 20,000ක් විතර එවන්න කියලා ඉල්ලීමක් තිබුණා. හැබැයි, අපේ රටේ පසුගිය කාලයේ තිබුණු තත්ත්වයත් එක්ක, විශේෂයෙන් පොල් කුරුමිණියාගේ ප්‍රශ්නයත් එක්ක ඒ අය ඒ ඇණවුම තහනම් කළා. නමුත්, පසුගිය කාලයේ ව්‍යාපාරිකයෝ මැදිහත් වෙලා, ඒ තහනම ඉවත් කර ගත්තා. ඒ තහනම ඉවත් කර ගත්තාට පසුව අපනයනය කරන්න අවස්ථාව අපට ලැබුණාට, ඒ සඳහා තවම සූදානමක් නැහැ; ඒ සඳහා තවම සැලැස්මක් නැහැ.

අපට ලොකු අපනයන ආදායමක් ලබා ගන්න පුළුවන්, කොහු කෙඳි සහ කොහු බත් අපනයනය කිරීමෙන්. ඒ නිසා එය දියුණු කරන්න වහාම මැදිහත් විය යුතුව තිබෙනවා. ඒ වාගේම, පසුගිය කාලයේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ EPF අරමුදලේ විශාල වංචාවක් සිදු වුණා. ඒකට වග කියන්න ඕනෑ නිලධාරිනිය දැනට අත් අඩංගුවේ ඉන්නවා. හැබැයි, ඒ අරමුදල මඟින් ඒ සේවකයන්ට හිමි මුදල් ලබා දීම සිද්ධ වෙලා නැහැ. ඇත්තටම ඒ සේවකයන්ගේ සල්ලි තමයි ඒ EPF අරමුදලේ තිබෙන්නේ. ඒ නිලධාරිනිය අත් අඩංගුවට අරගෙන නීතිමය ක්‍රියා මාර්ග ගන්නා එක හොඳයි. හැබැයි, ඒ අරමුදලෙන් ඒ සේවකයන්ට හිමි මුදල් ලබා දිය යුතුයි. විශේෂයෙන් සමහර සේවකයන් ඒ ආයතනවලින් දැන් ඉවත් වෙලා තිබෙනවා. ඔවුන්ට අයිති අරමුදලක් EPF එක කියන්නේ. ඒ නිසා කම්කරු දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන, ඔවුන්ට හිමි ඒ මුදල් ලබා දෙන්න වහාම මැදිහත් වෙන්න, ගරු ඇමතිතුමනි. ඒකට අදාළ අරමුදල බැංකුවේ තිබෙනවා. ඔබතුමාට කරන්න තිබෙන්නේ වහාම ක්‍රියා මාර්ග ගැනීම විතරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, නැනෝ පොහොර වංචාව පිළිබඳව. මම මේ පාර්ලිමේන්තුවේ නැනෝ පොහොර වංචාව පිළිබඳව ඉස්සෙල්ලාම කථා කරපු වෙලාවේ ගරු මහින්දානන්ද හිටපු ඇමතිතුමා කිව්වා, "නැහැ, කිසිදු වංචාවක් වෙලා නැහැ" කියලා. හැබැයි, පසුව එතුමන්ලාම පිළිගත්තා, එතැන බරපතළ වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා. ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමා. ඒකට ප්‍රධාන වශයෙන් වග කියන්න ඕනෑ, මොහාන් පෙරේරා මහත්මයායි. මොහාන් පෙරේරා මහත්මයාගේ සමාගම් blacklist කළා. හැබැයි, අදත් ඒ අය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටෙන්ඩර්වලට වෙනත් වෙනත් නම්වලින් ඇතුළත් වෙලා ඉන්නවා. අදත් ඒ ක්‍රියාවලිය සිදු වෙමින් තිබෙනවා. පී.බී. ජයසුන්දර මහත්මයා එදා කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ සභාපතිට නියෝග දුන්නා, කැබිනට් තීන්දුවට අනුව ගෙවීම් කරන්න කියලා. එතුමන්ලා බැහැ කිව්වා. පසුව CID පරීක්ෂණ පැවැත්වුණා. හැබැයි, අද වනතුරු නැනෝ පොහොර ගනුදෙනුව හරහා රටට වෙච්ච වංචාවේ පාඩුව පියවා ගන්න ක්‍රියා මාර්ග ගෙන නැහැ. නැනෝ පොහොර වංචාව පිළිබඳව අවුරුදු ගණනක් තිස්සේ අපි කථා

කළා; පාර්ලිමේන්තුවේදී කරුණු හෙළිදරවු කළා. හැබැයි, අපට වෙච්ච ඒ පාඩුව පියවා ගන්න තවම මැදිහත් වෙලා නැහැ. ඒ නිසා වහාම ඒකට මැදිහත් වෙන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Deputy Chairman-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Lakshman Kiriella?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I propose that the time of the Discussion be extended by half an hour; ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින රැස්වීම් කාලය පැය භාගයකින් දීර්ඝ කරමු. එය දෙපැත්තටම හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you. The next speaker is the Hon. Janaka Wakkumbura. You have five minutes.

[අ.භා. 1.07]

**ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ තමයි සාකච්ඡාවට ගන්නේ. ඒ, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයයි. මම මේ අමාත්‍යාංශ දෙකේම කටයුතු කරලා තිබෙනවා. මේ රටේ වැවිලි ක්ෂේත්‍රය සහ කෘෂිකර්ම ක්ෂේත්‍රය අයිති මේ අමාත්‍යාංශ දෙක මේ රට ගොඩ ගන්න පුළුවන් අමාත්‍යාංශ දෙකක්. මට තිබෙන්නේ විනාඩි 5ක කාලයක් වන නිසා මම මුලින්ම අපේ ගරු විෂය භාර ඇමතිතුමන්ලා, රාජ්‍ය ඇමතිතුමන්ලා ඇතුළු සියලු දෙනාටත්, මේ අමාත්‍යාංශ දෙකේම ලේකම්තුමන්ලාටත්, ඒවාට අයත් ආයතනවල සභාපතිතුමන්ලා ඇතුළු සියලු දෙනාටත් සුබ පතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ වැවිලි ක්ෂේත්‍රය ගෙන බැලුවොත්, අදටත් වගා නොකරන විශාල බිම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ වගා නොකරන බිම් ප්‍රමාණය වගා කරන්න අපි සියලු දෙනා එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ. වැවිලි සමාගම් යටතේ තිබෙන වතු වැඩි හරියක් නිකම් තිබෙන්නේ. ඒ අය ඒ හැම වත්තකම අලුතින් වගා කරන්නේ නැහැ; තිබෙන වගාවෙන්ම තමයි මොනවා හරි ආදායමක් ලබා ගන්නේ. අප තේ වතු දිහා බැලුවොත්, කුඩා තේ වතු හිමියා විතරයි වගා කරන්නේ. බදු දී තිබෙන, රජයේ මහා පරිමාණයේ වතු අද වගා කරන්නේ නැහැ. ඒ වතු නිකම් තිබෙන්නේ. ඒ නිසා මේ රටේ වැවිලි ක්ෂේත්‍රයේ සියලු වතුවල වගා කරලා ආදායමක් ලබන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මම මීට ඉස්සෙල්ලාත් කියා තිබෙනවා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා හෝ මේ 225දෙනාම එකතු වෙලා හෝ, වගා කරන්නේ නැති වතු රජයට පවරා ගෙන වගා කරන අයට දීලා ඒවායේ වගා කරවන්න කියලා. රට පහළට වැටිලා තිබෙන මේ වෙලාවේ එතැනින් නැගිටින්න නම්, අපි මේ රටේ සෑම බිම් අඟලක්ම ප්‍රයෝජනයට ගන්න ඕනෑ. ලෝකයේ සෑම රටක්ම එහෙමයි. චීනය ගෙන බලන්න. චීනය කෘෂි කර්මාන්තයෙන් බොහෝ සෙයින් දියුණු වෙලා තිබෙන්නේ ඇයි? ඒ රටේ නාය ගිය තැන්වලත් වගා කරලා තිබෙනවා. එහෙම නම් අපි කරන්න ඕනෑ මොකක්ද? අපේ රටේ පුංචි බිම්කඩක් තිබෙන්නේ. මේ බිම්කඩේ වගා කරන්න පුළුවන් හැම තැනම වගා කරන්න ඕනෑ. එහෙම වගා කළොත් අපට පුළුවන්කම ලැබෙනවා, අපේ රටේ තිබෙන මේ ප්‍රශ්න විසඳන්න.

අද අපේ වැවිලි ක්ෂේත්‍රයේ ගොවියන් ගොවිතැනින් ඈත් වෙන්න හේතුවක් තිබෙනවා. ඒ තමයි ඒ ගොල්ලන්ට යන වියදම -cost එක- වැඩි වීම. වියදම වැඩි වෙලා ඒකට සරිලන ආදායමක් ලැබෙන්නේ නැති වුණාම ඒ අය වගා කරන්න කැමැති වෙන්නේ නැහැ. අපි කුඹුරු ගොවීන්ට නම් සහනාධාර ලබා දෙනවා; ඒ අයට සහනාධාර රාශියක් ලබා දෙනවා. හැබැයි, වැවිලි ක්ෂේත්‍රයේ වගා කරන සියලු දෙනාත් ගොවියෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
කථාව පටන් ගන්නවත් වෙලාවක් නැති වෙනවා නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මේ වැවිලි ක්ෂේත්‍රයේ කටයුතු කරන හැමෝම ගොවි මහත්තුරු. තේ ගොවියාත් ගොවියෙක්. බඩ ඉරිඟු වගා කරන්නෙත් ගොවියෝ. කුරුඳු වගා කරන්නෙත් ගොවියෝ. මේ හැමෝම ගොවියෝ. ඒ නිසා ඒ හැමෝටම සහනාධාරයක් දෙන්න ඕනෑ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම එදා අපනයන කෘෂිකර්ම රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ අපේ ගරු රමේෂ් පතිරණ මැතිතුමා වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. අපි ඒ කාලයේ ගොවීන්ට නොමිලේ පැළ වර්ග ලබා දුන්නා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාලයේ මම ටොම් ඊජේසී අඹ පැළ ලක්ෂ 22ක් දුන්නා. ඒ දීපු පැළවලින් සෙවනගල සීනි කර්මාන්තශාලාව විතරක් රුපියල් හතළිස් නව ලක්ෂයක ආදායමක් ගත්තා. අපේ රටේ වගා කරන්න පුළුවන් හැම පැළ වර්ගයක්ම වගා කරන්න ඕනෑ. කුරුඳු හිටවන්නත් පුළුවන්. තේ වගා කරන්නත් පුළුවන්.

ඊළඟට, පුවක් වගාව ගැනත් මම කියන්න ඕනෑ. පුවක් වගාවෙන් මේ රටට ලොකු ආදායමක් ගෙනෙන්න පුළුවන්. අපි දැන් ආපහු පුවක් ආනයනය කරලා විකුණනවා. මම කියන්නේ, මේවා නතර කරලා රටක් විධියට අපි ඉස්සරහට වැඩ පිළිවෙළක් හදා ගන්න කටයුතු කරන්න ඕනෑ කියලායි. ගරු ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා, මේ කරන කටයුතු වෙනුවෙන්. ඒ වාගේම අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව කරන්නත්, ඒ යටතේ තිබෙන දෙපාර්තමේන්තු, සංස්ථා සියල්ල මීටත් වඩා හොඳට ඉදිරියට ගෙන යන්නත් ගරු ඇමතිතුමා ඇතුළු සියලු දෙනාටම ශක්තිය, ධෛර්යය වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Maithreepala Sirisena. You have seven minutes.

[අ.භා. 1.11]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කෘෂිකර්මාන්ත හා වැවිලි කර්මාන්තය පිළිබඳ කථා කරන විට ගොවි ජනතාව නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වශයෙන් මම, මේ වන විට ගොවීන් මුහුණ පා ඇති තත්ත්වය පිළිබඳව කෙටි වේලාවක් තුළ කරුණු කිහිපයක් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, මූලික වශයෙන්ම අපි කවදත් කථා කරන ගොවියාගේ නිෂ්පාදන වියදම අවම කිරීම සඳහා ගත යුතු වැඩ පිළිවෙළක අවශ්‍යතාව තමයි තිබෙන්නේ. අද වී ගොවියා, එළවලු ගොවියා, පලතුරු ගොවියා ඇතුළු බඩඉරිඟු වැනි ධාන්‍ය වගා කරන සෑම ගොවියෙකුටමත් තිබෙන ප්‍රශ්නය තමයි එම නිෂ්පාදන කිරීම සඳහා තමන්ට අවශ්‍ය ප්‍රාග්ධනය නොමැතිකම. ප්‍රධාන වශයෙන්ම 2020, 2021 අවුරුදුවල ගත්ත ඉතාම අමනෝඥ තීන්දු නිසා කෘෂිකර්මාන්තය සහ වැවිලි කර්මාන්තයේ ඇති වූ විශාල කඩා වැටීම ගොඩ නැඟීම පහසු වෙන්නේ නැහැ. මේක දවසකින් දෙකකින් කළ හැකි දෙයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, දැන් මේ කාලයේ පොළොන්නරුවේ යූරියා පොහොර නැහැ. යූරියා පොහොරවල විශාල හිඟයක් තිබෙනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන්, අපි සාමාන්‍යයෙන් ගමේ කථා කරන 'මඩ පොහොර' මේ කාලය තුළ පොළොන්නරුවේ විශාල හිඟයක් තිබෙනවා. රජයෙන් දෙනවා කියපු රුපියල් 10,000 පොළොන්නරුව ප්‍රදේශයේ හුඟ දෙනෙකුට ලැබිලා නැහැ. ඉතින් ඒ තත්ත්වයන් උඩ -ඒ මුදලත් ලැබුණේ නැති නිසා- ගොවීන් විශාල අමාරු තත්ත්වයකට පත් වෙලා සිටිනවා.

ඊළඟට, වල් නාශක සහ කෘමි නාශකවල මිල අද පුදුමාකාර විධියට ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. නිෂ්පාදන වියදම සම්බන්ධව කථා කරන විට බහුජාතික සමාගම්වලින් කිසිම පාලනයකින් තොරව වල් නාශක සහ කෘමිනාශකවල මිල ඉහළ නැංවීම නිසා වැවිලි ක්ෂේත්‍රයේ -කෘෂිකර්මය වැනි සෑම අංශයකම- බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, වල්නාශක සහ කෘමිනාශකවලට ඉතා ඉහළ මිලක් තිබෙන නිසා. සාමාන්‍ය ගොවියෙකුට රුපියල් 20,000ක් හෝ රුපියල් 20,000කට ඉහළ මිලකට තමයි ඒවා මිලදී ගන්න වෙලා තිබෙන්නේ. සාමාන්‍ය ගොවියෙකුට එම මිල යටතේ ඒවා මිල දී ගන්න පුළුවන්කමක් නැහැ. අපි ප්‍රධාන වශයෙන්ම අපේ රටේ කෘෂිකර්මාන්තය පෙර රජ දවස ඉඳලා ගත් විට අපිට මේ රට ස්වයංපෝෂිතභාවය පිළිබඳව, සමෘද්ධිය පිළිබඳව හැම විටම කථා කරන්නට පුළුවන්කම ලැබුණේ කෘෂිකර්මාන්තයේ දියුණුව නිසායි. මහා විජයබාහු රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳලා අනුරාධපුර යුගයෙන් ද, පොළොන්නරු යුගයෙන් ද, එතැනින් දඹදෙණියෙන් ද යනාදී වශයෙන් අපි දිගටම ගත්තොත් මේ සෑම කාල පරිච්ඡේදයකම කෘෂිකර්මාන්තය තමයි මහා වැව් හැදීම ආරම්භ කළේ. මේ රට වැව්වලින් පිරුණු රටක්. ලෝකයේ කිසිම රටක මේ තරම් වැව් නැහැ. එතකොට ඒ විධියට කෘෂිකර්මාන්තයේ දියුණුවක් ඇති වුණේ පෙර රජ දවස ඒ විධියේ වාරි කර්මාන්තය පිළිබඳව, වාරි තාක්ෂණය පිළිබඳව සිදු කරපු ශිල්පීය ඥානය සහ දියුණුව තුළයි. ප්‍රධාන වශයෙන්ම, එයින් නිෂ්පාදනයට ශක්තියක් ලැබී තිබෙනවා.

අද වාරිමාර්ග ක්ෂේත්‍රය ගත්තොත්, ප්‍රධාන වශයෙන් වාරිමාර්ගවල ජල කළමනාකරණය සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්න රාශියක් තිබෙනවා. වාරිමාර්ග සහ කෘෂිකර්ම කියන දෙක එකට යන ක්ෂේත්‍ර දෙකක්. මේ සියලු කාරණා ගත්තාම අපි ඉතා නරක තැනක ඉන්නේ. 2019න් පසුව මේ රටේ කෘෂි කර්මාන්තය මහා ජාතික ඛේදවාචකයක් බවට පත් වෙලා තිබෙනවා. එයින් ගොඩ ගැනීම ඉතා අමාරුයි. ඒ තත්ත්වය සම්බන්ධයෙන් රජය වගකීම අරගෙන, ඇමතිතුමා මූලිකත්වය අරගෙන කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන් මම කැමැතියි, වැවිලි කර්මාන්තය පිළිබඳවත් කථා කරන්නට. වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප හැටියට දැනට රුපියල් 1,000ක මුදලක් තමයි ලැබෙන්නේ. නමුත් රුපියල් 1,000කින් නඩත්තු වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා වැවිලි ක්ෂේත්‍රයේ වතු කම්කරුවෙකුට රුපියල් 2,000ක දෛනික වැටුපක් දෙන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ වාගේම 2020 කාලය තුළ පොහොර ප්‍රශ්නය නිසා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ සිදු වුණු කඩා වැටීම බරපතළයි.

මා අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා. මට කලින් කථා කළ අපේ ගරු මැති ඇමතිවරුත් මේ ගැන සඳහන් කළා. විශාල වතු සමාගම්වල නිෂ්පාදනය වැඩි කරන වැඩ පිළිවෙළක් නිසි පරිදි ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, සුළු තේ වතු හිමියා රටට වැඩි නිෂ්පාදනයක් ලබා දෙනවා නම්, බහුජාතික සමාගම් සතු, නැත්නම් අපේ රටේ ජාතික සමාගම් සතු මේ වතු ඒ ප්‍රදේශවල ජනතාවට ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ වතු රජයට පවරාගෙන ජනතාව සම්බන්ධ කරගෙන සමූපකාර ව්‍යාපාරය වැනි ව්‍යාපාරයක් හදලා නිෂ්පාදනය වැඩි කිරීමේ වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. මොකද, මේ වතු හිමියන්ට වෙනත් විශාල ව්‍යාපාර තිබෙනවා; වෙනත් ආදායම් මාර්ග තිබෙනවා. ඒ නිසා ඔවුන් මේවාට ප්‍රමුඛත්වයක් ලබා දෙන්නේ නැහැ. කෘෂිකර්ම ක්ෂේත්‍රයේත්, වැවිලි ක්ෂේත්‍රයේත් -වී ගොවියාගේ සිට වැවිලි ක්ෂේත්‍රය දක්වා- ඇති වෙලා තිබෙන මේ ප්‍රශ්නවලට විසඳුම් අවශ්‍ය බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Next, the Hon. Thenuka Vidanagamage. You have five minutes.

[අ.භා. 1.17]

**ගරු තේනුක විදානගමගේ මහතා (නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Urban Development and Housing)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපි සාකච්ඡා කරනවා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත්. ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. කෘෂි කාර්මික ප්‍රදේශයක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පත්වුණු මම කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන වැඩි අවධානයක් යොමු කරනවා. මේ වැය ශීර්ෂය අපේ ප්‍රදේශවල ජනතාවගේ ජීවිත කෙරෙහි ඍජුවම බලපානවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2024 වර්ෂය සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය කථාවේ දී කෘෂි ආර්ථිකය ඉහළට ඔසවා තැබීමට යෝජනා කළා. අගය එකතු කළ නිෂ්පාදන වැඩි කිරීමටත් යෝජනා කළා. ඒ වාගේම අපනයනය ඉලක්ක කරමින් කෘෂිකර්මය නවීකරණය කළ යුතු බව ප්‍රකාශ කළා. අය වැය යෝජනා සම්මත වුණාට පස්සේ ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති තීරණයක් වශයෙන් අපි එය සලකනවා. එය හොඳ ප්‍රවණතාවක්. අද කෘෂිකර්මය පදනම් කරගත් සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත බිහි වෙමින් තිබෙනවා. ඒවා අපනයන වෙළෙඳ පොළ දක්වා වර්ධනය කිරීමට මැදිහත් විය යුතුව තිබෙනවා; මඟ පෙන්වීම කළ යුතුව තිබෙනවා. මේ සඳහා අවශ්‍ය

මැදිහත්වීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම ප්‍රතිපත්ති සම්පාදනයේ දී අවධානය යොමු විය යුතුව තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය මේ සඳහා යම් මට්ටමකින් ප්‍රවේශ වෙලා තිබෙනවා. මෙවර කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවල කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 2,836ක් වෙන් වෙලා තිබෙනවා. මේ වැඩසටහන ගැන අපි සොයා බැලුවිට දැනගන්නට ලැබුණේ පසුගිය වර්ෂවල මේ පිළිබඳව විවිධ මට්ටමේ සාකච්ඡා පැවතුන බවයි. මේ වැඩසටහන 2024 වර්ෂයේ ශ්‍රී ලංකාව පුරාම විසිරී පවතින කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නඟා සිටුවීමට දායකත්වය ලබා දීමට යොමු කළ යුතුව තිබෙනවා. මේ වැඩසටහන කෘෂිකර්මය පදනම් කරගත් ව්‍යාපාර වැඩිදියුණු කරන, නඟා සිටුවන ක්‍රියාකාරි වැඩසටහනක් බවට පත් කරන්න ගරු අමාත්‍යතුමාගේත්, අමාත්‍යාංශ ලේකම්තුමාගේත් අවධානය යොමු වේවි කියා මා හිතනවා. මෙම වැඩසටහනට වෙන්වූ අරමුදල් නිසි ලෙස අරමුණු කරගත් කාර්යයටම යොමු කරවා දීමට මැදිහත් වෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ශ්‍රී ලංකා රජය සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල - IFAD - ලබා දුන් අරමුදල් මේ වැඩසටහනට යොදවා තිබෙනවා.

ඒ මුදලින් කරන්න නියමිත කාර්යයන් පළාත් මට්ටම දක්වා ව්‍යාප්ත විය යුතුයි. නැත්නම් ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි ව්‍යාපාර ඇරඹීමට සූදානම් අයට, මේ වන විටද ව්‍යාපාර ඇරඹූ කෘෂි ව්‍යාපාරිකයන්ට, ඒ පිළිබඳව උනන්දුව දක්වන්නන්ට මෙයින් ප්‍රතිලාභ ලබා ගන්න අවස්ථාවක් නැති වෙනවා. විශේෂයෙන් මෙම වැඩසටහන් යටතේ ඌව පළාතේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නඟා සිටුවීමට දායකත්වය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලය තුළදී කෘෂි කර්මාන්තය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා අපේ ප්‍රදේශවල ජීවත් වන ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ටත්, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත් අපේ ස්තුතිය පුද කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලය සීමිත නිසා මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා. මට වෙලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**** සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
** Rest of the speech tabled:*

විශේෂයෙන් අපනයනය සඳහා සුදුසු මට්ටමේ ප්‍රමිතියෙන් යුක්ත එළවලු බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ, ඌව පරණගම, බණ්ඩාරවෙල ආශ්‍රිත ප්‍රදේශවල නිෂ්පාදනය කරනවා. අපනයනකරුවන් ඒවා මිලදීගෙන අපනයනය කළා. මාලදිවයින, මැද පෙරදිග රටවලට අපනයනය කළ බව වාර්තා වෙනවා. අපනයනකරුවන් මෙන්ම සුපිරි වෙළෙඳ සැල් මෙම එළවලු මිලදී ගන්නේ අතරමැදියන් මඟින්. ඉහළම ප්‍රමිතියෙන් යුක්ත එළවලු, පලතුරු සහ මල් නිෂ්පාදන කරන බදුල්ලේ ගොවීන්ට සැබෑ මිලක්, ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයේ වැඩ පිළිවෙළක් "කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන" තුළින් ඇති කළ යුතු බව පෙන්වා දෙන්න කැමැතියි. ඒ අයුරින් කටයුතු කළොත් අය වැය කථාවේ කියැවුණ, අපනයන මට්ටමේ කෘෂි කාර්මික ව්‍යාපාර බිහිවේවි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2024 ඇස්තමේන්තුවේ තවත් මේ හා සමාන වැඩසටහනක් තිබෙනවා. ඒ, "කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන" නමින් හැඳින්වෙන වැඩසටහනයි. අපේ පළාතේ ගොවීන් මේ වැඩසටහන හඳුන්වා දෙන්නේ "බඩ ඉරිඟු වගා ව්‍යාපෘතිය" ලෙසයි. ඒකට හේතුව වුණේ, මීට පෙර වගා අක්කරයක සිටවූ බීජ ගණනට වැඩි බීජ ගණනක් සිටුවා, අක්කරයක සිටුවන බඩ ඉරිඟු ගස් ගණන වැඩි කර, අස්වැන්න වැඩි කර, ගොවීන්ගේ ආදායම වැඩි කර, බඩ ඉරිඟු ආනයනය කිරීම නවතාලීමට කටයුතු කරන ව්‍යාපාරික මට්ටමකට බඩ ඉරිඟු වගාවට ගොවීන් පෙලඹවූ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වීම නිසායි. මෙය ගොවීන් ආකර්ෂණය කරගත් ව්‍යාපෘතියක් වෙලා තිබෙනවා.

අපේ ප්‍රදේශයේ ගොවීන් විශාල ප්‍රමාණයක් මේ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් ලෙස කටයුතු කරනවා. ව්‍යාපෘතියට තෝරාගෙන තිබුණා. මෙම වැඩසටහනට 2024 වර්ෂයේ රුපියල් මිලියන 7,024 වෙන්වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා රජයේ අරමුදල් වාගේම ඉෆාඩ් - IFAD - අරමුදල් මේ සඳහා යොදවනවා.

මේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම්වලට ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී පවා පසුගිය වකවානුවේදී යම් යම් ගැටලු පැන නැඟුණා. මේ වැඩසටහන හා සම්බන්ධ වී කටයුතු කරන්න කල් වේලා ඇතිව ගොවීන් තම ගොවිබිම් සූදානම් කරගෙන සූදානම් වුණා. ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරින් විසින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමට භාවිත කළ නිර්ණායක හේතුවෙන් ක්ෂේත්‍රයේදී ගැටලු ඇති වුණා. මේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී මීට වඩා නම්‍යශීලීව කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් දීලා මෙහෙයවීමට වග බලා ගැනීම සුදුසු බව යෝජනා කරනවා. ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඒ සඳහා මැදිහත් වේවි.

වෙන් වූ මුදල නිසි පරිදි ආයෝජනය කර වසර අවසානයේ නිසි ඉලක්කයට වැඩසටහන මෙහෙයවීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ නිසා ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මාස්පතා ප්‍රගතිය වාර්තා කරන ක්‍රමවේදයක් සකස් වෙනවා නම් ඉතාම යෝග්‍ය බව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන වැඩසටහන් අතරින්,

පොහොර සහනාධාර වැඩසටහන - රුපියල් මිලියන 36,050

ගොවීන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම - රුපියල් මිලියන 1,000

දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය - රුපියල් මිලියන 11,800

යන ඒවා කාලීනව මැදිහත්වන ප්‍රමුඛතාව දී ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් බව ප්‍රකාශ කරන්න කැමැතියි. මේ අතරින් ශ්‍රී ලංකා රජය ලෝක බැංකුව දායක කරගෙන අරමුදල් සම්පාදනය කර ගත් දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඉටු කළ යුතු කාර්යයන් රැසක් තිබෙනවා.

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ, ඌව පරණගම, බණ්ඩාරවෙල, පස්සර, හපුතලේ, හල්දුම්මුල්ල වැනි ප්‍රදේශවල වගා බිම්වලට ජලය කළමනාකරණය කර දුන්, ජලය ලබා දුන් වාරිමාර්ග පද්ධති නිරන්තරව අධික වර්ෂාපතනයෙන් කැඩී බිඳී ගිය අවස්ථා තිබෙනවා. දිගු කලකින් නඩත්තු අලුත්වැඩියා නොකිරීම එක් හේතුවක් වෙනවා. වැඩි වශයෙන් බලපාන්නේ ප්‍රදේශයට ඇද හැලෙන අධික වර්ෂාපතනයයි. මේ කලාපයට නිරිතදිග මෝසම වාගේම ඊසානදිග මෝසම බලපානවා. මෝසම් වර්ෂා කාල දෙකේම වර්ෂාව ලබන ප්‍රදේශ බදුල්ලේ තිබෙනවා. ඒ වාගේම මෝසම් වර්ෂාව වාගේම දේශගුණික විපර්යාස නිසා ඇති වූ අධික වර්ෂාපතනය, නාය යෑම් ආදී අනිටු විපාක ඇති කරන දිස්ත්‍රික්කයක් බවටත් පත් වෙලා තිබෙනවා. දේශගුණික විපර්යාසයන් හේතුවෙන් සිදු වී තිබෙන අයහපත් බලපෑම් වෙනුවෙන් මුහුණ දෙන මධ්‍යම කඳුකරයේ නැඟෙනහිර කොටසට බදුල්ල දිස්ත්‍රික්කය අයිති වෙනවා. මේ නිසා හානි වූ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය මෙන්ම, ලැබෙන වර්ෂාපතනයට ඔරොත්තු දෙන අයුරින් පුළුල් කළ යුතු, සංවර්ධනය කළ යුතු සුළු වාරිමාර්ග මේ ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කරවා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමාන ගරු කථානායකතුමා කෘෂිකර්ම අමාත්‍යතුමා ලෙස කටයුතු කළ වකවානුවේ බදුල්ල දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා "ගොවීන්ගේ භාරකාර අරමුදල" යටතේ ප්‍රතිපාදන වෙන් කර දුන්නා. ඒ යටතේ,

අත්හැර දමා තිබූ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කළා.

අත්හැර දමා තිබූ වගා බිම් නැවත වගා කළා.

ගංවතුර හා නාය යෑම් තත්ත්වයන් පාලනය කළා.

ජල සම්පාදන දෝෂ නිසා වගා කටයුතු අත්හැර, ආදායම් මාර්ග අහිමි වූ පිරිස් නිසා ඇතිව තිබූ විරැකියාව අවම කළා.

වාර්ෂික නිෂ්පාදනයට කුඩා පරිමාණ වගා බිම්වලින් එකතු වූ නිෂ්පාදනය වැඩි කළා.

[ගරු තේනුක විදානගමගේ මහතා]

ඒ නිසා වත්මන් කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හඳුනාගත්, අත්‍යවශ්‍ය, ප්‍රමුඛතාව දිය යුතු සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණයට ප්‍රතිපාදන වෙන් කර දෙන්නයි ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලයක් තිස්සේ ගොවීන්ගේ, නිෂ්පාදකයන්ගේ ඉල්ලීමක් තිබෙනවා මහියංගනය කේන්ද්‍ර කරගත් ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීමට. මහියංගනය කේන්ද්‍ර කරගෙන පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක විතර නිෂ්පාදන දඹුල්ලට හෝ වෙනත් ආර්ථික මධ්‍යස්ථානවලට හෝ ගෙනගොස් තවත් මිලක් එකතු කරලා එම කෘෂි කාර්මික නිෂ්පාදන ප්‍රදේශවලට හා එම නිෂ්පාදන ප්‍රදේශවලට ආසන්න නගරවලට අළෙවිය සඳහා එවනවා.

මහියංගනය දිස්ත්‍රික්ක ගණනාවක් යා කරන කේන්ද්‍රීය ප්‍රදේශයක්. මේ ප්‍රදේශය හරහා හුවමාරු වන කෘෂි කාර්මික නිෂ්පාදනවල විනාශ වන ප්‍රමාණය, අපතේ යන ප්‍රමාණය ගණනය කළ විට එය අවම කර ගන්නත්, ප්‍රවාහන වියදම් අවම කර ගන්නත්, නිෂ්පාදකයාට හොඳ මිලක් මෙන්ම පාරිභෝගික සහනයක් සලසා දීමට ආර්ථික මධ්‍යස්ථානය පිටුවහලක් වෙනවා. පැරණි ආර්ථික මධ්‍යස්ථානවල යහපත් ගුණාංග සොයා බලා ඒවා ඒක රාශි කර ගනිමින්, හොඳින් සංවිධානය වූ ආර්ථික මධ්‍යස්ථානයක් මහියංගනයේ පිහිටුවීමට යෝජනා කරනවා.

2024 වර්ෂයට වෙන්වී තිබෙන ප්‍රතිපාදනවලින් හෝ මේ කටයුත්ත ආරම්භ කරන්න කියා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වන විට ඒ සඳහා අධ්‍යයන කිහිපයක් සිදු වෙනවා. මම කෙටි දිනකින් ඒ වාර්තා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට ඉදිරිපත් කරනවා.

මහියංගනය කේන්ද්‍ර කරගත් ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන්,

බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය, රිදීමාලියද්ද, මීගහකිවුල, කන්දකැටිය ප්‍රදේශවල නිෂ්පාදන

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර, මිනිපේ ප්‍රදේශවල නිෂ්පාදන

මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රදේශයේ නිෂ්පාදන

අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය, මහඔය, පදියතලාව ප්‍රදේශවල නිෂ්පාදන

මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල, මඩුල්ල ප්‍රදේශවල නිෂ්පාදන

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මායිම් ප්‍රදේශය (දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රදේශ) යන ප්‍රදේශවල ගොවීන්ගේ නිෂ්පාදනවලට සාධාරණත්වයක් ලැබේවි. අවශ්‍ය භූමිය, ජල සැපයුම ඇතුළු යටිතල පහසුකම් සපයා දෙන්න පුළුවන්. අවශ්‍ය වන්නේ ක්‍රමවත් සැලැස්මක් යටතේ කටයුතු සංවිධානය කර ගැනීම විතරයි. මම කලින් සඳහන් කළ ඉෆාඩ් අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන්වලින්ද මෙම ආර්ථික මධ්‍යස්ථානය සඳහා මුදල් යෙදවිය හැකියි කියා පෙනෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නියෝජනය කරන ප්‍රදේශයේ බහුතරයකගේ ජීවනෝපාය මාර්ගය ගොවිතැන, නැත්නම් ගොවිතැන පදනම් කරගත් ව්‍යාපාර. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම ලබාගෙන, කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමට, විශේෂයෙන් කෘෂි කාර්මික කටයුතුවලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට, නිපදවන අස්වැන්න විකුණා ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ගැනීමට මම යෝජනා ඉදිරිපත් කළා. ඒ ගැන ගරු අමාත්‍යතුමාගේ, ලේකම්තුමාගේ විශේෂ අවධානයක් යොමු වෙයි කියලා හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම විවාදයේදී මට අවස්ථාව ලබාදුන් ඔබතුමාට ස්තුතිය පළ කරනවා. ඒ වාගේම පසුගිය වර්ෂයේ පැන නැඟුණු අභියෝග භාර ගනිමින්, අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව මෙහෙයවූ ගරු අමාත්‍යතුමාට, හිටපු ලේකම්තුමාට මෙන්ම වත්මන් ලේකම්තුමාට, ඌව පළාත් සභාවේ කෘෂිකර්ම ලේකම්තුමාට, ඌව පළාත් අධ්‍යක්ෂතුමාට ස්තුතිය පළ කරමින් මම කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Next, the Hon. Mano Ganesan. You have seven minutes.

[பி.ப. 1.21]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

நன்றி, கௌரவ பிரதித் தவிசாளர் அவர்களே! ගරු ඇමතිතුමනි, මම දෙමළ භාෂාවෙන් කථා කරන්නම්, පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න.

இன்றைய வீரகேசரிப் பத்திரிகையில், "புதிய கூட்டு உடன்படிக்கை ஒன்றை உருவாக்குங்கள்" என்ற தலைப்பின் கீழ்,

'1,700 ரூபாயை வழங்குவதற்கு முடியுமா; 31க்கு முன் அறிவிக்குமாறு கம்பனி பிரதானிகளுக்கு ஜனாதிபதி பணிப்பு"

என்ற உப தலைப்பின்கீழ் செய்தியொன்று வெளிவந் திருக்கின்றது. இவ்விடயம் சம்பந்தமாக எங்களுடைய கௌரவ பாராளுமன்ற உறுப்பினர் வேலு குமார் அவர்கள் சற்றுமுன்னர் கௌரவ நிதி இராஜாங்க அமைச்சரிடம் கேள்வி எழுப்பியிருந்தார். அதற்குச் சரியான பதில் கிடைத்ததா என்பது எனக்குத் தெரியவில்லை. எது எப்படி இருந்தாலும், 1,700 ரூபாயை தோட்டத்தொழிலாளர்கள் எங்கே கேட்டார்கள் என்று தெரியவில்லை. அவர்களுக்கு 1,700 ரூபாய் போதாது; 3,000 ரூபாய் கிடைக்க வேண்டும். சம்பள நிர்ணய சபை மூலமாகவா, கூட்டு ஒப்பந்தம் மூலமாகவா, revenue sharing என்று சொல்லக்கூடிய வருமானத்தைப் பகிர்ந்துகொள்ளும் முறைமை மூலமாகவா தோட்டத்தொழிலாளர்களின் வருமானத்தை அதிகரிக்கிறார்கள் என்பதில் எங்களுக்குப் பிரச்சினையில்லை. தொழிலாளர்களின் - உழைக்கும் மக்களின் - வருமானம் அதிகரிக்கப்பட வேண்டும்; சம்பளம் அதிகரிக்கப்பட வேண்டும். நாட்டில் நாளாந்தம் உயர்ந்துகொண்டிருக்கும் விலைவாசிக்கு ஏற்றவிதத்தில் வாழ்வதற்கான வசதி வாய்ப்பு அவர்களுக்குக் கிடைக்க வேண்டும். அதுதான் முக்கியமாக இருக்கின்றது. அதனை மாண்புமிகு ஜனாதிபதி அவர்கள் புரிந்துகொள்ள வேண்டும்.

அடுத்து, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் காணி உரிமை சம்பந்தமாகப் பேசியிருக்கிறார். நல்ல விஷயம்! இதுவும் பேச்சளவில்தான் இருக்கின்றது. பரவாயில்லை! தலா 10 பேர்ச்சஸ் காணி தருவதாகச் சொல்லி, 400 கோடி ரூபாயை ஒதுக்கியிருக்கின்றார். இந்த ஒதுக்கீடானது, அவருடைய அமைச்சின் கீழ்தான் இருக்கின்றது. இந்த விடயமானது, வரவு செலவுத்திட்ட உரையில் சிங்களத்தில் 10ஆவது விஷயமாகவும், தமிழில் 11ஆவது விஷயமாகவும் இருக்கின்றது. அதில்கூட, குளறுபடி இருக்கின்றது. இந்தக் குளறுபடி காணி வழங்கலில் இருக்கக்கூடாது.

அடுத்து, கடந்த டிசம்பர் மாதம் 01ஆம் திகதி நான் பிரதிநிதித்துவப்படுத்தும் கொழும்பு மாவட்டத்தின் அவிசாவளை தொகுதியிலுள்ள Pussellawa Plantation Limitedஇன்கீழ் Damro நிறுவனம் நிர்வாகம் செய்கின்ற பென்ரீத் தோட்டத்தில் கருங்காலி divisionஇல் தீ விபத் தொன்று நிகழ்ந்திருக்கின்றது. அதனால் 16 குடும்பங்களைச்

சேர்ந்த 60 பேர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். நான் அங்கு நேரடியாகச் சென்று பார்த்தேன். தயவுசெய்து 10 பேர்ச்சஸ் நிலம் வழங்கும் திட்டத்தை அவிசாவளையிலிருந்து ஆரம்பிக்குமாறு நான் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் கேட்டுக் கொண்டேன். கொழும்பு மாவட்டம் எனது மாவட்டம் மட்டுமல்ல, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் முன்னர் பிரதிநிதித்துவம் செய்த மாவட்டமும்கூட. அவர் முன்னர் இந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தித்தான் MPஆக இருந்தார். ஆகையால், இந்தச் செயற்பாட்டைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இந்தச் செயற்பாடு காணி அமைச்சுக்குக் கீழும் இல்லை; பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சுக்குக் கீழும் இல்லை; பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அமைச்சுக்குக் கீழும் இல்லை. ஜனாதிபதிக்குக் கீழ்தான் இருக்கின்றது. அது சரிதான். பிரச்சினையில்லை!

இந்தக் காணி வழங்கும் திட்டத்தை நடைமுறைப் படுத்துகின்ற பொறுப்பை பெருந்தோட்டங்கள் இருக்கின்ற ஒவ்வொரு மாவட்ட ஒருங்கிணைப்புக் குழுவிடமும் வழங்க வேண்டுமென தயவாகக் கேட்டுக்கொள்கின்றேன். இன்று இந்த நாட்டிலுள்ள 12 மாவட்டங்களில் பெருந்தோட்டங்கள் இருக்கின்றன. அதாவது, கொழும்பு, களுத்துறை, இரத்தினபுரி, கேகாலை, கண்டி, மாத்தளை, நுவரெலியா, பதுளை, மொனராகலை, காலி, மாத்தறை மற்றும் குருநாகல் ஆகிய மாவட்டங்களிலேயே பெருந்தோட்டங்கள் இருக்கின்றன. இம்மாவட்டங்களில் 102 பிரதேச செயலகப் பிரிவுகளில் பெருந்தோட்டங்கள் இருக்கின்றன. இது தொடர்பான பெயர்ப்பட்டியல் எங்களிடம் இருக்கின்றது. இத்திட்டத்தை நடைமுறைப்படுத்துகின்ற பொறுப்பை அந்தந்த மாவட்ட ஒருங்கிணைப்புக் குழுவிடம் நீங்கள் வழங்குவீர்களானால், நிச்சயமாக தோட்டத் தொழிலாளர்களுக்கு மட்டுமல்ல, தோட்டத்தில் வாழுகின்ற மக்களுக்கும் 10 பேர்ச்சஸ் காணியை வழங்கும் முடியும். அந்த அடிப்படையில், அவிசாவளையிலுள்ள Pussellawa Plantation Limited க்குக்கீழ் வருகின்ற பென்ரீத் தோட்டத்தின் கருங்காலிப் பிரிவில் ஏற்பட்ட தீ விபத்தால் பாதிக்கப்பட்ட 16 குடும்பங்களுக்கும் 10 பேர்ச்சஸ் காணி வீதம் வழங்கி, இந்தத் திட்டத்தை ஆரம்பிக்கும்படி மீண்டுமொரு முறை நான் இந்தச் சபையினூடாக மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் கோரிக்கை விடுக்க விரும்புகின்றேன்.

உண்மையிலேயே இந்தச் செயற்பாடு நல்லதொரு செயற்பாடு எனப் பேசப்படுகின்றது. இங்கு பேசிய எதிர்க்கட்சித் தலைவர்கூட, இது சம்பந்தமாகப் பேசியிருந்தார். தோட்டத் தொழிலாளர்களைக் கூலிக்காரர்களாக வைத்திருப் பதை விடுத்து, அவர்களைப் பங்காளிகளாக மாற்ற வேண்டும். முன்னாள் ஜனாதிபதி அவர்கள் சற்று முன்னர் இங்கு பேசியதை நான் கேட்டேன். நாங்கள் பேச்சுவார்த்தை நடத்தி, கூட்டுறவு முறையிலாவது தோட்டத் தொழிலாளர்களைப் பங்காளிகளாக மாற்ற வேண்டும். அவர்கள் தொடர்ந்தும் தோட்டத் தொழிலாளிகளாக இருக்க முடியாது. அவர்கள் வாழ்வதற்கு இடம் வேண்டும்; அவர்களுடைய வாழ்வாதாரத் துக்கும் இடம் வேண்டும். வாழ்வாதாரத்துக்கு இடம் வேண்டும் என்பது, அவர்களுக்கு உழைப்பதற்கு இடம் வேண்டும். அவர்கள் அதில் விரும்பிய பயிரைப் பயிரிட்டு, விளைபொருளைப் பெற்று, அவற்றை விற்பனை செய்து, நாகரிகமான வாழ்க்கை வாழ்வதற்கு ஒரு சந்தர்ப்பம் வழங்கப்பட வேண்டும்.

தோட்டத் தொழிலாளிகள் தொடர்ந்தும் உழைப்பாளிகளாக - கூலிக்காரர்களாக - மட்டும் இருக்க முடியாது. அவர்கள் இலங்கைக்கு வந்து 200 வருடங்களாகி விட்டன என்று நாங்கள் சொல்கின்றோம். 'நாம் 200' என்ற பாரியதொரு விழாவை அரசாங்கம் நடத்தியது. அதில் இந்தியாவின் நிதி அமைச்சர் திருமதி நிர்மலா சீதாராமனும் கலந்து கொண்டிருந்தார். அவருக்கு முன்னால்தான் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தோட்டத் தொழிலாளர்களுக்கு 10 பேர்ச்சஸ் காணி வழங்குவதாகச் சொன்னார். அதற்காக 400 கோடி ரூபாயை ஒதுக்கியிருக்கிறார். ஆகையால், தயவுசெய்து இதனை உடனடியாக வழங்க வேண்டும். நான் ஏற்கெனவே சொன்னதுபோல, இச்செயற்பாட்டை நடைமுறைப்படுத்தும் பொறுப்பை பெருந்தோட்டங்கள் இருக்கின்ற மாவட்டங்களின் மாவட்ட ஒருங்கிணைப்புக் குழுவிடம் வழங்கினால், நிச்சயமாக அதனைச் செய்து முடிக்கலாம் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. கொழும்பு மாவட்டத்தின் ஒருங்கிணைப்புக் குழுத் தலைவராக எனது நண்பரும் பாராளுமன்ற உறுப்பினருமான பிரதீப் உந்துகொட அவர்கள் இருக்கின்றார். நான் அவரிடம் இது தொடர்பில் பேசியிருக்கிறேன். அவருக்கும் மாவட்டச் செயலாளருக்கும் நான் இவ்விடயம் தொடர்பில் கடிதம் எழுதியிருக்கின்றேன்.

ஆகவே, இச்செயற்பாட்டை கொழும்பு மாவட்டத்திலிருந்து ஆரம்பியுங்கள்! அவ்வாறு செய்வதன்மூலம்தான் தோட்டத் தொழிலாளர்களுக்கு - மலையக மக்களுக்கு - பெருந்தோட்ட மக்களுக்கு - நிலம் வழங்குகின்றோம் என்பதை பேச்சளவில் மாத்திரமல்லாது நடைமுறையிலும் காட்ட முடியும். அரசாங்கம் அதைச் செய்துவிட்டு பெயர்வாங்கிக் கொள்ளட்டும்! பரவாயில்லை! அதில் எங்களுக்குப் பிரச்சினையும் கிடையாது. ஆனால், அதைச் செய்ய வேண்டும். அது பேச்சளவில் மாத்திரம் இருக்கக்கூடாது. எல்லா விடயங்களும் பேச்சளவில்தான் இருக்கின்றன. தோட்டத் தொழிலாளர் களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் வழங்கப்பட வேண்டுமெனச் சொல்கின்றார்கள். அதுவும் பேச்சளவில்தான் இருக்கின்றது. தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் நாட்சம்பளம் கிடைப்பதே இல்லை. அதுவும் பேச்சளவில்தான் இருக்கின்றது. தோட்டத் தொழிலாளர்களுக்கு காணி வழங்குகின்ற விடயமும் பேச்சளவில்தான் இருக்கின்றது. எனவே, பேச்சளவில் மாத்திரம் இருக்கின்ற இவ்விடயங் களைச் செயலில் காட்டுமாறு கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The Hon. Gayantha Karunatilleka. You have nine minutes.

[අ.භා. 1.27]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කයටත්, රටටත් බලපාන වැවිලි කර්මාන්තයට සම්බන්ධ වගා දෙකක් ගැන කෙටි කාලයක් තුළ කරුණු කීපයක් කියන්න මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, ලංකාවේ කුරුඳු තමයි ලෝකයේම ගුණාත්මක බවින් ඉහළම කුරුඳු හැටියට පිළිගැනෙන්නේ. නමුත්, මේ වනකොට අපේ රටේ කුරුඳු වගාවේ නිරත වෙලා සිටින, ඊට සම්බන්ධ හැම අංශයක්ම ලොකු අර්බුදයකට මුහුණ දෙනවා. කුරුඳු මිල ගත්තාම අද වෙනකොට කිලෝවක් රුපියල් 2,800ක්, 2,900ක් වාගේ මිලකට යන්නේ. අපේ රටේ කුරුඳු වැඩියෙන්ම මිලට ගත්තේ මෙක්සිකෝව. නමුත්, ඒ රටේ පවතින ආර්ථික අර්බුද නිසා ඔවුන් මිලදී ගන්නා ප්‍රමාණයත් දැන් සීමාවෙලා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

තිබෙනවා. ඒ නිසා හොඳ වෙළෙඳ පොළක් සොයා ගැනීමේ කාර්යය රජයෙන් අපි බලාපොරොත්තු වෙනවා. අද කුරුඳු ගොවීන් එක්ක, කුරුඳු තළන අය එක්ක, කුරුඳු වගාකරුවන් එක්ක, ඒ වාගේම ව්‍යාපාරිකයන් එක්ක, කුරුඳු රට යවන අයත් එක්ක කථා කළත්, ඒ හැම අංශයකම නිරත පිරිස තුළ තිබෙන්නේ ලොකු අදෝනාවක්. අපි දන්නවා, කුරුඳු තළන අයට කුරුඳු විකුණුවාට පස්සේ ලැබෙන මුදලින් තුනෙන් පංගුවකුයි, කිලෝ එකකට තව රුපියල් 50ක් වාගේ මුදලකුයි ගෙවන සිරිතක් තිබෙනවා කියලා. නමුත්, අධික ජීවන බරත් එක්ක ඒ මිනිස්සු අද අන්ත අසරණ වෙලා තිබෙනවා. කුරුඳු වගා කරන වැවිලිකරුවන් එක්ක කථා කළොත් ඔවුන් කියන්නේ, දිනකට කම්කරු ගාස්තුව රුපියල් 2,500ක් විතර ගෙවන්න ඕනෑ, වල් නෙළන්න, කානු කපන්න අක්කරයකට රුපියල් 60,000ක් විතර අය කරනවා, පොහොර මිටියක් රුපියල් 9,000ක්, 10,000ක්, 11,000ක් වාගේ මිලකට ගන්න වුණාම ඔවුන්ට කිසිම ලාභයක් ගන්න බැහැ කියලායි. අපේ දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම කුරුඳු වගා කරන ප්‍රදේශ තමයි, කරන්දෙනිය, කොස්ගොඩ, බලපිටිය, ඇල්පිටිය, මීටියාගොඩ, බටපොල වැනි ප්‍රදේශ. පසුගිය අය වැයේදී ජනාධිපතිතුමා කිව්වා, කරන්දෙනිය මූලික කරගෙන කුරුඳුවලට වෙනම දෙපාර්තමේන්තුවක් ආරම්භ කරනවා කියලා. අපි එදාත් කිව්වා, අදත් කියනවා, දෙපාර්තමේන්තුවක් දැම්මොත් රජයේ යල් පැන ගිය නීති රීති එක්ක තීන්දු- තීරණ ගන්න අමාරුයි, ඒ නිසා තේවලට, පොල්වලට වාගේ කුරුඳුවලටත් අධිකාරියක් පිහිටුවන්න කියලා. ඒක අපි අදත් ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. අද කුරුඳු ව්‍යාපාරිකයන්ට හුඟක් වෙලාවට ලැබෙන්නේ ඉදිරියට දින දාපු චෙක්පත්. එවැනි අර්බුදයකුත් කුරුඳු වගාවේ නිරත ව්‍යාපාරිකයන්ට තිබෙනවා. ඒ නිසා වහාම මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා මම ඉල්ලනවා.

මට කෙටි වෙලාවක් ලැබී තිබෙන නිසා මම කැමැතියි, ඉතිරි විනාඩි කිහිපයේ තේ කර්මාන්තය ගැන කථා කරන්න. ලංකාවේ තේවලට අවුරුදු 150ක දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. එය රටට විදේශ විනිමය උපයන ප්‍රධානම කර්මාන්තයක්. නමුත්, අද වනකොට  තේ කර්මාන්තය ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. තේ කර්මාන්තයෙන් සෘජුවම පවුල් ලක්ෂ 20ක් විතර ජීවත් වෙනවා. සෘජු හා වක්‍ර රැකියාවලින් ලක්ෂ 40ක් විතර ජීවත් වෙනවා. මේ වනකොට තේ කර්මාන්තයේ ප්‍රබලම දායකත්වය සපයන කුඩා තේ වතු හිමියෝ ලක්ෂ 5ක් පමණ තේ වගා කරන දිස්ත්‍රික්කවල ජීවත් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1960-1962 වාගේ කාලවල ලෝකයේම තේ නිෂ්පාදනය අතින් ඉදිරියෙන් සිටියේ අපේ රට. නමුත්, මේ වනකොට ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා. මේ වනකොට ලෝක තේ නිෂ්පාදනයෙන් ශ්‍රී ලංකාව නිපදවන්නේ සියයට 3.9යි. සෙසු රටවල් සියයට 96ක්ම නිපදවනවා. අපට වඩා මෑත කාලයේ තේ වගාවට නැඹුරු වුණු චීනය, ඉන්දියාව, කෙන්යාව, වියට්නාමය වාගේ රටවල් අද ඉතාම ඉහළ මට්ටමකින් තේ නිෂ්පාදනයෙහි නිරත වෙනවා. ඒකට ඒ රටවල ආණ්ඩු උදවු කරලා තිබෙනවා.

නමුත්, අපේ රටේ ආණ්ඩු වැරදි විධියට තීන්දු-තීරණ ගත් නිසා ඒවායේ විපාකය අද තේ නිෂ්පාදකයන්ටත්, වගාකරුවන්ටත් විඳින්න සිදු වෙලා තිබෙනවා. ලෝකයේ වසරකට තේ නිෂ්පාදනය මෙට්රික් ටොන් මිලියන 6,300ක් වෙනවා. නමුත් අපේ රටේ වසරකට තේ නිෂ්පාදනය මෙට්රික් ටොන් මිලියන 340ට තිබුණු එක දැන් මෙට්රික් ටොන් මිලියන 250 දක්වා පල්ලම් බැහැලා තිබෙනවා. 2021දී කිසිම සොයා බැලීමක් නැතිව එක රැයින් රසායනික පොහොර තහනම් කරන්න ගත් උද්ධච්ච, හිතුවක්කාර, අමනෝඥ තීන්දුව නිසා වසර ගණනකට තේ කර්මාන්තය ගොඩ දමන්න බැරි තත්ත්වයක්  ඇති වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, IMF එකෙන් ණය හැටියට ලැබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 330ක් වුණාට, 2020ට සාපේක්ෂව 2021 වසරේ තේ නිෂ්පාදනය අඩුවීමෙන් ඒ හා සමානම ඇමෙරිකානු ඩොලර් මිලියන 330ක මුදලක් අපි අහිමි කරගත්තා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හේතුව නිසා ලංකාවේ අවුරුදු 32කට පෙර තිබුණු තේ නිෂ්පාදනයයි, 2022 වෙන කොට තේ නිෂ්පාදනයයි සමාන වෙලා තිබෙනවා. ඒ කියන්නේ අවුරුදු 32කට ඉස්සෙල්ලා තිබුණු තේ නිෂ්පාදන ප්රමාණයයි, මේ වන කොට තේ නිෂ්පාදන ප්‍රමාණයයි සමානයි. රසායනික පොහොර පිළිබඳව ගත් අමනෝඥ තීන්දුව කුඩා තේ වතු හිමියන්ගේ අස්වැන්නට බරපතළ ලෙස බලපා තිබෙනවා.

අපි වෙනදාට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී ඇමතිතුමාගෙන් ඉල්ලුවේ තේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න කියලායි. නමුත්, අපි දැන් ඉල්ලන්නේ තේ කර්මාන්තය ඉස්සරහට ගෙනියන එක කෙසේ වෙතත් අඩුගණනේ මේ රජය බලයට පත් වෙන කොට, ගෝඨාභය මහත්තයා ජනාධිපති ධුරය භාර ගන්න කොට තිබුණු තත්ත්වයටවත් මේ කර්මාන්තය ගෙනැල්ලා දෙන්න කියලායි. අද වන කොට පොහොර භාවිතය විශාල වශයෙන් අඩුවෙලා තිබෙනවා. අපි තේ නිෂ්පාදනය දියුණු නොකළොත්, තව අවුරුදු 5ක් යන කොට කෙන්යාව අපේ රටේ තේ නිෂ්පාදනයට, අපේ තේ කර්මාන්තයට විශාල අභියෝගයක් වෙනවා. පසුගිය කාලයේ රසායනික පොහොර තහනම ගෙනාපු වෙලාවේ අපි මේ සභාවේදී මේ තත්ත්වය ගැන කියන කොට ඒවා කිසිවක් ගණන් ගන්නේ නැතිව රජය පැත්තෙන් අපට උද්ධච්ච උත්තර තමයි සැපයුවේ. අන්තිමට වුණේ මොකක්ද? පාලකයන්ට ගෙදර යන්න වුණා. ජනාධිපතිලා අගමැතිලා වෙනස් වුණා, ඇමතිකම් වෙනස් වුණා. මේ වාගේ වටිනා වගාවක්, කර්මාන්තයක් අද විනාශ කරලා තිබෙනවා. පොහොර නාඩගමේ ප්රතිඵල ලෙස අමු තේ දළු අස්වැන්න අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කුඩා තේ වතු හිමියන්ගේ ජීවන වියදම සියයට 200කින්, 300කින් වැඩි වෙලා තිබෙනවා. පොහොර මිල අධික නිසා පොහොර දමන්නේ නැහැ. දළුවල ගුණාත්මකභාවය අඩුවෙලා, ප්රමිතිය නැතිවෙලා, නිමි තේවල රසය, බර, පැහැය ඔක්කොම වෙනස් වෙලා, තේ මිල පහත වැටිලා තිබෙනවා. එම නිසා "Ceylon Tea" කියන කීර්ති නාමයටත් තර්ජනයක් ඇවිල්ලා තිබෙනවා. මේ තත්ත්වය නිසා වර්තමානයේදී කර්මාන්තශාලා පවත්වා ගෙන යන්න අමාරු වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම් වැඩිවෙලා තිබෙනවා. විදුලි බිල දරාගන්න බැහැ. බැංකු පොලිය ඉහළ ගිහිල්ලා තිබෙනවා. එහෙත් ආදායම් බදු, කම්කරු වැටුප් හා යන්ත්‍රසූත්‍ර මිල ආදී සියලු වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 200කින්, 300කින් වැඩි වෙලා තිබෙනවා.

තේ කර්මාන්තය ප්රශ්න ගණනාවකයි පවතින්නේ. එකක් තමයි, නිෂ්පාදනය අඩු වීම. නැවත වගාව සියයට එකක, දෙකක වාගේ පහළ අගයක තමයි පවතින්නේ. රජයේ වතු සමාගම් පාලනය කරන වතුවලින් නිසියාකාරව සියයට 20ක්වත් අස්වැන්න ගන්න පුළුවන්කමක් ලැබී නැහැ. ඒ ඉඩම්වල නැවත වගාවන්  සිදු වෙන්නේම නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. සමහර තේ කම්හල් හිමියන් බැංකු වලින්, මූල්‍ය ආයතනවලින්, තේ බ්‍රෝකර් සමාගම්වලින් ගිනි පොලියට ණය අරගෙන තමයි ව්‍යාපාරය අමාරුවෙන් ගෙනියන්නේ. සමහර තේ කම්හල්වල එක එක දහ_ජරාව කලවම් කරනවා. ඒවාට දැඩි නීතිරීති දමන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සමහර වෙලාවට එවැනි දෙයක් වෙලා අහු වුණාම මාස හතරකට කර්මාන්තශාලාව වහලා දමනවා. ඒක කිසිසේත්ම ප්රමාණවත් නැහැ. එවැනි වැඩ කළාම කෙළින්ම බලපත්රය අහෝසි කරන්න ඕනෑ.

රජයේ වතු සමාගම් සතුව වගා කළ හැකි ඉඩම් තිබෙනවා. ඒවා හඳුනාගෙන වගා කරන්න කැමති අයට බදු පදනම මත අක්කර දෙක, අක්කර පහ, අක්කර දහය වශයෙන් ලබා දෙන්න ක්‍රමයක් හදන්න කියලා අපි ගරු ඇමතිතුමාට කියනවා. එහෙම නැත්නම් එම ඉඩම් අක්කර 25, 50, 100 වශයෙන් කැබලි කරලා, තේ වගාවට දක්ෂතාවක් තිබෙන ව්‍යවසායකයන්ට දිගුකාලීන බදු ක්‍රමයකට නැවත වගාවට දීමට පුළුවන් නම්, ඒ තුළින් තේ කර්මාන්තයට යහපත් දෙයක් සිදු වෙයි කියලා මම හිතනවා.

කාල වේලාව අවසාන නිසා අවසාන වශයෙන් මම කාරණයක් කියන්න ඕනෑ. තේ කර්මාන්තයට ප්‍රධාන වශයෙන් සම්බන්ධ ආයතන හතරක් තිබෙනවා. ඒ තමයි ශ්‍රී ලංකා තේ මණ්ඩලය - Sri Lanka Tea Board, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය - TRI - ඒ වාගේම ජාතික වැවිලි කළමනාකරණ ආයතනය. මේ ආයතනවල කාර්යයන් එකකට එකක් සම්බන්ධීකරණය වී නොමැති වීමත් බරපතළ ගැටලුවක් හැටියට මම දකිනවා. මේ ආයතන සියල්ලේම සම්බන්ධීකරණයක් තිබෙන්නට ඕනෑ. එක ආයතනයක් ගන්න තීන්දුව අනෙක් ආයතනයට සම්බන්ධ වෙන්න ඕනෑ.

මට තිබෙන අත්දැකීමකින් මම ඒ කාරණය කියන්නේ. මම මීට වසර කිහිපයකට ඉස්සෙල්ලා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට ක්‍රියා කළා. මම ඒ කාලයේ නිල බලයෙන් තේ මණ්ඩලයේත්, තේ පර්යේෂණ ආයතනයේත්, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේත්, කුඩා තේ වතු අධිකාරියේත් අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයෙක් හැටියට ක්‍රියා කළා. මේ ආයතන හතරම ගන්නා තීන්දු-තීරණවලදී එකකට එකක් සම්බන්ධීකරණයක් තිබුණොත් හොඳයි කියලා මම මතක් කරනවා. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. කථිකයෝ ගණනාවක් කථා කරන්න ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. කුරුඳු ගොවීන්ගේ ප්‍රශ්නයත් බරපතළයි. කුඩා තේ වතු හිමියන් ඇතුළු තේ කර්මාන්තයේ තත්ත්වයත් බරපතළයි. මේකට විසඳුම් හොයන්න වහාම පියවර ගන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. W. D. J. Seneviratne. You have five minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

[අ.භා. 1.36]

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලය තුළ වැදගත් කරුණු කීපයක් කියන්න මම බලාපොරොත්තු වෙනවා.

මම ප්‍රථමයෙන්ම මගේ ප්‍රදේශයට අදාළ තේ කර්මාන්තයට වඩා මේ රටට ප්‍රයෝජනවත් වෙන කාරණයක් ගැන කියන්න ඕනෑ. පසුගිය කාලයේ අපට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි විදේශ විනිමය නැතිකම. අපට විදේශ විනිමය නැති නිසා තමයි අපේ මුළු ආර්ථිකයම කඩාගෙන වැටුණේ. විදේශ විනිමය ලබා ගැනීමට අපි කල්පනා කරන්නේ කොහොමද? "විදේශ ආයෝජකයන් ඇවිල්ලා අපේ රටේ අයෝජනය කරයි. ඒ ආයෝජනයන් ඇවිල්ලා මේ රටේ කර්මාන්ත ඇති කළාම ඒ කර්මාන්තවල නිෂ්පාදන අළෙවි කරලා, නැත්නම් අපනයනය කරලා අපට විදේශ විනිමය ගන්න පුළුවන්" කියලා අපි කල්පනා කරනවා. නමුත් අපි කොච්චර බලාපොරොත්තු වුණත් ආයෝජකයෝ එන්නේ නැහැ. ඒකට ප්‍රධාන වශයෙන් හේතු වෙලා තිබෙන්නේ අපේ රටේ තිබෙන දැඩි කම්කරු නීති. ඒ වාගේම අපේ විදුලි බිල දැක්කාම ආයෝජකයෝ එන්නේ නැහැ. නමුත් අපට විදේශ විනිමය යහමින් සපයා ගන්න පුළුවන් මාර්ග තිබෙනවා. එකක් තමයි මේ රටේ කෘෂි කාර්මික නිෂ්පාදන අපනයනය කිරීම. මොකද, අපේ රට කෘෂි කාර්මික රටක්. ඒක නිසා අපේ රටේ එළවලු සහ පලතුරු යහමින් වවලා ඒවා අපනයනය කිරීමෙන් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපට ලබා ගන්න පුළුවන්. අපි දැනුත් ඒක කරනවා.

අපි එළවලු, පලතුරු යම් යම් රටවලට යවනවා. විශේෂයෙන් මැද පෙරදිග රටවලට, ඒ වාගේම මාලදිවයිනට ඒවා යවනවා. අපි එළවලු යවන රටවල් ගණනාවක් තිබෙනවා. මම ඒ ගැන දිගින් දිගටම කියන්නේ නැහැ. මට විනාඩි හයක් පමණක් තිබෙන නිසා ඒ කාරණය ගැන මට විස්තරාත්මකව කථා කරන්න අමාරුයි. නමුත් මේ තත්ත්වය තේරුම් අරගෙන අපි ඒ ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ. වැඩියෙන් එළවලු වවන්න ඕනෑ. අපි පලතුරු වවලා ටොන් 5,600ක විතර අස්වැන්නක් ලබා ගන්නවා. ඒ වාගේම එළවලු වවලා ටොන් 8,000ක පමණ අස්වැන්නක් ලබා ගන්නවා. ඒවායින් සමහර ඒවා එක්සත් රාජධානිය, ජර්මනිය, නෙදර්ලන්තය වාගේ රටවලට යවනවා; මාලදිවයිනට යවනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
අපි මේ තත්ත්වය දියුණු කර ගත්තොත් අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගන්න පුළුවන්.

අපි පලතුරු යවන රටවල් අරගෙන බැලුවාම චීනයට විශාල පලතුරු ප්‍රමාණයක් අවශ්‍යයි. ඒ අය අන්නාසි ගෙන්වන්නේ මැලේසියාව, තායිලන්තය වැනි රටවලින්. ඒ ගොල්ලන් අලිගැට පේර ගෙන්වන්නේ දකුණු අත්ලාන්තික් රටවලින්. ඒවා විශාල දුරකින් පිහිටි රටවල්. නමුත් චීනය ඒ වාගේ රටවලින් තමයි ඒවා ගෙන්වන්නේ. චීනය අපෙන් කෙසෙල් ගන්නවා. චීනය තමයි අපේ රටෙන් කෙසෙල් ගන්නා ප්‍රධාන රට. අපේ අන්නාසි ඉතා රසවත්. මම හිතනවා, ඉතා රසවත් අන්නාසි තිබෙන්නේ අපේ රටේ කියලා. අපට පුළුවන් නම් ඒ අන්නාසි චීනයට විකුණන්න, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. චීනය අපේ මිත්‍ර රටක්. ඊළඟ පලතුර තමයි අලිගැට පේර. චීනය නොයෙක් රටවලින් අලිගැට පේර ගෙන්වනවා. මම කෙසෙල් ගැනත් සඳහන් කළා. 2020දී ලංකාව කෙසෙල් අපනයනය කිරීමෙන් ඩොලර් මිලියන 16.2ක් උපයා ගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
මම කථා කරන්න පටන් ගත්තා විතරයි නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විනාඩි හයයි ඔබතුමාට වෙන් කර තිබුණේ.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
ඔබතුමා මට විනාඩි හතරක් දීලා කථාව අවසන් කරන්න කියනවා. කරුණාකර මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මම ඔබතුමාට විනාඩි දෙකකට කලින් මතක් කළා. ඇහෙන්න නැතුව ඇති.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
මම කියන්නට ඕනෑ, ලෝකයේ කෙසෙල් අපනයනකරුවන්ගෙන් අපේ රට ඉන්නේ 45 වන ස්ථානයේ බව. ඒ අනුව අපිට පුළුවන්කම තිබෙන්න ඕනෑ, එම කටයුතු තවත් ව්‍යාප්ත කරන්න. ඒ වාගේම අන්නාසි, අලිගැට පේර වැනි ජනප්‍රිය පලතුරු අපනයනයෙන් පවා ඒ ආකාරයට, මම කියපු විධියට ආදායම් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්නට කියලා.

ඊළඟට, අපේ දිස්ත්‍රික්කය ගැනත් මම වචන කීපයක් කථා කරන්නට කැමැතියි. මගේ දිස්ත්‍රික්කය තමයි කුඩා තේ වතු හිමියන් වැඩියෙන්ම ඉන්නා දිස්ත්‍රික්කය වන්නේ. ගාල්ල සහ මාතර වැනි දිස්ත්‍රික්ක සමඟ සංසන්දනය කළාම කුඩා තේ වතු හිමියන් වැඩිපුරම ඉන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ. කුඩා තේ වතු හිමියන්ගේ අද කලදසාව ගැන බැලුවොත්, එය ඉතාම ශෝකජනකයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)
මම අවසන් කරන්නම්.

ඒ නිසා තේ කර්මාන්තය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අපි වැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ. ඒ වාගේම තේ කර්මාන්තයට අවශ්‍ය කරන දේවල් ලබා දෙන්නට ඕනෑ. ඒ අයට සාධාරණ මිලකට පොහොර දෙන්නට ඕනෑ. එහිදී ගුණාත්මක පොහොර ලබා දිය යුතුයි. ඒ පැත්තේ තේ ගොවීන් අතර ලොකු මතයක් තිබෙනවා, තේවල ප්‍රමිතිය අඩුයි කියලා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන සොයා බලා යම් කිසි පියවරක් ගන්න කියලා. ගරු සභාපතිතුමනි, එම ඉල්ලීමත් ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු සභාපතිතුමනි, මම ලොකු වෙලාවක් ගන්නේ නැහැ. කරුණු කීපයක් විතරක් කියන්න මට අවස්ථාව දෙන්න. අපේ සෙනෙවිරත්න මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම කාරණා කිහිපයක් කියන්න කැමැතියි. ඔබතුමා අලිගැට පේර අපනයනය සම්බන්ධයෙන් කථා කළා. අපි hass avacado කියන ප්‍රභේදය තමයි අලුතින් හඳුනා ගෙන තිබෙන්නේ. ඒ අනුව කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ බදුල්ල සහ මහනුවර කියන දිස්ත්‍රික්ක ඉලක්ක කරගෙන ඒ සම්බන්ධයෙන් ලොකු වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. සම්පූර්ණයෙන්ම විදේශ වෙළෙඳ පොළ ඉලක්ක කරගෙනයි එම කටයුත්ත සිදු කරන්නේ. ඕස්ට්‍රේලියාවෙන් මේ සඳහා විශාල ඉල්ලුමක් තිබෙනවා. අපි ඕස්ට්‍රේලියාවෙන් තමයි එම ප්‍රභේදය ගෙනාවේත්. ඉදිරියේදී අපි එම කටයුතු ප්‍රවර්ධනය කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයටත් අපට මෙම ව්‍යාපෘතිය ගෙන එන්න පුළුවන්කම තිබෙනවා. මොකද, මම හිතන විධියට එම පලතුර වගා කිරීම සඳහා එම ප්‍රදේශයේ පවතින දේශගුණය ඉතාම හොඳයි. ඒ වාගේම මම මීට කලිනුත් සඳහන් කළා වාගේම කෙසෙල්වලට ඩුබායිවල වෙළෙඳ පොළ දැනටමත් අපට තිබෙනවා. ඊට අමතරව අපි තව වෙළෙඳ පොළවල් සොයා ගෙන යනවා. ඇඹුල් කෙසෙල් අපනයනය තමයි අපි මූලිකවම සිදු කරන්නේ. ඒ වාගේම ඩෝල් සමාගම හරහා අනෙක් කෙසෙල් වර්ග අපනයනයත් මේ වනවිට සිද්ධ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)
මිනිත්තු දහයයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
නැහැ, ඔබතුමියට මිනිත්තු හයක කාලයක් තිබෙන්නේ.

[අ.භා. 1.43]

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මම ඉස්සෙල්ලාම අපේ අලුත් වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාට සුබ පතනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පළපුරුදු ඇමතිවරයෙක්. ඒ වාගේම ඔබතුමා භාර ගන්නා කටයුතු හැම දාම හරියාකරව කරනවා. ඒ නිසා ඒ විශ්වාසය තබා ගෙන මේ රටේ අනාගතය තීරණය කරන ඉතාම වැදගත් කර්මාන්තයක් වන තේ වගාව සම්බන්ධයෙන් කටයුතු කරන්න කියමින් මා නැවත වතාවක් ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. මම දන්නවා, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් එච්චරම පළපුරුද්දක් නැති බව.

මොකද, ඔබතුමා සිටින පැත්තේ ඒ තරම් තේ කර්මාන්තය නැති නිසා. හැබැයි, ඔබතුමා ඒක හරියට දැන ගෙන කරන බව මම දන්නවා. පසුගිය කාලයේ තේ කර්මාන්තය තුළ පොඩි පොඩි ප්‍රශ්න ඇති වුණා. ඒ ගැන අපි ඔබතුමාව වෙනම දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ කථාව පටන් ගන්න ඉස්සෙල්ලා මම විනාඩි දෙකක් ගන්නවා, එක් කාරණයක් සඳහන් කිරීමට. සෞඛ්‍ය අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමා අද උදේ මේ ගරු සභාවේදී ප්‍රකාශයක් කර තිබෙනවා, මම මේ ගරු සභාවේ කළ අදහස් දැක්වීමක් සම්බන්ධයෙන්. ඒ කියන්නේ සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සම්බන්ධයෙන්. අපි දන්නවා, සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට එතුමා ඇත්තටම වෛද්‍යවරුන්ගේ පැත්ත අරගෙන, වෛද්‍යවරුන් ආරක්ෂා කරගෙන කටයුතු කරන්නට ඕනෑ බව. හැබැයි, මම නොකියපු දේකුත් එතුමා කියා තිබෙනවා, රත්නපුර රෝහලේ අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන්. මම ඒ අධ්‍යක්ෂවරයා ගැන කිව්වේ නැහැ. ඒ නිසා එතුමා එසේ ප්‍රකාශ කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම මම කියපු කරුණු මත මම ඒ විධියටම ඉන්නවා. මම කියනවා, ඕනෑම කෙනෙකුට රත්නපුර ප්‍රදේශයට, රත්නපුර ශික්ෂණ රෝහල පැත්තට ගිහිල්ලා ඒ සම්බන්ධව ස්වාධීනව හොයා බලන්න කියලා. මොකද, අපි පෙනී සිටින්නේ අහිංසක දරුවෝ වෙනුවෙන්. අවුරුදු පහක් තිස්සේ බොහොම අමාරුවෙන් ඉගෙන ගෙන වෛද්‍යවරයෙක් වෙන එක ගැන සිහින දැකපු දරුවන්ට එම අවස්ථාව ලබා දීම මඟ හරින වෛද්‍යවරුන් ගැනයි මම මෙතැනදී කිව්වේ. මම ඒ වෙනුවෙන් නැවතත් පෙනී සිටිනවා කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමා යටතේ තිබෙන කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ මේ රටට ඉතා වැදගත් වෙන අමාත්‍යාංශ වාගේම බරපතළ වගකීමක් තිබෙන අමාත්‍යාංශ. තේ, පොල්, රබර් කියන කර්මාන්ත, මේ රටට විදේශ විනිමය ලබා දෙන ප්‍රධානතම මාර්ගයක් හැටියට කටයුතු කරපු කාලයක් තිබුණා. ඉතිහාසයේ අපට ඇහලුම් තිබුණේ නැහැ, විදෙස්ගත ශ්‍රමිකයෝ හිටියේ නැහැ. සංචාරක ව්‍යාපාරය ගැන ඩොලර්වලින් කථා කළේ නැහැ. ඩොලර්වලින් ණය ගන්නකොට, රටේ සංවර්ධනයට කියලා නොයෙකුත් විධියට ඩොලර්වලින් ලෝකයට ණය වෙනකොට කිසිම කෙනෙක් කල්පනා කළේ නැහැ, මේ රටේ ඩොලර් වැඩි කර ගන්නේ කොහොමද කියලා.

ගරු ඇමතිතුමනි, මම එක ඉල්ලීමක් කරනවා. මම අහගෙන හිටියා හිටපු අමාත්‍යවරයෙක් වන ගයන්ත කරුණාතිලක මැතිතුමා පොහොර සම්බන්ධයෙන් කියපු කාරණා ගැන. ගරු සභාපතිතුමනි, අද මුළු රටේම කුඩා තේ වතු හිමියන් ලක්ෂ පහක් විතර ඉන්නවා. ඒ ගොල්ලන්ගෙන් කෙළින්ම යැපෙන ප්‍රමාණය, සමස්ත ජනගහනයෙන් සියයට 10ක් විතර වෙනවා. ඒ කියන්නේ, ලක්ෂ 25ක් විතර ඉන්නවා. ඒ ගොල්ලෝ කවදාවත් රටට බරක් වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, ඒ ගොල්ලෝ මේ රටට ඩොලර් ගෙනෙන කර්මාන්තයක් කරනවා මිසක් වෙන කිසිම දෙයක් කරන්න විධියක් නැහැ. මොකද, ඒ ගොල්ලෝ ඉතා අමාරුවෙන් ඒ කටයුත්තේ යෙදිලා ඉන්න නිසා. නමුත් පසුගිය කාලයේ පොහොර සම්බන්ධයෙන් ගත් මහ මෝඩ තීරණය නිසාත්, වල් නාශක සම්බන්ධයෙන් ගත් තීරණය නිසාත් ඒ ගොල්ලන්ට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ නිසා පසුගිය කාලයේ පොහොර මිටිය රුපියල් 35,000ට ගත්ත වෙලාවල් තිබුණා. ඒ වාගේම රුපියල් 27,000ට ගත්ත වෙලාවලුත් තිබුණා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. කුඩා තේ වතු අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරින් ගොඩක් ඉන්නවා. ඒ අය හරහා පොහොර භාවිතය පිළිබඳව කුඩා තේ වතු හිමියන්ව දැනුවත් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මොකද, දැන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ලබා දීපු සහනාධාර ඔක්කෝම නවත්වලා, කාබනික පොහොර කිලෝ 2ක් සහ පැළයක් ලබා දෙනවා. ඒවා වෙනස් වෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් කුඩා තේ වතු හිමියෙකුට අක්කර භාගයක්, අක්කරයක් තිබෙන්න පුළුවන්. ඒක ඔවුන් ගොඩක් අපහසුතාවට පත්වෙන ප්‍රධානතම කාරණයක්. හොඳ ප්‍රමිතියකින් යුතු තේ කොළ නිෂ්පාදනය කරන්න නම්, ගුණාත්මකභාවයකින් යුතුව තේ දල්ල නිෂ්පාදනය වෙන්න ඕනෑ. මට ඒ ගැන ගොඩක් කරුණු කථා කරන්න තිබෙනවා. හැබැයි, වෙලාව නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් වීවලට විතරක් නොවෙයි මේ වෙලාවේදී එළවලු සහ පලතුරු ගොවියාටත් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මොකද, අපි මෙතැන ප්‍රධාන දේවල් ගැන කථා කරනකොට වට්ටක්කා වගාවේ යෙදිලා ඉන්න මිනිස්සු වට්ටක්කා විසි කරන තත්ත්වයට අද පත්වෙලා ඉන්නවා. අඹ වවන ගොවියා අඹ ටික විසි කරනවා. අඩු ගණනේ මොනවා හරි ක්‍රමයකට, දීර්ඝ කාලීනව ඒවා පිටරට යැවීමේ වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න. පිටරටකට ගිය වෙලාවකදී අපේ මන්ත්‍රීවරියන් සියලු දෙනාටම දකින්න ලැබුණා, වට්ටක්කා ඇටවලින් හදලා තිබෙන, මිල අධික -ඇඟට හොඳ- පෝෂ්‍යදායී ආහාරයක්. ඒ වාගේ දේවල් ඕනෑ තරම් කරන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. අපට ඒකට නිලධාරින්ගේ සහාය ලබා ගන්න පුළුවන්. ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිලධාරින් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)
අපි බලාපොරොත්තු වෙනවා, දක්ෂ ඇමතිවරයෙක් හැටියට, කැපවීමෙන් වැඩ කරන ඇමතිවරයෙක් හැටියට, හොඳ, කෙළින් -සෘජුව- වැඩ කරන ඇමතිවරයෙක් හැටියට ඔබතුමා ඒ අයවත් සහභාගී කරවාගෙන ෂේප් න්‍යාය නැතුව ඒ කටයුත්තට අතගහයි කියලා. ගරු සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් වැඩිපුර ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අංගජන් රාමනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.50]

**ගරු අංගජන් රාමනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு அங்கஜன் இராமநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Angajan Ramanathan - Deputy Chairman of Committees)
கௌரவ தவிசாளர் அவர்களே, கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் விவசாயத் துறையோடு சேர்த்து புதிதாக பெருந்தோட்டத்துறையையும்

[ගරු අංගජන් රාමනාදන් මහතා]

பொறுப்பேற்று இருக்கின்றார். அதற்காக அவருக்கு என்னுடைய பாராட்டுக்களை இந்த நேரத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

மனித உடலின் இயக்கத்துக்கு குருதி எவ்வளவு முக்கியமோ, இதயம் எவ்வளவு முக்கியமோ அதுபோன்றுதான் இந்த நாட்டின் பொருளாதாரத்துக்கு விவசாயத்துறை முக்கியமானது. இந்த நாட்டின் பொருளாதார முன்னேற் றத்துக்கும் சரி, உணவுப் பாதுகாப்புக்கும் சரி, இதயம் போன்று செயற்படுகின்ற விவசாயிகளின் உழைப்பு முக்கியமானது. குறிப்பாக, விவசாயிகளுக்குப் போதியளவு உரம் கிடைக் காமையே 2022ஆம் ஆண்டு எமது நாடு பொருளாதார நெருக்கடியைச் சந்திப்பதற்கு முக்கிய காரணமாகும்.

கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள் கமத்தொழில் அமைச்சைப் பொறுப்பேற்ற பின்னர், விவசாயிகளின் பெருமளவான பிரச்சினைகளை நிவர்த்தி செய்து, அவர்களை முன்னேற்றுவதற்கான வழிவகைகளைச் செய்துகொண்டு இருக்கின்றார். அதற்காக நான் அவருக்கு இந்த நேரத்தில் மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். 2018இல் தற்போதைய ஜனாதிபதி அவர்கள் பிரதமராக இருந்தபோது, கௌரவ மஹிந்த அமரவீர அவர்கள்தான் கமத்தொழில் அமைச்சராக இருந்தார். அப்பொழுது கமத்தொழில் பிரதி அமைச்சராக இருந்து எனக்குச் சேவை செய்வதற்கு வாய்ப்புக் கிடைத்தது. அந்தக் காலத்தில் விவசாயத்துறையில் பாரியளவு அறுவடை கிடைத்தது. அதேபோன்று, எதிர்வரும் காலத்திலும் பாரியளவு அறுவடையை அவர் பெற்றுக்கொடுப்பார் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது.

நான் இந்த நேரத்தில் கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு விடயத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். யாழ்ப்பாண மக்கள் நிலத்தடி நீரை நம்பியிருப்பவர்கள். அங்கு ஆறுகள் இல்லை. எங்களுடைய மக்களுக்கு நிலத்தடி நீரைப் பெறுவதற்கு water pumps தேவையாக இருக்கின்றது. எங்களுடைய மக்கள் இரண்டு வகையான water pumpsஐப் பாவிக்கின்றார்கள். ஒன்று, electric water pump. மற்றையது, kerosene water pump. 2022ஆம் ஆண்டு ஏற்பட்ட பொருளாதார நெருக்கடிக்குப் பின்னர், kerosene water pumpsஐப் பயன்படுத்துவது குறைந்து விட்டது. ஏனெனில், அதனைப் பயன்படுத்துவதால் நட்டம் ஏற்படுகின்றது.

காரணம், cost of production அதிகரித்திருக்கின்றது. அதாவது, இன்றைக்கு எரிபொருளின் விலை 3 மடங்கால் அதிகரித்திருக்கின்றது. இன்று electricity கட்டணம் அதிகரித்திருந்தாலும், வடக்கு மாகாணத்தில் மட்டுமல்ல, நாடு முழுவதும் புதிதாக electricity connection கொடுத்துக் கொண்டுதான் இருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் யாழ்ப்பாணம் வந்தபோது நான் இது சம்பந்தமாக உங்களுடன் பேசினேன். அதுமாத்திரமன்றி, நேற்று முன்தினம் இடம்பெற்ற Ministerial Consultative Committee கூட்டத்திலும் நான் இது சம்பந்தமாகக் கதைத்தேன். இது தொடர்பில் அமைச்சரவைப் பத்திரமென் றைச் சமர்ப்பித்து, நியாயமான தீர்வொன்றை பெற்றுத் தருவதாக நீங்கள் சொல்லியிருந்தீர்கள். இது முக்கியமான ஒரு விடயமாகும். ஏனென்றால், இன்றைக்கு எங்களுடைய விவசாயிகள்தான் நாட்டின் பொருளாதாரத்தையும் உணவுப் பாதுகாப்பையும் பேணிக்கொண்டு இருக்கின்றார்கள்.

இன்றைக்கு Ceylon Electricity Boardஆனது, domestic rate, religious and charitable institutions' rate, industrial rate, hotel rate ஆகியவற்றைக் குறைவாகப் பேணுகின்ற அதேநேரம், agriculture rateஐ அதிகரித்திருக்கின்றது. கடந்த பெப்ருவரி மாதம் agriculture rateஆனது 1,500 ரூபாயிலிருந்து 1,600 ரூபாய்வரை உயர்த்தப்பட்டது. அதன்பின்னர், யூலை மாதத்தில் அது 1,000 ரூபாயாகக் குறைக்கப்பட்டு, இப்பொழுது 1,120 ரூபாய் வீதம் charge பண்ணப்படுகின்றது.

தற்பொழுது domestic rateக்கு 180 ரூபாயும், industrial rateக்கு 340 ரூபாயும், general purpose rateக்கு 750 ரூபாயும் அறவிடப்படுகின்றது. இன்றைக்கு விவசாயிகளிடமிருந்து அதிகளவு rateஐ charge பண்ணுவதனூடாக என்ன சொல்ல வருகிறார்கள்? இன்றைக்கு இந்த நாட்டின் பொருளாதாரத்தை hotelதுறை காப்பாற்றுகின்றதா அல்லது industrialதுறை காப்பாற்றுகின்றதா என்றால் இல்லை! விவசாயத்துறைதான் நாட்டின் பொருளாதாரத்தைக் காப்பாற்றுகின்றது. இன்றைக்கு energy charge என்று சொல்லி, per unitக்கான கட்டணம்கூட, domestic rate, industrial rate, hotel rate எல்லாவற்றையும்விட, agriculture rateக்கே அதிகமாக அறவிடப்படுகின்றது. அதாவது, agriculture rateக்கு ஒரு unitக்கு 38ரூபாய் வீதம் அறவிடப்படுகின்ற அதேநேரம், hotel rateக்கு 20 ரூபாய் வீதமே அறவிடப்படுகின்றது. இது எந்த விதத்தில் நியாயமென நான் கேட்கின்றேன். இது சம்பந்தமாக அமைச்சரவைப் பத்திரமொன்றைச் சமர்ப்பித்து, agriculture rateக்குரிய கட்டணத்தைக் குறைத்துத் தருவதாக கௌரவ அமைச்சர் அவர்கள் எங்களுக்கு உத்தரவாதம் அளித்திருக்கின்றார்.

இன்றைக்கு எங்களுடைய யாழ்ப்பாணத்திலுள்ள விவசாயிகளில் அதிகமானவர்கள் நெற்செய்கையில் ஈடுபடுபவர்கள் அல்லர். மாறாக, மேட்டு நிலப் பயிர்ச்செய்கையிலேயே ஈடுபடுகின்றார்கள். மேட்டு நிலப் பயிர்ச்செய்கையில் ஈடுபடுபவர்களுக்கு எந்தவிதமான ஊக் கமும் அளிக்கப்படாத நிலைமையே இப்போது இருக்கின்றது. ஊக்குவிப்புத் தொகை, உர மானியம் போன்றன நெற்செய் கையில் ஈடுபடுபவர்களுக்கு வழங்கப்படுகின்றதே ஒழிய, மேட்டு நிலப் பயிர்ச்செய்கையில் ஈடுபடுபவர்களுக்கு வழங்கப்படுவதில்லை. எனவே, எங்களுடைய பிரதேசத்தில் மரக்கறி, பழவகை போன்ற பயிர்ச்செய்கையில் ஈடுபடும் விவசாயிகளை இன்னும் அதிகமாக ஊக்கமளிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இப்பொழுது அதிகரிக்கப்பட்டிருக்கின்ற 'வற்' வரிக்குள் விவசாயத்துக்குப் பயன்படுத்துகின்ற இரசாயனப் பதார்த்தங்கள், இயந்திரங்கள் என்பனவும் உள்வாங்கப்பட்டிருப்பதாகச் சொல்லப் படுகின்றது. விவசாயிகளுக்கு இருக்கின்ற சந்தேகம் என்னவென்றால், யூரியா மற்றும் ஏனைய fertilizersக்கும் 18 சதவீத 'வற்' வரி விதிக்கப்படுமா? என்பதுதான். அது பற்றி கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்துவார் என்று நான் நம்புகின்றேன்.

இன்னும் இரண்டு முக்கியமான விஷயங்களை நான் இங்கு சொல்லவேண்டி இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பெருந்தோட்டக் கைத்தொழிலுக்கும் பொறுப்பான அமைச்சராக இருக்கின்றீர்கள். இன்றைக்கு வடக்குக்கான புதிய Coconut Triangleஆக யாழ்ப்பாண மாவட்டம், கிளிநொச்சி மாவட்டம், மன்னார் மாவட்டம் என்பன அறிவிக்கப்பட்டிருக்கின்றது. இது பாராட்டத்தக்கது. இன்றைக்கு எங்களுடைய மாவட்டத்தில் விளைகின்ற தேங்காய்களை குருநாகல் மாவட்டத்துக்குக் கொண்டுபோய் பெறுமதி சேர்க்கப்படுகின்றது. கிட்டத்தட்ட 20 இலட்சம் தென்னை மரங்கள் எங்களுடைய பிரதேசங்களில் இருக்

கின்றன. அங்கு உற்பத்தி செய்யப்படுகின்ற தேங்காய்களை எங்களுடைய பிரதேசத்திலேயே பெறுமதி சேர்ப்பதற்கான வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்ற வேண்டுகோளை நான் விடுக்கின்றேன். பனை வளம் என்பது எங்களுடைய வாழ்வாதாரத்தின் அடிப்படையாகும். அதற்கும் நீங்களே பொறுப்பாக இருக்கின்றீர்கள். அது சார்ந்தும் நீங்கள் அதிக அக்கறை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், ஒரு காலத்தில் - 1983இல் - கிட்டத்தட்ட 11 மில்லியனாக இருந்த பனை மரங்கள் இப்போது 9 மில்லியனாகக் குறைந்திருக்கின்றது. அதேநேரம், 1976இல் கிட்டத்தட்ட 88,000 பேர் பனை சார்ந்த தொழிலில் ஈடுபட்டார்கள். இப்போது, அது 8,000 ஆகக் குறைந்திருக் கின்றது. அதேபோல், அன்று பனை வளத்தின்மூலம் கிட்டத்தட்ட 70,000 பேர் வாழ்வாதாரத்தை நம்பியிருந்தார்கள். இப்போது அது 35,000ஆகக் குறைந்திருக்கின்றது. ஆகவே, இது சார்ந்தும் கௌரவ அமைச்சர் அவர்கள் இன்னும் அதிக அக்கறை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கடைசியாக ஒரேயொரு விடயத்தைச் சொல்லி முடிக்கின் றேன். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் நல்லிணக்கம் சார்ந்த பாரிய வேலைத்திட்டங்களை முன்னெடுக்க இருக்கின்றார். கௌரவ அமைச்சர் அவர்களே, இதில் உங்களுக்கும் மிக முக்கிய பங்கு இருக்கின்றதென நான் நினைக்கின்றேன். விவசாயம் சார்ந்த எங்களுடைய மக்களின் பிரச்சினைகளை நீங்கள் நேர்மையாகத் தீர்த்து வைப்பீர்களாக இருந்தால், இதைவிடப் பெரிய நல்லிணக்கம் தேவையில்லை. அதன்மூலம் நீங்கள் எங்களுடைய மக்களின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு மிகப் பெரிய தூணாக இருப்பீர்கள் என்பதைச் சொல்லிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු වී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
පැය භාගයකින් කාලය දීර්ඝ කළා නේ. ඒක හින්දා මට මිනිත්තු 8ක් දෙන්න, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට මිනිත්තු 6යි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[பி.ப. 1.57]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
கௌரவ தவிசாளர் அவர்களே, இன்று பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு, கமத்தொழில் அமைச்சு ஆகிய இரண்டு அமைச்சுக்களின் குழுநிலை விவாதம் நடைபெறுகின்றது. நான் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு தொடர்பில் முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, பெருந்தோட்டங்களில் பயிர்ச்செய் கையைக் குறைத்து, நல்ல qualityஆன teaஐ உற்பத்தி செய்து, வருமானத்தை அதிகரிக்கின்ற வகையில் அவற்றை அதிக விலைக்கு விற்பனை செய்வதற்குரிய நடவடிக்கைகளைத்தான் இப்பொழுது கம்பனிகள் எடுத்து வருகின்றன. அதன் காரணமாக, இப்போது பெருந்தோட்டங்களில் இருக்கின்ற பெரும்பாலான காணிகளில் தேயிலை உற்பத்தியை மறைமுகமாகத் தடைசெய்வதற்கான நடவடிக்கைகள் எடுக்கப் பட்டு வருகின்றன.

இப்பொழுது, அங்குள்ள பல காணிகள் காடாக மாறிவருவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக் கின்றது. பெருந்தோட்டக் காணிகளில் தேயிலைப் பயிர்ச் செய்கையைக் குறைத்து, தரமான தேயிலையை உற்பத்தி செய்து, அவற்றை அதிக விலைக்கு விற்பதன்மூலம் கம்பனிகள் இலாபத்தை ஈட்டுமே தவிர, தொழிலாளர்களுக்கு இலாபம் கிடைப்பதற்கான வாய்ப்பு குறைவாகவே இருக்கும். கம்பனிகள் இந்தச் செயற்பாட்டைத் திட்டமிட்டுச் செய்கின்ற காரணத்தால், ஒரு காலத்தில் தேயிலை உற்பத்தித் தொழில் இல்லாமல் போய்விடும் என்பதை நான் இந்த இடத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன். கம்பனிகள் இச்செயற்பாட் டுக்காக தொழிலாளர்களைக் குறைக்கின்றன; factoriesஐக் குறைக்கின்றன; துரைமாரைக் குறைக்கின்றன. இவ்வாறு செய்வதால் cost of productionஐக் குறைத்து, இலாபத்தை அதிகரிக்க முடியுமென்று கம்பனிகள் நினைக்கின்றன. இச்செயற்பாட்டை கம்பனிகள் தவிர்க்க வேண்டுமென நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இம்முறை வரவு செலவுத்திட்டத்தில் மொத்த நிதி ஒதுக்கீட்டில் 0.3 சதவீதம்தான் பொருந்தோட்டக் கைத்தொழில் அமைச்சுக்கு ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. நேற்றைய தினம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டக் கம்பனிகளின் CEOsஐ அழைத்துப் பேசியிருக்கிறார். இன்று பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் குழுநிலை விவாதம் பாராளுமன்றத்தில் இடம்பெறுமென்று ஜனாதிபதிக்கு நன்றாகவே தெரியும்! அதற்கு முன்னர், தான் ஒரு பதிலைச் சொல்ல வேண்டும் என்பதற்காகவே அவர் நேற்று பெருந்தோட்டக் கம்பனிகளின் CEOsஐ அழைத்துப் பேசியிருக்கின்றார். அதில் எந்தவிதமான தப்பும் இல்லை. ஆனால், இதனை முன்கூட்டியே செய்திருக்கலாம் அல்லது ஏனையோருடன் கலந்துபேசி செய்திருக்கலாம். இங்கு அவருடைய ஆலோசகர் ஒருவர்கூட இருக்கின்றார். அவருடனாவது கலந்துபேசியிருக்கலாம். அதையும் அவர் செய்யவில்லை. இது ஒரு நாடகமாக இருக்கக்கூடாது.

பெருந்தோட்டத் தொழிலாளர்களுக்குக் கட்டாயம் உரிய சம்பளம் கிடைக்க வேண்டும். தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் கொடுக்க வேண்டுமென்று சொன்னது யார்? தொழிற்சங்கங்களா, மாண்புமிகு ஜனாதிபதியா, பெருந்தோட்டக் கம்பனிகளா? என்பதை எங்களுக்குத் தெரியப்படுத்த வேண்டும். ஏனென்றால், நாங்களும் பெருந்தோட்டத்துறையின் பங்குதாரர்கள். ஆதலால், தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் வழங்க வேண்டுமென்பதை நீங்கள் எந்த அடிப்படையில் கொண்டுவந்தீர்கள் என்பது எங்களுக்கும் தெரிய வேண்டும். இப்பொழுது தோட்டத் தொழிலாளர் களுக்கு 2,350 ரூபாய் நாட்சம்பளம் கொடுக்க வேண்டுமென்று University of Peradeniya சொல்கின்றது. ஆனால், நீங்கள் 1,700 ரூபாய் வழங்க வேண்டுமென்று சொல்கின்றீர்கள். இதை எந்த அடிப்படையில் கொண்டுவந்தீர்கள் என்பதை மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சொல்ல வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

[ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා]

இன்று கென்யாவில் ஒரு ஹெக்டெயாரில் 8,000-10,000 கிலோகிராம் தேயிலைக் கொழுந்து பறிக்கப்படுகின்றது. ஆனால், எங்களுடைய நாட்டில் ஒரு ஹெக்டெயாரில் 800-1,000 கிலோகிராம் தேயிலைக் கொழுந்துதான் பறிக்கப்படுகின்றது. இது எமது நாட்டில் தேயிலை உற்பத்தி வீழ்ச்சியடைந்திருப்பதைக் காட்டுகின்றது. தேயிலை உற்பத்தி வீழ்ச்சியடையும்போது, அது சார்ந்த மக்களும் வீழ்ச்சியடைவார்கள். அதனால் அங்கு சமுதாயப் பிரச்சினை ஏற்படும் என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, நவீன முறைகளைப் பயன்படுத்தி விவசாயத்தை மேற்கொண்டு, உற்பத்திகளை அதிகரிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். மேலும், நீங்கள் கிருமிநாசினி, உரம், machine போன்றவற்றுக்கும் 'வற்' வரியை அறவிட்டால், மீண்டும் விவசாயிகள் பொருளாதாரத்தில் வீழ்ச்சியடையக் கூடிய சூழ்நிலை ஏற்படும். ஆகையால், அதனை நீங்கள் தவிர்த்துக்கொள்ள வேண்டுமென இந்த நேரத்தில் தெரிவித்துக்கொள்வதோடு, ஊடுபயிர்களை செய்கைபண்ண வேண்டுமெனவும் முன்மொழிகின்றேன்.

Sir, I take this opportunity to thank His Excellency Gopal Baglay, the outgoing High Commissioner of India to Sri Lanka. He rendered a great service to this country. So, we must extend our gratitude and thanks to him. During the COVID-19 pandemic and in crucial times of our economy, he recommended Sri Lanka to the Indian Government for them to extend aid worth US Dollars 4 billion through the Indian Credit Line for us to buy food and other items. He is now going to Australia as the High Commissioner of India. Again, we thank His Excellency Gopal Baglay on behalf of the people of Indian origin and all the people of Sri Lanka.

Thank you.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා යටතේ තිබෙන මේ විෂයයන් දෙකම පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ දෙපාර්ශවයේම මන්ත්‍රීවරුන් දැඩි ඕනෑකමකින් කථා කරන විෂයයන් දෙකක්. අද උදේ වරුවේත් සභාවේ කාලය නාස්ති කළා. දැන් තවත් විනාඩි 60ක් වැඩිපුර ගත්තා නම්, හැම කථිකයාටම විනාඩි 2 ගණනේ එකතු වෙනවා. මේක අන්තිම අසාධාරණයි. මේ විෂයයන් දෙකම ඉතා වැදගත් විෂයයන්. වැඩිපුර පැයක් ගත්තා නම්, කථිකයෙකුට විනාඩි 2ක් බැගින් එකතු කරගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, සභානායකතුමා ආවාට පසුව ඒ කාරණය එතුමාගේ අවධානයට යොමු කරන්නම්.

මීළඟට, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.03]

**ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත කියන අංශ දෙක එකතු වෙන්න ඕනෑ අංශ දෙකක්. ඇත්තටම මම ඉතා සන්තෝෂ වෙනවා කාලයකට පස්සේ - කලින් එහෙම තිබුණාද දන්නේ නැහැ - අතිගරු ජනාධිපතිතුමා අපේ හිතවත් මිත්‍රයාට ඒක එකතු කරලා දීලා තිබෙන එක ගැන. ඒක ඉතා හොඳ අදහසක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒකෙන් මේ රටට විශාල ප්‍රයෝජනයක් අරගෙන දෙයි කියලා මම හිතනවා.

කාලය සීමිත නිසා මම ලොකු දෙයක් කියන්න යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ප්‍රධාන වශයෙන් පොල් ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නයක් ගැන ඔබතුමාට දැනුම් දෙන්න කැමැතියි. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් පොල් කර්මාන්තයේ තිබෙන ප්‍රාථමික ක්‍රියාවලිය තමයි පොල් තෙල් නිෂ්පාදනය. දැන් ප්‍රාථමික නිෂ්පාදකයෝත් විශාල ලෙස මුදල් වියදම් කරලා තාක්ෂණයෙන් ඉහළ යන්ත්‍ර සූත්‍ර සවි කරලා හොඳ වැඩක් කරගෙන යනවා. සාමාන්‍යයෙන් පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තශාලා 2,000ක් විතර ලංකාවේ තිබෙනවා. හැබැයි මේ වෙනකොට ඉන් 1,000ක් විතර වසා දමා තිබෙනවා. ඒකට හේතුව මේකයි. ව්‍යාපාරිකයන් 6දෙනෙක් විතර RBD කියලා තවත් තෙලක් ලංකාවට ගෙන්වනවා. ඒ, පොල් තෙල්ම කියලා කියනවා. මම දන්නේ නැහැ මොකක්ද කියලා. ඒ නිසා පොල් තෙල් නිෂ්පාදනය කරන අයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, අර ගොල්ලන්ගේ තෙල්වල මිල අඩුයි. ලංකාවේ පොල් අරගෙන නිෂ්පාදනය කරන තෙල්වල මිල වැඩියි. ඉස්සර ඒ සඳහා බදු මුදලක් තිබුණා, කිලෝ එකට රුපියල් 350ක. ඒක දැන් රුපියල් 150 දක්වා අඩු කරලා තිබෙනවා. ඒ නිසා මේ අයට විශාල වාසියක් අත්වෙලා තිබෙනවා. එතකොට මේ අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය ආනයන මත රැඳීමද? ලංකාවේ තිබෙන ප්‍රාථමික කර්මාන්තයක් වුණත් ආනයන මත යැපෙනවාද, එහෙමත් නැත්නම් මේ පිළිබඳව තමුන්නාන්සේලා කථා කරලා පොල් තෙල් නිෂ්පාදකයන් නැවත සැරයක් පරණ තැනට ගෙනෙනවාද?

ගරු සභාපතිතුමනි, ලංකාවේ වාර්ෂික පොල්තෙල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 240,000ක් විතර වෙනවා. ඒ ප්‍රමාණය ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. නමුත් මේ වෙනකොට, ජනවාරි 23වන දා ඉඳලා අප්‍රේල් 30වන දා දක්වා වන කෙටි කාලය ඇතුළත ලංකාවට ගෙන්වා තිබෙනවා RBD පොල් තෙල් කිලෝ ලක්ෂ 177ක්. ඒ සඳහා මිලියන 7,800ක විතර විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. මේ පිළිබඳව කල්පනා කරලා බලන්න. තමුන්නාන්සේ යටතේ තිබෙන කිසිම ආයතනයක්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පවා කිසිම සහයෝගයක් දක්වන්නේ නැහැ, මේ කටයුතුවලට. පසුගිය කාලයේ බද්ද රුපියල් 50ක් හෝ 25ක් වැඩි කර ගන්න ගියා, ආනයනික RBD තෙල්වලට. ඒ අවස්ථාවේ දී මුදල් අමාත්‍යාංශයට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යන්න තරම් ඒ අය බලසම්පන්න වුණා. ලංකාවට සීනි ගෙන්වනකොට

කටයුතු කළේ කොහොමද? මිල අඩු කරනකොට මේ පැත්තෙන් stocks තියාගෙන, අවශ්‍ය වෙලාවට ඇතුළට ගෙනෙකොට ඔය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවක් තිබුණේ නැහැ. ලංකාවේ නිෂ්පාදන ආරක්ෂා කරන්න කටයුතු කරනකොට විවිධ කූට ව්‍යාපාරිකයන් ක්‍රියා කරන ආකාරය ගැන ඔබතුමාට බලන්න සිදු වෙනවා.

මොකද, මේ පිළිබඳව විවිධ මත ඉදිරිපත් වුණත් මේ කර්මාන්තයෙන් ග්‍රාමීය ජනතාව විශාල පිරිසක් ජීවත් වන බවත් මතක තබා ගත යුතුයි. පොල් ආශ්‍රිත කර්මාන්ත බහුල ප්‍රදේශ වන කුරුණෑගල සහ පුත්තලම තමයි මා නියෝජනය කරන්නේ. ඒ ප්‍රදේශවල ජනතාවට මේ ප්‍රශ්නය බරපතළ විධියට බලපානවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා crude oil ගෙන්වන බව. Crude oil ගෙන්වන්නේ, ප්‍රතිඅපනයනයට කියලායි. ප්‍රතිඅපනයනය කිව්වාට එය කොහොමද කෙරෙන්නේ කියලා කවුරුවත් සොයා බලලා නැහැ. අපට ලැබෙන තොරතුරු අනුව හුඟක් වෙලාවට කෙරෙන්නේ, crude oil ගෙනැල්ලා බදු රහිතව එළියට දාලා, ඒගොල්ලෝ වෙන තෙල් වර්ග ආපහු බදු රහිතව යවනවා. ඒක කාටවත් බලන්න බැහැ. ඒ නිසා මම කියන්නේ මෙයයි. දැන් තමුන්නාන්සේලා VAT හෝ වෙනත් බදු අය කරනවා නම්, හැම නිෂ්පාදනයකටම සමාන බද්දක් පනවන්න. ලංකාවට ගෙනාවත්, ලංකාවේ හැදුවත් සමාන මිලකට අළෙවි වෙනවා නම්, එතකොට පිට රටින් ගෙන්වන එකෙයි, ලංකාවේ නිෂ්පාදනය කරන එකෙයි අතර තිබෙන වෙනස බලා ගන්න පුළුවන්. ඊළඟට, මේවා සෞඛ්‍යයට හිතකරද, නැද්ද යන ප්‍රශ්නත් තිබෙනවා. ඒ පිළිබඳව සැලකිල්ලක් නැතුව තමයි කටයුතු කරන්නේ. එහි අඩංගු මොනවාද කියල දන්නෙත් නැහැ. ලොකු බහලුමක එන්නේ. පරීක්ෂණ ඒකකයට ආරංචි වුණා, එහෙන්ම කොන් හතරේ එල්ලලා එන්නේ කියලා. එම නිසා ගෙනියලා බලන්න කාටවත් විධියක් නැහැ. ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඒ සම්බන්ධව සොයා බලන්න. ඒ පිළිබඳව සොයා බැලීමේ ලොකු වගකීමක් ඔබතුමාට තිබෙනවා. ඒ සම්බන්ධව පියවරක් නොගත්තොත්, අපේ පොල් තෙල් කර්මාන්තය මුළුමනින්ම කඩා වැටෙනවා. සමහර අය විශාල ණය මුදලක් අරගෙන ව්‍යාපාර ආරම්භ කරලා තිබෙනවා. දැන් ආයතන වහන්න සිදු වෙලා, ඒ ගොල්ලෝ අපිට ඇවිත් කියනවා. අපි ගිහින් බලනවා, ඒක ඇත්ත. ඒ සෑම කර්මාන්තශාලාවකම අඩුම ගණනේ 25ක, 30ක පමණ පිරිසක් රැකියා කරනවා. ඒ අයගේත් රැකියා නැති වන තැනට කටයුතු සිදු වන්න ඉඩ දෙන්න එපා කියලා මම ඉල්ලනවා.

ඊළඟට, කෘෂිකර්ම අමාත්‍යාංශය ගනිමු. කෘෂිකර්ම අමාත්‍යාංශය අද විවිධ භෝග වර්ග සොයා ගැනීම් කරන්නේ නැහැ. අපි දන්නවා, මහමාන්‍ය ඩී.එස්.සේනානායක මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට සිටි කාලයේ ලංකාවේ විශාල ගොවිපොළවල් හදලා තිබුණා. ඒවා මීරිගම තිබුණා, පැල්වෙහෙරේ තිබුණා. දැන් ඒවා ඔක්කෝම අත හැර දමා තිබනවා. ඉස්සර ලංකාවේම පලතුරු වර්ග රාශියක් ඒගොල්ලෝ අත්හදා බලලා, සොයා ගැනීම් කළා. හැබැයි අද තත්ත්වය ගැන කනගාටුයි. අද අපි වැඩියෙන්ම අපනයනය කරන Tom EJC කියන අඹ වර්ගය ටොම් එල්ලාවල මහත්තයා තමයි හැදුවේ. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නොවෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශය ලජ්ජා වෙන්න ඕනෑ, පීඑච්ඩීකාරයෝ මෙච්චර ඉඳගෙන අඩු ගණනේ ලංකාවෙන් පිට රටට ගෙන යන්න අඹ වර්ගයක්වත් හදා ගන්න බැරි වීම ගැන. කරුණාකරලා, කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ තත්ත්වයෙන් එළියට ගන්න ක්‍රියා කරන්න. අපනයනය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය දියුණු කරන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, වී වගා කිරීමේ දීත් වෙනත් වගාවක් කිරීමේදීත් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, දැන් නිෂ්පාදන වියදම වැඩියි. ට්‍රැක්ටර්වලට, පොහොරවලට යන වියදම වැඩියි. ඇත්තටම ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට රසායනික පොහොර තහනම් කරන්නම වුණා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වගාවන්ට යොදන පොහොර ප්‍රමාණය අඩු කරන්න. එතෙක් අඩු කළේ නැහැ. පොහොර විශාල ප්‍රමාණයක් කුඹුරුවලට යෙදෙව්වා. ඒ නිසා ලංකාවෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් එළියට ගියා. දැන් නම් ඔන්න හරියාකාරව පොහොර යොදනවා. මෙච්චරයි, ලාභට යොදන්න ඕනෑ කියලා කියනවා. ඒ කියන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා රසායනික පොහොර තහනම් කිරීමෙන් ප්‍රතිඵලයක් ලැබුණා. ඒ තීන්දුව වැරදි වුණත්, හොඳ දෙයක් වුණා. ඒකෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇස් ඇරුණා; තමුන්නාන්සේලාගේ පේරාදෙණියේ නිදාගෙන ඉන්න පිරිසගේ ඇස් ඇරුණා, ඇත්තටම මෙච්චර පොහොර යොදන්න ඕනෑ නැහැ කියලා. ඒක ලොකු දෙයක්.

ඊළඟට අපට තිබෙනවා, යෙදවුම්වල ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා බදු සහන දෙනවා නම්, වෙනත් සහන දෙනවා නම් ට්‍රැක්ටර්වල, යෙදවුම්වල මිල අඩු කරන එකත් කරන්න. මොකද, ඊයේ පෙරේදාත් තමුන්නාන්සේලාගේම ඇමතිවරු දාලා එක එක තැන්වල ඇට වර්ග, අරවා මේවා බෙදනවා මම දැක්කා. ඒ පරණ උපක්‍රමය කරන්න එපා. වැඩක් නැහැ. ඒක තේරුමක් නැති වැඩක්. ඊට වඩා හොඳයි ට්‍රැක්ටර්වල, යෙදවුම්වල මිල අඩු කරන එක. සාමාන්‍ය ගොවිපළක් තිබෙන හැම කෙනෙකුටම ට්‍රැක්ටර් එකක්, අවශ්‍ය වෙනත් උපකරණ සහන මිලට ලබා ගන්න අවස්ථාව ලබා දෙන්න. අඩු ගණනේ ලෝකයේ වෙනත් රටකින් ආධාරයක් අරගෙන හෝ එය කරන්න. ණයක් ගන්න එපා. ආධාරයක් අරගෙන ඒක කළොත් හොඳයි කියලා මම හිතනවා. මේ තිබෙන තත්ත්වය වෙනස් කරලා නිදාගෙන ඉන්න යෝධයාව ඔබතුමා ඇහැරවන්න. එහෙම නොවුණොත් නිදාගෙන ඉන්න යෝධයා අපවත් යට කරගෙනම විනාශ වනවා. ස්වයංපෝෂිත කෘෂි කර්මයක් තිබුණොත් තමයි ලෝකයේ ඕනෑම රටක කාර්මික නිෂ්පාදන ඇති වෙන්නේ, රටක් දියුණු වෙන්නේ. ගරු ඇමතිතුමනි, ස්වයංපෝෂිත කෘෂි කර්මාන්තයක් නැතුව රටක් දියුණු කරන්න හිතන්නවත් එපා. ඒක වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[පි.ව. 2.11]

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා (ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன் - கிராமிய வீதிகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sivanesathurai Santhirakanthan - State Minister of Rural Road Development)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் எனது உரைக்குக் காது கொடுப்பாரென நான் நம்புகின்றேன். எங்களுடைய மட்டக்களப்பு மாவட்டம் ஒரு விவசாய மாவட்டமாகும். அந்த அடிப்படையில், அங்கு விவசாயத்துறையின் வளர்ச்சி சார்ந்த பல வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்படுகின்றன. இருந் தாலும், நாட்டினுடைய தற்போதைய பொருளாதார நிலைமை

[ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා]

யைக் கருத்திற்கொண்டு, சில விஷயங்களை நான் இங்கு முன்னிலைப்படுத்த வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் உலக வங்கியின் உதவியுடன் பல அபிவிருத்தித் திட்டங்கள் ஆரம்பிக்கப்பட்டுள்ளமை உங்களுக்குத் தெரியும்! ASMP போன்ற திட்டங்கள் சிறந்த திட்டங்களாக முன்மொழியப்பட்டாலும், குறித்த இலக்குகளை அடையமுடியாமல் போயிருக்கின்றது. நீங்கள் சொன்னது போல, ஏற்றுமதிப் பொருளாதாரத்தை மையமாகக்கொண்டு வாகரையில் மேற்கொள்ளப்பட்ட Hayleys நிறுவனத்தின் திட்டம் மாத்திரம்தான் தன்னுடைய இலக்கை அடைந்திருக் கின்றது. மற்றைய திட்டங்கள் எல்லாம் கிட்டத்தட்ட தோல்வியில் முடிவதுபோல்தான் நிலைமை இருக்கின்றது. அதற்குக் காரணம், சிறந்த திட்டமிடலுடன் ஆரம்பிக்கப்பட்ட திட்டங்களை அமுலாக்குகின்ற பொறுப்பை ஏற்றிருக்கின்ற நிறுவனங்களின் தலைவர்கள் மிகப்பெரிய இலக்குகளை அடையக்கூடியவர்களாகவும், அந்த நிறுவனத்தை முழுமை யாக இயக்கக்கூடியவர்களாகவும் இருக்காமை என்றே நான் எண்ணுகின்றேன். எனவே, எதிர்காலத்தில் நீங்கள் நல்ல திட்டமிடல்களை மேற்கொள்ள வேண்டும். அந்த வகையில், அமுலாக்கற்பிரிவின் உறுதித்தன்மையைத் தொடர்ந்தும் பாதுகாத்துக் கொள்வதற்கு நீங்கள் பக்கபலமாக இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். உற்பத்தித் துறையை முன்னேற்ற வேண்டுமாக இருந்தால், இலக்குகளைத் தவறவிடாமல் திட்டங்களை நிச்சயமாக அமுலாக்க வேண்டும்.

மட்டக்களப்பு மாவட்டம் தொடர்பில் முக்கியமானதொரு விஷயத்தை நான் இங்கு சொல்ல வேண்டும். சிங்களத்தில் 'மகா சீசன்' என்பதை நாங்கள் 'முன்மாரிச் செய்கை' என்று சொல்வோம். மட்டக்களப்பு மாவட்டத்தில் கிட்டத்தட்ட 2 இலட்சம் ஏக்கர் காணியில் நெற்செய்கை பண்ணப்படுகின்றது. இருந்தாலும், அதன்மூலம் கிட்டத்தட்ட 44 இலட்சம் நெல் மூடைகளைத்தான் பெறக்கூடியதாக இருக்கின்றது. அதற்குப் பல காரணங்கள் இருக்கின்றன. அதேபோன்று, காலபோகத் தில் கிட்டத்தட்ட 80,000 ஏக்கரில் நெற்செய்கை பண்ணப்படு கின்றது. அதன்மூலம் மட்டக்களப்பு மாவட்டத்தில் கிட்டத் தட்ட 65,000 நெல் மூடைகளைத்தான் வருடமொன்றுக்குப் பெறக்கூடிய வாய்ப்பிருக்கின்றது. ஆனால், அங்கு நெற்செய்கை மேற்கெள்ளக்கூடிய நிலத்தின் அளவையும் விவசாயிகளின் தொகையையும் அரசாங்கம் கொடுக்கின்ற மானியங்களையும் வைத்துப்பார்த்தால், நிச்சயமாக விளைச்சல் போதாமல் இருப்பது தெரிகின்றது. எதிர்வரும் 3 வருடங்களுக் குள் விளைச்சலை அதிகரிக்கக்கூடிய திட்டங்களைச் சரியாக அமுல்படுத்தினால், கூடுதலான விளைச்சலைப் பெற முடியும். கௌரவ அமைச்சர் அவர்களே, இதில் உங்களுடைய துறைசார்ந்த பிரிவினர் கூடிய கவனம் செலுத்த வேண்டும். இது தொடர்பில் நாங்கள் பலமுறை உங்களுடைய அமைச்சின் ஆலோசனைக் குழுக் கூட்டங்களில் கூறியிருக்கின்றோம். நீங்கள் உங்களுடைய அறிவுத் திறனைப் பாவித்து, இதில் முன்னோடியாகச் செயற்படுவீர்கள் என்று நான் நம்பு கின்றேன்.

அடுத்து, கமநல சேவை நிலையங்கள் சார்ந்த விடயத்தில் அதிக கவனம் செலுத்த வேண்டும். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள 2 இலட்சம் ஏக்கர் வயல் காணிகளுக்கும் சேவை வழங்கவென 17 கமநல சேவை நிலையங்களே இருக்கின்றன. அதை விரிவாக்க வேண்டும். அந்த வகையில், மேலதிகமாக இன்னும் 5 கமநல சேவை நிலையங்களை அமைக்க வேண்டுமென நாங்கள் கோரிக்கைவிடுத்து இருக்கின்றோம். சில கமநல சேவை நிலைய அதிகாரப் பிரதேசத்தில் கிட்டத்தட்ட 25,000 ஏக்கர் வயல் காணிகள் காணப்படுவதால், உரிய சேவைகளை வழங்க முடியாமல் இந்நிலையங்கள் திண்டாடுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

மேலும், எல்லா மாவட்டங்களிலும் விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்கள் இருக்கின்றார்கள். மட்டக்களப்பு மாவட்டத்தில் விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்களுக் கான ஆளணி 150 இருந்தாலும், தற்போது 15 பேர்தான் இருக்கின்றார்கள். அதேபோன்று, அங்கு 17 கமநல சேவை நிலையங்கள் இருந்தும், 7 கமநல அபிவிருத்தி உத்தியோகத்தர் களே தற்பொழுது கடமையாற்றிக்கொண்டு இருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இப்படியான குறைபாடுகளை நீங்கள் உடனடியாக நிவர்த்திசெய்து தரவேண்டும். கமத்தொழில் அமைச்சின்கீழுள்ள ஆராய்ச்சிப் பிரிவு, விதை உற்பத்தி நிலையம் என்பன இன்னும் குறித்த இலக்குகளை அடையாமல் இருப்பது வேதனையளிக்கின்றது. ஆகையால், இதற்குரிய சரியான வேலைத்திட்டங்களை நீங்கள் உறுதிப் படுத்திக்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்களில் நெல் விதைப்பும், அறுவடையும் ஏனைய மாவட்டங்களில் இடம்பெறுவதற்கு முன்னரே நடைபெறுகின் றன. நெல் சந்தைப்படுத்தும் சபை தேசிய ரீதியாக நெல்லுக் கான விலையைத் தீர்மானிக்கும்பொழுது, கிழக்கு மாகாணத் தில் நெல் அறுவடை ஆரம்பித்துவிடும். அதன் காரணமாக அம்மாகாண விவசாயிகளின் நெல்லுக்கான விலையில் தளம்பல் நிலை ஏற்படுகின்றது. மேலும், மழை பெய்தால் அவர்களுடைய உற்பத்தி அழிவடைகின்றது. இதனால் அந்த விவசாயிகள் உளவியல் ரீதியான தாக்கத்துக்கு உள்ளாவ துடன், அவர்கள் விவசாயத்தில் ஈடுபடுவதிலிருந்து பின்வாங்கக்கூடிய சூழலும் உருவாகின்றது. இவற்றை யெல்லாம் நிவர்த்தி செய்யக்கூடிய வகையில், ஜனவரி மாதத்தில் நெல்லுக்கான விலை நிர்ணயத்தையும் நெல் கொள்வனவுக்கான திட்டமிடலையும் செய்துமுடிக்க வேண் டும். அதுமாத்திரமன்றி, யானைகளால் தாக்கப்பட்டு உடைக் கப்பட்டிருக்கின்ற பல களஞ்சியங்கள் இன்னும் திருத்தப் படாமல் இருக்கின்றன. இப்படியான பிரச்சினைகளைத் தீர்த்து, நெல் சந்தைப்படுத்தும் சபையை உறுதியானதொரு நிறுவனமாக மாற்றுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் பாடுபடுவாரென நான் நம்புகின்றேன்.

வனவிலங்குகளின் தாக்குதல்களால் ஏற்படுகின்ற கணிச மான பிரச்சினைகளை நாங்கள் இனங்கண்டு சொன்ன போதிலும், இன்னும் அவை தீர்க்கப்படவில்லை. பிராந்திய ரீதியான காரியாலயம் இன்மையே அதற்குக் காரணமாகும். இவற்றையெல்லாம் தீர்த்து வைத்தால், நாட்டின் தேசிய உற்பத்தியில் மட்டக்களப்பு மாவட்டத்தின் பங்கில் கணிசமான தொரு வளர்ச்சிப்போக்கை எங்களால் எட்டமுடியும் என்று நம்புகின்றேன். இந்த நாட்டில் ஏற்பட்ட பொருளாதாரப் பிரச்சினை காரணமாக கித்துள், உறுகாமம் குளங்களின் இணைப்பு என்பது தற்போதைக்கு சாத்தியமில்லாமல் இருக் கின்றது. இது irrigation உடன் சம்பந்தப்பட்ட விடயமாக இருந்தாலும், இதனைக் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நாங்கள் நீர்ப்பாசனத் திட்டங்களை விரிவாக்குகின்றபோது, நிச்சயமாக அதிகூடிய நெல் உற்பத்தி யைப் பெறமுடியும். இவற்றையெல்லாம் நிவர்த்தி செய்து கொள்வதற்கு 2024ஆம் ஆண்டை சரியாகப் பயன்படுத்திக் கொள்ள வேண்டும்.

கௌரவ தவிசாளர் அவர்களே, நேரம் போதாமை காரணமாக என்னுடைய உரையின் எஞ்சிய பகுதியை ***ஹன்சாட்டில்** சேர்த்துக்கொள்ளுமாறு கேட்டுக்கொள்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. HESHA WITHANAGE took the Chair.*

[අ.භා. 2.17]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ ගැන කථා කරන මොහොතේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම මෙහිදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අද කෘෂි කර්මාන්තය අන්තයටම කඩා වැටිලා තිබෙන බව. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ ගජමිතුරන්ට රුපියල් බිලියන 600ක්, 700ක් බදු සහන ලබා දීලා, රට බංකොලොත් කළා. ඊට පස්සේ රසායනික පොහොර ගෙන්වීම තහනම් කරලා ගොවි ජනතාවට දෙවෙනි ප්‍රහාරයත් එල්ල කළා. මැති-ඇමතිවරුන්ගේ උපදෙසක් නැතිව, කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැතිව -කිසිම කෙනෙකුගෙන් උපදෙසක් නැතිව- රසායනික පොහොර තහනම් කිරීම නිසා ගොවි ජනතාව මහ පාරට බැස්සා. ඒ නිසා ගොවි ජනතාවට වගා කටයුතු කරගන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ නිසා ගොවි ජනතාව අනාථ වුණා. ඉන් පස්සේ කාබනික පොහොර කියලා නැනෝ නයිට්‍රජන් පොහොර ආනයනය කරලා -අසූචි පොහොර නැවක් ගෙනැල්ලා- ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක් හොරා කෑවා. ගොවියා අනාථ වුණා. මැති-ඇමතිවරුන්ගේ බැංකු ගිණුම් තර වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. එතුමා අපේ ගමේ ඉන්නේ. එතුමා ගොවියෙකුගේ පුතෙක්. එතුමා දක්ෂයෙක්. අපි එතුමාට අපේ දිස්ත්‍රික්කයේ වාගේම රටේ ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීම සඳහාත් සහයෝගය ලබා දෙන්න ඕනෑ.

ඊට පස්සේ අවුරුදු තුනක් යනකොට නියඟය ආවා. ඒ නියඟය මුළු රටටම බලපෑවා. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමාත් දන්නවා, අපිත් දන්නවා. ඒ නියඟයෙන් දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වාගේම මොනරාගල දිස්ත්‍රික්කයේත්, රත්නපුර දිස්ත්‍රික්කයේත්, විශේෂයෙන්ම අඟුණුකොළපැලැස්ස, මුරවැසිහේන, චන්ද්‍රිකා වැව, සූරියවැව, මයුරපුර, කිරිඉබ්බන්ආර, සෙවනගල යන ගොවිජන සේවා කොට්ඨාස හතේම ගොවි සංවිධාන 310ක වගාව විනාශ වුණා. පූදින්න තිබුණු ගොයම වතුර ලබා නොදීම නිසා මැරුණා. අපේ ඇමතිතුමා ලොකු උත්සාහයක් ගත්තා, වතුර ලබා ගන්න. සමනල වැව ව්‍යාපෘතියෙන් වතුර ලබා නොදීම නිසා හෙක්ටෙයාර 32,500ක් විනාශ වුණා. ඒ, පූදින්න තිබුණු ගොයම. විදුලිය නම් මුදලට හරි ලබා ගන්න තිබුණා. නමුත්, අපේ රටට බත සපයන ගොවියා අසරණ වෙලා විනාශ වුණා, රටට බත නැති වුණා.

සමනල වැව ජලාශයෙන් උඩවලවට වතුර ලබා දීලා තමයි අපේ ගොවි ජනපදවලට වතුර ලබා ගන්නේ; අපේ ගොවි ජනතාවට වතුර ලබා දෙන්නේ. ඒ Samanalawewa Power Project එකේ Technical Report එක මම සොයා ගත්තා, ගරු ඇමතිතුමනි. ඒ වාර්තාවේ සිංහල පරිවර්තනයක් මා ළඟ තිබෙනවා. එම සිංහල පරිවර්තනයේ 7.7 උඩවලව ව්‍යාපෘතියේ වාරි කටයුතු යටතේ සඳහන් වෙනවා, "සමනල වැව විදුලි බලාගාර අවරාරෙන් සිදු කෙරෙන සම්පාදනයන් වලවේ ගඟේ අතු ගංගාවක් වන කටුපත් ඔය වෙත ගලා බසිනු ඇත. සමනල වැව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු හා විදුලිය නිෂ්පාදනය සඳහා එහි කටයුතු මඟින් උඩවලව ජලාශයට ගලා යන ජල ධාරාවේ රටාව වෙනස් කරනු ඇත. ජල ව්‍යාපෘති/මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් කාර්යාංශ වාර්තාව තුළ සිදු කරන ලද ජල කළමනාකරණ අධ්‍යයනයන් මඟින් පෙන්වා දෙනුයේ සමනල වැව ව්‍යාපෘතිය මඟින් උඩවලවේ වාරි කටයුතුවල විශ්වසනීයත්වය සැලකිය යුතු ලෙස වර්ධනය කරවනු ඇති බවයි. වගා ව්‍යාපෘති 52ක් සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයකට අනුව සමනල වැවට අදාළව සිදුව තිබූ වගා අසාර්ථකත්වයන්හි අගය 3ක් ලෙසද, සමනල වැව රහිතව ලබා තිබූ අසාර්ථකත්වයන්හි අගය 10ක් විය. සමනල වැව ව්‍යාපෘතිය ඉදි කිරීමත් සමඟ උඩවලව වගා කටයුතු හෙක්ටෙයාර 32,500ක් දක්වා විශාලනය කළ හැකි අතර, සියයට 94ක වගා සාර්ථකත්වයක් ද අත්පත් කරගත හැක" යනුවෙන්.

ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ සමනල වැවෙන් උඩවලව ප්‍රදේශයේ කුඹුරුවලට වතුර ලබා දීම ගැනයි. මෙන්න මේ හේතුව නිසා උඩවලව ජලාශයෙන් පෝෂණය වන ගොවි බිම් ප්‍රදේශවලට ජලය ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා. මේ ගිවිසුම විදුලිබල මණ්ඩලයේ තිබෙනවා. ඔබතුමා ඒ ගිවිසුම අරගෙන බලන්න. මේ අවුරුද්දේ හෙක්ටෙයාර 32,000ක් විනාශ වුණා; ගොවීන් අසරණ වුණා. ගරු චමල් රාජපක්ෂ මැතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ ගැන දන්නවා. ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඒ ගිවිසුම අරගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. ඊට පස්සේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා මේ සඳහා අනුමැතිය ගන්න. හැම අවුරුද්දේම නියඟය එන නිසා ඇති වන වගා පාළුවත් එක්ක ගොවි ජනතාව මුහුණ දෙන ගැටලුවට විසඳුමක් ලෙස ගිවිසුමක් අත්සන් කරලා ජලය ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම යෝජනා කරනවා. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා ඒක ස්ථිර කරයි. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, ඒ යෝජනාව ඔබතුමාත් ස්ථිර කරන්න. මේ ආණ්ඩුව මේ අවුරුද්දේ ඒක කරන්න ඕනෑ. නැත්නම් ලබන අවුරුද්දේ වතුර දෙන්න බැහැයි කිව්වොත් මොකද කරන්නේ? ගරු කංචන විජේසේකර ඇමතිතුමා කිව්වා ජලය දෙන්න බැහැ කියලා. එතුමාට එහෙම කියන්න බැහැ නේ. මේවා අපේ පළාතේ ගොවීන්ට දෙන්න තිබෙන ජලය. විදුලිය නම් සල්ලිවලට ගන්න පුළුවන්. කන්න තිබෙන වී ටික නේ නැති වුණේ. අපේ ගොවීන් හිඟමනට වැටුණා; ගොවීන්ගේ රැකී රක්ෂා නැති වුණා; දරුවන් පාසල් යවා ගන්න බැරි වුණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ -අවුරුදු තුනක් තිස්සේ; ඒ ආණ්ඩුව ආවාට පස්සේ- ගොවීන්ගෙන් තමයි පළි ගත්තේ. ගොවීන් අද විනාශ මුඛයට වැටිලා සිටිනවා. එම නිසා

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ඔබතුමා මේ ව්‍යාපෘති විස්තර අරගෙන ගිවිසුමක් අත්සන් කරන්න. ඔබතුමන්ලා එහෙම කරන්නේ නැත්නම්, අපේ ආණ්ඩුවක් ආපු වෙලාවක අනිවාර්යයෙන්ම මම එය ඉෂ්ට කරනවා, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, දෙවැනි කාරණයත් මම ඔබතුමාට කියන්නම්. ගොවි ජනතාව මුහුණ දී තිබෙන ගැටලු තමයි මම වැඩියෙන්ම ඉදිරිපත් කරන්නේ. එයින් එකක් තමයි අපේ කොට්ඨාස පහට බලපාන වතුර පිළිබඳ ප්‍රශ්නය. ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ආරම්භයේ සිට මෙතෙක් ගොවි බිම් පෝෂණය වෙලා නැහැ. පන්නෙගමුව වැව, වීරවිල වැව, දෙබරවැව, තිස්ස වැව, යෝධ වැව, වම් ඉවුර වැව, දකුණු ඉවුර වැව වාගේම වාරි ඇළ මාර්ග කිසිවක් සංවර්ධනය වෙලා නැහැ, ගරු ඇමතිතුමා. එම බල ප්‍රදේශයට අයත් ලුණුගම්වෙහෙර ව්‍යාපාරයේ ඇළ මාර්ග ඇතුළු වාරි ව්‍යාපාර ප්‍රතිසංස්කරණය වෙලා නැහැ, ඒවායේ රොන් මඩ පිරිලා. පසුගිය දවස්වල වාරි ඇළ ප්‍රතිසංස්කරණය නොවීම නිසා මාස් කන්නයේ වගා කටයුතු කරගන්න බැරි වුණා. ගොවි සංවිධාන කිහිපයක්ම මට කථා කළා. ලුණුගම්වෙහෙර ගොවි සංවිධානයේ සභාපති සාමිත චතුරංග මහත්මයා මගෙන් කරපු ඉල්ලීමකට අනුව රුපියල් ලක්ෂ 25ක් දීලා දකුණු ඇළ කිලෝමීටර 26ක් ප්‍රතිසංස්කරණය කළා. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පෞද්ගලික මුදල් අරගෙන අගෝස්තු මාසයේ තමයි එම ප්‍රතිසංස්කරණ කටයුතු කළේ. ඒ විධියට ඇළ මාර්ග ඔක්කෝම ප්‍රතිසංස්කරණය කළ යුතුව තිබෙනවා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සල්ලි තිබෙනවා. මේවා ගොවි ජනතාවගේ ප්‍රශ්න. එම නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා ඒ සල්ලිවලින් ඇළ මාර්ග සුද්ද කරලා -ප්‍රතිසංස්කරණය කරලා- දුන්නොත් ඔවුන්ගේ ජල ප්‍රශ්නය විසඳන්න පුළුවන්. එම නිසා ඒ දෙයත් ඉෂ්ට කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, තිස්සමහාරාමයේ ගොවි සංවිධාන 16ක් මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. එහි පිටපතක් ජනාධිපතිතුමාටත් යවලා තිබෙනවා. එම ඉල්ලීම තමයි මා ළඟ මේ තිබෙන්නේ. ප්‍රධාන වැව්, කුඩා වැව් සහ වගා බිම් සඳහා ලුණුගම්වෙහෙර ව්‍යාපාරයේ හෝ උමා ඔය, වෙහෙරගල වැනි ව්‍යාපෘතිවල අතිරික්ත ජලය ලබා ගැනීම සඳහා ගොවි සංවිධාන 16ක් මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. තිස්සමහාරාම යෝධකණ්ඩිය ප්‍රදේශයේ උද්ධකන්දර, රණකෙළිය, විහාරමහාදේවිපුර, කිරින්ද ග්‍රාම නිලධාරි වසම්වල 1960 වර්ෂයේ සිට ඉදිකරනු ලැබූ වැව් 25ක් තිබෙනවා. මේ ප්‍රදේශවල අක්කර 1,000ක පමණ වී වගා කරනවා. වගා ඉඩම් අක්කර 200ක් තිබෙනවා. පාරම්පරික හේන් වගාව කරනු ලබන අක්කර 6,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. 2019 වසරේදී තඹරව වැව දක්වා එම ප්‍රධාන ඇළ කිලෝමීටර 4ක් දීර්ඝ කරලා තිබෙනවා. එම ගොවි සංවිධාන ඉල්ලන විධියට තව කිලෝමීටර 6ක් පමණයි එම ඇළ දිගු කරන්න තිබෙන්නේ. කිරින්දට යනකල් එසේ දිගු කළොත් ගොවි ජනතාවගේ හේන් ගොවිතැන, කුඹුරු ගොවිතැන ඇතුළු කෘෂි කර්මාන්තය කර ගන්න පුළුවන්. තිස්සමහාරාමයේ ගොවි සංවිධාන 16ක් කරපු ඉල්ලීමට අනුව එම ඇළ තව කිලෝමීටර 6ක් පමණයි දීර්ඝ කරන්න තිබෙන්නේ. වැව් හාරනවා, වැව් කපනවා, අනෙකුත් දේවල් කරනවා වාගේම එම ප්‍රධාන ඇළ මාර්ගයත් දිගු කරලා දුන්නොත් අනෙක් වසම් කිහිපයේම තිබෙන ගොඩ හෝග වගාව, හේන් ගොවිතැන ඇතුළු කෘෂි කර්මාන්තයට ජලය ලබා ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, ඒ විස්තර ටික මම ඔබතුමාට දෙන්නම්.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
රන්මිණිතැන්නේ ඉඳලාද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
රන්මිණිතැන්නේ ඉඳලා නොවෙයි, තිස්සමහාරාම යෝධකණ්ඩිය ප්‍රදේශයේ උද්ධකන්දර, රණකෙළිය, විහාර මහාදේවිපුර, කිරින්ද ග්‍රාම නිලධාරි වසම්වලට ජලය ගෙනයන ප්‍රධාන ඇළ. මේ විස්තර ටික මම ඔබතුමාට එවන්නම්, පොඩ්ඩක් බලන්න. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, ගොවි සංවිධාන 16ක් මට එවපු ලිපිය ගැනයි මම මේ කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලයත් දැන් අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩියක කාලයක් දෙන්න. නියඟයෙන් වූ හානිය ගැනත් කියන්න තිබෙනවා. නියඟය නිසා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි පවුල්වලට තමයි වැඩිපුරම වන්දි ලබා දුන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් කිව්වා අක්කරයකට රුපියල් 100,000ක් දෙනවා කියලා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
හෙක්ටෙයාරයකට.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
හෙක්ටෙයාරයකට නොවෙයි, අක්කරයකට. අසත්‍ය කියන්න එපා, ගොවියෝ අහගෙන ඉන්නවා. අක්කරයකට රුපියල් 100,000ක් දෙනවා කිව්වාට කැබිනට් මණ්ඩලයෙන් ඒක අනුමත කළේ නැහැ. හෙක්ටෙයාරයකට රුපියල් 100,000ක් දෙනකොට අක්කරයකට රුපියල් 40,000ක් දෙන්න ඕනෑ. නමුත් හෙක්ටෙයාරයකට හම්බ වෙන්නේ රුපියල් 86,000යි. රුපියල් 40,000න් රුපියල් 4,000ක් අඩු වෙලා අක්කරයකට රුපියල් 36,000 අද ගොවීන්ට හම්බ වෙන්නේ. මේක ආණ්ඩුව කරපු වැරැද්දක්. අපට වතුර දුන්නා නම්, මේ සල්ලි ගෙවන්න ඕනෑ නැහැ, චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි. කංචන විජේසේකර ඇමතිතුමාගේ කටේ බලයට වතුර දුන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා සටන් කළා නම් වතුර ගන්න තිබුණා. ගොවීන්ට වතුර නොදීම නිසා තේ පූදින ගොයම මැරුණේ, ගරු ඇමතිතුමනි. හෙක්ටෙයාරයකටම රුපියල් 86,000ක්, අක්කරයකට රුපියල් 36,000ක් දීලා වැඩක් සිද්ධ වෙන්නේ නැහැ නේ. ඒ නිසා ගොවීන්ට දෙන වන්දි මුදල වැඩි කරලා දෙන්න.

ගරු ඇමතිතුමනි, ඒ අවුරුදු තුනේම ගොවියෝ ණය වෙලා, අසරණ වුණා. ගොවීන්ට කන්න බොන්න විධියක් නැහැ; බඩුමුට්ටු -දේපළ- උකස් තියන්න වුණා; දුව කසාද බන්දලා දෙන්න විධියක් නැහැ; හරකා-බාන බේරා ගන්න විධියක් නැහැ. ඒ හැම දෙයම වෙලා අද වෙනකොට රට විනාශයට පත් වෙලා තිබෙනවා. මේ විනාශයෙන් ගොවි ජනතාව බේරා ගන්න ඔබතුමන්ලා එක්කහු

වෙලා කටයුතු කරන්න. අපේ නායකතුමා ඇතුළු අපගේ පූර්ණ සහයෝගය ඒ සඳහා අපි ලබා දෙනවා. මට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.29]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
මම ගොඩක් දේවල් කථා කරන්න හිතා ගෙනයි ආවේ. නමුත්, විනාඩි පහෙන් නම් ගොඩක් දේවල් කථා කරන්න අමාරුයි. නමුත් මට ලැබිලා තිබෙන වෙලාව අනුව මම කථා කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැටනවලක්ෂයක ජන වරමක් අරගෙන තමයි රටේ බලය පිහිටෙව්වේ. ඒ වාගේම අපි පාර්ලිමේන්තු එන්නේත් ඒ හැටනවලක්ෂය නියෝජනය කරමින්. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අදටත් දොස් කියන්නේ නැහැ. එතුමාට හොඳ දර්ශනයක් තිබුණා. නමුත්, කොතැනකදී හරි එතුමාට වැරැද්දක් වුණා. උපදේශකයන්ගේ හෝ ගත්ත ක්‍රියාමාර්ගවල වරද නිසා තමයි අපිට අද දේශපාලන වශයෙන් යම්කිසි හානියක් සිද්ධ වෙලා තිබෙන්නේ. ගොවියාට මේ ජන සමාජයේ තවම බලයක් තිබෙනවා. මේ මහ පොළොවේ තවම බලය තිබෙන්නේ ගොවියාට කියන එක අපි තේරුම් ගත්තේ නැහැ. අපි ඒ කාරණය තේරුම් නොගත්ත නිසා තමයි අද මේ රටේ ගොවියාට පොහොර සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන මේ ප්‍රශ්නය වෙනුවෙන් මහ පාරට බහින්න සිදු වුණේ කියන එක ගමේ කෙනෙකු වශයෙන් මම පෞද්ගලිකව විශ්වාස කරනවා. අපි මහජනතාව එක්ක සම්බන්ධ වෙනකොට ඔවුන් නිරන්තරයෙන් කියන කථාවක් තමයි, පොහොර ප්‍රශ්නය තමයි මේ ඔක්කෝටම මුල කියන එක. ඒ නිසා ඒක ඉතිහාසයේ වුණු නිවැරදි කරන්න බැරි වරදක් වශයෙන් තමයි මට දැනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා ගමේ මහජනතාව නියෝජනය කරන කෙනෙක්. මට මොනවා හරි දෙයක් කරන්න හිතුණොත් ඒකේ අතු අග හොයාගෙන ගිහිල්ලා හරි ඒ කටයුත්ත කරන්න මම උත්සාහ කරනවා. පාර්ලිමේන්තුවට එන හැම දවසකම මගේ ලිපි ගොනුවේ තිබෙනවා, ව්‍යාපෘති ගණනාවක වාර්තා. එක ව්‍යාපෘතියක් තමයි, දූරියංගා ව්‍යාපෘතිය. මේ ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාව අවුරුදු තුනක් මගේ ෆයිල් එකේ තිබුණා. මම මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ලොකු උත්සාහයක් ගත්තා. ඇමතිතුමා හමු වුණා; මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා හමු වුණා; කෘෂිකර්ම අධ්‍යක්ෂතුමිය හමු වුණා; අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හිටපු ලේකම්තුමිය හමු වුණා. නමුත් මේක පළාත් සභාවට යොමු කළාට පස්සේ ඇදි ඇදී තිබුණා. මට ලොකු වුවමනාවක් තිබුණා, මේ ව්‍යාපෘතිය කොහොම හරි කරන්න. හැබැයි, අපේ රාජ්‍ය ඇමතිතුමා දවසක් මට අමාත්‍යාංශයට එන්න කියලා අධ්‍යක්ෂතුමියව මුණගස්වන්න කටයුතු කළා විතරක් නොවෙයි, ගරු අමාත්‍යතුමාත් ඒ වෙනුවෙන් මැදිහත් වුණා. මට සතුටින් කියන්න පුළුවන්, මගේ දූරියංගා ව්‍යාපෘතිය අද වෙනකොට ඒ ගම්මානය තුළ ජනිත කරලා මහ පොළොවට ගේන්න පුළුවන් වුණු බව. ඒක ලොකු හයියක්. ඒ ගම්මානය, දූරියංගා ගම්මානයක් වශයෙන් නම් කරන්න මම දායකත්වය ලබා දී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගමෙන් ආපු මන්ත්‍රීතුමෙකු හැටියට ගමේ මිනිහාගේ ප්‍රශ්න ගැන මම මෙතැන කථා කරන්න ඕනෑ. මම බුලත් ගොවියා වෙනුවෙන් ලොකු සටනක් කරනවා. දැනුත් මගේ ළඟ තිබෙනවා, බුලත් ගොවියා වෙනුවෙන් ගෙනාපු ව්‍යාපෘති වාර්තාව. මට තවම බැරි වුණා, ඒ සඳහා සත 5ක් හොයා ගන්න. මේ ව්‍යාපෘති ලැයිස්තුවට අවුරුදු තුනක් වෙනවා. ගොවීන් ගස් කපන එක -කිතුල් ගස්, පුවක් ගස් කපන එක, ඉනි කපන එක- නවත්වලා කොන්ක්‍රීට් කණු උපයෝගී කරගෙන බුලත් වගාව කරගෙන යන්න ඔවුන්ට අවශ්‍ය ශක්තිය දෙන්න මම ගත්ත උත්සාහය අසාර්ථක වුණා. නමුත් මම අගය කළ යුතු දෙයක් තිබෙනවා. බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමාට මම මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කළාම එතුමාගේ මට්ටමේ ඉඳලා එතුමා මේ ගැන සාකච්ඡා කරලා, කොළඹ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න මැතිතුමාට කථා කරලා, මන්ත්‍රීතුමා මේකට ලොකු උත්සාහයක් ගන්නවා, අපි මේ වෙනුවෙන් උදවු කරමු කියලා එතුමාට කිව්වා. ඒ අනුව ගොවීන් 75දෙනෙක්, 80දෙනෙක් එකතු කරලා, බුලත් වගා කරන ගම්මානයක් නිර්මාණය කරන්න අද වෙනකොට මට පුළුවන් වුණා.

හැබැයි, සාම්ප්‍රදායික වගාවක් වශයෙන් අතීතයේ ඉඳලා බුලත් වගාව ගැන කථා කළත්, අපනයන සඳහා ගම්මාන නිර්මාණය කළත් බුලත් ගොවියා ගැන සමාජයේ කවුරුත් කථා කරන්නේ නැහැ. හැබැයි ඒ වගාවත් එක්ක හැදුණු කෙනකු වශයෙන් මට යුතුකමක්, වගකීමක් තිබෙනවා ඒ මිනිස්සු වෙනුවෙන් මොනවා හෝ දෙයක් කරන්න. දැනටත් අපේ ගරු ඇමැතිතුමා සහ රාජ්‍ය ඇමැතිතුමා මට උදව් කරනවා. ඒ වාගේම මම දැනුත් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් බුලත් ගොවියාට මේ සමාජයේ දෙපයින් නැඟී සිටින්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

කහ පාට උණ වගාව ගැනත් මම යමක් කිව යුතුයි. වේවැල් කර්මාන්තය කරන්න අවශ්‍ය බට ගස් කපන්න දෙන්නේ නැති නිසා අපි අලුත් වගාවක් නිර්මාණය කළා. ගෙවල්වල විසිතුරු පැළෑටියක් විධියට වවන කහ පාට උණ ගස් වගාවක් වශයෙන් කරන්න මම ලොකු උත්සාහයක් දැරුවා. නමුත් තවම කර ගන්න බැරි වුණා. ඒ වාගේම අපේ ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමාගේ දායකත්වය ලබාගෙන මම තේ ගම්මාන දෙකක් නිර්මාණය කළා.ඒ වාගේම මම තව ව්‍යාපෘතියක් ඉදිරිපත් කළා, දහදෙනෙකු එකම වගාව කරන්න; ගමක දහදෙනෙකු එකම දේ වවන්න. ඒකත් මට කර ගන්න පුළුවන් වුණේ නැහැ. ඒකත් කරන්න අවශ්‍යයි.

ඊළඟට කහ වගාව සම්බන්ධයෙන් කථා කළොත්, අද කහ ඕනෑවටත් වඩා හැදිලා විකුණා ගන්නත් බැරි තත්ත්වයක් තිබෙන්නේ. දැන් මිනිස්සු ඒකට අපට දොස් කියනවා. පුවක් වගාව සඳහාත් මට ලොකු සහයෝගයක් අමාත්‍යාංශයෙන් ලැබුණා. ඒ වාගේම කෙටි කාලීන කොස් පැළ ටිකක් ලබා දෙන්නත් මම උත්සාහ කළා. ඒ වාගේ කරුණු කාරණා ගණනාවක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි කාලයක් දෙන්න. මොකද, මම මේ අමාත්‍යාංශයට අදාළ වන කාරණා කටයුතු නියෝජනය කරන නිසා මට තව කාරණා කිහිපයක් කියන්නට තිබෙනවා. වැඩි වේලාවක් ගන්නේ නැහැ, මම ඉක්මනින් කියන්නම්.

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි භෝගයක් වශයෙන් තිබෙන පොල් ගස ආරක්ෂා කරන්න, ආහාර පනතට ඇතුළත් කරලා මේවා කපන එක තහනම් කරන්න මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා උත්සාහ කරනවා. නමුත් ඒ දේ කර ගන්නත් පුළුවන්කමක් ලැබුණේ නැහැ. විශේෂයෙන් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. බොහොම සංවේදීව, උඩුගං බලා ගිය රාජකාරියක් කරලා අද එතුමා යම් තැනකට ගොවියා ගෙනැල්ලා තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා වන මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමාටත්, ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමාටත්, කේ. කාදර් මස්තාන් රාජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්තුමාව අගය කරන්නට ඕනෑ. මොකද, මම එතුමාව හමුවෙලා කිව්ව හැම දෙයක් ගැනම එතුමා බොහොම සංවේදීව බලලා අපිව දැනුවත් කළා, කියන්න ඕනෑ කරුණු කාරණා කියලා. විශේෂයෙන් අපි වැඩ කරනකොට මධ්‍යම ආණ්ඩුව වශයෙනුත්, පළාත් සභා වශයෙනුත් බෙදෙන්නේ නැතිව ඒකාබද්ධ වුණොත් මීට වඩා හොඳින් වැඩ කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

බස්නාහිර පළාත් සභාව ගැනත් මම කියන්නට ඕනෑ. ගරු ආණ්ඩුකාර එයාර්මාර්ෂල් රොෂාන් ගුණතිලක මැතිතුමා කෘෂිකර්මයට විශාල දායකත්වයක් ලබා දෙනවා. ඒ ගැන වැඩිදුර විස්තර කියන්න වේලාව මදි. ඒ වාගේම ප්‍රදීප් යසරත්න මැතිතුමාත්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, නීල්වල මහත්මා ඇතුළු හිටපු ලේකම්වරු සියලුදෙනාත් ලොකු දායකත්වයක් ලබා දුන්නා. කුකුළු පාලනය සම්බන්ධයෙන් ඉන්න වෛද්‍යවරයා ඇතුළු සියලු දෙනා ලොකු කාර්යභාරයක් ඉටු කරලා තිබෙනවා. ඒවා අගය නොකළොත් එතුමන්ලාට අසාධාරණයක් වෙනවා. මොකද, ඒ අයගේ ශක්තිය තුළ ඒ අය මේ සමාජයට අරගෙන ගිය යම් යම් දේවල් සම්බන්ධව අපි ස්තුති කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් විශේෂයෙන් කිව යුතුයි. මාස හතරක් වතුරෙන් යට වුණු කුඹුරු තිබෙනවා. ඒ අය වගා කරලා තිබෙනවා. ඒ අයට වන්දියක් ලැබිලා නැහැ. ඒ අයගේ දුක්ඛ දෝමනස්ස තිබෙනවා. ඒ මිනිස්සුන්ට පොහොර ටික නොමිලයේ ලබා දෙන්න, අනෙකුත් පහසුකම් ලබා දෙන්න පුළුවන් නම් වටිනවා. කියන්න ගොඩක් දේවල් තිබුණත් වේලාව නැහැ. ඒ නිසා මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දින විවාද කෙරෙන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවයි. මම ඉතාම සන්තෝෂ වෙනවා මේ අමාත්‍යාංශ දෙක සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන්.

අද කථා අහගෙන ඉන්නකොට අපි දැනගත්තා අපේ ගරු ඇමතිතුමා මේ අමාත්‍යාංශය භාර ගන්න කලින් තමයි ඔක්කෝම ප්‍රශ්න ටික තිබිලා තිබෙන්නේ කියලා. හැබැයි, ඔබතුමාට ඒ සියලු වගකීම් ටික ලැබිලා තිබෙනවා. ඒ වගකීම් ඉටු කරමින්, ඉදිරි කාලයේදී රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඔබතුමාට විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

ගරු අමාත්‍යතුමනි, මට ලැබී ඇති කාල වේලාව අඩු වුණත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ගැන කථා කරන්නට අවශ්‍යයි. අපි දන්නවා, 1940න් පස්සේ අපේ අමාත්‍යාංශය යටතේ පැවති වතු සමාගම්වලට හෙක්ටෙයාර 925,000කට ආසන්න සංඛ්‍යාවක් තිබිලා තියෙනවා. ඒවායේ තේ සියයට 69කුත්, රබර් සියයට 38කුත්, පොල් සියයට 12කුත් තිබිලා තිබෙනවා. හැබැයි, වර්තමාන තත්ත්වය කොහොමද කියලා ඔබතුමා දන්නවා ඇති. අපි දන්නවා රජයේ වතු private companiesවලට ලබා දී තිබෙන බව. මේ වෙනකොට වතු සමාගම් 23කට ලබා දීලා තිබෙනවා. ඒ වතු සමාගම්වලින් රජයට ලැබෙන බදු ප්‍රමාණය කොපමණද කියලා අපි බලන්න ඕනෑ.

උදාහරණයක් විධියට අපේ දිස්ත්‍රික්කයේ තිබෙන හපුගස්තැන්න වැවිලි සමාගමෙන් ලැබිච්ච ආදායම ගත්තොත්, 2019දී අපට ලැබිලා තිබෙනවා, රුපියල් මිලියන 55ක්. 2023 වෙනකොට ලැබිලා තිබෙනවා, රුපියල් මිලියන 56ක්. හැබැයි, වර්ධනයක් වෙලා නැහැ. එයට හේතුව, ඇමතිවරු ඒ සමාගමට ගිහිල්ලා අදාළ ස්ථාන බලලා එනවා විතරයි. මේ වෙනකොට විශාල වතු සංඛ්‍යාවක වැවිලි කරන්නේ නැහැ. ඒ නිසා ඒවායෙන් ආදායමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා වැවිලි සමාගම් එක්ක කථා කරලා ඒ මුඩු අක්කර ප්‍රමාණය වවන්න යම්කිසි ශක්තියක් ලබා දෙන්න පුළුවන් නම්, ඒකෙන් අපට වැඩි බදු ප්‍රමාණයක් ලබාගන්න පුළුවන් වෙයි. එහෙම නැති වුණොත්, බදු විතරක් අරගෙන ඉන්න කල්පනා කළොත්, ඒ ඉඩම් එන්න එන්නම මුඩු වෙලා දැනට ලැබෙන බදු ප්‍රමාණයවත් නොලැබෙන තත්ත්වයට පත්වෙයි. ඒ නිසා අපි ඒ කටයුත්තට යන්න ඕනෑ. ඔවුන් සමඟ කථා කරලා ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න ඕනෑ. මේ වැවිලි සමාගමේ සේවකයන් හාරදහස් ගණනක් ඉන්නවා. නමුත් වැඩ තිබෙන්නේ, 2,000කට විතරයි. පිට වැඩවලට තමයි අනෙක් 2,000ම යන්නේ. ඒ නිසා මේක විශාල අසාධාරණයක්. මේ කටයුත්ත ප්‍රවර්ධනය කරගන්න ඔබතුමාට යම්කිසි ශක්තියක් ලැබේවි කියලා මම විශ්වාස කරනවා. එහෙම නැති වුණොත් මේ වතු සමාගමෙන් ලැබෙන ආදායම දිගටම අඩු වෙලා යාවි. ගරු ඇමතිතුමනි, 2019 ඉඳලා 2023 දක්වා මේ වැවිලි සමාගමෙන් බදු විධියට ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 309යි; අවුරුදු ගණනාවකින් බදු විධියට ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 309යි. ඒක වර්ධනය කරගන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

ඊළඟට කුඩා තේ වතු හිමියන් ගැන කථා කළොත්, රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 110,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. ලක්ෂ 5කට ආසන්න කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාවක් මේ රටේම ඉන්නවා. ඒ ගොල්ලන් තමයි තේ කර්මාන්තය ඉදිරියට ගෙනියන්න, රටේ ආදායම වැඩි කරගන්න වැඩිම දායකත්වයක් ලබා දෙන්නේ. හැබැයි, මේ VAT එක පැනවීම තුළ දලු හිමියාටත් විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. VAT එක සියයට 18ක් දක්වා ඉහළ නංවන්න තමයි හදන්නේ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලන්නේ, දලු කිලෝවක් සඳහා තිබෙන VAT එක අඩු කරන්න කියලයි. මොකද, VAT එක කැපුවොත් එය දලු කිලෝවක් සඳහා රුපියල් 36ක් වෙනවා. මේක විශාල අසාධාරණයක්. ඔබතුමාත් දන්නවා, පොහොර මිටියක් රුපියල් 10,000යි කියලා. VAT එක ගැහුවොත් රුපියල් 1,800කින් පොහොර මිටියක මිල වැඩි වෙනවා. රුපියල් 1,800ක ප්‍රමාණයකින් වැඩි වුණොත් පොහොර මිල ඉහළ යනවා. දලු කිලෝ එකෙනුත් VAT එක විධියට රුපියල් 36ක් කැපුවොත්, ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම, ඉතාම දිළිඳු ජන කොට්ඨාසයක් එහි ඉන්නේ. සහනාධාර ඉල්ලපු පවුල් සංඛ්‍යාව බැලුවාම දෙලක්ෂ ගණනක් සහනාධාර ඉල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව බලධාරින් සමඟ සාකච්ඡා කරලා තේ කර්මාන්තයට ගසන VAT එක ඉවත් කරලා දෙන්න. ඒක තේ හිමියාට ඔබතුමා කරන පළමුවෙනි ගෞරවය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, කුඩා තේ වතු හිමියන් නිසා තමයි factories ටික රැදෙන්නේ. මේ වෙනකොට 500කට ආසන්න factories සංඛ්‍යාවක් මේ රටේ තිබෙනවා. හැබැයි, මේ අවුරුද්දේ ජනවාරි ඉඳලා දෙසැම්බර් වෙනකොට factories 64ක් වහලා තිබෙනවා. මේක බරපතළ කාරණයක්. ඔබතුමාගේ රජයෙන් factories 10ක් වහලා තිබෙනවා. තේ කර්මාන්තය තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න නම්, අපි දෙගොල්ලන්ම මහන්සි වෙන්න ඕනෑ. අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය අපි ලබා දෙනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා අලුතෙන් අත්දැකීම් ගන්න කෙනෙක්. ඔබතුමාට මේ විෂය ලැබිලා දැනට මාසයක් පමණ වෙනවා. ඒ නිසා මෙතැනින් ඉදිරියට ගිහිල්ලා තේ කර්මාන්තය දියුණු කරගන්න ඔබතුමාට ධෛර්යය, ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව කථා කරන දවස. අපි කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධ වගකීම් උසුලමින් කටයුතු කරපු මෑත අතීතයේ මුල් කාර්තුව ඉතාම අමිහිරි වුණා. අපේ රටේ ගොවි ජනතාව අසීරුතාවන්ට පත් වුණා පමණක් නොවෙයි, ඒවාට විසඳුම් සොයා ගැනීම උදෙසා අපටත් විවිධ තීන්දු තීරණ ගන්න සිද්ධ වුණා. එදා ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් එක්ක මම මේ ක්ෂේත්‍රයේ කටයුතු කළා. වර්තමානයේ ගරු මහින්ද අමරවීර ඇමතිතුමා ඒ අමාත්‍යාංශයේ කැබිනට් ඇමතිතුමා හැටියට පත්වෙලා ඉන්නවා. එතුමාත් එක්ක රාජ්‍ය ඇමතිවරු හැටියට කටයුතු කරනවා, ගරු නීතිඥ මොහොන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමා, ගරු කාදර් මස්තාන් මැතිතුමා සහ ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා. අමාත්‍යාංශය තුළ අපට හොඳ මාර්ගෝපදේශකත්වයක් තිබෙනවා. ගොවි ජනතාවගේ හද ගැස්ම පිළිබඳව අවබෝධයක් තිබෙන, ගොවි ප්‍රශ්න පිළිබඳව අවබෝධයක් තිබෙන දේශපාලන නායකත්වයක මෙහෙයවීම තුළ ගොවි ජනතාව මුහුණ දීලා තිබුණු අසීරුතාවලින් ඔවුන් මුදා ගන්නට අපට පුළුවන්කමක් ලැබුණා.

ඒකට නායකත්වය දුන්නේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මාර්ගෝපදේශකත්වය තුළ අපේ කැබිනට් අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා. කඩා වැටුණු කෘෂි කර්මාන්තය මේ වන විට හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. ස්වාභාවික තත්ත්වවලට මුහුණ දෙන ගොවියාට සහන දෙන්නත්, රටේ ආර්ථිකයට වටිනාකම් එකතු කරන්නත් මේ අමාත්‍යාංශය කටයුතු කිරීම මා විශ්වාස කරනවා, අපට සැහීමකට පත් වෙන්න පුළුවන් කාරණාවක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පැවරුණු වගකීම තමයි, රටේ ජනතාවගේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සහ ඔවුන්ගේ ප්‍රෝටීන අවශ්‍යතාව සම්පූර්ණ කිරීම. පසුගිය කාලයේ අපි දැක්කා, රට අස්ථාවර තත්ත්වයට පත් වෙනකොට රටේ ආහාර උද්ධමනය ඉහළ ගිහිල්ලා, ජනතාව මන්දපෝෂණයෙන් පෙළෙන තත්ත්වයක් ඇති වුණු ආකාරය. නමුත් මේකට පාදක වෙච්ච කාරණාවලට විසඳුම් දෙන්න අපට පුළුවන් වුණා. ආහාර උද්ධමනය ඉහළ යනකොට ආහාර සුලබ කරන්නට පොහොර සහනාධාර ලබා දුන්නා. කෘෂි කර්මාන්තයට නොයෙකුත් සහනාධාර දීලා මේ රටේ කෘෂි කර්මාන්තයේ නිරත වෙලා ඉන්න ගොවි ජනතාවගේ ආර්ථික ශක්තියට වටිනාකම් එකතු කරලා, ඔවුන්ගේ දහඩිය බින්දුවලින් මහපොළොවත් එක්ක ගැටිලා ආහාරවලින් රට ස්වයංපෝෂිත කරන්නත් පුළුවන්කමක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රෝටීන අවශ්‍යතාව කියන එක මන්දපෝෂණයත් එක්ක බැඳිච්ච කාරණාවක්. මේ තත්ත්වය බරපතළ විදියට කඩා ගෙන වැටිලා තිබෙන වේලාවක රටේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරන්නට අද කාර්යක්ෂම විදියට අපි මැදිහත් වෙලා තිබෙනවා. මේ සඳහා මූලික කාරණයක් වන ජාතියේ කිරි අවශ්‍යතාව ගත්තාම, අපිට අවශ්‍ය වෙන කිරි ප්‍රමාණය අවුරුද්දකට ලීටර් මිලියන 750ක්. අපි ඒ කිරි අවශ්‍යතාව සම්පූර්ණ කරන්නට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය දීලා ඒ වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරි ලීටර් මිලියන 750ක් ඕනෑ කරනකොට එයින් සියයට 60ක්ම ආනයනය කරන තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. අපේ රටේ පසුගිය අවුරුද්දක කාලය ගත්තොත්, රුපියල් බිලියන 58ක වියදමින් ආසන්න වශයෙන් පිටි කිරි මෙට්‍රික් ටොන් 8,227ක් ආනයනය කරලා තිබෙනවා. මේක අපට තිබෙන අභියෝගයක්. මේ රුපියල් බිලියන 58 ලංකාවේ ගොවි ජනතාවට දෙන වැඩ පිළිවෙළක් අපි හදන්න අවශ්‍යයි. අපේ රටේ කිරි කර්මාන්තයේ නිරත ගොවි ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා. කිරි ගොවීන් 349,367ක්, ඒ වාගේම කිරි ගවයින් මිලියන 1.65ක්, මී ගවයින් මිලියන 0.49ක් එක්ක තමයි මේ ගනුදෙනුව අපට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න නම්, ඉන්න ගව ගහනය වැඩි කරන්න අවශ්‍යයි. ඒකට අවශ්‍ය සහයෝගය රජයක් හැටියට අපි ගොවි ජනතාවට ලබා දෙන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් කිව්වා, රජය මේ සඳහා මැදිහත් වෙන්නේ නැහැයි කියලා. අපේ රටේ ඉන්න සුළු සහ මධ්‍ය පරිමාණ කිරි ගොවීන් ශක්තිමත් කරන්නට අපේ අමාත්‍යාංශය පමණක් නොවෙයි, පළාත් 9ක ඒ පළාත් සභාත් එකට එකතු වෙලා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මූලික වශයෙන් අපට අවශ්‍යයි, මේ සතුන්ගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කරන්න. ඒකට අවශ්‍ය කරන තණකොළ ටික හදන්න අද අපේ ඇමතිතුමා තීන්දුවක් අරගෙන තිබෙනවා. තණකොළ භෝගයක් ලෙස සලකා, වාරි කර්මාන්තවල ප්‍රතිලාභ අරගෙන ඒ ඉඩම්වල තණකොළ වගා කරන තැනකට එන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා, ඒ සතුන්ගේ පෝෂණ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න. ඊට අමතරව, දියුණු වර්ගයේ තණකොළ හදලා

[ගරු ඩී.බී. හේරත් මහතා]

ප්‍රෝටීන වැඩි ප්‍රමාණයක් හදන තත්ත්වයටත් ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ කිරි ගොවීන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නත් අපි කටයුතු කරනවා. ඒ කියන්නේ, ගව ගාල් හදන්න, ඒකට අවශ්‍ය උපකරණ දෙන්න ආදී වශයෙන් ඒ කටයුත්ත පහසු කරන්නත්, ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වාගේ දේවල් පිළිබඳවත් අවධානය යොමු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අවධානය තවත් කාරණයකට යොමු වෙලා තිබෙනවා. ඒ තමයි මේ වන විට ලංකාවේ වසරකට මේ සත්ව පැටව් හම්බ වෙන්නේ ලක්ෂයක විතර ප්‍රමාණයක්. ඒකෙන් සියයට 50යි වැස්සි පැටව් හම්බ වෙන්නේ. ඒ තත්ත්වය වැඩි කරන්නත් දැන් කටයුතු කර තිබෙනවා; sexed semen අරගෙන ඒක වැඩි දියුණු කරන තත්ත්වයට ගේන්න සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කටයුතු කරලා තිබෙනවා. ඊට අමතරව, පෞද්ගලික අංශයේ ව්‍යවසායකයනුත් මේ ක්ෂේත්‍රයට එකතු කර ගැනීමේ ක්‍රියාමාර්ගයකට අපි අවතීර්ණ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනින් එහාට ගිහිල්ලා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මිල්කෝ ආයතනයේ රේණුක පෙරේරා සභාපතිතුමා අද ඒ වගකීම භාර අරගෙන දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළ, ඒ වාගේම මේ රටේ ජනතාවට පරිභෝජනයට අවශ්‍ය කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කරන වැඩ පිළිවෙළ කරගෙන යනවා.

ඊට අමතරව මේ කිරි නිෂ්පාදන, නැත්නම් පශු සම්පත් ක්ෂේත්‍රයේ පුරෝගාමියා හැටියට තිබෙන ආදර්ශවත් ආයතනය වන්නේ, NLDB එක - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයයි. එහි සභාපති Prof. Cyril මැතිතුමා මේ වැඩ පිළිවෙළේ නායකත්වය අරගෙන වැඩ කටයුතු ක්‍රමවත්ව කරගෙන යන්න විශාල මහන්සියක් දරනවා. මේ සියලු කාරණා ඇතුළත් නියමු ව්‍යාපෘතීන් දෙකක් තමයි එම ස්ථාන තුළ ක්‍රියාත්මක වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපට තිබෙන අභියෝගය තමයි පිටි කිරි වෙනුවට ජනතාව දියර කිරි භාවිතයට හුරු කිරීම. ලෝකයේ විවිධ රටවලින් ගෙනෙන පිටි කිරිවල පෝෂණ තත්ත්වය අඩුවෙලා තිබෙන බව අපි දන්නවා. මේ තත්ත්වය තේරුම් නොගත්ත පිරිස් පිටි කිරි භාවිත කරන්න උත්සාහ කරනවා. නමුත්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමත් එක්ක, ඒ වාගේ විවිධ සෞඛ්‍ය ස්ථාන තුළින් ලැබෙන දැනුමත් එක්ක අද ජනතාව දියර කිරි භාවිත කරන්න පෙලඹිලා තිබෙනවා. ඒ නිසා අපේ අමාත්‍යාංශය මේ වෙනුවෙන් දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළට ප්‍රමුඛතාව දීලා කටයුතු කරනවා.

ඊට අමතරව මම මේ ගරු සභාවේ අවධානය මේ කාරණය සඳහාත් යොමු කරවන්න කැමැතියි. ඒ තමයි, ප්‍රෝටීන් පිළිබඳව කථා කරන විට වැදගත් ස්ථානයක් ගන්නා අපේ රටේ කුකුළු කර්මාන්තය ගැන. ලංකාවේ කුකුළු කර්මාන්තය ඉතාම හොඳ, ස්වයංපෝෂිත තත්ත්වයක තිබුණා. පසුගිය කාලයේ ආර්ථිකය කඩාගෙන වැටුණාම, කොවිඩ් උවදුරත්, අරගළයත් එක්ක මේ කර්මාන්තය සහමුලින්ම කඩාගෙන වැටුණා. මේ කර්මාන්තයට ඇතිවෙලා තිබෙන ගැටලු පිළිබඳව අපි සොයා බැලුවා. ඒකට අවශ්‍ය මව් සත්තු ටික ලංකාවට ගේන්න අපි කටයුතු කරනවා. අද මව් සත්තු අපට අවශ්‍ය ප්‍රමාණය ගෙනල්ලා තිබෙනවා. හදිසි කටයුත්තක් හැටියට දැන් හැචරිවලින් නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වෙනවා. ගරු අමාත්‍යතුමාත් එතුමාගේ කථාවේදී මේ සම්බන්ධයෙන් කිව්වා. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ආදර්ශවත් ක්‍රියාවක නිරත වුණා. විදේශ රටවලින් සංසේචිත බිත්තර අරගෙන ඇවිල්ලා, ක්ෂණිකව පැටවු හදලා, ඒ සතුන් වැසීගිය කුකුල් ගොවිපොළවලට ලබාදෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ විතරක් නොවෙයි, මේ වැඩ පිළිවෙළ තුළ තිබුණු යම් යම් ගැටලු සහගත තත්ත්වයන් නිරාකරණය කරන්න අපේ දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා, වැහිච්ච කුකුළු ගොවිපොළ ටික අද වන විට යළි ආරම්භ කරලා තිබෙනවා. මීට මාස තුන හතරකට කලින් ලංකාවේ තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. අපි විදේශ රටවලින් බිත්තර ආනයනය කළා. එතැනින් එහාට ගිහිල්ලා බිත්තර සහ මස්වලින් ස්වයංපෝෂිත වෙන තත්ත්වයකට අපේ රට අද පත්වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, අද වන විට විදේශ රටවලට මස් සහ බිත්තර විකුණලා ඩොලර් හොයන තැන දක්වා අද අපි ඇවිල්ලා තිබෙනවා. මේ වෙනුවෙන් පැහැදුණු, පෙනී ඉන්න පෞද්ගලික අංශය ඉතා ශක්තිමත් විධියට ඒ කර්මාන්තයේ යන්ත්‍රණය මෙහෙයවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි විශ්වාස කරනවා එළැඹෙන උත්සව සමය වන විට ඒ සියලු අවශ්‍යතා සම්පූර්ණ කරන්නට. අපේ රජයේ අවධානය යොමු වෙලා තිබුණා, විදේශ රටවලින් බිත්තර ආනයනය කරන්න. මේ යන ක්‍රමවේදයත් එක්ක අපිට ඉතා ඉක්මනින්, නුදුරු අනාගතයේදී බිත්තර සහ මස්වලින් ස්වයංපෝෂිත වෙන්න පුළුවන් කියන කාරණාව විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි. මෙවැනි තත්ත්වයක් තුළ අපි ඉක්මනින් ජයග්‍රහණ කරා ළඟා වෙන්න කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශයක් හැටියට අපේ කැබිනට් ඇමතිතුමාත්, රාජ්‍ය ඇමතිවරුත් එකට එකතු වෙලා, එක පවුලක පිරිසක් හැටියට අපි කටයුතු කරනවා. එහෙම කටයුතු කරන විට අපට මේ ජයග්‍රහණ කරා ළඟා වෙන්න නිලධාරි මට්ටමේ සියලු දෙනාගේම සහයෝගය අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා මෑතකදී තමයි ඒ තනතුරට ආවේ. කලින් හිටපු ලේකම්තුමාත් අපට විශාල සහයෝගයක් දැක්වූවා. අවබෝධයකින් යුක්තව කටයුතු කරන කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, ඒ වාගේම ආයතනික ප්‍රධානීන් සියලු දෙනාත් මේ වෙනුවෙන් විශාල සහයෝගයක් දක්වනවා.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් ඒ හා සමාන වගකීමක් ඉටු කරනවා. ඒ වාගේම කෘෂි රක්ෂණ මණ්ඩලය, පොහොර සමාගම් දෙකක් වන කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ලංකා පොහොර සමාගම, අනිකුත් පර්යේෂණ ආයතන කියන මේ සියලු ඒවායේ ක්‍රියාකාරිත්වය තුළින් අපිට උචිත, ගැළපෙන විධියට විවිධ වැඩසටහන් විවිධ පැතිකඩ ඔස්සේ ක්‍රියාත්මක කරන්න අපි මහන්සි වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තාම පර්යේෂණාත්මකව ඒ වැඩසටහන් කරන්න අවශ්‍ය සහයෝගය උපරිම මට්ටමෙන් අපට ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්මය කියන්නේ ලෙහෙසි පහසු දෙයක් නොවෙයි කියලා අපි දන්නවා. මේ රටේ සීමිත ඉඩ කඩක් තුළ, අසීමිත වුවමනාවන් ඉටු කරන්න යනකොට, වැඩි අස්වැන්නක් අපේක්ෂාවෙන් අපි බොහෝ කටයුතු කරන්න උත්සාහ කරනවා. ඒ වෙනුවෙන් අලුත් ප්‍රභේද සොයා ගන්නවා. විදේශ රටවල තාක්ෂණය අපේ රටට අරගෙන එනවා. අපේ පර්යේෂණ ආයතනවල ක්‍රියාකාරකම් තුළ නව ප්‍රභේද සොයා ගන්නවා.

ඒ එක්කම අපි මුහුණ දෙන ඊළඟ ගැටලුව තමයි, පළිබෝධ ක්‍රියාකාරකම්. ඒ තුළින් අපේ අස්වැන්නට හානි වෙන අවස්ථා

තිබෙනවා. මේ පළිබෝධ ක්‍රියාකාරකම් තුළින් අපේ ගොවි ජනතාව ආරක්ෂා කර ගන්න පර්යේෂණ ආයතන විවිධ ආකාරයේ මහන්සියක් දරනවා. ගොවි බිම් රැක ගන්න, වැඩි අස්වැන්නක් ලබා ගන්න අවශ්‍ය පසුබිම හදන්න ඔවුන් කටයුතු කරනවා. මේ විධියට ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා යන ගමනේදී අපේ ජනාධිපතිතුමා කෘෂිකර්ම අමාත්‍යාංශයට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් ලබාදීම නිසා අපි විශ්වාස කරනවා, මේ රටේ කෘෂි කර්මාන්තය, කෘෂි ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් පදනමක් අමාත්‍යාංශයට තිබෙනවා කියලා.

මේ සියලු කාරණා කටයුතු කරද්දි, විශේෂයෙන් මේ රටේ ජනතාව මෑත භාගයේ ලබපු අත්දැකීම් කීපයක් තිබුණා. ඒ තමයි, රසායනික පොහොර භාවිත කිරීම සහමුලින්ම නවත්වා දැමීමෙන් පසු ගොවිබිම්වල සිද්ධ වුණු කඩා වැටීම. ඒ වාගේම කාබනික පොහොර පමණක් භාවිත කළාම අස්වැන්න අවශ්‍ය ඉලක්කය කරා ගන්න බැරිවීම. අද වන විට ඒ තත්ත්වය තේරුම් අරගෙන තිබෙනවා. අපේ ගොවිබිම්වලට රසායනික පොහොර සහ කාබනික පොහොර භාවිත කිරීමත් එක්ක සෞඛ්‍ය සම්පන්න, හොඳ අස්වැන්නක් නෙළා ගන්න පුළුවන්ය කියන අත්දැකීම අපට ලබා ගන්න පුළුවන් වුණා. ඒ අත්දැකීම අපට ලබා ගන්න පුළුවන් වුණේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මේ ක්‍රියාකාරකමත් එක්කයි. ඒ නිසා මම විශ්වාස කරනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ලබා දුන් කාලය අවසන් කියනවා. ඔබතුමාට මම සහයෝගය දක්වනවා.

අපේ රටේ ජනතාවගේ ආහාර අවශ්‍යතාව, ඒ වාගේම ප්‍රෝටීන අවශ්‍යතාව ඉටු කරන්න අපි අපේ අමාත්‍යතුමා එක්ක උපරිම මට්ටමින් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ කණ්ඩායමක් හැටියට දේශපාලන නායකත්වය අරගෙන කටයුතු කරනවා. ඒ වාගේම අපේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරිතුමන්ලා උපරිම මට්ටමින් අපට ලබා දෙන සහයෝගයත් එක්ක, අපි 2023 වසරට වඩා 2024 වසරේ දී තව පියවරක් ඉස්සරහට තබන්න සූදානම්ය කියන කාරණාව මතක් කරමින්, අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන අද අපි සාකච්ඡා කරනවා. මේ අමාත්‍යාංශ දෙකම භාරව ඉන්නේ පෞද්ගලිකව මගේ දීර්ඝ කාලීන මිත්‍රයකු වන ගරු මහින්ද අමරවීර ඇමතිතුමායි. 1994දී ඉඳලා අපි බොහොම ළඟ මිත්‍රයෝ. දේශපාලන වශයෙන් ඇති වෙච්ච යම් යම් මතිමතාන්තර නිසා දැන් ටිකක් ඈත් වෙලා හිටියාට, ඉස්සර එතුමාගේ නිවස අපට අපේ නිවස වාගෙයි. මගේ නිවස එතුමාට, එතුමාගේ නිවස වාගෙයි. අපි බොහොම ළඟින් ආශ්‍රය කළේ. එතුමාට වැඩක් භාර දුන්නාම, ඒ වගකීම ඉතාම හොඳට කරන්න පුළුවන් කෙනෙක්. ඒ නිසා වෙන්නට ඕනෑ, ගරු ජනාධිපතිතුමා කෘෂිකර්ම අමාත්‍යාංශය වාගේ වගකීම් විශාල ප්‍රමාණයක් තිබෙන අමාත්‍යාංශයත් එක්ක නැවත වරක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් එතුමාට භාර දුන්නේ. ගරු ජනාධිපතිතුමාගේ විශ්වාසය එතුමා දිනා ගෙන තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ගරු ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. එතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉඩම් බැංකුවක් හදලා, එතුමාට පුළුවන් විප්ලවීය වෙනසක් කරන්න; he could establish a land bank. ඒ කියන්නේ කෘෂිකර්මය සඳහා යොදා ගත හැකි ඉඩම් ලංකාවේ බොහෝ ප්‍රදේශවල වෙන වෙන තැන්වල තිබෙනවා. ලංකාවේ ඉඩම් ගත්තොත්, සමහර ඉඩම්වල අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට. සමහර ඉඩම්වල අයිතිය තිබෙන්නේ LRC එකට. සමහර ඉඩම්, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ තිබෙනවා. තවත් ඉඩම් කොටසක් වෙන කොටසකට අයිතිය තිබෙනවා. මම එදා අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේ දී අධිකරණ ඇමතිතුමාට යෝජනා කළා, මේ සියලු ඉඩම් එක පනතක් යටතට ගෙනැල්ලා, ඒ පනත තුළින් කෘෂි කර්මාන්තය හා වැවිලි කර්මාන්තය සඳහා තිබෙන ඉඩම් ටික වෙනම හඳුනා ගෙන ඉඩම් බැංකුවක් හදන්න කියලා. ඒ හරහා වී වගාවට අහවල් ප්‍රදේශයේ ඉඩම්, අහවල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම්, ඊළඟට තේ වගාවට හා වෙනත් අපනයන භෝගවලට අහවල් ප්‍රදේශයේ ඉඩම් යනාදී වශයෙන් වෙන් කරලා වෙන වෙනම වගා කිරීමේ හැකියාව තිබෙනවා. බොහෝ දියුණු රටවල ඒ විධියට ඉඩම් බැංකු හදලා, කෘෂි කර්මාන්තය හා වැවිලි කර්මාන්තය දියුණු කිරීමේ ක්‍රමවේද තිබෙන ආකාරය අපි දැකලා තිබෙනවා.

පළපුරුදු ඇමතිවරයකු විධියට ගරු මහින්ද අමරවීර ඇමතිතුමා, එතුමාට ලැබිලා තිබෙන එක් අමාත්‍යාංශයක් වන කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා වී ගොවීන් සම්බන්ධයෙන් විශාල අවධානයකින් කටයුතු කරනවා. හැබැයි, අපේ දිස්ත්‍රික්කයේ ගත්තොත්, මහවැලි "සී" කලාපය වැනි කලාපවල පරම්පරා තුනක්ම ඉන්නේ මීට අවුරුදු තිහකට, හතළිහකට ඉස්සෙල්ලා තිබුණු ඉඩම්වලම තමයි. ගොඩ ඉඩම් සහ මඩ ඉඩම් වශයෙන් පළමුවැනි පරම්පරාවට දුන් ඉඩමේ තමයි, පරම්පරා තුනේම අය වගා කරන්නේ. ජීවත් වෙන්නේත් ඒ ඉඩම් කොටසේම තමයි. දැන් වතුකරයේ ඉන්න දෙමළ ජනතාවට ඒ අවශ්‍ය කරන ඉඩම් ලබා දෙන්න ඉතාම හොඳ යෝජනාවක් කළා. වතුකරයේ ඉන්න දෙමළ ජනතාව අපේ රටට ඇවිල්ලා අවුරුදු 200ක් වෙනවා. ඒ අයට අවශ්‍ය කරන ඉඩමක් දෙන්න, ගෙයක් හදා ගන්න අවශ්‍ය වටපිටාව අපි සැකසුවා. මේ මහවැලි කලාපවල පරම්පරා තුනක් විතර එකම ගෙදරක, එකම ඉඩම් කොටස්වල පදිංචි වෙලා ඉන්නවා. ඒ අවුරුදු 40ක් තිස්සේ වගා කරන ඉඩම්වලම තමයි, ඒ පුත්තු, මුනුබුරන් සහ මිනිබිරියන් පදිංචිවෙලා ඉන්නේ. ඒ අයටත් අවශ්‍ය කරන ඉඩම් අලුතෙන් ලබා දීලා, පහසුකම් ලබා දෙන්න කටයුතු කළොත් ඒක ලොකු පිනක් කියලා මම හිතනවා.

දැන් හැම එකකටම VAT එක වදිනවා. හෙට - ඉරිදා දවසේ - VAT එක සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නවා. අද අපි ගොවියාට සහන දෙන්න කථා කරනවා. අද අපි කුඩා තේ වතු හිමියාට සහන දෙන්න කථා කරනවා. අද අපි කථා කරනවා අල ගොවියාට සහන දෙන්න. හෙට පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව මේ සියලු ගොවීන්ගේ විවිධ කෘෂි යෙදවුම්වලට VAT එක ගහනවා. VAT

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

එක ගහපු ගමන් අද මේ කථා කරන සියලු දේවල් අපතේ යනවා. හෙට පනත් කෙටුම්පත සම්මත වෙලා VAT එක ගහපු ගමන් කුඩා තේ වතු හිමියාගේ තේ නිෂ්පාදන පිරිවැය ඉහළ යනවා. ගොවියාගේ කෘෂිකර්මාන්තයට අවශ්‍ය විවිධ යෙදවුම්වලට VAT එක ගහපු ගමන් ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ යනවා. අල ගොවියාගේ නිෂ්පාදන පිරිවැය ඉහළ යනවා. මේ මොහොතේ අපේ පළාතේ අල ගොවියෝ බලාගෙන ඉන්නවා, ඊළඟ කන්නයේ අල වගාව කරන්න. ඒ ගොල්ලන් දැනටම බැංකුවලට සල්ලිත් බැඳලා ඉවරයි. සමහර වෙලාවට තවම ඒ ගොල්ලන්ට පිටරටින් එන බීජ අල ලැබිලා නැහැ. මේ දවස්වල බීජ අල කිලෝ 50ක පෙට්ටියක් සාමාන්‍යයෙන් රුපියල් 37,000ක, 40,000ක මිලකට යන්නේ. සාමාන්‍යයෙන් කිලෝ 50ක පෙට්ටියක ඇති බීජ අල වගා කරලා අවසාන වෙනකොට යෙදවුම් ගාස්තු, පොහොර, කුලී ගාස්තු ගත්තාම රුපියල් ලක්ෂයක් විතර වෙනවා. මෙතැනදී එකට දහයක් අස්වැන්න ලැබුණත්, රුපියල් 200 ගණනේ ගොවියා තමන්ගේ අස්වැන්න විකුණුවත් රුපියල් ලක්ෂයයි ලැබෙන්නේ. ඒ කියන්නේ ලාභයක් නැහැ. VAT එක වැදුණාට පස්සේ නිෂ්පාදන පිරිවැය තවත් ඉහළ යනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට මම යෝජනාවක් කරන්න කැමතියි. ගරු ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. රාජ්‍ය නිලධාරි මැදිරියේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් ඉන්නවා. අපේ ගොවිජන මධ්‍යස්ථාන හරහා අල වගා කරන ගොවියාට බීජ අල පෙට්ටි ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. මොකද, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර මහත්වරු එක්කෙනෙකුගේ, දෙන්නෙකුගේ යම් යම් අකටයුතුකම් තිබෙන්න පුළුවන්. ඒ අකටයුතුකම් පිළිබඳව නිවැරදි නිරීක්ෂණයක් කරලා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර මහත්වරු හරහා අල ගොවීන්ගේ නම් ලැයිස්තුව අරගෙන ඒ ගොවියෝ සල්ලි බැන්දාම බීජ අල පෙට්ටි ටික ඒ ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා දෙන්න පුළුවන් නම් මීට වඩා ඉක්මනටම අල ගොවියාට සහනයක් කළා වෙනවා. ඒ අයට වැය වන නිෂ්පාදන පිරිවැයත් -ප්‍රවාහන ගාස්තුව යනාදිය- එතැනින් අඩු වෙනවා.

ඊළඟට, එළවලු ගොවියා ගැනත් මම කතා කරන්න ඕනෑ. එළවලු ගොවියා අද අන්තිම අමාරුවේ. මේ දවස්වල මිනිස්සු කෑ ගහනවා, බෝංචි කිලෝ එක රුපියල් 500 දක්වා මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා. හැබැයි, එළවලු කිලෝවක මිල රුපියල් 500යි කියලා අපි එළවලු ගොවියාට කෑ ගැහුවාට, එළවලු ගොවියාගේ නිෂ්පාදන පිරිවැය පිළිබඳව කවුරුවත් බලන්නේ නැහැ. අද මේ වෙනකොට අපේ කුඩා තේ වතු හිමියාට දෙන පොහොරවල ප්‍රමිතියේ විශාල අඩුවක් තිබෙනවා. ඒ පොහොරවල යූරියා තිබෙන්න ඕනෑ ප්‍රමාණය ඉතා අඩුවෙන් තිබෙන්නේ. අපේ පළාත්වල කුඩා තේ වතු හිමියන්ගේ තේ රුපියල් 150ක, 154ක මිලකට දැන් අළෙවි වෙනවා. නමුත්, අස්වැන්න අඩු වෙලා. කුඩා තේ වතු හිමියෙකුට තමන්ගේ වත්තේ වැඩ කරන්න කුලී සේවකයෙක් දැන් ඉස්සර වාගේ රුපියල් 1,000කට ගන්න බැහැ. අඩුම ගණනේ රුපියල් 2,000ක්වත් දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩා තේ වතු හිමියා කියන්නේ අපේ රටේ කවදාවත් ආණ්ඩුවකට එරෙහිව ප්‍රශ්න ඇති කරපු කෙනෙක් නොවෙයි; පාරට බැහැලා, උද්ඝෝෂණ කරලා, තේ දලු පෙට්ටි ගිනි තියලා එහෙම කටයුතු කරපු කෙනෙක් නොවෙයි. කුඩා තේ වතු හිමියා කියන්නේ තමන්ට තිබෙන කුඩා තේ වතු ප්‍රමාණය වගා කරගෙන, ආණ්ඩුවට බරක් වෙන්නේ නැතිව, දේශපාලනඥයන්ගේ ගෙවල්වල රැකියා පෝලිමේ ඉන්නේ නැතිව ඉතා සාමකාමීව, සරලව ජීවත් වන මනුස්සයෙක්. නමුත් කාබනික පොහොර භාවිතය නිසා කුඩා තේ වතු හිමියා සම්පූර්ණයෙන්ම ඇද වැටුණා. ඒ දවස්වල වැවිලි කර්මාන්ත ඇමතිතුමා හැටියට හිටපු ගරු රමේෂ් පතිරණ මැතිතුමාට මම මන්තරයක් වාගේ කිව්වා, "අනේ! ඇමතිතුමා, තේවලට නම් කාබනික පොහොර ගෙනෙන්නම එපා" කියලා. එතුමා උත්සාහ ගත්තා කැබිනට් මණ්ඩලයට ඒ කාරණය ඉදිරිපත් කරලා ඒක නවත්වන්න. නමුත්, හරිගියේ නැහැ. කාබනික පොහොර වගාවන්ට යෙදීම ආරම්භ කළ ගමන් අපේ කුඩා තේ වතු හිමියෝ සම්පූර්ණයෙන්ම ඇද වැටුණා. තවමත් ඒ අයට නැඟිටින්න පුළුවන්කම ලැබිලා නැහැ. කුඩා තේ වතු හිමියා කියන පුද්ගලයා කවදාවත් රටේ කිසිම ආණ්ඩුවකට බරක් නොවුණු කෙනෙක්. ඒ අය කිසි කෙනෙකුට විරුද්ධව පාරේ බැහැලා උද්ඝෝෂණය කළ කට්ටිය නොවෙයි, ඉතා සාමකාමීව බොහොම සරලව ජීවත් වූ මිනිස්සු පිරිසක්. කුඩා තේ වතු හිමියා අද සම්පූර්ණයෙන් ඇද වැටිලා තිබෙනවා. ඒ නිසා අද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එකතු වෙලා කුඩා තේ වතු හිමියා සම්බන්ධයෙන් දෙන්න පුළුවන් සහන ටික දුන්නේ නැත්නම් අපට ලැබෙන ඩොලර් ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසා ගුණාත්මකභාවයෙන් වැඩි, ඒ කියන්නේ සාමාන්‍යයෙන් මිල වැඩි නිෂ්පාදනයක්, ඒ කියන්නේ හොඳ තේ දල්ලක් නිර්මාණය කිරීමට නම් කුඩා තේ වතු හිමියන්ට මීට වඩා අත දිය යුතුමයි. ඒක අපේ රටේ අද තිබෙන මේ ආර්ථික අර්බුදයට එක්තරා ආකාරයක විසඳුමක් වෙනවා. ඒ කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. එතුමාත් වැවිලි කර්මාන්තයට සම්බන්ධ ප්‍රදේශයක ඉන්නේ. හෙට දිනයේදී VAT එකට අදාළ පනත් කෙටුම්පත සම්මත කරනකොට කරුණාකරලා කෘෂි කර්මාන්තයට සහ වැවිලි කර්මාන්තයට අදාළ අංශවලට VAT එක exempt කරන්න; අයින් කරන්න. ත්‍රිපෝෂවලට අයින් කරන්න, සමපෝෂවලට අයින් කරන්න. නැත්නම් විශාල අර්බුදයකට මුහුණ පානවා, මේ අංශ දෙකම කඩා වැටෙනවා කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

කෘෂි කර්මාන්තයට නවීන තාක්ෂණය යොදා ගන්න කියලා අපි දැන් යෝජනා කරනවා. ඒක ඉතාම හොඳයි. නවීන තාක්ෂණය යොදා ගන්න යෝජනා කරන ගමන්, කෘෂි කර්මාන්තයේ නවීන තාක්ෂණය යොදා ගන්නා යෙදවුම්වලට, තේ කර්මාන්තයේ යෙදවුම්වලට VAT එක ගහනවා. එතකොට කොහොමද නවීන තාක්ෂණය යොදා ගන්නේ? වම් අතින් දීලා දකුණු අතින් ගන්නවා. නැත්නම් වම් අතින් දීලා දකුණු අතින් මුහුණට ගහනවා. එවැනි ප්‍රතිපත්තියක් තුළ, ඒ කියන්නේ හෙට ඉඳලා VAT එක ක්‍රියාත්මක වෙලා ඒ අවශ්‍ය සහනය ලබා දෙන්නේ නැත්නම් අපි අද ඉදිරිපත් කරන යෝජනා සියල්ල අපතේ යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසාන කරනවා.

අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා, අවුරුදු 200ක් විතර මේ රටේ අප සියලුදෙනා වෙනුවෙන් වැඩ කරපු වතු කම්කරුවන්ට අවසානයේවත් ඉඩම් ටික ලබා දීලා පදිංචි වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමා සභාවට පැමිණියා. ගරු ඇමතිතුමාට මම අවසාන වශයෙන් මේ කරුණ කියන්නම්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම ඔබතුමාගේ කථාව අහගෙන හිටියා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

බොහොම ස්තුතියි. මම ඔබතුමාගේ හොඳත් කිව්වා. අපේ පරණ යාළුකම් ගැනත් කිව්වා. අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. අපේ පළාත්වල විශාල තේ වතුවල මුඩු ඉඩම් තිබෙනවා. ඒවායේ වගා කටයුතු කරලා නැහැ. මම කියන්නේ නැහැ, ඒ ඉඩම් වත්තෙන් පිටට දෙන්න කියලා. නමුත්, සුළු බද්දක් අය කරගෙන වතු කම්කරුවන්ට ඒ ඉඩම් ලබා දෙන්න. ඒ ඉඩම්වල ගෙවල් හදන්න නොවෙයි. ඒ ඉඩම්වල වගා කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. මම මුලින් යෝජනා කළා, මේ සියලු කාරණා කරන්න පුළුවන් වෙන්නේ කොහොමද කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා අර ඉඩම් බැංකු කියන සංකල්පය ඇති කරන්න.

මම කියනවා, අපේ රටේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ වැඩ කරන නිලධාරින්ට promotions දෙන්න ඕනෑ, targetsවලට කියලා; ඒ කියන්නේ, target-oriented promotions. ඒ කියන්නේ target එකක් achieve කළොත් promotions දෙන්න ඕනෑ. අපේ රටේ ගොවීන්ටත් ඒ අය ලබා ගන්නා අස්වැන්න මත, හොඳ අස්වැන්නක් ලබන අයට වඩ වඩාත් සහන දෙන ක්‍රම ඇති කළොත්, ගොවි පවුල් සහ ගොවීන් අස්වැන්න වැඩි කර ගන්න වඩා උනන්දු වෙනවා. ඒ හරහා ඒ අයට උනන්දුවක් ඇති වෙනවා, ඊළඟ අවුරුද්දේ ඊටත් වඩා හොඳට අස්වැන්න ලබා ගන්න. යම්කිසි ඉලක්ක සහගත වැඩ පිළිවෙළක් එක්ක ගොවීන්ට උදවු කිරීමේ ක්‍රමවේදයකුත් සකසන්නට ඔබතුමාට ශක්තිය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩී. වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.06]

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගොවීන් පූර්ණ වශයෙන් කෘෂි කර්මාන්තයේ නියැළෙන දිස්ත්‍රික්කයකින්, කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවීන්ගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ආපු මා වාගේ මන්ත්‍රීවරයෙකුට මෙවැනි වැදගත් අවස්ථාවක කථා කරන්න විනාඩි පහක කාලයක් ලබා දීම ගැන මම අතිශයින් කනගාටු වෙනවා. මොකද, ඒ ගොවීන්ගේ ප්‍රශ්න ගැන, අපි මොනවාද කරන්න ඕනෑ කියන එක ගැන කථා කරන්න අවස්ථාවක් නොලැබීම නිසා. මම දීර්ඝ වශයෙන් විග්‍රහයක් කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අපි ආහාර සුරක්ෂිතතාව ගැන දිගට කථා කරනවා. මම ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා විධියට කටයුතු කරනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරින් මෙතැන තිබෙන රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්නවා. මම දන්නේ නැහැ, අපේ රටට අවශ්‍ය ආහාර ටික නිෂ්පාදනය කර ගන්න අවශ්‍ය දත්ත පද්ධතියක් තිබෙනවාද කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි හිටපු ගමන් අර්තාපල් ලංකාවට ගෙන්වනවා; බිත්තර ලංකාවට ගෙන්වනවා; මස් ලංකාවට ගෙන්වනවා; එළවලු, පලතුරු ලංකාවට ගෙන්වනවා. හැබැයි, ඒ එළවලු අපේ රටේත් වගා කරනවා. අපේ රටේ ඒවා වගා කළ හැකි භූමියත් තිබෙනවා.

උදාහරණයක් විධියට, අපේ රටට අර්තාපල් ගෙන්වනවා නම්, අපේ රටේ වාර්ෂික අර්තාපල් පරිභෝජනය කොච්චරද, ඒ ප්‍රමාණය නිෂ්පාදනය කර ගන්න අපි කොපමණ ඉඩම් ප්‍රමාණයක වගා කරන්න ඕනෑද, වගා කරන අක්කරයකින් අපි කොපමණ අස්වැන්නක් ලබා ගන්න ඕනෑද කියලා අපි කොහේ හෝ ගණනය කරලා තිබෙනවාද? අපේ රටේ එච්චර ඉඩම් නැත්නම්, අපට එච්චර හදන්නත් බැරි නම් අපි කළ යුතු දෙයක් තිබෙනවා. ඊළඟ අවුරුද්ද එන්න කලින් අපි ඊළඟ අවුරුද්දේ අර්තාපල් මෙට්‍රික් ටොන් කීයක් ලංකාවට ගෙන්වන්න ඕනෑද කියලා කියන්න ඕනෑ. එහෙම plan එකක් හදා ගත්තාම මාෆියා ඇති වෙන්නේත් නැහැ, අපට ප්‍රශ්නයක් නැතිව මේ දේවල් ගැන තීරණ ගන්නත් පුළුවන්.

ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපේ රටේ අවශ්‍යතා සපුරාගන්න මේ රටේ තිබෙන සීමිත ඉඩම් තුළ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් මොනවාද, අපි ගෙන්වන්න ඕනෑ දේවල් මොනවාද කියලා database එකක් හදන්න කියලා. එහෙම කරන්නේ නැතිව අපේ රටේ හදාගන්න පුළුවන් දේවලුත් අපි පිට රටින් ගෙන්වනවා. එහෙම කරලා අපි ඩොලර් නැහැ කියනවා. ඩොලර් නැහැ, නැහැ කියලා ළතැවෙනවා. හැබැයි, තිබෙන ඩොලර් ටිකත් වියදම් කරලා, අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවලුත් පිට රටින් ගෙන්වනවා. ගරු ඇමතිතුමනි, මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපි මොනවාද ගෙන්වන්න ඕනෑ, අපි මොනවාද වගා කරන්න ඕනෑ, එහෙම වගා කරනවා නම් ඒ භූමි ප්‍රමාණයෙන් අපි කොච්චර අස්වැන්නක් ගන්න ඕනෑද කියලා නිවැරදි දත්ත පද්ධතියක් හදන්න කියලා. මේ ගැන අවධානය යොමු කරන්න කියලා මා මුලිකව ඉල්ලනවා.

ඒ වාගේම, කෘෂි නවීකරණ ව්‍යාපෘතිය ගත්තාම, අපේ ගරු ජනාධිපතිතුමාත් ඒ ගැන දැඩි උනන්දුවක් දක්වනවා. එතුමා ඒ වෙනුවෙන් කටයුතු කරනවා. කෘෂිකර්ම ඇමතිවරයා විධියට මහින්ද අමරවීර මැතිතුමාත්, රාජ්‍ය ඇමතිවරුනුත්, අපේ නිලධාරිනුත් මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා මා හිතනවා. ගරු ඇමතිතුමනි, අපේ රටේ තිබෙන ඉඩම්වලින් අපි නිසි ප්‍රයෝජන ගන්නවාද? ඒක ඉතාම වැදගත් දෙයක්.

උදාහරණයක් හැටියට අපි බඩඉරිඟු වගා කළොත් ඊළඟ මාස හයේ ඒ ඉඩමෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. අපි මිරිස් වගා කරන ඉඩමෙන් ඊළඟ මාස හයේ කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. හැබැයි, මේ තිබෙන ඉඩම්වලින් නිසි ප්‍රයෝජනයක් ගැනීම සඳහා මේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය ඉතාම වැදගත් වෙනවා. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා උදේ කිව්වා, අක්කර භාගයක මිරිස් වගාවකින් කොච්චර අස්වැන්නක් ගත්තාද කියලා. මමත් ඒක පෞද්ගලිකව දන්නවා. මේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය නිසා රුපියල් ලක්ෂ 60ක, 70ක, 80ක ආදායම් ලබා ගත් අය ඉන්නවා. මේ රටේ තරුණයන්ට රැකියා ලබා දීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ තරුණ තරුණියන් රජයේ රැකියා ඉල්ලන්නේ නැහැ. මේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය ගෙනැල්ලා ඉඩමක් දීලා, අවශ්‍ය පහසුකම් ටික දීලා, ඒ තාක්ෂණය පිළිබඳ දැනුවත් කළාට පස්සේ හොඳ ආදායමක් උපයන්න පුළුවන් තැනට මේ රටේ තරුණ තරුණියන් පත් කරගන්න අපට පුළුවන්. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලනවා, මේ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ තරුණ තරුණියන්ට අවශ්‍ය පුහුණුව ලබා දෙන්න කියලා. මම දැක්කා, තරුණ තරුණියන් වෙනුවෙන් රුපියල් මිලියන 500ක් පමණ වෙන් කරලා තිබෙනවා.

[ගරු ඩී. වීරසිංහ මහතා]

හැබැයි, මීට වඩා වියදම් කරලා හරි කෘෂි නවීකරණ ව්‍යාපෘතිය තුළින් මේ රටේ තිබෙන සීමිත ඉඩම්වලින් ලොකු ප්‍රයෝජනයක් ගන්න කටයුතු කළොත් අපට ලොකු අස්වැන්නක් ලබා ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, අපේ රටට ගෙන්වන බීජ සම්බන්ධවත් මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අපේ රටේ තිබෙනවා, ප්‍රමිති ආයතනය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව දෙන්න, මේ කාරණය කියලා කථාව අවසන් කරනවා.

බීජවල මිල නියාමනය කිරීම, ප්‍රමිතිය සහතික කිරීම ඉතාම වැදගත් වෙනවා. ගරු ඇමතිතුමනි, එකම බීජය රුපියල් 1,000ට ගන්නත් තිබෙනවා, රුපියල් 1,500ට ගන්නත් තිබෙනවා, රුපියල් 2,000ටත් ගන්න තිබෙනවා. එකම බෙහෙත රුපියල් 1,000ට ගන්න තිබෙනවා, රුපියල් 2,000ට ගන්න තිබෙනවා, රුපියල් 3,000ටත් ගන්න තිබෙනවා. එම නිසා ගොවියෝ අසරණ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරි නිෂ්පාදනය ගැන කියලා මගේ කථාව අවසාන කරනවා, මට විනාඩියක් දෙන්න. ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 60ක් ආනයනය කරන බව. මම ඊයේ-පෙරේදා මහඔය ගමට ගියා. කිරි කර්මාන්තයේ යෙදෙන ගොවි කාන්තාවක් කියනවා, මන්ත්‍රීතුමා බලන්න, මට කිරිදෙනුන් 20ක් ඉන්නවා, මේ දෙනුන් 20 බලාගන්න එක දැන් මට එපා වෙලා තිබෙන්නේ, මොකද, ඒ සතුන් අනික් වගාවන්ට හානි කළාම ඒවාට වන්දි ගෙවන්නත් මට සිදු වෙනවා, ඒ නිසා මට මේකෙන් පාඩුයි කියලා. මම ඇහුවා, ඒ සතුන්ගෙන් කිරි කොච්චර ගන්නවාද කියලා. එක දෙනකගෙන් කිරි ලීටරයයි ලු, ගන්නේ. මම කිව්වා, අතින් කාලා හරක් බලනවා කියන කථාව හරි නේ කියලා. දෙනුන් 20ක් හදලා කිරි ලීටර් 20ක් නම් ගන්නේ, වැඩක් තිබෙනවාද? කිරිදෙනකගෙන් කිරි ලීටර් 20, 30 ගන්න පුළුවන් ක්‍රම අද ලෝකයේ තිබෙනවා. අපේ රටේ අඩුම කිරි ලීටර් 10ක්, 15ක් දෙනකගෙන් ගන්නවා. ඒ හින්දා කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ මිනිස්සුන්ට එක කිරිදෙනක් හරි හරියට හදාගන්න උදවු කරලා කිරි නිෂ්පාදනය වැඩිකර ගන්න උදව් කරන්න කියලා මම ඉල්ලනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ රටට ගෙන්වන කෘෂි නිෂ්පාදනවලට, කෘෂි උපකරණවලට, බීජවලට, මේ රටේ කෘෂි කාර්මාන්තයේ නියැළෙන ගොවීන්ගේ අස්වැන්නට VAT එක ගහන්න නම් ඉඩ තියන්න එපා. එහෙම වුණොත් ගොවීන් දැඩි අසීරුතාවට පත්වෙනවා. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාටත්, රාජ්‍ය ඇමතිවරුන්ටත්, නිලධාරින්ටත් මේ අවස්ථාවේදී මම සුබ පතනවා. ඉදිරි වර්ෂය තුළදී ගොවියා වෙනුවෙන් යමක් කරන්න ඔබ සියලුදෙනාටම ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. උදයකුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.11]

**ගරු එම්. උදයකුමාර් මහතා**
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் வரவு செலவுத் திட்ட நிதி ஒதுக்கீட்டின்மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, சில கருத்துக்களை முன்வைப்பதற்கு வாய்ப்பளித்தமைக்கு மிக்க நன்றி!

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின்கீழ் வருகின்ற தேயிலைத் தொழிற்றுறையானது நாட்டின் பொருளாதாரத்தில் மிக முக்கியதொரு பங்கை வகிக்கின்றது. உலகளாவிய ரீதியில் மேற்கொள்ளப்பட்ட ஆய்வில் நீருக்கு அடுத்தபடியாக அதிகளவில் மக்களால் அருந்தப்படும் பானமாக தேநீர் காணப் படுகின்றது. இலங்கையின் பொருளாதாரத்தில் தேயிலை ஏற்றுமதி கணிசமானதொரு பங்களிப்பைச் செய்கின்றது. குறிப்பாக, எமது நாட்டின் மொத்தத் தேசிய உற்பத்தியில் 2000ஆம் ஆண்டு 2.5 சதவீதத்தையும், 2010ஆம் ஆண்டு 3.2 சதவீதத்தையும், 2020ஆம் ஆண்டு 3.8 சதவீதத்தையும், 2022ஆம் ஆண்டு 4.1 சதவீதத்தையும் பெற்று தொடர்ச்சியாக வளர்ச்சியைக் காட்டிவருகின்றது. தேயிலை உற்பத்தித் துறையில் ஏற்றுமதி வருமானம் அதிகரித்துள்ளபோதிலும், அதற்காகப் பாடுபடும் தொழிலாளர்களின் வாழ்வில் அல்லது தொழில்சார் துறையில் முன்னேற்றம் ஏற்பட்டதாகத் தெரியவில்லை. தோட்டங்களை நிர்வகிக்கும் பெருந்தோட்டக் கம்பனிகளால் எமது மக்கள் தொடர்ந்தும் புறக்கணிக் கப்பட்டும், வஞ்சிக்கப்பட்டும் வருகின்றார்கள். தோட்ட மக்களின் தற்காலிகக் குடியிருப்புகள் தோட்ட நிருவாகத்தால் காட்டுமிராண்டித்தனமாக அடித்து நொறுக்கப்படுகின்றன.

இதனால் அம்மக்கள் நீதிமன்றத்துக்கும் பொலிஸ் நிலையத்துக்கும் இழுத்தடிக்கப்படுகின்றார்கள். குறிப்பாகச் சொல்வதென்றால், மரத்திலிருந்து விழுந்தவனை மாடு முட்டிய கதைபோல தோட்டத் தொழிலாளர்கள் தொடர்ந்தும் துன்பப்படுத்தப்படுகின்றார்கள். உழைப்புக்கேற்ற ஊதியம் அவர்களுக்கு இல்லை; நிம்மதியாகத் தூங்கியெழ சொந்த வீடு இல்லை; உரிமை என்று சொல்ல ஒரு துண்டுக் காணி இல்லை; அடையாளம் என்று சொல்ல சொந்த முகவரி இல்லை. இவ்வாறான நிலையில் நிரந்தர முகவரி கேட்டு, ஒட்டுமொத்த மலையக மக்களின் குரலாக நீதிமன்றம் சென்று வரலாற்றுச் சிறப்புமிக்க தீர்ப்பொன்று பெறப்பட்டுள்ளது. அதேநேரம், தற்போது கட்டப்படும் வீடுகளுக்கு முகவரி வழங்கப்படுவது மகிழ்ச்சி தரக்கூடிய விடயமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் தேயிலை உற்பத்தி வளர்ச்சியை நாம் பட்டியலிட்டுக் காட்டுவதற்குக் காரணம் இருக்கின்றது. தேயிலை வளர்ச்சியானது வெறுமனே ஆகாயத்திலிருந்து நிலத்துக்கு விழுந்த ஒன்றல்ல. இதற்குப் பின்னால் இரத்தம், வியர்வை, வேதனை, சோதனை, துன்பம் கலந்த ஒரு வரலாறு இருக்கின்றது. அந்த வரலாற்றுக்குச் சொந்தக்காரர்கள் இந்த நாட்டில் 200 வருடங்களைப் பூர்த்திசெய்திருக்கின்ற

மலையகப் பெருந்தோட்ட மக்களாவர். என்னதான் தேயிலை உற்பத்தி அதிகரித்து, தேயிலை ஏற்றுமதி அதிகரித்து, அந்நியச் செலாவணி அதிகரித்து, நாடு வளம்பெற்றிருந்தாலும், எமது மக்களின் வாழ்க்கை இன்னும் வளம்பெறவில்லை. இதற்கு முக்கிய காரணம், எமது மக்கள் தொடர்ச்சியாக பெருந் தோட்டக் கம்பனிகளாலும், ஆட்சியாளர்களாலும் ஏமாற்றப் படுவதுதான். அவர்களது உழைப்பு சுரண்டப்படுகின்றது; வியர்வை உறிஞ்சப்படுகின்றது. ஆனாலும், அவர்களுக்கு அதற்கேற்ற ஊதியமோ, சலுகைகளோ வழங்கப்படுவதில்லை. அதுமாத்திரமன்றி, அவர்கள் காலங்காலமாக சம்பள அதிகரிப்பு விடயத்திலும் ஏமாற்றப்பட்டு வருகின்றார்கள்.

குறிப்பாக, கூட்டு ஒப்பந்தம் என்ற போர்வையில், இந்த மக்கள் பல வருட காலமாக ஒரு வட்டத்துக்குள் அடைக்கப்பட்டிருந்தார்கள். அதன் பின்னர் அதிலிருந்து விடுபட்டு, சம்பள நிர்ணய சபை என்ற தேசிய நீரோட்டத்தில் கலக்கப்பட்டிருந்தாலும், பெருந்தோட்டக் கம்பனிகளின் நடவடிக்கை காரணமாக சம்பள நிர்ணய சபைமூலமான முறையும் தற்போது தோல்வியடைந்த ஒரு முறையாக மாறியுள்ளது. தற்போது, தோட்டத் தொழிலாளர்களின் சம்பள அதிகரிப்பு குறித்தான பேச்சுவார்த்தை மீண்டும் நடத்தப்படவுள்ளது. ஒரு பக்கம், கூட்டுஒப்பந்தம் மீண்டும் கைச்சாத்திடப்பட வேண்டும் என்ற கோரிக்கை மேலோங்கிக் காணப்படுகின்றது; மறுபக்கம், பெருந்தோட்டக் கம்பனிகள் மூலம் வருமானப் பகிர்வு முறை - revenue share model - முன்வைக்கப்பட்டுள்ளது. கூட்டு ஒப்பந்தமுறை மிகவும் பழைமைவாய்ந்த முறை என்றாலும், இன்னும் இது பல நாடுகளில் நடைமுறையில் இருக்கின்றது. அதன்மூலம் தொழிலாளர்களின் நலன்புரி விடயங்கள் பாதுகாக்கப் பட்டாலும், நியாயமான சம்பளம் தொழிலாளர்களுக்குக் கிடைப்பதில்லை என்பதுதான் உண்மை! அதனை வழங் குவதற்கு பெருந்தோட்டக் கம்பனிகள் எந்த வகையிலும் முன்வருவதில்லை. ஆகையால், இந்தக் கூட்டுஒப்பந்தத் தின்மூலம் பெருந்தோட்ட மக்களுக்கு நியாயமான சம்பளம் கிடைக்குமா? என்ற சந்தேகம் நிலவுகின்றது.

அதேபோல, பெருந்தோட்டக் கம்பனிகளால் முன்வைக் கப்பட்டுள்ள வருமானப் பகிர்வு முறை - revenue share model - குறித்தும் சந்தேகம் நிலவுகின்றது. அதாவது, இந்தத் திட்டம் நடைமுறைப்படுத்தப்படும்போது, எல்லாத் தொழிலாளர் களுக்கும் சமமான வருமானம் கிடைக்குமா என்பது கேள்விக்குறியாகும். காரணம், ஒவ்வொரு பெருந்தோட்டக் கம்பனியும் வெவ்வேறு தரத்தின் அடிப்படையிலேயே தேயிலையை உற்பத்தி செய்கின்றது. மேலும், கொழுந்து அதிகமாக காணப்படும் பெருந்தோட்டக் கம்பனிகளில் வேலைசெய்யும் தொழிலாளர்களுக்கு அதிக சம்பளமும், கொழுந்து குறைவாகக் காணப்படும் பெருந்தோட்டக் கம்பனிகளில் வேலைசெய்யும் தொழிலாளர்களுக்குக் குறைந்தளவு சம்பளமும் கிடைப்பதற்கு வாய்ப்பு இருக்கின்றது. இதனால் அநீதி இடம்பெறவும் வாய்ப்பிருக்கிறது. அதாவது, ஒரே தொழிலில் ஈடுபடும் தொழிலாளர்களுக்கு மாறுபட்ட ரீதியில் சம்பளம் கிடைப்பதால் நீதியற்ற தன்மை ஏற்படுமென நான் நினைக்கின்றேன். குறிப்பாக, ஒரு கிலோ கிராம் பச்சைக் கொழுந்து விற்பனை செய்யப்பட்டால், அதன்மூலம் கிடைக்கும் வருமானத்தில் 60 சதவீதம் தோட்டத் தொழிலாளிக்கு வழங்கப்படும். அப்படியாயின், அவர் களுக்கான ஊழியர் சேமலாப நிதி மற்றும் ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி என்பன எவ்வாறு செலுத்தப்படும்? என்ற கேள்வி எழுகின்றது. மேலும், இந்த முறையினூடாக அவர்களுக்கான சலுகைகளை வழங்குவதிலும் சந்தேகம் நிலவுகின்றது. இது சமநிலையற்ற முறை என்பதால், எந்தளவுக்கு நடைமுறையில் சாத்தியப்படும் என்ற கேள்வி எழுகின்றது.

அதனால்தான் சிறுதோட்ட உரிமையாளர்கள் போன்று, தோட்டத் தொழிலாளர்களுக்கும் தேயிலைத் தோட்டங்கள் பிரித்துக் கொடுக்கப்பட வேண்டுமென்ற கோரிக்கையை தொழிலாளர் தேசிய சங்கத்தினராகிய நாங்கள் தொடர்ந்து முன்வைத்து வருகின்றோம். ஒரு தோட்டத் தொழிலாளிக் குடும்பத்துக்குக் குறைந்தபட்சம் 2 ஏக்கர் வீதம் தேயிலைக் காணிகள் பிரித்துக் கொடுக்கப்பட்டு, அதில் பறிக்கப்படும் தேயிலைக் கொழுந்தை அன்றைய நாள் சந்தை விலைக்கு விற்பனை செய்வதற்கான வாய்ப்பும் வழங்கப்பட வேண்டும். இதன்மூலம் தோட்டத் தொழிலாளர்களின் வாழ்வில் புதியதோர் அத்தியாயத்தை ஏற்படுத்த முடியும் என்று நாங்கள் நினைக்கின்றோம். தற்போதைய அரசாங்கம் இதனைச் செய்யாவிட்டாலும், எதிர்வரும் காலங்களில் ஏற்படும் ஐக்கிய மக்கள் சக்தியின் ஆட்சியில் நிச்சயமாக பெருந்தோட்டத் தொழிலாளர்களை சிற்றுடைமையாளர்களாக ஆக்குவோம் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பெருந்தோட்டப் பகுதிகளில் பெருந்தோட்டக் கம்பனிகள் வரையறுக்கத்தக்க விடயங்களை முன்னெடுத்தாலும், அவற்றால் முன்னெடுக்கப்படவேண்டிய அபிவிருத்தித் திட்டங்கள் எதுவும் தற்போது நடைபெறுவதில்லை. பெரும்பாலான பெருந்தோட்டக் கம்பனிகளின் அசமந்தப் போக்கு காரணமாக தற்போது பல தோட்டங்கள் மூடப்படும் நிலையில் இருக்கின்றன. அதுமாத்திரமன்றி, அங்குள்ள பல தொழிற்சாலைகளும் தோட்ட வைத்தியசாலைகளும் தோட்ட முன்பள்ளிகளும் மூடப்பட்டுள்ளன. இது குறித்து கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

தற்போது பெருந்தோட்டப் பகுதியிலுள்ள தோட்டத் தொழிலாளர்களின் பெண் பிள்ளைகள் உதவி வெளிக்கள உத்தியோகத்தர்களாக உள்வாங்கப்பட்டிருப்பது மிகவும் வரவேற்கத்தக்க விடயமாகும். அவர்களை உதவி வெளிக்கள உத்தியோகத்தர்களாக உள்வாங்குவதுடன் மாத்திரம் நின்றுவிடாது, வெளிக்கள உத்தியோகத்தர்களாக, கணக் காளர்களாக, உதவி முகாமையாளர்களாக, முகாமையாளர் களாகப் பதவி உயர்த்துவதற்கான வேலைத்திட்டங்களையும் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

தற்போது பெருந்தோட்டப் பகுதிகளில் சுமார் 12,000 ஏக்கர் தரிசு நிலம் காணப்படுவதாக புள்ளிவிபரம் கூறுகின்றது. அவற்றைப் பெருந்தோட்டங்களில் வாழ்கின்ற, அங்கு வேலைசெய்யாத இளைஞர், யுவதிகளுக்குப் பகிர்ந்தளிப் பதன்மூலம் அவர்கள் மத்தியில் சுயதொழிலை மேம்படுத்த முடியுமென நான் நம்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.*

**ගරු එම්. උදයකුමාර් මහතා**
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)
*ගරු පලනි දිගම්බරම් මැතිතුමාගේ කාලයෙන් මම විනාඩියක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.*

குறிப்பாக, விவசாயம், கால்நடை வளர்ப்பு, நன்னீர் மீன்வளர்ப்பு போன்றவற்றை மேற்கொள்வதன்மூலம் சுயதொழில் வாய்ப்பை ஏற்படுத்த முடியும். அதன்மூலம் சமூக

[ගරු එම්. උදයකුමාර් මහතා]

முன்னேற்றத்தைக் காணக்கூடியதாக இருக்குமென்று நான் நினைக்கின்றேன். மேலும், தங்களுடைய பிரதேசத்தில் சிறுதோட்ட உரிமையாளர்களாகத் தொழில்புரிந்து, பெருந்தோட்டத் துறையையும் பாதுகாக்கக்கூடிய சூழ்நிலை உருவாகும். பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரான கௌரவ மஹிந்த அமரவீர அவர்கள் அங்குள்ள தரிசு நிலங்களைப் பகிர்ந்தளிப்பதற்கான வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டும். தரிசு நிலங்களை எவ்வாறு பகிர்ந்தளிப்பது என்பது குறித்துத் தீர்மானிப்பதற்குக் குழுவொன்றை அமைத்தால், நிச்சயமாக அதற்கு எங்களுடைய முழுமையான ஆதரவையும் ஒத்துழைப்பையும் வழங்குவோம் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த நாட்டினுடைய விவசாயத்துறையில் முன்னேற்றத்தை ஏற்படுத்தியவர். ஆகையால், நீங்கள் இந்தத் தரிசு நிலங்களில் மலையக இளைஞர்கள் விவசாயம், சுயதொழில் போன்றவற்றில் ஈடுபடுவதை ஊக்குவிக்க நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். இந்த நாட்டில் விவசாயத் துறையிலும் சரி, தேயிலை உற்பத்தித் துறையிலும் சரி, மேன்மைகொண்டு விளங்குவது நுவரெலியா மாவட்டம்தான். இது இங்குள்ள கௌரவ சீ.பி. ரத்நாயக்க அவர்களுக்கும் தெரியும்! ஆகையால், அந்த மாவட்டத்துக்கு அதிக முன்னுரிமை அளிக்கப்பட வேண்டுமென நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், பெருந்தோட்டங்களில் பணிபுரியும் தோட்ட சேவையாளர்கள் குறித்தும் கவனம் செலுத்த வேண்டும். குறிப்பாக, பணிபுரியும் காலத்தில் வசிப்பதற்கென தோட்ட சேவையாளர்களுக்கு வீடுகள் வழங்கப்படுகின்றன. அவர்கள் பணியிலிருந்து விலகிச் செல்லும்போது, அந்த வீடுகளை மீளக் கையளிக்க வேண்டும். அவற்றைக் கையளித்த பிறகு, அவர்கள் மிகவும் கஷ்டமான சூழ்நிலைக்குள் தள்ளப்படுகின்றார்கள். ஆகையால், தோட்ட சேவையாளர்களுக்கென தனியான வீடமைப்புத் திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக ஒரு விடயத்தைக் கூறிக்கொள்கின்றேன். பெருந்தோட்டத் தொழிலாளர்களை அனைத்து வகையிலும் முன்னேற்றப் பாதையில் அழைத்துச் செல்வதற்கும், "Ceylon Tea" என்ற வர்த்தக நாமத்தின்மூலம் இந்த நாட்டின் புகழை சர்வதேச ரீதியில் மேலும் அதிகரிக்கச் செய்வதற்கும், இந்தப் புகழுக்குப் பின்னணியிலிருந்து உழைக்கும் தோட்டத் தொழிலாளர்களின் வாழ்வில் ஒளியேற்றுவதற்கும் பெருந் தோட்டக் கைத்தொழில் அமைச்சர் அவர்கள் செயற்பட வேண்டுமெனவும், இந்த அமைச்சுக்கு அனைத்து வளங்களையும் வழங்கி, அதன்மூலம் பெருந்தோட்ட மக்களின் வாழ்க்கையை வளம்பெறச் செய்ய வேண்டுமெனவும் கேட்டு, கௌரவ அமைச்சர் அவர்களுக்கு எனது வாழ்த்துக்களைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.21]

**ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

*நஹ்மதுஹூ வநுஸல்லி அலா ரஸூலிஹில் கரீம். அம்மா பஃத்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் இந்த நாட்டுக்குத் தேவையான மிக முக்கியமான இரண்டு அமைச்சுக்களின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு இருக்கின்றோம். இந்த நாட்டில் என்றுமில் லாதவாறு பொருளாதார நெருக்கடியும் உணவுப் பிரச்சினையும் ஏற்பட்ட காலத்தில்தான் கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள் கமத்தொழில் அமைச்சைப் பொறுப்பேற்றார். கமத்தொழில் அமைச்சுக்கு மேலதிகமாக பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சும் அவருக்கு வழங்கப்பட்டு இருக்கின்றது. அதையிட்டு நான் மிகவும் மகிழ்ச்சியடைவதுடன், அவருக்கு என்னுடைய பாராட்டுகளையும் தெரிவித்துக்கொள்கின்றேன். அத்துடன், அவரோடு இணைந்து செயற்படுகின்ற State Ministersக்கும் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று நமது நாட்டுக்குத் தேவை உணவு உற்பத்தி! அதற்காக எமது நிலங்களிலிருந்து நாம் உச்ச பயனைப் பெறவேண்டும். அது பெருந்தோட்ட உற்பத்திகளாக இருக்கலாம்; சிறுதோட்ட உற்பத்திகளாக இருக்கலாம்; நெல் உற்பத்தியாக இருக்கலாம்; கோழி, ஆடு, மாடு வளர்ப்பாக இருக்கலாம். இச்செயற்பாடுகளெல்லாம் ஓர் அமைச்சரின்கீழ் இருப்பதால், அவருக்குக் கீழுள்ள உயர் அதிகாரிகள் எல்லோரும் இணைந்து இந்த நாட்டில் பாரியதொரு வேலைத்திட்டத்தை அமுல்படுத்த வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். முன்னர் இந்த இரண்டு அமைச்சுகளும் வெவ்வேறு நபர்களிடம் இருந்ததனால், "எங்களால் அதைச் செய்ய முடியாது, இதைச் செய்யமுடியாது" என்று சொல்கின்ற நிலைமை இருந்தது. தற்பொழுது இந்த நாட்டுக்கு என்ன தேவையோ, அதைப் பெறுவதற்காக கௌரவ அமைச்சரும் கௌரவ இராஜாங்க அமைச்சர்களும் அமைச்சின் அதிகாரிகளும் அமைச்சின்கீழ் வருகின்ற ஏனைய நிறுவனங்களின் அதிகாரிகளும் ஒன்றிணைந்து பாரியதொரு வேலைத்திட்டத்தைச் செய்ய முடியும்.

தற்போதைய கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் அவர்கள் சாதாரண ஒருவர் அல்லர். அவர் ஒரு விவசாயி; மாடு வளர்ப்பு பற்றித் தெரிந்தவர். நானும் இங்கு பேசிய அம்பாறை மாவட்டத்தைப் பிரதிநிதித் துவப்படுத்தும் கௌரவ டீ. வீரசிங்க உட்பட பலரும் விவசாயிகள்! எங்களுக்கு நிலம் பற்றியும் தெரியும்; அதில் எவ்வாறான பயிர்கள் வளரும் என்பது பற்றியும் தெரியும்; நீரின் முக்கியத்துவமும் தெரியும்; நிலத்தின் முக்கியத்துவமும் தெரியும்! அதனால்தான் நாங்கள் சொல்கிறோம், நீங்கள் எதைச் செய்ய முற்பட்டாலும் முதலில் soil test செய்யுங்கள் என்று. முதலில் மண்ணைப் பரிசோதித்து அதன் தரத்தை அறிந்துகொள்ளுங்கள்! எந்த மண் எந்தப் பயிருக்குப் பொருத்தமானதென்று பாருங்கள்! தேவையான உத்தியோகத் தர்கள் இருந்தும் இதைச் செய்யவில்லை என்றால், நாம் செய்யும் அனைத்து வேலைகளும் வீணாகிவிடும் என்பது என்னுடைய கருத்தாகும்.

அம்பாறை மாவட்டத்திலுள்ள கரும்புப் பயிர்ச்செய்கை சார்ந்த பிரச்சினை பற்றி நாம் தொடர்ச்சியாகப் பேசிக் கொண்டு இருக்கின்றோம். அங்கு பெரு நிலப்பரப்பில் அதிகளவு நீர் பாய்ச்சப்பட்டு கரும்பு உற்பத்தி செய்யப் படுகின்றது. ஆனாலும், கரும்பு விவசாயிகளுக்கு எந்தவிதமான நன்மையும் கிடைப்பதில்லை. கம்பனியானது குறைந்த வட்டிக்குப் பணத்தைப் பெற்று, விவசாயிகளுக்கு கூடிய வட்டிக்கு கடன் கொடுத்து, அவர்களைக் கடனாளிகளாக மாற்றுகின்றது. இப்படிச் செய்தால், இந்த நாட்டில் விவசாயிகள் எப்படி நிம்மதியாக வாழ முடியும்? இது பாவமான செயல்தானே! கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இதற்கென ஒரு வேலைத்திட்டத்தை உருவாக்கினால், கரும்பு உற்பத்தியில் ஈடுபடுவதற்கு விவசாயிகள் விரும்புவார்கள். கரும்புத் தோட்டம் பார்வைக்கு அழகாக இருக்க வேண்டும். விவசாயிகள் வயலுக்குச் சென்று தங்களுடைய வேளாண் மையைப் பார்க்க விரும்புவார்களோ, அதேபோன்று கரும்புத் தோட்டங்களையும் பார்க்க விரும்புவார்கள். கரும்புத் தோட்டம் வனாந்தரமாக இருப்பதை அவர்கள் விரும்ப மாட்டார்கள்.

கரும்புத் தோட்டத்துக்குள் ஒரு வாடிகட்டி, அங்கு 5-10 தென்னம்பிள்ளைகளை வளர்த்து, 50-100 கோழிகளையும் ஐந்து பசுமாடுகளையும் வளர்க்க வேண்டும். நாங்கள் புல்லை வளர்க்கத் தேவையில்லை. கரும்புப் பயிர்ச்செய்கையின்போது வளரும் புல் போதுமானது. அதேபோல், விவசாய நிலங்களில் இருக்கின்ற, வரம்புகளிலுள்ள புல் கணிசமானளவு பால் உற்பத்திக்குப் போதுமானது. ஒவ்வொரு தடவையும் விவசாயம் செய்யும்போது, 2-3 தடவை வரம்பிலுள்ள புற்களை வெட்டி அகற்ற வேண்டியேற்படுகின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, இன்று பால்மாவில் protein இல்லை என்று சொல்கின்றார்கள். அதாவது, பாலிலுள்ள புரதம், கொழுப்பு என்பவற்றை அகற்றிய பின், அதற்கு தண்ணீரையும் melamineஐயும் தாவரக் கொழுப்பையும் சேர்த்துத்தான் எங்களுக்குப் பால்மாவாக அனுப்புகிறார்கள். அதைத்தான் நாங்கள் பாவித்துக்கொண்டிருக்கின்றோம். நான் இதை என்னுடைய இலாபத்துக்காகச் சொல்லவில்லை. இந்த நாட்டு மக்களின் இலாபத்துக்காகவும், விவசாயிகளின் இலாபத்துக்காகவுமே சொல்கின்றேன். நாம் இந்த விடயத்தை ஜனாதிபதி அவர்களிடமும் சொல்லியிருக்கின்றோம். ஆகவே, மிகவும் பிரயோசமான காணிகளையும், நீரையும் இந்த நாட்டின் உற்பத்திக்காக, இந்த நாட்டின் வருமானத்துக்காக, விவசாயிகளின் வருமானத்துக்காகப் பாவிக்க வேண்டும். கம்பனிகளின் தேவைகளுக்கு அரச அதிகாரிகள் விலைபோகக் கூடாது. கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்களே, நீங்கள் உங்களுடைய அமைச்சின் உத்தியோகத்தர்களை நாட்டின் உற்பத்தித் தேவைக்காகப் பாவிக்க வேண்டும். உங்களுடைய காலத்தில் இந்த நாட்டில் உணவு உற்பத்தி சிறப்பாக இடம்பெறுவதற்கு நாங்கள் எல்லோரும் துணைபுரிவோம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල් හලීම් මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
මම හිතන විධියට විනාඩි පහකට වැඩි කාලයක් මට තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශවල වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ මොහොතේ මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම බලාපොරොත්තු වෙනවා, අපනයන භෝග සම්බන්ධව තිබෙන ප්‍රශ්න ගැන සහ ඒවායෙන් ලැබෙන ආදායම් සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න. ඊට කලින් මට පොඩි වෙලාවක් ගන්නවා වැදගත් කාරණයක් සඳහන් කිරීමට. පසුගිය මාස තුනක පමණ කාලයක් තිස්සේ ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව නිසා මාසයක කාලයක් තුළ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ නගරය දෙ වරක්ම ජල ගැලීම්වලට ලක් වුණා. එපමණක් නොවෙයි, ඊයේ හවස් වරුවේ සිදු වුණු නාය යෑමක් නිසා ජීවිත හානි පවා සිදු වුණා. මේ ජල ගැලීම් සම්බන්ධව අපි මේ සභාවේ කිහිප වරක්ම කථා කළා. මම අකුරණ නගරය ගැන සඳහන් කරන්නේ මම ඉන්නේ අකුරණ නිසාම නොවෙයි. විශේෂයෙන්ම අකුරණ නගරය හරහා ඒ-9 මාර්ගය පවා පිහිටා තිබෙනවා. එම ප්‍රදේශයේ මුල් වරට ජල ගැලීම් සිදු වුණේ 2001 වර්ෂයේ. ඊට කලින් එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. පසුගිය යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ අපි කාර්ය සාධක බලකායක් පිහිටුවා මේ සම්බන්ධයෙන් යම් අධ්‍යයනයක් සිදු කළා. එම කණ්ඩායම අපට බොහෝ දේවල් නිර්දේශ කළා. එම නිර්දේශවලට අනුව හරියාකාරව කටයුතු කළා නම් මම හිතන විධියට අද වනවිට අපි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ නැහැ. ගංවතුර තත්ත්වය නිසා මෙවර ඇති වී තිබෙන පාඩුව ඉතා විශාලයි. පසුගිය කාලයට වඩා විශාල පාඩුවක් මෙවර ජල ගැලීම් නිසා සිදු වී තිබෙනවා. ඒ වාගේම අකුරණ නගරය කියන්නේ ආර්ථික වශයෙනුත් ඉතා වැදගත් නගරයක්; හැම දිනකම වාගේම විශාල වශයෙන් වෙළෙඳාම් කටයුතු සිදු වන නගරයක්. ඒ නිසා ආර්ථිකයටත් යම් බලපෑමක් ඇති කරන්න පුළුවන් නගරයක් නිසායි ඇත්තටම මම මේ ගැන කථා කරන්න කල්පනා කළේ.

මේ වෙලාවේ විශේෂයෙන් මේ ගැන මම මතක් කළේ වැදගත් කාරණයක් නිසායි. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේ සඳහන් කර තිබුණා, ගාල්ල නගරයේ ගංවතුර පාලනය කිරීම සඳහා මිලියන 250ක් වෙන් කරන බව. මම මේ වෙලාවේ මේ අකුරණ නගරය ගැනත් ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මහනුවර අකුරණ නගරයේ මෙසේ ජල ගැලීම් සිදු වන්නේ මුල්වරට නොවෙයි. මම හිතන විධියට 10වැනි වතාවට වෙන්නට ඕනෑ මෙසේ ජල ගැලීම් සිද්ධ වුණේ. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳීම සඳහාත් අය වැයෙන් යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර දුන්නොත් හොඳයි කියන එකයි මගේ අදහස. ඒ එක්කම මම මුලින් කිව්වා වාගේ යහ පාලන ආණ්ඩුව කාලයේ අපි පිහිටු වූ කාර්ය සාධක බලකාය ඒ සම්බන්ධයෙන් ලබා දී තිබෙන යම් යම් නිර්දේශ ඉදිරියේදී ක්‍රියාත්මක කළොත් අපිට මේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳා ගන්න හැකි වෙයි.

මම කලින් කිව්වා වාගේ මහනුවර දිස්ත්‍රික්කය තුළ අපනයන භෝග වගාව සිදු වන බව අපි කවුරුත් දන්නා කාරණාවක්. භෝග වර්ග කිහිපයක්ම බහුලව වගා කෙරෙනවා. විශේෂයෙන් අකුරණ සහ හාරිස්පත්තුව කියන්නේ සාදික්කා, කරාබුනැටි, ගම්මිරිස්, පුවක්, වසාවාසි, බුලත් වැනි අපනයන භෝග වගා කරන ප්‍රදේශ. කුළුබඩු, එහෙම නැත්නම් සුළු අපනයන භෝග ප්‍රවර්ධනය, නිෂ්පාදනය සහ අලෙවිය සම්බන්ධයෙන් කථා කිරීමේදී, ශ්‍රී ලංකාව කියන්නේ ලෝකයේ සුළු අපනයන භෝග අපනයනය කරනු ලබන ප්‍රමුඛ රටවල් දහය අතර සිටින එක් රටක් බව මම සඳහන් කළ යුතුයි.

සුළු අපනයන භෝග අතරින්, කුරුඳු වගාව ගැන මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ශ්‍රී ලංකාව අපනයනය කරන කුරුඳු ලෝකයේ නමක් දිනාගෙන තිබෙන නිෂ්පාදනයක්. කුරුඳු වගාව සම්බන්ධයෙන් ලෝකයේ රටවල් අතර අපේ රටට හිමි වී තිබෙන්නේ ඉතා ඉහළ ස්ථානයක්. දැනට අවුරුදු 10ක විතර

[ගරු අබ්දුල් හලීම් මහතා]

තිබෙන දත්ත විශ්ලේෂණය කළහොත් පෙනෙනවා, 2012 වර්ෂයේදී පමණක් සුළු අපනයන භෝගවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 256ක ආදායමක් ලබා ගන්න අපට හැකි වෙලා තිබෙන බව. ඒ වාගේම මෑතකදී -2021 වර්ෂයේදී- ඇමෙරිකානු ඩොලර් මිලියන 456ක් උපයා ගන්න අපට පුළුවන්කම ලැබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
මට මීට වඩා වෙලාව ලැබෙන්නේ නැහැ. හැම දාම අපට සිදු වන්නේ මේකයි. ඒ නිසා අපට හරියට දෙයක් කථා කරන්න බැරි වෙනවා. මම සකස් කරගෙන ආ කථාවෙන් කාරණා කීපයක් පමණයි කියන්න පුළුවන් වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.33]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

விசேடமாக, பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, என்னுடைய தொப்புள்கொடி உறவுகளான மலையக மக்கள் சார்பாக ஒருசில கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன்.

நேற்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாகக் கருத்துத் தெரிவித்திருந்தார். அதாவது, தோட்டத் தொழிலாளர்களுடைய நாட்சம்பளம் 1,700 ரூபாய் என பரிந்துரை செய்திருக்கிறார். எங்களுடைய மக்களுக்கு 33 மாதமாகச் சம்பள உயர்வு கிடைக்கவில்லை. எங்களுடனான கலந்துரையாடலுக்குப் பின்னர், மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டக் கம்பனிகளை அழைத்து, அவற்றிடம் தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 நாட்சம்பளத்தை வழங்குமாறு பரிந்துரைத்திருப்பதோடு, அது பற்றி இம்மாதம் 31ஆம் திகதிக்கு முன்னர் அறிவிக்குமாறும் கூறியிருக்கிறார். அதற்காக நான் ஜனாதிபதி அவர்களுக்கு எமது மக்கள் சார்பாக நன்றி தெரிவிக்கின்றேன்.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

இது பற்றி இங்கு விமர்சனம் எழுந்தது; விதண்டாவாதம் புரியப்பட்டது. அப்படியென்றால், இதை யார் செய்வது? பூனைக்கு மணி கட்டுவதுபோன்றுதான் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு விடயமும் இருக்கின்றது. இது சம்பந்தமாக பலரும் பல்வேறு கருத்துகளை முன்வைக் கலாம். ஆனாலும், நான் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு சம்பந்தமாக கம்பனிகளுடனும் தொழில் அமைச்சுடனும் முதலாளிமார் சம்மேளனத்துடனும் பல கோணங்களில் பேச்சுவார்த்தை நடாத்தியிருக்கின்றேன். இந்தக் குறுகிய காலத்தில் நான் தொழில் அமைச்சருக்குப் பாரிய தொல்லையாக இருந்திருப்பேன் என நினைக்கின்றேன். ஆகையால், நாங்கள் வெகுவிரைவாக இந்த மக்களுக்கு சம்பள உயர்வு வழங்குவதற்குரிய ஏற்பாடுகளைச் செய்வோம்.

கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்களே, இன்று பெருந்தோட்டங்களிலுள்ள காணிகள் காடாக்கப்படுகின்றன. முன்னர் ஒரு கலாசாரத்தோடு செயற்பட்ட இந்தத் தொழிற்றுறையானது, இன்று எதிரும் புதிருமாகச் செயற்பட்டுக்கொண்டிருக்கின்றது. இன்று தோட்டத் தொழிலாளிகளைக் கண்டால் தோட்ட அதிகாரிகளுக்கு எதிரிகளைக் காண்பதுபோல் இருக்கின்றது. தொழிலாளர் களுக்கும் தோட்ட அதிகாரிகளைக் காணும்போது அவ்வாறானதொரு தோற்றப்பாடே ஏற்படுகின்றது. முன்னர் கலாசாரத்தோடும் பண்போடும் பாசத்தோடும் செயற்பட்ட இந்தத் தொழிற்றுறையானது, இன்று நஷ்டமடைவதற்கும் பெருந்தோட்டங்கள் காடாவதற்கும் காரணம் காழ்ப்புணர்ச் சியாகும். பெருந்தோட்டங்கள் தனியார் துறையிடம் ஒப்படைக்கப்பட்ட பிறகு, பெருந்தோட்டக் கம்பனிகள் இந்த மக்களைக் காழ்ப்புணர்ச்சியோடு பார்ப்பதுதான் இதற்கு அடிப்படைக் காரணமாகும்.

கௌரவ பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் அவர்களே, தயவுசெய்து quick notice வழங்குவதை நிறுத்தும்படி உங்களுக்குகீழ் இயங்குகின்ற PMMDக்குத் தெரிவியுங்கள்! தனியார் பெருந்தோட்டக் கம்பனிகள் இந்த நாட்டில் 200 வருடகாலமாக, 5 பரம்பரையாக வாழ்ந்துகொண் டிருக்கும் பெருந்தோட்ட மக்களைப் பழிவாங்கும் நோக்கில் அவர்கள் பற்றித் தவறான கருத்துக்களைத் தெரிவிப்பதால், அம்மக்களுக்கு உங்களுடைய அமைச்சின் மூலமாக quick notice அனுப்பப்படுகின்றது. பெருந்தோட்டக் காணிகளில் வெளியாட்கள் வந்து குடியமர்ந்தால் அல்லது வேறு யாராவது பெருந்தோட்டக் காணிகளை அபகரித்தால் நிச்சயமாக அவர்களுக்கு quick notice வழங்கப்பட வேண்டும்.

எனினும், பெருந்தோட்டங்களில் 5 பரம்பரையாக வாழ்ந் துகொண்டு இருக்கின்றவர்களை அங்கிருந்து வெளியேற் றுவதை, அவர்களை வீடுகளை விட்டு வெளியேற்றுவதை நான் உண்மையிலேயே வன்மையாகக் கண்டிக்கின்றேன். அவ்வாறான செயற்பாடுகளைப் புதிதாகப் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சைப் பொறுப்பேற்றிருக்கின்ற கௌரவ மஹிந்த அமரவீர அவர்கள் தடுத்து நிறுத்துவாரென நான் நம்புகின்றேன். எங்களுடைய மக்களைத் தோட்டங்களிலிருந்து வெளியேற்றுகின்ற எண்ணம் நாட்டின் ஜனாதிபதிக்கும் கிடையாது; அரசாங்கத்துக்கும் கிடையாது. ஆகையால், பெருந்தோட்டக் கம்பனிகள் செய்கின்ற அடாவடித்தனத்தை நிறுத்துவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மலையக மக்களுக்கு காணி உறுதிப்பத்திரங்களை வழங்குவதற்கு அரசாங்கம் தீர்மானித் திருக்கிறது. மலையக மக்களைத் தேசிய நீரோட்டத்தில் இணைப்பதென்றால், அவர்களையும் இந்த நாட்டின் ஏனைய பிரஜைகளைப் போன்று கவனிக்க வேண்டும். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அந்தப் பொறுப்பை அவருடைய ஆலோசகர் என்ற அடிப்படையில் என்னிடம் ஒப்படைத் திருக்கிறார். கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களோடு இணைந்து அந்தக் கடமையைச் செய்வதற்கு விரும்புகின்றேன்.

ගරු ඇමතිතුමා, මම ඔබතුමාට සුබ පතනවා. මම ඔබතුමාට කාරණයක් කියන්න ඕනෑ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන PMMD එකෙන් පරම්පරා පහක් - අවුරුදු 200ක් - තිස්සේ ජීවත් වෙච්ච කම්කරු ජනතාවට දැන් quick notice දෙනවා. ගරු ඇමතිතුමනි, පිට කට්ටිය ඇවිල්ලා වතුවලින් ඉඩම් අල්ලනවා නම් ඒකට අපි විරුද්ධයි, එහේ පිට කට්ටිය පදිංචි කරනවා නම් ඒකට අපි විරුද්ධයි. නමුත්, ඒ වත්තේම අවුරුදු 200ක් - පරම්පරා 5ක් - හිටපු කට්ටිය දෙස වතු කොම්පැනි කට්ටිය බලන්නේ නිකම් ද්‍රෝහීන් හැටියට. ඉස්සර තිබුණේ එහෙම තත්ත්වයක් නොවෙයි. වතු පාලකයන් අතරත්, කම්කරුවන් අතරත් හොඳ සම්බන්ධතාවක් තිබුණා. දැන් සමහර කොම්පැනි මොනවාද කරන්නේ? ඒ ජනතාවගෙන් පළිගන්න වැරැදි තොරතුරු දෙනවා කියලා මම දන්නවා. වැරදි තොරතුරු දීලා, quick notice දීලා ඒ කට්ටියව එළියට දමනවා. ගරු ඇමතිතුමනි, ඒක තමයි පසුගිය දවස්වල සිදු වුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ කට්ටියට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න කියලා මම ඉල්ලනවා. වතුකරයේ ජනතාව වෙනුවෙන් අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි සුබ ප්‍රාර්ථනා කරනවා. අපි ඔබතුමාට සම්පූර්ණ සහයෝගය දෙනවා. අපි ඔබතුමා ගැන දන්නවා. ඔබතුමා අවුරුදු ගණනක් අනික් ක්ෂේත්‍රවල ඇමති ධුර දරන කොට කටයුතු කළේ කොහොමද කියලා අපි දන්නවා. මේ වතාවේ ජනාධිපතිතුමා ඔබතුමාට මගේ වතුකර ජනතාව අයත් වන අමාත්‍යාංශයත් දීලා තිබෙනවා. ඒ ගැන අපි ගොඩක් සතුටු වෙනවා. සමගිය ඇති කිරීමේ හා ජාතිය එකතු කිරීමේ වැඩ පිළිවෙළකුත් මේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ සඳහා අපි අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා කියමින් ඔබතුමාටත්, ඔබතුමාගේ අමාත්‍යාංශයේ කණ්ඩායමටත් වතුකරයේ ජනතාව වෙනුවෙන් මම wish කරනවා, ගරු ඇමතිතුමා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සු. නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.38]

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று நடைபெறுகின்ற கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் குழுநிலை விவாதத்தில் நான் வன்னித் தேர்தல் மாவட்ட மக்களைப் பிரதிநிதித்துவப்படுத்தி உரையாற்ற விழைகின்றேன்.

வன்னித் தேர்தல் மாவட்டமானது, பெரும்பான்மையாக விவசாய மக்களைக்கொண்ட ஒரு தேர்தல் மாவட்டமாகும். அண்மையில் கௌரவ அமைச்சர் அவர்கள்கூட, அங்கு வருகை தந்திருந்தார். இப்பொழுது அங்குள்ள குளங்கள் எல்லாம் காட்டுக்குள்தான் இருக்கின்றன. ஒரு காலத்தில் குளங்களைச் சுற்றி வயல் காணப்பட்டது. ஆனால், இன்று அவற்றைச் சுற்றி காடுதான் காணப்படுகின்றது. முப்பது வருடகால யுத்தம், பராமரிப்பின்மை, அபிவிருத்தி இன்மை என்பவற்றால் அங்குள்ள குளங்களைச் சுற்றி காடு வளர்ந் திருக்கின்றது. அன்று பற்றைக்காடுகளாக இருந்தவைகூட, இன்று வனாந்தர மாக மாறியிருக்கின்றன. இதனால் அவற்றையும் வன இலாகா தன்னுடைய காணிகளெனப் பிரகடனப்படுத்தி இருக்கின்றது. இதன் காரணமாக அந்தக் குளங்களிலிருந்து விவசாயிகள் நீரைப் பெறமுடியாத நிலைமை ஏற்பட்டிருக்கின்றது. இதற்கு கௌரவ அமைச்சர் அவர்கள் ஒரு முடிவைக் காண வேண்டும். ஒன்றில், புனரமைக்கப்படாத குளங்களைப் புனரமைக்க வேண்டும் அல்லது வன இலாகாவிடமிருந்து அந்தக் குளங் களை மீட்டெடுத்து விவசாயிகளுக்குக் கொடுக்க வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அங்கு வருகை தந்தவேளை, 'மக்கள் பாதிக்கப்படக்கூடாது, விவசாயிகள் பாதிக்கப்படக்கூடாது, அரசாங்கம் பாதிக்கப்படக்கூடாது' என விவசாய நடவடிக்கை சார்ந்து கூறிய கருத்தை நான் இங்கு நினைவுபடுத்த விரும்புகின்றேன். உண்மையிலேயே செயற் றிட்டங்கள் ஒழுங்கான முறையில் திட்டமிடப்பட்டு, சீரான முறையில் நடைமுறைப்படுத்தப்பட்டால், அதன்மூலம் மக்க ளும் விவசாயிகளும் அரசாங்கமும் நன்மை அடையக்கூடிய நிலைமை உருவாகும்.

அடுத்து, உளுந்துப் பயிர்ச்செய்கையாளர்கள் எதிர்நோக்கு கின்ற பிரச்சினையானது, வவுனியா மாவட்டத்தில் மட்டுமல்ல, வன்னிப் பிரதேசம் முழுவதும் இருக்கின்ற ஒரு பொதுவான பிரச்சினையாகும். உளுந்துப் பயிர்ச்செய்கையாளர்கள் பயிர்ச் செய்கைக்காக ஒரு கிலோகிராம் விதை உளுந்தை 1,500 ரூபாய்க்கே பெறுகின்றார்கள். ஆனாலும், அவர்கள் அறுவடை செய்த உளுந்தை வெறுமனே 300-350 ரூபாய்க்கே விற்பனை செய்யக்கூடியதாக இருக்கின்றது. எனவே, உளுந்துப் பயிர்ச் செய்கையாளர்கள் பயிர்ச்செய்கையின் ஆரம்ப காலத்தில் விதை உளுந்தை மிகக் குறைந்த விலையில் பெறுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டு மென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசங்களில் நெல் அறுவடை இடம் பெறும் காலத்தில் நெல் சந்தைப்படுத்தும் சபை மூடப்பட்டிருக் கும். வவுனியாவிலும் சரி, மன்னாரிலும் சரி, முல்லைத்தீவிலும் சரி, இந்த நிலைமைதான் காணப்படுகின்றது. நெல் கொள்வனவுக்கான நிதி இன்னும் அரசாங்கத்தால் - திறைசேரியால் - ஒதுக்கப்படவில்லை என்ற காரணத்தைச் சொல்லி, நெல் சந்தைப்படுத்தும் சபையானது நெல்லைக்

[ගරු සු. නෝගරාදලිංගම් මහතා]

கொள்வனவு செய்ய முடியாதெனக் கூறுகின்றது. எங்களுடைய விவசாயிகள் குறைந்த செலவில் அறுவடையை மேற்கொண்டாலும், உரிய காலத்தில் நெல் சந்தைப்படுத்தும் சபை அவற்றைக் கொள்வனவு செய்யாமையால் அல்லது விவசாயிகள் பாதிக்கப்படாத வகையில் நெல்லுக்கான விலை நிர்ணயம் செய்யப்படாமையால் அவர்கள் தங்களுடைய நெல்லை தனியாருக்குக் குறைந்த விலைக்குக் கொடுக்க வேண்டிய நிர்ப்பந்தம் ஏற்படுகின்றது. விவசாயிகள் வங்கிகளில் கடன் எடுத்தும் தங்களது நகைகளை அடகுவைத்தும் பயிர்ச்செய்கையில் ஈடுபடுவதால், அவர்களுடைய நெல்லை நெல் சந்தைப்படுத்தும் சபை அல்லது அராசாங்கம் கொள்வனவு செய்யும் வரை அவர்களால் காத்திருக்க முடியாது. அதன் காரணமாக, தங்களுடைய நெல்லை குறைந்த விலைக்குக் கொடுக்க வேண்டிய ஒரு நிர்ப்பந்தம் அவர்களுக்கு ஏற்படுகின்றது. ஆகவே, அறுவடை முடிந்த கையோடு, எங்களுடைய விவசாயிகளிடமிருந்து நெல்லைக் கொள்வனவு செய்யக்கூடிய வகையில் அராசங்கம் நெல் சந்தைப்படுத்தும் சபைக்கு உரிய ஆலோசனைகளை வழங்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள விவசாயக் கிணறுகளும் விவசாயப் பாதைகளும் புனரமைக்கப்பட வேண்டி இருக்கின்றன. அதேபோல், புதிய விவாசாயக் கிணறுகள் அமைக்கப்படவேண்டி இருக்கின்றன. இந்த விடயத்திலும் கௌரவ அமைச்சர் அவர்கள் கரிசனைகொள்ள வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன். மேலும், அங்கு நெல் காயப்போடும் தளங்கள் இல்லை. அங்கு ஏற்கெனவே இருந்த தளங்கள்கூட, காட்டு யானைகளால் அல்லது வேறு காரணங்களால் சேதமடைந்திருக்கின்றன. இன்று எங்களுடைய விவசாயிகள் அறுவடை செய்த தங்களுடைய நெல்லை பிரதான வீதிகளில் காயப்போடுகின்ற ஒரு நிலைமைதான் இருக்கின்றது. இதனால் அங்கு விபத்துகள் ஏற்படுகின்றன. ஆகவே, அங்கு நெல்லைக் காயப்போடுகின்ற தளங்களைப் புதிதாக அமைப்பதற்கு விசேட நிதி ஒதுக்கீடு செய்ய வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

முல்லைத்தீவின் கரைதுறைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள குமரபுரம் கிராம சேவையாளர் பிரிவில் கைவிடப்பட்டிருக்கின்ற நிலையிலுள்ள மடத்துவயல் குளத்தைப் புனரமைப்புச் செய்தால், கிட்டத்தட்ட 100 ஏக்கர் நிலத்தில் சிறுபோக விவசாயம் செய்ய முடியும். கேப்பாப்பிலவு கிராம அலுவலர் பிரிவிலுள்ள வாவெட்டி குளம் தற்போது உடைப்பெடுக்கும் நிலையில் இருக்கின்றது. உலக வங்கியின் நிதியுதவின்கீழ் இக்குளத்தைப் புனரமைப்புச் செய்வதற்கான ஏற்பாடுகள் நடைபெற்றன. ஆனாலும், இப்பொழுது அதைப் புனரமைப்பதற்கான எவ்வித ஆயத்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே, இக்குளத்தைப் புனரமைக்க நடவடிக்கை எடுக்கவேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, பாண்டியன்குளம் கமநல சேவைகள் நிலையத்துக்குக் கீழுள்ள துவரங்குளம், கோரப்பனிக்கன் குளம், புதுக்குளம் என்பன முழுமையாகப் புனரமைப்புச் செய்யப்பட்டுள்ள போதிலும், கடந்த காலங்களில் இக்குளங்களின் கீழுள்ள வயல் நிலங்களைத் துப்புரவு செய்வதற்கு அனுமதிக்கப்படவில்லை. குறிப்பாக, வன இலாகா, வனசீவராசிகள் திணைக்களம் இதற்குத் தடையாக இருக்கின்றன. இதனால் இந்த வயல் நிலங்களைப் பாவிக்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைமை இருக்கின்றது. துவரங்குளத்துக்குக் கீழுள்ள வயல் நிலங்களில் பயிர்ச்செய்கை செய்த சுமார் 58 விவசாயிகளுக்கு எதிராக வன இலாகா வழக்குத் தாக்கல் செய்திருக்கின்றது. இதனால் அந்த விவசாயிகள் தங்களுடைய வயல் நிலங்களில் பயிர்ச்செய்கையில் ஈடுபட முடியாதவொரு நிலைமை இருக்கின்றது. உலக உணவுத்திட்டம் இக்குளத்தின் புனரமைப்புக்காக ஒரு கோடி ரூபாயைச் செலவிட்டிருக்கிறது.

அடுத்து, முல்லைத்தீவு மாவட்டத்தின் சுண்டிக்குளம் பிரதேசத்திலுள்ள கரியல் வயலில் பயிர்ச்செய்கையில் ஈடுபட்ட ஏறக்குறைய 130 விவசாயிகளுக்கு எதிராக கடந்த இரண்டு தினங்களுக்கு முன்னர் வனசீவராசிகள் திணைக்களத்தினர் வழக்குத் தாக்கல் செய்திருக்கின்றார்கள். அது வனசீவராசிகள் திணைக்களத்துக்குரிய காணி என்றும் அக்காணியைத் துப்புரவு செய்து, அதில் வீதிகளை அமைத்துப் பயன்படுத்துவதாக அவ்விவசாயிகள்மீது குற்றம் சுமத்தியே வழக்குத் தாக்கல் செய்யப்பட்டிருக்கிறது. இந்தக் காணியானது, அங்குள்ள விவசாயிகளால் 100 வருடங்களுக்கும் மேலாகப் பயன்படுத்தப்பட்டு வருகின்ற ஒரு காணியாகும். இந்த வழக்கில் பிரதிவாதிகளாகக் குறிப்பிடப்பட்டுள்ள சிலர் பல வருடங்களுக்கு முன்னர் இறந்தும் விட்டார்கள். அதாவது, இறந்தவர்களுக்கு எதிராகக் கூட, வழக்குத் தாக்கல் செய்யப்பட்டிருக்கின்ற ஓர் அபூர்வமான விடயத்தை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. ஏன் இவ்வாறு செய்ய வேண்டும்? எனக் கேட்கின்றேன். அரசாங்கத் தின் முகவர்களாகச் - agentஆகச் - செயற்படுகின்ற வன இலாகாவைச் சேர்ந்த அதிகாரிகளும் வனசீவராசிகள் திணைக்களத்தைச் சேர்ந்த அதிகாரிகளும் பறவைகள் சரணாலயத்துக்குப் பொறுப்பான அதிகாரிகளும் மகாவலி 'L' வலயத்துக்குப் பொறுப்பான அதிகாரிகளும்தான் எங்களுடைய மக்களின் காணிகளை கபளீகரம் செய்கின்ற அல்லது அவற்றை அடாத்தாகப் பிடிக்கின்ற வேலைத் திட்டத்தை மும்முரமாகச் செயற்படுத்திக்கொண்டிருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாங்கள் இதனை அரசாங்கத்தின் திட்டமிட்ட நில அபகரிப்பின் - நில ஆக்கிரமிப்பின் - ஓர் அங்கமாகத்தான் பார்க்கின்றோம்.

மேய்ச்சல் தரைப் பிரச்சினையானது, பொதுவாக நாடு முழுவதிலுமுள்ள ஒரு பிரச்சினையாகும். ஆனாலும், வன்னிப் பிரதேசத்தில் இது மிகப் பெரியதொரு பிரச்சினையாக இருந்து கொண்டு இருக்கின்றது. உதாரணத்துக்கு, முல்லைத்தீவு மாவட்டத்திலுள்ள ஒட்டுசுட்டான் கமநல சேவைகள் நிலையத்தின் அதிகார எல்லைப் பிரதேசத்தில் மேய்ச்சல் தரை இல்லாமையால் 15,000க்கும் மேற்பட்ட கால்நடைகளைப் பராமரிப்பதில் மிகவும் சிக்கலான நிலை இருந்துகொண்டு இருக்கின்றது. அங்கு குறைந்தது 200 ஏக்கர் மேய்ச்சல் தரையாவது தேவையாக இருக்கின்றது. மன்னாரில் கட்டுக்கரைக்குளத்துக்குக் கீழுள்ள சில பிரதேசங்கள்கூட, மேய்ச்சல் தரையாக அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றன. அதே போன்று மன்னார் பெருநிலப்பரப்பில் அச்சங்குளம், தள்ளாடி, தேத்தாவடி போன்ற பிரதேசங்களும் மேய்ச்சல் தரையாக அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றன. ஆனாலும், அவற்றை கால்நடைப் பண்ணையாளர்களுக்குப் பிரித்துக் கொடுப்பதில் காலதாமதம் நிலவுகின்றது. இதன் காரணமாக கால்நடைகள் வீதிகளில் படுக்கின்ற நிலைமையையும் அவை எந்தநேரமும் வீதிகளில் இருப்பதையும் நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. அதுமாத்திரமன்றி, விபத்துக்கள் ஏற்படுவதையும் நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அண்மையில் மாங்குளம் - ஒட்டுசுட்டான் வீதியில் பாரிய விபத்தொன்று ஏற்பட்டது. அதாவது, கனரக வாகனமொன்று கால்நடைகள்மீது மோதுண்டதன் காரணமாக 7 அல்லது 8 கால்நடைகள் உயிரிழந்தன. இவ்வாறு கால்நடைகளுக்குப் பாதுகாப்பில்லாத ஒரு நிலைமையே எங்களுடைய பிரதேசத்தில் இருக்கின்றது. ஆகவே, இந்த விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
நான் முடிக்கின்றேன்.

எமது பகுதிகளிலுள்ள அனைத்துக் குளங்களையும் நில அளவைத் திணைக்களம்மூலம் அளவீடு செய்து, எல்லை நிர்ணயம் செய்து, எல்லைக் கற்களை இட்டு, புனரமைப்புச் செய்தால், அங்கு தனியாராலும் வேறு அமைப்புகளாலும் மேற்கொள்ளப்படும் நில அபகரிப்பையும் குள அபகரிப்பையும் தடுக்க முடியும். உதாரணத்துக்கு, முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டான் கமநல சேவைகள் நிலையத்துக்குக் கீழுள்ள வரவுப்பிலவுக்குளம் தனிநபர்களால் ஆக்கிரமிக்கப்பட்டுள்ளது. இது தொடர்பில் நாங்கள் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் எடுத்துக்கூறியும் எதுவும் நடைபெறவில்லை. குளம் இருந்த இடம் தெரியாமல் அழிக்கப்பட்டுவிட்டது. அங்குள்ள அதிகாரிகள் அசமந்தப் போக்குடன் செயற்படுகின்ற நிலைமையை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. வரவுப்பிலவுக்குளம் முறையாக நில அளவை செய்யப்பட வேண்டும். இது சம்பந்தமாக உயர் அதிகாரிகள் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு உரிய பணிப்புரைகளை வழங்க வேண்டு மென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கட்டுக்கரைக்குளம் - Giant's Tank என்பது, மன்னார் மாவட்டத்தில் காணப்படுகின்ற மிகப்பெரிய குளமாகும். அந்தக் குளத்தின் நீரேந்துப் பகுதியிலும் ஏனைய பகுதிகளிலும் சில தனிநபர்கள் சட்டவிரோதமாகக் காணிகளைப் பிடிக்கின்ற நிலைமை இருக்கின்றது. இச்செயற்பாடு உடனடியாக நிறுத்தப்பட வேண்டும். அந்தக் குளத்தின் நீர்மட்டம் உயர்த்தப்பட வேண்டும். அந்தக் குளத்தை அபிவிருத்தி செய்வதனூடாக கூடுதலான நீரைச் சேமித்து, அங்குள்ள விவசாயிகள் பயன்பெறக்கூடிய விதத்தில் வேலைத்திட்டங் களை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදයකාන්ත ගුණතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු උදයකාන්ත ගුණතිලක මහතා**
(மாண்புமிகு உதயகாந்த குணதிலக்க)
(The Hon. Udayakantha Gunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත කියන අමාත්‍යාංශ දෙක ගත්තාම, රටට විශාල සේවයක්, සෙතක් සලසන අමාත්‍යාංශ දෙකක්. වැවිලි ක්ෂේත්‍රය ගත්තාම, අපේ රටේ ග්‍රාමීය මට්ටමේ ඉඳලා, වතු ක්ෂේත්‍රය ඇතුළුව ඒ කෙරෙන නිෂ්පාදන තුළින් විශාල විදේශ විනිමයක් අපේ රටට ලැබෙනවා. ඒ වාගේම, ඒ ක්ෂේත්‍රයේ නියැළී සිටින ජනතාව ඒ නිෂ්පාදන තුළින් විශාල ආදායමක් උපයනවා. අපේ අපනයන භෝග නිෂ්පාදනවලට අද හොඳ වෙළෙඳ පොළක්, හොඳ ඉල්ලුමක් සහ වෙළෙඳ පොළ වටිනාකමක් ලැබිලා තිබෙනවා. එම නිසා එම ක්ෂේත්‍රයේ නියැළී සිටින ජනතාවට අද හොඳ ආර්ථික මට්ටමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශවල වැඩි වශයෙන් බුලත් වගාව කෙරෙනවා. නමුත්, දැන් බුලත් වගාවට කණ කොකා හඬපු තත්ත්වයක් තමයි තිබෙන්නේ. මොකද, පාකිස්තානයේ තමයි අපේ ප්‍රධාන ගැනුම්කරුවා හිටියේ. ඒ රටේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක ඒ රටට කළ බුලත් අපනයනය සීමාසහිත වුණා. එම නිසා විදේශ රටවලට යවපු බුලත් ප්‍රමාණය, එහෙම නැත්නම් පාකිස්තානයට යවපු බුලත් ප්‍රමාණය දේශීය වෙළෙඳ පොළට ඒම නිසා බුලත් මිල ශීඝ්‍ර ලෙස පහළ වැටිලා තිබෙනවා. ඒකට විසඳුමක් හොයන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමාගේ අවධානයට වාගේම, අදාළ නිලධාරින්ගේ අවධානයට මා එම කාරණය යොමු කරනවා. අපි ඉතිහාසයේ වාගේ බුලත් තට්ටුවල සහ කූඩවල අසුරා රට යවන්නේ නැතුව ඒ නිෂ්පාදන රට යවලා ඒ තුළින් විශාල විදේශ විනිමයක් උපයන්න පුළුවන්. පසුගිය කාලයේ බුලත් කොළයක මිල රුපියල් 35ක් දක්වා ඉහළ ගියා. බුලත් කොළයක් රුපියල් 35ක් වනකොට බුලත් 1,000ක් රුපියල් 35,000ක් වූ කාල වකවානුත් තිබුණා. එම ආර්ථික තත්ත්වය ලබා ගන්න නැවත ශක්තිය ලබා දෙන්න කියන ඉල්ලීමත් මා කරනවා.

අපේ රටේ ප්‍රධාන ආහාරය බත්. වී වගාවට සහ සහල් නිෂ්පාදනය කර ගන්න අද විශාල වියදමක් -වැය බරක්- දරන්න ගොවියාට සිද්ධ වෙනවා. වගාවට විශාල වැය බරක් දරන ගොවියාගේ වීවලට අද සාධාරණ මිලක් ලැබෙනවාද කියන කාරණාවත්, පාරිභෝගිකයාට සාධාරණ මිලකට සහල් ලැබෙනවාද කියන කාරණාවත් අපි හිතන්න ඕනෑ තැනකට අද පත්ව තිබෙනවා. විශේෂයෙන්ම ඊට හේතුව, වෙළෙඳ පොළ තරගකාරිත්වයක් නොමැති වීමයි. වෙළෙඳ පොළ තරගකාරිත්වයක් නොමැති වීම නිසා ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකු අතට සම්පූර්ණ වී තොග පත් වෙනවා. එතකොට ඔවුන් කරන්නේ හිතයක් මවා පාලා මිල ඉහළ යාමක් සිද්ධ කිරීමයි. මිල ඉහළ යාම තුළ විශේෂයෙන්ම අපේ පාරිභෝගිකයාට වාගේම, සිල්ලර කඩ හිමියන්ටත් අද ලොකු අපහසුතාවකට පත්වන්න සිදු වෙලා තිබෙනවා. රජය මිල පාලනය කළත්, මිල පාලන ගැසට් නිකුත් කළත්, අද මිල පාලනයක් සිදු වෙලා නැහැ. වැඩි මිලට තමයි කඩවල සහල් විකුණන්නේ. අර මහා පරිමාණ ව්‍යාපාරිකයන් සමඟ තරග කරන්න රජයට පුළුවන්කමක් නැහැ. පෞද්ගලික අංශයේ කිහිපදෙනෙකු අතරේ තමයි ඒ ගනුදෙනුව සිද්ධ වෙන්නේ. ඔවුන් මිල තීන්දු කරන්නේ හිතයක් මවා පෑම තුළින්. එම නිසා ඒ තත්ත්වය වෙනස් කිරීම අවශ්‍යයි. ඒ තත්ත්වය වෙනස් කරන්න නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සමුපකාර සංවිධාන වාගේ සංවිධාන හදලා, ඒවා ඒකාබද්ධ කරලා, ඒ නිෂ්පාදන බෙදා හදා ගන්නා ක්‍රමවේදයක් නිර්මාණය කරන්න ඕනෑ. එහෙම ක්‍රමවේදයක් නිර්මාණය කළොත් අපට පුළුවන් වෙයි, පාරිභෝගිකයා රැක ගන්න.

අද කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරින් විශාල පිරිසක් ඉන්නවා. සමහර කොට්ඨාසවල ඉතාම උනන්දුවෙන් වැඩ කරන නිලධාරින් වාගේම වැඩ බොහොම මන්දගාමී ලෙස සහ වැඩ බොහොම අඩුවෙන්ම කරන නිලධාරින් පිරිසකුත් ඉන්නවා. මම සතුටු වනවා සහ ආඩම්බර වනවා, ගරු ඇමතිතුමාත්, රාජ්‍ය අමාත්‍යවරුනුත් කරන සේවය ගැන. ඒ වාගේම වැඩ කරන නිලධාරින්ටත් මගේ ස්තුතිය හා ගෞරවය මේ අවස්ථාවේ පුද කරනවා. මේ ක්ෂේත්‍රය තුළ බිම් මට්ටමේ ඉන්න නිලධාරින්ගෙන් කොටසක් පළාත් සභාවල ඉන්නවා, තවත් කොටසක් මධ්‍යම රජය යටතේ ඉන්නවා. ඒ දෙගොල්ලන් සමහර තැන්වලදී දෙපැත්තට අදින ස්වරූපයක් තිබෙනවා. ඒ අය ඒකාබද්ධ වෙලා ගොවියාට අවශ්‍ය සහන ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අද ගොවි ජනතාව පීඩාවට පත්ව සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු උදයකාන්ත ගුණතිලක මහතා**
(மாண்புமிகு உதயகாந்த குணதிலக்க)
(The Hon. Udayakantha Gunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

නියඟය, අධික වර්ෂාපතනය සහ ගංවතුර වැනි තත්ත්වයන් හේතුවෙන් කෘෂිකර්මයට බරපතළ හානි සිදු වෙනවා, ප්‍රශ්නයක් ඇති වෙනවා. අපි ඒ තත්ත්ව කළමනාකරණය කර ගනිමින් ගොවි නිෂ්පාදන වැඩි කර ගන්න කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම ඉදිරියේදී ආහාර හිඟයක් ඇති වෙන්න පුළුවන්. මේ වෙනකොටත් වර්ෂාව මාස 4කට වැඩි කාලයක් තිස්සේ පවතිනවා. තව ඉස්සරහටත් වහිනවා කියලාත්, නැවත නියඟයක් ඇති වෙන්න පුළුවන් කියලාත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කියනවා. එතකොට අපට ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වෙනවා. ආහාර හිඟය වළක්වා ගැනීමට අපට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් ගරු ජනාධිපතිතුමා හඳුන්වා දී තිබෙනවා. එම කෘෂි නවීකරණ ව්‍යාපෘතිය තුළින් ආහාර හිඟය වළක්වා ගන්න, ආහාර නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒක ජනාධිපතිතුමාට, ඒ විෂයයට අදාළ අමාත්‍යවරුන්ට සහ රාජ්‍ය අමාත්‍යවරුන්ට විතරක් කරන්න බැහැ. ඒ සඳහා සහයෝගය ලබා දෙන්න කියා අදාළ නිලධාරින්ගෙනුත් මේ අවස්ථාවේදී මා ඉල්ලීමක් කරනවා. ඒ සඳහා ඔවුන්ට ශක්තිය සහ ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසාන කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.57]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කථා කරන්න හිතාගෙන ඉන්න දේවල් විනාඩි 5කට කොහොම ගොනු කරන්නද කියලා මට තේරෙන්නේ නැහැ. හැබැයි, මම මේ මාතෘකාවට ප්‍රවේශ වෙන්න ඕනෑ.

අද මට ඇහුණා, ලොකු කථා ගොඩක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආර්ථිකය ඝාතනය කළා වාගේම, "පෙරදිග මුතු ඇටය" කියපු, "ආසියාවේ ධාන්‍යාගාරය" කියපු අපේ රටේ කෘෂි ආර්ථිකයත් ඝාතනය කරපු ඝාතකයන් පිරිසක් හිටියා. විශේෂයෙන්ම ගොවීන් සිහින මාළිගාවල රඳවලා බලයට ආපු ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ රාජපක්ෂ ආණ්ඩුව ගත් ඒ තීන්දු-තීරණ තුළින් අපේ ගොවියා සම්පූර්ණයෙන්ම නන්නත්තාර කළා, හිඟන්නෙකු බවට පත් කළා. අන්තිමට ඉන්දියාවේ හිඟන්නෝත් හිඟා කාලා එකතු කරපු මුදල්, අපේ රටේ මිනිස්සුන්ට එවන මට්ටමට මේ පෙරදිග මුතු ඇටය පත් වුණා වාගේම අපේ ගොවියෝ ටික පාරට බැස්සුවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු සියලුදෙනාම ඒකට වගකියන්න ඕනෑ. මහින්දානන්ද අලුත්ගමගේ හිටපු කෘෂිකර්ම ඇමතිවරයා ඒකට වග කියන්න ඕනෑ. මේ සභාවේ ඉන්න මහින්ද අමරවීර ඇමතිතුමා -අලුත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා- ඒකට වගකියන්න ඕනෑ. මහින්ද අමරවීර ඇමතිතුමා දකිනකොට මට දෙයක් මතක් වෙනවා. අපේ රටට චීනයෙන් අසූචි පොහොර නැවක් ගෙන්වූවා. එතකොට මහින්ද අමරවීර මහත්මයා -අලුත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා- දැන් ප්‍රකාශ කරනවා, ඒ අසූචි පොහොර නැව සම්බන්ධයෙන් කිසිම දෙයක් එතුමා දන්නේ නැහැ කියලා. නමුත්, තමුන්නාන්සේ අමතක කරන්න එපා, තමුන්නාන්සේත් ඒ කැබිනට් මණ්ඩලයේ හිටියා කියලා. එතකොට මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිවරයාත් කියනවා, මේ කියන අසූචි පොහොර නැව සම්බන්ධව කිසිම දෙයක් දන්නේ නැහැ කියලා. එතකොට ඒ ගැන මහින්දානන්ද දන්නේත් නැහැ, මහින්ද අමරවීර දන්නේත් නැහැ, මහින්ද රාජපක්ෂ දන්නේත් නැහැ. චීනයෙන් ගෙනා ඒ අසූචි පොහොර නැවට ඩොලර් මිලියන 6.9ක් ගෙවන්න අපට සිදු වුණා. ඒ, වාණිජ මහාධිකරණය දුන් වාරණ නියෝගය ඉවත් කිරීම නිසා. ඒ නැව දින 70ක් මුහුදේ නැංගුරම්ලා තිබුණා. එතකොට ලංකා බැංකුව, මහජන බැංකුව ණයවර ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් අසාදු ලේඛනගත වුණා. අපේ රටේ තිබෙන ප්‍රධානතම වාණිජ බැංකු දෙකක්, රජයේ බැංකු දෙකක් වන ලංකා බැංකුවත්, මහජන බැංකුවත් ලෝකය ඉදිරියේ හැල්ලුවට ලක්වුණා. ඒ වාගේම අපේ අහිංසක ගොවීන් පාරට බැස්සා. ඔවුන්ට ජීවත් වෙන්න විධියක් නැතිව ගියා. මහින්දානන්ද අලුත්ගමගේ සහ මහින්ද අමරවීර ඇතුළු කණ්ඩායම ගෝඨාභය රාජපක්ෂ ගත් පොහොර ප්‍රතිපත්තියට පක්ෂව කථා කළා. මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිවරයාත් සභාවේ ඉන්නවා. එතුමාත් කාලයක් පොහොර සම්බන්ධයෙන් රාජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළා.

අපේ රටේ ගොවියෝ ටික පාරට බහිද්දිත්, ඉන්දියාවේ හිඟන්නෝත් මුදල් එකතු කරලා මේ මහා තුන් සිංහලයේ ගොවීන්ට එවන තරමට අපි බාල්දු වෙද්දිත්, අපේ කෘෂිකර්මය ඝාතනය වෙද්දිත්, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා -තනතුරු නැති වුණාට- අද මේ රටේ ඉන්නවා. මහින්ද රාජපක්ෂ හිටපු අගමැතිවරයාට අද ඒ තනතුර නැති වුණාට එතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මහින්ද අමරවීර මැතිතුමා එදා කෘෂිකර්ම ඇමතිවරයා නොවුණාට මේ පාර්ලිමේන්තුවේ හිටියා; කැබිනට් මණ්ඩලයේ හිටියා. අදත් එතුමා පාර්ලිමේන්තුවේ ඉන්නවා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඒ වෙනකොට කෘෂිකර්ම ඇමති හැටියට හිටියා. මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිවරයා මම හිතන විධියට එදා පොහොර විෂය සම්බන්ධව කටයුතු කළා. ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන්ලාත් හිටියා. ආර්ථික ඝාතනය සම්බන්ධයෙන් අධිකරණවල තීන්දු හම්බ වෙනකොට, ආර්ථිකය ඝාතනය කළා කියලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා නේ. විනාඩි දෙකක් තිබෙනවා කියලා ඔබතුමා කලින් දැනුම් දෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආර්ථිකය ඝාතනය කිරීම සම්බන්ධයෙන් රාජපක්ෂලාට සහ ඒ නිලධාරින්ට චෝදනා එල්ල වෙනකොට කෘෂිකර්මය විනාශ කිරීම

සම්බන්ධයෙන් කවුද වග කියන්නේ? එතකොට ඒ චීන අසූචි නැව මොනවත් ගෙනාවේම නැද්ද කියායි අපි අහන්නේ. චීන අසූචි නැව එතකොට සියඹලා ගෙනාවේම නැද්ද? අපේ රටේ සල්ලි වියදම් වුණේම නැද්ද? ඒ නිසා අපි කියන්න කැමැතියි, කෘෂිකර්මය ගැන කථා කරන්න කලින් මේවා ගැන කථා කරන්න ඕනෑ බව. අපේ වීරසිංහ මන්ත්‍රීවරයා කිව්වා, සැලැස්මක් ඇතුව වගා කරන්න ඕනෑ, ජාතික නිෂ්පාදිතයට අදාළ විධියට උපදෙස් දෙන්න ඕනෑ කියලා. ඉතින්, සපත්තු ගැන කථා කරන්න කලින් කකුල් දෙක කැපුවේ කවුද? අපේ කකුල් දැන් නැති කරලා තිබෙන්නේ කවුද? ඒ නිසා අහිංසක ගොවීන්ගේ කකුල් කඩපු, අහිංසක ගොවීන්ගේ කකුල් කපලා දාපු ඒ ඝාතකයන්, සාහසිකයන් ටික හොයලා ඒ ප්‍රශ්නවලට උත්තර හොයන්න ඕනෑ. ගොවීන්ට සපත්තු, මේස්, ග්ලවුස් දාන්න හදන්න ඉස්සෙල්ලා, ගොවීන්ගේ කොන්ද කඩපු එකට, ගොවීන්ගේ ආර්ථිකය විනාශ කරපු එකට, ඔවුන්ගේ කකුල් කඩපු එකට වගකිව යුත්තන් කවුද කියන එක හොයලා කරුණාකර දඩුවම් දෙන්න කියන කාරණය මේ අවස්ථාවේදී කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුලසිංහම් තිලීපන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.03]

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வவுனியா மாவட்டத்தில் நவீன முறையிலான மிளகாய் செய்கையையும் விவசாயக் கிராம திட்டத்தையும் நடைமுறைப் படுத்துவதற்குதவிய கௌரவ அமைச்சர் அவர்களுக்கும் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களுக்கும் நான் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

வவுனியா மாவட்டத்தில் மட்டுமல்ல, மன்னார், முல்லைத் தீவு மாவட்டங்களிலும் வனவளத் திணைக்களத்தின் கட்டுப் பாட்டின்கீழ் பல குளங்கள் உள்ளன. நாம் அதிக முயற்சி யெடுத்து, மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் ஊடாக வனவளத் திணைக்களத்தால் ஏற்படுத்தப் பட்டிருக்கின்ற பிரச்சினைகளை ஓரளவு தீர்த்து வருகின்றோம். இந்த விடயத்தில் கமத்தொழில் அமைச்சு அக்கறையுடன் செயற்பட்டு, குளங்களை விடுவிப்பதற்கான அழுத்தத்தை வனவளத் திணைக்களத்துக்குப் பொறுப்பான அமைச்சுக்குக் கொடுக்க வேண்டும்.

முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் இருக்கக்கூடிய பெரியசாலம்பன் குளத் தைப் புனரமைப்பதற்கு நிதி கிடைத்தும் அது புனரமைக்கப் படவில்லை. அதற்குக் காரணம், அங்கிருக்கக்கூடிய கல்குவாரிதான். இன்று அந்த கல்குவாரி இயங்கும் நிலையில் இல்லை. இப்பொழுதாவது அந்தக் குளத்தைப் புனரமைத்துக் கொடுத்தால், அங்கு 25 - 30 வருடங்களாக குடியிருக்கின்ற மக்களுக்குப் பயிர்ச்செய்கை செய்வதற்கு ஏதுவாக இருக்கும்.

முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கக்கூடிய பூதன்வயல் கிராமமானது, கடலை, உளுந்து போன்ற பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டு வருகின்ற ஒரு கிராமமாகும். அண்மையில் வனவளத் திணைக்களத்தினர் அங்கு சென்று, பயிர்ச் செய்கையில் ஈடுபட்டிருந்த விவசாயிகளது மண்வெட்டி மற்றும் ஏனைய உபகரணங்களைப் பறித்துச் சென்றிருப் பதுடன், அவர்களுக்கு எதிராக வழக்குத் தாக்கல் செய்வதற்கும் நடவடிக்கை எடுத்து வருகின்றனர். இதனைத் தடுக்க வேண்டும். சற்றுமுன்னர்கூட, நான் இது தொடர்பில் முல்லைத்தீவு மாவட்ட வனவளத் திணைக்கள அதிகாரியைத் தொடர்புகொண்டு பேசினேன். பிரதேச செயலாளரோடு கமத்தொழில் அமைச்சும் இணைந்து செயற்பட்டால், இப்படி யான பிரச்சினைகளுக்கு நாம் முற்றுப்புள்ளி வைக்கலாம்.

அடுத்து, நான் இங்கு முக்கியமாக வவுனியா மாவட்டத்தில் இயங்கக்கூடிய விவசாயப் பண்ணை தொடர்பாகச் சுட்டிக் காட்ட வேண்டும். ஏனெனில், அந்த விவசாயப் பண்ணையில் அதிகளவான முறைகேடுகள் நடைபெறுகின்றன. அதாவது, மாடு கொள்வனவு செய்யப்படாமலேயே மாடு இறந்ததாகக் கணக்குக் காட்டப்படுகின்றது. அதேபோல், ஆடு வாங்காமலேயே ஆடு இறந்ததாகக் கணக்குக் காட்டப் படுகின்றது. நான் இந்த விடயம் தொடர்பாக அந்த விவசாயப் பண்ணையில் பணியாற்றும் அதிகாரியோடு பேசினேன். அப்பொழுது அவர், இங்கு மட்டுமல்ல, ஏனைய பிரதேசங் களிலுள்ள விவசாயப் பண்ணைகளிலும் இது போன்ற ஊழல் நடைபெறுவதாகச் சொன்னார். இவ்வாறு ஓர் அரச அதிகாரி பதிலளிப்பது வருந்தத்தக்கது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இதில் தலையிட்டு, விவசாயப் பண்ணைகள் தொடர்பில் ஆய்வொன்றை நடத்தி, நாட்டுக்கு வருமானம் கிடைக்கக்கூடிய வகையில் அவற்றை மாற்றியமைக்க வேண்டும்.

இலங்கையில் அதிகளவான பப்பாசியை உற்பத்தி செய்த ஒரு பிரதேசம்தான் வவுனியா மாவட்டத்திலுள்ள நெடுங் கேணிப் பிரதேசம். வைரஸ் தாக்கம் காரணமாக இன்று அங்கு ஒருசில ஏக்கரில் மட்டுமே பப்பாசி உற்பத்தி செய்யப் படுகின்றது. எனினும், இன்று வரை வைரஸ் தாக்கத்தைக் கட்டுப்படுத்த முடியவில்லை. இதனால் அங்கு பப்பாசிச் செய்கையை மேற்கொண்டவர்கள் தற்பொழுது கூலி வேலை களையும் வேறு வேலைகளையும் நாடிச் செல்கின்றனர். இலங்கையில் செத்தல் மிளகாய் உற்பத்தியில் வவுனியா பிரதேச செயலகப் பிரிவு முதலிடம் வகித்தது. ஆனால், இன்று அது கேள்விக்குறியாக மாறியிருக்கின்றது. இப்படி எமது பிரதேசங்களில் அதிக வருமானத்தை ஈட்டித்தந்த தொழில் முயற்சிகள் இன்று கேள்விக்குறியாக மாறியிருக்கின்றன. எனவே, நாங்கள் அவற்றைச் சரிசெய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
ஒரு நிமிடம் தாருங்கள்! முடித்துக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் நாளொன்றுக்கான பால் உற்பத்தியை 20 மில்லியன் லீற்றராக அதிகரிக்க வேண்டுமென்பதற்காக கருத்திட்ட மொன்றை முன்மொழிந்திருக்கிறார். பால் உற்பத்தியைப் பெருக்க வேண்டுமென்றால், கட்டாயம் மாடு வளர்ப்புக்குப் போதியளவு மேய்ச்சல் தரை இருக்க வேண்டும். இதனை கௌரவ அமைச்சர் அவர்கள் கருத்திலெடுத்து, வனவளத் திணைக்களத்துக்கு அழுத்தம் கொடுத்து, எமது மாவட்டங் களுக்கான மேய்ச்சல் தரையைப் பெற்றுத்தர வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ අපේ රටේ ආර්ථිකයට වාගේම අපේ පැවැත්මට ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක්. අපි දිගින් දිගටම කෘෂි කාර්මික රටක් හැටියට ජීවත් වුණාට අදටත් අපට හැකියාවක් නැහැ, සහනදායී මිලකට අපේ ආහාර ටික සපයා ගන්නට.

ගරු ඇමතිතුමනි, මේ රජය බලයට එනකොට හාල් කිලෝවක් තිබුණේ රුපියල් 75ට. අද වෙනකොට එය හතර ගුණයකින් විතර වැඩි වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, අපේ ප්‍රදේශවල ගොවීන් කුඹුරු වපුරලා පොහොරත් ගහපු බව. නමුත්, අද වෙනකොට ගිං ගඟ ගලලා ගොවිතැන් ටික හෝදාගෙන ගිහිල්ලා තිබෙනවා. ජල කළමනාකරණය පිළිබඳ නිසි සැලැස්මක් නැති වීම තුළ ගොවීන් අද වෙනකොට ඉතා අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රුපියල් 6,000ක් දෙනවා, අක්කරයකට. අක්කරයක් වවන්න නොවෙයි, ඒ මුදලින් ගොවීන්ට තේ ටික බොන්නවත් හැකියාවක් නැහැ. ඒ නිසා මේ ප්‍රායෝගික ප්‍රශ්න පිළිබඳව ඔබතුමා කරුණාකරලා හොයා බලන්න කියලා මම ඉතා ඕනෑකමින් කියනවා.

මේ රටේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය දවසින් දවස අභාග්‍යසම්පන්න තත්ත්වයට පත් වෙනවා. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වෙලා සිටින අයට අද වෙනකොට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ පැතිවල -පහත රට- වැවිලි කර්මාන්තකරුවන්, සේවකයන් ගැන කිසි කෙනෙක් කිසිම අවධානයක් යොමු කරන්නේ නැහැ. උඩරට වතු ගැන විතරයි කථා කරන්නේ. ගෙවල් හැදුවත් එහාට විතරයි; වෙන පහසුකම් දුන්නත් එහාට විතරයි. ඒ අයට හරි ඒවා ලබා දෙන එක ගැන අපි සතුටු වෙනවා. නමුත් අවාසනාවකට, පහතරට වැවිලි කර්මාන්තකරුවන් වෙනුවෙන් -අපේ රුවන් ගාල්ලගේ මැතිතුමා වැනි කණ්ඩායම් විශාල හඬක් නගනවා- රජයේ අවධානය යොමු වෙලා නැහැ. වතු ගොඩනහා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම වතු හිමිකරුවන්ගේ වාගේම වතු සමාගම්වල අවශ්‍යතා පිළිබඳවත් සොයා බලන්න ඕනෑ. ඒ අය ලාභයක් හොයන්නේ නැතුව අපට කවදාවත් සේවකයන්ට පඩි ගෙවන්න, වතු ඉදිරියට පවත්වා ගෙන යන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඔබතුමා දන්නවා, පසුගිය කාලය වෙනතුරු අපේ රටේ තේ factories 750ක් තිබුණු බව. නමුත්, ඒ තේ factories 750, පසුගිය කාලයේ 450 දක්වා අඩු වුණා. අද factories පවත්වාගෙන යන්න අවශ්‍ය තේ දලු ප්‍රමාණය නැහැ. ඒ වාගේම කර්මාන්තශාලා හිමියන්ට ණය දුන්නා. ණය ගෙවා ගන්න බැරි වුණාම පසුගිය කාලයේ moratorium එකක් දුන්නා. අද moratorium එකටත් පොලිය එකතු කරපු නිසා, ඔවුන්ට ඒ මුදල් ගෙවා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තේ කර්මාන්ත ක්ෂේත්‍රය කඩා වැටිලා තිබෙනවා. ඒ වාගේම තමයි tea auction එක. අපි පිටරටට තේ විකුණන්නේ ඩොලර්වලින්. ඩොලර්වලින් විකුණලා රුපියල්වලින් සල්ලි හම්බ වෙනකොට ඒක ලොකු ප්‍රශ්නයක්. අපි දිගින් දිගටම යෝජනා කළා, auction එක ඩොලර්වලින් තියන්න කියලා. අද හැම දෙයම Port City එකට තමයි ගෙන යන්නේ. Tea auction එක Port City එකට ගෙනිහිල්ලා ඩොලර්වලින් auction එක කරන්න. එතකොට අපේ රටට හොඳ මුදලක් ලබා ගැනීමට හැකියාව ලැබෙයි, ගරු ඇමතිතුමනි. ඒ පිළිබඳව අලුත් විධියට හිතන්න පුරුදු වෙන්න.

කුරුඳු සඳහාත් auction එකක් තියන්න කියලා අපි දිගින් දිගටම කිව්වා. නමුත් කිසිම විධියකට ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. ඒ නිසා අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද කුරුඳු ටික විකුණා ගන්න බැහැ; ගොඩ ගැහිලා තිබෙනවා. අද කුරුඳු වගාකරුවන් විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා සිටිනවා. මේ ගැන හොයන්නේ බලන්නේ නැහැ, බොරුවට කථා කරනවා විතරයි. ඔබතුමා අවධානය යොමු කරලා, ලබන වසරේදීවත් ඒ කටයුත්ත ආරම්භ කරන්න. දැන් මොකක්ද තේවල තිබෙන වටිනාකම? තේවල තිබෙන්නේ antioxidant එකක්. Antioxidant ප්‍රතිශතය පිළිබඳව අපි promote කරන්නේ නැහැ. අපි තේවල බර ප්‍රමාණයට වඩා එයින් ලබා ගත හැකි antioxidants ප්‍රමාණය පිළිබඳ ප්‍රචාරයක් ගෙන ගිහිල්ලා, ඒ අනුව මිල තීන්දු කළොත් අපට වැඩි මිලක් ගන්න පුළුවන්. පොල් සම්බන්ධවත් කරන්න තිබෙන්නේ ඒකමයි. පොල් ගෙඩියේ ප්‍රමාණයවත්; වට ප්‍රමාණයත් නොවෙයි අපි බලන්න ඕනෑ. පොල් ගෙඩියේ තිබෙන fat ප්‍රමාණය පිළිබඳව පර්යේෂණ ආයතන මඟින් පර්යේෂණ කරලා, ඒ තුළින් අපට මිලක් ලබා ගැනීම සඳහා අලුත් විධියට හිතලා වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. එහෙම නැතිව සාම්ප්‍රදායික විධියට අවුරුදු සිය ගණනක් තිස්සේ මේ රටේ කරන දේම අදත් කරලා වැඩක් නැහැ.

අපි research institutes ගැන කථා කරනවා. ලංකාවේ තිබෙන research institutesවල research කරන්න අවශ්‍ය කට්ටිය නැහැ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ ආයතනයම බලන්න. රජයේ තේ සමාගම් භාරව ඉන්නේ විශේෂඥයින්ද? නැහැ. විශේෂඥයෝ හොයා ගන්න නැහැ. තේ බොන කට්ටිය දාලා තේ වවන්න, කටයුතු කරන්න උත්සාහ ගැනීම තුළ මේ ඉරණම අත් වෙනවා කියන එක අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ.

ඒ වාගේම, පොහොරවල quality එක පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. පොහොරවල quality එක පිළිබඳ ප්‍රශ්නය නිසා ඔබතුමා දන්නවා, කොච්චර පොහොර දැම්මත් අද වැඩක් නැහැ කියලා. පොහොර දමන්න රුපියල් 8,500ක් යනවා. ඒත් අවශ්‍ය දලු ප්‍රමාණය ලැබෙන්නේ නැහැ. දලු ප්‍රමාණය අඩු වනකොට තේ ගොවියා දවසින් දවස දුප්පත් වෙලා තේ කර්මාන්තය කඩා වැටෙනවා. ඒකම තමයි අද කුරුඳු වගාවටත්, රබර් වගාවටත් වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කියන්න හදන කාරණය තමයි වැදගත්ම දේ. රබර් ගැනයි මම මේ කියන්න හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඉක්මනින් අවසන් කරන්න.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
හොඳයි.

ගිය අවුරුද්දේ විකුණා තිබෙන්නේ රබර් කිලෝ මිලියන 70යි. මේ අවුරුද්දේ කිලෝ මිලියන 60යි. අවුරුද්දක් ඇතුළත කිලෝ මිලියන 10ක් අඩු වෙලා තිබෙනවා. 2019 ඉඳලා අවුරුදු 4ක් තිස්සේ තිබෙන කළු පුල්ලි රෝගය -පත්‍ර පුල්ලි රෝගය- පිළිබඳ කතිකාවක් තිබුණා. මේ නිසා රබර් ක්ෂේත්‍රය විශාල අවදානමකට ලක් වුණා. ඔබතුමා මම පෞද්ගලිකවත් මේ ගැන කිව්වා. නමුත්, ඊයේ ජනාධිපතිවරයා කර්මාන්තකරුවෝ හම්බ වුණාම කියා තිබෙනවා, පත්‍ර පුල්ලි රෝගය කියා රෝගයක් මේ රටේ රබර්වලට තිබෙනවා කියා එතුමා දන්නේ නැහැ කියලා. මේ විධියට ජනාධිපතිවරයා දන්නේ නැත්නම්, -වැවිලි කර්මාන්තය භාරව දැන් අලුත් ඇමතිවරයෙක් ඉන්නේ- මෙච්චර කල් මේ පිළිබඳ අවධානයක් යොමු කළේ නැත්නම්, අපේ රටේ කෘෂි කර්මාන්තයට, අපනයන වැවිලි කර්මාන්තයට, අපනයන කෘෂි කර්මාන්තයට කුමක්ද වෙන්නේ කියන එක පිළිබඳ අමුතුවෙන් කථා කරන්න ඕනෑ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩියකින් අවසන් කරනවා. විනාඩියක් යන්නෙත් නැහැ. අපි දැන් කථා කරනවා, trade agreements ගැන, අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම් ගැන. ජනාධිපතිවරයා ආවොත් හැම දාම කථා කරන්නේ ඒවා ගැන. අපි අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම්වලට එළඹෙනකොට අපේ තේ, කුරුඳු, රබර්, කරුංකා, කරදමුංගු ඇතුළු කෘෂිකර්මයට අදාළ සියලු නිෂ්පාදන පහසුවෙන් ලෝකයේ අනෙක් රටවලට යවන්න අවශ්‍ය කරන පහසුකම් තිබෙන ගිවිසුම්වල වගන්ති ඇතොත් එකතු කරගන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. මේ වර්ෂය තුළ මේ කටයුත්ත කරන්න හැකියාව තිබෙන කණ්ඩායමකට බලය ලබා දීම සඳහා වූ මැතිවරණයකට යන්න අවස්ථාව ලබා දීලා, මේ කර්මාන්තයට ඇති වෙලා තිබෙන තත්ත්වය නැති කරලා රට ඉදිරියට ගෙන යන්න ගරු ඇමතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාගේ සහයෝගය ලබා දෙයි කියා අපි විශ්වාස කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් පුෂ්පකුමාර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார - வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Jagath Pushpakumara - State Minister of Foreign Employment Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳ මම සතුටු වෙනවා. අවස්ථා දෙකකදී මම කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළා. හැබැයි, ඒ හැම අවස්ථාවකම මට මාස 6කට වඩා එම තනතුරේ කටයුතු කරන්න ලැබුණේ නැහැ. ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සම්බන්ධ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ඇමතිවරයා හැටියටත් මම කටයුතු කළා. මම ඉතා සතුටු වෙනවා, මා හිත මිත්‍ර අපේ ඇමතිතුමා ගැන. එතුමා බොහොම අවබෝධයකින්, උනන්දුවකින් වැඩ කරන්න පුළුවන් දක්ෂ ඇමතිවරයෙක්. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියලු ව්‍යාපෘතිවල වැඩසටහන් ඒකාබද්ධ කරලා, බොහොම මෑතකදී එතුමා "Smart Villages" නමින් යොවුන් කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන රට පුරාම ආරම්භ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළා. එතුමා කළ ඉල්ලීමක් අනුව, මම සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුගේගලයාය ග්‍රාම නිලධාරි වසමේ තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහනක් ආරම්භ කළා. ඒ ගම්මානයේ පවුල් 1,200ක් ඉන්නවා. මෙහිදී ඒ පවුල් 1,200ම සංවර්ධනය කරන ඉලක්කගත වැඩ පිළිවෙළක් අපි සකස් කළා. ඒවා සකස් කරනකොට දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා, කෘෂිකර්ම අංශයේ නිලධාරින්, අමාත්‍යාංශයේ නිලධාරින්, ඒ වාගේම පළාත් කෘෂිකර්ම අංශයේ ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා සහ සියලුම ක්ෂේත්‍ර නිලධාරින් සම්බන්ධ කරගෙන තමයි අපි ඒක කළේ. හදබිම අධිකාරියට අපි ස්තුතිවන්ත වෙනවා, "සහභාගිත්ව ගැමි විමසුම" කරන්න එහි සභාපතිතුමා ඇතුළු සියලුම නිලධාරි මහත්ම මහත්මීන් ලබා දුන් සහයෝගය වෙනුවෙන්. ඒ වාගේම එම නිලධාරින් එක්ක සාකච්ඡා කරනකොට මට දැන ගන්න ලැබුණා, ගම්මාන 80ක වාගේ ප්‍රමාණයක PRA වැඩසටහන කරලා තිබෙනවා කියලා. ඒ සියලුම ක්ෂේත්‍ර නිලධාරින්ට පහසුකම් සලසා දීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම තවත් කාරණාවක් මතක් කරන්න ඕනෑ. නිරන්තරයෙන්ම පසු විපරමක් හා ප්‍රගති සමාලෝචනයක් කිරීම හොඳයි කියලා මම යෝජනා කරනවා. ගරු ඇමතිතුමනි, මම අපේ දිසාපතිතුමාට උපදෙස් දුන්නා, මාසයකට සැරයක් ගම්මානවල එම වැඩසටහන ගැන සොයා බලන්න කියලා. ප්‍රාදේශීය ලේකම්තුමා සති දෙකකට සැරයක් ඒ ගැන සොයා බලනවා. මාස තුනකට සැරයක් මම එනවා කියලා එම ගම්මාන දැනුවත් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මෙම වැඩසටහන ආරම්භ කරපු හැම ගම්මානයකම ඇගැයීමක් කරන්න කියලා. දක්ෂ ලෙස වැඩ කරපු නිලධාරින් අගය කරලා ඒ අයව ඇගැයීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම ගම්මානවල තිබෙන සංවිධානවලටත් එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කළොත් හොඳයි කියලා මම යෝජනා කරන්න කැමැතියි.

ඒ වාගේම තවත් ඉතා වැදගත් කාරණා කිහිපයක් මට කියන්න තිබෙනවා. එකක් තමයි, කෘෂි කර්මාන්තයේදී අපට අවශ්‍ය භෝගවල තිබෙන ප්‍රශ්න. විවිධ භෝග පිට රටින් ගේනවා. මහවැලියේ කලාප ගණනාවක් තිබෙනවා. උදාහරණයක් විධියට මම වලව කලාපය ගැන කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, යල කන්නයයි, මහ කන්නයයි අතර මැද කන්නයක් තිබෙන බව. එම නිසා එක කොට්ඨාසයක තනිකර මුංඇට වගා කරන්න පුළුවන්. තව කොට්ඨාසයක තනිකර කව්පි වගා කරන්න පුළුවන්. තවත් කොට්ඨාසයක තනිකර කොල්ලු වගා කරන්න පුළුවන්. මහවැලි කලාපවල එහෙම කළා නම්, අපට ඒවායේ අධීක්ෂණ කටයුතු සෘජුව කරන්න පුළුවන්. වතුර ටික තිබෙනවා. එහෙම වුණොත් අපට ඉලක්ක කරන්න පුළුවන්, කොල්ලු මෙච්චර වගා කරනවා, ඒ නිසා මෙච්චර අස්වැන්නක් එනවා; මුංඇට මෙච්චර ප්‍රමාණයක් වගා කරනවා, මෙච්චර අස්වැන්නක් එනවා කියලා. වියළි කලාපවල සාමාන්‍ය හේන් ක්‍රමය ගත්තාම, වර්ෂාව නැති නිසා අස්වැන්න හානි වෙනවා, නැත්නම් අස්වැන්න ලැබෙන කාලයට වැස්ස නිසා අස්වැන්න නාස්ති වෙනවා. එම නිසා මේ වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කළොත් හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

මට තිබුණු විනාඩි 5න් එච්චරද තිබෙන්නේ? එච්චර නම් කාලය ගතවුණේ නැහැ. මගේ ෆෝන් එකෙන් වේලාව බලමින් මම කථා කළේ. මේකේ හැටියට මට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. SAPP එක මඟින් ඔබතුමාගේ මොනරාගල දිස්ත්‍රික්කයේත් බඩඉරිඟු වගාව කළා. මම ඔබතුමාට සහතිකයක් දෙනවා, මේ වතාවේ තමයි මොනරාගල බඩඉරිඟු වගාව සාර්ථකවම කරලා තිබෙන්නේ කියලා. සමහර කාලවල බීජ ටික ගෙනැල්ලා ගොවියා වගා කළාම ඔහුට කියනවා, "නැහැ, නැහැ, ඔයා දැන් වගා කරලා. ඔයාට බීජ ටික දෙන්නේ නැහැ" කියලා. එහෙම කියලා බීජ ටික එකතු කර ගන්නවා. ඊට පස්සේ ඒ ටික අරගෙන ගිහිල්ලා කඩයකට විකුණනවා. සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට මේ වතාවේ මම හැම ගමකම අධීක්ෂණ කටයුතු කරන්න අධීක්ෂණ කණ්ඩායම් දැම්මා. මම ඒ නිලධාරින්ට කිව්වා, හරියට කටයුතු කරලා නැත්නම් ඒ ගැන මට කියන්න, වංචාවක් කරලා තිබෙනවා නම් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට මම පැමිණිලි කරන්නම් කියලා. මම ඒක කරන්නම් කියලා දන්වා තිබෙනවා. ඒ වාගේම අස්වැන්න analyse කරන වැඩසටහනකුත් කරන්න කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මගේ අල්ලපු වැටේ නේ ඉන්නේ.

ඊළඟට, හිටපු පොල් සංවර්ධන ඇමතිවරයා හැටියට මම මේ කාරණයත් කියන්න ඕනෑ. පොල් වගා කිරීමේ මණ්ඩලයටත්, පොල් පර්යේෂණායතනයටත් අපි App එකක් හඳුන්වා දුන්නා. නිලධාරින් සේවයට වාර්තා කළාද කියලා දැන ගන්න උදේට e-mail එකක් එනවා. උදේ හත, හතහමාර වෙනකොට පොල් වගා කිරීමේ මණ්ඩලයේත්, පොල් පර්යේෂණායතනයේත් කවුද ඉන්නේ, කවුද නැත්තේ කියලා email එකක් එනවා. පළමු වතාවට පොල් පර්යේෂණායතනයේ සේවකයින්ට බෝනස් දුන්නා, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සේවකයින්ටත් බෝනස් දුන්නා. එවැනි වැඩ පිළිවෙළක් අපි නිර්මාණය කළා. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? චෙක් රෝලට අනුව සත්‍ය වශයෙන්ම වැඩ කරන්නේ පස්දෙනායි, මාසය අන්තිමට 15දෙනෙකුගේ නම් දානවා. මේවා අධීක්ෂණය කරන්න වැඩ පිළිවෙළක් නැහැ.

2010 වර්ෂයේ අපි පොල් පැළ ලක්ෂ 20යි නිෂ්පාදනය කළේ. 2011දී මම ඒක ලක්ෂ 40 දක්වා වැඩි කළා. 2012දී ලක්ෂ 60 දක්වා වැඩි කළා. 2012 වර්ෂයේ වියළි කාලගුණය නිසා අපට බීජ ගන්න බැරි වුණා. එම නිසා 2013දී ලක්ෂ 40ට අඩු වෙලා, 2014 වර්ෂයේදී පොල් පැළ ලක්ෂ 90ක් නිෂ්පාදනය කළා. පොල් පැළ නිෂ්පාදනය කළා වාගේම අපි ඒවා වගා කිරීම සඳහා සැලැස්මක් හැදුවා. මම සන්තෝෂයෙන් කියනවා, අද මොනරාගල දිස්ත්‍රික්කයට පිට පළාතකින් පොල් ගෙඩියක්වත් ගේන්නේ නැහැ, පොල් තෙල් ගේන්නේ නැහැ. මම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ධුරය භාර ගන්න කොට යාපනයේ පොල් තිබුණේ නැහැ, වාකරේ පොල් තිබුණේ නැහැ. හමුදා කඳවුරු සියල්ල සම්බන්ධ කරගෙන ඒ ප්‍රදේශවල පොල් වගා කිරීමේ කටයුත්ත මම කළා. ඒ වාගේම, Kurunegala Plantations Limited - KPL - වැනි ආයතනවලට අඛණ්ඩව පොහොර ලබා දුන්නා.

අවසාන වශයෙන්, මම ඉතා වැදගත් කාරණාවක් කියනවා. හොරකම් කරන අය සම්බන්ධව පියවර ගන්නේ නැහැ කියලා සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු ගරු ඇමතිතුමාට දොස් කියන ආකාරය මම ඊයේ Facebook එකෙන් දැක්කා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වැඩිපුරත් කාලය ලබා දුන්නා. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක වැදගත් කාරණාවක්. ගරු ඇමතිතුමාත් පොරොන්දු වෙනවා, ඒ හොරකම් අල්ලන්න විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරනවා කියලා. පොහොර හොරකම් කරපු සිද්ධීත් තිබෙනවා. ඔය පාර්ශ්වයේ කෙනෙක් හොරකම් කළත්, මේ පාර්ශ්වයේ කෙනෙක් හොරකම් කළත් හොරා හොරාමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් ඔබතුමා ගත්තු පියවර කරුණාකර කියන්න. එහෙම නැත්නම් ඔබතුමාට නරක නාමයක් එනවා. කවුරු හොරකම් කළත් හොරා හොරාමයි. ඒ කෙනා ඔය පැත්තේද, මේ පැත්තේද කියන එක අදාළ නැහැ. අපට කුණු ගන්න බැහැ වාගේම ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට කුණු ගන්න අපි ඉඩ දෙන්නේත් නැහැ කියමින්, එතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින්ටත් මගේ ස්තුතිය පුද කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවෙන් මට විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමාගේ වෙලාව තුළ ගරු ඇමතිතුමා කථා කරලා ඉවරයි. ඔබතුමා, ඔබතුමාගේ ඔරලෝසුවේ විධියටත් වඩා වැඩිපුර වෙලාව ගත්තා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

එහෙම නම්, මම ගරු රාජ්‍ය ඇමතිතුමාගේ වෙලාවෙන් ගන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතුමාගේ වෙලාවත් අරගෙන ඉවරයි.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

මට කථා කරන්න බොහොමයක් දේවල් තිබෙනවා. ඔබතුමා මගේ බෙල්ලෙන් අල්ලලා තද කරනවා වාගේ වෙලාව ඉවරයි කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා වැඩිපුරත් වෙලාව ගත්තා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
මට කථා කරන්න වෙලාව නැති වුණත්, ගරු ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ අගය කරමින්, එතුමාට සුබ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ගරු ජගත් පුෂ්පකුමාර රාජ්‍ය ඇමතිතුමා ඇතුළු දෙතුන්දෙනාම කිව්වේ අර පොහොර සිද්ධිය සම්බන්ධවයි. ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාවක් ඇවිත් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් COPE එකේ ඉන්නවා. COPE එකට ඒ කණ්ඩායම ගෙන්වා මේ විගණනය ගැන පරීක්ෂා කරලා අපට වාර්තාවක් දෙන්න, ඒ අය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ කොහොමද කියන කාරණය ගැන. මා කියන්නේ ඒකයි. එහි කාගේවත් නම් කියලා නැහැ. "ඒ මුදල් අය කර ගැනීමට කටයුතු කරන්න" කියා සඳහන් කර තිබෙනවා. ඒකට තමයි මම විශ්‍රාම ගිය විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන්න හදන්නේ. ඒකටත් ගරු විරුද්ධ පක්ෂ නායකතුමාගේ කැමැත්තක් නැහැ. එතුමා ඊයේ කිව්වේත්, මේ කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන්න කියලායි. මම දැනටමත් උපදෙස් ලබා දී තිබෙනවා, මේ කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන්න කියලා. නමුත් ඒ කණ්ඩායම COPE එකට ගෙන්වලා නියෝගයක් දුන්නා නම් වඩා වැදගත් කියා මා හිතනවා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
මම ඒ යෝජනාව කරන්නම්. ඔබතුමාට නරක නාමයක් ඇවිත් තිබෙනවා සමාජ මාධ්‍ය හරහා. ඔබතුමාට නරක නාමයක් එනවාට මම කැමැති නැහැ. ඒකයි මම එහෙම කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

[අ.භා. 4.24]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව දැන් ඉඳලා ගණන් කරන්න.

ගරු ඇමතිතුමනි, අපි අහලා තිබෙනවා, "මඩ සෝදාගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියලා ඒ කාලයේ කියලා තිබෙන බව. හැබැයි අද ගොවියා ගැන කියන්න කනගාටුයි. ගොවියා අද මඩ සෝදාගත් කල ඒ කාලයේ ගොවීන් මඩට ඇඳපු අමුඩ ලේන්සුව ගන්නවත් බැරි තරමට අසරණ වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, අද දඹුල්ලේ බී ලූනු ගොවියෝ 5,000කට වැඩි ප්‍රමාණයක් ගොවිතැනින් අයින් වෙලා තිබෙන බව. මේ කන්නයේදී නම් ගොවියන් ගොවිතැනින් අයින් වුණේ වැස්ස නිසා. ඊට කලින් කන්නවලදීම ගොවියෝ ගොවිතැනින් අයින් වුණා. මොකද, බීජවල මිල පාලනය ගැන ප්‍රශ්නයක් තිබුණා; බීජවල ප්‍රමිතිය ගැන ප්‍රශ්නයක් තිබුණා; වගාවට රක්ෂණයක් නැතිකම ප්‍රශ්නයක් වෙලා තිබුණා. ගොවීන්ට මේ වාගේ ගැටලු තිබුණා. මාතලේ දිස්ත්‍රික්කයේ එළවලු ගොවියාත් අද පොහොර මිල සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයත් එක්ක එළවලු වගාවේ යෙදෙනවාද කියන ප්‍රශ්නාර්ථයේ ඉන්නවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මොනරාගල, මහියංගනය ආදී ප්‍රදේශවලත්, ලග්ගල, විල්ගමුව ආදී ප්‍රදේශවලත් ගොවීන් බීජ පිළිබඳ ගැටලුව නිසාත්, මිල පිළිබඳ ගැටලුව නිසාත් බඩ ඉරිඟු වගාවෙන් අයින් වෙලා සිටින බව. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ විල්ගමුව, ලග්ගල, පල්ලේගම, ගලේවෙල, පල්ලේපොල ආදී වශයෙන් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11හිම වැඩි වශයෙන් වී ගොවිතැන කරනවා. අද ඒ ගොවියෝ වගාවෙන් අයින් වෙලා ඉන්නවා. යල කන්නයේ භූමි ප්‍රමාණයෙන් සියයට 10ක වගා කරලා තිබුණේ නැහැ. මහ කන්නයේ ඊට වඩා වැඩි භූමි ප්‍රමාණයක වගා කටයුතුවලින් ගොවියෝ ඈත් වෙලා තිබුණා. ඒකට එක හේතුවක් තමයි, අක්කරයක් වගා කරන්න යන වියදම. මට කාලය නැති නිසා මම කෙටියෙන් ඒ ගැන කියන්නම්. අක්කරයක වී වගා කරන්න ගියාම බිත්තර වීවලට රුපියල් 8,000ක් වැය වෙනවා, හී හාන්න රුපියල් 25,000ක් වැය වෙනවා, **ලියැදි** කපන්න රුපියල් 18,000ක් වැය වෙනවා, පොහොරවලට රුපියල් 30,250ක් විතර වැය වෙනවා, කෘමිනාශකවලට රුපියල් 18,000ක් විතර වැය වෙනවා, කුලිය සඳහා තවත් රුපියල් 24,000ක් විතර වැය වෙනවා. තවත් වියදම් තිබෙනවා. ඒ ඔක්කෝම එකතු කළාම රුපියල් 179,000ක් විතර වැය වෙනවා, අක්කරයක වගාවට. අපේ පළාත්වල නම් මේ වන කොට වී අස්වැන්න අඩුයි කියලා අපි දන්නවා. හැබැයි, පොළොන්නරුවේ කොහොමද කියලා මම දන්නේ නැහැ. අක්කරයකට වී බුසල් 80ත්, 100ත් අතර ප්‍රමාණයක් තමයි ලැබෙන්නේ. එතකොට අර කියපු පාලන මිලට වී දුන්නොත් - වී කිලෝවක් රුපියල් 95ට ගොවියාගෙන් ගත්තොත් - ලැබෙන්නේ කීයද කියලා ඔබතුමා බලන්න. රුපියල් 159,000ක් වාගේ මුදලක් තමයි අක්කරයකින් ලැබෙන්නේ. අක්කරයකට රුපියල් 179,000ක් වියදම් කරලා රුපියල් 159,000ක් ලබා ගන්න ගොවියෝ ඒ ගොවිතැනේ ඉඳී ද? අස්වැන්න නෙළලා අන්තිම වන කොට ගොවියා රුපියල් 20,000ක් රටට ණය වෙනවා, කාට හරි ණය වෙනවා. එතකොට ඒක අතින් කාලා හරක් බලනවා වාගේ වැඩක් වෙනවා. මෙන්න මේ වාගේ ගැටලු තිබෙනවා.

අය වැයේදී කිව්වා පොහොර ගන්න අක්කරයකට රුපියල් 6,000ක් දෙනවා කියලා. මම හිතනවා ඒක ගොවියා හැල්ලුවට ලක් කිරීමක් කියලා. ඒ අයට තිබුණු ප්‍රශ්නය කෘෂිකර්ම

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

අමාත්‍යාංශය තේරුම් ගත්තේ නැහැ. ගොවියා අසරණ කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ගොවීන්ට පොහොර ගන්න පුළුවන් විධියට පොහොර සුලබ කරලා දෙන්න. ඒ අය ඒ අයට කැමති විධියට ඒ මිල දී ගැනීම් කරයි. මොකද, ඒ අයත් එක්ක කථා කළාම අපට දැනෙනවා පොහොර ගන්න, රුපියල් 30,000ක් විතර ඕනෑ වෙනවා කියලා. ඒ වියදම් දරන්න බැරි වුණොත් ගොවියෝ වී ගොවිතැනින් අයින් වෙනවා. එහෙම වුණොත් අන්තිම වී ඇටයත් පිට රටින් ගෙන්වන්න සිදු වන එක වළක්වා ගන්න අපට බැරි වේවි. මොකද, කෘෂි කර්මාන්තය නවීකරණය කරනවා කියලා කොච්චර කිව්වත්, වගාවට අවශ්‍ය පහසුකම් නොලැබෙනවා නම්, ගොවීන් ගොවිතැනෙහි යෙදෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ වෙලාවේ මතක් කර දෙනවා, කවුරුත් කථා නොකරන ගම්මිරිස් ගොවියා ගැන. මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, උකුවෙල, රත්තොට සහ අඹන්ගඟ කෝරළේ කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මිනිසුන් ජීවත් වෙන්නේ ගම්මිරිස් ගොවිතැනින්. ඔබතුමා එහේ ගිහිල්ලාත් තිබුණා, එක දවසක්. ඒ අයටත් ගැටලු තිබෙනවා. ඒ අයටත් පොහොර සහනාධාරය ඒ විධියටම ලැබෙනවාද කියා ඔබතුමාගේ පිළිතුරු කථාවේදී සඳහන් කරන ලෙස මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා. මොකද, එහෙම නොවුණොත් අර ඔබතුමා කිව්වා වාගේ ඒ අයටත් කියන්න වෙනවා, ගම්මිරිස්වලින් වැඩක් නැති හින්දා අක්කර භාගයෙන් රුපියල් ලක්ෂ 50ක් ගන්න මිරිස් වගාවටවත් යන්න කියලා. මොකද, මිරිස් අක්කරයක් වගා කර ගත්තොත් රුපියල් කෝටියක් හොයා ගන්න පුළුවන්. වී ගොවියාටත් මිරිස් වගාවම කරන්න කියන්න අපට පුළුවන්. ගරු ඇමතිතුමනි, මෙවැනි තත්ත්වයක් අපේ ගොවිතැනේ තිබෙනවා කියන එක අපි අවබෝධ කර ගන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට කෘෂි නවීකරණ වැඩ පිළිවෙළට බිලියන 7.25ක් වෙන් කරලා තිබෙනවා අපි දැක්කා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා මේ රට දැනුවත් කරන්න. මේ දවස්වල ඔබතුමා - කෘෂිකර්ම අමාත්‍යාංශය- ගොවියා නඟා සිටුවීම කෙසේ වෙතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නඟා සිටුවන දැඩි වැඩ පිළිවෙළක ඉන්නවා කියා මම දන්නවා. ප්‍රශ්නයක් නැහැ. බඩ ඉරිඟු ගොවියා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයා වුණත් කමක් නැහැ, ඔහු බඩ ඉරිඟු වවනවා නම්. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, බීජ දෙන කොට ඉඩම් නැති අයට දෙන්න එපා, ගරු ඇමතිතුමා. තඹුත්තේගම සමහර තැන් වටලලාත් තිබෙනවා. අපි වීඩියෝ පටය දැක්කා. ඉඩම් නැති මිනිසුන්ගේ ලැයිස්තුත් ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලා දීලා තිබුණා. ඒ අයට ආයේ බීජ දෙන්න එපා. දීලා වැඩක් නැහැ. මොකද, ඒ අයට ඒවා හදාගන්න තැනක් නැහැ.

ගරු ඇමතිතුමනි, 2024දී නියඟයක් එන බව කියනවා. ඒකත් අමතක කරන්න එපා. ඒකට මුහුණ දෙන -ආහාර සුරක්ෂිතතාව පිළිබඳ- වැඩ පිළිවෙළ මොකක්ද? ඒකට පිළිතුරත් පටි තද කර ගන්න කියන එක නම්, ආයෙත් එහෙම පටි තද කර ගන්න විධියක් නැති වෙනවා. මොකද, දැන් VAT එක ගහලා හොඳටම පටි තද වෙලා යන්නේ. ඒ නිසා 2024දී එන නියඟයට මුහුණ දෙමින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සම්බන්ධයෙන් වන වැඩ පිළිවෙළ මොකක්ද කියලා කියන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට දැන් වැවිලි කර්මාන්ත විෂයයත් අලුතින් ලැබිලා තිබෙන හින්දා තවත් කාරණයක් කිව යුතුයි. මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙනවා, ඇල්කඩුව වැවිලි සමාගම සහ රාජ්‍ය වැවිලි සමාගම. දැන් ඒ දෙකම විකුණන්න හෝ ප්‍රතිව්‍යුහගත කරන්න හෝ යන බවක් අපි දකිනවා. ඇල්කඩුව වැවිලි සමාගම කියන්නේ හොඳින් ලාභ ලබා පෙන්නපු සමාගමක්. ගරු ඇමැතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ හැම එකකටම විසඳුම විකිණීම කර ගන්න එපා කියලා. විකුණලා හරි, ප්‍රතිව්‍යුහගත කරලා හරි යම්කිසි යහපතක් වෙනවා කියලා හිතනවා නම්, ඊට කලින් ඔබතුමන්ලා හොඳට හොයලා බලන්න, ඒ ආයතනවල ඉන්න නිලධාරීන් කවුද කියලා. ඒ සමාගම්වල ඉන්න නිලධාරීන්ගේ දූෂණ නිසා ඒවා බිඳ වැටීම සිද්ධ වෙනවා. ඒ කාරණය COPE එකටත් ගෙනාවා. හැබැයි, එහිදී කියපු ඉලක්කම් නම් නිවැරැදි නැහැ; වැරදියි. නඩුවට රුපියල් දෙකෝටි හැත්තෑහතර ලක්ෂයක් කියලා කිව්වා. මා හිතන විධියට ඒ මන්ත්‍රීතුමාට ඉලක්කම් කියවීම පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ඒ තරම් ලොකු ගාණක් නැහැ. වැරදීමකින් ඒක කියවිලා තිබෙන්නේ. කොහොම වුණත්, හොරකමක් සිද්ධ වෙනවා නම් ඒක හොරකමක්ම තමයි. හැබැයි COPE එකට අහු වුණේත් ලොකුම හොරකම් ටික නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ඒ වැවිලි සමාගම් ඇතුළේ තිබෙන හොරකම් ටික ගැන ජනාධිපති විමර්ශන ඒකකයෙන් විමර්ශනයක් කරන්න කියලා. ඒ කටයුත්ත අමාත්‍යාංශයට බාර දුන්නාට ඒකෙන් කරන විමර්ශනයෙන් වැඩක් නැහැ. මොකද, මා හිතන්නේ නැහැ, හොරාගේ අම්මාගෙන් පේන අහලා වැඩක් තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නයි යන්නේ. මට තවත් විනාඩියක් දෙන්න.

ගරු ඇමතිතුමනි, වතු ආශ්‍රිතව සිටින 15,000කට ආසන්න පිරිසක් ඒ ආයතන මාර්ගයෙන් ජීවත් වෙනවා. ඒ අයගේ අනාගතය ගැන අවිනිශ්චිතභාවයක් තිබෙනවා, මේ ප්‍රතිව්‍යුහගතකරණය තුළ. ඒ අයට පැහැදිලි කරලා දෙන්න, ඒ අයගේ ජීවිතවලට මොකක්ද වෙන්නේ කියලා.

ඒ අයට ඒවායේ ඉන්න පුළුවන්ද, එහෙම නැත්නම් මොකක්ද වෙන්නේ කියන එක පැහැදිලි කර දෙන්න. මොකද, ඒ ජනතාව කැමැතියි, රජය යටතේම ඒ වතු තිබෙනවාට. ඒවා ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑම නම්, ඒ ජනතාවගේ ජීවිතවල සුරක්ෂිතතාව තහවුරු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, මෙතෙක් කාලයක් ඒ වතු රැක්කේ, වතුකරයේ ජනතාව. ඒ අයගේ දහඩියෙන් තමයි ඒ වතු ටික රැකුණේ. ඒවායේ අයිතිය ඒ අයට තිබෙනවා. ඒ නිසා ඒ අයගේ ජීවිතවල සුරක්ෂිතතාව අවශ්‍යමයි. ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා වැඩි කරනවා කිව්වා. ඒක හොඳයි. රුපියල් 2,000 කරන්න පුළුවන් නම් හොඳටම හොඳයි. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ අයට පදිංචිය සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ඇතුව - *[බාධා කිරීමක්]* වැඩි කරනවා කියලා කියා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, එහෙම නම් හොඳයි. ඒක රුපියල් 2,000ක් කරලා දෙන්න. මොකද, VAT එක අය කිරීමත් එක්ක රුපියල් 1,700න් කරන්න දෙයක් නැහැ. ඒ වාගේම ඒ අයගේ පදිංචි ඉඩම පිළිබඳවත් තහවුරුවක් දෙන්න. කොහේවත් නැති තැනක ඒ අයට නිකම්

ගෙයක් අටවන්නේ නැතුව ඒ අයට පහසුකම් ඇතුව නිවාස ඉදිකරලා දෙන්න. ඒ සඳහා විවිධ ක්‍රම අද ලෝකයේ තිබෙනවා. පාසල, රෝහල ආදී සියල්ලම එක තැනක පිහිටා තිබෙන විධියේ ගම්මාන හදලා දෙන්න. ඒ වාගේම ඒ අයට හිමිකම් කීමට හැකි නොවන සේ මේ වතුවලින් අක්කරයක් හෝ දෙකක් වගා කරගන්නත් අවස්ථාව සලසා දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජීවනාලිය බඳු ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාදයට එකතු වෙන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. පසුගිය කාලයේ මතු වුණු පොහොර සම්බන්ධ ගැටලු නිසා කෘෂිකර්මාන්ත සහ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රවල යම් පසුබෑමක් ඇති වුණත්, ඒ තත්ත්වය දැන් ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතිනවා. ඒ නිසා තිබුණු තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක් ඉදිරියේ දී මේ ක්ෂේත්‍රයන්හි ඇති වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. කලින් කලට මතු වන ගැටලුවලට සාධනීය විසඳුම් ලබා දෙමින් ඉදිරියට කටයුතු කිරීම ඉතාම වැදගත්. ගංවතුරක දී, නියඟයක දී වාගේම කෘමීන්ගෙන් සිදු වන හානි ඇතුළු පූර්ණ කාලීනව පාලනය කළ නොහැකි ඇතැම් කරුණු කාරණාවල දී මේ ක්ෂේත්‍රයට වන හානි අපි බලාපොරොත්තු වන ඉලක්ක කරා යාමට විශාල බාධාවක් වෙනවා. එවැනි අවස්ථාවකදී -ඉලක්කවලට යන්න බැරි වුණාම- එම නිෂ්පාදන පිට රටින් ගෙන ඒම සඳහා කටයුතු කරනවා වෙනුවට අපි වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කරගන්න අපි උනන්දු විය යුතුයි. ඉදිරි කාලයේ කරන දේවල් ගැන පුරෝකථනයක් කරලා ඒ සඳහා නිවැරදිව සූදානම් වෙන්න, ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත්.

මා නියෝජනය කරන බද්දේගම ආසනය ඇතුළු සමස්ත ගාල්ල දිස්ත්‍රික්කය ගත්තාම තේ, කුරුඳු ඇතුළු භෝග වගා කරලා බොහෝ පිරිසක් ආදායම් ලබා ගන්නවා. ඒ තුළින් රටේ ආර්ථිකයට වාගේම අපනයනයටත් විශාල ශක්තියක් ලබා දෙනවා. ඩොලරයේ වටිනාකම ආණ්ඩුවට පූර්ණ කාලීනව පාලනය කරන්න බැරි බව අපි දන්නවා. හැබැයි, තේ දලු කිලෝවක් සඳහා ලැබෙන ආදායම, කුරුඳුවලට ලැබෙන ආදායම ආදිය ගැන තමයි වගා කරන ජනතාව විශාල වශයෙන් උනන්දු වෙන්නේ. අපට පූර්ණ කාලීනව මිල පාලනය කරන්න නොහැකි වුණත්, වැඩි ඵලදාවක් ලබා ගැනීම සඳහා, වැඩි දලු ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා දැනුම ලබා දීම ඉතාම වැදගත් වෙනවා. ඒ මඟ පෙන්වීම ලබා දීම ඉතාම වැදගත් වාගේම ඒ අයට දැරිය හැකි මිලකට අඛණ්ඩව පොහොර ලබා දීමත් ඉතාම වැදගත්. ඒ වාගේම තමයි පොහොර ලබා දීම පිළිබඳව විශ්වාසය ඇති වීමත් ඒ හා සමානවම වැදගත් වෙනවා.

මේ ආශ්‍රිතව තිබෙන ප්‍රධානතම ගැටලුවක් තමයි ශ්‍රම හිඟය. ශ්‍රම හිඟය වෙනුවෙන් තාක්ෂණය හඳුන්වා දීම වර්ෂ කිහිපයක සිට ක්‍රියාත්මක වෙනවා. ඇතැම් උදවිය නව තාක්ෂණ ක්‍රමවේද වෙත යොමු වෙලා තිබෙනවා. තවත් උදවිය නව තාක්ෂණයට යොමු වෙන්න යම් ආකාරයක මැළිකමක් දක්වනවා. ලැබෙන දලු ප්‍රමාණය අඩු වීම ඇතුළු විවිධ කරුණු නිසා ඇතැම් අය මේවාට යොමු වෙන්න යම් මැළිකමක් දක්වනවා. හැබැයි, මේ සම්බන්ධයෙන් නිවැරදි දැනුවත් කිරීමක් ලබා දීම ඉතාම වැදගත්. අද අපි මුහුණ දෙන ශ්‍රම හිඟයෙන් කුඩා තේ වතු හිමියන් මුදා ගැනීම සඳහා නිසි තාක්ෂණික දැනුම ලබාදීමත් ඉතාම වැදගත්. සමස්තයත් විධියට මේවායේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා "B-60 policy" ඇතුළු සංකල්ප ක්‍රියාත්මක වෙනවා. ජනවාරි සිට මේක අනිවාර්ය කරන්න යනවා කියලා මම දැක්කා. කෙසේ වෙතත්, ලෝකයේ තිබෙන "Ceylon Tea" කියන සන්නාමය රැක ගැනීම ඉතාම වැදගත්. කසළ තේ, තත්ත්වයෙන් බාල තේ අපනයනය කිරීම නතර කිරීමට කටයුතු කිරීමත් ඉතාම වැදගත්. වතු සමාගම් සතු වගා නොකරන ඉඩම් සියල්ලත් වගා කළ යුතුයි. විශේෂයෙන් ඒ ගැන කටයුතු සිදු කිරීම ඉතාම වැදගත්.

අපේ දිස්ත්‍රික්කයේත් විශාල ලෙස වගා කරන කරුඳු ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. අපේ කුරුඳු ලෝකයේ ඉහළම තත්ත්වයේ කුරුඳු ලෙස නමක් දිනාගෙන තිබෙනවා. අපි දන්නවා, අද වෙනකොට වෙනත් රටවලින් අපනයනය කරන cassia cinnamon අඩු මිලට ලෝක වෙළඳපොළට එක්වීමත් එක්ක අපට තරගයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන බව. හැබැයි, මේ cassia cinnamonවල තිබෙන සංඝටක ශරීරයට අහිතකරයි කියන කාරණය ගැන මේ වෙනකොට වාර්තා පළ වීමත් එක්ක Ceylon cinnamonවලට තිබෙන වටිනාකම ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපේ වගකීමක් තමයි ඊට ගැළපෙන විධියේ සැපයුමක් ලෝක වෙළඳපොළට ලබා දෙන්න අවශ්‍ය කටයුතු සිදු කිරීම. විශේෂයෙන් කරුඳු තැලීම, කුරුඳු කැපීම ඇතුළු මේ කාරණා ගැන නිසි පුහුණුවක් ලබාදීමත් ඉතාම වැදගත්. මොකද, මේවායින් බොහෝ ප්‍රදේශවල ආදායමෙන් තුනෙන් එකක් වාගේ තමයි ලැබෙන්නේ; දෙකෙන් එකක් වාගේ ලැබෙන ප්‍රදේශත් තිබෙනවා. නිසි ප්‍රමිතියෙන් යුතුව මේ සඳහා පුහුණුව ලබාදීම අපනයනයට ගැළපෙන ඉහළ ප්‍රමිතියෙන් යුතු කුරුඳු නිෂ්පාදනය කිරීම සඳහා ඉතාම වැදගත්. ඒ වාගේම අපි දන්නවා, සාම්ප්‍රදායිකව අපනයනය කරන තේ සහ කුරුඳුවලට value additions සිදු කරලා මේ වෙනකොට යම් නිෂ්පාදනයක් සිදු වෙන බව. මේ ගැනත් යම් ආකාරයක සොයා බැලීමක් සිදු කිරීම ඉතාම වැදගත්.

ඒ වාගේම තමයි සාම්ප්‍රදායිකව පොල් වගාකරන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
හොඳයි, මම අවසන් කරනවා.

සාම්ප්‍රදායිකව පොල් වගා කරන ප්‍රදේශවලින් බැහැරව පොල් වගා කිරීමේ වැඩසටහන් පසුගිය කාලයේ ආරම්භ වුණා. මේ සියල්ල ගැන අපි විශේෂ අවධානයක් යොමු කිරීම ඉතාම වැදගත්. විශේෂයෙන්ම කෘමීන්ගෙන් සිදුවන රෝග නිසා පසුගිය කාලයේ විශාල හානියක් මේ ක්ෂේත්‍රයටත් ඇති වුණා. මට මීට වඩා කථා කරන්න කාලය නැහැ. මේ කෙටි කාලය තුළ මා සඳහන් කරපු කරුණු ගැන ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම විශේෂයෙන් සිදු කරමින්, කෙටි කාලයක් හෝ ලබාදීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පළ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

අද දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයට එක්වීමට ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම අද ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු කථා කරපු විධියට මේ රටේ වී ගොවියා වාගේම අනෙක් සියලු ගොවීන්ට කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මේ අය වැය තුළින් ලබන වසරේ සිට ලබා දෙන ඒ ආධාරවලින් හොඳක් වේවා කියලා තමයි හැම දෙනාම ප්‍රාර්ථනා කරන්නේ. විශේෂයෙන්ම දිනෙන් දින සහල් මිල වැඩි වුණත්, මේ රටේ වී ඇටය නිෂ්පාදනය කරන ගොවියාට නම් සාධාරණයක් සිදු වෙලා නැහැ.

ගරු ඇමතිතුමනි, මේ රටේ තිබෙන කෙත් ඇළ මාර්ග ගැන කථා කළොත්, ඒ ඇළ මාර්ග සම්පූර්ණයෙන්ම මේ වෙනකොට විනාශ වෙලා තිබෙනවා. පොහොර වාගේම ජලයත් වගාවට අත්‍යවශ්‍ය දෙයක්. විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, කෙත් ඇළ මාර්ග කිලෝමීටර 1,057ක් තිබෙනවා. මේ කිලෝමීටර 1,057න් සියයට 85කම ජලය අපතේ යනවා. ගරු ඇමතිතුමනි, ලෝක බැංකු ණය ආධාර යටතේ මේ සම්බන්ධව පොළොන්නරුව දිස්ත්‍රික්කයට මිලියන 850ක් ලැබුණා. මේ මිලියන 850න් කරන්න ලක්ෂ 50ට අඩු ව්‍යාපෘති ඒ ප්‍රදේශයේ තිබෙන ගොවි සංවිධානවලට භාර දුන්නා. කෘ.ප.නි.ස. ලා ඉන්නවා; කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉන්නවා. හැබැයි, මේ ව්‍යාපෘති ගොවි සංවිධානවලට භාර දුන්නාට මේ නිලධාරින් මොනවා කරනවාද කියා මම නම් දන්නේ නැහැ. ව්‍යාපෘති 87ක් ගොවි සංවිධානවලට භාර දුන්නත්, මේවායේ පසු විපරමක් කරලා නැහැ. මේ ව්‍යාපෘතිවලින් 30ක් විතර වාගේ තමයි මේ වෙනකොට අවසන් වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කළොත්, අපට ජලය ඉතුරු කර ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මොන තරම් වැස්ස ලැබුණත් වැසි දෙකක් තුනක් නැති වෙනකොට ජලය නැති වෙනවා. මේ ජල ප්‍රශ්නය එනවා. විශේෂයෙන්ම පරාක්‍රම සමුද්‍රයෙන් ගලා යන ඩී. 1 ඇළ මාර්ගය සහ පොළොන්නරු දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන ඇළ මාර්ග බලන්න. ගරු ඇමතිතුමනි, ඩී. 1 ප්‍රධාන ඇළ පටන් ගන්නකොට පළල අඩි 30ක් පමණ තිබුණාට කිලෝමීටරයක් විතර ඈතට යනකොට මෙහි පළල අඩි 80ක්, අඩි 100ක් බවට පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ගරු රොෂාන් රණසිංහ මැතිතුමා පොළොන්නරුවේ බන්ට් එකේ ඇවිදින මංතීරු හදනකොට මම එතුමාට යෝජනා කළා, ඔබතුමා මේ සඳහා වෙන් කරන මුදල් අපේ ප්‍රධාන ඇළ මාර්ග ටික හදන්න වෙන් කරන්න කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙයට මැදිහත් වෙලා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර මෙවර අය වැයෙන් මේ ප්‍රධාන ඇළවල් ටික හැදුවොත් අපට ජලය ඉතුරු කර ගන්න පුළුවන්.

ඊළඟට, මේ දෙනවා කියන පොහොර සහනාධාරය ගැනත් අපි මතක් කරලා දෙන්න ඕනෑ. අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරය, මාදුරු ඔය ව්‍යාපාරය, කවුඩුල්ල ව්‍යාපාරය, ගිරිතලේ ව්‍යාපාරය යන මේ කිසිම ව්‍යාපාරයකට, මහවැලි කලාපවලට පොහොර සහනාධාරය ලබා දීලා නැහැ. මේ වෙනකොට ගොවීන්ට බණ්ඩි පොහොර, මඩ පොහොර අවශ්‍යයි. එම නිසා මේ කාලයේදී මේ පොහොර සහනාධාරය ගොවීන්ට ලබා දෙන්න ඕනෑ. ගොයමට දැන් දින 15ත්, 20ත් අතර කාලයක් ගතවෙලා තිබෙනවා. දැන් ඒ ගොයමට යූරියා ගහන්න ඕනෑ කාලය හරි. ගරු ඇමතිතුමනි, මේ පොහොර සහනාධාරය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට ලබා දෙන්නේ කවදා ද?

ඒ වාගේම, අක්කරයකට රුපියල් 6,000ක වන්දි මුදලක් ලබා දෙන බව කියනවා. මේ මුදල ප්‍රමාණවත් ද? මේ ගරු සභාවේ කථා කරපු සියලුදෙනා කිව්වේ මේ වන්දි මුදල ප්‍රමාණවත් නැහැ කියලායි. සාමාන්‍යයෙන් අක්කරයකට රුපියල් 42,000ක වාගේ මුදලක් පොහොරවලට විතරක් වැය වෙනවා. අපේ රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කියපු විධියට අද වන විට ගොවියා අන්ත අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ගොවියා අක්කරයක් වගා කරන්න රුපියල් 20,000ක් විතර ණය වෙනවා. ඒ ලැබෙන අස්වැන්නේ ආදායමින් ගොවියා මාස 6ක් ජීවත් වෙන්නත් ඕනෑ. ගරු ඇමතිතුමනි, එම නිසා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියා මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

ඒ වාගේම, අලි-මිනිස් ගැටුම ගැනත් මම කියන්න ඕනෑ. මේ අලි-මිනිස් ගැටුම වැඩියෙන්ම පටන් ගන්නේ අස්වැන්න නෙළන කාලයටයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයට ආපු වෙලාවේත් මේ ප්‍රශ්නය මතු වුණු බව ඔබතුමා දන්නවා. අස්වැන්න නෙළන ගොවියා ඒ වී ටික ගබඩා කරන්නේ තමන්ගේ ගෙදර. ගොවියා තමන්ගේ ගෙදර වී ටික ගබඩා කරනකොට, වී සුවඳ සොයාගෙන වනඅලි ගෙදරට ඇවිල්ලා ඒ වී ටිකත් කාලා, නිවසත් සම්පූර්ණයෙන්ම විනාශ කරලා යනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, අක්කර දෙකහමාරට වඩා වැඩි භූමියක අස්වැන්නක් නෙළන ගොවීන්ට හිස් කන්ටේනර් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. අඩි 20ක් හෝ අඩි 40ක් දිග කන්ටේනර් ඔවුන්ට ලබා දෙන්න පුළුවන්. එතකොට ඒ ගොවීන්ගේ නිවසට කිට්ටු නැති තැනක මේ කන්ටේනර් තියලා ඔවුන්ගේ වී ටික ගබඩා කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙවර අය වැයෙන් මේ කන්ටේනර් ටික ගොවි ජනතාවට ලබා දුන්නොත්, මේ අලි-මිනිස් ගැටුමෙන් ගෙවල්වලට වන හානිය අවම කර ගන්න අපට පුළුවන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින්ම කථාව අවසන් කරන්නම්.

ඊළඟට මම කැමැතියි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන බීජ වී ගොවිපොළ ගැනත් කථා කරන්න. මේ ගොවිපොළේ වපසරිය හෙක්ටෙයාර 195ක්. ගරු ඇමතිතුමනි, මේ ගොවිපොළේ වගා කරන්න පුළුවන් හැම භූමි කොටසකම වගා කරලා තිබෙනවා. හැබැයි, මේකේ කම්කරුවෝ ඉන්නේ 46දෙනායි. මේ 46දෙනාගෙන් පමණක් අය මේ වන විට අවුරුදු 8ක් වාගේ කාලයක් තිස්සේ වැඩ කරමින් ඉන්නේ. පමණක් අය අවුරුදු 5ක් වාගේ කාලයක් තිස්සේ වැඩ කරමින් ඉන්නේ. නමුත්, මේ

සේවකයන් තවම සේවයේ ස්ථිර කරලා නැහැ. ඒ නිසා මේ ඉන්න පිරිස ස්ථිර කළොත්, මේ අයගෙන් අපට උපරිම සේවයක් ගන්න පුළුවන් වෙනවා, ගරු ඇමතිතුමනි. ඒක අපට තිබෙන හොඳ බීජ ගොවිපොළක්. මේ බීජ ගොවිපොළට ප්‍රමාණවත් නිලධාරින් පිරිසක් පත් වුණොත්, මේ බීජ ගොවිපොළෙන් වැඩි අස්වැන්නක් ලබා ගන්න අපට පුළුවන්.

ඒ වාගේම, පොළොන්නරුවේ තිබෙන NLDB farm එක ගැනත් මම කියන්න ඕනෑ. මේ farm එක හරහා කදුරුවෙල නගරයට අලි එන්න පටන් අරගෙන තිබෙනවා. ඒ farm එකේ ඉන්න කළමනාකාරතුමා ගැන ඔබතුමාත් දන්නවා ඇති. එතුමා මැදිහත්වෙලා වනඅලි එන එක වළක්වන්න විකල්පයක් හොයා ගත්තා. එතුමා ඒ ප්‍රශ්නයට විකල්පයක් හොයා ගත්තාට පස්සේ මොකක්ද කළේ? වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා එතුමාට නඩු දාලා, එතුමා උසාවියට ඉදිරිපත් කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එතැන තිබෙන ජාතික ක්‍රීඩාංගණයේ වැටත් අලි ඇවිල්ලා සම්පූර්ණයෙන්ම විනාශ කළා. එහා පැත්තේ තිබෙන්නේ විද්‍යාපීඨය. එතැනටත්, කදුරුවෙල නගරයටත් දැන් අලි එන්න පටන් අරන් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ NLDB farm එක හරහා කදුරුවෙල නගරයට වනඅලි එන එක නවත්වන්න කටයුතු කළේ එහි කළමනාකාරතුමා ඇතුළු කාර්ය මණ්ඩලය. ඒ නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් එක්ක මේ සම්බන්ධයෙන් කථා කරලා, එතුමා කරගෙන ගිය වැඩ පිළිවෙළ නැවතත් ක්‍රියාත්මක කරන්න එතුමාට අවස්ථාව ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කාදර් මස්තාන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.45]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා (ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கா. காதர் மஸ்தான் - கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. K. Kader Masthan - State Minister of Rural Economy)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் இடம்பெறுகின்ற கமத்தொழில் அமைச்சு மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் 2024ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட குழுநிலை விவாதத்தில் கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சராகக் கலந்து கொண்டு பேசுவதையிட்டு நான் மிகுந்த மகிழ்ச்சி அடைகின்றேன்.

எமது நாட்டினுடைய பொருளாதாரத்தின் ஒவ்வொரு துறையிலும் விசேட கவனம்செலுத்தி முன்வைக்கப்பட்டுள்ள இந்த வரவு செலவுத்திட்டமானது, அரச மற்றும் தனியார் துறைகளின் எதிர்கால அபிவிருத்தியை நோக்கிய, விரைவான வளர்ச்சிக்கான ஆரம்பமாக அமையுமென நான் கருதுகின்றேன்.

இந்த அமைச்சுடன் சம்பந்தப்பட்ட கௌரவ இராஜாங்க அமைச்சர்களான நானும் கௌரவ மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்களும் கௌரவ டீ.பீ. ஹேரத் அவர்களும் கௌரவ லொஹான் ரத்வத்தே அவர்களும் கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்களுடன் கைகோர்த்துச் செயற்பட்டு, மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் இலக்கை அடையவுள்ளோம். இதுவே எமது பிரதான நோக்கமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறைந்த வருமானம்பெறும் கிராமப்புற மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்தும் வகையில், கிராமியப் பொருளாதாரப் பிரிவின்மூலம் பல்வேறு திட்டங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றன. பிராந்தியப் பொருளாதார மையங்களின் நிர்வாகம் மற்றும் அபிவிருத்தி நடவடிக்கைகள் தொடர்பில் தேவையான வழிகாட்டல்களை வழங்கி, அதனூடாக விவசாயிகளின் மேம்பாட்டுக்கான செயற்றிட்டங்கள் உருவாக்கப்படுகின்றன. இதுதவிர, இலங்கை ஹதபிம அதிகாரசபை யூடாக நாங்கள் மேலதிகச் செயற்பாடுகளையும் திட்டமிடுகின்றோம்.

கௌரவ அமைச்சர் அவர்கள் விவசாய அமைச்சின் பணிகளை மேலும் வெற்றிகரமாக முன்னெடுப்பதற்காக மாகாணங்களை வலயங்களாகப் பிரித்து, அவற்றின் செயற்பாடுகளை நேரடியாகக் கண்காணிக்கும் பொறுப்பை இராஜாங்க அமைச்சர்களான எம்மிடம் ஒப்படைத்துள்ளார். அதன்படி, வடக்கு, கிழக்கு மற்றும் மத்திய மாகாணங்கள் எனது மேற்பார்வையின்கீழ் வருகின்றன. மாகாண மட்ட முன்னேற்ற மீளாய்வுக் கலந்துரையாடல்கள் இடம்பெற்று வருவதுடன், 2024ஆம் ஆண்டுக்கான செயற்பாடுகள் தொடர்பான சந்திப்புக்களையும் நாங்கள் மேற்கொள்கின்றோம். எதிர்வரும் சனவரி மாதமும் கூட்டங்களை நடாத்தி, அதிகாரிகளின் வழிகாட்டுதலுடனும் ஆதரவுடனும் எமது செயற்பாடுகளை வெற்றிகரமாகத் தொடரவுள்ளோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது நமது நாட்டின் கிராமப்புறங்களில் கணிசமான எண்ணிக்கையிலான குடும்பங்கள் தொழில்வாய்ப்புகளின்றி குறைந்த வருமானத்துடன் வாழ்கின்றன. அந்த மக்கள் தமது அன்றாட தேவைகளைப் பூர்த்திசெய்வதில் பெரும் சிரமங்களை எதிர்நோக்குகின்றனர். இந்த மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்த பல திட்டங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றன. அவற்றில் பயிர்ச்செய்கை ஊக்குவிப்புத் திட்டங்கள் மற்றும் ஆடு வளர்ப்புத் திட்டங்கள் தேர்ந்தெடுக்கப்பட்ட மாவட்டங்களில் பிரதான திட்டங்களாக நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன. இத்திட்டங்கள் வெற்றியடைய மாவட்டச் செயலாளர்கள் உட்பட ஏனைய அனைத்து அதிகாரிகளும் எமது அமைச்சுக்கு வழங்கிய ஆதரவுக்கு எனது நன்றியை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இத்திட்டங்களை மக்கள் மத்தியில் பிரபல்யப்படுத்துவன்மூலம் பயிரிடப்படும் அளவை அதிகரித்து, பயிர்களின் உற்பத்திகளை அதிகரித்து, தானியங்களை இறக்குமதி செய்வதற்குச் செலவிடப்படும் அந்நியச் செலாவணியைச் சேமிக்க முடியுமென நான் கருதுகின்றேன். மேலும், குறைந்த வருமானம்பெறும் மக்களின் காணிகளை இவ்வாறான பயிர்ச்செய்கைகளுக்குப் பயன்படுத்துவதை ஊக்குவிப்பதன் மூலம் அவர்களது வருமானத்தைப் பாரியளவில் உயர்த்த முடியும். 2023இல் இந்த வேலைத்திட்டங்களுக்காக எமது அமைச்சின் கிராமியப் பொருளாதாரப் பிரிவுக்கு 275 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. எமது அதிகாரிகள் உட்பட மாவட்ட மட்ட அரச அதிகாரிகள் வழங்கிய ஆதரவின்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

காரணமாக இத்திட்டங்கள் வெற்றிகரமாக நடைமுறைப் படுத்தப்பட்டு, நல்ல முன்னேற்றமும் ஏற்பட்டுள்ளது. இந்த முன்னேற்றம் காரணமாக, 2024ஆம் ஆண்டில் இவ்வேலைத் திட்டங்களுக்கென மேலதிகமாக 125 மில்லியன் ரூபாயும் வழங்கப்பட்டிருக்கின்றது. மேலும், வட மாகாணத்தில் ILOஇன் ஆதரவுடன் அரச-தனியார் பங்களிப்புடன் தொழில் முனைவோர் ஊக்குவிப்புத் திட்டங்கள் நடைமுறைப்படுத்தப் பட்டு, அந்தத் திட்டங்கள் எதிர்பார்த்ததைவிட வெற்றிகரமான அடைவைத் தந்தன. அந்த அடைவின் அடிப்படையில், அடுத்த ஆண்டில் அரச-தனியார் பங்களிப்புடன் இந்தத் திட்டங்களை மேலும் விரிவுபடுத்த நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேற் குறிப்பிட்ட வாழ்வாதார அபிவிருத்தித் திட்டங்களுக்கு மேலதிகமாக, எனக்கு ஒதுக்கப்பட்டுள்ள விசேட பொருளாதார மையங்கள் விடயத்தில் அதிக கவனம் செலுத்தத் திட்டமிட்டுள்ளேன். இலங்கையில் விவசாய உற்பத்திப் பொருட்களின் விற்பனையை ஊக்குவிப்பதுடன், நுகர் வோருக்கு நியாயமான விலையில் பொருட்களைப் பெற்றுக் கொடுக்கும் நோக்கத்துடன், வெவ்வேறு காலங்களில் ஸ்தாபிக் கப்பட்ட 13 விசேட பொருளாதார மத்திய நிலையங்கள் தற்போது இயங்கி வருகின்றன. மேலும், வவுனியா, யாழ்ப்பாணம், மட்டக்களப்பு ஆகிய பொருளாதார மையங் களை எதிர்வரும் சனவரி மாதம் மக்கள் பாவனைக்கு கையளிக்க ஏற்பாடுகளைச் செய்து வருகின்றேன். பொருளாதார மையங்கள்மூலம் விவசாயிகள் மற்றும் நுகர் வோருக்கு மிகவும் விரிவான மற்றும் தரமான சேவையை வழங்க முடியுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். அதே நேரம், ஆரம்பிக்கப்பட்டு செயற்படாமல் இருக்கின்ற சில நிலையங்கள் தொடர்பில் கவனம் செலுத்தி, அவற்றின் சிறப்பான செயற்பாட்டுக்கு உரிய நடவடிக்கைகளை நாங்கள் எதிர்காலத்தில் மேற்கொள்வோம்.

மேலும் 'டிஜிட்டல்' தொழில்நுட்பத்தைப் பயன்படுத்தி, அனைத்துப் பொருளாதார மையங்களிலும் பொருட்களின் நாளாந்த விலைகளைக் காட்சிப்படுத்தும் திட்டத்தை நாங்கள் அறிமுகப்படுத்தவுள்ளோம். பொருளாதார மத்திய நிலையங்கள் எந்த நோக்கத்துக்காக அமைக்கப்பட்டதோ, அந்த நோக்கம் சரிவர நிறைவேறவில்லை. விவசாயிகளுக்கு - farmers - கூடிய பயன் கிடைக்க வேண்டும் என்பதற்காகத்தான் நாங்கள் இந்த 'டிஜிட்டல்' திட்டத்தைக் கொண்டுவருகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஹதபிம அதிகாரசபையானது, மண் அரிப்பு, மண்வளப் பாதிப் பைக் குறைத்தல், நிலையான நில மற்றும் நீர்நிலைகளைப் பாதுகாத்தல், அவற்றை மேம்படுத்தல், பண்ணை அபிவிருத்தி ஆகியவற்றை மேற்கொள்கின்றது. 2023ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளின்கீழ் அபிவிருத்தி நடவடிக்கைகளுக்காக ஒதுக்கப்பட்ட நிதியைப் பயன்படுத்தி, ஹதபிம அதிகாரசபையானது வெற்றிகரமான பல்வேறு அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொண்டுள்ளது. நாங்கள் அடுத்த ஆண்டில் பழ உற்பத்திக் கிராமங்கள், மரக்கறி உற்பத்திக் கிராமங்கள், தேனீ வளர்ப்புக் கிராமங்கள், கோழி வளர்ப்புக் கிராமங்கள் என்பவற்றை உருவாக்கும் வேலைத்திட்டத்தை முன்னெடுக்க எதிர்பார்க்கின்றோம். மேலும், விவசாயம் சார்ந்த கிராமிய வீடுகளுடனான பண்ணை சுற்றுலாத் தங்குமிடங்களையும், விவசாய இளைஞர் சங்கங்களையும் உருவாக்குவதன்மூலம் வேலையில்லாத் திண்டாட்டத்தைக் குறைப்பதற்கும், இளைஞர்களை விவசாயத் துறையில் ஆர்வமூட்டுவதற்குமான வேலைத்திட்டங்களை நாங்கள் முன்னெடுக்கத் திட்டமிட்டுள்ளோம்.

இன்று இங்கு உரையாற்றிய பல உறுப்பினர்கள் தங்களுடைய மாவட்டங்களில் பிரதான வாய்க்கால்களைப் புனரமைக்கவேண்டி இருப்பதாகக் கூறியிருந்தார்கள். சிறியளவிலான நிதி ஒதுக்கீட்டின்மூலம் குளங்கள் புனரமைக் கப்பட்டாலும், விவசாயம் சார்ந்த வாய்க்கால்களும் வீதிகளும் புனரமைக்கப்படவில்லை. எனவே, முன்னுரிமை அடிப் படையில் அவற்றைப் புனரமைப்பதற்குச் சரியான திட்டங் களை எதிர்காலத்தில் வகுத்துச் செயற்படுவோம் என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன்.

இங்கு உரையாற்றிய பலர் கூறியதுபோல, வடக்கு, கிழக்குப் பகுதிகளில் பல குளங்களும் விவசாய நிலங்களும் Department of Forest Conservation இன்கீழ் இருப்பதால், அந்தக் குளங்களைப் புனரமைப்புச் செய்ய முடியாமல் இருப்பதோடு, அந்த விவசாய நிலங்களில் விவசாயம் செய்ய முடியாமலும் இருக்கின்றது. இது தொடர்பில் நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களுடன் கதைத்ததன் விளைவாக, 1985ஆம் ஆண்டுக்குப் பின்னர் gazette பண்ணப்பட்ட வன இலாகாவுக்குச் சொந்தமான காணிகளை விடுவித்து, அவற்றை மக்களிடம் கையளிப்பதற்கான நடவடிக்கைகள் இன்று பாரியளவில் நடந்துகொண்டு இருக்கின்றன. அந்தக் காணிகள் விரைவாக மக்களிடம் கையளிக்கப்படுமென நான் நினைக்கின்றேன். மேலும், நாங்கள் கௌரவ அமைச்சர் அவர்களுடன் கதைத்து, எந்தெந்தப் பகுதிகளில் என்னென்ன குளங்கள் அரச திணைக்களங்களால் கையகப்படுத்தப்பட்டு இருக்கின்றன என்பது தொடர்பில் document ஒன்றை கமத்தொழில் அமைச்சுக்கூடாகத் தயாரித்து, அக்குளங்களை விடுவிப் பதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம் என்பதை இங்கு கூறிக்கொள்கின்றேன்.

கடந்த காலங்களில் விவசாயம், மேட்டு நிலப் பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்ட காணிகளில் - அந்தக் காணிகள் Department of Forest Conservation இன்கீழ் இருந்தாலும் பரவாயில்லை - விவசாயிகள் பயிர்ச்செய்கை செய்வதைத் தடுக்கக்கூடாது என்றும் அவற்றில் பயிர்ச்செய்கை செய்வதற்கு அனுமதி வழங்கப்பட வேண்டும் என்றும் நாங்கள் தொடர்ச்சியாக எமது அமைச்சுக்கூடாக வலியுறுத்தி, அதற்குரிய ஏற்பாடுகளைச் செய்து வருகின்ற போதிலும்கூட, சில இடங்களில் அதற்கான ஒத்துழைப்பு எங்களுக்குக் கிடைக்காமல் இருக்கின்றது. என்றாலும், நாங்கள் எதிர்காலத்தில் இது தொடர்பில் திட்டமிட்டுச் செயற்படுவோம்.

அடுத்து, நாங்கள் உணவுப் பாதுகாப்பு விடயத்தை கவனமாகக் கையாள வேண்டும். அண்மையில் நான் Minister of Irrigation உடன் கதைத்து, எமது பகுதிகளிலுள்ள ஆறு, சிறு குளங்களை அந்த அமைச்சுக்குக் கீழ் கொண்டுவந்து, மன்னார் மாவட்டத்தில் நெடுங்குளம் என்ற இடத்தில் புதியதொரு major tankஐ அமைத்து, அங்குள்ள விவசாயிகளின் நீர் பற்றாக் குறையை நிவர்த்தி செய்வதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம்.

நாங்கள் இங்கு பழைய கதைகளைப் பேசிக்கொண்டு இருக்காமல், எவ்வாறு பொருளாதார நெருக்கடியிலிருந்து மீண்டெழுந்து, விவசாயிகளின் வாழ்வாதாரத்தை மேம் படுத்தலாம் என்பது தொடர்பில் கவனம் செலுத்த வேண்டும். அந்த வகையில், எமது அமைச்சானது நமது நாட்டை முன்னேற்றப் பாதையில் இட்டுச் செல்வதற்குரிய ஏற்பாடு களைத் திட்டமிட்ட அடிப்படையில் செய்துகொண்டு வருகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි, ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து ஒரு நிமிடம் தாருங்கள்!

இறுதியாக, மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கும், கௌரவ அமைச்சர் அவர்களுக்கும், கௌரவ இராஜாங்க அமைச்சர்களுக்கும், அமைச்சின் செயலாளர் மற்றும் அதிகாரிகளுக்கும், மாகாண மற்றும் மாவட்ட மட்டத்தில் எமது அமைச்சின் நடவடிக்கைகளுக்கு உதவி செய்து வருகின்ற அனைத்து அதிகாரிகளுக்கும் என்னுடைய நன்றியை இந்த இடத்தில் தெரிவித்துக்கொள்கின்றேன். எமது அமைச்சு இந்த வருடம் எவ்வாறு சிறப்பாகச் செயற்பட்டதோ, அதைவிட எதிர்வரும் காலங்களில் சிறப்பாகச் செயற்படுவதற்கு உங்கள் அனைவரது ஒத்துழைப்பையும் கேட்டவனாக எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අලි සාහිර් මවුලානා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.58]

**ගරු සෙයියිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் 2024ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

எமது நாட்டின் பொருளாதாரத்துக்குப் பெரும் பங்களிப்புச் செய்கின்ற விவசாயிகள் தமது தொழிலை முன்னெடுப்பதில் பல்வேறு தடைகளையும் இன்னல்களையும் எதிர்கொண்டு வருகின்றார்கள். எமது விவசாயிகள் எதிர்கொள்ளும் பிரச்சினைகள் ஏராளம் என்றாலும், அவற்றில் சிலவற்றை நான் இந்தச் சபையில் முன்வைக்கின்றேன். அரசாங்கத்தால் வழங்கப்படும் உர மானியம் உரியவேளைக்கு விவசாயிகளைச் சென்றடைவதில்லை என்பதுதான் பெரும்பாலானோரின் குற்றச்சாட்டாகும். பயிர்களுக்கு உரிய காலத்தில் போதியளவு உரம் இடுவதற்காக விவசாயிகள் மிகுந்த சிரமங்களையும் பொருளாதாரக் கஷ்டங்களையும் அனுபவிக்கின்றனர். எனவே, எதிர்வரும் காலங்களில் விவசாயிகளுக்கு உர மானியத்தை உரியவேளைக்கு வழங்குவதற்கு அரசாங்கம் நடவடிக்கை யெடுக்க வேண்டும். அறுவடைக் காலத்தில் நெல்லுக்கு ஸ்திரமான விலையின்மை காரணமாக விவசாயிகள் பெரும் கஷ்டமும் கவலையும் அடைகின்றனர். எனவே, அறுவடை காலத்தில் நெல்லுக்கான நிர்ணய விலையை உரிய நேரத்தில் நிர்ணயிப்பதற்கு அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டும். எமது மாவட்டத்தில் நெல் சந்தைப்படுத்தும் சபையோ, பல்நோக்குக் கூட்டுறவுச் சங்கங்களோ, விவசாயிகள் எதிர்பார்க்கின்ற அந்த அறுவடைக் காலத்தில் அவர்களிட மிருந்து நெல்லைக் கொள்வனவு செய்வதில்லை. இதன் காரணமாக விவசாயிகள் தனியாருக்குக் குறைந்த விலையில் தமது நெல்லை விற்பனை செய்து பாரியளவில் நஷ்டமடை கின்றனர்.

மட்டக்களப்பு மாவட்டத்தில் காட்டு யானைகளின் தொல்லை காட்டுக்கடங்காமல் அதிகரித்துக் காணப் படுகின்றது. அதனால் விவசாயிகள் பெரும் அசௌகரியங் களை அனுபவிக்கின்றனர். சேனைப் பயிர்நிலங்களும், நெல் வயல்களும், வயல் வாடிகளும் காட்டு யானைகளால் சேதப்படுத்தப்படுகின்றன. இதனால் அடிக்கடி மனித உயிரிழப்புகளும் ஏற்படுகின்றன. குறிப்பாக, விவசாயிகள், மீன்பிடியாளர்கள், கால்நடைப் பண்ணையாளர்கள் எனப் பலர் இறந்திருக்கின்றனர். இதற்கான தீர்வாக காட்டுயானை அச்சுறுத்தலுள்ள பிரதேசங்களில் மின்சார வேலி அமைக்கப்பட வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன். வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் இந்த விடயத்தில் உடனடி நடவடிக்கையெடுக்க வேண்டும். இன்றுகூட எமது பகுதியிலுள்ள, குறிப்பாக ஏறாவூர்பற்று, கொம்பர்சேனை விவசாய மக்கள் அமைப்பிடமானது, காட்டு யானையால் தாக்கப்பட்டுள்ளது. தங்கள் பிரதேசத்தில் உடனடியாக யானை வேலியை அமைத்துத் தருமாறு அவர்கள் என்னிடம் அவசர கோரிக்கையொன்றை விடுத்துள்ளனர்.

எமது பிரதேசத்தில் காணப்படும் அதிகமான விவசாய வீதிகள் மக்கள் பயணிக்க முடியாத அளவுக்குப் பாதிப் படைந்து காணப்படுகின்றன. தங்கள் வயல் நிலங்களுக்குத் தேவையான பொருட்களை மழை காலங்களில் எடுத்துச் செல்வதற்கும், அறுவடை செய்த நெல்லைத் தமது வீடுகளுக்கு எடுத்து வருவதற்கும் விவசாயிகள் பெரும் சிரமங்களை அனுபவிக்கின்றனர். ஆகவே, குறித்த விவசாய வீதிகள் உடனடியாகப் புனரமைப்புச் செய்யப்பட வேண்டும். விவசாயிகளுக்கு காப்புறுதித் திட்டம் கட்டாயமாக்கப்பட வேண்டும். இதன்மூலம் விவசாயிகள் அடையும் நட்டத்தை ஓரளவுக்கு ஈடுசெய்யக்கூடியதாக இருக்கும். விவசாயிகள் கடன் வசதிகளை அரச மற்றும் தனியார் வங்கிகள்மூலம் இலகுவான முறையில் பெற்றுக்கொள்ள ஏற்பாடுகள் செய்யப் பட வேண்டும்.

எமது மாவட்ட கால்நடைப் பண்ணையாளர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகளில் மேய்ச்சல் தரைப் பிரச்சினை மிகவும் பிரதானமானது. கால்நடைகளுக்கான மேய்ச்சல் தரைகளை வர்த்தமானிமூலம் அடையாளப்படுத்தும் விடயம் நீண்ட காலமாக கிடப்பில் போடப்பட்டுள்ளது. மட்டக்களப்பு மாவட்டத்தின் எல்லைப் பகுதியில் குறிப்பாக, மாதவனை - மயிலத்தமடு பிரதேசத்தில் இடம்பெறுகின்ற அத்துமீறல்கள் இனமுரண்பாடுகளைத் தோற்றுவிக்கும் செயற்பாடாகவே பார்க்கப்படுகின்றது. இதன் எதிர்விளைவாக மகாஓயா பகுதியிலுள்ள கால்நடைப் பண்ணையார்களுடன் இராணு வத்தினர் மிகவும் இறுக்கமாக நடந்துகொள்கின்றனர். இச் செயற்பாடு தவிர்க்கப்பட வேண்டும். இந்தக் கால்நடைப் பண்ணையாளர்களுக்கு எதிரான செயற்பாடுகளைத் தடுப் பதற்கு அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களது மாவட்டத்தை அண்மித்த பொலன்னறுவை மாவட் டத்தை மையமாக வைத்துத்தான் வருடாந்தம் பெரும்போக நெற்செய்கைக்கான ஆரம்ப விதைப்பு நாள் தீர்மானிக் கப்படுகின்றது. திறைசேரிகூட, விவசாயிகளுக்கான

[ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා]

மானியங்கள், பண விடுவிப்பு போன்றவற்றை பொலன்னறுவை மாவட்டத்தை மையமாக வைத்துத்தான் வழங்குகின்றது. இதன் காரணமாக எமது மாவட்ட விவசாயிகளுக்கு உரிய நேரத்துக்கு மானியங்கள் கிடைப்பதில்லை; உரம் கிடைப்பதில்லை. இதனால் எமது விவசாயிகள் பாதிக்கப்படுகின்றார்கள். திறைசேரி நிதியை வழங்குவதற்குத் தாமதிக்கின்ற காரணத்தால் எமது விவசாயிகளின் அறுவடை கொள்வனவு செய்யப்படுவதில் தாமதம் ஏற்படுகின்றது. இதனை கௌரவ அமைச்சர் அவர்கள் கருத்திற்கொண்டு, உரிய நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම විනාඩි පහකින් මගේ ප්‍රදේශයේ ගොවීන් ගැන, ශ්‍රී ලංකාවේ ගොවීන් ගැන කථා කරන්න පුළුවන්කමක් නැහැ.

කෙසේ වුණත් මම ප්‍රථමයෙන් ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙවර අය වැයෙන් රුපියල් මිලියන 250ක් -ලක්ෂ 2,500ක මුදලක්- බණ්ඩාරවෙල තොග වෙළෙඳ මධ්‍යස්ථානයට, නැත්නම් එළවලු තොග එකතු කරන ආර්ථික මධ්‍යස්ථානයට වෙන් කිරීම පිළිබඳව. මොකද, බණ්ඩාරවෙල තොග වෙළෙඳ මධ්‍යස්ථානය කියන්නේ සාමාන්‍යයෙන් දවසකට එළවලු කිලෝ ලක්ෂ 5ක, 8ක ප්‍රමාණයක් එහාට මෙහාට යන, ව්‍යාපාරයක් සිදුවන ස්ථානයක්. එතැන එළවලු පාර දිගට බිම දාගෙන තමයි වෙළෙඳාම කරන්නේ. ඒ පාරෙන් රෝහලටවත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. එම නිසා මේ කර්තව්‍යය වෙනුවෙන් කටයුතු කළ සියලු දෙනාට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ කිව යුතු තව කාරණාවක් තිබෙනවා. මේ වෙලාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ හදිසි ආපදා තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ වෙනකොටත් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලිපනාවල ප්‍රදේශයේ කොටසක් නාය යමින් පවතිනවා. දැන් පවුල් විශාල සංඛ්‍යාවක් එතැනින් අයින් කරලා තිබෙනවා. බදුල්ල-බණ්ඩාරවෙල මාර්ගයේ එක තීරුවක විතරයි ගමන් කරන්න පුළුවන්කම තිබෙන්නේ. මේ පවතින වැස්සත් එක්ක ජනතාව විශාල අර්බුද රැසකට මුහුණ පාලා තිබෙනවා. එළවලු මිලත් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබෙනවා. මේ කාලය ගොවීන් දැඩි අපහසුවෙන් ඉන්න කාලයක් බවට පත් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාව මතක් කරන්න ඕනෑ. එතුමා මාසයකට වරක්වත් බණ්ඩාරවෙලට -අපේ ප්‍රදේශයට- නැත්නම් බදුල්ල දිස්ත්‍රික්කයට එනවා. ඇවිත් ගොවීන්ගේ ප්‍රශ්න ගැන අපිත් එක්ක කථා කරනවා; සාකච්ඡා කරනවා. එතුමාට ලබා දිය හැකි විසඳුම් සියල්ල ලබා දෙනවා. ඒක තමයි වැදගත්ම දේ. මේ වෙලාවේ දකින්න පුළුවන් හොඳම දෙයක්, ඒක. ඔබතුමා අල ගොවීන් හමුවෙන්න ගියා. තිබෙන ප්‍රශ්න ගැන කථා කළා. ගොඩක් ප්‍රශ්න තිබෙනවා. නමුත් ඒ ප්‍රශ්න යම් කිසි මට්ටමකට හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම ඉතාම වැදගත් වෙනවා. ඒක ඉතාම වැදගත්. මම මේ අවස්ථාවේ ඔබතුමාට -ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට- ගෞරවනීය ස්තුතියක් පිරිනමනවා. ඔබතුමා එහෙම ගිය එකෙන් තමයි හොඳම ගොවියා සොයා ගත්තේ. හොඳම ගොවියා බණ්ඩාරවෙල ඉන්නවා. පාලිත මහතා, මිදි වගාව කරන බණ්ඩාර මහතා, එළවලු ව්‍යාපාරය අලුත් මාවතකට ගෙනයන මංජු මහතා -මේ කණ්ඩායම - සොයා ගත්තා. ඔවුන්ව සොයාගෙන අලුත් තැනකට ගෙනයන්න, ඔවුන්ට අත දෙන්න, ඔවුන්ට සහයෝගය දෙන්න, ඔවුන්ට උපදෙස් දෙන්න අවශ්‍ය කටයුතු මේ අවස්ථාවේ කරමින් පවතිනවා. ගරු ඇමතිතුමා එක දවසක එක තැනකදී කිව්වා, මේ වාගේ දස දෙනෙක් ලංකාවේ හිටියා නම්, මේ රට ගොඩ දමන්න ලෙහෙසියි කියලා. අලුත් තාක්ෂණයත් භාවිත කරමින් තමයි මේ වගා කටයුතු කරන්නේ. මිදි වගාව කළාට මිදි හැදෙයි කියලා ඒ පැත්තේ -ඌව පරණගම-කවුරුවත් විශ්වාස කළේ නැහැ. නමුත් අද ඉතා සාර්ථක මිදි වගාවක් කරනවා. ඉතින්, ඒ අයටත් අත දෙන්න කටයුතු කරමින් සිටිනවා. ඔබතුමාට ඒ ගැන ඉතාම ස්තුතියි.

මම මේ අවස්ථාවේ අල ගොවියා ගැනත් මතක් කරනවා. අල ගොවියා මේ වෙලාවේ ඉන්නේ දැඩි ලෙස අසරණ වෙලා. ඒකට ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට වැරදි කියන්න ඕනෑ නැහැ. මොකද, එතුමා අපේ ඉල්ලීම මත කරන්න පුළුවන් දේවල් කළා. මම බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා - DCC Chairman - හැටියට දිසාපතිතුමා සමඟ සම්බන්ධ වෙලා අවශ්‍ය documents ඔක්කොම ඔබතුමාට භාර දුන්නා, ආනයනය කිරීමේදී බද්ද - Import Tax එක - පනවන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. හැබැයි, මුදල් අමාත්‍යාංශයේදී ඒක හිර වුණා. එකෙන් තමයි මේ අර්බුදය ඇති වුණේ. අල ගොවියා අල වගාව සඳහා විශාල මුදලක් වියදම් කරලා තිබුණත්, ඔවුන්ගේ අස්වැන්නට හොඳ මිලක් ලැබුණේ නැහැ. නමුත්, ඔබතුමා උපරිම උත්සාහයක් ගත්තා. ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් අවශ්‍යයි. එදිනෙදා පැලැස්තර දමන්නේ නැතිව අල ගොවීන්, ලූනු ගොවීන් ආරක්ෂා කර ගන්න ස්ථිර විසඳුමක් අවශ්‍යයි. කවුරු බලයට ආවත්, කවුරු බලයේ හිටියත් හැම දාම ක්‍රියාත්මක වන ස්ථිර විසඳුමක් අවශ්‍යයි. ඔවුන් අස්වැන්න නෙළන්න මාසයකට, දෙකකට කලින්වත් Import Tax එක දාලා ආනයනය කරන අය හිර කරන්න ඕනෑ. නැත්නම් අල ආනයනය - import - කරන අය අල ගෙනැල්ලා ගබඩා කර ගන්නවා. ගබඩා කරගෙන අපේ ගොවියා අස්වැන්න නෙළන වෙලාවට මිල අඩු කරලා විකිණීම තමයි කරන්නේ. මම ඒ කාරණය විශේෂයෙන් අවධාරණය කරනවා.

අපි හැම වෙලාවේම ඊශ්‍රායලය ගැන කථා කරනවා. ඊශ්‍රායලයෙත් නව තාක්ෂණය තමයි භාවිත කරන්නේ. ඊශ්‍රායලයේ පුහුණු වුණු ගොඩක් අය කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇවිත් ඉන්නවා. මම අපේ තානාපතිතුමා එක්කත් ඊයේ සාකච්ඡා කළා. එතුමා කිව්වා අපේ කණ්ඩායම් ගිහිල්ලා පුහුණු වෙලා ඇවිත් ඉන්නවා කියලා. ඒ ගොල්ලන් තමයි බිංදු ජලසම්පාදන තාක්ෂණය - drip irrigation technology - සොයා ගත්තේ. ඒ ගොල්ලන් තමයි ඒකෙන් උපරිම ප්‍රයෝජනය ගන්නේ. ඒකෙන් වතුර සහ රසායනික ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණය පමණයි පැළයට ලැබෙන්නේ. අපි රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් යොදන නිසා, අද ඔයක, ඇළක මාළුවෙක් නැහැ; ගෙම්බෙක් නැහැ. මේ රසායනික පොහොර භාවිතය නිසා ඒ සතුන් ඔක්කොම විනාශ වෙලා. හැබැයි අපි drip irrigation system එක පටන් ගත්තොත්, අපට විශාල වශයෙන් මේ තත්ත්වය අඩු කර ගන්න පුළුවන්; මේ නාස්තිය අඩු කර ගන්න පුළුවන්; වියදම අඩු කර ගන්න පුළුවන්. සාමාන්‍යයෙන් ඊශ්‍රායලයේ බටු ගෙඩියක් කිලෝ එකහමාරක්, දෙකක් විතර වෙනවා. ඒ ගොල්ලන් හොඳ බීජ අරගෙන, අලුත්

තාක්ෂණය යොදලා ඒ දේවල් විශාල වශයෙන් වගා කරනවා. අපිත් එතැනට යමු, කියලා මා ඉල්ලා සිටිනවා. ඊළඟ පරම්පරාවට අලුත් තාක්ෂණයත් එක්ක තමයි ගමන් කරන්න තිබෙන්නේ. මේ පරම්පරාවෙන් පස්සේ, ඊළඟ පරම්පරාව ගොවිබිමට බහින්නේ නැහැ. එහෙම නම් අපේ රට කෘෂිකාර්මික රටක් හැටියට, ඒ ගොල්ලන්ව ගොවිබිමට ගේන්න නම් අපි ඒ තැනට යන්න ඕනෑ. ඒකට අවශ්‍ය කටයුතු දැන් සැකසෙමින් පවතින බව මම දන්නවා. ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලැබේවා, කියලා මා ප්‍රාර්ථනා කරනවා. අපේ ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා දක්ෂ රාජ්‍ය අමාත්‍යවරු. එතුමන්ලාට ඒ කටයුතු කරගෙන යන්න අවශ්‍ය ශක්තිය තිබෙනවා.

ඒ වාගේම කුකුළු පාලනය හා ගව පාලනයත් කරගෙන යා යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසන්.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න. විශේෂයෙන්ම ඉඩම් ගැන පමණක් කථා කරලා මම කථාව නවත්වන්නම්.

ලංකාවේ සියලු ඉඩම්වලට සින්නක්කර ඔප්පු හෝ කුමක් හෝ එක ඔප්පුවක් දිය යුතුයි. දැන් සින්නක්කර ඔප්පු, ජයභූමි ඔප්පු, වාර්ෂික අවසරපත්‍ර, ස්වර්ණ භූමි ඔප්පු, රන් භූමි ඔප්පු, රත්බිම ඔප්පු, LRC බලපත්‍ර හා මහවැලි බලපත්‍ර කියලා තිබෙනවා. ඊළඟට අන්තර් පළාත් බලපත්‍ර කියලා එකක් තිබෙනවා, ඒක ඉඩම් කොමසාරිස්වරයා යටතේ වෙනම පාලනය වෙන එකක්. මේ සියල්ලට එක ඔප්පුවක් දෙන්න කටයුතු කරන්න ඕනෑ. සමහර වෙලාවට කියාවි, මැනුම් කටයුතු - survey - කර ගන්න අමාරුයි කියලා. සබරගමුව විශ්වවිද්‍යාලයේ Dr. Milinda Piyasena මැතිතුමා dronesවලින් මැනුම් කටයුතු කරන්න පුළුවන් හොඳ software එකක් හදලා තිබෙනවා. එහි ප්‍රයෝජනය ගන්න. අපි එහි pilot project එක බණ්ඩාරවෙල නගර සභා සීමාවේ කළා. ඒක ඉතාම සාර්ථකයි. අපි පාර්ලිමේන්තුවටත් ගෙන්වලා ඒ ගැන සාකච්ඡා කළා. ඒක ඉතා සාර්ථක දෙයක්. මේ මැනුම් කටයුතු සියල්ලම ඒකෙන් කරන්න පුළුවන්. අලුත් තාක්ෂණය භාවිත කරලා ඒ කටයුතු කරලා, අපේ රටට එක ක්‍රමයක් හදා ගනිමු. එහෙම නැත්නම් නීති කටයුතුවලදී අපේ මහජනතාව උසාවිවල පුදුම දුකක් විඳිනවා. ඒකෙන් ගලවා ගන්න ඕනෑ. උසාවිවල විශාල වශයෙන් තිබෙන්නේ ඉඩම් නඩු. ඒ නිසා මේ ප්‍රශ්නයෙන් ඒ අයව ගලවා ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පලනි දිගම්බරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී මට කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතියි. අද වතු කම්කරුවන්ගේ ප්‍රශ්නය තමයි ආර්ථික ප්‍රශ්නය. වෙන මොකුත් ප්‍රශ්නයක් නැහැ. අද ඒ ගොල්ලන් දලු කිලෝ 20ක් කැඩුවොත් රුපියල් 800ක්, 900ක් හම්බ වෙනවා. කිලෝ 20ට අඩුවෙන් තිබුණොත් රුපියල් 500ක් හම්බවෙන්නේ. සාමාන්‍යයෙන් කිලෝ 20ට වැඩියෙන් තිබුණොත්, කිලෝවකට රුපියල් 50ක් හම්බ වෙන්නේ. එතකොට මේ සමාගම්වල අය bought leaf ගන්නවා, කිලෝවකට රුපියල් 150ක් ගෙවනවා. අපි මේ ආණ්ඩුවෙන් හා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමා නම් මේ වෙලාවේ සභාවේ නැහැ. නමුත් අපි ගරු ඇමතිතුමාට කියන්නේ, මේ ජනතාවගේ ආර්ථික ප්‍රශ්න ඉවර කරන්න ඕනෑ කියන එකයි. නැත්නම් මොනවත් කරන්න බැහැ.

ඒ නිසා මම ගරු ඇමතිතුමාට කියන්නේ, ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා සාකච්ඡා කරලා, ඒ ජනතාවට ඉඩම් ටික බෙදලා දෙන්න කියලායි. අපි කියන්නේ නැහැ, අයිතිය දෙන්න කියලා. අයිතිය දෙන්නේ නැහැ. පර්චස් 10ක් දෙන්නේ නැත්නම්, අක්කර ගණනක් දෙන්නේ නැහැ. අපි කියන්නේ, lease එකට දෙන්න කියලායි. Lease එකට දුන්නාම, ඒ ගොල්ලන් ඒ ඉඩම් ටික බලා ගන්නවා. පොහොර දමනවා; බෙහෙත් දමනවා; සුද්ද කරනවා. ඒ ඔක්කොම කරනවා. එතකොට දලු කිලෝවක් රුපියල් 150ට ගන්නවා නම්, සාමාන්‍යයෙන් දලු කිලෝ 10ක් තිබුණොත් රුපියල් 1,500ක් ලැබෙනවා. දලු කිලෝ 20ක් තිබුණොත් රුපියල් තුන්දහසක් ගණනක් තිබෙනවා. දලු තිබෙන කාලයට කිලෝ 30ක්, 40ක් ගත්තොත් රුපියල් 5,000ක විතර ආදායමක් ගන්න පුළුවන්. එතකොට ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න ඒ ගොල්ලන් බලා ගන්නවා. හැමදාම අපි පාර්ලිමේන්තුවේ ඒ අය ගැන කථා කරනවා විතරයි. පාර්ලිමේන්තුවේ කථා කළාම TV එකේ පෙන්වනවා, පත්තරේ යනවා, එච්චරයි. Action මොකුත් නැහැ. ඒ නිසා මේ කටයුත්ත කරන්න බැරි නම්, ඉස්සරහට වතුවල කම්කරුවන් හැටියට කවුරුවත් වැඩ කරන එකක් නැහැ.

දැන් බලන්න, සාමාන්‍යයෙන් කම්කරුවන් 300ක්, 400ක් හිටපු වත්තක, දැන් කම්කරුවන් 60ක්, 80ක් තමයි වැඩ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා. ඔබතුමා නියෝජනය කරන රත්නපුරය දිස්ත්‍රික්කයේත් වතු කම්කරුවෝ ඉන්න බව. දැන් ඒ ගොල්ලන් ඔක්කොම කොළඹට එනවා. කොළඹට ඇවිල්ලා කොහේ හරි වැඩ කරනවා. රුපියල් 2,000ක්, 3,000ක්, 5,000ක් පඩි ගන්නවා. ඒ නිසා මේ වැවිලි කර්මාන්තය ආරක්ෂා කර ගන්න නම්, අපි කරන ඉල්ලීම අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන්න ඕනෑ. එහෙම නැත්නම් කරන්න බැහැ. දැන් බලන්න, මේ ආණ්ඩුව ඉඩම් දෙනකොට පර්චස් හයක් දෙන්න බැරිව අඬනවා. පසුගිය කාලයේ හැම තැනම බලෙන් අල්ලා ගෙන ගෙවල් හැදුවාම, ඒ වත්තේ managersලා ගිහිල්ලා බලෙන් ඒවා කඩනවා.

යහ පාලන ආණ්ඩුව කාලයේ අපි තීරණයක් ගත්තා එක ලැයිම් කාමරයකට පර්චස් 7ක් දෙනවා කියලා. ඒ කාලයේ පර්චස් 7යි. දැන් කියන්නේ පර්චස් 10ක් කියලා. එය ලබා දුන්නාම ලැයිම් කාමර කඩලා අයින් කරන්න පුළුවන්. අපි දන්නවා ඒ ඉන්න කට්ටිය ඔක්කොටම ඉඩම් දෙන්න බැහැ කියලා. එහෙම ඉඩම් දුන්නොත් වැවිලි කර්මාන්තය නැති වෙලා යනවා. ඒක නිසා ලැයිම් කාමරයකට පර්චස් 10ක් දුන්නාම, ඒ ගොල්ලන්ගේ පුතාලා එහෙම ඉන්නවා නම් උඩ තට්ටු හදා ගනීවි. එහෙම කරන්න බැරි නම් ඉස්සරහට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා අපි මේ ආණ්ඩුවට කියන්නේ, ගරු ජනාධිපතිතුමාට කියන්නේ ඒ කටයුත්ත වහාම කරන්න කියලායි.

මම අද උදේ පත්තරය බැලුවා. ජනාධිපතිතුමා ඊයේ 'හාම්පුතුන්ගේ සංගමය' ඇතුළු ඔක්කොම ගෙන්නගෙන කිව්වා ලු,

[ගරු පලනි දිගම්බරම් මහතා]

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප හැටියට රුපියල් 1,700ක් දෙන්න පුළුවන්ද කියලා මේ මාසයේ 29වෙනි දාට ඉස්සර වෙලා කියන්න කියලා. පත්තරය කියවලා මම ඊට පස්සේ හාම්පුතුන්ගේ සංගමයට කථා කළා. ඒ ගොල්ලෝ කිව්වා, එහෙම එකක් ගැන කථා කළේ නැහැ, restructure කරන එක ගැන සාකච්ඡා කළා කියලා. නමුත්, වතුකරයේ ඉන්න අපේ මන්ත්‍රීවරු ඔක්කොම කිව්වා, අන්න දැන් රුපියල් 1,750ක වැටුපක් හම්බ වෙනවා, ජනාධිපතිතුමා එහෙම කිව්වා කියලා. අපි දන්නවා මේ ජනාධිපතිතුමා කවුද කියලා; මේ ආණ්ඩුව මොකක්ද කියලා. ජීවිතේට දෙන්නේ නැහැ. Plantation companiesවල අය Collective Agreement එකකට ගියත් ඒ ගොල්ලෝ ඒ කියන පඩිය දෙන්නේ නැහැ. ඒක නිසා අපි දිගින් දිගටම ඉල්ලනවා, ඒ ජනතාවට ඒ ඉඩම් ටික බෙදලා දෙන්න කියලා. ඒ වාගේම තේ දලු කිලෝ එකක් රුපියල් 150ට ගත්තා නම් හොඳයි. දැන් රුපියල් 150ටත් වැඩියෙන් ගන්නවා. පසුගිය කාලයේ දලු කිලෝ එකක් රුපියල් 200ටත්, 250ටත් ගත්තා. අපි කියන්නේ මේකයි. තේ දලු කිලෝ එකක් අඩුම ගණනේ රුපියල් 150කට ගත්තා නම්, කිලෝ 10ක් ගත්තොත් රුපියල් 1,500යි; කිලෝ 20ක් ගත්තොත් රුපියල් 3,000යි. එතකොට, ඒ ගොල්ලන් හොඳට ජීවත් වෙන ගමන් වගාවත් හොඳට කරගෙන යාවි. එහෙම කරන්නේ නැතුව දිගින් දිගට ඒ මිනිස්සු මුළා කර ගෙන ඉන්නවා නම් මම හිතන්නේ ඒක හොඳ නැහැ කියලායි. අවුරුදු 200ක් තිස්සේ අපි ඒ මිනිස්සු ගැන කථා කරනවා. මම ගරු ජනාධිපතිතුමාට කියන්නේ මේකයි. ඒ පළාතේ මන්ත්‍රීවරු ඉන්නවා නේ. මගේ මිත්‍ර ගරු ජීවන් තොණ්ඩමන් ඇමතිතුමා ඉන්නවා; ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා ඉන්නවා; තවත් මන්ත්‍රීවරු ඉන්නවා. ඒ ගොල්ලන්ට, ජනාධිපතිට ඡන්ද ලක්ෂයක් හරි ගන්න ඕනෑ නම් අඩුම ගණනේ මේ කියපු වැඩේ හරි කරන්න. එහෙම කළේ නැත්නම් ඒ ඡන්ද ටිකවත් හම්බ වෙන්නේ නැහැ.

මගේ කාලයෙන් තවත් ඉතිරි වෙලා තිබෙනවා නම් ඒක ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අතීතයේ පටන් කෘෂි කර්මාන්තයෙන් පෝෂණය වන, වැවිලි කර්මාන්තයෙන් පෝෂණය වන අප රට ලෝකයේ "පෙරදිග ධාන්‍යාගාරය" නමින් විරුදාවලියට පාත්‍ර වූ රටක් බව කියන්න ඕනෑ.

අපි දන්නවා පසුගිය වසර දෙකක කාලයේදී ඉතිහාසයේ දරුණු වසංගතයක් අපේ රටේ ඇති වුණු බව. ආර්ථික අර්බුදයත් සමඟ කෘෂි හා වැවිලි ක්ෂේත්‍රය ඉතා වේගයෙන් පහත වැටුණා. ඒ වාගේම රසායනික පොහොර හා රසායනික වල් නාශක ගැටලුව විශාල වශයෙන් ගොවියාට බලපෑවා. අද වන කොට ගරු ඇමතිතුමා ඇතුළු රාජ්‍ය ඇමතිතුමන්ලා, ඒ වාගේම නිලධාරි මහත්වරු මේ රටේ කෘෂි කර්මාන්තය ඉහළට ඔසවා ආර්ථිකයට දැවැන්ත ශක්තියක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට ගොවියාට පොහොර ටික සඳහා මුදල් හම්බ වෙනවා. ඒ ගැන අපි සතුටු විය යුතුයි.

ගරු අමාත්‍යතුමාගේ අවධානයට යම් කාරණයක් යොමු කරවීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ගොවියාට පොහොර ටික ගන්න මුදල් ඔවුන්ගේ ගිණුම්වලට දැම්මත් සමහර ගොවි මහත්තුරු ඉන්නවා, සම්පූර්ණ වගාවට අවශ්‍ය පොහොර මිල දී නොගෙන ඒ මුදල් අරගෙන වෙනත් අවශ්‍යතා සඳහා යොදවන. ඒ නිසා අස්වැන්න අඩුවෙන් පෙන්නුම් කරන බව විශේෂයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් අපව දැනුවත් කර තිබෙනවා. අපේ ගරු ඇමතිතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අපේ රටේ අවුරුදු 50ට, 60ට වැඩි අය තමයි ගොවිතැන් කරන්නේ. ඒ නිසා නවීන තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීලා තරුණ පිරිස් කෘෂි කර්මාන්තයට නැඹුරු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා මම යෝජනා කරනවා.

ලෝකයේ අනෙකුත් කෘෂිකාර්මික රටවල් වාගේම අපිත් රජයක් හැටියට විශේෂයෙන් අපේ රටට ගැළපෙන කෘෂි තාක්ෂණය සකස් කළ යුතුයි. එවිටයි, කෘෂි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත රාජ්‍යයක් ගොඩ නැඟීමේ හැකියාව ලැබෙන්නේ. අපි කාබනික පොහොර පිට රටින් ගෙන්වා ගත යුතු නැහැ. මොකද, ඒ සඳහා අපේ රටේ ඕනෑ තරම් සම්පත් තිබෙනවා. කාබනික පොහොර නිෂ්පාදනය දැනටමත් ක්‍රමවත්ව ආරම්භ කරලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ වාගේම කාබනික පොහොර ව්‍යවසායකයන් දිරි ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය කියන කාරණයත් මම ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම විශේෂයෙන් කියන්න ඕනෑ ගොවියාට විශාල කරදරයක් කරන සත්ව කොට්ඨාසයන් සිටිනවා කියන එක. ඒ ගැන ඔබ අපි හැමෝම දන්නවා. මොනරා, රිළවා, වල්ඌරා, ඉත්තෑවා හා වල් අලි යන සතුන් නිසා ගොවීන්ට විශාල ලෙස ගැටලුවලට මුහුණ පාන්න සිද්ධ වෙනවා. එම සතුන්ගෙන් වන හානිය නිසා අද ගොවියා ගොවිතැන් කරන්න පවා අකැමැත්තක් දක්වනවා. එම තත්ත්වය අවම කර ගැනීමට විශේෂ ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන ලෙස ගරු අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, කිරි ගොවියාට විශේෂ ණය සහනයක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. ඒ ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා විශාල සහන රැසක් වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථාන, කෘෂිකර්ම නවීකරණ කේන්ද්‍රස්ථාන බවට පත් කිරීමට රුපියල් මිලියන 2,500ක් ලබන වසර සඳහා වෙන් කර තිබෙනවා.

අපේ ගරු ඇමතිතුමාට මම විශේෂයෙන් මතක් කරනවා, අපේ සබරගමුව පළාතේ තිබෙන එකම කෘෂිකර්ම විද්‍යාලය වන රත්නපුර, කරපිංච, කෘෂිකර්ම විද්‍යාලය සංවර්ධනය කිරීම පිළිබඳව. මොකද, 2014න් පසු කිසිම සංවර්ධනයක් සඳහා එයට මුදල් වෙන් කරලා නැහැ. ඒ සඳහා කිසියම් මුදලක් වෙන් කරලා එය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙසත් මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මමත් නියෝජනය කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කයයි. රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ හදවත බඳු සම්පතක්, කෘෂි කර්මාන්තය හා වැවිලි කර්මාන්තය. කාල වේලා නොතිබුණත් වැවිලි කර්මාන්තය

පිළිබඳවත් මම අදහස් හා යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනවා. ඇත්තටම අපේ රටට අපනයනයෙන් වැඩිම ඩොලර් ප්‍රමාණයක් ලැබෙන්නේ තේ, රබර්, කුරුඳු ඇතුළු අනෙකුත් සුළු අපනයන බෝගවලින්. තේ ගොවියාටත් පසුගිය වර්ෂවලදී රටේ පැවැති ආර්ථික අර්බුදයත් සමඟ පොහොර ප්‍රශ්නය බලපෑවා. ඒ අවස්ථාවේ තේ වගාව විශාල ලෙස හානි වුණා. ඔවුන් ලැබූ ඒ අමිහිරි අද්දැකීම පිළිබඳව මා කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ශක්තිමත් වීමත් සමඟ තේ දලු මිල ඉහළ යෑම නිසා වැවිලිකරුවා යම්කිසි සතුටක් ලැබුවා. තේ දලු මිල ඉහළ යෑම සිදු වුවත් තේ පොහොර මිල දරා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාට මා යෝජනා කරනවා, අනෙකුත් වගාකරුවන්ට සහන ලබා දෙන ආකාරයටම තේ ගොවියාටත් පොහොර සහනාධාරයක් ලබා දීමේ හෝ සහන මිලකට පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළක් සකසන ලෙස. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.20]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද අප කථා කරන්නේ 2024 වසරට අදාළව කෘෂිකර්ම අමාත්‍යාංශයේත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳවයි. අද මේ අමාත්‍යාංශ පිළිබඳව කථා බහ කරන්නට ලැබීම මට පෞද්ගලිකවත් ඉතා වැදගත්. මම මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගොවි පවුලකින් බිහි වෙච්ච මහජන නියෝජිතයෙකු විධියට ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා, පළාත් සභාව නියෝජනය කරලා, මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම ඇමතිවරයා වෙලා, එතැනින් පසුව පාර්ලිමේන්තුවට පිවිසුණා. මධ්‍යම පළාතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට කටයුතු කිරීමෙන් කෘෂි කර්මාන්තය පිළිබඳව යම් ප්‍රායෝගිකව දැනුම් සම්භාරයක් අත් දකිමින් කටයුතු කරපු කෙනෙකු විධියට තමයි මේ ක්ෂේත්‍ර ගැන අදහස් දැක්වීම වැදගත් කියලා මා කල්පනා කළේ.

මධ්‍යම පළාතේ, මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ වී වගාව, එළවලු බෝග වගාව, අපනයන බෝග වගාව, විසිතුරු මල් වගාව, ලොකු ලූනු වගාව ආදි බෝග නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කරනවා. තව පැත්තකින් ගත්තොත්, මධ්‍යම පළාත තුළ බිත්තර වී නිෂ්පාදනය, දේශීය ලොකු ලූනු නිෂ්පාදනය, බීජ අර්තාපල් නිෂ්පාදනය සහ බෝංචි බීජ නිෂ්පාදනය කියන විශාල කටයුත්තට ඇමතිවරයකු විධියට මැදිහත් වෙච්ච, ඊට නායකත්වය සපයපු කෙනෙක්, මම. අද කෘෂිකර්ම අමාත්‍යාංශයේ සිදු වන ක්‍රියාවලිය වාගේම නොසිදු වන ක්‍රියාවලිය සම්බන්ධයෙන් හඳුනා ගනු ලැබූ ගැටලුවලට විසඳුම් ලබා දෙන්නේ කොහොමද, රටක් විධියට මේ පිම්ම පැන ගැනීම සඳහා 2024 වසරට වෙන් වී තිබෙන මුදල් ප්‍රතිපාදන කොයි තරම් ප්‍රමාණවත් වෙයිද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා.

විශේෂයෙන්ම ලංකාවේ සියයට 70කට වැඩි ජනගහනයක් ජීවත් වන්නේ කෘෂි ආර්ථිකය මත පදනම් වෙලායි. කෘෂි ආර්ථිකය මත පදනම්ව ජීවිකාව ගත කරන ගොවි ජනතාව කාටවත් බරක් නැතිව, වෘත්තීය සමිති හදාගෙන අරගළ කරන්නේ නැතිව, මහ පොළවත් එක්ක පොර බදලා, ඇතැම් විටෙක ගල් පර්වතත් අස්වද්දලා තමන්ගේ පාඩුවේ ජීවත්වෙන්න හුරු වෙච්ච ණය නැති ජනතාවක්. අද මේ අමාත්‍යාංශයේ කටයුතු ඉහළ සිට පහළට - නාගරික සමාජයේ සිට ග්‍රාමීය ප්‍රදේශ දක්වාම- විහිදිලා, පැතිරිලා තිබෙනවා. නාගරික සමාජය ගත්තත්, පසුගිය වකවානු තුළ විවිධ විධියේ ගෙවතු වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා අපි දැක්කා. ඒ නිසා මේ අමාත්‍යාංශයේ විෂය පථය පිළිබඳව කථා කරද්දිත්, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරද්දිත්, මේ අමාත්‍යාංශයේ විවිධ තත්ත්ව සංශෝධනය කරද්දිත් බොහොම පරිස්සමෙන් තමයි කටයුතු කරන්න ඕනෑ.

ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා තමන්ගේ ජනාධිපති ධුරය දමලා පලා යන්නත් මූලික වෙච්ච අමාත්‍යාංශයක් තමයි කෘෂිකර්ම අමාත්‍යාංශය. එතුමා, ඒ සම්බන්ධයෙන් සිටින හොඳ විශේෂඥයන්ගෙන් උපදෙස් ගන්නේත් නැතිව තමන්ට හැටනව ලක්ෂයකගේ ජන මතය තිබෙනවා කියලා ඔළුවේ විඥානයක් හදාගෙන තමන්ට හිතුණු හිතුණු දේවල් කරන්න උත්සාහ ගත්තා. එතුමාගේ පෞද්ගලික මනස තමයි රටේ පොදු ජනතාවගේ මනස කියලා කල්පනා කරලා එතුමා වැරදි නිලයකට අත තැබුවා. සියයට 70කට, 75කට වඩා ජනගහනයක්, කෘෂි ආර්ථිකය මත ජීවත්වෙන ජනතාවක් දුෂ්කරතා ගොඩකට මුහුණ දීලා බලාපොරොත්තු තබාගෙන කටයුතු කරගෙන යද්දී, ඔළුවට ආපු ඉතාම අමනෝඥ අදහසක් ක්‍රියාත්මක කරමින් කාබනික පොහොර භාවිතය ආරම්භ කරලා එතුමා ලෝකයේ වීරයා වෙන්න උත්සාහ ගත්තා. අන්තිමෙට පැදුරටත් නොකියා තමයි එතුමාට පලා යන්න සිද්ධ වුණේ. පසුගිය වකවානුව තුළ එතුමාව ජනාධිපතිවරයා බවට පත්කරන්න මධ්‍යම පළාතෙත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේත් බොහොම ප්‍රබලව කටයුතු කරපු කෙනෙක් තමයි මම. අපි ඔක්කොම එකට එකතුවෙලා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාව හාමුදුරු කෙනෙක් කළා නම් -මහණ කළා නම්- ඊටත් වඩා හොඳයි කියලා මම පස්සේ කල්පනා කළා. මොකද, කෘෂිකර්මය ගැන කථා කරද්දී, කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කථා කරද්දී, ගොවීන් ගැන කථා කරද්දී පසුගිය කාලයේ වූ එතුමාගේ ක්‍රියා කලාපය නිසා ගෝඨාභය රාජපක්ෂ කියන චරිතය අපට අමතක කරන්න බැහැ. ඒ කර ගත්ත මහ වින්නැහිය නිසා, ඉල්ලන් කෑම නිසා, නොගැළපෙන වෙලාවක නොගැළපෙන ක්ෂණික තීරණ ගන්න ගිහිල්ලා අන්තිමට හිටපු ජනාධිපතිතුමාට ජනාධිපතිකමත් දමලා රටෙනුත් පලා යන තත්ත්වයක් ඇති වුණා.

මම එදා නියෝජනය කළේ ආණ්ඩු පක්ෂයයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරින් හරියට කල්පනා කරන්නේ නැතිව, විශේෂඥයන්ගේ උපදෙස් ගන්නේ නැතිව, ගොවියාට විරුද්ධව හිතුවක්කාර තීරණයක් අරගෙන කටයුතු කරද්දීත්, මම එදා ඒකට විරුද්ධව කථා කළා. එදා ඒ තීරණය ගත් දවසේ සිටම මම ජනාධිපතිතුමාගේ ඒ තීරණයට විරුද්ධව පෙනී හිටපු කෙනෙක්. ඒ තීරණයට විරුද්ධව මම පෙනී හිටියා විතරක් නොවෙයි, ඒ පිළිබඳව විරෝධයත් දැක්වූවා. පුවත්පත් සාකච්ඡා පැවැත්වූවා. ආණ්ඩු පක්ෂයේ බොහෝ අය ඒකට විරුද්ධ වුණා කියා මම හිතනවා. එතුමන්ලා විරුද්ධ වුණත් ප්‍රසිද්ධියේත්, අප්‍රසිද්ධියේත් එයට විරෝධය එල්ල කරපු ආණ්ඩු පක්ෂය නියෝජනය කරපු පළමුවැනි මන්ත්‍රීවරයා වුණේ මමයි. මට මතකයි, එක වෙලාවක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු කැඳවලා ජනාධිපති මන්දිරයේ සාකච්ඡාවක් කරන කොට මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේම එක්තරා මන්ත්‍රීවරයෙක් ජනාධිපතිතුමාට පැමිණිලි කළා, "ජනාධිපතිතුමනි, ඔබතුමාත්, අපිත් මේ රටේ කාබනික පොහොර ව්‍යාප්තිය සාර්ථක කරන්න උත්සාහ ගන්න කොට නිමල් පියතිස්ස නුවරඑළියේ ගොවි ජනතාව එක්ක එකට එකතු වෙලා උද්ඝෝෂණ සූදානම් කරනවා" කියලා කිව්වා. මම එදාත්

[ගරු නිමල් පියතිස්ස මහතා]

බය වුණේ නැහැ. ඒ වෙනුවෙන් උද්ඝෝෂණ කරන්න ඕනෑ තමයි. ගොවි ජනතාවට විරුද්ධව තීරණ ගන්න කොට, ගොවියෙක් විධියට මට එය බොහොම සංවේදීව දැනුණා. එදා කරගත් මහා වරදෙන් අපටත් වැරදිලා, රටටත් වැරදිලා, ආණ්ඩුවටත් වැරදිලා, ජනාධිපති වෙච්ච එතුමාටත් වැරදිලා තමයි වැඩේ අවසන් වුණේ. ඒක තමයි ඇත්ත කථාව.

ඒ වාගේම මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. දකුණේ ඇමතිවරයකු විධියට අපේ කෘෂිකර්ම ඇමතිතුමා ගොවීන් ගැන හොඳ අදහසක්, අවබෝධයක් තිබෙන කෙනෙක් කියලා මම හිතනවා. ඩී.බී හේරත් රාජ්‍ය ඇමතිතුමා මාත් එක්ක පළාත් සභා ඇමතිකම් කරද්දී එතුමා ඒ පළාතේ කෘෂිකර්ම ඇමතිවරයා විධියටත්, මම මධ්‍යම පළාතේ කෘෂිකර්ම ඇමතිවරයා විධියටත් කටයුතු කළා. ඒ වාගේම තමයි අද අපේ ලොහාන් රත්වත්තේ මැතිතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කරනවා. එදා අපට ගැටලු මොනවාවත් තිබුණේ නැහැ. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ රේඛීය අමාත්‍යාංශය ගත්තොත්, ලේකම්තුමා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, සහකාර අධ්‍යක්ෂවරු, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ ගම් මට්ටමින් ගත්තාම, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, ඒ වාගේම පළාත් මට්ටමින්, පළාත් සභා ලේකම්, අධ්‍යක්ෂවරු, සහකාර අධ්‍යක්ෂවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, කෘෂි උපදේශක - AI - මහත්වරු වැනි නිලධාරින් බිම් මට්ටම දක්වා ඉන්නවා. ඒ නිසා මේ රටේ මේ කෘෂි ක්ෂේත්‍රය බිඳ වැටෙන තත්ත්වයක් නැහැ. විශේෂයෙන්ම තාක්ෂණික නිලධාරින් වාගේම ඊට අදාළ විෂය පථය හොඳට හදාරපු, අවබෝධ කරගත් විශේෂඥයන් මේ ක්ෂේත්‍රයට නායකත්වය දෙද්දී ගොවියෝ මීට වඩා පිම්මක් පැනලා ඉදිරියෙන් කටයුතු කරන්න ඕනෑ.

ගොවි ජනතාවට නායකත්වය දෙන්න ගමේත් නිලධාරින් සිටිනවා. ගමක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, කෘෂි උපදේශක යන නිලධාරින් වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත් ඔබතුමාගේ අමාත්‍යාංශයටම අයිති පශු වෛද්‍යවරයා, සත්ව සංවර්ධන උපදේශක - LDI - වැනි මහා විශාල පිරිසක් ගොවිතැනත්, පශු සම්පත් ක්ෂේත්‍රයත් සංවර්ධනය කිරීම සඳහා ගොවීන්ට නායකත්වය ලබා දෙනවා. ඒ වාගේම තාක්ෂණික සහාය ලබා දෙනවා. හැබැයි, එහෙම තිබියදීත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? කෘෂි උපදේශකවරු ඔවුන්ගේ union එක හරහා අද විශාල වශයෙන් දුක්ගැනවිලි ඉදිරිපත් කරනවා. එහි අඩුවක් නැහැ. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරිනුත් ඔවුන්ගේ union එක හරහා දුක්ගැනවිලි රාශියක් ඉදිරිපත් කරනවා. පශු වෛද්‍යවරුනුත් ඔවුන්ගේ union එක හරහා ප්‍රශ්න රාශියක් මෙන්ම අදෝනාත් අපට ඉදිරිපත් කරනවා. සත්ව සංවර්ධන උපදේශකයනුත් විශාල වශයෙන් අපට දුක්ගැනවිලි, අදෝනා ඉදිරිපත් කරනවා. එහෙම බැලුවාම මේ ක්ෂේත්‍රය තුළ සිටින කවුරුවත් තෘප්තිමත් නැහැ. ගොවියා තෘප්තිමත් නැහැ වාගේම නිලධාරිනුත් තෘප්තිමත් නැහැ. ඒ නිසා අද අපට ලොකු අභියෝගයක් තිබෙනවා. අපි ඒ අභියෝගය හඳුනා ගන්න ඕනෑ. ගොවියා වට්ටලා, ගොවියා දුර්වල කරලා අපට ඉදිරි ගමනක් යන්න බැහැ. මොකද අපට බත සපයන, ආහාර සපයන පිරිසක් විධියට තමයි ණය නැති ගොවි ජනතාව කටයුතු කරන්නේ.

ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සංගමය විසින් අපට බොහෝ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වෙලාවේ ඒ සියලු යෝජනා ගැන අදහස් දක්වන්න බැහැ. මට ලැබී තිබෙන කාල වේලාව ඉක්මනින් ගෙවිලා යන නිසා මම කල්පනා කරනවා, එතුමන්ලා විසින් ඉදිරිපත් කරපු යම් කරුණු ප්‍රමාණයක් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්න. ඔවුන් කියනවා, "ලෝකයේම අඩුම ගමන් වියදම වැඩි කර දෙන ලෙස ඉල්ලා සිටිමු" කියලා. ඇත්තටම ගත්තොත්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ට ගමන් වියදම් හැටියට දැන් දෙන්නේ රුපියල් 400ක වාගේ මුදලක්. හැබැයි, අද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ 2,000ක වාගේ පුරප්පාඩු තිබෙනවා. දැනට ඉන්න නිලධාරින් පිරිස කොට්ඨාස ගණන තව වැඩි කරගෙන ඒ කටයුතු කරගෙන යනවා. හැබැයි, ඒ අයට අවශ්‍ය ගමන් වියදම් පහසුකම් නැති නිසා අද ඒ කොට්ඨාසවල ජීවත් වෙන ගොවීන්ට නිසියාකාරව සාධාරණත්වය ඉටු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔවුන්ගේ ගමන් වියදම් කියන කාරණය සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු වෙන්න ඕනෑ. අද ඉන්ධන මිල අධිකයි. පෙට්‍රල් ටිකක් ගහගෙන බයික් එකේ ගිහිල්ලා මාසයක් කටයුතු කරද්දී රුපියල් 10,000ක් විතර වියදම් කරන්න වෙනවා. එහෙම වියදම් කරන කෙනෙකුට ගමන් වියදම් සඳහා රුපියල් 500ක්, රුපියල් 400ක් දෙනවා කියන කාරණය අදට වලංගු නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය ඒ සම්බන්ධයෙනුත් මා යොමු කරවනවා. ඒ ක්ෂේත්‍රයේ නිරත කණ්ඩායම තෘප්තිමත් වන විධියට ඔවුන්ට ඒ පහසුකම් යම් පමණකට හරි දුන්නොත් පමණයි ඒ සේවය නිසියාකාරව පවත්වාගෙන ගොස් ගොවීන්ට අවශ්‍ය සාධාරණය ඉටු කර දෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

එම සංගමය ඉදිරිපත් කර ඇති යෝජනාවල වැඩිදුරටත් සඳහන් වෙනවා, පවතින බඳවා ගැනීමේ පටිපාටිය රටේ කෘෂිකර්මය දියුණු කරන එකක් නොවන අතර, දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති පටිපාටිය අනුව කෘෂි කාර්මික වර්ධනයකට යා හැකි යෝජිත බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම නිලධාරි පුරප්පාඩු පවතින නිසා නිලධාරි හිඟය ගොවියාට දැනට බලපාන නිසා නවක නිලධාරින් බඳවා ගැනීමට යෝජනා කරන බවත්, මේ වන විට තරුණ තරුණියන් 50,000කට වඩා මුදල් ගෙවා මෙම තනතුරට අයදුම්පත් ඉදිරිපත් කරලා තිබෙන බවත් ඔවුන් සඳහන් කරනවා. පසුගිය වකවානුවේ විශාල පිරිසක් විටින් විට මෙම තනතුරට අයදුම් කර තිබෙන බව ඔවුන් කියනවා.

එම යෝජනාවල වැඩිදුරටත් සඳහන් වෙනවා, සෑම වසරකම ලබා දිය යුතු ලිපි ද්‍රව්‍ය දීමනාව වසර මුලදී ලබා නොදීමෙන් ගොවීන්ට සේවා කිරීමට බලධාරින්ගෙන් ලැබෙන සොච්චම් වැටුපෙන් ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට සිදු වන බවත්, මේ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් මුදල් ලබා ගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගය ලබා නොදුන් බවත්. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ට ලබා දෙන කාර්යාල දීමනාව ග්‍රාමීයව රුපියල් 500ක් බව මම කලිනුත් කිව්වා. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ට රාජකාරි කිරීමට ලබා දී ඇති කාර්යාල පුටු, මේස බොහෝ ප්‍රමාණයක් අබලන් වීම නිසා සමහර කාර්යාලවල නිලධාරින්ට හා පැමිණෙන ගොවීන්ට ඉඳ ගැනීමට පුටු නොමැති වීමත්, එමෙන්ම 2015 වසරේ මේ තනතුරුවලට බඳවා ගත් කිසිවෙකුට කාර්යාල උපකරණ ලබා නොදීම කියන කාරණාවත් එම යෝජනාවල අඩංගුව තිබෙනවා.

ඒ වාගේම ගොවීන්ට මේ පහසුකම් සපයද්දී ඒ නිලධාරින් ඉතා බරපතළ තත්ත්වයකට මුහුණ දෙන බවත් ඔවුන් සඳහන් කරනවා. කුඹුරු මැනීම කළ යුත්තේ මිනින්දෝරුවන් වුවත්, කෘපනිස නිලධාරින්ට එම බාහිර රාජකාරිය පෞද්ගලික වියදමින් කරන ලෙසත්, එයට නියමිත මුදල් දෙන බවත් පැවසූ පසු එය එම නිලධාරින් තාක්ෂණික ගැටලු මධ්‍යයේ ණය වී ඉටු කළත්, අද වෙන තුරු ඒ මුදල් සියල්ල කෘෂිකර්ම අමාත්‍යාංශය ලබා දීලා නැති බවත් ඔවුන් සඳහන් කරනවා.

ඊළඟට, ගොවි බැංකුවල වසර 20කට වඩා රාජකාරි කරන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ට ගොවි

බැංකු නිලධාරි පත්වීම් තනතුරු අදාළ නියමිත වැටුපේ පිහිටුවා ලබා නොදුන් බවත් ඔවුන් සඳහන් කරනවා. ශ්‍රමය හා දැනුම සූරා කෑම වළක්වා ගැනීම කියන කාරණයත් එහි තිබෙනවා. මේ වාගේ කාරණා ගොඩක් මෙම යෝජනාවල අඩංගු වෙනවා. ගරු ඇමතිතුමනි, අත්‍යවශ්‍ය යැයි කියලා හිතපු කාරණා ටිකක් තමයි මම ඔබතුමාට ඉදිරිපත් කළේ. ඒ කාරණා පිළිබඳව අපේ අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු ජනාධිපතිතුමා පසුගිය කාලයේ ඉදිරිපත් කළා, කෘෂිකර්ම නවීකරණය කියන කාරණය. ඒක ඉතා වැදගත්. අපි නවීකරණය හරහා අද තිබෙන අභියෝගවලට මුහුණ දෙන්න ඕනෑ. හැබැයි, අපට ගැටලුවක් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරියෙක් - Divisional Officer of Agrarian Development - ඉන්නවා. එතුමා තමයි ඒ ක්ෂේත්‍රයේ අත්දැකීම් තිබෙන, විශේෂඥ හැකියාව තිබෙන නිලධාරියා. හැබැයි, නවීකරණ කාර්යාලය විවෘත කරද්දී, ඒ නිලධාරියා ඉන්දෙද්දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකුට ඒ අවස්ථාව ලබා දීම සාධාරණ නැහැ කියලා අපි විශ්වාස කරනවා. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් නිකුත් කරලා තිබෙනවා. දෙසැම්බර් මාසයේ 4වැනි දා කියලා තමයි එහි දිනය සඳහන් වෙලා තිබෙන්නේ.

නමුත්, එම කාර්යයේදී ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ලේකම් එම කටයුත්තට සම්බන්ධ කර ගන්නේ නැතුව ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි තමයි ඇත්තටම ඒ අදාළ මූලික සම්බන්ධීකරණ කටයුතු සියල්ල සිද්ධකොට තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව යම් සංශෝධනයක් සිදු කරලා සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්ට නැවත එම කටයුතු පවරා දෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම පළාත් සභා තුළ පවතින ක්‍රියාවලියේ අද වන විට විශාල දුර්වලතා තිබෙනවා. මොකද, අද ඒවායේ මහජන නියෝජිතයෝ නැති නිසා විශේෂයෙන්ම පළාත් සභා හරහා ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන්වල සාර්ථක ප්‍රතිඵල ගොවියාට ලැබෙන තත්ත්වයක් නැහැ. ඒවායේ මහජන නියෝජිතයෝ සිටියා නම් ඒ පාර්ශ්ව සියල්ල -ගොවීන්, මහජන නියෝජිතයන් සහ නිලධාරින්- එකට එකතු වෙලා එතැනට ගැළපෙන ක්‍රියාවලිය පවත්වා ගෙන යනවා. නමුත්, අද පවතින තත්ත්වය නිසා ඒ ක්ෂේත්‍රය තුළ බිම් මට්ටමේ සිටින ජනතාව ඉතා බරපතළ තැනකට ඇද වැටී තිබෙනවා.

ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන පශු වෛද්‍ය ක්ෂේත්‍රය ගැනත් මා සඳහන් කළ යුතුයි. අද පශු වෛද්‍යවරුන්ගේ හිඟය බරපතළ විධියට පවතිනවා. කිරි නිෂ්පාදන ක්‍රියාවලියේදී නිශ්චිතවම පශු වෛද්‍යවරුන්ගේ මැදිහත්වීම සිදු විය යුතු වුණත්, අද වන විට පශු වෛද්‍යවරුන්ගේ හිඟයත් විශාල වශයෙන් පවතිනවා. ඒ වාගේම ඔවුන්ට නිසි පරිදි නිල නිවාසත් නැහැ. ඒ වාගේම ඔවුන්ට ලබා දී තිබෙන වාහන සමහර විට අවුරුදු 20ක්, 40ක් විතර පරණයි. වහින කාලයට ඒ වාහන ඇතුළේ යන්න ඕනෑ කුඩයක් ඉහලාගෙනයි. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කර ඔවුන්ට අවශ්‍ය එම පහසුකම් සපයන්නේ නැත්නම් අපි බලාපොරොත්තු වන ඵලදායී ප්‍රතිඵලය, ගොවීන් බලාපොරොත්තු වන පහසුකම් නොලැබී යනවා. ඒ නිසා අපි කියා සිටිනවා, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා.

අද වන විට නිලධාරින් රට හැර යනවා. පශු වෛද්‍යවරුන් යම් පිරිසක්, ඒ වාගේම සත්ත්ව සංවර්ධන උපදේශකයින් යම් පිරිසක් පසුගිය වකවානුව තුළ රට හැර යෑම නිසා ඇති වුණු පුරප්පාඩු සම්පූර්ණ නොවීම තුළ විශේෂයෙන්ම පශු සම්පත් ක්ෂේත්‍රයේ ගොවීන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා වාගේම ඒ හේතුව නිසා රජයේ -අමාත්‍යාංශයේ- අපේක්ෂිත ඉලක්ක සපුරා ගන්නත් බැරිව යනවා. මම හිතන විධියට ඒ තුළ තිබෙන්නේත් බරපතළ තත්ත්වයක්.

ඒ වාගේම තව පැත්තකින් බිම් මට්ටමේ ගොවීන්ට, විශේෂයෙන්ම කිරි ගොවීන්ට බලපා තිබෙන තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි හරකුන් හංවඩු ගැසීමේදී ඇති වන ගැටලුව. පසුගිය කාලය තුළ ඒක ඒ තරම් ගැටලුවක් වෙලා තිබුණේ නැහැ. නමුත්, සමහර නීතිමය කාරණාවලදී හරකුන් හංවඩු නොගැසීම හේතු කොටගෙන ගොවීන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. මොකද, ඊට අදාළ පනතට අනුව පශු වෛද්‍යවරයාට තමයි හරකුන් හංවඩු ගැසීමට ඒ අදාළ බලය තිබෙන්නේ. නමුත්, මොකක් හෝ සංශෝධනයක් සිදු කර අඩුම තරමේ පශු වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ සත්ත්ව සංවර්ධන උපදේශකට ඊට අදාළ බලය ලබා දුන්නොත්, ගොවීන් දැනට මුහුණ දෙන ගැටලුවලට එය යම් පමණක හෝ විසඳුමක් විධියට අපට සලකන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, අපට මෙන්න මේ ආකාරයේ ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම මධ්‍යම පළාත් සභාව තුළ කෘෂිකර්ම ඇමතිවරයා විධියට කටයුතු කරද්දී ලබපු අත්දැකීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලබපු අත්දැකීම් මා හට තිබෙනවා. ඔබතුමා හොයා බලන්න, මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට මම නායකත්වය දුන් කාලයේ මධ්‍යම පළාත් සභාවේ හොඳම අමාත්‍යාංශය වුණේ එයයි. කෘෂි ක්ෂේත්‍රය, පශු සම්පත් ක්ෂේත්‍රය නවීකරණය කරලා ඵලදායක ප්‍රතිඵල ඒ කාලයේ මම ප්‍රායෝගිකව අරගෙන දුන්නා. කොටින්ම කියනවා නම්, මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මගේ නිල කාලය අවසන් වෙනකොට විගණකාධිපතිවරයාගේ විගණන පැසසුම් සහිත විගණන මත 17ක් මම ලබා ගත්තා.

මම ඔබතුමාගේ අවධානය ඉන් එක් කාරණයකට යොමු කරනවා. මම කෘෂි ක්ෂේත්‍රයට තරුණ තරුණියන් 2,000ක් සූදානම් කළා. ඒ අනුව මධ්‍යම පළාතෙන් තෝරා ගත් තරුණ තරුණියන් 500කට මහවැලි සමුපකාර නිකේතනයේදී දින ගණනාවක පුහුණුවක් ලබා දීලා ඒ අය කෘෂි ක්ෂේත්‍රයට යොමු කිරීම සඳහා මම විශේෂ වැඩසටහනක් දියත් කළා. එම වැඩසටහන තුළ මම කෘෂි ක්ෂේත්‍රය තුළ නෙළා ගත් විවිධ සාර්ථක ප්‍රතිඵල ඇතුළත් ප්‍රකාශයක්, සඟරාවක් විධියට 2012දී මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර හා පරිසර කටයුතු අමාත්‍යාංශය නිකුත් කළා. බලන්න, මේ තිබෙන්නේ ඒ සඟරාව. මේ සඟරාව හරියට කියවා බලන්න, විශේෂයෙන්ම මෙය රේඛීය අමාත්‍යාංශයේ නිලධාරින්ටත්, පළාත්වල ඉන්නා නිලධාරින්ටත් ඉතා වැදගත් ආදර්ශ සපයන සඟරාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගොවිසවිය විශේෂ කලාපය 2012" යනුවෙන් සඳහන් එම සඟරාව මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ සඟරාව තුළ තිබෙන කරුණුවලින් බොහෝ දේ ඉගෙන ගන්න පුළුවන්. මොකද, ගන්න පුළුවන් ගොඩක් දේවල් මේ තුළ තිබෙනවා. මට ලැබී තිබෙන කාලය අවසන් නිසා මම මේ සඟරාවේ තිබෙන එක් කාරණයකට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එවකට සිටි විගණකාධිපතිවරයා සමඟ සිදු කළ සාකච්ඡාවකට අදාළව 2012.01.19 දින "ලංකාදීප" පුවත් පතේ පළ වුණු වාර්තාවක කොටසක් "ගොවිසවිය විශේෂ කලාපය 2012" යන මෙම සඟරාවේ 111 වැනි පිටුවේ සඳහන් වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිමල් පියතිස්ස මහතා]

එම ලිපියේ මාතෘකාව ලෙස සඳහන් වන්නේ, "මධ්‍යම පළාත් සභා ඇමැති නිමල් පියතිස්සගේ අමාත්‍යාංශය විගණකාධිපතිගේ පැසසුමට" යනුවෙන්. ගරු ඇමතිතුමනි, මේ සඟරාවේ කාරණා ගොඩක් සඳහන් වෙනවා. නමුත්, ඒ සියල්ල මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න වෙලාව නැහැ. මේ සඟරාව කියෙව්වොත් මෙහි සඳහන් කර තිබෙන කාරණා දැක බලා ගන්න ඔබට පුළුවන්. මේ තුළ සඳහන් කාරණා හරියට හැදෑරුවොත් එය ප්‍රයෝජනවත් වෙයි කියාත් මා හිතනවා. මොකද, සමහර වැඩසටහන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන් කොහොමද කියන එකත් මේ තුළ සඳහන් කර තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාටත්, ඒ වාගේම අපේ රාජ්‍ය අමාත්‍යවරුන් දෙපළටත් මේ අවස්ථාවේදී මම සුබ පතනවා. ඔබතුමන්ලාට ප්‍රායෝගිකව ඉතා විශාල කාර්යභාරයක් කරන්න පුළුවන් කියලා අපි දන්නවා. ඔබතුමන්ලා දැනටමත් ඒ සඳහා විශාල වෙහෙස මහන්සියක් දරනවා කියන පණිවුඩය ලබා දෙමින් ඔබතුමන්ලාට 2024 වසරට සුබ පතමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.39]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් රමේෂ් පතිරණ ඇමතිතුමා -අපේ දිස්ත්‍රික්කයේ නායකතුමා- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කාලයක් දක්ෂ ඇමතිවරයෙක් විධියට කටයුතු කළා. අද කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් එකතු කරගෙන රාජ්‍ය ඇමතිවරු දෙදෙනා සමඟ ඉතාම දක්ෂ විධියට ඒ කටයුතු හැසිරවීම සම්බන්ධයෙන් අපි පළමුවෙන්ම ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට සුබ පතනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සහ මේ පාර්ලිමේන්තුව මේ රටේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳව දක්වන උනන්දුව මත මේ රට හැමදාමත් ණයකාරයෝ වෙලා ලෝකයට ණය ගෙවනවාද, එහෙම නැත්නම් හැම දාම IMF එකෙන් නැත්නම් වෙනත් විදේශීය රටවලින් ණය ලබාගෙන ණයකාරයෝ වෙලා ඉන්නවාද කියන එක තීරණය වෙනවා. ඒක තීරණය වෙන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත දක්වන උනන්දුව සහ අපි දක්වන මැදිහත්වීම මතයි. මම මේ ගැන කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට ගත් දිනයේදීත් සඳහන් කළා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයට මේ වෙලාවේ ලක් කළ යුතු කාරණයක් තිබෙනවා. මම ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති. ලංකාව පුරාම මම මේ කියන තත්ත්වය ඇති. කෘෂිකර්ම කමිටුව කියන්නේ, මහජන නියෝජිතයින්ගෙන් තොරව පවත්වා ගෙන යන කමිටුවක්. මහජන නියෝජිතයින්ට කෘෂිකර්ම කමිටුවට සම්බන්ධ වෙන්න පුළුවන් වෙන විධියට අණ පනත් සහ චක්‍රලේඛ වෙනස් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. අද කෘෂිකර්ම කමිටුව නිලධාරීන් පමණක් රැස් වෙන තැනක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා කෘෂිකර්ම කමිටුව -ප්‍රාදේශීය මට්ටමේ කමිටුවත්, දිස්ත්‍රික්ක කමිටුවත්- සියලු මහජන නියෝජිතයන්ට විවෘත වන, සාකච්ඡා කළ හැකි තැනක් බවට පත් කරන්න කියලා මම මේ වෙලාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, රසායනික පොහොර ප්‍රතිපත්තිය නිසා වැඩිපුරම බලපෑමට ලක්වුණු කෙනෙක්, මම. මම මේ පාර්ලිමේන්තුවේ සිටින සෑම මන්ත්‍රීවරයෙකු ළඟටම ගිහිල්ලා, මන්ත්‍රීවරු 43දෙනෙකුගෙන් අත්සන් ලබාගෙන ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, ඒ පොහොර ප්‍රතිපත්තිය ගැන නැවත වතාවක් හිතා බලන්න කියලා. හිනිදුම් පත්තුවේ ඉපදුණු කෙනෙක් විධියට මට ඒ මොහොතේ ඇති වුණු බලපෑම ගැන මේ සභාවට මෙහෙම කියලා නිම කරන්න නැහැ. අපේ මිනිස්සු තුළ තිබුණු පීඩනය යම් වෙලාවකදී පුපුරා ගියා කියලා මම හිතනවා. තවමත් අපට ඒක නිවැරදි කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ තුළින් විශේෂයෙන්ම තේ පැළ තවාන්කරුවා විනාශයට පත් වුණා. මගේ ප්‍රදේශය වන හිනිදුම් පත්තුව, තේ පැළ තවාන් සිදු කරන ප්‍රදේශයක්. තේ පැළ තවාන්කරුවන් ඔවුන්ගේ ජීවනෝපාය ගෙන යන්නේ තේ පැළ තවාන් 500ක්, 1,000ක් වාගේ ප්‍රමාණයකින්. අද වෙනකොට ඒ තේ පැළ තවාන්කරුවන් විනාශයට පත් වෙලා, නැත්තටම නැති වෙලා තිබෙනවා.

මම මේ වෙලාවේ විශේෂයෙන්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් සියලුදෙනාටම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. කුරුඳු පැළ තවාන්කරුවන් බරපතළ අපහසුතාවකට පත් වුණා, පසුගිය අවුරුද්දේ. රජයට -දෙපාර්තමේන්තුවට- කුරුඳු පැළ මිලදී ගන්නවා කියලා ඔවුන්ට විශාල බලාපොරොත්තුවක් ලබා දෙමින් කුරුඳු පැළ විශාල ප්‍රමාණයක් වගා කරන්න කියලා ලබා දුන්නා. හැබැයි, කුරුඳු පැළ මිලදී ගත්තේ නැහැ. කුරුඳු පැළ ඉතා සුළු ප්‍රමාණයක් විතරයි ඔවුන් මිලදී ගත්තේ. ඒ නිසා අද කුරුඳු පැළ තවාන්කරුවා බරපතළ අපහසුතාවකට පත් වෙලා සිටිනවා. ඔවුන්ට අද අලුතින් වගා කරන්න භූමිය නැහැ; හදපු පැළ ටික වැඩෙමින් තිබෙනවා; ඒවා විකුණා ගන්න විධියක් නැහැ; ඒවා රජයෙන් මිලදී ගත්තේ නැහැ. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් ඔවුන්ට තිබෙනවා. මම විශ්වාස කරනවා, එවැනි ප්‍රශ්නවලට අපි විසඳුම් දෙන්න ඕනෑ කියලා. අපි තේ පැළ තවාන්කරුවා ආරක්ෂා කරන්න ඕනෑ; කුරුඳු පැළ තවාන්කරුවා ආරක්ෂා කරන්න ඕනෑ.

රසායනික පොහොර ප්‍රතිපත්තිය නිසා හොඳට බැණුම් අහපු කෙනෙක් විධියට මට මේ කාරණය මේ සභාව තුළ නොකියා ඉන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රසායනික පොහොර භාවිතය නිසා පස මිය යමින් තිබෙනවා. මම ඒක අත්දකිනවා. අපේ පළාත්වල පසෙහි සිටින ගැඩවිලා, බිංකුණ්ඩා, කුඩැල්ලා වඳ වෙමින් යනවා. ඒ වාගේම අපේ පළාතේ පස අසමතුලිත වෙලා තිබෙනවා; පරිසරයත් අසමතුලිත වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ පළාත තුළ මොනරු විශාල වශයෙන් පැතිරෙමින් සිටිනවා. ඒ නිසා අපේ පළාත්වල වෙනදාට නිතර දකින්න ලැබුණු උරගයින් -සර්පයින්- අද අපට දකින්න ලැබෙන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපේ රටේ පවතින මේ තත්ත්වය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ගරු අමාත්‍යතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය තුළ විශේෂයෙන්ම තේ වගාව සහ කුරුඳු වගාව සිදු කෙරෙනවා. කොවිඩ් වසංගතය නිසා අපේ රට වැටෙන්න යද්දී, විනාශ වෙන්න යද්දී හිනිදුම් පත්තුව ඇතුළු ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල මිනිස්සු තමන්ගේ තේ කර්මාන්තශාලාවල කටයුතු අත් හරින්නේ නැතුව පවත්වාගෙන ගිහිල්ලා මේ රටට විදේශ විනිමය ගෙනාවා.

ගරු අමාත්‍යතුමනි, තේ කර්මාන්තය පවත්වාගෙන යන්න නම් අපි තේ කර්මාන්තශාලාවල විදුලි බිලට සහනයක් දිය යුතුමයි කියා මම විශ්වාස කරනවා. තේ කර්මාන්තශාලාවල විදුලි බිලට සහනයක් දෙන්න බැරි වුණොත්, හෙට දවසේ තේ කර්මාන්තය විනාශ වෙයි. අද අලුතෙන් තේ වගා කිරීම නතර වෙලා තිබෙනවා. ඒ වාගේම තිබෙන තේ දලුවලට විශාල තරගයක් ඇති වෙලා තිබෙනවා. තේ දලුවල ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා. තේ දලුවලට තිබෙන තරගය නිසා විශේෂයෙන් අමු තේ දලු එකතු කිරීමේදී දලුවල තිබෙන ගුණාත්මක තත්ත්වය නොසලකා තේ කර්මාන්තශාලා හිමියන් කටයුතු කරනවා. ඒ නිසා තේ කර්මාන්තය ආරක්ෂා කර ගන්න ඔබතුමා මැදිහත් විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට, කුරුඳු වගාව ගැනත් මම කියන්න කැමතියි. අපේ දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රදේශයේ විශාල වශයෙන් කුරුඳු වගා කරනවා. අපේ ප්‍රදේශයේ පස හොඳට ගැළපෙනවා, කුරුඳු වගාවට. එදා මහ බද්ද කිව්වේ, කුරුඳු වගාවෙන් ගත්ත බද්දට. ඉතිහාසයේ කුරුඳු වගාවෙන් තමයි ආණ්ඩුව විශාලම බද්ද අරගෙන තිබෙන්නේ. අපේ කරන්දෙණිය ප්‍රදේශයේ තිබෙනවා, මාතර දිස්ත්‍රික්කයත්, හම්බන්තොට දිස්ත්‍රික්කයත් යාවෙන එක බෝඩරයක්. ඒ බෝඩරය කුරුඳු වගාවට හරියටම ගැළපෙන පස තිබෙන බිම් ප්‍රදේශයක්. එහි කුරුඳු වගාව ව්‍යාප්ත කිරීමේ හැකියාව තිබෙනවා. මේ අවුරුද්දේ ආරම්භ කළ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා යම් පරිවර්තනයක් කරන්න, පෙරළිකාර තීන්දුවක් ගන්න, අපේ රටේ කුරුඳු වෙන්දේසිය ඇති කරන්න, ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා නම් ඔබතුමා එයින් ජයග්‍රහණය කරනවා. ඒක අපේ කුරුඳු වගාකරුවාට කරන සාධාරණයක් වෙනවා. මොකද, කුරුඳු තැළෙන්නේ අවුරුද්දේ එක කාලයකට විතරයි. අවුරුද්දේ කුරුඳු තැළෙන කාලයට ඒ මිනිස්සු අතේ සල්ලි යහමින් ගැවසෙනවා. සමහර වෙලාවට අපේ මිනිසුන්ට කුරුඳුවලින් ගන්න සල්ලි කළමනාකරණය කර ගන්න බැහැ. මොකද, එකවර විශාල මුදල් ප්‍රමාණයක් ඔවුන්ගේ අතට ලැබෙනවා. හැබැයි, කුරුඳු තැළෙන්නේ නැති කාලයට ඒ අය අතේ එක රුපියලක්, සතයක් නැතුව අන්ත දුගී දුප්පත්භාවයට පත් වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන්කම ලැබුණොත් කුරුඳු වෙන්දේසිය ඇති කරන්න, අපේ රටේ වතු සමාගම් කොටු කරගෙන සිටින, වවන්නේ නැති වතුවලින් -වතු සමාගම් අල්ලාගෙන සිටින වතුවලින්- යම් ප්‍රමාණයක් තරුණ වගාකරුවන්ට දීලා මේ රටේ වගා සංග්‍රාමයක් ඇති කරන්න, අපි IMF එකේ ණයකරුවන් වෙන්නේ නැහැ; අපි හැමදාම ණය වෙලා ජීවත් වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මම විශ්වාස කරනවා, ඔබතුමාට මේ වෙනුවෙන් විශාල පරිවර්තනීය වෙනසක් කරන්න පුළුවන් කියලා.

ගරු ඇමතිතුමනි, මගේ ආසනයේ ජනතාව මාස දෙකකට කලින් ඉඳලා අදටත් බලාගෙන ඉන්නවා, සෘජු වගා ක්‍රමය යටතේ තේ පැළ සිටුවන්න. වළවල් කපාගෙන, කුඤ්ඤ ගහගෙන දහස් ගණනක් මිනිස්සු ඒ වෙනුවෙන් බලාගෙන ඉන්නවා; නමුත්, තවම තේ පැළ ටික දෙන්න බැරි වුණා; තවම කොම්පෝස්ට් පොහොර ටික දෙන්න බැරි වුණා. සෘජු වගා ක්‍රමය යටතේ ඉඩමේ තේ පැළ වවන්න මගේ ආසනයේ මිනිස්සු දෙතුන්දාහක් බලාගෙන ඉන්නවා; අක්කර කාල බැගින් ඔවුන් ඉඩම් හදාගෙන ඉන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, පුළුවන් නම් මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කරලා පරිවර්තනීය තීන්දුවක් ගන්න කියලා. අපි අස්වැසුමෙන් රුපියල් 15,000ක් දෙනවා; රුපියල් 8,500ක් දෙනවා. අඩු ගණනේ තමන්ගේ තිබෙන අක්කර කාල, භාගය වවන්න අවශ්‍ය පැළ ගන්න, ඉඩම හදන්න මුදල් දෙන්න ක්‍රමයක් මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කරලා, හදන්න පුළුවන් නම් හැමදාම ආණ්ඩුවට අතපාන සහනාධාරලාභීන් නොවී ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න පුළුවන්කම තිබෙනවා කියලා මම හිතනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් මේ සම්බන්ධයෙන් අලුත් සංකල්ප, අලුත් දේවල් හඳුන්වා දෙන්න. පාර්ලිමේන්තුව විධියට අපි සූදානම්, අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා ඔබතුමා එක්ක මේ වැඩ කොටසට මැදිහත් වෙලා කටයුතු කරන්න. පසුගිය කන්නයේ අපට කුඹුරු වගාවෙන් අපේ ඉලක්කයට යන්න බැරි වුණා. මේ කන්නයේ අපි, අපේ දිස්ත්‍රික්කය ඒ ඉලක්කයට ගෙන යනවා. මේ මොහොත වෙද්දී කුඹුරු වගාවෙන් අපි, අපේ ඉලක්කයට යමින් ඉන්නවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි මහත්වරුන්ගේ හිඟය ගැනත් මම කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ ආසනයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි මහත්වරු 70දෙනෙක් අඩුයි. මගේ ආසනයේ වසම් 143ක් තිබෙනවා. ඒ වසම් 143න්, 70ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් නැහැ. ඒවා කුඹුරු වගා කරන ආසන. හැම ග්‍රාම නිලධාරි වසමකම කුඹුරු අක්කර තුන් හාරසියයක් තිබෙනවා. හැබැයි, නිලධාරීන් - කෘපනිස මහත්වරු - නැහැ. එම නිසා ඒ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. HESHA WITHANAGE left the Chair and THE HON. DEPUTY SPEAKER took the Chair.*

[பி.ப. 5.48]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின் குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு நாங்கள் உரையாற்றிக் கொண்டிருக்கிறோம். எங்களுடைய பிரதேசம் நீண்ட காலமாக யுத்தத்தினால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசமாகும்.

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

அந்த வகையில், அங்குள்ள பிரதேசங்களைக் கட்டியெழுப்ப வேண்டும். அந்த வகையில் வடக்கு, கிழக்கு மாகாணங்களை போரால் பாதிக்கப்பட்ட மாகாணங்களெனப் பிரகடனப் படுத்தி, அங்கு விவசாயம், வர்த்தகம், கடற்றொழில் போன்ற துறைகளை அபிவிருத்தி செய்வதற்கு விசேட ஏற்பாடுகள் செய்யப்பட வேண்டுமென்ற கோரிக்கைகள் எங்களால் நீண்ட காலமாக விடுக்கப்பட்டு வந்தும், அரசாங்கம் அதைக் கவனத்தில் எடுக்கவில்லை. இத்தகைய சூழலிலே, விவசாயத் துறையில் இருக்கின்ற பிரச்சினைகள் தொடர்பாக நான் இங்கே சில விடயங்களைச் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

விவசாய அபிவிருத்தி தொடர்பாக அரசாங்கம் அதிகமாகப் பேசி வருகின்றது. இத்தகைய சூழலிலே, வடக்கு, கிழக்கில் விவசாய அபிவிருத்தி தொடர்பாக அரசாங்கத்தின் கொள்கை என்ன என்பது தொடர்பில் பாரிய கேள்வி இருக்கின்றது. தற்போதைய கமத்தொழில் அமைச்சர்மீது எங்களுக்கு மிகுந்த மரியாதை இருக்கின்றது. ஆனால், கடந்த காலத்தில் தமிழர்களுடைய விவசாயப் பொருளாதாரத்தை அழிவடையச் செய்த செயற்பாடுகள் அவர்களை மிகவும் ஆத்திரமடையவும் விரக்தியடையவும் செய்தன. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்திலே உள்ள மயிலத்தமடு, மாதவனை போன்ற பிரதேசங்கள் பொலன்னறுவையின் எல்லைப் பகுதியாக அமைந்திருக்கின்றன. அந்தப் பிரதேசங்கள் மிகப் பெரிய மேய்ச்சல் நிலங்களைக் கொண்டுள்ளன. அங்கு மூன்று இலட்சம் கால்நடைகள் வளர்க்கப்பட்டு வந்தன. அந்தப் பிரதேசத்திற்கு பொலன்னறுவை மற்றும் அம்பாறை ஆகிய மாவட்டங்களில் இருந்து பெரும்பான்மை இனத்தைச் சேர்ந்த சிங்கள மக்களை சோளப் பயிர்ச்செய்கைக்காகவும் ஏனைய சிறு தானியப் பயிர்ச்செய்கைக்காகவும் கொண்டுவந்து வலுக்கட்டாயமாக அங்கே குடியேற்றினார்கள். அதற்காக, அங்குள்ள கிட்டத்தட்ட 15,000 ஏக்கர் மேய்ச்சல் தரைகள் கைப்பற்றப்பட்டிருக்கின்றன. அத்துமீறி குடியேறிய பெரும் பான்மையின சிங்களவர்களால் அங்கு கால்நடை வளர்ப்பில் ஈடுபடுகின்ற பண்ணையாளர்கள் மிக மோசமாகத் தாக்கப்படு கின்ற, அவர்களின் கால்நடைகள் அழிக்கப்படுகின்ற சம்பவங்கள் நடைபெறுகின்றன. அந்த மக்கள் அதற்கெதிராக நீதிமன்றங்களிலே வழக்குத் தொடுத்திருக்கிறார்கள். அத்துமீறி குடியேறி இருக்கும் பண்ணையாளர்கள் அங்கிருந்து வெளி யேற்றப்பட வேண்டுமென்று அண்மையில்கூட ஏறாவூர் நீதிமன்றம் தீர்ப்பளித்திருந்தது. ஆனால், அந்த நீதிமன்றக் கட்டளைகள் நடைமுறைப்படுத்தப்படவில்லை. பொலிஸாரும் அந்தக் கட்டளையை நடைமுறைப்படுத்துவதற்கு எந்தவித மான நடவடிக்கையும் எடுக்கவில்லை.

அங்கு பெரும்பான்மை இனத்தவர்களால் தொடர்ச்சியாக மாடுகளும் கன்றுகளும் வெட்டப்பட்டு, இறைச்சிக்காகக் கொண்டு செல்லப்படுகின்றன. அத்துமீறி குடியிருக்கும் பெரும்பான்மை இனத்தைச் சேர்ந்த ஒரு பண்ணையாளரால் கடந்த வாரம் 'ஜெனரேட்டர்'மூலம் மின்சாரம் பாய்ச்சப்பட்டு ஏழு மாடுகள் படுகொலை செய்யப்பட்டுள்ளன. அது தொடர் பாக பொலிஸாரிடம் முறைப்பாடு செய்யப்பட்டபோதும், இன்றுவரை பொலிஸார் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கவில்லை. கரடியனாறு பொலிஸார் அத்துமீறி குடியேறிய பண்ணையாளர்களுக்குச் சார்பாகவே செயற்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். இதன் காரணமாக, அங்குள்ள மூன்று இலட்சம் மாடுகளும் அழிவுகளைச் சந்தித்து வருகின்றன. மேலும், அந்த மாடுகளை அங்கே வளர்க்க முடியாமல் வாழைச்சேனை, கிரான் போன்ற பகுதிகளுக்கு மேய்ச்சலுக் காக எடுத்துச் செல்கின்றபோது பண்ணையாளர்கள் இன்னோரன்ன பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். இப்பொழுது காலபோக நெற் செய்கைக் காலம் என்பதால், நெற்செய்கை பண்ணப்பட்ட பிரதேசங்களுக்குள் அந்தக் கால்நடைகள் சென்று விவசாயத்தை அழிக்கின்ற நிலைமை உருவாகிக் கொண்டு இருக்கின்றது. இதனால், நெற் செய்கையாளர்களுக்கும் தமிழ்ப் பண்ணையாளர்களுக்கும் இடையே முரண்பாடுகள் தோன்றுகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆகவே, மயிலத்தமடு, மாதவனைப் பகுதியிலே சட்ட விரோதமாக, அத்துமீறி குடியேறி இருக்கின்ற பெரும்பான்மையின சிறு தானியப் பயிர்ச் செய்கையாளர்களை அங்கிருந்து அகற்றி, அந்த மேய்ச்சல் தரையை தமிழ்ப் பண்ணையாளர்களுக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று இந்த இடத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே! மட்டக்களப்பு மாவட்டத்தில் 25 சதவீதமான நெற் செய்கையாளர்களுக்குத் தான் உர மானியம் வழங்கப்பட்டிருக்கின்றது. ஆயித்தியமலை கமநல சேவைகள் நிலைய பிரிவில் இருக்கின்ற ஒரு விவசாயிக்குக்கூட இன்னும் உர மானியம் வழங்கப்பட வில்லை. இதன் காரணமாக, இரண்டு மாதங்களுக்கு முன்னர் போடப்பட்டிருக்கவேண்டிய உரம் இன்றுவரை போடப்படாத நிலைமை காணப்படுகின்றது. இப்படிச் செய்தால், எப்படி அந்த மாவட்டத்திலே உள்ள விவசாயிகள் நெற்செய்கையை இலாபகரமானதாகச் செய்ய முடியுமென்பதை தயவுசெய்து நீங்கள் சற்றுச் சிந்தித்துப் பார்க்க வேண்டும். இவ்வாறான செயற்பாடுகள் தவறுதலாக நடக்கின்றதா அல்லது வேண்டு மென்றே நடத்தப்படுகின்றதா என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது.

வடக்கு மாகாணத்திலே கமநல சேவைகள் அபிவிருத்தியை கிராம மட்டத்திற்குக்கொண்டு செல்வதற்கு விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர் பதவிநிலை மிகவும் அவசியமாக இருக்கின்றது. அத்தகைய பதவிநிலை உத்தியோகத்தர்கள் இருந்தால்தான் கிராம மட்டத்தில் அதன் சேவைகளைச் சிறப் பாகக் கொண்டு செல்லக் கூடியதாக இருக்கும். இத்தகைய தொரு சூழலிலே, யாழ். மாவட்டத்திலே 435 கிராம சேவை யாளர் பிரிவுகள் இருக்கின்றன். ஒவ்வொரு பிரிவுக்கும் ஒவ்வோர் உத்தியோகத்தர் தேவையாக உள்ளது. அந்த ஒவ் வொரு பிரிவுக்கும் ARPA என்ற பதவிநிலை உத்தியோகத்தர் கள் தேவையென விண்ணப்பம் கோரப் பட்டபோதும், 189 cadre மட்டும்தான் அங்கீகரிக்கப் பட்டிருக்கின்றது. அந்த 189 வெற்றிடங்களுக்கு 10 பேர் மாத்திரம்தான் நியமிக்கப்பட்டிருக் கிறார்கள். அதேபோன்று, கிளிநொச்சி மாவட்டத்திலே 95 கிராம சேவையாளர் பிரிவுகளுக்கும் விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்கள் தேவைப்படுகின்றபோது, 41 ஆளணிதான் அங்கீகரிக்கப் பட்டிருக்கின்றது. அதில் நான்கு உத்தியோகத் தர்கள் மாத்திரமே நியமிக்கப்பட்டு, கடமையில் ஈடுபடுத்தப் பட்டிருக்கின்றார்கள்.

அதேபோன்று, முல்லைத்தீவு மாவட்டத்தின் 136 கிராம சேவகர் பிரிவுகளுக்கு ARPAs என்கின்ற விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்கள் தேவையாக இருக்கின்றபோது 55 cadre அங்கீகரிக்கப்பட்டிருக்கின்ற நிலையில், 4 உத்தியோகத் தர்களே அங்கே கடமையில் இருக்கின்றார்கள். அதேபோன்று, வவுனியாவிலே 102 கிராம சேவையாளர் பிரிவுகளுக்கு 45 cadre அங்கீகரிக்கப்பட்டிருக்கின்ற நிலையில், 7 உத்தியோகத் தர்களே கடமையிலே இருக்கின்றார்கள். அதேபோன்று, மன்னார் மாவட்டத்திலே 122 cadre தேவைப்படுகின்றது. ஆனால், 66 cadre அங்கீகரிக்கப்பட்டிருக்கின்ற நிலையில், 25

உத்தியோகத்தர்களே கடமையில் இருக்கின்றார்கள். அதில் ஒரேயொருவர் மட்டுந்தான் தமிழராக இருக்கின்றார்.

வட, கிழக்கு மிகப்பெரியதொரு விவசாயப் பிரதேசமாக இருக்கின்ற நிலையில், இந்தக் குறைபாடுகளை நிவர்த்தி செய்யாமல் எப்படி நீங்கள் அங்கு விவசாயத்துறையை அபிவிருத்தி செய்யப் போகின்றீர்கள்? என்ற கேள்வி இருக்கின்றது. அதேபோன்று, வவுனியாவிலே 212 குளங்கள் Forest Departmentஇன் கட்டுப்பாட்டில் இருக்கின்ற காரணத்தினால், அதனை அபிவிருத்தி செய்ய முடியாத நிலைமை காணப்படுகின்றது. அதன்கீழ், 5,000 ஏக்கர் வயல் நிலங்களில் பயிரிட முடியாத நிலைமை இருக்கின்றது. ஆகவே, அவற்றை உடனடியாக விடுவித்து, அப்பகுதிகளை அபிவிருத்தி செய்வதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கௌ்கின்றோம். அதேநேரத்திலே, கிளிநொச்சி மாவட்டத்திலே பரந்தன் மற்றும் கண்டாவளை கமநல சேவை நிலையங்களுக்கு நிரந்தர விவசாயக் கட்டடங்களை அமைத்துத் தரவேண்டும் என்ற கோரிக்கை அந்த மக்களால் முன்வைக்கப்பட்டிருக்கின்றது. பூநகரிப் பிரதேசத்திலே வயல் காணிகளுக்குள் உவர் நீர் புகுகின்ற காரணத்தினாலே அதைத் தடுப்பதற்குத் தடுப்பணைகள் தேவைப்படுகின்றன. அதேபோன்று, கரியாலை நாகபடுவான் குளம் புனரமைக்கப்படாத காரணத்தினாலே 1,500 ஏக்கர் விவசாய நிலம் பாதிக்கப்படுகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. அதேபோன்று, யாழ். மாவட்டத்திலே அதிகளவான விவசாயிகள் மேட்டுக் காணிகளிலே உப உணவுப் பயிர்ச்செய்கையில் ஈடுபடுகின்ற நிலையில், அவர்களுடைய விவசாய நடவடிக்கைகளை ஊக்குவிப்பதற்கான மானியங்கள் எதுவும் வழங்கப்படாத காரணத்தினால் பெருமளவானோர் மோசமாகப் பாதிக்கப்படுகின்றார்கள்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கின்றேன்.

இந்த விடயத்திலேயும் கவனஞ்செலுத்தப்பட வேண்டும். அதேநேரத்திலே, வட மாகாணத்திலே யாழ்ப்பாணம் தவிர்ந்த ஏனைய 4 மாவட்டங்களுக்கும் பிரதி மாகாணப் பணிப்பாளர்கள் நியமிக்கப்படவில்லை. இதன் காரணமாக அந்த மாவட்டங்களில் விவசாய அபிவிருத்தியென்பது மிகமோசமாகப் பின்தங்கிக் கொண்டே செல்கின்றது. 'வாரி சௌபாக்கியா' திட்டத்தின்கீழ் முன்னெடுக்கப்பட்ட நீர்ப்பாசனக் குளங்களைப் புனரமைக்கும் வேலைகள் அரைகுறையில் நிறுத்தப்பட்டுள்ளது. மத்திய நீர்ப்பாசனத் திணைக்களம் முன்னெடுத்த மேற்படி வேலைகளைப் பூரணப்படுத்துவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்று கேட்டுக்கொள்கின்றோம்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
ஒரு நிமிடம் தாருங்கள்!

அடுத்ததாக, முல்லைத்தீவு கிளிநொச்சி மாவட்டங்களிலே World Bankஇனுடைய நிதியுதவியில் கமத்தொழில் அமைச்சினால் நடைமுறைப்படுத்தப்படும் 'சியாப்' என்றழைக்கப்படும் காலநிலைக்குச் சீரமைவான நீர்ப்பாசன விவசாயத்திட்டத்தினூடாக முல்லைத்தீவு பேராறு ஆற்றுப்படுக்கையில் 21 அணைகள் அமைக்கப்பட வேண்டியிருக்கின்ற அதேவேளை, கிளிநொச்சி மண்டைக் கல்லாற்றில் சில குளங்களும் அமைக்கப்பட வேண்டியிருக்கின்றன. இதற்குரிய முதலாங் கட்ட அனுமதிகள் வழங்கப்படவில்லை. ஆகவே, இதனை வழங்குவதற்குரிய நடவடிக்கைகளை விரைவாக எடுக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාවේ අවසරය ලබා ගත යුතුයි.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විවාදයේ කටයුතු අවසන් වනතෙක් වැඩිපුර කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee. -*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.57]

**ගරු ජගත් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)
ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි.

අද දින කාරක සභා අවස්ථාවේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම සතුටක්. මෙම අමාත්‍යාංශ දෙකේ අමාත්‍යවරයා විධියට අපේ ගරු මහින්ද අමරවීර ඇමතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමන්ලා විධියට කටයුතු කරන අපේ ගරු ඩී.බී. හේරත් මැතිතුමා, ගරු නිතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමා හා ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමන්ලාට එම අමාත්‍යාංශවල කටයුතු කරගෙන යාමේදී අපේ සහයෝගය උපරිමයෙන්ම ලබා දීමට කටයුතු කරනවා වාගේම, එතුමන්ලාට සුබ පතනවා.

[ගරු ජගත් සමරවික්‍රම මහතා]

අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් 2023 අවුරුද්දේ ලබා දුන්න සහයෝගය වෙනුවෙන් විශේෂයෙන්ම අපේ ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාට ස්තුතිය පුද කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අපේ පොළොන්නරුවේ ගොවිජන සේවා සහකාර අධ්‍යක්ෂතුමාගෙන් දැන ගන්න ලැබුණා, පොහොර සහනාධාරය වෙනුවෙන් ලබා දෙන රුපියල් 15,000ක මුදල ලබන සතියේ ඉඳලා අපේ ගොවි මහතුන්ගේ ගිණුමට බැර වන බව. එය අපේ ගොවි මහතුන්ට සුබ පණිවුඩයක් වනවා. ඒ පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. කිසිදු හිඟයකින් තොරව පොහොර ලබා ගැනීමට මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට හැකියාව ලැබුණා. ඔබතුමා සුළු වාරි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මුදල් ලබා දුන්නා. අපට අක්කර 400කට ආසන්න ප්‍රමාණයකට පැරෂුට් තැටි ලබා දුන්නා. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන වැඩසටහන පෙබරවාරි මාසය වනකොට අපට මුළුමනින්ම අවසන් කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම ගොවි මහතුන්ගේ සියයට 50ක දායකත්වය යටතේ air rifles ලබා ගැනීමට ඔබතුමා අපට අවස්ථාව ලබා දුන්නා.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමනි, මම ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිය පුද කරනවා, දුරකථන ඇමතුම්වලට ඔබතුමා දක්වන ප්‍රතිචාරයට. පොළොන්නරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විධියට එය මට විශාල සහනයක්. අපි ගන්නා දුරකථන ඇමතුම්වලට ඔබතුමා හැම විටම ප්‍රතිචාර දක්වනවා. පොඩි වෙලාවක් ප්‍රමාද වෙලා හෝ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා, අපේ ප්‍රශ්නවලට පිළිතුරු සපයලා, සහයෝගය ලබා දීම පිළිබඳව මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් කාරණයක් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. රාජ්‍ය අමාත්‍යතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. මේ වනකොට ලංකාවේ සියලු ප්‍රදේශවල විදුලිය බිඳ වැටීමක් සිදු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව විමසා අපට දුරකථන ඇමතුම් රාශියක් එනවා. මුළු ලංකාවේම විදුලිය බිඳ වැටිලා, මේ මොහොතේ. එයට හේතුව මොකක්ද කියලා අපි කැබිනට් ඇමතිවරයාගෙන් දැන ගන්න කැමැතියි. මොකද, රටේම එකවර විදුලිය බිඳ වැටීමක් සිදු වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ගරු විදුලිබල සහ බලශක්ති ඇමතිතුමා පාර්ලිමේන්තුවේ නැහැ. අපි ඒ ගැන හොයා බලන්නම්.

**ගරු ජගත් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)
ගරු සභාපතිතුමනි, ඒ කාලය මගේ වෙලාවෙන් අඩු කරන්න එපා.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමනි, මම යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා. අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලය පවත්වාගෙන යන්නේ railway station එකට අයිති ගොඩනැඟිල්ලක. Railway station එකේ නිලධාරින් විසින් අපේ ගොවිජන සේවා කාර්යාලය එතැනින් ඉවත් කර ගන්න කියා දැනුවත් කරලා තිබෙනවා. පුළුවන් නම් 2024 වර්ෂයේදීවත් නව නගරයේ තිබෙන භූමියේ ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදකයින්ගෙන් සියයට 95කට වඩා මේ වෙද්දි ගැටලු රාශියකට මැදි වෙලා සිටිනවා. ඒ වී මෝල් අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඇතැම් වී මෝල් මේ වනකොට බැංකුවලින් පවරාගෙන තිබෙනවා. එසේ නොකරන ලෙසට ඉල්ලමින් මම ගරු ජනාධිපතිතුමාගේත්, ඔබතුමාගේත් විශේෂ අවධානයට ඒ කාරණය යොමු කරනවා. කොරෝනා වසංගතයත් එක්ක තමයි ඒ වී මෝල් අකර්මණ්‍ය වෙන්න පටන් ගත්තේ. බැංකුවලින් පවරා ගැනීම නොවෙයි, ඒ වී මෝල් හිමියන්ට සහන ලබා දෙමින්, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නගා සිටුවීමයි කළ යුත්තේ කියා මම යෝජනා කරනවා.

කෙසේ නමුත්, සහල් වෙළඳ පොළේ ආරක්ෂාව වෙනුවෙන් දිවයින පුරා විසිරී සිටින දහසකට අධික සුළු හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදකයින් රැක ගැනීම වෙනුවෙන් ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මම යෝජනා කරනවා.

මෙරට පොල් අපනයනයෙන් ලබන ආදායම ඩොලර් බිලියන 2ක් දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න අපේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා කටයුතු කර තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මම යෝජනා කරනවා ඒ වැඩසටහන්වලදී පොල් වගාකරුවන් බොහෝ පිරිසක් සිටින පොළොන්නරුව දිස්ත්‍රික්කයත් ප්‍රමුඛ දිස්ත්‍රික්කයක් බවට පත් කර ගන්න කියලා. මොකද, ශ්‍රී ලංකාවේ විශාල පොල් farms අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අරලගංවිල ප්‍රදේශයේ තිබෙනවා. ඒ වාගේම, පොල් වගා කිරීම සඳහා අවශ්‍ය භූමිය පොළොන්නරුවේ ප්‍රමාණවත්ව තිබෙනවා. ඒ භූමිය පොල් වගාවට යෙදෙව්වොත්, එය රටටත්, අපේ දිස්ත්‍රික්කයේ ජනතාවටත් විශාල සහනයක් වෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව ව්‍යාපෘතිය - SAPP - මඟින් අපේ දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ට ප්‍රතිලාභ අත් කර දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා වාගේම එම දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තයේ යෙදෙන තරුණ තරුණියන්ට සහනයක් විධියට 2024 වර්ෂයේදීත් එම ව්‍යාපෘතිවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියා යෝජනා කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා, ගරු ඇමතිතුමනි.

වන සතුන්ගෙන් සිදු වන හානි ද මේ වන විට ඉහළ ගොස් ඇති නිසා වගා හානි වළක්වා ගැනීම සඳහා තමන්ට පතරොම් තුවක්කු ලබා දෙන්න කියන ඉල්ලීම ගොවීන් නිරන්තරයෙන් කරනවා,

ගරු ඇමතිතුමනි. හෙක්ටෙයාර 2කට ආසන්න ප්‍රමාණයකට - අක්කර 5කට- තමයි දැනට අනුමැතිය ලබා දී තිබෙන්නේ. ඒ නිසා ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මම යෝජනාවක් කරනවා, ගරු ඇමතිතුමනි. මහවැලි කලාපවල විශාල භූමි ප්‍රමාණයක -හතරෙන් තුනකම වාගේ- තිබෙන්නේ හෙක්ටෙයාරයක ගොවි බිම්. ඒ නිසා හෙක්ටෙයාරයක් වගා කරන ඒ ගොවීන්ටත් තුවක්කු බලපත්‍ර ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ජගත් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

වගා හානි වැඩි වශයෙන් සිදු කරන්නේ රිළවුන් වැනි සතුන්. ඒ නිසා රිළවුන් ලක්ෂයක් චීනයේ සත්වෝද්‍යාන වෙත ලබා දීමට අවශ්‍ය මූලික පියවර ගත්තත්, පරිසර සංවිධාන විසින් නඩු පැවරීම හේතුවෙන් එම වැඩ පිළිවෙළ කඩාකප්පල් වුණා. තවත් රටවල් කිහිපයකින්ම අපේ රටේ රිළවුන්ට ඉල්ලුමක් ඇති වුණත්, අධිකරණ තීන්දුව නිසා එම වැඩ පිළිවෙළ මුළුමනින් අකර්මණ්‍ය වෙලා තිබෙනවා. එය එසේ වුවත්, ඉදිරියේදී ආහාර අර්බුදයක් ඇති වීමේ අවදානම මඟ හරවා ගැනීම සඳහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් වගා කරන භෝග වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට දරන උත්සාහයක් වශයෙන් ගොවීන්ගේ ඉල්ලීම පරිදි සියයට 50ක දායකත්වයට යටත්ව -මා කලිනුත් කිව්වා වාගේ- 2024 වර්ෂය සඳහා වෙන් කර තිබෙන ප්‍රතිපාදනවලින් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් වායු රයිෆල් ලබා දීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. කෙසේ වෙතත්, වන සතුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් කථා කරන අයට සහ ඒ සත්ව සංගම්වල අයටත් අදහසක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. රිළවුන් නිසා අපේ ගොවීන් විඳින දුක් පීඩා දන්නේ ඒ ගොවි ජනතාවයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, සතුන්ට ආදරය කරන සත්ව සංවිධානවල අයට මම කියනවා, කරුණාකර පොළොන්නරුවට එන්න කියලා. සතුන්ට ආදරයක් තිබෙනවා නම් ඕනෑ නම් ඒ අයට පුළුවන්, පොළොන්නරුවේ ඉන්න රිළවුන් ටික කොළඹ ප්‍රදේශයට අරගෙන එන්න. අපිත් සතුන්ට ආදරෙයි. නමුත්, සතුන් නිසා සිදු වන ඒ විනාශයෙන් අපේ ජනතාවගේ ආර්ථිකය කඩා වැටෙනවා. ඒකත් අපි මතක තියා ගන්න ඕනෑ.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.05]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් වැය ශීර්ෂ කිහිපයක් සාකච්ඡාවට ගන්නා මේ වෙලාවේ, මා විශේෂයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳව කරුණු ඉදිරිපත් කරනවා. හැම දාම කියනවා වාගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවියෙකුගේ පුතෙකු හැටියටයි මම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ.

අපි දන්නවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් ඉන්නේ වී වගා කරන ගොවීන් බව. අද වී කිලෝවක් නිෂ්පාදනය කරන්න විශාල පිරිවැයක් යනවා. මම මීට පෙරත් මේ ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා. දැන් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. අද උදේ ඉඳලා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ විධියට ජනවාරි මාසයේ ඉඳලා එකතු වන VAT එක නිසා වගාව සඳහා තවත් විශාල පිරිවැයක් දරන්න සිදු වෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ කියන්නේ, වී වගාවට සහ බඩ ඉරිඟු වගාවට අදාළ නිෂ්පාදන කාර්යය සඳහා විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා. හැබැයි, අප හැම වෙලාවේම කියනවා වාගේ ගොවියා ගොවිතැනෙන් ඉවත් වෙන්න එක කාරණාවක් තමයි, තමා නිෂ්පාදනය කරන පිරිවැයට සරිලන සාධාරණ මිලක් නොලැබීම. ඒ නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් විශාල වශයෙන් වී වගාවෙන් ඉවත් වෙලා තිබෙනවා. මොකක්ද හේතුව? වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 110ක, 120ක විතර පිරිවැයක් යනවා. හැබැයි, කන්නය අවසානයේ -වී වගාව අවසන් වුණාට පස්සේ- අස්වැන්න මිල දී ගන්නේ වී කිලෝවක් රුපියල් 120ක් වාගේ පොඩි මුදලකට. මේක ඉතා බරපතළ කාරණාවක්.

ගරු සභාපතිතුමනි, අස්වැන්න සඳහා නිසි මිලක් ලැබෙනවා නම් ගොවියෝ උද්ඝෝෂණ කරන්නේ නැහැ; පාරට බහින්නේ නැහැ. අපි ඒ බව දන්නවා. හැබැයි, පවතින ඕනෑම ආණ්ඩුවක වගකීමක් තමයි, ගොවියා ආරක්ෂා කර ගැනීම. මොකද, මේ රටේ මිලියන 22ක් වූ ජනතාවට ජීවත් වෙන්න වී ගොවියා තමයි බත සපයන්නේ. අප හැම වෙලාවේම කථා කරන කාරණාවක් තමයි, ආහාර සුරක්ෂිතතාව. ආහාර සුරක්ෂිතතාව ඇති කරන්න නම්, ගොවියා ශක්තිමත් වෙන්න ඕනෑ. ගොවියා ශක්තිමත් වුණොත් විතරයි අප බලාපොරොත්තු වන ආහාර සුරක්ෂිතතාව කරා යන්න අපට පුළුවන්කම ලැබෙන්නේ.

මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන්න කැමතියි, ගරු ඇමතිතුමනි. අදත් අප කථා කරලා බැලුවාම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ 17,000කට පමණයි පොහොර සහනාධාරය ලැබිලා තිබෙන්නේ. හැබැයි, තවත් ගොවීන් 30,000කට විතර එම සහනාධාරය ලබා දිය යුතුව තිබෙනවා. මුළු ලංකාවේම පොහොර සහනාධාරය සඳහා මේ වන කොට මහා භාණ්ඩාගාරයෙන් - Treasury එකෙන් - ලැබිලා තිබෙන්නේ රුපියල් මිලියන 1,800ක් පමණයි. හැබැයි, ගොවිජන සේවා මධ්‍යස්ථානවල තිබෙන dataවල ප්‍රශ්නයක් නිසා එම මුදල් ලැබී නැහැ කියනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ මැදිහත් වීම මත පුළුවන් තරම් ඉක්මනට ගොවීන්ට පොහොර සහනාධාරය ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශයක ජීවත් වන පුද්ගලයෙකු හැටියට මම ඔබතුමාට යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා ඉතා දක්ෂ අමාත්‍යවරයෙක්. ඒ ගැන අපට කිසිම විවාදයක් නැහැ. මොකද, අපි දන්නවා, ඔබතුමා හැමදාම ජනතාව සමඟ හිටගත් නායකයෙක් බව. කුමන අමාත්‍යාංශය දැරුවත් ඔබතුමා ඉතා ගෞරව පූර්වක ලෙස ඒ අමාත්‍යාංශයේ කටයුතු කළා.

මගේ පළමුවැනි යෝජනාව තමයි ගරු ඇමතිතුමනි, කෘෂිකර්ම ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය කියන එක. මේක ඉතාම වැදගත්. ඒකට හේතුව මා කියන්නම්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තිබෙනවා, ගොවිජන සංවර්ධන

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

දෙපාර්තමේන්තුව තිබෙනවා, ඒ වාගේම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තිබෙනවා. එම ආයතන තුනෙන්ම ක්‍රියාත්මක වන්නේ එක එක විධියේ වැඩසටහන්. එම නිසා මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි. මේ අමාත්‍ය ධුරයේ සිටින කාලය තුළ ඔබතුමා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්න. එහෙම කළොත්, මේ රටේ ජනතාව ඔබතුමා ගැන හැමදාම කථා කරයි, ගොවීන් වෙනුවෙන් ඔබතුමා කෘෂිකර්ම ජාතික ප්‍රතිපත්තිය නිර්මාණය කළා කියලා.

ඊළඟ යෝජනාව තමයි ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් වැඩි අස්වැන්නක් නෙළා ගන්න ඉතා හොඳ බීජ ප්‍රභේද ටිකක් මේ රටට -ලංකාවට- හඳුන්වා දිය යුතුය කියන එක. මෙය අපි පාර්ලිමේන්තුවේදී හැම වෙලාවේම වාගේ කරන ඉල්ලීමක්. ලෝකයේ කෘෂිකාර්මික රටවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වියට්නාමය ගත්තොත්, ඒ රටේ ඉතාම හොඳ බීජ ප්‍රභේද තිබෙනවා. හැබැයි අපේ රටේ ප්‍රශ්නය, ගොවියා කොච්චර මහන්සි වුණත්, කොච්චර පොහොර යෙදුවත් නිෂ්පාදනය වැඩි නොවීම. ඒකට හේතුව තමයි, බීජවල ගුණාත්මකභාවය අඩුකම. අනෙක් ප්‍රශ්නය තමයි, බීජවලට තිබෙන ඉහළ මිල. මම මේ කාරණය ගැනත් හැමදාම වාගේ කියනවා. අම්පාර දිස්ත්‍රික්කයේ ගරු වීරසිංහ මන්ත්‍රීතුමාත් මේ ගැන කියනවා, මම දැක්කා. හිතුණු හිතුණු ගණන්වලට තමයි බීජ අළෙවි කරන්නේ, ගරු ඇමතිතුමනි. බීජ විකුණන කඩවල් එක එක මිල ගණන්වලට තමයි බීජ අළෙවි කරන්නේ. එම නිසා අධික බීජ මිල ගොවීන්ට බරපතළ ප්‍රශ්නයක්.

තවත් විශේෂ කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. කෘෂිකර්ම අමාත්‍යාංශය, ඒ වාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විශාල වශයෙන් පරීක්ෂණ සිදු කරනවා. Agriculture විෂය සම්බන්ධ මහාචාර්යවරු, ආචාර්යවරු විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා. හැබැයි ගරු ඇමතිතුමනි, ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ඒ කරන පර්යේෂණ මහ ජනතාව අතරට - ගොවීන් අතරට - යන්නේ නැතිකම. මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. මේ ක්ෂේත්‍රයේ කරන පර්යේෂණ පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම ඉතාම වැදගත් කියලායි මා හිතන්නේ. එම නිසා ඒ පිළිබඳව ඉතා හොඳින් සොයා බලන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

අපි හැම වෙලාවේම තාක්ෂණය පිළිබඳව කියනවා. මම දන්නවා, ඔබතුමා මේ වන කොට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා tunnel system එක - tunnels ඇතුළේ වගා කරන ක්‍රමය - ක්‍රියාත්මක කරන බව. ඒ සඳහා ආණ්ඩුවෙන් ලක්ෂ 5ක් ලබා දෙනවා; ගොවීන් ලක්ෂ 5ක් වැය කරනවා. ගරු ඇමතිතුමනි, ලක්ෂ 5ක් වැය කරන්න බැරි සමහර ගොවියෝ ඉන්නවා. හැබැයි ඔවුන් ඉතා දක්ෂ ගොවියෝ. මේ ක්‍රමය ඉතා වැදගත්. එක දිස්ත්‍රික්කයක තරුණයන් 100ක් හොයාගෙන එක අවුරුද්දකට tunnels 100ක් හදන්න අපිට පුළුවන් නම් අපි ඒකෙන් විශාල ජයග්‍රහණයක් ලබන්න පුළුවන්. මම දන්නවා, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රදේශයේ විශාල වශයෙන් මාළු මිරිස් වගා කරන බව. අද මාළු මිරිස් කිලෝවක් රුපියල් 1,000යි. අද මාළු මිරිස් අපනයනය කරනවා. ඉතුරු වෙන ටික කීල්ස් සුපර්මාර්කට් එකට ගන්නවා, නැත්නම් කාර්ගිල්ස් ෆුඩ් සිටි එකට දානවා. ඒ නිසා මේ tunnels ඇතුළේ හදන හැම එකකටම - තක්කාලි වෙන්න පුළුවන්, කරවිල වෙන්න පුළුවන්, මාළු මිරිස් වෙන්න පුළුවන් - විශාල ඉල්ලුමක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේක ඉතා හොඳ තාක්ෂණයක්.

අනෙක් කාරණය මෙයයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා දැන් මේ කටයුත්ත ආරම්භ කර තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මා අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු ඇමතිතුමනි, දැන් ලෝකයේ විශාල වශයෙන් drone system එකෙන් කෘෂි රසායනික ද්‍රව්‍ය, තෙල් ඉසින්න පටන් ගෙන තිබෙනවා. මම හිතන විධියට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව තමයි මේක ආරම්භ කර තිබෙන්නේ. මේ ක්‍රමය යාවත්කාලීන කරලා, ගොවි ජනතාව අතරට ගෙනියන්න පුළුවන් නම් ඒක අපි ලබන ලොකු ජයග්‍රහණයක් කියලා මම හිතනවා.

ගරු ඇමතිතුමනි, අපේ නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා කිව්වා වාගේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට තිබෙන ප්‍රශ්න ගැන මමත් කියන්න ඕනෑ. මොකද, ඔවුන් විශාල රාජකාරියක් කරන බව අපි දන්නවා. ගරු ඇමතිතුමනි, අද අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම එක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙක්, සහකාරවරියක් ග්‍රාම නිලධාරි වසම් දෙකක් හෝ තුනක් ආවරණය කරනවා. හැබැයි ලෝකයේ අඩුම ගමන් වියදම ගෙවන්නේ ඔවුන්ට. ඒක රුපියල් 400ක් වාගේ සුළු මුදලක්. ඔවුන්ගේ කාර්යාල දීමනාව මාසයකට රුපියල් 500යි, රුපියල් 750යි. අනුරාධපුරය නගරය වාගේ තැනක රුපියල් 5,000කට, රුපියල් 6,000කට එක කාමරයක් ගන්න බැහැ. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ කාරණාව ගැන අවධානය යොමු කරන්න කියලා. මොකද, ඔවුන්ට විශාල ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඔවුන්ගේ බඳවා ගැනීමේ පටිපාටිය ගත්තාම, දෙපාර්තමේන්තුව විසින් ඒ පටිපාටිය නිර්මාණය කරලා තිබුණත්, අද වෙනකොට ඒ පටිපාටියෙන් බැහැර වෙලා තමයි ඒ බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳවත් සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අනෙක් කාරණාව මෙයයි, ගරු ඇමතිතුමනි. මේ වෙනකොට දත්ත සපයන්නේ WhatsApp මඟින්. හැබැයි WhatsApp සඳහා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකු දාගන්න data package එක රුපියල් 990ක් වෙනවා. ඔවුන් ඒ රුපියල් 990 දාගෙන මාසයකට ඉල්ලන දත්ත ටික දැම්මාම ඔවුන්ගේ ඒ package එක ඉවරයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන් වෙනවා.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ඉතාම සාර්ථක ක්‍රමයක් තමයි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් කුඹුරු මැනීම් කටයුතු කරපු එක. හැබැයි තවම ඔවුන්ගේ දීමනාව දීලා නැහැ, ගරු ඇමතිතුමනි. ඒ පිළිබඳවත් සඳහන් කරමින්, මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණාවත් මතක් කරන්න කැමැතියි. ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. ඒක

තමයි, කෘෂි නවීකරණ සේවය සම්බන්ධයෙන් වන යෝජනාව. මේක ඉතා වැදගත්. හැබැයි තිබෙන ප්‍රශ්නය මෙයයි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ DO මහත්වරු සිටිද්දි, සහකාර කොමසාරිස්වරු සිටිද්දි මේ කටයුත්ත සහකාර ප්‍රාදේශීය ලේකම්වරයකු යටතට ගියොත් මොකද වෙන්නේ? සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ට විශාල කාර්යභාරයක් තිබෙනවා. මේ වැඩේ හොඳයි. හැබැයි සහකාර ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ ලේකම්වරියක් යටතේ ක්‍රියාත්මක කරන්න ගියොත් අපට මේක ඉස්සරහට ක්‍රියාත්මක කරන්න බැරි වෙයි. මේ වැඩේ ඉතා වැදගත්. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත කරනවා නම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහාම ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, ඔබතුමාට මේ අමාත්‍යාංශය කරගෙන යැම සඳහා සුබ පතමින් මා නිහඬ වෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු සභාපතිතුමනි, කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාත්, තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුත් කියපු නිසා ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිළිබඳව මම කියන්න කැමැතියි. ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මේ වනවිටත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ඊට අමතරව ජනාධිපතිතුමා එය මහාචාර්ය ගාමිණී සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හදපු වෙනම කමිටුවකටත් යොමු කර තිබෙනවා. ඒ කමිටුව මේ වෙලාවේ එය සමාලෝචනය කරනවා. ඒ කටයුත්ත අවසන් වුණාම ඉතා කඩිනමින් එය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඔබතුමන්ලාගේ අදහසුත් අරගෙන, තව සංශෝධන තිබෙනවා නම් ඒවාත් ක්‍රියාත්මක කරලා වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මේ රටට ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.17]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු සභාපතිතුමනි, මේ රටට ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක් පිළිබඳව කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ අදහස් දක්වන්නට මට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ප්‍රදේශයේ අමාත්‍යවරයකු වන ගරු මහින්ද අමරවීර මැතිතුමාට කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට රටේ ජනතාව වෙනුවෙන් ඒ භාරදූර කර්තව්‍යය සාර්ථකව ඉදිරියට කරගෙන යන්න හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මුලින්ම මගේ සුබ පැතුම් එතුමාට පිරිනමනවා. නමුත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ, ගිය වසරේ අය වැය විවාදය වෙලාවේ, මේ අමාත්‍යාංශයේ විවාදයේ දීම මම ඔබතුමාගේ අවධානයට ලක් කළ කාරණයක් පිළිබඳව. පසුගිය කාල සීමාවේ අපේ රට ආර්ථිකමය වශයෙන් ඉතාම අසීරු තැනකට පත් වෙලා තිබුණු අවස්ථාවේ, රටේ ගොවි ජනතාවට හුස්මක් ගන්න බැරිව ඉතාම නරක තැනකට පත් වෙලා සිටි වෙලාවේ, ඒ අයගේ ගොවි බිම් වේළෙන වෙලාවේ ඒකට සහනයක් විධියට ආණ්ඩුව එක එක විකල්ප ගෙනාවා. ඔබතුමන්ලා ඒ දවස්වල ප්‍රවර්ධනය කරපු විධියට, මේ ලෝකයේ තිබුණු හොඳම කොම්පෝස්ට් පොහොර එක අපි තමයි නිෂ්පාදනය කරන්නේ. අපි දැක්කා, එක එක මන්ත්‍රීවරු දාලා, පසුපෙළ මන්ත්‍රීවරු දාලා, බෝම්බ ගැහුවා වාගේ එළදාව හැදෙනවා කියන මතය සමාජගත කළ ආකාරය. කොම්පෝස්ට් පොහොර භාවිතය හොඳයි. හැබැයි, ඒ වෙලාවේ කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් වුණේ මොකක්ද කියන එක හොයා බැලුවොත්, අපේ රටේ කෘෂි ආර්ථිකය සම්පූර්ණයෙන් විනාශ වෙලා ගිහින් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ වාගේ නරක තැනකට කෘෂි කර්මාන්තය පත් වෙලා තිබුණු වෙලාවේ, ජනතාව පීඩාවට පත් වෙලා සිටි වෙලාවේ, ඒ ලැබුණු අවස්ථාව ව්‍යාපාරිකයෝ තමන්ගේ වාණිජ අරමුණු වෙනුවෙන් යොදා ගත්තා. අපේ දේශපාලනඥයන්ටත් එයින් වාසි සහගත තත්ත්වයන් ඇති වුණා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ගිය සැරේ ඇහුවා, අර පොහොර නැව ගැන. මම දැක්කා, අදත් පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුම ඒ ගැන මතු කරලා ඔබතුමා උත්තරයකුත් දුන්නා. මොකද, ඒක අත හරින්නට පුළුවන් දෙයක් නෙවෙයි. ඩොලර් මිලියන 6.9ක් කියන්නේ විශාල මුදලක්. ඔබතුමා ගියවර අය වැය විවාදයේ අවසාන කථාව වෙලාවේ කිව්වා, ඒ සම්බන්ධව අවශ්‍ය සියලු තොරතුරු හොයලා ඒ වෙනකොට නීත්‍යනුකූල පියවර ගන්න නියමිතයි කියලා. ඔබතුමා කියපු ආකාරයෙන්ම කියනවා නම්, "වැරදිකාරයෝ කවුරු වුණත් මට කමක් නැහැ, මොන බලයක් තිබෙන කෙනෙක් හිටියත් කමක් නැහැ, අවශ්‍ය පියවර ගන්න කටයුතු කරනවා" කියලා කිව්වා. හැබැයි, අද වෙනකොට අවුරුද්දක් ගත වෙලා ඔබතුමා කියනවා, මේක නැවත COPE එකට එනවා නම් හොඳයි කියලා. COPE එක කියන්නේ මේ පාර්ලිමේන්තුවේ තිබෙන ඉතාම වැදගත් කමිටුවක්. මාත් එහි සාමාජිකයෙක්. ඒක හරහා යන එක හොඳයි. නමුත්, අද COPE එකට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවා නේ. කෘෂිකර්ම ඇමතිවරයා විධියට මහින්ද අමරවීර මැතිතුමාටත් ඒකේ ඇත්ත තත්ත්වය සොයා ගන්න වුවමනාව තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. අනෙක් රාජ්‍ය අමාත්‍යතුමන්ලා ගැන මම දන්නේ නැහැ, මහින්ද අමරවීර අමාත්‍යතුමා මේක සොයන්න උනන්දු වෙනවා කියලා මම දන්නවා.

ගරු ඇමතිතුමනි, අපි පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - විධියට, මේ රටේ නීති හදන තැන විධියට ලජ්ජා විය යුතුයි. මොකද, මේ හොරකම කළේ පිට ඉන්න මිනිහෙක් නොවෙයි නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේකට වග කියන්න ඕනෑ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එතකොට මේක කළේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන එක හොයා ගන්න අවුරුද්දක් යනකම් කෘෂිකර්ම අමාත්‍යාංශයට බැරි වුණා නම්, ඒකට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්න බැරි වුණා නම්, නීතිපතිතුමාගේ අවධානයට යොමු කරලා ඒකට උත්තරයක් සොයා ගන්න බැරි වුණා නම්, මේ රටේ අනෙක් හොරු අල්ලන්නේ කොහොමද කියන්නකෝ. මේ රටේ ජනතාවට වෙච්ච හානි වෙනුවෙන්, එම වූදිතයන් අධිකරණය හමුවට ගෙනැල්ලා සාධාරණය ඉෂ්ට කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, මේ වෙලාවේ නම

[ගරු හේෂා විතානගේ මහතා]

වැදගත් වෙන්නේ නැහැ. මේ වෙලාවේ වාසගම වැදගත් වෙන්නේ නැහැ. මේ සියලුදෙනාම අද රටේ ජනතාව බිම දාලා පාගලා ඉවරයි, ඒ වීරත්වයන් ඔක්කෝම බිම දාලා පාගලා ඉවරයි. පැහැදිලිවම එතැන වංචාවක් තිබෙනවා කියලා ඔබතුමාත් පිළිගන්නවා ඇති කියලා මම හිතනවා. මේ වංචාව කළ, මේ මුදල් අවභාවිත කරපු පිරිස තව ටික දවසක් යනකොට ඒක අද මේ ගරු සභාවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ සිටින නිලධාරියකුගේ කරේ තියන්න පුළුවන්. ඒ රාජ්‍ය නිලධාරින්ව හිර කරලා ඒ ප්‍රශ්නයෙන් ගැලවෙන්න හදයි. සමහර විට තව ටික කාලයක් යනකොට මේ තිබෙන තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට හැරෙනකොට ඒක වෙයි. අපි මෙහෙමත් සිද්ධි දැක්කා නේ. ඔබතුමන්ලාගේ ඉස්සර හිටපු කැබිනට් ඇමතිවරයෙක් - මර්වින් සිල්වා ඇමතිවරයා - යම් පුද්ගලයෙකුව ගස් බැන්දා. මොකද වුණේ? අන්තිමට වුණේ ඒ පුද්ගලයාම තමන්ව ගස් බැඳ ගත්තා වාගේ වැඩක් නේ. ඒ නිසා මේ වංචාව කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක්ක එකතු වෙලා ඒ වංචාව කරපු පිරිස අධිකරණය හමුවට ගෙන යන්න කටයුතු කරන්න.

මේ දවස්වල වංචා, දූෂණ ගැන කථා කරනවා නේ. මම දැක්කා සජිත් ප්‍රේමදාස මැතිතුමාට චෝදනා කරනවා. එතුමාට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම්, ඒක අධිකරණයට අරගෙන යෑමේ වගකීමත් ආණ්ඩුවට තිබෙනවා. සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටට වංචාවක්, දූෂණයක් කරලා තිබෙනවා නම්, මේ රටේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අවභාවිත කළා කියන චෝදනාව අධිකරණයෙන් ඔප්පු වෙනවා නම්, එතුමාත් ඒකට මුහුණ දෙන්න සූදානම්. හැබැයි, මේවා එළිපිට - ඇස් පනාපිට - වෙච්ච හොරකම්. ඔබතුමාත්, මමත් දිස්ත්‍රික්ක දෙකක වුණාට, ඔබතුමාත් දන්නවා, ගොවි ජනතාව විඳින දුක. වී කිලෝවක මිල ගැන සමහරු කිව්වාම මම සතුටු වුණා. යල කන්නයට අදාළ වන මාස මොනවාද, යල කන්නය ආරම්භ කරන මාසය මොකක්ද, මහ කන්නය මොකක්ද කියලා දන්නා ඇමතිවරයෙක් අපට ඉන්නවා. මට මතකයි, කුඹුර හාන්නේ මොන කාලයටද, මඩ පොහොර ගහන්නේ මොන කාලයටද කියලා මීට ඉස්සෙල්ලා හිටපු කෘෂිකර්ම ඇමතිතුමෙකුගෙන් විවාදයකදී ප්‍රශ්නයක් ඇහුවාම, එතුමා ඒ ගැන කියන්න දැනගෙන හිටියේ නැහැ කියන එක. එතුමා හිතාගෙන හිටියේ, මඩ පොහොර ගහන්නේ බණ්ඩි පොහොර ගහන අවස්ථාවේදී කියලා. එහෙම කෘෂිකර්ම ඇමතිවරු තමයි අපේ රටේ කෘෂිකර්මය නංවන්න හිටියේ. ඒ වාගේ දේවල් අපි ඉතිහාසයේදී දැක්කා. ඉතින්, පරීක්ෂණ කළාද, ඇමතිවරු සතුටු කළාද දන්නේ නැහැ. සීනි සම්බන්ධයෙන් ඇමතිවරයෙක් හිටියා. පොල් සම්බන්ධයෙන් ඇමතිවරයෙක් හිටියා. පොහොර සම්බන්ධයෙන් මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමා පත් කරලා තිබුණා. මහින්ද අමරවීර ඇමතිතුමාට මේ විෂයය ගැන අලුතෙන් කියන්න ඕනෑ නැහැ. ඔබතුමා ගොවි පරපුරකින් පැවත එන, ගොවි පරම්පරාව පිළිබඳව අවබෝධයක් තිබෙන ඇමතිවරයෙක්.

ගරු සභාපතිතුමනි, මේ ඔක්කෝම සෙල්ලම්. බිත්තර සම්බන්ධයෙනුත් ඇමතිවරයෙක් හිටියා. එතුමාට කිව්වේ, පශු සම්පත් සංවර්ධන ඇමති කියලා. මොකක්ද අන්තිමට වුණේ? බිත්තර සම්බන්ධයෙන් ඇමතිතුමෙක් පත් කර ඉන්නවා, හැබැයි බිත්තර ටික රටින් ගේනවා. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව - STC එක - හරහා ඔබතුමාත් වී කිලෝ මෙට්‍රික් ටොන් 50,000ක් -මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් ගේන එකෙන් 50,000ක්- ගේන්න මිල ගණන් කැඳවලා කියලා මට තොරතුරක් ලැබුණා. මම කියන කාරණය හරි නේද ඇමතිතුමනි? ඔබතුමාගේ අවසරය ඇතුව නේ ඒවා ගේන්නේ. එතකොට වී ටිකත් රටින් ගේනවා නම්, බිත්තර ටිකත් රටින් ගේනවා නම්, ඉරිඟු ටිකත් රටින් ගේනවා නම් කෘෂි කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද? පොල් සම්බන්ධයෙනුත් ඇමතිවරු ඉන්නවා, සීනි සම්බන්ධයෙනුත් ඇමතිවරු ඉන්නවා. සීනිත් රටින් ගේනවා නම්, මොකක්ද අපේ රටේ කෘෂි කර්මාන්තයට වෙලා තිබෙන්නේ? තට්ටු මාරු ක්‍රමයට ඇමතිවරු ටිකක් පෝෂණය වෙලා තිබෙනවා. තට්ටු මාරු ක්‍රමයට ආපු ඒ ඇමතිවරු ටික විළි ලජ්ජා නැතිකමත් එක්ක සුද්ද සිංහලෙන්ම කියනවා නම් ගණනක් හොයාගෙන තිබෙනවා. හැබැයි, රටේ කෘෂි කර්මාන්තය එක අඟලක්වත් ඉස්සරහට ගිහිල්ලා නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, ගොවි පරපුර ගැන ඔබතුමාත් දන්නවා. ඔබතුමා දන්නවා, වලව කලාපයේ ගොවීන් කොච්චර දුක් විඳිනවාද කියලා. ඔබතුමා ඒවා ඇස් දෙකෙන් දකින කෙනෙක්. අහිංසක ගොවීන් වෙනුවෙන් පියවරක් තබන්න මන්ත්‍රීවරයෙක් හොඳ යෝජනාවක් ගෙනාවා. එක එක කාලයට එන ජනාධිපතිවරුන්ට, අගමැතිවරුන්ට අවශ්‍ය විධියට වෙනස් නොවන කෘෂිකර්මයට ජාතික ප්‍රතිපත්තියක් හදන්න පුළුවන් නම්, මහින්ද අමරවීර මහත්තයාත් මේ රටේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල දෙයක් කළා වෙනවා. ගරු ඇමතිතුමනි, එහෙම නොකළොත් මේ වෙලාවේ කෘෂි කර්මාන්තය ගොඩ දමන්න ඔබතුමාට බැහැ. මේකේ ඉන්න හොරු ටික අල්ලන්න ඕනෑ. ලබන අවුරුද්දේ පාර්ලිමේන්තුව විසුරුවන්නේ නැතුව - විසුරුවනවා නම් අපි කැමැතියි- තිබිලා, ඔබතුමා මේ ඇමති ධුරය දැරුවත් මම කැට තියලා කියනවා, මේ සිද්ධියට සම්බන්ධ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දෙන්නාගෙන් අඩුම ගානේ කටඋත්තරයක්වත් ගන්නේ නැතිව, මේ පොහොර වංචාව පිළිබඳව අබමල් රේණුවකවත් චෝදනාවකට ලක් නොවන විධියට ආරක්ෂා කරන්න හිරිකිතයක් නැතුව මේ ආණ්ඩුව කටයුතු කරනවා කියලා. ගොවි ජනතාවගේ හදවතේ රිද්මය දන්නා ඇමතිවරයෙකු විධියට මේ රටේ ගොවියා ආරක්ෂා කරන්න ඔබතුමාට හයියක් ලැබේවා කියමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගෙන් කරුණු පැහැදිලි කරගැනීමකට මට තත්පර කිහිපයක් ලබා දෙන්න.

කෘෂිකර්ම ඇමතිතුමා විශාල උත්සාහයක් දරනවා, කෘෂිකර්ම ව්‍යාපාරය අලුතෙන් ගොඩ නඟලා ගොවිතැන් කරන ජනතාවට ලොකු ශක්තියක් දෙන්න. විශේෂයෙන්ම ගොවිතැනට ලොකු

ශක්තියක් බිම් මට්ටමෙන් ලබා දෙන්නේ, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්. ඒ නිලධාරින්ගේ ගමන් වියදම වශයෙන් තවමත් තිබෙන්නේ, එක්දහස් අටසිය ගණන්වල ගෙවපු රුපියල් 400මයි. අද සියලු දේවල්වල මිල වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අයගේ ගමන් වියදම වැඩි කරන්න ඔබතුමා පියවරක් ගන්නවාද කියන කාරණාව මම දැනගන්න කැමැතියි. ඔවුන් දිගින් දිගටම මැනුම් කටයුතු කළා. ඒ සඳහා ඔවුන්ට දීමනාවක් ගෙවනවා කිව්වා. නමුත්, තවමත් ඒක ගෙවා නැහැ. මේ සඳහා සාධාරණයක් ඉෂ්ට කරනවාද කියලාත් ගරු ඇමතිතුමාගෙන් දැනගන්න මා කැමැතියි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු සභාපතිතුමනි, මීට පෙරත් මේ ප්‍රශ්නය මතු වුණා. ඒ අයගේ ගමන් වියදම් දීමනාව වශයෙන් තිබෙන්නේ, රුපියල් 400යි. ඒක ප්‍රමාණවත් නැහැ. ආර්ථික අපහසුතා මැද්දේ ලොකු ගණනක් ගෙවන්න බැරි වුණත්, එය රුපියල් 1,000 දක්වා වැඩි කරන්න කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අය මැනුම් කටයුතුවලට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් කරන ගෙවීම්වල ඉතිරි කොටස කඩිනමින් ගෙවන්න අපි කටයුතු කරනවා. දැනට සියයට 60ක් විතර ගෙවලා අවසන්. ඉතිරි මුදලත් කඩිනමින් ගෙවන්න අපි කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.26]

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law - State Minister of Agriculture)

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ රටේ සමාජමය සහ ආර්ථික වශයෙන් ලොකු වැදගත්කමක් තිබෙන ක්ෂේත්‍ර දෙකක් පිළිබඳව කථා කරන අවස්ථාවේ, මේ සම්බන්ධයෙන් විවිධ විවේචනත් එල්ල වුණා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අපි දන්නවා, රටක් හැටියට අතීතයේ ඉඳලාම අපේ ප්‍රධාන ජීවනෝපාය වුණේ කෘෂි කර්මාන්තය බව. අපේ රටේ ජනතාවගෙන් සියයට 70ක් විතර සෘජුව හෝ වක්‍රව කෘෂි කර්මාන්තයෙන් යැපෙනවා. නමුත්, මෙතැන සමහර අය යම් යම් අදහස් ඉදිරිපත් කළා, කෘෂි කර්මාන්තයෙන් අපේ ජනතාව ඈත් වෙගෙන යනවා කියලා. නමුත්, එය ඇත්තක් නොවෙයි. ගරු සභාපතිතුමනි, 2016 ඉඳලා 2019 දක්වා ඒකේ යම් අඩුවක් වෙලා තිබෙනවා. හැබැයි, 2019 ඉඳලා 2021 වෙනකොට ඒ තත්ත්වය නැවතත් වැඩි වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට 2022 අවුරුද්දේ සමස්ත රැකියා නියුක්තිය 8,147,736ක් වෙනකොට ඒකෙන් කෘෂි කර්මාන්තයේ නියැළී තිබෙනවා, 2,158,559ක්. ඒ කියන්නේ සියයට 26.5ක්. ඒක කර්මාන්ත හා සේවා අංශයේ සේවා නියුක්තියට වඩා වැඩියි කියලා තමයි මහ බැංකු වාර්තාවලින් කියන්නේ. ඒ නිසා කවුරු හරි කියනවා නම්, විවිධ හේතු නිසා කෘෂි කර්මාන්තයෙන් මේ රටේ ජනතාව වේගයෙන් ඈත් වෙනවා කියලා, ඒක අසත්‍යයක් කියන කාරණය මම කියන්න ඕනෑ.

අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේම අපි බොහොම අභියෝගාත්මක කාලයකටයි මුහුණ දුන්නේ, දැන් ඒ අභියෝගාත්මක කාලය අවසන් වෙගෙන යනවා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, අද කෘෂිකර්ම අමාත්‍යාංශය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ඒකාබද්ධ කරලා මහින්ද අමරවීර මැතිතුමා එහි නායකයා හැටියට පත් කිරීම සම්බන්ධයෙන්. එහෙම කළාම එහි වාසි ගණනාවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා, වැවිලි ක්ෂේත්‍රයටත්, කෘෂි ක්ෂේත්‍රයටත් පොහොර වාගේ දේවල් අත්‍යවශ්‍යයි කියන කාරණය. එහෙම වෙනකොට ජාතික පොහොර ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සලය වාගේ ආයතන එකම අමාත්‍යාංශයක් යටතට වැටෙනවා. එතකොට අපි දන්නවා, මේ පොහොර බෙදා හැරීම් කටයුතු, ඒ වාගේම පසු අස්වනු හානි අවම කිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතයේදී, පර්යේෂණ සිදු කිරීමේදී මේ සියලු ක්ෂේත්‍ර අලළා අපට ඒ වැඩ කටයුතු කරන්න පුළුවන් බව. ඒ සම්බන්ධව මේ ගරු සභාවේ තව අදහස් ගණනාවක් මතු වුණා.

විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරු ගණනාවක් ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් ගැන කථා කළා. අපේ ගරු ඇමතිතුමාත් කිව්ව ආකාරයට, මේ වෙනකොට තේමා 10ක් යටතේ ඉලක්ක 13ක් සපුරා ගැනීම සඳහා "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය" සකස් කරලා තිබෙනවා. 2023.09.30 දින වන විට ගරු ඇමතිතුමා විසින් එය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා දැන් එය කෘෂි නවීකරණ කමිටුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. කෘෂි නවීකරණ කමිටුවේ නිර්දේශ ලැබුණු පසු අපි එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගන්න කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලය අපට අමාරු කාලයක් වුණා. ඒ අමාරු කාලයේ වුණත්, අපි විවිධ රටවල ආධාර අරගෙන මේ රටේ ජනතාවට යම් යම් සහන ලබා දුන්නා. විශේෂයෙන්ම අපට මහජන චීන සමූහාණ්ඩුවෙන් ඩීසල් ලීටර් 6,840,000ක් හම්බ වුණා. ඒක 2022/2023 යල සහ මහ කන්නවල කෘෂි කාර්මික කටයුතු සඳහා අපි ඒ ඩීසල් අපේ ගොවි ජනතාවට නොමිලේ ලබා දුන්නා. ආහාර සුරක්ෂිතතාව පිළිබඳවත් ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙකු කථා කළා. කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන්වලට රුපියල් මිලියන 900ක මුදලක් වෙන් කරලා ඒ ඔස්සේ විවිධ වැඩසටහන් අපි ක්‍රියාත්මක කළා. විශේෂයෙන්ම අපි ආහාර සුරක්ෂිතතාව ඇති කරන්න ප්‍රධාන භෝග වන වී, මිරිස්, අර්තාපල්, ලොකු ලූනු, රතු ලූනු, මුංඇට, රටකජු, කව්පි, බඩඉරිඟු, තල, උඳු, කුරක්කන්, සෝයා වාගේ භෝග වගා කරන්න ඉලක්ක දීලා ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, තව කියනවා නම්, අපි ක්ෂේත්‍ර 14ක් හඳුනාගෙන අපේ රටේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන විධියට ව්‍යාපෘති 120ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම විශේෂිත භෝගවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම, උසස් තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම, කෘෂිපාදක කර්මාන්ත ප්‍රවර්ධනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය වැනි අංග 14ක් යටතේ අපි කටයුතු කරලා තිබෙනවා. මම දිගින් දිගට ඒවා ගැන කථා කරන්න යන්නේ නැහැ, මගේ කථාව සභාගත කරන්න කල්පනා කරන නිසා. විශේෂයෙන්ම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනකොට අපට මතකයි, ජනාධිපතිතුමා පසුගිය අය වැය කථාවේදී ඉදිරිපත් කළා, කෘෂි කර්මාන්තය තුළ තරුණයන් රඳවා ගැනීමට යම් වැඩ පිළිවෙළක් හදන බව.

[ගරු නිතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

ඒ සඳහා මුදල් වෙන් කළා. අපේ ගරු ඇමතිතුමා, ගරු ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාව ප්‍රායෝගික තත්ත්වයට ගෙනාවා, ගරු සභාපතිතුමනි. ඒ සම්බන්ධයෙන් අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි මේ වනවිට දිස්ත්‍රික්ක හතරක නියමු ව්‍යාපෘති 22ක් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරනවා. ඊළඟට, තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන හැටියට තෝරා ගත්ත ඒ ගම්මාන අපේ රටේ දේශීය වෙළෙඳ පොළත් එක්ක ඒකාබද්ධ කරලා, අපේ කෘෂි කර්මාන්තයට තරුණයෝ යොමු කරලා, සෘජු ව්‍යවසායකයෝ බිහි කරන්න අපි අවශ්‍ය පියවර ගන්නවා. ඒ යටතේ හම්බන්තොට, ගාල්ල, වවුනියාව, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල මේ වෙනකොට ආදර්ශ ගම්මාන විශාල ප්‍රමාණයක් හඳුනාගෙන, අපි ඒවා ක්‍රියාත්මක කරගෙන යනවා. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය කියන ආයතනවලට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාත් මේ සභාවේ සිටින වෙලාවේ, ලේකම්තුමාත් රාජ්‍ය නිලධාරි මැදිරියේ සිටින වෙලාවේ, විශේෂයෙන්ම හදබිම අධිකාරියේ තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් එතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, හදබිම අධිකාරිය කියන්නේ අර්ධ රාජ්‍ය ආයතනයක්. මේ ආයතනය අර්ධ රාජ්‍ය තත්ත්වයෙන් තිබෙන නිසාම, හදබිම අධිකාරියේ සේවය කරන අයට වරප්‍රසාද කිහිපයක් ලැබිලා නැහැ. විශේෂයෙන්ම 2019 වර්ෂයේ ජූලි 01වැනි දා චක්‍රලේඛයෙන් ගෙවන්න කියපු අමතර විශේෂ මාසික දීමනා වන රුපියල් 2,500ක දීමනාව මේ අයට ලැබෙන්නේ නැහැ. අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා රාජ්‍ය නිලධාරි මැදිරියේ දැන් ඉන්නවා. මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ අයට එම විශේෂ දීමනාව ලබා දෙන්න කියලා. මොකද, හදබිම අධිකාරියේ සේවකයෝ කියන්නේ, මෙම ක්ෂේත්‍රයේ වැඩ කරද්දී විශාල සහයෝගයක් අපේ අමාත්‍යාංශයේ වැඩවලට ලබා දුන්නු කොට්ඨාසයක්. එම නිසා ඒ අයට ඒ දීමනාව ලබා දෙන්න. ඒ වාගේම, රජයේ සේවකයන්ට ලබා දෙන සංයුක්ත දීමනාව, රුපියල් 1,000, රුපියල් 800, රුපියල් 700 වුණාට මේ අයට ගෙවන්නේ ඒකෙන් අර්ධයයි. ඒ කියන්නේ, රුපියල් 1,000ක් ලැබිය යුතු නම්, ඔවුන්ට ලැබෙන්නේ රුපියල් 500යි. ඒකත් වෙනස් කරන්න ඕනෑ. මොකද, මේ අය ඉතා හොඳින් සේවය කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපි යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා, මේ ක්ෂේත්‍රයේ සිටින අයට පුළුවන් නම් මෝටර්සයිකලයක් ලබාදීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියලා. ඒක ලබා දුන්නා කියලා කිසිම හානියක් වෙන්නේ නැහැ. ඉතා විශාල වැඩ කොටසක් මේ උදවිය කරනවා කියන කාරණය අපි කියන්න ඕනෑ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලුදෙනා මේ අවස්ථාවේදී නිලධාරි මැදිරියේ සිටිනවා. අපි ඒ අයට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි. විවිධ බාධක හා අභියෝග මධ්‍යයේ තමයි මේ අය කටයුතු කරන්නේ. මෙහි විශාල සේවක අර්බුදයක් තිබෙන බව අපි දන්නවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ වනවිට කෘෂිකර්ම පර්යේෂණ, තාක්ෂණ ව්‍යාපෘති, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බීජ බෙදා හැරීම, නියාමන සේවා යන මේ අංශ අතින් විශාල වැඩ කොටසක් කරනවා. මේ අය කරන විශාල වැඩ කොටසක් අපට කියන්න පුළුවන්. නමුත්, මේ වෙලාව ඒවා කියන්න වෙලාව නොවෙයි. අපේ විපක්ෂ නායකතුමාත් කිව්වා, මේ සඳහා නවීන තාක්ෂණය යොදා ගන්න කියලා.

ගරු සභාපතිතුමනි, මේ වනවිට අපි වී අස්වැන්න වැඩි කරන්න පැරෂුට් තැටි හඳුන්වා දීලා, සියයට 75ක දායකත්වයක් ඒ වෙනුවෙන් ලබා දෙන්න රුපියල් මිලියන 328ක් දීලා තිබෙන බවත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. එවැනි වැඩසටහන් විශාල කොටසක් අපි කරගෙන යනවා. ඒ වාගේම, greenhouses ගැනත් කථා කළා. කෘෂිකර්ම අමාත්‍යාංශය මූලික වෙලා greenhouses 200ක් ඇති කරන්න කටයුතු කරලා තිබෙනවා. 2024 වර්ෂයේ අපි රුපියල් මිලියන 890ක් ඒ සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ විධියට අපට විශාල වැඩ කොටසක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා කරන්න පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙනවා.

අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ අපට තිබෙන එක ප්‍රශ්නයක් තමයි, සේවක ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, බීජ ගොවිපොළවල අපේ පුහුණු කම්කරුවෝ ඉන්නවා. මේ අය පුහුණු කම්කරුවන් වුණාට ඔවුන් තවම ස්ථිර කරලා නැහැ. මේ අය අනියම් පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත ඉන්නේ. මේ අයට ලැබෙන්නේ බොහොම සොච්චම් වැටුපක්. මට මතක විධියට රුපියල් 1,100ක්, රුපියල් 1,065ක් -කෙසේ හෝ රුපියල් 1,250ට වඩා අඩු මුදලක්- තමයි ඒ අයට දිනකට ලැබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ සේවකයන්ගේ නිරන්තර ඉල්ලීමක් තිබෙනවා, මේ මුදල වැඩි කර දෙන්න වාගේම මේ අයගේ සේවා සුරක්ෂිතභාවය ඇති කරන්නත් කියලා. මම එක වතාවක් බතලගොඩට ගිය වෙලාවේ සේවකයෝ ඇවිල්ලා ඒ අයගේ සේවා සුරක්ෂිතතාව ඇති කරන්න කියලා ඉල්ලා සිටි ආකාරය මට මතකයි. අපේ ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් මේ වනවිට ලේකම්තුමා එක්ක කථා කරලා වැඩ පිළිවෙළක් හදාගෙන යන බව අපි දන්නවා. අපේ රටේ ආර්ථික තත්ත්වය යහපත් වේගෙන එනකොට මේ සේවකයන්ගේ ඒ සේවා ගැටලු විසඳන්න අපට පුළුවන් වේවි.

ඊළඟට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව අපි කියන්න කැමැතියි. මේ ගරු සභාවේදී ඒ ගැන විවිධ විවේචන එල්ල වුණා. ගරු සභාපතිතුමනි, මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට 2023 අවුරුද්දේ අපි රුපියල් බිලියන 14.18ක් වෙන් කරලා, මේ වනවිට ඉන් සංවර්ධන ව්‍යාපෘතිවලට රුපියල් මිලියන 3,050ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මේකෙන් අපි විශාල වැඩ කොටසක් කරගෙන ගිහිල්ලා තිබෙනවා. දිස්ත්‍රික්ක 11ක අත්හැර දමපු වැව් 30ක් අපි ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. ඒ වාගේම, "Kickstart" වැඩසටහන යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ලෙස ව්‍යාපෘති 4,780ක් ක්‍රියාත්මක කරලා, මේ වෙනකොට ව්‍යාපෘති 308ක වැඩ අවසන් කරලා, ව්‍යාපෘති 170ක් අවසන් අදියරේ තිබෙනවා. ඒ වාගේම, මේ ගරු සභාවේ නිරන්තරයෙන්ම කථා කරපු ප්‍රශ්නයක් වන, ගංවතුරින් හානි වෙච්ච සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ යටතේ දිස්ත්‍රික්ක 17ක, ව්‍යාපෘති 160ක් ක්‍රියාත්මක කරලා, ඉන් ව්‍යාපෘති 60ක වැඩ අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම, පුරන් කුඹුරු අස්වැද්දීම යටතේ අක්කර 6,052ක වගා කිරීම ඉලක්ක වන අතර, යල කන්නයේදී අක්කර 616ක් සහ මහ කන්නයේදී අක්කර 186ක් වගා කරලා තිබෙනවා. ඒ වාගේම කුඩා වැව්, අමුණු ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යාපෘති 351ක් හඳුනාගෙන, අපි ඉන් ව්‍යාපෘති 113ක වැඩ අවසන් කරලා තිබෙනවා. එමෙන්ම කෘෂිමාර්ග, කෘෂි ළිං හා සුහුරු ගම්මාන වැඩසටහන යටතේ ගොවිපළ හඳුනාගෙන, ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ගොවීන් නවීන තාක්ෂණයට හුරු කරන්න මුළු දිවයිනම ආවරණය වන විධියට අක්කර 8,165ක් හිමි ගොවීන් සඳහා පැරෂුට් තැටි 3,163,347ක් අපි මේ වෙනකොට බෙදා දීලා තිබෙනවා. ඇත්තටම ඒ පැරෂුට් තැටි ලබාදීම සම්බන්ධයෙන් අපිට ගොවි මහත්වරුන් විශාල ප්‍රශංසාවක් පළ කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාටත්, රජයටත් අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඩිජිටල්කරණය යටතේ අපි "GeoGoviya" වැඩසටහන තුළින් ගොවීන් 1,403,309ක් හා කුඹුරු ඉඩම් කට්ටි 2,056,047ක් ලියා පදිංචි කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේදී කථා කළා වාගේම මේ සියලු වැඩ කිරීමේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉතාම අසීරුතා මධ්‍යයේ තමයි කටයුතු කරන්නේ. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට ගමන් වියදම් දීමනාව හැටියට ලැබෙන්නේ රුපියල් 400යි. ඒ දීමනාව රුපියල් 1,000 කරන්න ගරු ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඉදිරියේදී ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජය ඒ සඳහා අපට අවස්ථාව ලබා දෙයි කියලා.

ගරු සභාපතිතුමනි, අපිට මතකයි, 1970 ගණන්වල හදපු ගොවිජන සේවා මධ්‍යස්ථාන ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරු විසින් පුච්චලා දැම්මා. නැවත වතාවක් අපිම තමයි ඒවා හැදුවේ. හැබැයි, ඉතා අපහසුතා මධ්‍යයේ තමයි ඒ ගම්වලට සේවය සපයන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඒවායේ ඉන්නේ. ඇත්තටම ඒවායේ වැසිකිළි කැසිකිළි පහසුකමක්වත් නැහැ. අමාත්‍යාංශය හැටියට ඒ අයට වඩා හොඳ ගොඩනැඟිලි කිහිපයක් ලබා දෙන්න අපි නිරන්තර උත්සාහයක් දරනවා. නමුත්, රටේ තිබුණු ආර්ථික ප්‍රශ්න එක්ක අපිට ඒක කරන්න බැරි වුණා. නමුත්, අපි විශ්වාස කරනවා, ලබන අවුරුද්දේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කිහිපයකට හරි ඒ අවස්ථාව ලබා දෙන්න අපට හැකි වේවි කියලා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම දැන් මේ සභාවේදී ගරු මන්ත්‍රීවරු කිව්වා, මැනපු කුඹුරු ඉඩම් වෙනුවෙන් ඒ අයට තවම මුදල් ගෙවලා නැහැ කියලා. නමුත්, අපිට දැනගන්න තිබෙන ආකාරයට අපේ අමාත්‍යාංශයෙන් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, මේ වෙනකොට සියයට 70ක මුදලක් ගෙවලා තිබෙනවා. අපි ඉතිරි මුදලත් මේ අවුරුද්දේ දෙසැම්බර් 31වැනි දා වෙනකොට ගෙවන්න අවශ්‍ය කටයුතු කරනවා කියන කාරණය මේ ගරු සභාවේදී කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අද සත්ත්ව නිෂ්පාදන අංශය පිළිබඳව අපේ ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා කථා කළා. එතුමා විශාල වැඩ කොටසක් කරපු දේශපාලන නායකයෙක්. ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව එතුමා ඉතාම විශාල වැඩ කොටසක් තවමත් කරනවා. එතුමාට සහ එතුමා යටතේ තිබෙන සියලු ආයතනවල නිලධාරීන්ට අපේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු සභාපතිතුමනි, පොහොර පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළා. පොහොර පිළිබඳව කථා කරද්දී නිරන්තරයෙන්ම කථා කරපු කාරණයක් තමයි, චීනයෙන් ආනයනය කරපු පොහොර නැව පිළිබඳ කාරණය. ඒ පොහොර නැව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන බව අපි කවුරුත් දන්නවා. හැබැයි, මේ ගරු සභාවේදී මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීවරයෙක් පැහැදිලිව හිටපු කෘෂිකර්ම ඇමතිතුමාත්, රාජ්‍ය ඇමතිතුමාත් එල්ල කරලා කථා කළා. හැබැයි, ඒක සම්පූර්ණයෙන් වැරැදියි. අපි කියන්න ඕනෑ, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මිනිස්සුන්ට මඩ ගහන්න හොඳ නැහැ කියන එක. ඒ විගණන වාර්තාවේ කිසිම තැනක ලියවිලා නැහැ, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාවත්, ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාවත් ඒකට වග කියන්න ඕනෑ කියලා. ඒකේ කියලා තිබෙනවා, යම් යම් ක්‍රියා මාර්ග ගන්න කියලා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ අද වෙනකොට ලේකම්තුමා ඒ සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. අපි දන්නවා, ඒ ගැන විපක්ෂ නායකතුමාට බොහොම රිදුණේ, එතුමාගේ බිරිඳට ආරක්ෂකයෝ දහදෙනෙක් දුන්නා කියලා එදා ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ සභාවේදී කථාවක් කළාට පස්සේ කියලා. හැබැයි, ඒ කථාව එතුමා කළේ, ඒ අමාත්‍යාංශයෙන් දීපු අභ්‍යන්තර විගණන වාර්තා පදනම් කර ගෙනයි. ඒක ලිඛිත සාක්ෂියක්. ගරු සභාපතිතුමනි, ඒ ප්‍රකාශයෙන් අපහාසයක් වෙලා තිබෙනවා නම්, මෙතැන නිකම් පාළු ගෙයි වළං බිඳින්නේ නැතුව, අධිකරණයට යන්න එතුමාට පුළුවන්. දැන් එතුමා කියන විධියට කිසිම සුදුසුකමක් නැති අභ්‍යන්තර විගණකවරයෙක් නේ ඒ වාර්තාව හදලා තිබෙන්නේ. එතකොට ඒ අභ්‍යන්තර විගණකවරයාට විරුද්ධව විපක්ෂ නායකතුමාට අධිකරණයට ගිහිල්ලා නඩු පවරන්න පුළුවන්. "අබ කෑ මිනිහගේ මොළේ දනවා වාගේ" විපක්ෂ නායකතුමා අද ඒක හෝද-හෝදා මඩේ දැම්මා. ඒ නිසා පාළු ගෙයි වළං බිඳින්න ඕනෑ නැහැ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. චීන පොහොර නැව සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ අලාභය අය කර ගන්න අපි කටයුතු කරනවා. අපට දැන ගන්න ලැබී තිබෙන ආකාරයට, මේ වෙන කොටත් ගරු ඇමතිතුමා ඉල්ලීමක් කර තිබෙනවා, අඩුම ගානේ පොහොර ලබා දෙන්න බැරි නම් ඒ චීන සමාගමෙන් මේ රටට අවශ්‍ය කරන කෘෂි උපකරණ ලබා දෙන්න කියලා. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අපි මැදිහත්වීමක් කරනවා. ඒ නිසා ඒකෙන් අපේ රටට වෙච්ච පාඩුව අපිට පියවා ගන්න පුළුවන්.

පොහොර ලබා දීම සම්බන්ධව මේ ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලා කථා කළා. ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිවම කිවයුතු කාරණයක් තමයි මේ රටේ රසායනික පොහොර අවභාවිතාවක් සහ අධි භාවිතාවක් වුණා කියන එක. ඒ කාලයේ හඳුන්වා දුන් කාබනික පොහොර ප්‍රතිපත්තිය හේතුවෙන් අපේ කෘෂිකර්මාන්තයේ යම් ගැටලුවක් ඇති වුණා. ඒ ගැටලුව ගැන අද හැමෝම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එල්ල කරගෙන කථා කරනවා. ඒක වැරදියි. මම ඒ කාලයේ පොහොර පිළිබඳව කටයුතු කළ අමාත්‍යවරයා හැටියට යම් යම් කාරණා කිහිපයක් දන්නවා. එතුමාට යම් යම් උපදේශකවරු, මහචාර්යවරු, ජනමාධ්‍යවේදීන්, සමහර ආයතන මේ සම්බන්ධයෙන් විශාල වශයෙන් උපදෙස් දුන්නා. අපිත් දන්නවා සමහර අය කිව්වා, රසායනික පොහොර පාවිච්චිය නිසා වකුගඩු රෝග හැදෙනවා, නිදන්ගත රෝග හැදෙනවා කියලා. ඇත්තටම එතුමා හුදෙක්ම ඒ පිළිබඳව කල්පනා කරලා තමයි ඒ තීන්දුව ගත්තේ. හැබැයි එතුමාට අන්තිමට ඒ කවුරුවත් නැති වුණා. අවසාන වශයෙන් එතුමාව වැරදිකාරයා කළා. ඒක වැරදියි කියන කාරණය අපි කියන්න ඕනෑ. අද වෙනකොට ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා, නැවත රසායනික පොහොර ලබා දෙන්න. ඒ වාගේම භූමිය පදනම් කරගෙන තමයි පොහොර ලබා දෙන්නේ. ගරු සභාපතිතුමනි, දැන් අපේ ආණ්ඩුව පොහොර බෙදීමෙන් ඈත් වෙලා මේ වෙනකොට මුදල් ලබා දී ගෙන යනවා. මේ ගරු සභාවේදී සමහර මන්ත්‍රීවරු කිව්වා තවමත් පොහොර සහනාධාර සම්බන්ධයෙන් මුදල් ලැබිලා නැහැ කියලා. නමුත් මම කියන්න ඕනෑ,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, කෙටියෙන් කියලා අවසන් කරන්න.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු සභාපතිතුමනි. අද මේ අමාත්‍යාංශයට විරුද්ධව චෝදනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. ඒ නිසා කරුණු කාරණා පැහැදිලි කිරීමට අවශ්‍ය නිසා ඔබතුමා මට සාධාරණ විධියට පොඩි වෙලාවක් දෙන්න.

ගරු සභාපතිතුමනි, මේ වෙනකොට ගොවීන් 247,990කට හෙක්ටෙයාර 141,012ක් සඳහා රුපියල් මිලියන 2,115ක් ගෙවලා තිබෙනවා. දැන් ගරු මන්ත්‍රීතුමකු කිව්වා වාගේ පොළොන්නරුවේ

[ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ පහු වෙලා වගා කරලා තිබෙන්නේ. නමුත්, පොළොන්නරුවේ ගොවීන්ට රුපියල් මිලියන 90ක් ලබන සතිය වෙනකොට ගෙවන්න කටයුතු කරනවා කියන කාරණය මම කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ වෙනකොට විශේෂයෙන්ම ජාතික පොහොර ලේකම් කාර්යාලය මූලික වෙලා මේ රටට නව පොහොර පිළිබඳ පනතක් හඳුන්වා දීමේ කටයුත්ත පටන් ගෙන එය අවසාන අදියරේ තිබෙන්නේ. ඒ වාගේම ජාතික පොහොර ලේකම් කාර්යාලය ඒ වාගේම අපේ සීමාසහිත ලංකා පොහොර සමාගම, කොමර්ෂල් පොහොර සමාගම යනාදී මේ සියලු කණ්ඩායම් එකතු වෙලා දැන් අපේ පොහොර පර්යේෂණාගාරය වැඩිදියුණු කරන්න කටයුතු කරලා තිබෙනවා.

සමහර අය කිව්වා, පොහොරවල තත්ත්වය බාලයි කියලා. නමුත්, ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව දන්නා කාරණාවක් තමයි අපේ පසට වැඩිපුර රසායනික පොහොර යොදලා පස දැන් මැරිලා තිබෙන්නේ කියන එක. මේ තත්ත්වය නිසා අපි පසට කොච්චර රසායනික පොහොර දැම්මත් මම හිතන්නේ ඒවා සමහර වෙලාවට ශාකයට අවශෝෂණය කර ගන්නේ නැහැ. හැබැයි අර කියන විධියේ තත්ත්වයක් තිබෙනවා නම් අපි පැහැදිලිවම ඒ අයට දඬුවම් කරන්න ලැහැස්තියි. පොහොරවල ප්‍රමිතිය පිළිබඳව අපි සොයා බැලීමක් කරනවා කියන කාරණය අපි කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපේ පොහොර ප්‍රතිපත්තිය නිසා 2022, 2023 මහ කන්නයේ යූරියා භාවිතය සියයට 34කින් අඩු වෙලා තිබෙනවා. බණ්ඩි පොහොර භාවිතය සියයට 83කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම 2023 යල කන්නයේදී යූරියා භාවිතය සියයට 32කින් අඩු වෙලා තිබෙනවා. බණ්ඩි පොහොර භාවිතය සියයට 57කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම දැන් සමහර අය කොහොම කිව්වත් කාබනික පොහොර ප්‍රතිපත්තිය ඇති කරපු නිසා මේ රටේ දේශීය ව්‍යවසායකයෝ පිරිසක් බිහි වුණා. හැබැයි, ඒකේ යම් වැරැද්දක් තිබුණා ගරු සභාපතිතුමනි. මේ අය අනවශ්‍ය ආකාරයට බාල නිෂ්පාදන වෙළෙඳ පොළට දාලා මේ රටේ ගොවි ජනතාවට කාබනික පොහොර එපා කරවපු තත්ත්වයක් ඇති වුණා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ.

ඊළඟට තවත් වැදගත් කාරණයක් ඔබතුමාගේ සහ මේ ගරු සභාවේ අවධානයට මම යොමු කරනවා. අපේ අමාත්‍යාංශය දැන් විදේශ ආධාර මත ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් විනාඩි හයක්, හතක් වැඩිපුර ගත වෙලා තිබෙනවා. ඒ නිසා කෙටියෙන් කියලා අවසන් කරන්න.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිවලින් බහුතරය තිබෙන්නේ උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල. නමුත් උතුරු, නැඟෙනහිර පළාත් නියෝජනය කරන සමහර මන්ත්‍රීවරු කියනවා මම දැක්කා, උතුරු, නැඟෙනහිරට කුඩම්මාගේ සැලකිලි දක්වනවාය කියලා. ගරු සභාපතිතුමනි, අපි ගාල්ල දිස්ත්‍රික්කය අරගෙන බැලුවොත්, එක ව්‍යාපෘතියක්වත් නැහැ. එහෙම නම් කුඩම්මාගේ සැලකිල්ල තිබෙන්නේ ගාල්ල, මාතර වැනි දිස්ත්‍රික්කවලටයි. ඒ නිසා ඒ අය කියන කාරණය ඇත්තක් කියා අපි පිළිගන්නේ නැහැ.

විශේෂයෙන් ගොවීන්ගේ රක්ෂණ වන්දි පිළිබඳවත් මේ සභාවේ කථා කළා. රක්ෂණ වන්දි ගෙව්වේ නැහැ කිව්වා. නමුත් 2023 වගා වන්දි ගෙවීම සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලයට රුපියල් මිලියන 1,000ක් වෙන් කළා. 2024ටත් අපි රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. උදාහරණයක් හැටියට 2023 අපි රුපියල් බිලියන 1.4ක මුදලක් ගෙවා තිබෙනවා. එතකොට ඉතිරි මුදල, වැඩිපුර ගිය මුදල, අපි වගා රක්ෂණ අරමුදලින් තමයි අරගෙන තිබෙන්නේ. කවුරු හෝ කියනවා නම් ඒක බොරුවක් කියලා, මේ සම්බන්ධයෙන් අපට කරුණු කාරණා කියන්න පුළුවන්. මම ගරු ඇමතිතුමාට සාධාරණයක් කරන්න ඕනෑ නිසායි මේ කාරණය කිව්වේ. ඒ ගැන මම දිගට කථා කරන්නේ නැහැ.

ඒ වාගේම අපි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හැටියටත් විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව වැඩි විස්තර සඳහන් කරන්න වෙලාව නැහැ. අපේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය කියන ආයතන විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. ගරු ලොහාන් රත්වත්තේ රාජ්‍ය ඇමතිතුමා වෙනුවෙන් මම ඒ ආයතනවල හැම දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ හිටපු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා -ගරු රමේෂ් පතිරණ මැතිතුමා- කොවිඩ් සමයේ වැවිලි ක්ෂේත්‍රය ආරක්ෂා කරන්න විශාල මහන්සියක් ගත්තා. ඒක මම පෞද්ගලිකව දන්නා කාරණයක්. ඒ නිසා අපි හැම දෙනාගේම ගෞරවනීය ස්තුතිය එතුමාට පුද කළ යුතුයි.

මගේ කථාව අවසන් කිරීමට පෙර මම විශේෂයෙන් ස්තුති කළ යුතු තව පිරිසක් සිටිනවා, ගරු සභාපතිතුමනි. අපේ කැබිනට් අමාත්‍යතුමා අප - ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා, ගරු කේ. කාදර් මස්තාන් රාජ්‍ය ඇමතිතුමා, අලුතින් පත් වුණු ගරු ලොහාන් රත්වත්තේ රාජ්‍ය ඇමතිතුමා- සමඟ සහෝදරත්වයෙන් කටයුතු කරමින් ලොකු සහයෝගයක් ලබා දෙනවා. ඒ සම්බන්ධයෙන් එතුමාට අපේ ගෞරවනීය ස්තුතිය එතුමාට පුද කරන්න ඕනෑ. ඒ වාගේම අපේ ලේකම්තුමා -ජනක සේනාධීර මැතිතුමා- අපේ අමාත්‍යාංශයට අලුතින් ආවත් අපට විශාල ශක්තියක් ලබා දෙනවා. මේ අවස්ථාවේ මෙතැන නැති වුණත් මම මතක් කරන්න ඕනෑ, අපේ හිටපු ඇමතිතුමාත්, ලේකම්, ගුණදාස අමරසිංහ මැතිතුමා ඇතුළු අතිරේක ලේකම්වරු ඇතුළු සියලු දෙනා අපට විශාල ශක්තියක් ලබා දුන් බව.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ ආයතන ගණනාවක් තිබෙනවා. මම ඒ ආයතන සියල්ල ගැන කථා කරන්න බලාපොරොත්තු වුණත්, කාල වේලාව නැති නිසා මට ඊට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, වී අලෙවි මණ්ඩලය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය, ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනාවාස අධිකාරිය, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය, ජාතික පොහොර ලේකම් කාර්යාලය, ලංකා පොහොර සමාගම, කොමර්ෂල් පොහොර සමාගම, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ආශ්‍රිත සමාගම්, මිල්කෝ සමාගම, මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම, ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන යන ආයතනවල වගකිව යුතු නිලධාරීන් සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරන සියලු ආයතනවල නිලධාරීන් මේ රටේ ජාතික ආර්ථිකයට ලොකු ශක්තියක් ලබා දෙන සභාපතිවරු, කළමනාකාර අධ්‍යක්ෂවරු ඇතුළු නිලධාරීන්. මේ සියලු දෙනා ගරු ඇමතිතුමා සහ අපි වෙනුවෙන් මේ රටට ලබා

දෙන සහයෝගය වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා, ගරු සභාපතිතුමනි. ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මට වෙලාව ලබා දීම සම්බන්ධව.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මේ වනවිට මේ රටේ විදුලිබලය ඇණ හිටීම සම්බන්ධයෙන් හේෂා විතානගේ මන්ත්‍රීතුමාත් කථා කළා. මට පුංචි කාරණයක් කියන්න තිබෙනවා. මෙතැන තිබෙන ගැටලුව, තාක්ෂණික දෝෂයක් වෙන්නත් පුළුවන්. හැබැයි, සමහරු උත්සාහ කරනවා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳ කාරණයත් එක්ක මේක ඒ ගිණුමට දාගන්න. ඒ කාලයේ ට්‍රාන්ස්ෆෝමර පුපුරවලා මුළු රටම අඳුරේ තියපු අයට මේක මහ ලොකු දෙයකුත් නොවෙයි. මම හිතනවා, ඇමතිතුමා පොඩි පැහැදිලි කිරීමක් කරයි කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එතුමා කිව්වා, තව ටිකකින් ඒක නිවැරදි කරනවා කියලා.

## කෘෂිකර්ම අමාත්‍යාංශය
## கமத்தொழில் அமைச்சு
## MINISTRY OF AGRICULTURE

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 60,949,250,000 |
| මූලධන | රු. 39,474,030,000 |

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී, කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 3 සිට 5 දක්වා පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය:

'කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 66,039,250,000 |
| මූලධන | රු. 46,522,030,000' " |

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 66,039,250,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 46,522,030,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 66,039,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 46,522,030,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 66,039,250,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.
Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 46,522,030,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.
Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 11 8වන ශීර්ෂය.- කෘෂිකර්ම අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.;2,499,400,000 මූලධන වියදම, රු. 433,000,000

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 42,270,400,000; මූලධන වියදම, රු. 31,291,670,000

### தலைப்பு 118.- கமத்தொழில் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,499,400,000; மூலதனச் செலவு, ரூபாய் 433,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 42,270,400,000; மூலதனச் செலவு, ரூபாய் 31,291,670,000

### HEAD 118.- MINISTER OF AGRICULTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,499,400,000; Capital Expenditure, Rs. 433,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 42,270,400,000; Capital Expenditure, Rs. 31,291,670,000

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී, 118 වන වැය ශීර්ෂය සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා:

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"19 වන පිටුවේ, 7 සිට 9 දක්වා පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'ශීර්ෂ 118 - කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා

වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 3,504,400,000 රු. 478,000,000

වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 44,885,400,000 රු. 37,234,670,000' "

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නාමය කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලෙස වෙනස් කිරීම, අහෝසි කරන ලද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන, වැය ශීර්ෂ 118 යටතට මාරු කරමින්, පුනරාවර්තන ප්‍රතිපාදන රු. 3,620,000,000කින් සහ මූලධන ප්‍රතිපාදන රු. 3,488,000,000කින් වැඩි කිරීම, 2023.10.23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වැය ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වැය ශීර්ෂ 337 - කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කිරීම සහ අය වැය යෝජනා 22 ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 2,500,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 3,504,400,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 478,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 44,885,400,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 37,234,670,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,504,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 478,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான அதிகரிக்கப்பட்ட ரூபாய் 44,885,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 37,234,670,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப் பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப் பட்டது.

Question, "That the increased sum of Rs. 3,504,400,000, for Head 118, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 478,000,000, for Head 118, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 44,885,400,000, for Head 118, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 37,234,670,000, for Head 118, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**281 වන ශීර්ෂය.- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 662,550,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 662,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන. -මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 73,860,000

" 281වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 73,860,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 8,917,790,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 8,917,790,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 3,781,500,000

" 281වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,781,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**285 වන ශීර්ෂය.- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 625,800,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 625,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 49,000,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 49,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 5,132,160,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 5,132,160,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 3,186,000,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,186,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**292 වන ශීර්ෂය.- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 841,150,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 841,150,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 73,000,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 73,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 586,000,000

"292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 586,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 281.- கமநல அபிவிருத்தித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 662,550,000

“தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 662,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 73,860,000

“தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 73,860,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 8,917,790,000

“தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 8,917,790,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,781,500,000

“தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 3,781,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 285.- கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 625,800,000

“தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 625,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 49,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 49,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 5,132,160,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 5,132,160,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,186,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 3,186,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 292.- கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 841,150,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 841,150,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 73,000,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 73,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 586,000,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 586,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 281.- DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure Rs. 662,550,000

Question, "That the sum of Rs. 662,550,000, for Head 281, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 73,860,000

Question, "That the sum of Rs. 73,860,000, for Head 281, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 281, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 8,917,790,000

Question, "That the sum of Rs. 8,917,790,000, for Head 281, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 3,781,500,000

Question, "That the sum of Rs. 3,781,500,000, for Head 281, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 285.- DEPARTMENT OF AGRICULTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 625,800,000

Question, "That the sum of Rs. 625,800,000, for Head 285, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 49,000,000

Question, "That the sum of Rs. 49,000,000, for Head 285, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Developmental Activities - Recurrent Expenditure, Rs. 5,132,160,000

Question, "That the sum of Rs. 5,132,160,000, for Head 285, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 3,186,000,000

Question, "That the sum of Rs. 3,186,000,000, for Head 285, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 292.- DEPARTMENT OF ANIMAL PRODUCTION AND HEALTH

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 841,150,000

Question, "That the sum of Rs. 841,150,000, for Head 292, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 73,000,000

Question, "That the sum of Rs. 73,000,000, for Head 292, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 586,000,000

Question, "That the sum of Rs. 586,000,000, for Head 292, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு
MINISTRY OF PLANTATION INDUSTRIES

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"27 වන පිටුවේ, 4 සිට 16 දක්වා වන පේළි ඉවත් කරන්න."

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අංක 2355/10 හා 2023.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අහෝසි කරන ලද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රතිපාදන අතුරින් වැය ශීර්ෂ 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා, 2024 විසර්ජන පනත් කෙටුම්පතින් ඉවත් කිරීම සහ වැය ශීර්ෂ 135 යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන වැය ශීර්ෂ 118 - කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සහ වැය ශීර්ෂ 501 - අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා යටතට මාරු කිරීම සහ වැය ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වැය ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වැය ශීර්ෂ 337 - කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**289 වන ශීර්ෂය.- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 933,000,000; මූලධන වියදම රු. 517,000,000

**தலைப்பு 289.- ஏற்றுமதி கமத்தொழில் திணைக்களம்**
நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 933,000,000; மூலதனச் செலவு, ரூபாய் 517,000,000

HEAD 289.- DEPARTMENT OF EXPORT AGRICULTURE
Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 933,000,000; Capital Expenditure, Rs. 517,000,000

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී, 289 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 15 වන පේළියට ඉනික්බිතිව පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 933,000,000 රු. 517,000,000' "

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2023.10.23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වැය ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**293 වන ශීර්ෂය.- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**
02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 412,000,000; මූලධන වියදම රු. 528,000,000

**தலைப்பு 293.- இறப்பர் அபிவிருத்தித் திணைக்களம்**
நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 412,000,000; மூலதனச் செலவு, ரூபாய் 528,000,000

HEAD 293.- DEPARTMENT OF RUBBER DEVELOPMENT
Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 412,000,000; Capital Expenditure, Rs. 528,000,000

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී, 293 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 18 වන පේළියට ඉනික්බිතිව පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 412,000,000 රු. 528,000,000' "

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2023.10.23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වැය ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**337 වන ශීර්ෂය.- කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**
02වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.125,000,000; මූලධන වියදම, රු.15,000,000

**தலைப்பு 337.- கறுவா தொழிற்றுறை அபிவிருத்தித் திணைக்களம்**
நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 125,000,000; மூலதனச் செலவு ரூபாய் 15,000,000

HEAD 337.- DEPARTMENT OF CINNAMON INDUSTRY DEVELOPMENT
Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 125,000,000; Capital Expenditure, Rs. 15,000,000

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, 2024 කාරක සභා අවස්ථාවේදී, 337 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"19 වන පිටුවේ, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට ඇතුළත් කළ වැය ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, සඳහා අදාළ විස්තරයට ඉනික්බිතිවම පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'ශීර්ෂ 337 - කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 125,000,000 රු.15,000,000' "

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2023.10.23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වැය ශීර්ෂ 337 - කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2024 කාරක සභා අවස්ථාවේදී පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"33 වන පිටුවේ, 23 වන පේළියට ඉනික්බිතිව පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 138,000,000 |
| මූලධන | රු. 24,000,000 |

ශීර්ෂ 501 - අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා

වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 138,000,000 රු. 24,000,000' "

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අංක 2355/09 හා 2023.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන පරිදි අලුතින් පිහිටුවන ලද අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂයක් හා ප්‍රතිපාදන වෙන් කිරීම සහ 2024 විසර්ජන පනත් කෙටුම්පතට වැය ශීර්ෂ අංක 501 ඇතුළත් කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 6.58ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2023 දෙසැම්බර් 11වන සඳුදා.***

*பி.ப.6.58 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2023 டிசம்பர் 11, திங்கட்கிழமை.*

*At 6.58 p.m., the Chairman left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Monday, 11th December, 2023.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශීර්ෂ අංක 118, 135, 289, 293, 337 සහ 501 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 281, 285 සහ 292 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 9 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත: නියමය
## இலங்கை தேயிலைச் சபைச் சட்டம்: கட்டளை
## SRI LANKA TEA BOARD LAW: ORDER

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13(1)(අ) සහ 13(1)(ආ) වගන්ති යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 04 දිනැති අංක 2339/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පළිබෝධනාශක පාලනය කිරීමේ පනත: නියෝග
## பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தற் சட்டம்: ஒழுங்குவிதிகள்
## CONTROL OF PESTICIDES ACT: REGULATIONS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 20 වන වගන්තිය සමඟ කියවිය යුතු 26 වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 18 දිනැති අංක 2345/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය: වාර්ෂික වාර්තාව (2021)
## இலங்கை இறப்பர் ஆராய்ச்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2021)
## RUBBER RESEARCH INSTITUTE OF SRI LANKA: ANNUAL REPORT (2021)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1930 (අවසන් වරට සංශෝධිත වර්ෂය 2003) අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ 8 වගන්තිය යටතේ 2023.05.24 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පොල් වගාකිරීමේ මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2020)
## தென்னைப் பயிர்ச்செய்கைச் சபை: வருடாந்த அறிக்கை (2020)
## COCONUT CULTIVATION BOARD: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වගන්තිය යටතේ 2023.06.21 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පොල් පර්යේෂණ ආයතනය: වාර්ෂික වාර්තාව (2020)
## தென்னை ஆராய்ச்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2020)
## COCONUT RESEARCH INSTITUTE: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 44 වගන්තිය යටතේ 2023.02.10 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් පර්යේෂණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය: වාර්ෂික වාර්තාව (2019)
## தலவாக்கலை இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2019)
## TEA RESEARCH INSTITUTE OF SRI LANKA - TALAWAKELE: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් තලවාකැලේ ශ්‍රීලංකා තේ පර්යේෂණ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පොල් සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව (2020)
## தெங்கு அபிவிருத்தி அதிகாரசபை: வருடாந்த அறிக்கை (2020)
## COCONUT DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ III වන කොටසේ 24 වගන්තිය යටතේ 2023.03.08 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව (2021)
## சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை: வருடாந்த அறிக்கை (2021)
## TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT (2021)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ 2023.03.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 7.00ට, අද දින සභා සම්මතිය අනුව, 2023 දෙසැම්බර් 10 වන ඉරිදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி. ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி. ப. 7.00க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2023 டிசம்பர் 10, ஞாயிற்றுக்கிழமை மு. ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 7.00 p.m. until 9.30 a.m. on Sunday, 10th December, 2023, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.